බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 30

සූත්‍රාන්තපිටකයෙහි

සූවිසිවන ග්‍රන්ථය

කුදුගත්සඟියේ දසවැනි වූ

ජාතකපාළි

ප්‍රථම භාගය

සිංහලානුවාදය
මහරගම සිරි වජිරඤාණ ධර්මායතනාධිපති
මඩිහේ සිරි පඤ්ඤාසීහාභිධාන
මහානායක ස්ථවිරයන් වහන්සේ විසිනි

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින්
ප්‍රකාශිත යි.**

ශ්‍රී බු. ව. 2526
රාජ්‍ය වර්ෂ. 1983

Buddha Jayanti Tripitaka Series - Volume 30

THE TWENTY-FOURTH BOOK IN THE

SUTTANTA PITAKA

KHUDDAKA NIKĀYA PART 10

JATAKAPALI

PART I

WITH

THE SINHALA TRANSLATION

BY

THE VENERABLE **MADIHE SIRI PAÑÑASĪHA**
MAHA NAYAKA THERA
THE PRINCIPAL OF SIRI VAJIRAÑANA
DHARMAYATANAYA, MAHARAGAMA

PUBLISHED

UNDER THE PATRONAGE

OF

DEMOCRATIC SOCIALIST REPUBLICAN
GOVERNMENT OF SRI LANKA

B.E. 2526
C.E. 1983

සුත්තන්තපිටකෙ ඛුද්දකනිකායෙ

ජාතකපාළි

පඨමො භාගො

සූත්‍රාන්තපිටකයෙහි ඛුද්දකනිකායෙහි

ජාතකපාළි

ප්‍රථම භාගය

‘‘තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො.’’

‘‘මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබළයි. වැසුණේ නො ම බබළයි.’’

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත – හරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

සංස්කෘතික කටයුතුපිළිබඳ අමාත්‍ය

ගරු ඊ. එල්. බී. හුරුල්ලේ මැතිතුමා

කළ ඉල්ලීම අනුව

කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍ය

ගරු සී. සිරිල් මැතිව් මැතිතුමා

දුන් උපදෙස් පරිදි

ලංකා බනිජවැලි සංයුක්ත මණ්ඩලයේ සභාපති

ආර්. ඇස්. සිරිසේන මහතා

සංස්ථාවේ අරමුදලින් පරිත්‍යාග කළ

රුපියල් දෙලක්ෂ පනස් දහසක මුදලින්

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාවේ

මෙම කාණ්ඩයේ පිටපත් 3000 මුද්‍රණය කරවන ලදී.

මෙයින් ජනිත කුසල සම්භාරය දායක කාරක සියලු දෙනා

අනුමෝදන් වෙත්වා.

At the request of the

Hon'ble E. L. B. HURULLE
Minister of Cultural Affairs

and on the advice of

Hon'ble C. CYRIL MATHEW
Minister of Industries and Scientific Affairs

Mr. R. S. SIRISENA
Chairman of the **Ceylon Mineral Sands Corporation**

has donated

out of the funds of the Corporation

Rupees 250,000.00

being the full cost of the printing of

3000 copies of this volume of

THE BUDDHA JAYANTI TRIPITAKA SERIES

May the Kusala Kamma accrued by this
noble act be shared by everyone concerned.

පටුන
CONTENTS

	පිටු
සංස්කාරක නිවේදනය	xiii
ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය	xv
සංකේත නිරූපණය	xvii
පාළි හෝඩිය	xix
විසය සූචි	xxi–xxxvii
පෙළ හා පරිවර්තනය	2–535
ගාථාදිපාදනුක්කමණිකා	537–580
සඤ්ඤානාමානුක්කමණිකා	581–584
විසෙසපදනුක්කමණිකා	585–598
ශුද්ධාශුද්ධ නිරූපණය	599
බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා	601–602

සංස්කාරක නිවේදනය

අප තිලෝගුරු සම්මාසම්බුදුන් බුද්ධත්වයට පැමිණ පන්සාලිස් හවුරුද්දක් මුළුල්ලෙහි ආකාශගඞ්ගාප්‍රවාහයක් සෙයින් දෙශනා කොට වදළ චතුරසීතිසහස්‍රසංඛ්‍යා වූ ධර්මස්කන්ධය ශාස්තෘශාසන නම් වෙයි. ශාස්තෘශාසනය වූකලි 'සුත්ත ගෙය්‍යා' දි අඞ්ග නවයෙකින් පරිමිත කොට බුදුරදුන් විසින් මැ නානාස්ථානයෙහි ලා වදරන ලද්දේ ය. නවාඞ්ගයන් කෙරෙහි සත්වැනි අඞ්ගය වූයේ ජාතකාඞ්ගය යි. සාර්ධපඤ්චසත ජාතකයෙකින් පරිමිත වූ ජාතකාඞ්ගය බුදුරදුන් වදළ සත්දහසකට ආසන්න වූ ගාථායෙන් හා අතීත කථායෙන් ද යුක්ත වෙයි. ජාතකපාළියෙහි අර්ථෝද්ධාරය දුෂ්කර යැ, බුද්ධානුමත වූ අර්ථ කථාව මැ වහල් කොටගෙන ජාතකාර්ථ නහාගතයුතු වෙයි. සිංහල ජනතාවගේ සද්භාවය සඳහා ජාතක කථායෙන් ලැබෙන පිටුවහල සලකා වීරසිංහප්‍රතිරාජයන් විසින් ජාතකට්ඨකථා ඇසිරි කොට සිංහල ජාතක පොත නිපදවන ලද්දේ ය. ජාතකාර්ථාවබොධය සඳහා රාජ-මුරාරීන් ලියූ ජාතක සන්නයකුදු එසේ මැ අන්‍යතර ආචාර්‍ය්‍යවරයන් විසින් නිපදවන ලද ජාතක ගැටපදය හා වෙසතුරුදා සන්නයද ඇත. මේ හැම කරුණෙකින් මැ ඇත අතීතයෙහි සිට සිංහල ජනතාව සම්භාවනා පූර්වක වැ ජාතක කථා පරිශීලනය කළබව සැලැකිය යුතු වේ.

දෙදහස්පන්සියයේ බුද්ධජයන්ති අනුස්මරණය සඳහා පිහිටුවනලද ලඞ්කා බෞද්ධ මණ්ඩලය මගින් ආරම්භ කළ ක්‍රියාපද්ධතියෙහි විශිෂ්ටතම වූයේ පාළි ත්‍රිපිටක බුද්ධවචනය සියබසට නහා පළකරවා ලීමේ අති දුෂ්කර කාර්‍ය්‍යය වේ. ඒ සඳහා ප්‍රයුක්ත වූ ත්‍රිපිටක මණ්ඩලය විසින් ජාතකපාළිය ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි 30, 31, 32 ග්‍රන්ථ වශයෙන් අංකිත වැ ඇත. එහි සිංහල පරිවර්තනය සඳහා ආරාධනා ලැබුවාහු මහරගම සිරිවජිරඤාණ ධර්මායතනාධිපති මඩිහේ සිරි පඤ්ඤාසීහාභිධාන මහානායක ස්ථවිරයන් වහන්සේ යි.

වර්තමාන ත්‍රිපිටක මණ්ඩලයෙහි ධර්මධර මහතෙරවරුන් විසින් ජාතකපාළි පාඨශොධනය ද කරමින් එහි සිංහල අනුවාදය ද මහත් පරිශ්‍රමයෙන් ශොධනය කොට මුද්‍රණයට සකස්කරන ලද්දේ ය. එසේ ම ධර්මගවෙෂකයනට ඵලවත් වූ ගාථාදිපාද සූචිය ද සංඥානාම හා විශෙෂපදනුක්‍රමණිකා ද පිළියෙළ කොට ඇත. ත්‍රිපිටක ග්‍රන්ථ-මාලායෙහි 30 වැනි ග්‍රන්ථය වූ ජාතකපාළි ප්‍රථම භාගය ප්‍රකාශයට පමුණුවාලීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අනුග්‍රහය ද සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් තැන්පත් සෝමපාල ජයවර්ධන මහතාණන්ගේ විශෙෂ උද්‍යොගය ද ලැබීම අගය කොට සලකම්හ.

ශ්‍රී සද්ධර්මව්‍යාප්තිය සඳහා ක්‍රියා කරන ගරු සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය තැන්පත් ඊ. ඇල්. බී. හුරුල්ලේ මැතිතුමාණන් ප්‍රමුඛ සංස්කෘතික අධිකාරියෙහි සුධීහු ද තිසර මුද්‍රණාලයෙහි කාර්‍ය්‍ය-මණ්ඩලය ද මේ සඳහා සහාය දෙන හැම පින්වත්හු ද ධර්මදානමය කුශල හේතුයෙන් සගමොක් සුව ලබත්වා යි ආශංසනය කරම්හ.

ජාතක දෙශනා පිළිබඳ විශෙෂ ප්‍රස්තාවනාව තෘතීය භාගයෙහි ලා ප්‍රකාශ කරනු ලැබේ.

මේ වගට, ශාසනොදයකාරී,

ලබුගම ලඞ්කානන්‍ද

මහානායක ස්ථවිර

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ ප්‍රධාන සම්පාදක

$\frac{2526}{1983}$ අගෝස්තු 20 වැනි දින

115, මහානායක චාරිකාරාමයේ
ත්‍රිපිටක මණ්ඩලය,
විජේරාම මාවත,
කොළඹ 7.

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

උපදේශක :

අග්‍ගමහාපණ්ඩිත, බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

සභාපති :

අභංගම විද්‍යාචන්ද්‍රපරිවෙණාධිපති, ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය, කෝදගොඩ ශ්‍රී ඥානාලෝක දක්ෂිණලඬකායෙහි ප්‍රධාන සඬඝනායක ස්ථවිරයන් වහන්සේ.

ප්‍රධාන සම්පාදක ;

මොල්ලිගොඩ ප්‍රවචනොදය පරිවෙණාධිපති ශ්‍රී මහාවිහාරවංශාලඬකාර විමල කීර්ති ශ්‍රී ත්‍රිපිටකවාගීශ්වර, රාජකීය පණ්ඩිත ලබුගම ශ්‍රී ලඬකානන්ද– කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඬඝසභායෙහි මහානායක ස්ථවිරයන් වහන්සේ.

සම්පාදක ;

කිරුළපන පූර්වාරාමයෙහි හා නාරාහේන්පිට අභයාරාමයෙහි අධිපති අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, රද්දල්ලේ ශ්‍රී ප්‍රඥාලෝක — කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඬඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හෙරලියාවල ශ්‍රී සුධර්මාරාමාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වේඬරුවේ ශ්‍රී අනවමදර්ශී කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඬඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ, මාකඩවර විහාරාධිපති, ශ්‍රී රෙවත පරිවෙණාධිපති, රාජකීය පණ්ඩිත, කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

කොළඹ තිඹිරිගස්යායේ අශොකාරාමාධිපති, රාජකීය පණ්ඩිත, කරඳන ශ්‍රී ප්‍රඥාලඬකාර නායක ස්ථවිරයන් වහන්සේ.

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි ත්‍රිපිටක අංශයෙහි මහාචාර්ය, ශාස්ත්‍රාචාර්ය, රාජකීය පණ්ඩිත, ත්‍රිපිටකාචාර්ය උඩුවේ ජනානන්ද ස්ථවිරයන් වහන්සේ.

ලේකම් ;

කොළඹ බෞද්ධාලොක මාවතෙහි බෞද්ධාලොක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරි ධම්මපාල– කොළඹදිශායෙහි ප්‍රධාන සඬඝනායක ස්ථවිරයන් වහන්සේ.

සංකෙත නිරූපණය

සී.මු. – සීහළක්ඛරමුද්දිත ජාතකපාළි

අට්ඨකථා – සීහළක්ඛර මුද්දිත ජාතකට්ඨකථා

ම.ඡ.සං. – මරම්මරට්ඨෙ ඡට්ඨසංගීතියා සොධිත ජාතකපාළි

ස්‍යා. – තායායක්ඛරමුද්දිත ජාතකපාළි

THE PALI ALPHABET

IN SINHALA CHARACTERS

VOWELS

අ a　ආ ā　ඉ i　ඊ ī　උ u　ඌ ū　එ ē　ඔ ō

CONSONANTS

ක ka	ඛ kha	ග ga	ඝ gha	ඞ ṅa
ච ca	ඡ cha	ජ ja	ඣ jha	ඤ ña
ට ṭa	ඨ ṭha	ඩ ḍa	ඪ ḍha	ණ ṇa
ත ta	ථ tha	ද da	ධ dha	න na
ප pa	ඵ pha	බ ba	භ bha	ම ma

ය ya	ර ra	ල la	ව va	ස sa	හ ha	ළ ḷa	අං ṃ
ක ka	කා kā	කි ki	කී kī	කු ku	කූ kū	කෙ kē	කො kō
ඛ kha	ඛා khā	ඛි khi	ඛී khī	ඛු khu	ඛූ khū	ඛෙ khē	ඛො khō
ග ga	ගා gā	ගි gi	ගී gī	ගු gu	ගූ gū	ගෙ gē	ගො gō

CONJUNCT-CONSONANTS

කක kka	ඤඤ ñña	ත්‍ර tra	මඵ mpha
කඛ kkha	ණහ ṇha	දද dda	මබ, ඹ mba
ක්‍ය kya	ඤච ñca	දධ ddha	මභ mbha
ක්‍රි kri	ඤ්ඡ ඡ ñcha	ද්‍ර dra	මම mma
කව kva	ඤ්ජ ජ ñja	දව, ව dva	මහ mha
ඛ්‍ය khya	ඤඣ ñjha	ධව dhva	යය, ය්‍ය yya
ඛව khva	ටට ṭṭa	නත nta	යහ yha
ගග gga	ටඨ, ඨ ṭṭha	නථ ntha	ලල lla
ගඝ ggha	ඩඩ ḍḍa	නද nda	ල්‍ය lya
ඞක ṅka	ඩඪ ḍḍha	නධ ndha	ලහ lha
ග්‍ර gra	ණණ ṇṇa	නන nna	වහ wha
ඞඛ ṅkha	ණට ṇṭa	නහ nha	සස ssa
ඞග ṅga	ණඨ ṇṭha	පප ppa	සම sma
ඞඝ ṅgha	ණඩ, ඬ ṇḍa	පඵ ppha	සව sva
චච cca	තත tta	බබ bba	හම hma
චඡ ccha	තථ ttha	බභ bbha	වහ vha
ජජ jja	තව tva	බ්‍ර bra	ළහ ḷha
ජඣ jjha		මප mpa	

ා ā　ි i　ී ī　ු u　ූ ū　ෙ ē　ො ō

ජාතක පාළි

පඨමො භාගො

විසය සූචි

1. එකක නිපාතො 2 – 61

1. අපණ්ණකවග්ගො 2 – 5

ජාතක සංඛ්‍යා		ජාතකනාම		පිට්ඨඞ්කා
1.	1.	අපණ්ණක	ජාතකං	2–3
2.	2.	වණ්ණුපථ	,,	2–3
3.	3.	සෙරිවාණිජ	,,	2–3
4.	4.	චුල්ලසෙට්ඨි	,,	2–3
5.	5.	තණ්ඩුලනාළි	,,	4–5
6.	6.	දෙවධම්ම	,,	4–5
7.	7.	කට්ඨහාරි	,,	4–5
8.	8.	ගාමණි	,,	4–5
9.	9.	මඛාදෙව	,,	4–5
10.	10.	සුඛවිහාරී	,,	4–5

2. සීලවග්ගො 6 – 9

11.	1.	ලක්ඛණමිග	ජාතකං	6–7
12.	2.	නිග්‍රොධමිග	,,	6–7
13.	3.	කණ්ඩින	,,	6–7
14.	4.	වාතමිග	,,	6–7
15.	5.	ඛරාදිය	,,	6–7
16.	6.	තිපල්ලත්ථමිග	,,	6–7
17.	7.	මාළුත	,,	8–9
18.	8.	මතකභත්ත	,,	8–9
19.	9.	ආයාචිතභත්ත	,,	8–9
20.	10.	නළපාන	,,	8–9

3. කුරුඞ්ගවග්ගො 10 – 13

21.	1.	කුරුඞ්ගමිග	ජාතකං	10–11
22.	2.	කුක්කුර	,,	10–11
23.	3.	භොජාජානීය	,,	10–11
24.	4.	ආජඤ්ඤ	,,	10–11
25.	5.	තිත්ථ	,,	10–11

විසය සූචි

1. එකක නිපාතො 2–61

3. කුරුඞ්ග වග්ගො 10-13

ජාතක සංඛ්‍යා		ජාතකනාම				පිට්ඨඞ්කා
26.	6.	මහිලාමුඛ	,,	..	..	10–11
27.	7.	අභිණ්හ	,,	..	..	12–13
28.	8.	නන්දිවිසාල	,,	..	..	12–13
29.	9.	කණ්හ	,,	..	..	12–13
30.	10.	මුනික	,,	..	..	12–13

4. කුලාවකවග්ගො 14 – 17

31.	1.	කුලාවක	ජාතකං	..	..	14–15
32.	2.	නච්ච	,,	..	..	14 15
33.	3.	සම්මෝදමාන	,,	..	..	14–15
34.	4.	මච්ඡ	,,	..	..	14–15
35.	5.	වට්ටක	,,	..	..	14–15
36.	6.	සකුණ	,,	..	..	16–17
37.	7.	තිත්තිර	,,	..	..	16–17
38.	8.	බක	,,	..	..	16–17
39.	9.	නන්ද	,,	..	..	16–17
40.	10.	ඛදිරඞ්ගාර	,,	..	..	16–17

5. අත්ථකාමවග්ගො 17 – 21

41.	1.	ලොසක	ජාතකං	..	..	18–19
42.	2.	කපොතක	,,	..	..	18–18
43.	3.	වෙළුක	,,	..	..	18 19
44.	4.	මකස	,,	..	..	18–19
45.	5.	රොහිණී	,,	..	..	18–19
46.	6.	ආරාමදූසක	,,	..	..	18 19
47.	7.	වාරුණිදූසක	,,	..	..	20–21
48.	8.	වෙදබ්භ	,,	..	..	20–21
49.	9.	නක්ඛත්ත	,,	..	..	20–21
50.	10.	දුම්මෙධ	,,	..	..	20–21

6. ආසිංසවග්ගො 22 - 25

51.	1.	මහාසීලව	ජාතකං	..	..	22–23
52.	2.	චූළජනක	,,	..	..	22–23
53.	3.	පුණ්ණපාති	,,	..	..	22–23
54.	4.	කිංඵල	,,	..	..	22–23
55.	5.	පඤ්චාවුධ	,,	..	..	22–23
56.	6.	කඤ්චනක්ඛන්ධ	,,	..	..	22–23
57.	7.	වානරින්ද	,,	..	..	24–25
58.	8.	තයොධම්ම	,,	..	..	24–25
59.	9.	භෙරිවාද	,,	..	..	24–25
60.	10.	සඞ්ඛධමන	,,	..	..	24–25

විසය සූචි

1. එකක නිපාතො 2–61

7. ඉත්ථිවග්ගො 26 – 29

ජාතක සංඛ්‍යා		ජාතකනාම				පිට්ඨඞ්කා
61.	1.	අසාතමන්ත ජාතකං		..	..	26–27
62.	2.	අණ්ඩභූත	,,	..	..	26–27
63.	3.	තක්ක	,,	..	..	26–27
64.	4.	දුරාජාන	,,	..	..	26–27
65.	5.	අනභිරති	,,	..	..	26–27
66.	6.	මුදුලක්ඛණ	,,	..	..	28–29
67.	7.	උච්ඡඞ්ග	,,	..	..	28–29
68.	8.	සාකෙත	,,	..	..	28–29
69.	9.	විසවන්ත	,,	..	..	28–29
70.	10.	කුද්දාල	,,	..	..	28–29

8. වරුණවග්ගො 30 – 33

71.	1.	වරුණ	ජාතකං	..	..	30–31
72.	2.	සීලවනාගරාජ	,,	..	..	30–31
73.	3.	සච්චංකිර	,,	..	..	30–31
74.	4.	රුක්ඛධම්ම	,,	..	..	30–31
75.	5.	මච්ඡ	,,	..	..	30–31
76.	6.	අසඞ්කිය	,,	..	..	30–31
77.	7.	මහාසුපින	,,	..	..	32–33
78.	8.	ඉල්ලිස	,,	..	..	32–33
79.	9.	ඛරස්සර	,,	..	..	32–33
80.	10.	භීමසෙන	,,	..	..	32–33

9. අපායිම්හවග්ගො 34 – 37

81.	1.	සුරාපාන	ජාතකං	..	..	34–35
82.	2.	මිත්තවින්ද	,,	..	..	34–35
83.	3.	කාලකණ්ණි	,,	..	..	34–35
84.	4.	අත්ථස්සද්වාර	,,	..	..	34–35
85.	5.	කිම්පක්ක	,,	..	..	34–35
86.	6.	සීලවීමංස	,,	..	..	36–37
87.	7.	මඞ්ගල	,,	..	..	36–37
88.	8.	සාරම්භ	,,	..	..	36–37
89.	9.	කුහක	,,	..	..	36–37
90.	10.	අකතඤ්ඤු	,,	..	..	36–37

විසය සූචි

1. එකක නිපාතො 2–61

10. ලිත්තවග්ගො 38 – 41

ජාතක සංඛ්‍යා		ජාතකනාම		පිටඞ්ඩකා
91.	1.	ලිත්ත	ජාතකං	38–39
92.	2.	මහාසාර	,, ...	38–39
93.	3.	විස්සාසභොජන	,, ...	38–39
94.	4.	ලොමහංස	,, ...	38–39
95.	5.	මහාසුදස්සන	,, ...	38–39
96.	6.	තෙලපත්ත	,, ...	40–41
97.	7.	නාමසිද්ධි	,, ...	40–41
98.	8.	කූටවාණිජ	,, ...	40–41
99.	9.	පරොසහස්ස	,, ...	40–41
100.	10.	අසාතරූප	,, ...	40–41

11. පරොසතවග්ගො 42 - 45

101.	1.	පරොසත	ජාතකං	42–43
102.	2.	පණ්ණික	,, ...	42–43
103.	3.	වෙරි	,, ...	42–43
104.	4.	මිත්තවින්ද	,, ...	42–43
105.	5.	දුබ්බලකට්ඨ	,, ...	42–43
106.	6.	උදඤ්චනී	,, ...	44–45
107.	7.	සාලිත්තක	,, ...	44–45
108.	8.	බාහිය	,, ...	44–45
109.	9.	කුණ්ඩපූව	,, ...	44–45
110.	10.	සබ්බසංහාරක	පඤ්හා	44–45

12. හංසවග්ගො 46 – 49

111.	1.	හද්‍රභ පඤ්හා	.. ..	46–47
112.	2.	අමරාදෙවී පඤ්හා	,, ...	46–47
113.	3.	සිගාල	ජාතකං	46–47
114.	4.	මිතචින්ති	,, ...	46–47
115.	5.	අනුසාසික	,, ...	46–47
116.	6.	දුබ්බච	,, ...	48–49
117.	7.	තිත්තිර	,, ...	48–49
118.	8.	වට්ටක	,, ...	48–49
119.	9.	අකාලරාවී	,, ...	48–49
120.	10.	බන්ධනමොක්ඛ	,, ...	48–49

විසය සූචි

1. එකක නිපාතො 2–61

13. කුසනාළිවග්ගො 50 – 53

ජාතක සංඛ්‍යා		ජාතකනාම				පිට්ඨඞ්කා
121.	1.	කුසනාළි	ජාතකං	..	..	50–51
122.	2.	දුම්මෙධ	,,	..	..	50–51
123.	3.	නඞ්ගලීස	,,	..	..	50–51
124.	4.	අම්බ	,,	..	..	50–51
125.	5.	කටාහක	,,	..	..	50–51
126.	6.	අසිලක්ඛණ	,,	..	..	52–53
127.	7.	කලණ්ඩුක	,,	..	..	52–53
128.	8.	බිළාරවත	,,	..	..	52–53
129.	9.	අග්ගික	,,	..	..	52–53
130.	10.	කොසිය	,,	..	..	52–53

14. අසම්පදනවග්ගො 54 – 57

131.	1.	අසම්පදන	ජාතකං	..	..	54–55
132.	2.	පඤ්චගරුක	,,	..	..	54–55
133.	3.	ඝතාසන	,,	..	..	54–55
134.	4.	ඣානසොධන	,,	..	..	54–55
135.	5.	චන්දාභ	,,	..	..	54–55
136.	6.	සුවණ්ණහංස	,,	..	..	56–57
137.	7.	බබ්බුක	,,	..	..	56–57
138.	8.	ගොධ	,,	..	..	56–57
139.	9.	උභතොභට්ට	,,	..	..	56–57
140.	10.	කාක	,,	..	..	56–57

15. කකණ්ටකවග්ගො 58 – 61

141.	1.	ගොධ	ජාතකං	..	..	58–59
142.	2.	සිගාල	,,	..	..	58–59
143.	3.	විරොචන	,,	..	..	58–59
144.	4.	නඞ්ගුට්ඨ	,,	..	..	58–59
145.	5.	රාධ	,,	..	..	85–59
146.	6.	කාක	,,	..	..	58–59
147.	7.	පුප්ඵරත්ත	,,	..	..	60–61
148.	8.	සිගාල	,,	..	..	60–61
149.	9.	ඒකපණ්ණ	,,	..	..	60–61
150.	10.	සඤ්ජීව	,,	..	..	60–61

2. දුකනිපාතො 62 – 123

1. දළ්හවග්ගො 62 – 69

ජාතක සංඛ්‍යා		ජාතකනාම		පිට්ඨඞ්කා
151.	1.	රාජොවාද	ජාතකං	62–63
152.	2.	සිගාල	,,	62–63
153.	3.	සූකර	,,	62–63
154.	4.	උරග	,,	62–65
155.	5.	ගග්ග	,,	64–65
156.	6.	අලීනචිත්ත	,,	64–65
157.	7.	ගුණ	,,	64–65
158.	8.	සුහනු	,,	64–67
159.	9.	මොර	,,	66–67
160.	10.	විනීලක	,,	66–68

2. සන්ථව වග්ගො 70 – 75

161.	1.	ඉන්දසමානගොත්ත	ජාතකං	70–71
162.	2.	සන්ථව	,,	70–71
163.	3.	සුසීම	,,	70–71
164.	4.	ගිජ්ඣ	,,	72–73
165.	5.	නකුල	,,	72–73
166.	6.	උපසාළ්හ	,,	72–73
167.	7.	සමිද්ධි	,,	72–73
168.	8.	සකුණග්ඝි	,,	74–75
169.	9.	අරක	,,	74–75
170.	10.	කකණ්ටක	,,	74–75

3. කල්‍යාණධම්මවග්ගො 76 – 81

171.	1.	කල්‍යාණධම්ම	ජාතකං	76–77
172.	2.	දද්දර	,,	76–77
173.	3.	මක්කට	,,	76–77
174.	4.	දුතියමක්කට	,,	76 77
175.	5.	ආදිච්චුපට්ඨාන	,,	78–79
176.	6.	කළායමුට්ඨි	,,	78–79
177.	7.	තින්දුක	,,	78–79
178.	8.	කච්ඡප	,,	78–81
179.	9.	සතධම්ම	,,	80–81
180.	10.	දුද්දද	,,	80–81

2. දුක නිපාතො 62–123

4. අසදිසවග්ගො 82 – 87

ජාතක සංඛ්‍යා		ජාතකනාම		පිට්ඨඞ්කා
181.	1.	අසදිස	ජාතකං	82–83
182.	2.	සඞ්ගාමාවචර	,, ...	82–83
183.	3.	වාලොදක	,, ...	22–83
184.	4.	ගිරිදත්ත	,, ...	82–83
185.	5.	අනභිරති	,, ...	84–85
186.	6.	දධිවාහන	,, ...	84–85
187.	7.	චතුමට්ඨ	,, ...	84–85
188.	8.	සීහකොත්ථුක	,, ...	86–87
189.	9.	සීහචම්ම	,, ...	86–87
190.	10.	සීලානිසංස	,, ...	86–87

5. රූහකවග්ගො 88 – 93

191.	1.	රූහක	ජාතකං	88–89
182.	2.	සිරිකාලකණ්ණි	,, ...	88–89
193.	3.	චූලපදුම	,, ...	88–89
194.	4.	මණිචොර	,, ...	88–91
195.	5.	පබ්බතූපත්ථර	,, ...	90–91
196.	6.	වලාහස්ස	,, ...	90–91
197.	7.	මිත්තාමිත්ත	,, ...	90–91
198.	8.	රාධ	,, ...	90–93
199.	9.	ගහපති	,, ...	92–93
100.	10.	සාධුසීල	,, ...	92–93

6. නතංදළ්හවග්ගො 94 – 96

201.	1.	බන්ධනාගාර	ජාතකං	94–95
202.	2.	කෙළිසීල	,, ...	94–95
203.	3.	ඛන්ධවත්ත	,, ...	94–97
254.	4.	වීරක	,, ...	96–97
205.	5.	ගඞ්ගෙය්‍ය	,, ...	96–97
206.	6.	කුරුඞ්ගමිග	,, ...	96–97
207.	7.	අස්සක	,, ...	98–99
208.	8.	සුංසුමාර	,, ...	98–99
209.	9.	කක්කර	,, ...	98–99
210.	10.	කන්දගලක	,, ...	98–99

බීරණත්ථම්භකවග්ගො 100–105

211.	1.	සොමදත්ත	ජාතකං	100–101
212.	2.	උච්ඡිට්ඨභත්ත	,, ...	100–101
213.	3.	භරු	,, . ..	100–101
214.	4.	පුණ්ණනදී	,, ...	100–101
215.	5.	කච්ඡප	,, ...	102–103

2. දුක නිපාතො 62–123

7· බීරණත්ථම්භකවග්ගො 100 – 105

ජාතක සංඛ්‍යා		ජාතකනාම				පිටඨ්ඨකා
216.	6.	මච්ඡ	,,	..	..	102–103
217.	7.	සෙග්ගු	,,	..	..	102–103
218.	8.	කූටවාණිජ	,,	..	..	102–105
219.	9.	ගරහිත	,,	..	..	104–105
220.	10.	ධම්මද්ධජ	,,	..	..	104–105

8. කාසාවවග්ගො 106 – 111

221.	1.	කාසාව	ජාතකං	..	..	106–107
222.	2.	චූළනන්දිය	,,	..	..	106–107
223.	3.	පුටභත්ත	,,	..	..	106–107
224.	4.	කුම්භිල	,,	..	..	108–109
225.	5.	ඛන්තිවණ්ණන	,,	..	..	108–109
226.	6.	කොසිය	,,	..	..	108–109
227.	7.	ගූථපාණක	,,	..	..	108–109
228.	8.	කාමනීත	,,	..	..	110–111
229.	9.	පලාසි	,,	..	..	110–111
230.	10.	දුතියපලාසි	,,	..	..	110–111

9. උපාහනවග්ගො 112 – 117

231.	1.	උපාහන	ජාතකං	..	..	112–113
232.	2.	වීණාථූන	,,	..	..	112–113
233.	3.	විකණ්ණක	,,	..	..	112–113
234.	4.	අසිතාභූ	,,	..	..	114–115
235.	5.	වච්ඡනඛ	,,	..	..	114–115
236.	6.	බක	,,	..	..	114–115
237.	7.	සාකෙත	,,	..	..	114–115
238.	8.	එකපද	,,	..	..	116–117
239.	9.	හරිතමාතු	,,	..	..	116–117
240.	10.	මහාපිඞ්ගල	,,	..	..	116-117

10. සිගාලවග්ගො 118 – 123

241.	1.	සබ්බදාඨ	ජාතකං	..	..	118–119
242.	2.	සුනඛ	,,	..	..	118-119
243.	3.	ගුත්තිල	,,	..	..	118–119
244.	4.	වීතිච්ඡ	,,	..	..	118-121
245.	5.	මූලපරියාය	,,	..	..	120–121
246.	6.	තෙලොවාද	,,	..	..	120–121
247.	7.	පාදඤ්ජලි	,,	..	..	120–121
248.	8.	කිංසුකොපම	,,	..	..	120–123
249.	9.	සාලක	,,	..	..	122-123
250.	10.	කපි	,,	..	..	122-123

3. තිකනිපාතො 124 – 164

1. සඞ්කප්පවග්ගො 124 – 131

ජාතක සංඛ්‍යා		ජාතකනාම		පිට්ඨඞ්කා
251.	1.	සඞ්කප්ප	ජාතකං	124–125
252.	2.	තිලමුට්ඨි	,, ...	124–125
253.	3.	මණිකණ්ඨ	,, ...	124–127
254.	4.	කුණ්ඩකකුච්ඡිසින්ධව	.. .	126–127
655.	5.	සුක	,, ...	126–127
256.	6.	ජරූදපාන	,, ...	126–129
257.	7.	ගාමණිචණ්ඩ	,, ...	128–129
258.	8.	මන්ධාතු	,, ...	128–129
259.	9.	තිරීටවච්ඡ	,, ...	128–131
260.	10.	දූත	,, ...	130–131

2. පදුමවග්ගො 132 – 137

261.	1.	පදුම	ජාතකං	132–133
262.	2.	මුදුපාණි	,, ...	132–133
263.	3.	චූලපලොභන	,, ...	132–133
264.	4.	මහාපණාද	,, ...	132–135
265.	5.	ඛුරප්ප	,, ...	134–135
266.	6.	වාතග්ග	,, ...	134–135
267.	7.	කක්කටක	,, ...	134–135
268.	8.	ආරාම දූසක	,, ...	136–137
269.	9.	සුජාත	,, ...	136–137
270.	10.	උලූක	,, ...	136–137

3. අරඤ්ඤවග්ගො 138 – 145

271.	1.	උදපානදූසක	ජාතකං	138–139
272.	2.	ව්‍යග්ඝ	,, ...	138–139
273.	3.	කච්ඡප	,, ...	138–139
274.	4.	ලොල	,, .. .	140–141
275.	5.	රුචිර	,, ...	140–141
276.	6.	කුරුධම්ම	,, ...	140–143
277.	7.	රොමක	,, ...	142–143
278.	8.	මහිස	,, ...	142–143
279.	9.	සතපත්ත	,, ...	144–145
280.	10.	පුටදූසක	,, ...	144–145

3. තික නිපාතො 124–161

4. අබ්භන්තරවග්ගො 146 – 153

ජාතක සංඛ්‍යා		ජාතකනාම				පිට්ඨඞ්කා
281.	1.	අබ්භන්තර	ජාතකං	..	..	146–147
286.	2.	සෙය්‍යංස	,,	..	..	146–147
283.	3.	වඩ්ඪකීසූකර	,,	..	..	146–149
284.	4.	සිරි	,,	..	..	148–149
285.	5.	මණිසූකර	,,	..	..	148-149
286.	6.	සාලූක	,,	..	..	150–151
287.	7.	ලාභගරහ	,,	..	..	150–151
288.	8.	මච්ඡුද්දන	,,	..	..	150–153
289.	9.	නානාච්ඡන්ද	,,	..	..	152–153
290.	10.	සීලවීමංස	,,	-	..	152–153

5. කුම්භවග්ගො 154 – 161

291.	1.	භද්‍රඝට	ජාතකං	..	..	154–155
292.	2.	සුපත්ත	,,	..	..	154–155
293.	3.	කායවිච්ඡන්ද	,,	..	..	154–155
294.	4.	ජම්බුඛාදක	,,	..	..	156–157
295.	5.	අන්ත	,,	..	..	156–157
296.	6.	සමුද්ද	,,	..	..	156–157
297.	7.	කාමවිලාප	,,	..	..	158–159
298.	8.	උදුම්බර	,,	..	..	158–159
299.	9.	කොමායපුත්ත	,,	..	..	158–161
300.	10.	වක	,,	..	..	160–161

4. චතුක්කනිපාතො 162 – 205

1. විවරවග්ගො 162 – 171

301.	1.	චුල්ලකාලිඞ්ග	ජාතකං	..	..	162–163
302.	2.	මහාඅස්සාරොහ	,,	..	..	162–165
303.	3.	ඒකරාජ	,,	..	..	164–165
304.	4.	දද්දර	,,	..	..	164–167
305.	5.	සීලවීමංස	,,	..	..	164–167
306.	6.	සුජාතා	,,	..	..	166–169
307.	7.	පලාස	,,	..	..	168–169
308.	8.	ජවනසකුණ	,,	..	..	168–169
309.	9.	ඡවක	,,	..	..	170–171
310.	10.	සයහ	,,	..	..	170–171

4. චතුක්ක නිපාතො 162–205

2. පුචිමන්දවග්ගො 172 – 179

ජාතක සංඛ්‍යා		ජාතකනාම				පිට්ඨඞ්කා
311.	1.	පුචිමන්ද	ජාතකං	..	..	172–173
312.	2.	කස්සපමන්දිය	,,	..	..	172–173
313.	3.	ඛන්තිවාදී	,,	..	..	172–175
314.	4.	ලොහකුම්භි	,,	..	..	174–175
315.	5.	මංස	,,	..	..	174–175
316.	6.	සස	,,	..	..	174–177
317.	7.	මතරොදන	,,	..	..	176–177
318.	8.	කණවෙර	,,	..	..	178–179
319.	9.	තිත්තිර	,,	..	..	178–179
320.	10.	සුච්චජ	,,	..	..	178–179

3. කුටිදූසකවග්ගො 180 – 187

321.	1.	කුටිදූසක	ජාතකං	..	..	180–181
322.	2.	දද්දභ	,,	.	..	180–181
323.	3.	බ්‍රහ්මදත්ත	,,	..	..	180–183
324.	4.	චම්මසාටක	,,	..	..	182–183
325.	5.	ගොධ	,,	..	..	182–183
326.	6.	කක්කාරු	,,	..	..	182–185
327.	7.	කාකාතී	,,	..	..	184–185
328.	8.	අනනුසොචිය	,,	..	..	184–185
329.	9.	කාළබාහු	,,	..	..	186–187
330.	10.	සීලවීමංස	,,	..	..	186–187

4. කොකාලිකවග්ගො 188 – 195

331.	1.	කොකාලික	ජාතකං	..	..	188–189
332.	2.	රථලට්ඨි	,,	..	..	188–189
333.	3.	පක්කගොධ	,,	..	..	188–191
334.	4.	රාජොවාද	,,	..	..	190–191
335.	5.	ජම්බුක	,,	..	..	190–191
336.	6.	බ්‍රහාඡත්ත	,,	..	..	192–193
337.	7.	පීඨ	,,	..	..	192–193
338.	8.	ථුස	,,	..	..	192–193
339.	9.	බාවෙරු	,,	..	..	194–195
340.	10.	විසය්හ	,,	..	..	194–195

4. චතුක්ක නිපාතො 162–205

5. චූලකුණාලවග්ගො 196 - 205

ජාතක සංඛ්‍යා		ජාතකනාම				පිට්ඨඞ්කා
341.	1.	කින්නරී	ජාතකං	..	..	196–197
342.	2.	වානර	,,	..	..	196–197
343.	3.	කුන්තිනී	,,	..	..	198–199
344.	4.	අම්බචොර	,,	..	..	198–199
345.	5.	ගජකුම්භ	,,	..	..	200–201
346.	6.	කෙසව	,,	..	..	200–201
347.	7.	අයකූට	,,	..	..	200–203
348.	8.	ආරඤ්ඤ	,,	..	..	202–203
349.	9.	සන්ධිභෙද	,,	..	..	202–205
350.	10.	දෙවතාප	,,	..	..	204–205

5. පඤ්චකනිපාතො 206 – 233

1. මණිකුණ්ඩලවග්ගො 206 – 217

351.	1.	මණිකුණ්ඩල	ජාතකං	..	..	206–207
352.	2.	සුජාත	,,	..	..	206–207
353.	3.	ධොනසාඛ	,,	..	..	208–209
354.	4.	උරග	,,	..	..	210–211
355.	5.	ඝත	,,	..	..	210–213
356.	6.	කාරණ්ඩිය	,,	..	..	212–213
357.	7.	ලටුකික	,,	..	..	214–215
358.	8.	චූලධම්මපාල	,,	..	..	214–215
359.	9.	සුවණ්ණමිග	,,	..	..	216–217
360.	10.	සුසන්ධි	,,	..	..	216–217

2. වණ්ණාරොහවග්ගො 218 – 227

361.	1.	වණ්ණාරොහ	ජාතකං	..	..	218–219
362.	2.	සීලවීමංස	,,	..	..	218-219
363.	3.	හිරි	,,	..	..	220–221
364.	4.	ඛජ්ජොපණක	,,	..	..	220–221
365.	5.	අහිතුණ්ඩික	,,	..	..	222–223
366.	6.	ගුම්බිය	,,	..	..	222–223
367.	7.	සාලිය	,,	..	..	224-225
368.	8.	තවසාර	,,	..	..	224–225
369.	9.	මිත්තවින්දක	,,	..	..	226–227
370.	10.	පලාස	,,	..	..	226-227

5. පඤ්චකනිපාතො 206-233

3. අඩ්ඪවග්ගො 228 - 233

ජාතක සංඛ්‍යා		ජාතකනාම				පිටඞ්කා
371.	1.	දීඝිතිකොසල	ජාතකං	..	..	228-229
372.	2.	මිගපොතක	,,	..	..	228-231
373.	3.	මූසික	,,	..	..	230-231
374.	4.	චූළධනුග්ගහ	,,	..	..	230-233
375.	5.	කපොත	,,	..	..	232-233

6. ඡක්කනිපාතො 234 - 263

1. අවාරියවග්ගො 234 - 249

376.	1.	අවාරිය	ජාතකං	..	..	234-235
377.	2.	සෙතකෙතු	,,	..	..	233-237
378.	3.	දරීමුඛ	,,	..	..	236-239
379.	4.	නෙරු	,,	..	..	238-239
380.	5.	ආසඞ්ක	,,	..	..	238-241
381.	6.	මිගාලොප	,,	..	..	240-241
382.	7.	සිරිකාලකණ්ණි	,,	..	..	242 245
383.	8.	කුක්කුට	,,	..	..	246-247
384.	9.	ධම්මධජ	,,	..	..	246-249
385.	10.	නන්දියමිග	,,	..	..	248-249

2. සෙනකවග්ගො 250 - 263

386.	1.	ඛරපුත්ත	ජාතකං	..	..	250-251
387.	2.	සූචි	,,	..	..	250-253
388.	3.	තුණ්ඩිල	,,	..	..	252-253
389.	4.	සුවණ්ණකක්කටක		..	..	254-255
390.	5.	මය්හක	,,	..	..	256-257
391.	6.	ධජවිහෙඨ	,,	..	..	256-259
392.	7.	භිසපුප්ඵ	,,	..	..	258-259
393.	8.	විසාස	,,	..	..	260-261
394.	9.	වට්ටක	,,	..	..	260-261
395.	10.	කාක	,,	..	..	262-263

7. සත්තකනිපාතො 264 – 301

1. කුක්කුවග්ගො 264 – 281

ජාතක සංඛ්‍යා		ජාතකනාම		පිට්ඨඞ්කා
396.	1.	කුක්කු	ජාතකං	264–265
397.	2.	මනොජ	,,	266-267
398.	3.	සුතනු	,,	266–269
399.	4.	ගිජ්ඣ	,,	268–269
400.	5.	දබ්භ	,,	270–271
401.	6.	දසණ්ණක	,,	272–273
402.	7.	සත්තුභස්ත	,,	272-275
403.	8.	අට්ඨිසෙන	,,	274–277
404.	9.	කපි	,,	276–279
405.	10.	බකබ්‍රහ්ම	,,	278-281

2. ගන්ධාරවග්ගො 282 – 301

406.	1.	ගන්ධාර	ජාතකං	282–283
407.	2.	මහාකපි	,,	282-285
408.	3.	කුම්භකාර	,,	284–287
409.	4.	දළ්හධම්ම	,,	286–289
410.	5.	සොමදත්ත	,,	288-289
411.	6.	සුසීම	,,	290–291
412.	7.	කොට්සිම්බලි	,,	292–293
413.	8.	ධූමකාරී	,,	292–295
414.	9.	ජාගර	,,	294–295
415.	10.	කුම්මාසපිණ්ඩ	,,	296–299
416.	11.	පරන්තප	,,	298–301

8. අට්ඨකනිපාතො 302 – 323

1. කච්චානිවග්ගො 302 – 323

417.	1.	කච්චානි	ජාතකං	302–305
418.	2.	අට්ඨසද්ද	,,	304–305
419.	3.	සුලසා	,,	306-307
420.	4.	සුමඞ්ගල	,,	306–311
421.	5.	ගඞ්ගමාල	,,	310–313
422.	6.	චෙතිය	,,	312–315
423.	7.	ඉන්ද්‍රිය	,,	314–317
424.	8.	ආදිත්ත	,,	316–319
425.	9.	අට්ඨාන	,,	318-321
426.	10.	දීපි	,,	320–323

9. නවකනිපාතො 324 – 347

2. ගිජ්ඣවග්ගො 324 – 347

ජාතක සංඛ්‍යා		ජාතකනාම		පිට්ඨඞ්කා
427.	1.	ගිජ්ඣ	ජාතකං	324–325
428.	2.	කොසම්බ	,,	326–327
429.	3.	මහාසුක	,,	328–331
430.	4.	චුල්ලසුක	,,	330–333
431.	5.	හාරිත	,,	332–333
432.	6.	පදමාණවක	,,	334–335
433.	7.	ලොමසකස්සප	,,	336–337
434.	8.	චක්කවාක	,,	336–339
435.	9.	හලිද්දිරාග	,,	340–341
436.	10.	සමුග්ග	,,	342–345
437.	11.	පූතිමංස	,,	344–345
438.	12.	තිත්තිර	,,	344–347

10. දසකනිපාතො 348 – 387

439.	1.	චතුද්වාර	ජාතකං	348–349
440.	2.	කණ්හ	,,	348–351
441.	3.	චතුපොසථික	,,	352–355
442.	4.	සඞ්ඛ	,,	354–357
443.	5.	චුල්ලබොධි	,,	358–361
444.	6.	කණ්හදීපායන	,,	360–363
445.	7.	නිග්‍රොධ	,,	364–365
446.	8.	තක්කල	,,	366–369
447.	9.	මහාධම්මපාල	,,	368–371
448.	10.	කුක්කුට	,,	372–373
449.	11.	මට්ඨකුණ්ඩලී	,,	374–375
450.	12.	බිළාරකොසිය	,,	376–377
451.	13.	චක්කවාක	,,	378–379
452.	14.	භූරිපඤ්ඤ	,,	380–383
453.	15.	මහාමඞ්ගල	,,	382–385
454.	16.	ඝතපණ්ඩිත	,,	384–387

11. එකාදසකනිපාතො 388 – 411

ජාතක සංඛ්‍යා		ජාතකනාම		පිටඞ්ක
455.	1.	මාතුපොසක	ජාතකං	388–389
456.	2.	ජුණ්හ	,,	390–393
457.	3.	ධම්ම	,,	392–395
458.	4.	උදය	,,	396–401
459.	5.	පානීය	,,	400–403
460.	6.	යුධඤ්ජය	,,	402–405
461.	7.	දසරථ	,,	404–407
462.	8.	සංවර	,,	406–409
463.	9.	සුප්පාරක	,,	408–411

12. ද්වාදසකනිපාතො 412 – 441

464.	1.	චූළකුණාල	ජාතකං	412–415
465.	2.	භද්දසාල	,,	414–417
466.	3.	සමුද්දවාණිජ	,,	416–421
467.	4.	කාම	,,	420–423
468.	5.	ජනසන්ධ	,,	422–425
469.	6.	මහාකණ්හ	,,	424–427
470.	7.	කොසිය	,,	426–431
471.	8.	මෙණ්ඩකපඤ්හ	,,	432–435
472.	9.	මහාපදුම	,,	434–437
443.	10.	මිත්තාමිත්ත	,,	438–441

13. තෙරසකනිපාතො 442 – 475

474.	1.	අම්බ	ජාතකං	442–445
475.	2.	ඵන්දන	,,	446–449
476.	3.	ජවනහංස	,,	448–451
477.	4.	චුල්ලනාරද	,,	450–453
478.	5.	දූත	,,	452–455
479.	6.	කාලිඞ්ගබොධි	,,	456–461
480.	7.	අකිත්ති	,,	460–465
481.	8.	තක්කාරිය	,,	464–467
482.	9.	රුරුමිග	,,	468–471
483.	10.	සරභමිග	,,	470–475

පකිණ්ණකනිපාතො 476 –535

ජාතක සංඛ්‍යා		ජාතකනාම				පිට්ඨඞකා
484.	1.	සාලිකෙදර	ජාතකං	..	..	476–479
485.	2.	චන්‍දකින්නර	,,	..	..	478–485
486.	3.	මහාඋක්කුස	,,	..	..	486–491
487.	4.	උද්දාලක	,,	..	..	490–493
488.	5.	භිස	,,	..	..	494–499
489.	6.	සුරුචි	,,	..	..	500–503
490.	7.	පඤ්චුපොසථ	,,	..	..	504–509
491.	8.	මහාමොර	,,	..	..	508–513
492.	9.	තච්ඡසූකර	,,	..	..	512–517
493.	10.	මහාවාණිජ	,,	..	..	516–519
494.	11.	සාධීන	,,	..	..	520–523
495.	12.	දසබ්‍රාහ්මණ	,,	..	..	524–531
496.	13.	භික්ඛාපරම්පර	,,	..	..	532–535

සුත්තන්තපිටකෙ ඛුද්දකනිකායො

ජාතකපාලි

පඨමො භාගො

සුත්තන්තපිටකෙ-ඛුද්දකනිකායෙ

ජාතකපාළි

(පඨමො භාගො)

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

එකකනිපාතො

1. අපණ්ණකවග්ගො

1. අපණ්ණකං ඨානමෙකෙ දුතියං ආහු තක්කිකා,
එතදඤ්ඤාය මෙධාවී තං ගණ්හෙ යදපණ්ණකන්ති[1].

1. අපණ්ණකජාතකං.

2. අකිලාසුනො වණ්ණුපථෙ[2] ඛණන්තා
උදඞ්ගණෙ තත්ථ පපං අවින්දුං,
එවං මුනී විරියබලූපපන්නො[3]
අකිලාසු වින්දෙ හදයස්ස සන්තින්ති.

2. වණ්ණුපථජාතකං[4].

3. ඉධ චෙ හි නං[5] විරාධෙසි සද්ධම්මස්ස නියාමතං[6],
චිරං ත්වං අනුතපෙස්සසි[7] සෙරිවායංව වාණිජො.

3. සෙරිවාවාණිජජාතකං[8].

4. අප්පකෙනපි මෙධාවී පාභතෙන විචක්ඛණො,
සමුට්ඨාපෙති අත්තානං අණුං අග්ගිංව සන්ධමන්ති.

4. චුල්ලසෙට්ඨිජාතකං[9]

---

1. තං ගණ්හෙය්‍ය අපණ්ණකං - මජසං.
2. වණ්ණුපථෙ - මජසං.
3. මුනි විරිය - මජසං, ස්‍යා.
4. වණ්ණුපථ මජසං.
5. ඉධචෙතං - මජසං, ස්‍යා.
6. නියාමකං - මජසං, ස්‍යා.
7. අනුතපෙස්සි - මජසං ස්‍යා.
8. සෙරිව. ස්‍යා. සෙරිවවාණිජ. - මජසං.
9. චුල්ලක - මජසං, ස්‍යා.

සූත්‍රාන්තපිටකයෙහි-ඛුද්දකනිකායෙහි

ජාතකපාලි

(ප්‍රථම භාගය)

ඒ භගවත් අර්හත් සම්මා සම්බුද්ධරජාණන් වහන්සේට
නමස්කාර වේවා.

ඒකකනිපාතය.

1. අපණ්ණක වර්ගය.

1. බොධිසත්ත්වාදි නුවණැති සමහර කෙනෙක් අවිරුද්ධ වූ කාරණය (අපණ්ණක ප්‍රතිපදාව=නිසි මඟ) ගත්හ. (තම තමන්ගේ උත්ප්‍රෙක්ෂායෙන් කල්පනා කරන) තාර්කිකයෝ සාපරාධ වූ දෙවැනි කාරණය (නො මග) ගත්හ. ප්‍රශස්ත බුද්ධි ඇත්තේ මේ මඟ නො මඟ දැනැගෙනැ නිසි මඟ මැ ගන්නේ යැ.

1. අපණ්ණක ජාතකය.

2. පටන් ගන්නා ලද වීර්‍ය්‍ය ඇති උත්තමයෝ අඩගණ සඞ්ඛ්‍යාත අනාවර්තක භූමිප්‍රදෙශ ඇති වැලිමඟෙහි බිම සාරන්නාහු ඒ වාලුකාමාර්ගයෙහි ජලය ලදහ. එපරිද්දෙන් වීර්‍ය්‍යයෙනුදු කායබල ඥනබලයෙනුදු යුක්ත වූ වීර්‍ය්‍යවත් තපස්වී තෙමේ සිතට හා හෘදයට ද ශීතලභාව කරණයෙන් ශාන්ති නම් වූ (ධ්‍යානවිදර්ශනා-අභිඥ අර්හන්මාර්ග සඞ්ඛ්‍යාත) ආර්‍ය්‍යධර්මය ලබන්නේ යැ.

2. වණ්ණුපථ ජාතකය.

3. මේ ශාසනයෙහි සද්ධර්මයට ප්‍රතිනියත වූ ඒ ශ්‍රොත ආපත්ති මාර්ගය යම් හෙයකින් (වීර්‍ය්‍ය නොවැඩීම නිසා) වැරදවූයෙහි නම් තෝ බොහෝ කාලයක් තැවෙන්නෙහි ය. සෙරිවා නම් වෙළෙන්ද (ලක්ෂයක් අගනා) ස්වර්ණ පාත්‍රය නො ලැබීමෙන් යම්සේ තැවුණේ ද එලෙසිනි.

3. සෙරිවාවාණිජ ජාතකය.

4. වෙළෙඳාමෙහි දක්ෂ වූ නුවණැත්තේ ස්වල්ප වූ බඩු මිලයෙන් (මහත් ධනය ද යශස ද උපදවා) තමන් (උසස් තැනැ) පිහිටුවයි. ඒ කෙසේ ද යත්: මුඛ වාතයෙන් පිඹ දල්වා ගන්නා වූ මඳවූ ගින්නක් මෙනි.

4. චුල්ලසෙට්ඨි ජාතකය.

5. කිමග්ඝති[1] තණ්ඩුලනාළිකාය
අස්සාන මූලාය වදෙහි රාජ[2],
බාරාණසිං සන්තරබාහිරන්තං[3]
අයමග්ඝති තණ්ඩුලනාළිකාති.*

5. තණ්ඩුලනාළිජාතකං.

6. හිරිඔත්තප්පසම්පන්නා සුක්කධම්මසමාහිතා,
සන්තො සප්පුරිසා ලොකෙ දෙවධම්මාති වුච්චරෙති.

6. දෙවධම්මජාතකං.

7. පුත්තො ත්‍යාහං මහාරාජ ත්වං මං පොස ජනාධිප,
අඤ්ඤෙපි දෙවො පොසෙති කිඤ්ච දෙවො සකං පජන්ති.

7. කට්ඨහාරි[4]ජාතකං.

8. අපි අතරමානානං ඵලාසාව සමිජ්ඣති,
විපක්කබ්‍රහ්මචරියොස්මි එවං ජානාහි ගාමණීති.

8. ගාමණීජාතකං.

9. උත්තමඞ්ගරුහා මය්හං ඉමෙ ජාතා වයොහරා,
පාතුභූතා දෙවදූතා පබ්බජ්ජාසමයො මමාති.

9. මඛාදෙව[5]ජාතකං.

10. යඤ්ච අඤ්ඤෙනුරක්ඛන්ති යො ච අඤ්ඤෙ න රක්ඛති,
ස වෙ රාජ සුඛං සෙති කාමෙසු අනපෙක්ඛවාති.

10. සුඛවිහාරිජාතකං.

අපණ්ණකවග්ගො පඨමො.

තස්සුද්දානං:

වරාපණ්ණකවණ්ණුපථසෙරිවරො
සුවිචක්ඛණතණ්ඩුලනාළිකස්සං,
හිරිපුත්තවරුත්තමගාමණිනා
යො ච න රක්ඛති තෙන දස.

---

1. කිං අග්ඝති – මජසං.
2. රාජා. – මජසං.
3. බාරාණසී සන්තරබාහිරතො – මජසං
4. කට්ඨවාහන – මජසං.
5. දෙවදූත. ස්‍යා. මඝදෙව – මජසං.

* ස්‍යා. කිමග්ඝති තණ්ඩුලනාළිකාච බාරාණසී අන්තරබාහිරානි, අස්සපඤ්චසතෙනාති එකා තණ්ඩුලනාළිකාති.

5. රජතුමනි, (පන්සියයක්) අසුන්ගේ මිල සඳහා වූ සහල් නැළිය කුමක් අගනේ ද යි කිව මැනැවැ යි. අස් වෙළෙඳ තෙමේ රජහට කීයේ ය. නැවැත රජු විසින් විමසනු ලැබූ බඩු මිල කරන්නා මේ සහල් නැළිය අගනුවරත් ගම් නියම් ගමුත් සහිත බරණැස් රාජ්‍යය ම අගනේයැ යි කී ය.

5. තණ්ඩුලනාළි ජාතකය.

6. (දුසිරිතෙහි පිළිකුල ඇති කරන) හිරියෙන් ද (දුසිරිතෙහි) බියෙන් ද සම්පූර්ණ වූ, කුශල ධර්‍මයන්ගෙන් සමන්විත වූ ශාන්ත වූ සත්පුරුෂයෝ සත්ත්ව ලෝකයෙහි දෙවධර්‍ම ඇත්තෝ ය යි කියනු ලැබෙත්.

6. දෙවධර්‍ම ජාතකය.

7. මහරජ, මම ඔබගේ (අත්‍රජ) පුත්‍රයෙමි. ජනප්‍රධානය මා පොෂණය කර. රජතෙමේ සෙවක මිනිසුන් හා තිරිසනුන් ද යන අන්‍යයන් පොෂණය කෙරෙයි. ස්වකීය ප්‍රජාව වූ මා කුමක් නිසා පොෂණය නො කරන්නේ ද?

7. කට්ඨහාරි ජාතකය.

8. නුවණැත්තන්ගේ අවවාදයෙහි පිහිටා, ඉක්මන් නොවී උපාය ක්‍රමයෙන් කර්‍මාන්තයෙහි යෙදෙනවුන්හට ප්‍රාර්ථනා කළ ප්‍රයොජනයෙහි ආශාව නොහොත් බලාපොරොත්තු වූ ඵලය සමෘද්ධ වේ ම ය. (සතර සඞ්ග්‍රහ වස්තු මූලක යශඃ සම්පත්තීන් මුහුකරවා සිටි බැවින්) පරිපක්ව බ්‍රහ්මචර්‍ය්‍යා ඇත්තෙම් වෙමි. ගාමණිය, (ඔබ උසස් බවට පැමිණි සැටි) මෙසේ දනුව.

8. ගාමණිචණ්ඩ ජාතකය.

9. මාගේ උත්තමාඞ්ගයෙහි (හිසෙහි) හටගත්තා වූ වයස හැර ගන්නා වූ මේ නර (පැසුණු) කෙස්හු උපන්හ. මරණයට ළඟ බව කියන නරකෙස් නම් වූ දෙවදූතයෝ පහළ වූහ. දැන් මාගේ පැවිද්දට කාල යැ යි.

9. මඛාදෙව ජාතකය.

10. සෙසු බොහෝ පුද්ගලයෝ යමකු රක්‍ෂා නො කෙරෙත් ද මහරජ ඒ පුද්ගල තෙමේ (වස්තුකාම ක්ලෙශකාමයන්හි) අපෙක්‍ෂා නැත්තේ ඒකාන්තයෙන් ම කායවිවේක චිත්ත විවේක සැපයෙන් වාස කෙරෙයි.

10. සුඛවිහාරි ජාතකය.

පළමු වන අපණ්ණක වර්ග යි.

එහි උද්දන:

උතුම් අපණ්ණක-වණ්ණුපථ-උතුම් සෙරිවා (වාණිජ) සුවිචක්ඛණ (චුල්ලසෙට්ඨි) තණ්ඩුලනාළි-හිරි (දෙවධර්‍ම) පුත්ත (කට්ඨහාරි) වරුත්ත (මඛාදෙව) ගාමණි යොව නරකඛත් (සුඛවිහාරී) යන්න හා දස ජාතකයෝ ය.

2. සීලවග්ගො

11. හොති සීලවතං අත්ථො පටිසන්ථාර[1]වුත්තිනං,
ලක්ඛණං පස්ස ආයන්තං ඤාතිසඞ්ඝපුරක්ඛතං
අථ පස්සසිමං කාළං සුවිහීනංව ඤාතිභීති.

1. ලක්ඛණමිගජාතකං[2].

12. නිග්‍රොධමෙව සෙවෙය්‍ය න සාඛමුපසංවසෙ[3],
නිග්‍රොධස්මිං මතං සෙය්‍යො යඤ්චෙ සාඛස්මිං ජීවිතන්ති.

2. නිග්‍රොධමිගජාතකං[4].

13. ධිරත්ථු කණ්ඩිනං සල්ලං පුරිසං ගාළ්හවෙධිනං,
ධිරත්ථු තං ජනපදං යත්ථිත්ථී පරිනායිකා,
තෙ චාපි[5] ධික්කිතා සත්තා යෙ ඉත්ථීනං වසං ගතාති.

3. කණ්ඩිනජාතකං[6].

14. න කිරත්ථි රසෙහි පාපියො
ආවසෙහි වා සන්ථවෙහි වා,
වාතමිගං ගෙහනිස්සිතං[7]
වසමානෙසි රසෙහි සඤ්ජයොති.

4. වාතමිගජාතකං

15. අට්ඨඛුරං[8] ඛරාදියෙ මිගං වඞ්කාතිවඞ්කිනං,
සත්තහි කලාහතික්කන්තං[9] න තං ඔවදිතුස්සහෙති.

5. ඛරාදියජාතකං.

16. මිගං තිපල්ලත්ථමනෙකමායං
අට්ඨඛුරං අඩ්ඪරත්තාවපායිං[10],
එකෙන සොතෙන ඡමාස්සසන්තො
ඡහි කලාහතිභොති භාගිනෙය්‍යොති.

6. තිපල්ලත්ථමිගජාතකං[11].

1. පටිසන්ධාර - මජසං.
2. ලක්ඛණජාතකං - මජසං, ස්‍යා.
3. නසාඛං උපසංවසෙ - ස්‍යා.
4. නිග්‍රොධජාතකං - මජසං, ස්‍යා.
5. තෙවාපි - ස්‍යා.
6. කණ්ඩිජාතකං - මජසං.
7. ගහනනිස්සිතං - මජසං ස්‍යා.
8. අට්ඨක්ඛුරං - මජසං, ස්‍යා,
9. සත්තහි කාලාතික්කන්තං ස්‍යා. සත්තකාලෙහතික්කන්තං - මජසං.
10. අට්ඨක්ඛුර අඩ්ඪරත්තාපපායි. - මජසං, ස්‍යා.
11. තිපල්ලත්ථජාතකං - මජසං.

2. සීල වර්ගය

11. සිල්වත් වූ හෙවත් ආචාර සම්පන්න වූ (ආමිස පටිසන්ථාර ධම්ම පටිසන්ථාර යන) පිළිසඳර පෙවෙතින් යුක්ත වූවනට අභිවෘද්ධි (සිදු) වන්නේ ය. ඥාති සමූහයා විසින් පිරිවරන ලදුව එන්නා වූ ලක්ෂණ (මෘග) යා බලව. වැලි දූ නෑයන්ගෙන් විශෙෂයෙන් හීන වූ මේ කාල (මෘග) යා බලව. මේ දෙදෙනා දෙස බැලීමෙන් සිල්වත් බව හා පිළිසඳර පෙවෙත හා දෙක්හි වෙනස දතහේ යැ යූ සේ යි.

1. ලක්ඛණමිග ජාතකය.

12. (දියුණුව කැමැත්තේ වී නම්) න්‍යග්‍රොධ මෘගරාජයා සෙවනය කරන්නේ ය. සාඛ මෘගයා කරා නො එළඹෙන්නේ ය. සාඛ මෘගයා සමීපයෙහි යම් ජීවත් වීමෙක් ඇද්ද (එයට වඩා) න්‍යග්‍රොධ මෘගරාජයා පාමුලැ (වැදූහෙව) මිය යෑම උතුම් වන්නේ ය.

2. න්‍යග්‍රොධමිග ජාතකය.

13. කණ්ඩින නම් ශරය ඇති දඬි කොට විදිනා වූ පුරුෂයාට නින්ද වේවා ! යම් ජනපදයෙක්හි ස්ත්‍රියක් තොමෝ පරිණායිකා වන්නී ද ඒ ජනපදයට නින්ද වේවා ! යම් කෙනෙක් ස්ත්‍රීන්ගේ වසයට ගියාහු ද ඒ සත්ත්වයෝ ද නින්දිතයහ.

3. කණ්ඩින ජාතකය.

14. නිරන්තර වාසස්ථාන වූ ආවාසයෙහි ද මිත්‍ර සන්ථවයෙහි ද (ඡන්දරාගය) ලාමක ය. දිවට දැනෙන රසයෙහි ඡන්දරාගය යටැ කී දෙකරුණෙහි ඇල්මට වඩා ලාමකතරය. ඊට වඩා අධික ඡන්දරාගයක් නො ම ඇත්තේල. සඤ්ජය නම් උයන්පලු තෙමේ වනගහන ස්ථානයෙහි වූ වාතමෘගයා රසයෙන් පොලොඹවා තමාගේ වසයට පැමිණැවීය.

4. වාතමිග ජාතකය.

15. බරාදිය නමැත්තිය කුර අටක් ඇති මුලින් වක් වූ අං ඇති හෙයින් වඩ්කාතිවඩ්කිත වූ අවවාද කාලසතක් ඉක්මවා සිටි අකීකරු ඒ මෘගයාට අවවාද කරන්නට උත්සාහ නැත්තෙමි.

5. බරාදිය ජාතකය.

16. සහෝදරිය, ත්‍රිවිධාකාරයෙකින් ශයනය කරන්නා වූ අට කුරයක් ඇති බොහෝ මෘගමායා දන්නා වූ මධ්‍යම රාත්‍රියෙහි පැන් බොන්නා වූ (බෑනණු) මෘගයාට (මෘගමායා) හොඳින් ඉගැන්වීමි. (ඒ කෙසේ ද යත්) යට වූ එක් නාසිකා ශ්‍රොතසකින් පොළොවට ආශ්වාස හරනේ සවැදෑරුම් මෘගමායා කලාවෙන් බෑනණු තෙමේ වැද්ද වංචා කරන්නේ ය.

6. තිපල්ලත්ථමිග ජාතකය.

17. කාළෙ[1] වා යදි වා ජුණ්හෙ යදා වායති මාලුතො,
වාතජානි හි සීතානි උභොත්ථමපරාජිතාති.

7. මාලුතජාතකං.

18. එවඤ්චෙ සත්තා ජානෙය්‍යුං දුක්ඛායං ජාතිසම්භවො.
න පාණො පාණිනං හඤ්ඤෙ පාණඝාතී හි සොචතීති.

8. මතකභත්තජාතකං.

19. සචෙ මුඤ්චෙ පෙච්ච මුඤ්චෙ[2] මුච්චමානො හි බජ්ඣති,
නහෙවං ධීරා මුච්චන්ති මුත්ති බාලස්ස බන්ධන'න්ති.

9. ආයාචිතභත්තජාතකං.

20. දිස්වා පදමනුත්තිණ්ණං දිස්වා නොතරිතං පදං,
නළෙන වාරිං පිවිස්සාම[3] නෙව මං ත්වං[4] වධිස්සසී'ති.

10. නළපානජාතකං.

සීලවග්ගො දුතියො.

තස්සුද්දානං:

අථලක්ඛණසාඛදිරත්ථුපුන
නකිරත්ථිරසෙහිබරාදියා,
අතිභොතිරසමාලුතපාණ
මුච්චෙචනනළඅවහයනෙත භවන්ති දස.

---

1. කාලෙ – මජසං, සයා.
2. සචෙ මුඤ්චෙ පෙච්ච මුඤ්චෙ, – මජසං.
3. පිස්සාම.
4. න ච මං ත්වං, – මජසං

17. කෘෂ්ණ පක්ෂයෙහි වේවයි ශුක්ල පක්ෂයෙහි වේවයි යම් කාලයෙක්හි වාතය හමා ද (එසමයෙහි ශීත වේ. කුමක් හෙයින් ද යත්:) ශීතයෝ නම් වාතයෙන් හටගන්නාහු ය. එහෙයින් මේ වාදයෙහි ලා සිංහ ව්‍යාඝ්‍ර තෙපි දෙදෙනා ම නො පැරදුණාහුය.

7. මාලුත ජාතකය.

18. මේ (ඒ ඒ තන්හි) ඉපැදීම ද වැඩීම ද (ජරා ව්‍යාධි මරණාදි) දුකට කාරණාවනුයෙන් දුක් වන්නේය යි. සත්ත්වයෝ මෙසේ දන්නාහු නම්, ප්‍රාණයෙක් අන් ප්‍රාණයකු නො නසන්නේ ය. යම් හෙයකින් ප්‍රාණ විනාශය කරන්නේ ශොක කරන්නේ වේ ද එහෙයිනි.

8. මතකභත්ත ජාතකය.

19. ඉදින් අන්තරායවලින් මිදෙනු කැමැත්තේ වී නම් යම්සේ පරලොව්හි කර්මබන්ධනයෙන් නො බැඳේ ද එපරිද්දෙන් මිදෙව. (ප්‍රාණවධාදි දුශ්චරිත කොට දුන්) මිදෙන්නේ ඒකාන්තයෙන් ම (මතු පාප පාශයෙන්) බැඳෙන්නේ ය. නුවණැත්තෝ එපරිද්දෙන් නො මිදෙන්නාහු ම ය. බාලයාගේ මිදීම (තවත්) බැඳීමෙකි. යමෙක් ප්‍රාණවධ කොට අන්තරායෙන් මිදේ ද හේ පරලොව පාප පාශයෙන් නො මිදෙන හෙයින් මිදුණත් බැඳුණාහු නම් වෙති.

9. ආයාචිතභත්ත ජාතකය.

20. දියෙන් ගොඩට නො නැගි පියවර දක (දියෙන් ගොඩට නැගී පියවර නොදක යූ සේ යි.) දියට බට පියවර(ම) දක බට නළින් ජලය බොන්නෙමු. තෝ මා නො නසන්නෙහි ය (නසනු නො හැක්කෙහි ය).

10. නළපාන ජාතකය.

දෙවැනි ශීල වර්ග යි.

එහි උද්දන :

ලක්ඛණ මිග, සාඛ න්‍යග්‍රොධ මිග. ඩිරත්ථු (කණ්ඩින) නකිරත්ථි රස (වාතමිග) ඛරාදිස අතිභොති (තිපල්ලත්ථමිග) මාලුත පාණ(මතක භත්ත) මුච්ච (ආයාචිත භත්ත) නළපාන යන මේ නම් ඇති දසය යි.

3. කුරුඞ්ගවග්ගො

21. ඤාතමෙතං කුරුඞ්ගස්ස යං ත්වං සෙපණ්ණි සෙය්‍යසි,
අඤ්ඤං සෙපණ්ණිං[1] ගච්ඡාමි න මෙ තෙ රුච්චතෙ ඵලන්ති.

1. කුරුඞ්ගමිගජාතකං.

22. යෙ කුක්කුරා රාජකුලම්හි වද්ධා[2]
කොලෙය්‍යකා වණ්ණබලූපපන්නා,
තෙ'මෙ න වජ්ඣා මයමස්ම වජ්ඣා
නායං සඝච්චා[3] දුබ්බලඝාතිකායන්ති.

2. කුක්කුරජාතකං.

23. අපි පස්සෙන සෙමානො සල්ලෙහි සල්ලලීකතො,
සෙය්‍යොව වළවා භොජ්ජො[4] යුඤ්ජ මඤ්ඤෙව සාරථී'ති.

3. භොජාජානීයජාතකං[5].

24. යදා යදා යත්ථ යදා යත්ථ යත්ථ යදා යදා,
ආජඤ්ඤො කුරුතෙ වෙගං හායන්ති තත්ථ වාළවා'ති.

4. ආජඤ්ඤජාතකං.

25. අඤ්ඤමඤ්ඤෙහි තිත්ථෙහි අස්සං පායෙහි සාරථි,
අච්චාසනස්ස පුරිසො[6] පායාසස්සපි තප්පතී'ති.

5. තිත්ථජාතකං.

26. පුරාණචොරාන වචො නිසම්ම
මහිළාමුඛො පොථයමානුචාරී[7]*
සුසඤ්ඤතානං හි වචො නිසම්ම
ගජුත්තමො සබ්බගුණෙසු අට්ඨාති.

6. මහිළාමුඛජාතකං.

---

1. සෙපණ්ණි – මජසං, ස්‍යා.
2. රාජකුලම්හි වඩ්ඪා – ස්‍යා
3. සඝච්ඡා – මජසං.
4. ගොජො ස්‍යා. භොජ්ඣො. – මජසං.
5. භොජානියජාතකං – මජසං.
6. සුහිතො – මජසං.
7. පොථයමනවචාරී – මජසං.

* අනවධාරී අයමෙව වා පාඨොති අට්ඨකථා.

3. කුරුඞ්ග වර්ගය

21. එම්බා ඇද්දෙමට රුක, තෝ යම් හෙයකින් (ඉදිරියෙහි පල) විසුරුවනු වූයෙහි ද මේ කාරණය කුරුඞ්ග මෘගයා දන්නා ලදි. අන් ඇද්දෙමට රුකක් කරා යමි. තාගේ පල මට නො රුස්නේ ය.

1. කුරුඞ්ගමිග ජාතකය.

22. වර්ණයෙන් හා කායබලයෙන් යුක්ත වූ රාජකුලයෙහි උපන් රජගෙයි වැඩුණු යම් බලු කෙනෙක් ඇද්ද, ඒ මේ බල්ලෝ වධයට සුදුස්සෝ නො වෙති. අපි වධයට (විනාශයට) සුදුසුවම්හ. මේ වධය ප්‍රබල වධ නම් නො වේ. මේ දුර්වල වධ නම් වේ.

2. කුක්කුර ජාතකය.

23. ශරයෙන් විදින ලද එහෙයින් ම එක පාර්ශ්වයෙකින් හෝනා ද වූ, භොජාජානීය වූ ජාති සෛන්ධවයා ම බලුඞ්ක අශ්වයාට (සින්ධු දෙශයෙන් අන්‍ය දෙශයෙහි උපන් කුඩා අශ්ව-යාට වඩා) උතුම, සාරථිය, මා මැ යුද්ධයෙහි යොදව.

3. භොජාජානීය ජාතකය.

24. (පෙරවරු ආදි) යම් යම් කාලයෙක්හි වේවා, ග්‍රාමාදි යම් තැනෙක්හි වේවා, යම් ක්‍ෂණයෙක්හි වේවා, (යුද්ධ මණ්ඩලාදි) යම් යම් ස්ථානයෙක්හි වේවා, උපහාර ලැබුම් ආදි යම් යම් කාලයෙක්හි වේවා (සාරථියාගේ අභිප්‍රාය දන්නා සුලුවූ) උතුම් සෛන්ධවයා ම වීර්‍ය්‍ය කිරීමට පටන්ගනී ද එහි දී බලුඞ්ක අශ්වයෝ පිරිහෙත්. (පසුබසිත්)

4. ආජඤ්ඤ ජාතකය.

25. සාරථිය අනෙක් අනෙක් තොටෙකින් අශ්වයා පොව. (නහවව) පුරුෂ තෙමේ අධික කොට කැමෙන් මිහිරි පායාස-යෙන් ද තෘප්ත වේ. (මතු නොකනු කැමැත්තේ වේ.)

5. තිත්ථ ජාතකය.

26. මහිලාමුඛ නම් ඇතා පළමු සොරුන්ගේ (රෞද්‍ර) වචනය අසා (හමු වූවන්) මරමින් සොරුන්ගේ වචනය අනුවැ හැසුරුණේ ය. සුසංයත වූ සිල්වතුන්ගේ මෘදු මොළොක් තෙපුල් අසා උත්තම හස්තියා (පළමු තමා තුළ තුබුණු) සියලු ගුණයෙහි (නැවත) පිහිටියේ ය.

6. මහිලාමුඛ ජාතකය.

27. නාලං කබලං[1] පදාතවෙ
න ච පිණ්ඩං න කුසෙ න ඝංසිතුං,
මඤ්ඤාමි අභිණ්හදස්සනා
නාගො සිනෙහමකාසි[2] කුක්කුරෙති.

7. අභිණ්හජාතකං.

28. මනුඤ්ඤමෙව භාසෙය්‍ය නාමනුඤ්ඤං කුදාචනං
මනුඤ්ඤං භාසමානස්ස ගරුංභාරං උදද්ධරි,
ධනඤ්ච නං අලබ්භෙසි තෙනචත්තමනො අහූ'ති.

8. නන්දිවිසාලජාතකං.

29. යතො යතො ගරුධුරං යතො ගම්භීරවත්තනී,
තදස්සු[3] කණ්හං යුඤ්ජන්ති ස්වාස්සු තං වහතෙ ධුරන්ති.

9. කණ්හජාතකං.

30. මා මුනිකස්ස පිහයි ආතුරන්නානි භුඤ්ජති,
අප්පොස්සුක්කො භුසං ඛාද එතං දීඝායුලක්ඛණන්ති.

10. මුනිකජාතකං.

කුරුඞ්ගවග්ගො තතියො.

තස්සුද්දානං:

කුරුඞ්ගස්ස කුක්කුරභොජවරො
පුන වාළවස්සසිරිවයතො,
මහිළාමුඛනාමනුඤ්ඤවරො
වහතෙධුරමුනිකෙන දස.

1. කබළං - මජසං.
2. සෙනහ - මජසං.
3. තදස්සු - මජසං සයා.

27. (බතට පළමුව දෙන) කටුක බෙහෙත් පිණ්ඩය ගන්නට හෙවත් අනුභව කරන්නට නො සමත් ය. බත් පිඩු ගන්නට ද නො සමත්ය. තෘණ ගන්නට ද නොසමත්ය. (නහවන වේලෙහි) ඇඟ උළාලීමෙහි ද නොසමත් ය. ඇත් තෙමේ නිතර දැකීමෙන් බල්ලා කෙරෙහි ස්නෙහ කෙළේ ය යි හඟිමි.

7. අභිණ්හ ජාතකය.

28. මනොඥ වචනයක් ම කියන්නේ ය. කිසි කලෙක්හිදු අමනොඥ කොට නො බණන්නේ ය. මනොඥ කොට බණන්නහුගේ (ප්‍රමාණ වශයෙන් ගැල් සියයක්) බරවූ සකට භාරය ඉදිරියට ඇදපී ය. එයින් බමුණා ධන ද ලැබ්බවිය. සතුටු සිතැත්තේ ද විය.

8. නන්දිවිසාල ජාතකය.

29. යම් තැනෙක්හි (ගැල්) ධුරය ඉතා බරවේ ද යම් තැනෙක්හි (දිය හා මඩ ඇති බැවින්) ගැඹුරු වූ මාර්ගයෙක් වේ ද එකල්හි කණ්හ නම් බලිවර්දයා (ගොනා) යොදත්. හෙතෙමේ ඒ ධුරය උසුලන්නේ ය.

9. කණ්හ ජාතකය.

30. මුනික නම් ශූකරයාගේ භොජනය ප්‍රාර්ථනා නො කරව. (කුමක් හෙයින් ද යත්) මුනික ශූකර තෙමේ මරණ භොජන අනුභව කරයි. (මධුරාහාරය) අල්පොත්සුක ව තමා විසින් ලබන තෘණපත් අනුභව කරව. මෙය දීර්ඝායු ලක්ෂණයෙකි.

10. මුනික ජාතකය.

තෙවෙනි කුරුඞ්ග වර්ගී සි.

එහි උද්දන:

කුරඞ්ගමිග කුක්කුර භොජාජානීය වාළව (ආජඤ්ඤ) සිරිචය (තිත්ථ) මහිලාමුඛ නාග (අභිණ්හ) මනුඤ්ඤචර (නන්දිවිසාල) වහතෙ (කණ්හ) මුනික යන දසයයි.

4. කුලාවකවග්ගො

31. කුලාවකා මාතලි සිම්බලිස්මිං
ඊසාමුඛෙන පරිවජ්ජයස්සු,
කාමං චජාම අසුරෙසු පාණං
මායිමෙ දිජා විකුලාවා අහෙසු'න්ති[1].

1. කුලාවකජාතකං.

32. රුදං මනුඤ්ඤං රුචියා[2] ච පිට්ඨි
වෙළුරියවණ්ණූපනිභා ච[3] ගීවා,
ව්‍යාමමත්තානි ච පෙඛුණානි[4]
නච්චෙන තෙ ධීතරං නො දදමී'ති.

2. නච්චජාතකං.

33. සම්මොදමානා ගච්ඡන්ති ජාලමාදය පක්ඛිනො,
යද තෙ විවදිස්සන්ති තද එහින්ති මෙ වස'න්ති.

3. සම්මොදමානජාතකං.

34. න මං සීතං න මං උණ්හං න මං ජාලස්මිං බාධනං,
යඤ්ච මං මඤ්ඤතෙ මච්ඡී අඤ්ඤං සො රතියා ගතො'ති.

4. මච්ඡජාතකං.

35. සන්ති පක්ඛා අපතනා සන්ති පාද අවඤ්චනා,
මාතා පිතා ච නික්ඛන්තා ජාතවෙද පටික්කමා'ති.

5. වට්ටකජාතකං.

---

1. මාමෙ දිජා විකුලවා අහෙසුං – මජසං.
2. රුධියා – මජසං.
3. වෙළුරිය වණ්ණසන්නිභා ච – මජසං.
4. පෙක්ඛුණානි – ස්‍යා.

4. කුලාවක වර්ගය

31. මාතලිය, සුපර්ණ පොතකයෝ (ගුරුළු පැටව්) ඉඹුල් වෙනෙහි එලී හොවිති. ඔවුන් රථ ශීර්ෂයෙන් දුරු කරව. (ඔවුන්-ගෙන් රථ ශීර්ෂය දුරු කරව යු සේයි.) අසුරයන් කෙරෙහි ප්‍රාණය හරිම්හ. මේ සුපර්ණ පෝතකයෝ කැදූල්ලෙන් පහවූවාහු නො වෙත්වා.

1. කුලාවක ජාතකය.

32. මයුරය තාගේ ශබ්දය මනොඥ ය. පිට ද සිත්කලු ය. ග්‍රීවය ද වෛදූර්‍ය්‍ය මාණික්‍යයෙහි වර්ණය හා සමාන ය. පිල් ද බඹයක් පමණ ය. (මෙසේ රූපී වුවද ලජ්ජා භය නැති) නැටීම හෙතු කොට තට මාගේ දුව නො දෙමි.

2. නච්ච ජාතකය.

33. වටු පක්ෂීහු සමගි වූවාහු වෙත්. විවාද නො කරන්නාහු දැල ඔසවාගෙන යෙති. ඔවුහු යම් කලෙක්හි විවාද කෙරෙත් ද එකල්හි මාගේ වසයට එති.

3. සම්මොදමාන ජාතකය.

34. ශීතල මා පෙළන්නේ නො වෙයි. උෂ්ණය මා පෙළන්නේ නො වෙයි. දැළෙහි බැඳීම ද මා පෙළන්නේ නො වෙයි. යම් හෙයෙකින් මා නො දක්නා වූ මත්ස්‍යධෙනු තොමෝ හේ (මත්-ස්‍යයා) අන්‍ය මත්ස්‍ය ධෙනුවක හා කාමරතිය පිණිස ගියේ යැ යි සිතා ද එය මේ සියලු දුකට වඩා මා පෙළන්නේ ය යි.

4. මච්ඡ ජාතකය.

35. මාගේ පියාපත් ඇත. (එහෙත්) පියාසර කරන්නට අසමර්ථ ය. පාදයෝ ඇත. (එහෙත්) පියවර ගමනින් යන්නට අපොහොසත් ය. මෑණියෝ ද පියාණෝ ද මා හැර ගියහ. ජාත-වෙදය (ගින්න) පහවව. (නවතුව)

5. වට්ටක ජාතකය.

36. යං නිස්සිතා ජගතිරුහං විහඞ්ගමා
ස්වායං අග්ගිං පමුඤ්චති,
දිසා භජථ වක්කඞ්ගා[1]
ජාතං සරණතො භයන්ති.

6. සකුණජාතකං.

37. යෙ වුඩ්ඪමපචායන්ති නරා ධම්මස්ස කොවිදා,
දිට්ඨෙව ධම්මෙ[2] පාසංසා සම්පරායෙ ච සුග්ගතී'ති.

7. තිත්තිරජාතකං.

38. නාච්චන්තං නිකතිප්පඤ්ඤො නිකත්යා සුඛමෙධති,
ආරාධෙති නිකතිප්පඤ්ඤො බකො කක්කටකාමිවා'ති.

8. බකජාතකං.

39. මඤ්ඤෙ සොවණ්ණයො රාසි සොවණ්ණමාලා ච නන්දකො,
යත්ථ දාසො ආමජාතො ඨිතො ථුල්ලානි ගජ්ජතී'ති.

9. නන්දජාතකං.

40. කාමං පතාමි නිරයං උද්ධපාදො අවංසිරො,
නානරියං කරිස්සාමි හන්ද පිණ්ඩං පටිග්ගහා'ති.

10. ඛදිරඞ්ගාරජාතකං.

කුලාවකවග්ගො චතුත්ථො.

තස්සුද්දානං:

සිරිමාතලිධීතරපක්ඛිවරො
රතිරාගතොමාතාපිතා ච පුන,
ජගතීරුහවුඩ්ඪසුකක්කටකො
තථා නන්දකපිණ්ඩවරෙන දස.

---

1. වඞ්කඞ්ගා - සයා.
2. දිට්ඨධම්මෙ ච - සයා.

36. පක්ෂීහු යම් රුකක් ආශ්‍රය කළෝ ද ඒ රුක මැ ගිනි හරනේ යැ. පක්ෂීනි, සරණස්ථානයෙන් හෙවත් පිහිටවනස්ථාන-යෙන් භය උපනි. (එහෙයින්) දිශා භජනය කරව (රුක හැර යව).

6. සකුණ ජාතකය.

37. (වැඩිහිටියන් සැලැකීම නම් වූ) ගුණධර්මයෙහි දක්‍ෂ වූ යම් කෙනෙක් ගුණයෙන් ද වයසින් ද වැඩිහිටියන් පුදත් ද ඔවුහු මෙලොව දී ම පැසැසියයුතු වෙති. පරලොවිහි ද සුගතිය වෙයි.

7. තිත්තිර ජාතකය.

38. වඤ්චන බුද්ධි ඇත්තේ තමාගේ ම වංචා හෙතුවෙන් නිත්‍යයෙන් සුව නො වඩයි. කිසි සුවයෙක්හි නො පිහිටයි. වඤ්චන බුද්ධි ඇත්තේ (තමා කළ වැරදිවල කටුක විපාක) ලබයි. කකුළුවාගෙන් (ගෙල සිඳගත්) කොකා මෙනි.

8. බක ජාතකය.

39. කුලජාත දසියගේ පුත්‍ර වූ නන්‍දක දස තෙමේ යම් තැනෙක්හි සිටියේ පරුෂ කොට ගර්ජනා කෙරේ ද (බෙණේ ද) ස්වර්ණරාශිය ද ස්වර්ණමාලා ද එතැන්හි යැ යි හඟිමි.

9. නන්ද ජාතකය.

40. ඌර්ධවපාද ඇත්තෙමි. අධඃකෘත හිස ඇත්තෙමි. එකාන්-තයෙන් නරකයෙහි වැටෙමි. (එතෙකුදු වුවත් දන් නොදීම සිල් නොරැකීම ආදි) අනාර්‍ය්‍ය ක්‍රියාවක් නො කරමි. එබැවින් පිණ්ඩ නම් ලද බත පිළිගන්නේ මැනැවි.

10. ඛදිරඞ්ගාර ජාතකය.

සිවුවැනි කුලාවක වර්ග යි.

එහි උද්දන :

සිරිමාතලී (කුලාවක) ඊතර (නච්ච) පකබීචර (සම්මෝදමාන) රතිරාගගත (මච්ඡ) මාතාපිතා ච පුන (නැවත වට්ටක) ජගති රුහ (සකුණ) වුඩ්ඪසු (තිත්තිර) කක්කට (බක) තථා නන්‍දක (එසේම නන්‍ද) පිණ්ඩචර (ඛදිරඞ්ගාර) යන්න සමග දසය යි.

5. අත්ථකාමවග්ගො

41. යො අත්ථකාමස්ස හිතානුකම්පිනො
ඔවජ්ජමානො න කරොති සාසනං.
අජියා පාදමොලුබ්භ[1]
මිත්තකො විය සොචතීති.

1. ලොසකජාතකං.

42. යො අත්ථකාමස්ස හිතානුකම්පිනො
ඔවජ්ජමානො න කරොති සාසනං,
කපොතකස්ස වචනං අකත්වා
අමිත්තහත්ථත්ථගතොව සෙතී'ති.

2. කපොතකජාතකං.

43. යො අත්ථකාමස්ස හිතානුකම්පිනො
ඔවජ්ජමානො න කරොති සාසනං,
එවං සො නිහතො සෙති
වෙළුකස්ස යථා පිතා'ති.

3. වෙළුකජාතකං.

44. සෙය්‍යො අමිත්තො මතියා උපෙතො
නත්වෙව මිත්තො මතිවිප්පහීනො,
මකසං වධිස්සන්ති හි එළමූගො
පුත්තො පිතු අබ්භිද උත්තමඞ්ගන්ති.

4. මකසජාතකං.

45. සෙය්‍යො අමිත්තො මෙධාවී යඤ්චෙ බාලානුකම්පකො,
පස්ස රොහිණිකං ජම්මිං මාතරං හන්ත්වාන සොචතී'ති.

5. රොහිණීජාතකං.

46. න වෙ අනත්ථකුසලෙන අත්ථචරියා සුඛාවහා,
හාපෙති අත්ථං දුම්මෙධො කපි ආරාමිකො යථා'ති.

6. ආරාමදූසකජාතකං.

1. අජාය පාදමොලම්බො - මජසං.

5. අත්ථකාම වර්ගය

41. අභිවෘද්ධි කැමැතිවැ හිත චිත්තයෙන් අනුකම්පා කරන්නහුගේ ඒ අනුශාසනය අවවාද ලබන යමෙක් නො කෙරේ ද (එසේ වූ පුරුෂ තෙමේ) එළියගේ පය ගෙනැ ශොක කරන මිත්ත වින්‍දකයා මෙන් ශොක කරයි. (මිත්ත වින්‍දකයා ශොක කළාක් මෙන් ශොක කරයි.)

1. ලොසක ජාතකය.

42. අර්ථයක් කැමැතිවැ හිතචිත්තයෙන් අනුකම්පා කරන්නහුගේ ඒ අනුශාසනය අවවාද ලබන යමෙක් නො කෙරේ ද පරවියාගේ වචනය නො කොට අමිත්‍ර වූ සූදයාගේ (අරක්කැමියා) අතට ගිය කාකයා මෙන් (ව්‍යසනයට පැමිණැ) හෝනේ ය.

2. කපොත ජාතකය.

43. දියුණුව කැමැත්තා වූ හිතචිත්තයෙන් අනුකම්පා කරන්නක්හුගේ අනුශාසනය ඔවා ලබන යමෙක් නො කෙරේ ද හෙතෙමේ වෙළුක නම් සර්පයාගේ පියා යම්සේ ද එපරිද්දෙන් නෂ්ට ව හෝනේ ය.

3. වෙළුක ජාතකය.

44. ප්‍රඥයෙන් යුක්ත වූ අමිත්‍ර තෙමේ උතුම් වේ. ප්‍රඥයෙන් විප්‍රහීණ වූ (නුවණ නැති) මිත්‍ර තෙමේ උතුම් නො වේ මැ යි (කුමක් හෙයින යත්) මූඪ (කෙළතොලු) පුත්‍ර තෙමේ මදුරුවා මරමි යි පියාගේ හිස පැළී ය.

4. මකස ජාතකය.

45. අනුකම්පා කරන යම්බඳු බාලයෙක් ඇද්ද (ඔහුට වඩා) නුවණැත්තා වූ අමිත්‍රයා උතුම් වේ. බාලවූ රෝහිණී නම් නුවණ නැත්තිය බලව (මැස්සන් මරමි යි) මව මරා ශොක කරන්නී ය.

5. රොහිණී ජාතකය.

46. අනර්ථයෙහි දක්‍ෂයා විසින් කරන ලද අර්ථචර්‍ය්‍යාව සුව එළවන්නී නො වේ. නුවණ නැති බාලයා දියුණුව පිරිහෙළයි. (කවරක්හු මෙන් ද යත්) උයන බැලීමෙහි යෙදුණු වානරයා මෙනි.

6. ආරාමදූෂක ජාතකය.

47. න වෙ අනත්‍ථකුසලෙන අත්‍ථචරියා සුඛාවහා,
හාපෙති අත්‍ථං දුම්මෙධො කොණ්ඩඤ්ඤෙ වාරුණිං යථාති.

7. වාරුණිදූසකජාතකං.

48. අනුපායෙන යො අත්‍ථං ඉච්ඡති සො විහඤ්ඤති,
චෙතා හනිංසු වෙදබ්බං[1] සබ්බෙ තෙ ව්‍යසනමජ්ඣගූති

8. වෙදබ්බජාතකං[2].

49. නක්ඛත්තං පතිමානෙන්තං අත්‍ථො බාලං උපච්චගා,
අත්‍ථො අත්‍ථස්ස නක්ඛත්තං කිං කරිස්සන්ති තාරකා'ති.

9. නක්ඛත්තජාතකං.

50. දුම්මෙධානං සහස්සෙන යඤ්ඤො මෙ උපයාචිතො,
ඉදානි ඛොහං යජිස්සාමි බහූ අධම්මිකො ජනො'ති.

10. දුම්මෙධජාතකං.

අත්‍ථකාමවග්ගො පඤ්චමො.

පඨමො පණ්ණාසකො.

තස්සුද්දානං:

අථ මිත්තකමාතුකපොතවරො
තථාවෙළුකඵලමූගොරොහිණී,
කපිවාරුණිචෙතවරා ච පුන
තථා තාරකයඤ්ඤවරෙන දස.

1. වෙදබ්බං – මජසං, ස්‍යා.
2. වෙදබ්බ – මජසං, ස්‍යා.

47. අනත්‍ථයෙහි (දක්‍ෂයා විසින් (අත්‍ථයෙහි අදක්‍ෂයා විසින්) කරන ලද අත්‍ථචය්‍ර්‍යාව සුව එළවන්නී නො වේ. නුවණ නැති බාලයා දියුණුව පිරිහෙළයි. (කවරක්හු මෙන් ද යත්) සුරාව නැසූ කොණ්ඩඤ්ඤ නම් ශිෂ්‍යයා මෙනි.

7. වාරුණී ජාතකය.

48. යමෙක් අනුපායයෙන් (වැරදි මඟින්) අභිවෘද්ධි කැමැති වේ ද හෙතෙමේ (එයින්) විනාශ වෙයි. චෙතිය නම් රටවැසි සොරු (වෛදර්භ නම් මන්ත්‍රය හෙතුකොටගෙන) වෙදබ්භ නම් බමුණා නැසූහ. ඒ සොරු සියලු දෙනා ද (ඔවුනොවුන් ඇන කොටාගෙන) විනාශයට පැමිණියෝ ය.

8. වෙදබ්භ ජාතකය.

49. අත්‍ථය නැකත් බලන අඥානයා ඉක්මැ යෙයි. අත්‍ථය (අභීෂ්ට ප්‍රතිඵල ලාභය ම) බලාපොරොත්තු වන අභිවෘද්ධිය ලැබීම ම නැකත වේ. තාරකාවෝ කවර නම් අත්‍ථයක් යොදත් ද (නො යොදත් ම ය.)

9. නක්ඛත්ත ජාතකය.

50. මා විසින් නුවණ නැති මිනිසුන් දහසෙකින් (යාගයක් කරමි යි දෙවතාවන් වෙතට ගොස්) ආරාධනා කරන ලදි. මම දැන් යාගය කෙරෙමි. කුමක් නිසා ද යත් අධාර්මික ජනයා බහුලය (එහෙයිනි.)

10. දුම්මෙධ ජාතකය.

පස්වැනි අත්‍ථකාම වර්ග යි.

පළමු පණ්ණාසක යි.

එහි උද්දන :

මිත්තක (ලොසක) කපොත වෙළුක එළමූග (මකස) රොහිණී කපි (ආරාම දූසක) වාරුණී වෙනවරා (වෙදබ්භ) තාරක (නක්ඛත්ත) යඤ්ඤචර (දුම්මෙධ) යන දසය යි.

6. ආසිංසවග්ගො

51. ආසිංසෙථෙව[1] පුරිසො න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො,
පස්සාමි වොහං අත්තානං යථා ඉච්ඡිං තථා අහූති

1. මහාසීලවජාතකං.

52. වායමෙථෙව පුරිසො න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො,
පස්සාමි වොහං අත්තානං උදකා ථලමුබ්භත'න්ති.

2. චූළජනකජාතකං.

53. තථෙව පුණ්ණා පාතියො අඤ්ඤායං වත්තතෙ කථා,
ආකාරකෙන ජානාමි න චායං භද්දිකා[2] සුරාති.

3. පුණ්ණපාතිජාතකං.

54. නායං රුක්ඛො දුරාරුහො නපි ගාමතො ආරකා,
ආකාරකෙන ජානාමි නායං සාදුඵලො දුමොති.

4. කිංඵලජාතකං[3].

55. යො අලීනෙන චිත්තෙන අලීනමනසො නරො,
භාවෙති කුසලං ධම්මං යොගක්ඛෙමස්ස පත්තියා
පාපුණෙ අනුපුබ්බෙන සබ්බසඤ්ඤොජනක්ඛයන්ති.

5. පඤ්චාවුධජාතකං.

56. යො පහට්ඨෙන චිත්තෙන පහට්ඨමනසො නරො
භාවෙති කුසලං ධම්මං යොගක්ඛෙමස්ස පත්තියා
පාපුණෙ අනුපුබ්බෙන සබ්බසංයොජනක්ඛයන්ති.

6. කඤ්චනක්ඛන්ධජාතකං.

---

1. අසිංසෙථෙව – මජසං.
2. නෙවායං භද්දකා– ස්‍යා.
3. ඵලජාතකං – සීමු, ස්‍යා.

6. ආසිංස වර්ගය

51. පුරුෂ තෙමේ (පටන්ගන්නා ලද ක්‍රියාවෙහි නිමාවට පැමිණෙනු සඳහා) ආශා කරන්නේ මැ ය. නුවණැත්තේ (වීර්‍ය්‍ය වඩනුයේ) උකටලි නො වන්නේ යැ. බලාපොරොත්තුව නො සිඳ ගන්නේය.) යම්සේ බලාපොරොත්තු වීම් ද, එසේ මැ වී. මම (එයින් රාජ සම්පත්තියට පැමිණි) තමා දක්මි.

1. මහාසීලව ජාතකය.

52. පුරුෂ තෙමේ වැයම් කරන්නේ මැ යැ. නුවණැත්තේ (අපෙක්‍ෂාව සාදගතහැකි දැ යි) උකටලි නො වන්නේ ය. මම (වීර්‍ය්‍යයෙන් සාගරය පීනා) දියෙන් ගොඩට නැංගා වූ තමා දක්මි.

2. චූළජනක ජාතකය.

53. සුරා පාත්‍රයෝ එසේ මැ (මා යන කලැ තුබූසේ මැ) පිරුණාහ. යම් මේ (සුරාවර්ණනා) කතාවක් පවතී ද (මේ) අනෙකක් මැ යැ. (බොරුවෙක් මැ යැ.) ආකාරයෙන් දනිමි. එකාන්ත-යෙන් මේ සුරාව යහපත් නො වේ යැ යි.

3. පුණ්ණපාති ජාතකය.

54. මේ වෘක්‍ෂය දුකසේ නැංග යුත්තේ නො වෙයි. (සුවසේ නැඟියැහෙයි.) ගමින් දුරුවූයේ ද නො වෙයි. (ඉදින් මිහිරි ඵල ඇත් නම් එක ද පලයක් ඉතිරි නො වේ. එයින්) මේ වෘක්‍ෂය මිහිරි පල ඇත්තේ නො වෙයි. (මෙ කරුණ) ආකාරයෙන් දනිමි.

4. කිංඵල ජාතකය.

55. (චතුර්විධ) යොගක්‍ෂේමයට හෙවත් නිවනට පැමිණෙනු සඳහා උදුර වූ අදහස් ඇති යම් මනුෂ්‍යයෙක් නො පසුබට වූ සිතින් කුශල ධර්මයන් වඩා ද හෙතෙමේ පිළිවෙළින් සියලු සංයොජනයන්ගේ ක්‍ෂයයට හෙවත් රහත්ඵලයට පැමිණෙයි.

5. පඤ්චාවුධ ජාතකය.

56. යොගක්‍ෂේමයට හෙවත් නිවනට පැමිණෙනු සඳහා දුරු කළ නීවරණයන් ඇති සිතින් (එහෙයින් ම) නිර්මල වූ සිත් ඇති යම් මනුෂ්‍යයෙක් කුශලධර්මයන් වඩා ද හෙතෙමේ සියලු සංයොජනයන්ගේ ක්‍ෂයයට හෙවත් රහත්ඵලයට පිළිවෙළින් පැමිණෙයි.

6. කඤ්චනක්ඛන්ධ ජාතකය.

57. යස්සෙතෙ චතුරො ධම්මා වානරින්ද යථා තව,
සච්චං ධම්මො ධිති චාගො දිට්ඨං සො අතිවත්තතී'ති.

7. වනරින්දජාතකං.

58. යස්ස එතෙ තයො[1] ධම්මා වානරින්ද යථා තව,
දක්ඛියං සූරියං පඤ්ඤා දිට්ඨං සො අතිවත්තතී'ති.

8. තයොධම්මජාතකං.

59. ධමෙ ධමෙ නාතිධමෙ අතිධන්තං හි පාපකං,
ධන්තෙන[2] හි සතං ලද්ධං අතිධන්තෙන නාසිත'න්ති.

9. භෙරිවාදජාතකං.

60. ධමෙ ධමෙ නාතිධමෙ අතිධන්තං හි පාපකං,
ධන්තෙනාධිගතා භොගා තෙ තාතො විධමී ධමන්ති.

10. සඞ්ඛධමනජාතකං[3].

ආසිංසවග්ගො ඡට්ඨො[4].

තස්සුද්දානං:

යථාපි චිත්තිං තථාභූදකාථලා
සූරසාදුඑලොවඅලීනමනො,
සම්පහට්ඨමනො චතුරො ච තයො
සතලද්ධකභොගධනෙනදස.

1. යස්සෙතෙ ච. - මජසං, ස්‍යා
2. ධමන්තෙන අ. ධන්තෙන - ස්‍යා.
3. සඞ්ඛධම්ම - මජසං.
4. ආසීසවග්ගො - මජසං.

57. වානරෙන්ද්‍රය, වාක්සත්‍යය, පරීක්ෂාඥානය, ධෛර්යය, ත්‍යාගය යන මේ සතර ධර්මයෝ (සතර ගුණයෝ) තට මෙන් යමකුට විද්‍යමාන වෙද්ද හෙතෙමේ සතුරා ඉක්මවා යේ. (සතුරා මැඩ පවත්වයි.)

7. වානරින්ද ජාතකය.

58. වානරෙන්ද්‍රය, දක්ෂභාවය ද, නිර්භයභාවය ද, උපාය කෞශල්‍යඥානය ද යන මේ ත්‍රිවිධ ධර්මයෝ තට මෙන් යමකුට ඇත් ද හෙතෙමේ සතුරා ඉක්මවා යේ.

8. තයොධම්ම ජාතකය.

59. බෙර ගසන්නේ ය. බෙර ගසන්නේ ය. (ප්‍රමාණය ඉක්මවා) අතිශයින් නො ගසන්නේ ය. නිරන්තරයෙන් බෙර ගැසීම ලාමක ය. (අනර්ථකර ය.) බෙර ගසන්නහු විසින් (කහවණු) සියයක් ලබන ලද. (කාලය නො බලා) නිරන්තරයෙන් බෙර වයන්නහු විසින් (ඒ ධනය නසන ලදී.)

9. භෙරිවාද ජාතකය.

60. සක් පිඹින්නේ ය. සක් පිඹින්නේ ය. (කල් නො බලා) අධික කොට නො පිඹින්නේ ය. අධික කොට පිඹීම ලාමක ය. (අනර්ථකර ය) සක් පිඹින්නහු විසින් භෝගයෝ ලබන ලදහ. (අපගේ) පියා නැවත නැවත සක් පිඹින්නේ ඒ භොගය විනාශ කෙළේ ය.

10. සඞ්ඛධමන ජාතකය.

සවැනි ආසිංස වර්ග යි.

එහි උද්දන :

යථා ඉච්ඡිං තථා අහූ (මහාසීලව) දකථල (මූලජනක) සුරා (පුණ්ණපාති) සාදුඵල (කිංඵල) අලීනමනො (පංචාවුධ) සම්පහට්ඨමනො (කඤ්චනක්ඛන්ධ) චතුරෝ (වානරින්ද) තයො (තයොධම්ම) සතලද්ධ (භෙරිවාද) භොගධන (සංඛධමන) යන දසය යි.

7. ඉත්ථිවග්ගො

61. අසා[1] ලොකිත්ථියො නාම වෙලා තාසං න විජ්ජති,
සාරත්තා ච පගබ්භා[2] ච සිඛී සබ්බඝසො යථා;
තා හිත්වා පබ්බජිස්සාමි විවෙකමනුබ්‍රෑහයන්ති.

1. අසාතමන්තජාතකං.

62. යං බ්‍රාහ්මණො අවාදෙසි වීණං සමමුඛවෙඨිතො,
අන්ධභූතා භතා භරියා තාසු කො ජාතු විස්සසෙ’ති.

2. අන්ධභූතජාතකං[3].

63. කොධනා අකතඤ්ඤූ ච පිසුනා ච විභෙදිකා[4],
බ්‍රහ්මචරියං චර භික්ඛු සො සුඛං න හොහිසීති.*

3. තක්කජාතකං[5].

64. මා සු නන්දි ඉච්ඡති මං මා සු සොචි න ඉච්ඡති[6],
ථීනං භාවො දුරාජානො මච්ඡස්සෙවොදකෙ ගතන්ති.

4. දුරාජානජාතකං.

65. යථා නදී ච පන්ථො ච පානාගාරං සභා පපා,
එවං ලොකිත්ථියො නාම නාසං කුජ්ඣන්ති පණ්ඩිතාති.

5. අනභිරතිජාතකං.

1. ආසා – සත්තා.
2. පගබ්බාම – මජසං.
3. අණ්ඩභූතා භතජාතකං – මජසං.
4. ජාතකවත්ථු. පිසුණාමිත්තදූභිකා. මජසං. පිසුණා මිත්තභෙදිකා.
*. න පරිහාහිසීතිපි පාඨො අයමෙවසෙට්ඨො. අට්ඨකථා.
5. තක්කපණ්ඩිතජාතකං – මජසං.
6. නාභිවජ්ජති – මජසං.

7. ස්ත්‍රී වර්ගය

61. ලොකයෙහි ස්ත්‍රීහු නම් ලාමකයහ. නොහොත් තමන් කෙරෙහි ඇලුණවුනට දුක් දෙන්නාහු ය. ඔවුනට (කෙලශොත්පත්ති නිවාරණයට) මර්යාදවෙක් නැත. සංරක්තයහ, ප්‍රගල්භයහ, සියල්ල කාදමන ගින්න මෙන් පුරුෂයන් විශෙෂයෙන් සෙවුණාහ. (එසේ වූ) ඔවුන් හැර විවෙකය වඩන්නෙම් පැවිදි වෙමි.

1. අසාතමන්ත ජාතකය.

62. බමුණු තෙමේ යම් කාරණයෙකින් (සනවස්ත්‍රයෙකින් මුඛය සමග වෙළන ලද්දේ) වීණාව වැයී ද (එසේ ඔහු රැවටූ තැනැත්තිය කෙසේ වූ බැමිණියක් ද යත්:) මවුකුසැ හොත් කල්හි මැ ආරක්‍ෂා කොට පොෂණය කළා වූ භායර්‍යාව යැ. එබඳු (පෙරළෙනසුලු) භාර්යාවන් කෙරෙහි කවර නම් නුවණැත්තෙක් එකාන්තයෙන් විශ්වාස තබන්නේ ද? (නො තබන්නේ මැ යැ.)

2. අණ්ඩභූතජාතකය.

63. (ස්ත්‍රීහු නම්) කිපෙන සුල්ලහ. කළ ගුණ නො දන්නෝ ද වෙති. ප්‍රියභාවය ශූන්‍ය කරන්නා වූ ද මිත්‍රයන් භෙද කරන්නා වූ ද කථා කරන ස්වභාව ඇත්තාහු ය. මහණ, බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙව. බඹසර හැසිරෙන තෝ සුවයෙන් නො පිරිහෙන්නෙහි ය.

3. තක්ක ජාතකය.

64. (මේ ස්ත්‍රිය) මා කැමැත්තීය යි සතුටු නො වෙව, මා නො කැමැත්තීය යි ශොක නො කරව. දියෙහි මත්ස්‍යයාගේ ගමන මෙන් ස්ත්‍රීන්ගේ ස්වභාවය නො දත හැකි යැ. දියෙහි මත්ස්‍යයාගේ ගමන් සටහන මෙනි.

4. දුරාජාන ජාතකය.

65. ගංගාව ද, මහාමාර්ගය ද, සුරාහල ද ඉසුඹුහල ද, පින්පැන් මඩුව ද, යම්සේ සියලු දෙනාට සාධාරණයෝ ද ලොකයෙහි ස්ත්‍රීහු ද එසේ (වූ පැවැතුම් ඇත්තෝ) වෙති. පණ්ඩිතයෝ මේ ස්ත්‍රීන්ට නො කිපෙත්.

5. අනභිරත ජාතකය.

66. එකා ඉච්ඡා පුරෙ ආසි අලද්ධා මුදුලක්ඛණං,
යතො ලද්ධා අළාරක්ඛි ඉච්ඡා ඉච්ඡං විජායථාති.

6. මුදුලක්ඛණජාතකං.

67. උච්ඡඞ්ගෙ දෙව මෙ පුත්තො පථෙ ධාවන්තියා පති,
තඤ්ච දෙසං න පස්සාමි යතො සොදරියමානයෙති[1].

7. උච්ඡඞ්ගජාතකං.

68. යස්මිං මනො නිවිසති චිත්තං වාපි[2] පසීදති,
අදිට්ඨපුබ්බකෙ පොසෙ කාමං තස්මිම්පි විස්සසෙ'ති.

8. සාකෙතජාතකං.

69. ධිරත්ථු තං විසං වන්තං යමහං ජීවිතකාරණා,
වන්තං පච්චාවමිස්සාමි[3] මතං මෙ ජීවිතා වරන්ති.

9. විසවන්තජාතකං.

70. න තං ජිතං සාධු ජිතං යං ජිතං අවජීයති,
තං ඛො ජිතං සාධු ජිතං යං ජිතං නාවජීයතීති.

10. කුද්දාලජාතකං.

ඉත්ථිවග්ගො සත්තමො.

තස්සුද්දානං:

සිඛී සබ්බසසොපි ච වීණවරො
පිසුනමිත්තහෙදිකානන්දිනදී,
මුදුලක්ඛණසොදරියාවමනො
විසසාධුජිතෙන භවන්ති දස.

1. සොදරියංනයො – මජසං.
2. චිත්තස්සාපි – මජසං, ස්‍යා.
3. පච්චාහරිස්සාමි – මජසං.

66. මුදුලක්‍ඛණා නම් දෙවිය නො ලදින් පූර්වයෙහි එක් තෘෂ්ණාවක් වූව. විශාලනෙත්‍ර ඇති ඇය යම් තැනෙක පටන් ලබන ලද ද (පූර්වයෙහි වූ ඒ) තෘෂ්ණාව (ගෘහොපකරණ රැස්කිරීම් ආදි අනෙක් මැ) තෘෂ්ණාවක් ඉපදවීය.

6. මුදුලක්‍ඛණ ජාතකය.

67. දෙවයෙනි, පුත්‍ර තෙමේ මාගේ ඇකයෙහි මැ යැ. (ඉණට කඩා ගන්නා පලාමෙන් සුලභයහ.) මගෙහි යන්නා වූ මට ස්වාමිපුරුෂයෝ ද සුලභයහ. යම් දෙශයෙකින් සහෝදරයකු ගෙන එම් ද (මවුපියන් නැති බැවින්) ඒ දෙශය (මව්කුස) නො දකිමි.

7. උච්ඡඞ්ග ජාතකය.

68. යම් පුද්ගලයක්හු කෙරෙහි සිත පිහිටා ද, (දුටු පමණෙකින්) සිත පහදී ද පෙර නුදුටුවිරු ඒ පුරුෂයා කෙරෙහි එකාන්තයෙන් විශ්වාසය තබන්නේ ය. (හෙවත් විශ්වාසයට පැමිණෙන්නේ ය.)

8. සාකෙත ජාතකය.

69. යම් විෂයෙක් හරන ලද ද, ඒ වමනය කළ විෂ මම ජීවිතයාගේ පැවැත්ම සඳහාවත්, නැවත හැරගනිම් ද, ඒ විෂට නින්ද වේවා. (වමනය කළ විෂ නැවත හැරගෙනැ) ජීවත්වීමට වඩා මිය යාම උතුම්.

9. විසවන්ත ජාතකය.

70. යම් ජයක් (සතුරන් විසින්) පරදවනු ලැබේ ද ඒ දිනුම මනා කොට දිනුවා නම් නො වේ. යම් ජයක් (සතුරන් විසින්) පරදවනු නො ලැබේ ද, ඒ දිනුම ම මනා කොට දිනුවා නම් වේ.

10. කුද්දල ජාතකය.

සත්වැනි ස්ත්‍රීවර්ග යි.

එහි උද්දන :

සිඛිසබ්බසසො (අසාතමන්‍ත) වීණවරො (අණ්ඩභූත) පිසුනමිත්‍තවිභෙදිකා (තක්‍ක) නන්‍දි (දුරාජාන) නදී (අනභිරත) මුදුලක්‍ඛණ සොදරීය (උච්ඡඞ්ග) මනො (සාකෙත) විස (විසවන්‍ත) සාධුජිත (කුද්දල) යන දසය යි.

8. වරණවග්ගො

71. යො පුබ්බෙ කරණීයානි පච්ඡා සො කාතුමිච්ඡති,
වරණ[1] කට්ඨභඤ්ජොව ස පච්ඡාමනුතප්පතීති.

1. වරණජාතකං[2].

72. අකතඤ්ඤුස්ස පොසස්ස නිච්චං විවරදස්සිනො,
සබ්බඤ්චෙ පථවිං දජ්ජා නෙව නං අභිරාධයෙති.

2. සීලවනාගරාජ[3]ජාතකං.

73. සච්චං කිරෙවමාහංසු නරා එකච්චියා ඉධ,
කට්ඨං විප්ලාවිතං[4] සෙය්‍යො නත්වෙවෙකච්චියො නරොති.

3. සච්චංකිරජාතකං.

74. සාධු සම්බහුලා ඤාතී අපි රුක්ඛා අරඤ්ඤජා,
වාතො වහති එකට්ඨං බ්‍රහන්තම්පි වනස්පතින්ති[5].

4. රුක්ඛධම්මජාතකං.

75. අභිත්ථනය පජ්ජුන්න නිධිං කාකස්ස නාසය,
කාකං සොකාය රන්ධෙහි මඤ්ච සොකා පමොචයා'ති.

5. මච්ඡජාතකං.

76. අසඞ්කියොම්හි ගාමම්හි අරඤ්ඤෙ නත්ථි මෙ භයං,
උජුමග්ගං සමාරූළ්හො මෙත්තාය කරුණාය චාති.

6. අසඞ්කියජාතකං.

---

1. වරුණ. ස්‍යා. වරුණකට්ඨ – මජසං.
2. වරුණජාතකං – මජසං, ස්‍යා.
3. සීලවහත්ථි. ස්‍යා. සීලවනාග – මජසං.
4. නිල්ලවිතං ස්‍යා. නිප්ලවිතං – මජසං.
5. වනප්පතිං – මජසං, ස්‍යා

8. වරණ වර්ගය

71. යමෙක් පළමු කටයුතු දෑ පසුව කරන්නට කැමැති වේ ද හෙතෙමේ ලුණුවරණදඬු බිඳි මාණවකයා මෙන් පසුව තැවෙයි. (ශොක කරයි.)

1. වරණ ජාතකය.

72. කළ ගුණ නො දන්නා වූ නිරතුරු (අනුන්ගේ) සිදුරු (වැරැදි) දක්නා වූ පුරුෂයාට ඉදින් මුළු පොළොව හෙවත් සක්විති රජකම දුන්නේ වී නමුදු ඔහු සතුටට පමුණුවනු නො හැක්කේ ය.

2. සීලවනාගරාජ ජාතකය.

73. ගඟදියෙහි පාවෙන දරදඬු (නගා ගොඩ තබන ලද්දේ) උතුම් වේ. (කළ ගුණ නො දන්නා) සමහර පුරුෂයෙක් (නගා ගොඩ තබන ලද්දේ) උතුම් නො වේ මැ යි. මෙ ලොවැ ඇතැම් පණ්ඩිත කෙනෙක් සැබවක් ම කීහු ල.

3. සච්චංකිර ජාතකය.

74. බොහෝ වූ නෑයෝ (සමග වැ වෙසෙන්නාහු) ශොභන වෙති. අරණ්‍යයෙහි හටගත් වෘක්ෂයෝ පවා (ඝන වැ සිටියාහු) ශොභන වෙත්. වාතය එකලා වැ සිටියා වූ අතුපතර ඇති මහත් වූ වනදෙටු රැක ද මුලිනුපුටා හෙළයි.

4. රුක්ඛධම්ම ජාතකය.

75. මේඝය ගර්ජනා කරව. කාක සමූහයාගේ (මත්ස්‍ය) නිධානය නසව. කපුටුමුළුව ශොකයට පමුණුවව. නෑයන් හා මා ද ශොකයෙන් මුදව.

5. මච්ඡ ජාතකය.

76. ගමෙහි ද නිසැකයෙම් වෙමි. අරණ්‍යයෙහි මට බියෙක් නැත. මෛත්‍රියෙන් ද කරුණාවෙන් ද සෘජු වූ (බ්‍රහ්මලොක හා දිව්‍යලොකගාමී) මාර්ගයට නැංගෙමි.

6. අසංකිය ජාතකය.

77. උසභා රුක්ඛා ගාවියො ගාවා ච,
අස්සො කංසො සිගාලී ච කුම්භො,
පොක්ඛරණී ච අපාකචන්දනං

ලාපූනි සීදන්ති සිලා පලවන්ති.
මණ්ඩූකියො කණ්හසප්පෙ ගිලන්ති.
කාකං සුවණ්ණා පරිවාරයන්ති.
තසාවකා එළකානං භයා හි
විපරියාසො[1] වත්තති න ඉධමත්ථීති.

7. මහාසුපිනජාතකං.

78. උභො ඛඤ්ජා උභො කුණී උභො විසමචක්ඛුකා,
උභින්නං පිළකා ජාතා නාහං පස්සාමි ඉල්ලිසන්ති.

8. ඉල්ලිසජාතකං.

79. යතො විලුත්තා ච හතා ච ගාවො
දඩ්ඪානි ගෙහානි ජනො ච නීතො,
අථාගමා පුත්තහතාය පුත්තො
ඛරස්සරං දෙණ්ඩිමං[2] වාදයන්තොති.

9. ඛරස්සරජාතකං.

80. යන්තෙ පවිකත්ථිතං[3] පුරෙ
අථ තෙ පූතිසරා සරන්ති පච්ඡා,
උභයං න සමෙති භීමසෙන[4]
යුද්ධකථා ච ඉදං ච තෙ විහඤ්ඤති.

10. භීමසෙනජාතකං[5].

වරණ[6]වග්ගො අට්ඨමො.

තස්සුද්දානං :

වරණා අකතඤ්ඤූවරෙසුස වච්චවරං සවනප්පත්තිනා ච අභිත්ථනය,
කරුණායසිලාපලවඉත්ථීසතො පුන දෙණ්ඩිමපූතිසරෙන දස.

---

1. විපරියායො – මජසං, සයා.
2. දින්දිමං – මජසං.
3. විකත්ථිතං – මජසං.
4. භිම්මසෙන – මජසං.
5. භිම්මසෙනජාතකං – මජසං.
6. වරුණ – මජසං, සයා.

77. (යුද නො කොට ගිය) වෘෂභයෝ යැ, (මල් පලගත් කුඩා) වෘක්‍ෂයෝ යැ, (එදවස උපන් වස්සන්ගේ කිරි බොන) දෙන්නු යැ, (වියෙහි යොදන නහඹු) ගවයෝ යැ, (දෙපස මුඛ ඇති) අශ්ව යැ, (ජර සිවලකුට මෙහි මූ කරව යි පෑ සිය දහසක් අගනා) රන්තලිය යැ, (අඹරන රැහැන කාදමන) සිවලී යැ, (හිස් කළ අතුරෙහි තුබූ දිය පිරුණු) කළය යැ, (ගැඹුරු තැන දිය කැලැඹුණු) පොකුණ යැ, (එක් මැ සැළෙහි නිසි සේ) නො පැසුණු බත යැ, (කුණුමෝරු වලට විකුණන සියදහසක් අගනා) රත්සඳුන්හර යැ, යන සිහින ද-

හිස් ලබුකබල්හු දියෙහි ගැලෙති, ඝන පාෂාණයෝ (නැව් මෙන්) දියෙහි පාවෙති, මැඩිපැටියෝ කෘෂ්ණ සර්පයන් ගිලිති, ස්වර්ණ හංසයෝ කවුඩුවකු පිරිවරති, වෘකයෝ එළුවන්ට බියෙන් තැති ගනිත්. මෙසේ විපර්‍යාසයෙක් පවතී, දූත් වැලිත් මේ පුරුෂ යුගයෙහි (මේ සිහිනයන්ගේ) විපාක දීමෙක් නැති යි.

7. මහාසුපින ජාතකය.

78. දෙදෙනා ම පිළු ය. දෙදෙනා ම කොරු ය. දෙදෙනා ම වමරැයි ය. දෙදෙනාගේ ම හිස (සමාන වූ) පිළිකාවෝ ජාතයහ. (එහෙයින්) මම ඉල්ලීස නො දකිමි.

8. ඉල්ලීස ජාතකය.

79. යම් කලෙක්හි ගවයෝ පැහැර ගන්නා ලද්දහු ද, (මස් පිණිස) නසන ලද්දහු ද, ගෘහයෝ දවන ලද්දහු ද, ජනයෝ ද බැඳැ ගෙන යන ලද්දහු, එකල්හි නැසුණු දරුවන් ඇති මවගේ නිර්ලජ්ජ වූ පුත්‍රයා අමධුර වූ ශබ්ද ඇති පටහබෙරය වාදනය කෙරෙමින් ආවේ ය.

9. ඛරස්සර ජාතකය.

80. භීමසෙනය, තොප විසින් පෙර සංග්‍රාමයෙහි යමක් කියන ලද ද නැවත පසුව හෙවත් යුද්ධයෙහි දී තාගේ පූතිසර නම් වූ සිරුරුමල වැගිරෙති. තොපගේ යුද්ධ (පිළිබඳ ඔදවැඩි) කතා ද මේ පීඩාව ද යන දෙ කරුණ සම නො වේ.

10. භීමසෙන ජාතකය.

සත්වැනි වරණවර්ග යි.

එහි උද්දන :

වරණ අකතඤ්ඤ (සීලවනාගරාජ) සච්චවර (සච්චංකිර) වනස්පති (රුක්ඛධම්ම) අභිත්ථනය (මච්ඡ) කරුණාය (අසඞ්කිය) සිලාපලව (මහාසුපින) ඉත්‍ථී (ඉල්ලීස) දෙණ්ඩිම (ඛරස්සර) පූතිසර (භීමසෙන) යන දසය යි.

9. අපායිම්හවග්ගො

81. අපායිම්හ අනච්චිම්හ අගායිම්හ රුදිම්හ ච,
විසඤ්ඤීකරණිං[1] පීත්වා[2] දිට්ඨා නාහුම්හ වානරා'ති.

1. සුරාපානජාතකං.

82. අතික්කමම රමණකං සදමත්තඤ්ච දූභකං[3],
ස්වාසි පාසාණමාසීනො යස්මා ජීවං න මොක්ඛසී'ති.

2. මිත්තවින්දජාතකං.

83. මිත්තො හවෙ සත්තපදෙන[4] හොති
සහායො පන ද්වාදසකෙන හොති,
මාසඩ්ඪමාසෙන ච ඤාති හොති
තතුත්තරිං අත්තසමොපි හොති.
සොහං කථං අත්තසුඛස්ස හෙතු[5]
චිරසන්ථුතං[6] කාලකණ්ණිං ජහෙය්‍යන්ති.

3. කාලකණ්ණිජාතකං.

84. ආරොග්‍යමිච්ඡෙ පරමඤ්ච ලාභං
සීලඤ්ච වුද්ධානුමතං සුතඤ්ච,
ධම්මානුවත්තී ච අලීනතා ච[7]
අත්ථස්ස ද්වාරා පමුඛා ඡළෙතෙ'ති.

4. අත්ථස්සද්වාරජාතකං.

85. ආයතිදොසං නාඤ්ඤාය යො කාමෙ පතිසෙවති,
විපාකන්තෙ හනන්ති නං කිංපක්කමිව භක්ඛිතන්ති.

5. කිම්පක්කජාතකං.

---

1. විසඤ්ඤිකරණිං - මජසං, සයා.
2. පිත්වා - මජසං.
3. දූසකං - මජසං.
4. සත්තපදෙන - මජසං.
5. අත්ථසුඛස්ස - මජසං.
6. චිරසන්ධවං - මජසං.
7. ධම්මානුවත්තිඤ්ච අලීනතඤ්ච - මජසං.

9 අපායිම්හවග්ගො

81. සුරා පීම්හ, (අත් ලෙළවමින්) නැටුම්හ. මහහඩින් ගී කීම්හ, (සුරාපානය නපුරු ය යි පසුව) හැඬුම්හ. සිහිසන් නැති කරන රා බී (යම් හෙයෙකින්) වඳුරෝ නො වූවමෝ ද එය මී මැනැවි (යි තමාගේ නුගුණ කීවේ ය.)

1. සුරාපාන ජාතක යි.

82. පළිඟු පහය ද රිදී පහය ද මැණික් පහය ද ඉක්ම තෙපි (පාපක්‍ෂය වන නෙක්) ජීවත් වන්නහු (යම් උරවක්‍රයෙකින්) නො මිදෙන්නහු ද එබඳු පාෂාණ උරවක්‍රයෙකින් මඩනා ලද්දහු.

2. මිත්තවින්‍ද ජාතක යි.

83. එක් වැ සත්පියවරක් යෑමෙන් මිත්‍රයෙක් වන්නේ ය. දෙළොස් දිනක් එක් වැ විසීමෙන් යහළුවෙක් වන්නේ ය. මසෙකින් ද අඩමසෙකින් ද නෑයකු හා සම වන්නේ ය. එයින් අධික කාලයක් එක් වැ විසීමෙන් ප්‍රාණසමයෙක් ද වන්නේ ය. ඒ මම තමාගේ සුවය කරණ කොටගෙනැ බොහෝ කාලයක් එක් වැ වාසය කොට පුරුදු වූ කාලකණ්ණි නම් යහළුවා කෙසේ හරනෙම් ද?

3. කාලකණ්ණි ජාතක යි.

84. ආරොග්‍ය නම් වූ උතුම් ලාභය කැමැති වන්නේ ය, ආචාර ශීලය ද (ගුණයෙන්) වැඩිහිටියන්ගේ අනුමතය ද බහුශ්‍රැතබව ද ධර්මය අනුවැ පැවැත්ම ද විත්තයාගේ නො හැකුළුණු බව ද යන මේ සදෙන දියුණුවට ප්‍රධාන වූ ද්වාරයෝ ය.

4. අත්‍ථස්සද්වාර ජාතක යි.

85. මතු වන්නා වූ දෙෂය නො දන යමෙක් කාමයන් සෙවුනේ ද කන ලද කිම්පක්‍ක නම් විෂඵලය මෙන් (ඒ කාමයෝ) ඒ පුරුෂයා විපාක සංඛ්‍යාත අන්තයෙහි (නිරයෙහි නොයෙක් දුක් දී) නසත්.

5. කිම්පක්ක ජාතක යි.

86. සීලං කිරෙව කල්‍යාණං සීලං ලොකෙ අනුත්තරං,
පස්ස ඝොරවිසො නාගො සීලවාති න හඤ්ඤතී'ති.

6. සීලවීමංසජාතකං.

87. යස්ස මඞ්ගලා සමූහතා
උප්පාතා සුපිනා ච ලක්ඛණා ච,
සමඞ්ගලදොසවීතිවත්තො[1]
යුගයොගාධිගතො න ජාතුමෙතීති.

7. මඞ්ගලජාතකං.

88. කල්‍යාණිමෙව මුඤ්චෙය්‍ය නහි මුඤ්චෙය්‍ය පාපිකං,
මොක්ඛො කල්‍යාණියා සාධු මුත්වා තපති[2] පාපිකන්ති.

8. සාරම්භජාතකං.

89. වාචාව කිර තෙ ආසි සණ්හා සඛිලභාණිනො,
තිණමත්තෙ අසජ්ජිත්ථො නො ච නික්ඛසතං හරන්ති.

9. කුහකජාතකං.

90. යො පුබ්බෙ කතකල්‍යාණො කතත්ථො නාවබුජ්ඣති,
පච්ඡා කිච්චෙ සමුප්පන්නෙ කත්තාරං නාධිගච්ඡති.

10. අකතඤ්ඤුජාතකං.

අපායිම්හවග්ගො නවමො.

තස්සුද්දානං:

අපායිම්හ ච දූභකසත්තපදං
ජලදාවාර ච ආයතිනා ච පුන,
අභිසීලවමඞ්ගලිපාපිකස්සා
සතනික්ඛකතත්ථවරෙන දස.

1. සොමඞ්ගල - ස්‍යා.
2. තපති - මජසං, ස්‍යා.

86. ආචාර සීලය ම යහපත් ල, ලෝකයෙහි සීලය ශ්‍රෙෂ්ඨ ය. බලව, නපුරු විෂ ඇති සර්ප තෙමේ සිල්වත් වෙමි යි (අන්‍යයනට) හිංසාවක් නො කෙරේ.

6. සීලවීමංස ජාතක යි.

87. යම් රහත් කෙනකුගේ (දිට්ඨ-සුත-මුත ආදි) මංගලයෝ ද (සූර්‍යග්‍රහණාදි) උත්පාතයෝ ද ස්වප්නයෝ ද ලක්‍ෂණයෝ ද මනා කොට නසන ලද්දහු ද මංගලදොෂයන් ඉක්ම සිටියේ ද යුගධර්මයන් ද යොගධර්මයන් ද යටපත් කොට සිටියේ ද ඒ රහත් උතුමා ඒකාන්තයෙන් (ප්‍රතිසන්ධි වශයෙන් මේ ලොකයට) නො එන්නේ යි.

7. මංගල ජාතක යි.

88. කල්‍යාණ වූ වචන ම කටින් නිකුත් කරන්නේ ය. ලාමක වචනයක් නො ම නිකුත් කරන්නේ ය. කල්‍යාණ වචනයාගේ (බිණීම) යහපති, ලාමක තෙපුල් බැණැ (දෙලොව) තැවෙන්නේ යි.

8. සාරම්භ ජාතක යි.

89. මෘදු වූ තෙපුල් බණන්නා වූ තොපගේ වචන ම මට සිලිටි වී, තණකෙන්දක් පමණෙකැ නො ඇලුණෙහි ය, (එහෙත්) නිෂ්ක සියයක් හැර ගෙනැ යන්නේ නො වෙහි ද?

9. කුහක ජාතක යි.

90. යමෙක් පෙර කරන ලද උපකාර ඇති වැ නිෂ්පාදිත කෘත්‍ය ඇත්තේ (කළ උපකාරය) නො දනී ද පසුව කටයුත්තක් පැමිණි කල්හි (ඔහුට) එය කැරදෙන්නකු නො ලබා යී.

10, අකතඤ්ඤ ජාතක යි.

නවවැනි අපායිම්හ වර්ග යි.

එහි උද්දන :

අපායිම්හ (සුරාපාන) දූහක (මිත්තවින්දක) සතපද (කාලකණ්ණි) ජලද්වාර (අත්‍ථස්ස ද්වාර) ආයති (කිම්පක්ක) අභිසීලව (සීලවිමංස) මංගල පාපික (සාරම්භ) සතනික්ඛ (කුහක) කතත්වර (අකතඤ්ඤ) යන දසය යි.

10. ලිත්තවග්ගො

91\. ලිත්තං පරමෙන තෙජසා
ගිලමක්ඛං පුරිසො න බුජ්ඣති,
ගිල රෙ ගිල පාපධුත්තක
පච්ඡා තෙ කටුකං භවිස්සතීති.

1. ලිත්තජාතකං.

92\. උක්කට්ඨෙ සූරමිච්ඡන්ති මන්තීසු අකුතූහලං,
පියඤ්ච අන්නපානම්හි අත්ථෙ ජාතෙ ච පණ්ඩිතන්ති.

2. මහාසාරජාතකං.

93\. න විස්සසෙ අවිස්සත්ථෙ විස්සත්ථෙපි න විස්සසෙ,
විස්සාසා භයමන්වෙති සීහංව මිගමාතුකා'ති.

3. විස්සාසභොජනජාතකං.

94\. සො තත්තො සොසිනො එකො භිංසනකෙ වනෙ
නග්ගො න චග්ගිමාසීනො එසනා පසුතො මුනී'ති.

4. ලොමහංසජාතකං.

95\. අනිච්චා වත සඞ්ඛාරා උප්පාදවයධම්මිනො,
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමො සුඛොති.

5. මහාසුදස්සනජාතකං.

10. ලිත්ත වර්ගය

91. මහාතෙජස් ඇති හලාහලවිෂයෙන් රුඳුණු පසඇට ගිලින්නා වූ පුරුෂ තෙමේ (එහි විෂ රුඳුණු බව) නො දනී, නීවය, (පසඇට) ගිලෙ, පාපධූර්තය ගිලෙ, පසුව හෙවත් මෙය ගිලූ කලැ තට කටුක විපාකයෙක් වන්නේ ය.

1. ලිත්ත ජාතක යි.

92. එළඹසිටි යුද්ධයෙහි හෙවත් යුද්ධයක් පැමිණි කල්හි ශූරයා (නිර්භය පුරුෂයා ද) මන්ත්‍රණය කරන කල්හි (රහස් හෙළි නො කරන හෙයින්) අකුතූහල පුරුෂයා ද මධුරාහරාදීන් එළවූ කල්හි (එක් වැ වළඳනා) ප්‍රියයා ද (ප්‍රශ්න විසර්ජනාදි) අර්ථයක් උපන් කල්හි පණ්ඩිතයා ද කැමැති වෙති. (පැතිය යුත්තේ ය.)

2. මහාසාර ජාතක යි.

93. (පෙරැ විශ්වාසයෙන් සිට පසුව) අවිශ්වාස වූවහු කෙරෙහි විශ්වාසය නො කරන්නේ ය. (පෙරැ අවිශ්වාස ව සිටැ) විශ්වාස වූවහු කෙරෙහි විශ්වාස නො කරන්නේ ය. එබඳු විශ්වාසයෙන් මීවින්න (මෘගමාතෘ) ගෙන් සිංහයාට මෙන් භය පැමිණේ.

3. විශ්වාස භොජන ජාතක යි.

94. (හිරුරැසින්) විශෙෂයෙන් තැවුණෙමි, (හිමදියෙන්) විශෙෂයෙන් තෙත් වූයෙමි, බියකරු වෙනෙහි හුදකලා වූයෙමි, නග්න වූයෙමි, ගිනි සමීපයෙහි නො හිඳිනෙමි. (බ්‍රහ්මචර්‍ය්‍යා) සෙවීමෙහි යෙදුණෙමි. (මුනිභාවය පිණිස පිළිපන්නෙකැ යි) ලොකයාගේ සැලකුම් ලැබීමි.

4. ලොමහංස ජාතක යි.

95. සංස්කාරයෝ හෙවත් හෙතුප්‍රත්‍යයයෙන් හටගත් වස්තූහු එකාන්තයෙන් අනිත්‍යයහ. ඉපද නස්නා ස්වභාවය ඇත්තාහ. ඉපැද නැති වෙති. ඒ සංස්කාරයන්ගේ සන්හිඳීම නම් වූ නිවන ම සුව ය යි.

5. මහාසුදස්සන ජාතක යි.

96. සමතිත්තිකං අනවසෙසකං[1]
තෙලපත්තං යථා පරිහරෙය්‍ය,
එවං සචිත්තමනුරක්ඛෙ
පත්ථයානො දිසං අගතපුබ්බන්ති.

6. තෙලපත්තජාතකං.

97. ජීවකඤ්ච මතං දිස්වා ධනපාලිඤ්ච දුග්ගතං[2],
පන්ථකඤ්ච වනෙ මූළ්හං පාපකො පුනරාගතො'ති.

7. නාමසිද්ධිජාතකං.

98. සාධු ඛො පණ්ඩිතො නාම නත්වෙව අතිපණ්ඩිතො.
අතිපණ්ඩිතෙන පුත්තෙන මනම්හි[3] උපකූලිතො'ති,

8. කූටවාණිජජාතකං.

99. පරොසහස්සම්පි සමාගතානං
කන්දෙය්‍යුං[4] තෙ වස්සසතං අපඤ්ඤා,
එකොව සෙය්‍යො පුරිසො සපඤ්ඤො
යො භාසිතස්ස විජානාති අත්ථ'න්ති.

9. පරොසහස්සජාතකං.

100. අසාතං සාතරූපෙන පියරූපෙන අප්පියං
දුක්ඛං සුඛස්ස රූපෙන පමත්තමතිවත්තතී'ති.

10. අසාතරූපජාතකං.

ලිත්තවග්ගො දසමො.

තස්සුද්දානං:

ගිලමක්ඛකුතූහලමාතුකස්සා
මුනිනා ච අනිච්චතපත්ථවරං,
ධනපාලිවරො අතිපණ්ඩිතකො
සපරොසහස්සඅසාත දස.

මජ්ඣිමපණ්ණාසකො.

---

1. අනවසෙකං - මජ්සං, ස්‍යා.
2. දුග්ගතිං - මජ්සං.
3. ධනම්හි උපකූටිතො - ස්‍යා. මනම්හි උපකූයිතො - මජ්සං,
4. කන්දෙය්‍යුකො - ස්‍යා.

96. මුවවිට දක්වා සමව පිරුණු නො වැගිරෙන්නා වූ තලතෙල් පාත්‍රය යම්සේ ගෙනැ යන්නේ ද, එසේ ම නො ගියවිරු තිවන් දිසාව පතන්නේ ස්වකීය සිත (භාවනාවෙක යොද) විසිර යා නො දී රක්නේ ය.

6. තෙලපත්ත ජාතක යි.

97. ජීවකයා ද මළහු දක ධනපාලී ද දුගී වූවා දක පන්ථකයා ද වෙනෙහි මංමුළා වූවහු දක පාපක නමැත්තා නැවත (ආපසු) ආවේ ය.

7. නාමසිද්ධි ජාතක යි.

98. පණ්ඩිතයා නම් යහපත, උතුම් ය. (නාම මාත්‍රයෙන්) අති පණ්ඩිතයා උතුම් නො වේ ම ය. අතිපණ්ඩිත පුත්‍රයා විසින් ඇසිල්ලෙකින් දවන ලද්දෙම් වෙමි.

8. කූටවාණිජ ජාතක යි.

99. රැස්වූවන් අතුරෙහි දහසකට අධික වූ ප්‍රඥා රහිත වූ ඔවුහු අවුරුදු සියයක් හඬන්නාහු නමුදු (කාරණය වටහා නො ගනිති. එහෙයින් උතුම් නො වේ.) යමෙක් ප්‍රකාශිත වචනයාගේ අර්ථය දනී ද ඒ එක ප්‍රඥවත් පුරුෂ තෙමේ ම උතුම් වේ.

9. පරොසහස්ස ජාතක යි.

100. අමධුරය (අකුශලකර්ම විපාක දෙන තුරු) මධුර ස්වරූපයෙන් ද අප්‍රියවස්තුව ප්‍රියස්වරූපයෙන් ද දුඃඛය සුඛස්වරූපයෙන් ද ප්‍රමත්ත (මුළාසිහි ඇති) පුරුෂයා යටපත් කෙරෙයි.

10. අසාතරූප ජාතක යි.

දසවැනි ලිත්ත වර්ග යි.

එහි උද්දන :

ගිලමක්ඛ (ලිත්ත) අකුතුහල (මහාසාර) මාතුක (විස්සාස භොජන) මුනි (ලොමහංස) අනිච්චත (මහාසුදස්සන) පත්වර (තෙලපත්ත) ධනපාලිවර (නාමසිද්ධි) අතිපණ්ඩිත (කූටවාණිජ) පරොසහස්ස සාත (රූප) යන දසය යි.

මජ්ඣිම පණ්ණාසක යි.

11. පරොසතවග්ගො

101. පරොසතඤ්චෙපි සමාගතානං
ඣායෙය්‍යුං තෙ වස්සසතං අපඤ්ඤා,
එකොව සෙය්‍යො පුරිසො සපඤ්ඤො
යො භාසිතස්ස විජානාති අත්ථ'න්ති.

1. පරොසතජාතකං.

102. යො දුක්ඛඵුට්ඨාය භවෙය්‍ය තාණං
සො මෙ පිතා දූභි[1] වනෙ කරොති,
සා කස්ස කන්දාමි වනස්ස මජ්ඣෙ
යො තායිතා සො සහසා කරොතීති.

2. පණ්ණිකජාතකං.

103. යත්ථ වෙරී නිවසති න වසෙ තත්ථ පණ්ඩිතො,
එකරත්තං දිරත්තං වා දුක්ඛං වසති වෙරිසූති.

3. වෙරිජාතකං.

104. චතුබ්භිඅට්ඨජ්ඣගමා අට්ඨාහි-පි ච සොළස,
සොළසාහි ච බත්තිංස අත්‍රිච්ඡං චක්කමාසදෙ.
ඉච්ඡාහතස්ස පොසස්ස චක්කං භමති මත්ථකෙති.

4. මිත්තවින්දජාතකං.

105. බහුං පෙතං වනෙ කට්ඨං වාතො භඤ්ජති දුබ්බලං;
තස්ස චෙ භායසී නාග කිසො නූන භවිස්සසීති.

5. දුබ්බලකට්ඨජාතකං.

1. දුබ්භි – මජසං, සයා.

11. පරොසත වර්ගය

101. රුස්වූවන් අතුරෙහි සියයකට අධික වූ ද ප්‍රඥා රහිත වූ ඔවුහු අවුරුදු සියයක් පරීක්‍ෂා කොට බලන්නාහු නමුදු (කාරණය වටහා නො ගනිති. එහෙයින් උතුම් නොවේ.) යමෙක් ප්‍රකාශිත වචනයාගේ අර්‍ථය දනී ද ඒ ප්‍රඥාවත් එක පුරුෂයා ම උතුම් වේ.

1. පරොසත ජාතක යි.

102. යමෙක් දුකින් පහරන ලද තැනැත්තියට පිහිට වන්නේ ද මාගේ ඒ පියා වෙනෙහි මිත්‍රද්‍රොහි කර්මය කෙරෙයි. වෙනෙහි මැදූ ඒ මම කවරක්හට (පිහිට සොයා) හඬම් ද, යමෙක් (මට) පිහිට වන්නට සුදුසු ද හෙතෙමේ ම සාහසික කර්මයක් කෙරෙයි.

2. පණ්ණික ජාතක යි.

103. යම් තැනෙක්හි වෛරී පුද්ගලයා වෙසේ ද එතන්හි නුවණැත්තේ නො වසන්නේ ය. (කුමක් හෙයින් ද යත්:) එක දවසක් හෝ දෙකක් හෝ වෛරීන් අතුරෙහි (වසන්නේ) දුකින් (ම) වෙසේ.

3. වෙරි ජාතක යි.

104. සතර දෙනකුන්ගෙන් අසන්තුෂ්ට වැ අටදෙනකුන් කරා ගියේ ය. අටදෙනකුන්ගෙන් අසන්තුෂ්ට වැ සොළොස්දෙනකුන් කරා ද සොළොස්දෙනකුන්ගෙන් අසන්තුෂ්ට වැ දෙතිස්දෙනකුන් කරා ද ගියේ ය. (ලද දෙයින් නො සතුටු වැ) වැඩියක් පතන්නේ උරචක්‍රයට පැමිණියේ ය. තෘෂ්ණාවෙන් පෙළන ලද පුරුෂයාගේ මස්තකයෙහි උරචක්‍රය (නැවත නැවත වැටීමෙන්) බමයි.

4. මිත්තවින්දක ජාතක යි.

105. වෙනෙහි බොහෝ වූ (යම්) මේ දුර්වල කාෂ්ටයක් (දණ්ඩක්) සුළභ බිඳී ද, නාගය, ඉදින් එයට බියපත් වෙහි නම් ඒකාන්තයෙන් කෘෂ වූවෙක් වන්නෙහි ය.

5. දුබ්බලකට්ඨ ජාතක යි.

106. සුසුඛං වත මං ජීවන්තං[1] පචමානා උදඤ්චනී,
චොරී ජායප්පවාදෙන තෙලං ලොණඤ්ච යාචතීති.

6. උදඤ්චනීජාතකං.

107. සාධු ඛො සිප්පකං නාම අපි යාදිසකීදිසං,
පස්ස ඛඤ්ජප්පහාරෙන[2] ලද්ධා ගාමා චතුද්දිසාති.

7. සාලිත්තකජාතකං.

108. සිකෙඛය්‍ය සික්ඛිතබ්බානි සන්ති සච්ඡන්දිනො ජනා,
බාහියා හි සුහන්නෙන[3] රාජානමභිරාධයීති[4].

8. බාහියජාතකං[5].

109. යථන්නො පුරිසො හොති තථන්නා තස්ස දෙවතා,
ආහරෙතං කණං පූවං[6] මා මෙ භාගං විනාසයාති

9. කුණ්ඩපූවජාතකං.

110. සබ්බසංහාරකො නත්ථි සුද්ධං කඞ්ගු පවායති,
අලිකං භාසත යං ධුත්තී සච්චමාහ මහල්ලිකාති.

10. සබ්බසංහාරකපඤ්හො.

පරොසතවග්ගො එකාදසමො.

තස්සුද්දනං:

සපරොසතතායිතවෙරී පුන
හමචක්කථ නාගසිරිවහයනො,
සුඛකඤ්චනසිප්පකබාහියා
කුණ්ඩපූවමහල්ලිකකා ච දස.

---

1. සුඛිතං වත මං ජීවා – මජසං.
2. ඛජ්ජපහාරෙන – මජසං.
3. බාහිරා හි සුහදෙන – මජසං.
4. රාජානං අභිරාධයි – සයා.
5. බාහිර– මජසං.
6. කුණ්ඩපූවං – මජසං, සයා.

106. එකාන්තයෙන් ඉතා සුවසේ ජීවත්වන්නා වූ මා පෙළන්නාවූ දිය ඉස්නා සටිකාවක් මෙන් අන්සතු දැ පැහැර ගන්නා වූ භායඞා නාමයෙන් යුක්ත සෙරක් තෙල් ද ලුණු ද (ආදි කැමැති කැමැති වස්තුව) ඉල්ලයි.

6. උදඤ්චනී ජාතක යි.

107. යම්තම් වූ ශිල්පය නමුදු යහපත් ම ය. බලව කොරාගේ (එළුබෙටි) ගැසීමෙන් සතර දිගින් සතරක් ගම්හු ලබන ලදහ.

7. සාලිත්තක ජාතක යි.

108. හික්මෙන්නට සුදුසු ශිල්පයන් හික්මෙන්නේ ය, (ඉගෙන ගන්නේය) ඒ ඒ ශිල්පයෙහි කැමැති ජනයෝ ඇත්තාහ. යම් හෙයෙකින් බිහි ජනපදයෙහි උපන් ස්ත්‍රී මනා කොට කළ පුරිෂසර්ගයෙන් රජහු සිත් ගත්තී ද (එහෙයිනි).

8. බාහිය ජාතක යි.

109. පුරුෂ තෙමේ යම්බඳු ආහාරයක් ඇත්තේ වේ ද ඔහුගේ දෙවතාවා ද එබඳු ම ආහාර ඇත්තේ ය, මේ කුඩුපූව (කුඩුකැවුම) ගෙනෙව, මාගේ කොටස නො නසව.

9. කුණ්ඩපූව ජාතක යි.

110. මෙහි සර්වසංහාර (සියල්ල එකතු වූ) සුවඳ නැත්තේ ය. (අනෙක් සුවඳෙකින් අමිශ්‍ර හෙයින්) පිරිසුදු පුවහුමල්සුවඳ ද විහිදෙයි. ධූර්ත වූ මෝ තොමෝ බොරු කියයි. මහල්ලිකා (මැහැලි) තොමෝ සැබවක් කිව.

10. සබ්බසංහාර ජාතක යි.

එකොළොස්වැනි පරෝසත වර්ග යි.

එහි උද්දන :

පරෝසත – තායිත (පණ්ණික) වෙරී හමචාසක (මිත්තවින්දක) නාගසිරි (දුබ්බලකට්ඨ) සුබ (උදඤ්චනී) සිප්පක (සාලිත්තක) බාහිය කුණ්ඩපූව මහලලික (සබ්බසංහාරක) යන දසය යි.

12. හංසිවග්ගො

111. හංසි තුවං[1] එවමඤ්ඤසි
සෙය්‍යො පුත්තෙන පිතා'ති රාජසෙට්ඨ,
හන්දස්සතරස්ස තෙ අයං
අස්සතරස්ස හි ගද්‍රභො පිතා'ති.

1. ගද්‍රභපඤ්හො.

112. යෙන සත්තුබිලඞ්ගා ච දිගුණ පලාසො ච පුප්ඵිතො,
යෙනාදම් තෙන වදම් යෙන නාදම් න තෙන වදම්
එස මග්ගො යව මජ්ඣිකස්ස එතං ඡන්නපථං විජානාහීති.

2. අමරාදෙවිපඤ්හො.

113. සද්දහාසි සිගාලස්ස[2] සුරාපීතස්ස බ්‍රාහ්මණ,
සිප්පිකානං සතං නත්ථි කුතො කංසසතා දුවෙති.

3. සිගාලජාතකං[3].

114. බහුචින්තී අප්පචින්තී ච උභො ජාලෙ අබජ්ඣරෙ,
මිතචින්තී අමොචෙසි[4] උභො තත්ථ සමාගතා'ති.

4. මිතචින්තිජාතකං.

115. යායඤ්ඤමනුසාසති[5] සයං ලොලුප්පචාරිණී,
සායං විපක්ඛිකා සෙති හතා චක්කෙන සාළිකා'ති[6].

5. අනුසාසිකජාතකං[7].

---

1. හඤ්චිතුවං – මජසං.
2. සිඞ්ගාලස්ස – මජසං.
3. සිඞ්ගාල – මජසං.
4. පමොචෙසි – මජසං.
5. යායඤ්ඤ – මජසං.
6. සායිකා – මජසං.
7. ලොලසාසික – මජසං.

12. හංස වර්ගය

111. රාජොත්තමය, ඉදින් තෙපි පුතාට වඩා පියා උතුමැ යි මෙසේ හඟනහු ද එබැවින් තොපගේ අශ්වතරයාට වඩා මේ කොටළුවා උතුම් වන්නේ ය. යම් හෙයෙකින් කොටළු තෙම අශ්වතරයාට පිය වූයේ ද එහෙයිනි.

1. ගද්‍රභපඤ්හ ජාතක යි.

112. යම් තැනෙක්හි අත්සුණු ද කාඩි ද විකුණන අංගානියෙක් (කඩපිළක්) ඇද්ද, යම් තැනෙක්හි පිපුණා වූ දෙකක් ව මැදින් බෙදී ගිය පත් ඇති කොබෝලීල රුක ද යම් අතකින් බුදිම් ද ඒ (දකුණු) දිසාවෙන් මග කියමි. යම් අතකින් නො බුදිම් ද ඒ (වම්) දිසාවෙන් (මග) නො කියමි. යවමැදුම්ගමැ පිහිටි අපගේ ගෙට මේ මාර්ගය ය. මේ සඟවා කී කාරණය දැනැගනුව.

2. අමරාදෙවිපඤ්හ ජාතක යි.

113. බ්‍රාහ්මණය, සුරා බොන ලද හිවලාගේ වචනය අදහන්නෙහි ද (මා ළඟ) බොල්ලන් (සිප්පි) සියයකුදු නැත, කහවණු දෙසියයක් කොයින් ද?

3. සිගාල ජාතක යි.

114. බහුචින්තී නම් මත්ස්‍යයා ද අප්පචින්තී නම් මත්ස්‍යයා ද යන දෙදෙනා ම දැලෙහි බැඳුණාහ. මිතචින්තී නම් මත්ස්‍යයා (ඔවුන්) දැලෙන් මිදී ය. බහුචින්තී අප්පචින්ති දෙදෙනා ම දියෙහි මිතචින්තී හා එක්වූහ.

4. මිතචින්තී ජාතක යි.

115. යමක් තොමෝ ලොල් වැ හැසිරෙන්නී අන්‍යයනට අනුශාසනා කරන්නී ද ඒ මේ සැළලිහිණි රියසකින් නසන ලද්දී පහවූ පියාපත් ඇති වැ මාර්ගයෙහි හෝනී ය.

5. අනුසාසික ජාතක යි.

116. අතිකරමකරාචරිය මය්හම්පෙතං න රුච්චති,
චතුත්ථෙ ලඞ්ඝයිත්වාන පඤ්චමියම්පි[1] ආවුතොති[2].

6. දුබ්බචජාතකං.

117. අච්චුග්ගතා[3] අතිබලතා අතිවෙලං පභාසිතා,
වාචා හනති දුම්මෙධං තිත්තිරංවාතිවස්සිත'න්ති.

7. තිත්තිරජාතකං.

118. නාචින්තයන්තො පුරිසො විසෙසමධිගච්ඡති,
චින්තිතස්ස ඵලං පස්ස මුත්තොස්මි වධබන්ධනා'ති.

8. වට්ටකජාතකං.

119. අමාතාපිතරි[4] සංවද්ධො අනාචරියකුලෙ[5] වසං,
නායං කාලං[6] අකාලං වා අභිජානාති කුක්කුටො'ති.

9. අකාලරාවිජාතකං.

120. අබද්ධා[7] තත්ථ බජ්ඣන්ති යත්ථ බාලා පභාසරෙ,
බද්ධාපි තත්ථ මුච්චන්ති යත්ථ ධීරා පභාසරෙ'ති.

10. බන්ධනමොක්ඛජාතකං.

හංසවග්ගො ද්වාදසමො.

තස්සුද්දානං:

අට්ගද්‍රභසත්තු චකංසසතං
බහුචින්තිසාසිකායාතිකර,
අතිවෙලවිසෙසමනාචරියො ච
ධීරාපභාසරතෙන දස.

1. පඤ්චමායසි – මජසං, සයා.
2. ආධුතො – මජසං.
3. අච්චුග්ගතාතිලපනා – මජසං.
4. අමාතාපිතර – සයා. මජසං.
5. අනාවෙර – මජසං.
6. කාලමකාලං වා – සයා.
7. අබනධා – මජසං.

116. ආචාර්‍ය්‍යය, තොපට නො පිළිවන් වූ අධික වූ ක්‍රියාවක් කෙළෙහි ය. මට ඒ කාරණය නො රුස්සයි. සතරවැනි ශස්ත්‍රයෙහි (නොවැටී සිරුර) පන්වා පස්වැන්නෙහි ඇවිණී ගියෙහි ය.

6. දුබ්බච ජාතක යි.

117. ඉතා උස්වූ (ඉතා මහත් කොට කියන ලද්ද වූ) ඉතා බලවත් වූ ප්‍රමාණය ඉක්මවා ප්‍රකාශිත වචනය ප්‍රමාණය ඉක්මවා හැඩූ වටුවා මෙන්, නුවණ නැත්තහු නසයි.

7. තිත්තිර ජාතක යි.

118. පුරුෂ තෙමේ (පැමිණි දුකින් මිදීමට උපාය) නො සිතන්නේ දුකින් මිදීම නම් වූ විශෙෂයට නො පැමිණේ, (එසේ) චින්තිත කර්‍ම්‍යාගේ ප්‍රයොජනය බලව. මම මරණයෙන් ද බන්‍ධන-යෙන් ද මිදුණෙමි.

8. වට්ටක ජාතක යි.

119. මවුපියන් සමීපයෙහි නො වැඩුණු ආචාර්‍ය්‍යකුලයෙහි නො වූසූ මේ කුකුළා හැඬුවමනා කාලය හෝ නො හැඬුවමනා කාලය හෝ නො දනී.

9. අකාලරාවි ජාතක යි.

120 යම් තැනෙක්හි අඥනයෝ බෙණෙද්ද එතැන්හි බන්‍ධනයට නුසුදුස්සෝ ද බැඳෙති. යම් තැනෙක්හි නුවණැත්තෝ බෙණෙද්ද එතැන්හි බන්‍ධනයට සුදුස්සෝ ද මිදෙති.

10. බන්‍ධනමොක්ඛ ජාතක යි.

දොළොස්වැනි හංස වර්ග යි.

එහි උද්දනය :

ගද්‍රභ – සත්තු (අමරාදෙවිපඤ්හ) කාසසත (සිගාල බහුචිනති (මිතචිනති) සාසික (අනුසාසිත) අතිසාර දුබ්බච අතිබල (තිත්තිර) විසෙස (වට්ටක) අනාචරිය (අකාලරාවි) ධීරාපහාසර (බන්‍ධන-මොක්ඛ) යන දසය යි.

13. කුසනාළිවග්ගො

121. කරෙ සරික්ඛො අථවාපි සෙට්ඨො
නිහීනකො වා'පි කරෙය්‍ය එකො,
කරෙය්‍යුං[1] තෙ ව්‍යසනෙ උත්තමත්ථං
යථා අහං කුසනාළී රුචාය'න්ති.

1. කුසනාළිජාතකං.

122. යසං ලද්ධාන දුම්මෙධො අනත්ථං චරති අත්තනො,
අත්තනො ච පරෙසඤ්ච හිංසාය පටිපජ්ජති'ති.

2. දුම්මෙධ ජාතකං.

123. අසබ්බත්ථගාමිනිං වාචං බාලො සබ්බත්ථ භාසති,
නායං දධිං වෙදි න නඞ්ගලීසං දධිම්පයං[2] මඤ්ඤති නඞ්ගලී-
සන්ති.

3. නඞ්ගලීසජාතකං.

124. වායමෙථෙව පුරිසො න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො,
වායාමස්ස ඵලං පස්ස භුත්තා අම්බා අනීතිහන්ති.

4. අම්බජාතකං.

125. බහුම්පි සො විකත්ථෙය්‍ය අඤ්ඤං ජනපදං ගතො,
අන්වාගන්ත්වාන දූසෙය්‍ය භුඤ්ජ භොගෙ කටාහකාති.

5. කටාහකජාතකං.

1. කරෙය්‍යු – මජසං, සයා.
2. දධිප්පයං. (මෙතෙ.) – මජසං. සයා.

13. කුසනාළි වර්ගය

121. (ජාත්‍යාදීන්) සමාන වූයේ ද ශ්‍රේෂ්ඨ වූයේ ද (මිත්‍රධර්මය) කරන්නේ ය. එකෙක් හීන වූයේ ද (මිත්‍රධර්මය) කරන්නේ ය. ඒ මිත්‍රයෝ විපත්තියෙහි දී උතුම් වූ අර්ථයක් ම (යහපතක් ම) කරන්නාහු ය. බුරුදගස උපන් මා ද දියබෙරලිය ගස උපන් කුසනාළි ද මෙනි.

1. කුසනාළි ජාතක යි.

122. නුවණ නැත්තේ යශස් (පිරවර සම්පත්) ලැබැ තමනට අනර්ථය පිණිස හැසිරෙයි. තමහට ද මෙරමාහට ද හිංසා පිණිස පිළිපදී.

2. දුම්මේධ ජාතක යි.

123. නුවණ නැත්තේ හැම තැනට ම නුසුදුසු තෙපුල් හැම තන්හි ම බෙණෙයි. මේ තෙමේ දී ද (දීකිරි ද) නඟුලීස ද නො දන්නේ ය. (යම්සේ) දීකිරි ද නඟුලීස යයි සිතා ද එහෙයිනි.

3. නඞ්ගුලීස ජාතක යි.

124. නුවණැති පුරුෂ තෙමේ වැයම් කෙරේ ම ය. නො කලකිරෙන්නේ ය. වැයම් කිරීමේ ප්‍රයොජනය බලව (රස) මෙසේ ද වී යැ යි මෙසේ ද වී යැ යි ඇසීම් මාත්‍රයෙන් නොවැ (ප්‍රත්‍යක්ෂයෙන් ම) අඹ අනුභව කරන ලදහු ය.

4. අම්බ ජාතක යි.

125. ඒ පුරුෂ තෙමේ අනෙක් ජනපදයකට ගියේ බොහෝ කොට ම (පරිභව හා වංචා වචන) බණන්නේ ය. නැවත අවුදින් (තමාගේ ස්වාමියා) දූෂණය කරන්නේ ය. කටාහකය (අනාචාර ගති හැරැපියා) සම්පත් අනුභව කරව.

5. කටාහක ජාතක යි.

126. තථෙවෙකස්ස[1] කල්‍යාණං තථෙවෙකස්ස පාපකං,
තස්මා සබ්බං න කල්‍යාණං සබ්බං වාපි න පාපකන්ති.

6. අසිලක්ඛණජාතකං.

127. තෙ දෙසා තානි වත්ථූනි අහඤ්ච වනගොචරො,
අනුවිච්ච ඛො තං ගණ්හෙය්‍යුං පිබ[2] ඛීරං කලණ්ඩුකාති.

7. කලණ්ඩුකජාතකං.

128. යො වෙ ධම්මං ධජං කත්වා නිගූළ්හො පාපමාචරෙ,
විස්සාසයිත්වා භූතානි බිළාරං නාම තං වතන්ති.

8. බිළාරවතජාතකං[3].

129. නායං සිඛා පුඤ්ඤහෙතු ඝාසහෙතු අයං සිඛා,
න'ඞ්ගුට්ඨගණනං යාති අලනෙත හොතු අග්ගිකාති.

9. අග්ගික[4]ජාතකං.

130. යථා වාචා ච භුඤ්ජස්සු යථාභූතඤ්ච ව්‍යාහර,
උභයං තෙ න සමෙති වාචාභූතඤ්ච කොසියෙති.

10. කොසියජාතකං.

කුසනාළිවග්ගො[5] තෙරසමො.

තස්සුද්දානං:

කුසනාළිසිරිව්හයනො ච යසං
දධිමඹකටාහකපඤ්චමකො,
අථ පාපක ඛීරබිළාරවතං
සිඛිකොසියසව්හයනෙන දස.

---

1. තදෙවකස්ස – "අයමෙව වා පාඨො. දුතියපදෙපි එසෙවනයො" අට්ඨකථා.
2. පිව මජසං–සයා.
3. මූසිකජාතකං–සයා.
4. අග්ගිකභාරද්වාජ – මජසං.
5. සරීකබ්බවග්ගො–මජසං.

126. එකකුහට හේ ම (එය ම) කල්‍යාණය (යහපත් ය) එකකුහට හේ ම ලාමක ය. එහෙයින් සියල්ල කල්‍යාණ නො වේ. සියල්ල ලාමක ද නො වේ.

6. අසිලක්ඛණ ජාතක යි.

127. (නා උපන් මවුකුස නම් වූ) දෙශය ද (මවු ගැබ නම් වූ) වස්තුව ද වනගොචර වූ (තිරිසන් වූ) මම ද දනිමි. (ස්වාමිවරු) නා දැනැ හැරගන්නාහ. කලණ්ඩුකය කිරි බොව.

7. කලණ්ඩුක ජාතක යි.

128. යමෙක් එකාන්තයෙන් (දශකුශල) ධර්‍මයන් ධ්වජයක් කොට (මතු කොට පෙන්නා) සත්ත්වයන් (ලවා මේ සිල්වතෙකැ යි) විශ්වාස ඇති කරවාගෙනැ තමන් තතු සඟවාගත්තේ පව් සිදු කෙරේ ද ඔහුගේ ඒ පැවැත්ම බිළාර නම් ව්‍රතය යි.

8. බිළාරවත ජාතක යි.

129. මෙ සිඛාව (හිසැ මුදුනෙහි බැඳි කෙස් රොද) පින් පිණිස නො වේ. මේ සිඛාව අනුන් කනු සඳහා ය. (මේ මූසික සමූහයා) ඇඟිලි ගණනට නො යේ. අග්ගිකය තාගේ (මීයන් ගිණීම) මෙ පමණ වේවා.

9. අග්ගික ජාතක යි.

130. කොසියාව (ලෙඩෙමි යන) වචනයට අනුකූල වැ අනුභව කරව. කෑ දෙයට අනුකූල වැ මෙහෙ කරව. තීගේ (ලෙඩෙමි යන) කීම ද අනුභව කිරීම ද යන මේ දෙකරුණ සම නො වේ.

10. කොසිය ජාතක යි.

තෙලෙස්වැනි කුසනාළි වර්ග යි.

එහි උද්දන:

කුසනාළි – යසං (දුම්මෙධ) දධි (නඞ්ගලීස) – අම්බ – කටාහක – පාපක – (අසිලක්ඛණ) ඛීර (කලණ්ඩුක) බිළාරවත – සිඛී (අග්ගික) කොසිය යන දසය යි.

14. අසම්පදානවග්ගො.

131. අසම්පදානෙනිතරීතරස්ස
බාලස්ස මිත්තානි කලීභවන්ති,
තස්මා හරාමි භුසං අඩ්ඪමානං
මා මෙ මිත්ති ජීයිත්ථ[1] සස්සතායන්ති.

1. අසම්පදානජාතකං.

132. කුසලූපදෙසෙ ධිතියා දළ්හාය ච
අවත්ථිතත්තා[2] භයභීරුතාය ච,
න රක්ඛසීනං වසමාගමිම්හ[3]
ස සොත්ථිභාවො මහතා භයෙන මෙති.

4. පඤ්චගරුකජාතකං[4].

133. ඛෙමං යහිං තත්ථ අරී උදීරිතො
උදකස්ස[5] මජ්ඣෙ ජලතෙ ඝතාසනො,
න අජ්ජ වාසො මහියා මහීරුහෙ
දිසා භජව්හො සරණජ්ජ නො භයන්ති.

3. ඝතාසනජාතකං.

134. යෙ සඤ්ඤිනො තෙපි දුග්ගතා
යෙපි අසඤ්ඤිනො තෙපි දුග්ගතා,
එතං උභයං විවජ්ජය
තං සමාපත්තිසුඛං අනඞ්ගණ'න්ති.

4. ඣානසොධනජාතකං.

135. චන්දාභං සුරියාභඤ්ච යො'ධ පඤ්ඤාය ගාධති,
අවිතක්කෙන ඣානෙන හොති ආභස්සරූපගොති.

5. චන්දාභජාතකං.

---

1. ජිය්‍යිත්ථ – මජසං, සයා.
2. අනිවත්තිතත්තො – මජසං.
3. වසමාගමිම්හසෙ–මජසං.
4. භීරුකජාතකං–මජසං, සයා. (පඤ්චභීරුකජාතකං.)
5. දකස්ස–මජසං, සයා.

14. අසම්පදාන වර්ගය

131. කිසියම් හීන වූ ද උතුම් වූ ද වස්තුවක් නො ගැනීම නිසා අනුවණයාගේ මිතුරෝ කිලුටු වෙත්. (හෙවත් බිඳෙත්.) එහෙයින් (මිත්‍රත්වය රකිනු පිණිස) මිතුරා දෙන ලද බොල් කුරුණි සතර ගතිමි. මගේ මිත්‍රත්වය නො පිරිහේවා, මිත්‍රත්වය සදා පවතීවා.

1. අසම්පදාන ජාතක යි.

132. දක්‍ෂ වූ (පසේබුදුවරයන්ගේ) අවවාදයෙහි දැඩි ව පිහිටි හෙයින් ද භය භීරුතායෙන් නො නැවති හෙයින් ද යකින්නන්ගේ වශයට නො පැමිණියම්හ. මට මහත් වූ බියෙන් ඒ සෙත් බව වී.

2. පඤ්චගරුක ජාතක යි.

133. යම් තැනෙක නිර්භය ද එ තැන සතුරා නැඟීසිටියේ ය. දිය මැද ගිනි දිලිසෙයි. පොළෝ තෙලෙහි වූ රුක්හි අද වාසයෙක් නැත. අන් දෙසෙක යවු. අපට පිහිට වූ තැනින් අද බිය උපන.

3. ඝතාසන ජාතක යි.

134. සිතැති යම් සත්ත්ව කෙනෙක් වෙත් ද ඔහු ද දිළිඳු වෙති. සිත නැති යම් සත්ත්ව කෙනෙක් වෙත් ද ඔහු ද දිළිඳු වෙති. සිත ඇති සිත නැති භවයන් දුරු කරව, ඒ අරූප සමවත් සුව නිදෙසි.

4. ඣානසොධන ජාතක යි.

135. මෙ ලොවැ යමෙක් ඔදාතකසිණය ද පීතකසිණය ද නුවණින් වඩා ද, මේ දෙයාකාරයෙන් වැඩූ විතර්ක රහිත දහැනින් (දෙවැනි දහැනින්) ආභස්සර බඹ ලොවට පැමිණියේ වෙයි.

5. චන්දාභ ජාතක යි.

136. යං ලද්ධං තෙන තුට්ඨබ්බං අතිලොභො හි පාපකො,
හංසරාජං ගහෙත්වාන සුවණ්ණා පරිහායථාති.

6. සුවණ්ණහංසජාතකං.

137. යත්ථෙකො ලභතෙ බබ්බු දුතියො තත්ථ ජායති,
තතියො ච චතුත්ථො ච ඉදං තෙ බබ්බුකා බිලන්ති.

7. බබ්බුකජාතකං.

138. කිංතෙ ජටාහි දුම්මෙධ කිංතෙ අජිනසාටියා,
අබ්භන්තරං තෙ ගහනං බාහිරං පරිමජ්ජසීති.

8. ගොධජාතකං.

139. අක්ඛී භින්නා පටො නට්ඨො සඛී ගෙහෙ ච භණ්ඩනං,
උභතො පදුට්ඨකම්මන්තා උදකම්හි ථලම්හි චාති.

9. උභතොභට්ඨජාතකං.

140. නිච්චං උබ්බිග්ගහදයා සබ්බලොකවිහෙසකා,
තස්මා තෙසං වසො නත්ථි කාකානස්මාක ඤාතින’න්ති.

10. කාකජාතකං.

අසම්පදානවග්ගො චුද්දසමො.

තස්සුද්දානං:

ඉතරීතරරක්ඛසිබෙමියො ච
පරොසතපඤ්ඤන ආභස්සරො පුන,
අථ හංසවරුත්තමබබ්බුජටං
පටනට්ඨකකාකවරෙන දස.

136. යමක් ලැබුණේ ද එයින් (ලද දෙයින්) සතුටු විය යුතු ය. අධික ලෝභය ලාමක ය. (රන් වැඩියක් ලබනු රිසි ව) ස්වර්ණහංස රාජයා අල්ලා ගැනීම නිසා රනින් පිරිහුණේ ය. (ලැබෙන්නට තුබූ රන් ද නො ලැබුණේ ය.)

6. සුවණ්ණහංසජාතක යි.

137. යම් තැනෙකැ බළලෙක් (ගොදුරක්) ලබා ද එතැනැ දෙවෙනි බළලෙක් උපදී. තෙවැන්නෙක් ද සිවුවැන්නෙක් ද උපදී. මේ තීගේ බබ්බුකා බිලය යැ. (පළිඟු ගුහාව යැ.)

7. බබ්බුකජාතක යි.

138. මෝඩය, ජටායෙන් තට කවර ප්‍රයොජනයෙක් ද? අඳුන් දිවි සමෙන් තට කවර ප්‍රයොජනයෙක් ද? තාගේ හිත රාගාදි කෙලෙස් කසළින් පිරී ඇත. පිටත (සිරුර) තවුස්වෙස් දරා පිරිමදනෙහි ය.

8. ගොධ ජාතක යි.

139. නෙත්‍රයෝ බුන්හ, පටය (වස්ත්‍රය) නවූයේ ය. (නැති විය) යෙහෙළිය හා තාගේ බිරිය ගෙයි කලහ යැ. දිය ගොඩ දෙතැන්හි දූෂිතකර්‍මාන්ත ඇත්තෙහි යැ.

9. උභතොභට්ඨ ජාතක යි.

140. සතතයෙන් තැතිගත් සිත් ඇතියහ. සියලු ලෝවැස්සන් වෙහෙසන්නාහ. එහෙයින් අපගේ නෑසියන් වූ ඒ කවුඩනට වූරුණුතෙල් නැත.

10. කාක ජාතක යි.

තුදුස්වැනි අසම්පදාන වර්ග යි.

එහි උද්දන:

ඉතරීතර (අසම්පදාන) යැ රක්ඛසී (පක්‍ෂගරුක) යැ බෙමි (සතාසන) යැ පරොසතපඤ්හ (ඣානසොධන) යැ ආභස්සර (චන්ද්‍රාභ) යැ හංසවරුතගම යැ බබ්බු යැ ජටා (ගොධ) යැ පටනට්ඨක (උභතොභට්ඨ) යැ කාක යැ යි ජාතක දසයෙකි.

15. කකණ්ටකවග්ගො.

141. න පාපජනසංසෙවී අච්චන්තසුඛමෙධති,
ගොධාකුලං කකණ්ටො'ව *කලිං පාපෙති අත්තානන්ති.

1. ගොධජාතකං.

142. එතං හි තෙ දුරාජානං යං සෙසි මතසායිකං,
යස්ස තෙ කඩ්ඪමානස්ස හත්ථා දණ්ඩො න මුච්චතී'ති.

2. සිගාලජාතකං.

143. ලසී ච තෙ නිප්ඵලිතා මත්ථකො ච විදළිතො,
සබ්බා තෙ ඵාසුකා භග්ගා අජ්ජ ඛො ත්වං විරොචසී'ති.

3. විරොචනජාතකං.

144. බහුම්පෙතං අසබ්භි ජාතවෙද
යං තං වාලධිනා හි පූජයාම,
මංසාරහස්ස නත්ථජ්ජ මංසං
නඞ්ගුට්ඨම්පි භවං පටිග්ගහාතූ'ති.

4. නඞ්ගුට්ඨජාතකං.

145. න ත්වං රාධ විජානාසි අඩ්ඪරත්තෙ අනාගතෙ,
අව්‍යායතං විලපසි විරත්තා කොසියායනෙ'ති.

5. රාධජාතකං.

146. අපි නු හනුකා සන්තා මුඛඤ්ච පරිසුස්සති,
ඔරමාම න පාරෙම පූරතෙව මහොදධී'ති.

6. කාකජාතකං.[1]

---

*. පාළියං පන ඵලං පාපෙතීති ලිඛන්ති, තං ව්‍යඤ්ජනං අට්ඨකථාය නත්ථි අත්ථොපිස්ස න යුජ්ජති. තස්මා යථාවුත්තමෙව ගහෙතබ්බං, අට්ඨකථා.

1. සමුද්දකාකජාතකං.

15. කකණ්ටක වර්ගය

141. පාපජනයා සෙවුනා පුද්ගල ඒකාන්තයෙන් සුව නො වඩයි. (නො ලබයි.) කකණ්ටකයා (කටුස්සා) කෙරෙන් ගොධාකුලය මෙන් තමා ද තමා හා එක් වූවනුදු විනාශයට පමුණුවයි.

1. ගොධ ජාතක යි.

142. යම් කාරණයෙකින් මළ එකක්හු මෙන් හෝනෙහි ද? තොපගේ මේ කාරණය නො දතහැකි ය. (කවර හෙයින් ද යත්:) දඬුකෙළවර අදනා කල්හි තොපගේ අතින් මුගුරුදණ්ඩ නො මිදේ ද (එහෙයිනි.)

2. සිගාල ජාතක යි.

143. තාගේ හිස්මුල් ද පිටතට නික්මුණේ ය. හිසද පළන ලද්දේ ය. තාගේ සියලු ඉළඇට බිඳුණේ ය. අද වූකලි තෝ බබළන්නෙහි ය.

3. විරොචන ජාතක යි.

144. අසත්පුරුෂ වූ ගිනිදෙවිය, යම් හෙයෙකින් තා වාලධියෙන් පුදමෝ ද මෙ පමණකුදු (තමනට අයිති දේ රැකැගත නොහැකි තොපට) බෙහෙව මාංසානුභවයට සුදුසු තොපට අද මස් නැත. පින්වත නඟුට ද පිළිගනීවා.

4. නඞ්ගුට්ඨ ජාතක යි.

145. රාධය, තෝ මධ්‍යමරාත්‍රිය නො ආ කල්හි (මෙතෙක් දෙනා ආවාහු යයි) නො දන්නෙහි ය. (එසේ වූ තෝ පරපුරුෂයන් වළකනුව) අව්‍යක්ත වූ විලාපයක් බණන්නෙහි ය. බැමිණිය බමුණා කෙරෙහි නො ඇලුණා ය.

5. රාධ ජාතක යි.

146. අපගේ හනු (හකු) විඩාවට පැමිණියේ ය. මුඛය ද වියළෙයි. මුහුදු දිය ඇදලන්නට වීයඹ කරම්හ. දිය හිස් කළ නො හෙම්හ. මහමුහුද පිරේ ම ය.

6. කාක ජාතක යි.

147. න ඉදං දුක්ඛං අදුං දුක්ඛං යං මං තුදති වායසො
යං සාමා පුප්ඵරත්තෙන කත්තිකං නානුභොස්සතීති.

7. පුප්ඵරත්තජාතකං.

148. නාහං පුනං න ච පුනං න චාපි අපුනප්පුනං.
හත්ථිබොන්දිං පවෙක්ඛාමි. තථා හි භයතජ්ජිතො'ති.

8. සිගාලජාතකං.

149. එකපණ්ණො අයං රුක්ඛො න භූම්‍යා චතුරඞ්ගුලො,
ඵලෙන විසකප්පෙන මහායං කිං භවිස්සතීති.

9. එකපණ්ණජාතකං.

150. අසන්තං යො පග්ගණ්හාති අසන්තඤ්චුපසෙවති,
තමෙව ඝාසං කුරුතෙ ව්‍යග්ඝො සඤ්ජීවකො යථාති.

10. සඤ්ජීවජාතකං.

කකණ්ටකවග්ගො[1] පණ්ණරසමො.

තස්සුද්දානං:

සුඛමෙධතිදණ්ඩවරො ච පුන
ලසිවාලදීපඤ්චමරාධවරො,
සමහොදධිකත්තිකබොන්දි පුන
චතුරඞ්ගුලබ්‍යග්ඝවරෙන දස.

උපරිමපණ්ණාසකො.

එකකනිපාතො නිට්ඨිතො.

තත්‍ර වග්ගුද්දානං:

අපණ්ණකං සීලවග්ගකුරුඞ්ග
කුලාවකං අත්ථකාමෙනපඤ්චමං,
ආසිංසො ඉත්ථිවරුණං අපායි.
ලිත්තවග්ගෙන තෙරස,
පරොසතං හංසිසරික්ඛං
අසම්පදංකකණ්ටවග්ගො.

1. පාපසෙවනවග්ගො - මජසං.

147. කවුඩු තෙම (හුල තියා සිටින) මා තුඩින් විදින්නේ ය. යන යම් දූකක් ඇද්ද, මෙය මට දුක් නො වෙයි. (මාගේ අඹු) සාමා වනුක් මලින් රදූ වස්ත්‍රයෙන් සැරසී කාර්තිකොත්සවශ්‍රිය නො විඳී යන යමක් ඇද්ද, එය මට දුක් වේ.

7. පුප්ඵරත්ත ජාතක යි.

148. මම ඇත්කඳ තුළට නැවත නො යෙමි, නැවත ද නො යෙමි, නැවත නැවත ද නො යෙමි. ඒ එසේ මැ ය. එපමණම හයින් නැති ගත්තෙම් වෙමි.

8. සිගාල ජාතක යි.

149. මේ (කොසඹ) ගස (දෙපසෙහි) එක එක පත් ඇත්තේ ය. බිමින් සතරඟුලක් වැඩියේ ද නො වෙයි. හලාහල විෂ සමාන වූ පත්‍රයෙන් යුක්ත ය. මහත් වැ වැඩුණේ කුමක් නම් වන්නේ ද,

9. එකපණ්ණ ජාතක යි.

150. යමෙක් අසත්පුරුෂයාට සත්කාර සම්මාන කෙරේ ද අසත්පුරුෂයා සෙවන හෝ කෙරේ ද, (ඒ අසත්පුරුෂයා) ඔහු ම ගිලගනී. (විනාශයට පත් කෙරෙයි) ව්‍යාඝ්‍ර සංජීවක දෙදෙනා මෙනි.

10, සඤ්ජීව ජාතක යි.

පසළොස් වැනි කකණ්ටක වර්ග යි.

එහි උද්දනය:

සුබමෙධ (ගොධ) දණ්ඩවර (සිගාල) ලසි (විරොචන) වාලධි (නඞ්ගුට්ඨ) පස් වැනි රාධ මහොදධි (කාක) කත්තික (පුප්ඵරත්ත) බොන්දී (සිගාල) චතුරඞ්ගුල (එකපණ්ණ) ව්‍යගස (සංජීව) යන දසය යි.

උපරිම පණ්ණාසක යි.

එකක නිපාතය නිමි.

එහි වග්ගුද්දන:

අපණ්ණක – සීලව – කුරුඞ්ග – කුලාවක – පස්වැනි අත්ථකාම – ආසිංස – ඉත්ථී – වරණ – අපායිම්භ – දස වැනි ලිත්ත – පරොසත – හංසි – පරික්ඛ (කුසනාළි) අසම්පදාන – කකණ්ටක යනු යි.

දුකනිපාතො

1. දළ්හවග්ගො

151. දළ්හං දළ්හස්ස ඛිපති මල්ලිකො[1] මුදුනා මුදුං
සාධුම්පි සාධුනා ජෙති අසාධුම්පි අසාධුනා,
එතාදිසො අයං රාජා මග්ගා උය්‍යාහි සාරථී.

152. අක්කොධෙන ජිනෙ කොධං අසාධුං සාධුනා ජිනෙ,
ජිනෙ කදරියං දානෙන සච්චෙන අලිකවාදිනං[2]
එතාදිසො අයං රාජා මග්ගා උය්‍යාහි සාරථීති.

1. රාජොවාදජාතකං.

153. අසමෙක්ඛිතකම්මන්තං තුරිතාභිනිපාතිනං,
සානි කම්මානි තප්පෙන්ති උණ්හං වජ්ඣොහිතං මුඛෙ.

154. සීහො ච සීහනාදෙන දද්දරං අභිනාදයි,
සුත්වා සීහස්ස නිග්ඝොසං සිගාලො දද්දරෙ වසං
භීතො සන්තාසමාපාදි හදයඤ්චස්ස අප්ඵලීති.

2. සිගාලජාතකං.

155. චතුප්පදො අහං සම්ම ත්වම්පි සම්ම චතුප්පදො,[3]
එහි සීහ නිවත්තස්සු කින්නු භීතො පලායසී.

156. අසුචි පූතිලොමොසි දුග්ගන්ධො වාසි සූකර,
සචෙ යුජ්ඣිතුකාමොසි ජයං සම්ම දදම්මි තෙති.

3. සූකරජාතකං.

157. ඉධූරගානං පවරො[4] පවිට්ඨො
සෙලස්ස වණ්ණෙන පමොක්ඛමිච්ඡං,
බ්‍රහ්මඤ්ච වණ්ණං අපචායමානො
බුභුක්ඛිතො නො විසහාමි. හොතු.

---

1. ඛත්තිකො-මජසං, බල්ලිකො-සයා.
2. සබ්බනාලිකවාදිනං-මජසං, සයා.
3. සම්ම - මජසං, සයා.
4. පවරං-සීමු.

දුකනිපාතය

1. දළ්හ වර්ගය

151. මල්ලික නම් රජ දැඩි (තද) අයට තදින් පහර දෙයි. මෘදු අය මෘදුභාවයෙන් දිනයි. සත්පුරුෂයා සාධු ගුණයෙන් ද අසත්පුරුෂයා අසාධු ගුණයෙන් ද දිනයි. මෙ රජ මෙබඳු ගති ඇත්තේ ය. රථාචාර්‍ය්‍ය, මාර්ගයෙන් පහව යා (යි මල්ලික රජුගේ රථාචාර්‍ය්‍යයා බරණැස් රජුගේ රථාචාර්‍ය්‍යයාට කී ය.)

152. ක්‍රොධ කරන්නා ක්‍රොධ නො කිරීමෙන් (මෛත්‍රියෙන්) දිනයි. අසත්පුරුෂයා සාධු ගුණයෙන් දිනයි. තදමසුරා (තදමසුරුබව) දීමෙන් දිනයි. බොරු කියන්නා සත්‍යවචනයෙන් දිනයි. මෙ රජ මෙබඳු ගුණ ඇත්තේ ය. රථාචාර්‍ය්‍ය, මාර්ගයෙන් පහව යා (යි බරණැස් රජුගේ රථාචාර්‍ය්‍යයා මල්ලික රජුගේ රථාචාර්‍ය්‍යයාට කී ය.

1, රාජොවාද ජාතක යි,

153. මනා කොට පරීක්‍ෂා නො කොට කරන ලද කර්‍මාන්ත ඇති, (නොවිචාරා) වහා කටයුතු පටන් ගන්නහු, උණු අහරක් මුඛයෙහි තැබීමෙන් මුඛය දැවෙන්නා සේ තමාගේ ක්‍රියාවෝ (ඔහු) තවත්. (ස්වකීය ක්‍රියාවලින් ඔහු තැවෙයි, දැවෙයි.)

154. සිංහ තෙමේ ද සිංහනාදයෙන් පර්වතය එකනාද කෙළේ ය. පර්වතයෙහි වසන්නා වූ හිවලා සිංහයාගේ මහහඬ අසා (මරණ බියෙන්) බියපත් වූයේ තැතිගැන්මට පැමිණියේ ය. ඔහුගේ හෘදය ද පැළුණේ යි.

2, සිගාල ජාතක යි,

155. යහළුව, මම සිවුපායෙමි. යහළුව, තෝ ද සිවුපායෙහි. සිංහය මෙහි එව, නවතුව, බියපත් වූයේ කුමට පලායෙහි ද?

156. (තෝ) අපවිත්‍ර වූ කුණු වූ ලොම් ඇත්තෙහි ය, දුගඳ හමන්නෙහි ය. ශූකරය, ඉදින් මා හා යුද කරනු කැමැත්තෙහි නම් යහළුව තට ජය දෙමි.

3. සූකර ජාතක යි,

157. මීදීමක් කැමැත්තා වූ සර්පරාජ තෙමේ ශෛල වර්ණයෙන් මේ වල්කලාවට හෙවත් තවුස් පොරෝණය ඇතුළට පිවිසියේ ය. මම තොප වහන්සේගේ බ්‍රහ්මවර්ණය පුදන්නෙමි (බඩගිනි ඇත්තෙමි) කනු කැමැත්තෙමි නමුදු කන්නට නො පොහොසත් වෙමි.

158. සො බ්‍රහ්මගුත්තො චිරමෙව ජීව
දිබ්බා[1] ච තෙ පාතුභවන්තු භක්ඛා,
යො බ්‍රහ්මවණ්ණං[2] අපචායමානො
බුභුක්ඛිතො නො විසහාසි හොතුන්ති.

4. උරගජාතකං.

159. ජීව වස්සසතං ගග්ග[3] අපරානි ච වීසතිං[4].
මා මං පිසාචා ඛාදන්තු ජීව ත්වං සරදෙසතං.

160. ත්වම්පි වස්සසතං ජීව අපරානි ච වීසතිං,
විසං පිසාචා ඛාදන්තු ජීව ත්වං සරදෙසතන්ති.

5. ගග්ගජාතකං.[5]

161. අලීනචිත්තං නිස්සාය පහට්ඨා මහතී චමූ,
කොසලං සෙනාසන්තුට්ඨං ජීවගාහං[6] අගාහයි.

162. එවං නිස්සයසම්පන්නො භික්ඛු ආරද්ධවිරියො,
භාවයං කුසලං ධම්මං යොගක්ඛෙමස්ස පත්තියා.
පාපුණෙ අනුපුබ්බෙන සබ්බසංයොජනක්ඛයන්ති.

6. අලීනචිත්තජාතකං.

163. යෙන කාමං පණාමෙති ධම්මො බලවතං මිගී,
*උන්නදන්ති විජානාහි ජාතං සරණතො භයං.

164. අපි චෙපි දුබ්බලො මිත්තො මිත්තධම්මෙසු තිට්ඨති,
සො ඤාතකො ච බන්ධු ච සො මිත්තො සො ච මෙ සඛා
දඨිනි මාතිමඤ්ඤිත්ථො[7] සිගාලො මම පාණදෙති.

7. ගුණජාතකං.

165. න ඉදං විසමසීලෙන සොණෙන සුහනුස්සහ,
සුහනූපි තාදිසොයෙව යො සොණස්ස ස ගොචරො.

---

1. දිබ්‍යාව – මජසං, සයා.
2. බ්‍රහ්මං චක්කං – මජසං.
3. භග්ග – මජසං, සයා.
4. වීසති – මජසං, සයා.
5. භග්ගජාතකං – මජසං, සයා.
6. ජීවග්ගාහං – අට්ඨකථා, මජසං, සයා.
*. උන්නතදන්තීතිපි පාඨොයෙව.
7. මාභිමඤ්ඤදෙහා – මජසං. සයා මාතිමඤ්ඤිදෙහා.

158. උත්තම වර්ණයට පුදන්නා වූ කනු කැමැත්තා වූ ද යමෙක් අනුභව කරන්නට නො පොහොසත් ද (ඒ තෝ) බ්‍රහ්මයා විසින් රක්නා ලද්දෙහි ය. බොහෝ කලක් මැ ජීවත් වේවා! තට දිව්‍යභොජනයෝ පහළ වෙත්වා!

4. උරග ජාතක යි.

159. ගඟය තෙපි එක්සිය විසි වසක් ජීවත් වව, පිසාචයෝ මා නො කත්වා, තෙපි ශරත් ඍතු සියයක් (එක්සියවිසි වසක්) ජීවත් වව. (ශරත් ඍතු සියය නම් අවුරුදු සියයයි.)

160. තෙපි දු එකසිය විසිවසක් ජීවත් වව. පිසාචයෝ හලාහල විෂය කත්වා, තෙපි ශරත් ඍතු සියයක් ජීවත් වව.

5, ගඟ ජාතක යි.

161. අලීනචිත්ත කුමාරයා නිසා ඉතා සතුටු වූ මහත් වූ සෙනා තොමෝ ස්වකීය රාජ්‍යයෙන් සතුටු නො වූ (පරරාජ්‍යලොභයෙන් පැමිණි) කොසොල් රජු ජීවග්‍රාහයෙන් අල්වාගත්තී ද,

162. මෙසේ නිඃශ්‍රය සම්පන්න වූ චතුර්විධ යොගයාගේ ක්ෂෙමයට හෙවත් නිවනට පැමිණෙනු සඳහා සත්තිස් බොධිපාක්ෂික කුශලධර්මයන් වඩන්නා වූ පටන් ගන්නා ලද වීයර්‍ය ඇති මහණ පිළිවෙළින් සියලු සංයොජනයන්ගේ ක්ෂයට (රහත්බවට) පැමිණේ.

6, අලීනචිත්ත ජාතක යි:

163. උන්නත වූ දළ ඇති මෘගරාජය, ඊශ්වර තෙමේ යම් දිශාවෙකින් සෙවකයා පහ කරනු කැමැති ද ඒ දිශාවෙන් එකාන්තයෙන් පහ කෙරෙයි. බලවතුන්ගේ ස්වභාවධර්මය මෙසේ දනුව, නොහොත් උස් වූ නාද ඇති සිංහධෙනුව යම් කාරණයෙකින් එකාන්තයෙන් හිංසා කෙරේ ද එපරිදි තී දනුව. යම් හෙයෙකින් පිහිට වැ සිටි තොප කෙරෙන් භය උපන්නේ ද එහෙයින් යම්හ.

164. ඉදින් දුර්වල වූ මිත්‍ර තෙමේ මිත්‍රධර්මයෙහි පිහිටියේ නම් හෙතෙමේ නෑයා ද, බන්ධු ද, මිත්‍ර ද, යහළුවා ද වේ. සිංහිය අවමන් නො කරව, හිවලා මාගේ ප්‍රාණදායක මිත්‍ර වේ.

7. ගුණ ජාතක යි.

165. සුහනු නම් අශ්ව තෙමේ සොණ නම් අශ්වයා සමඟ යම් ප්‍රෙමයක් කෙරේ ද එය තමාගේ විෂම ස්වභාවයෙන් නො වේ. යම් සුහනු නම් අශ්වයෙක් සොණ අශ්වයා හා සමාන ගොචර ඇත්තේ ද සුහනු නම් අශ්වයා ද එබඳු මැ යි.

166. පක්ඛන්දිනා පගබ්භන[1] නිච්චං සන්දානඛාදිනා
සමෙති පාපං පාපෙන සමෙති අසතා අසන්ති[2].

8. සුහනුජාතකං.

167. උදෙතයං චක්ඛුමා එකරාජා
හරිස්සවණ්ණො පඨවිප්පභාසො,
තං තං නමස්සාමි හරිස්සවණ්ණං පඨවිප්පභාසං
තයජ්ජ ගුත්තා විහරෙමු දිවසං.

168. යෙ බ්‍රාහ්මණා වෙදගූ සබ්බධම්මෙ
තෙ මෙ නමො තෙ ච මං පාලයන්තු,
නමත්ථු බුද්ධානං නමත්ථු බොධියා
නමො විමුත්තානං නමො විමුත්තියා.
ඉමං සො පරිත්තං කත්වා මොරො චරති එසනා.

169. අපෙතයං චක්ඛුමා එකරාජා
හරිස්සවණ්ණො පඨවිප්පභාසො,
තං තං නමස්සාමි හරිස්සවණ්ණං පඨවිප්පභාසං
තයජ්ජ ගුත්තා විහරෙමු රත්තිං.

170. යෙ බ්‍රාහ්මණා වෙදගූ සබ්බධම්මෙ
තෙ මෙ නමො තෙ ච මං පාලයන්තු,
නමත්ථු බුද්ධානං නමත්ථු බොධියා
නමො විමුත්තානං නමො විමුත්තියා.
ඉමං සො පරිත්තං කත්වා මොරො වාසමකප්පයී’ති.

9. මොරජාතකං.

---

1. පගබ්බන-මජ්ඣං.
2. සතන්ති-සයා.

166. අශ්වයන් මතුයෙහි පතිත පියවි ඇති කායප්‍රගල්භතාදි-යෙන් යුක්ත වූ නිතර (තමා බැඳි) රහන කන ස්වභාව ඇති පාපස්වරූපඇතියගු හා දුශ්ශීලත්වය සමාන වන්නේ ය. (එසේම) අසත් පුරුෂයා අනාචාරයෙන් යුක්තයා හා සමාන වන්නේ යි.

8. සුහනු ජාතක යි.

167. (අන්ධකාර විධමන කොට දැකුම ලබා දෙනුයෙන්) චක්ෂුස්මත් වූ (සක්වළ මුළුල්ලේ ආලෝකය පතුරුවන්නන් කෙරෙන් ශ්‍රේෂ්ඨ හෙයින්) එකරාජ වූ ස්වර්ණවර්ණ වූ පොළොව බබුළුවන්නා වූ මේ සූර්යයා උදා වේ. එහෙයින් රන්වන් වූ පොළොව බබුළුවන්නා වූ තොපට නමස්කාර කෙරෙමි. තොප විසින් ආරක්ෂා කරන ලද්දමෝ අද දවහල වාස කරම්හ.

168. සියලු (ස්කන්ධාදි) ධර්මයන් සිය නැණින් දැනැ ගත්තා වූ යම් (ක්ෂීණාසුව) බ්‍රාහ්මණ කෙනෙක් ඇද්ද ඔවුනට මාගේ නමස්කාරය වේවා, ඒ උතුමෝ මා පාලනය කෙරෙත්වා, බුදුවරයනට මාගේ නමස්කාරය වේවා, බොධිඥානයට ද මාගේ නමස්කාරය වේවා, අර්හත්ඵලවිමුක්තීන් විමුක්තයනට ද මාගේ නමස්කාරය වේවා, (තදඞ්ගාදි පඤ්ච) විමුක්තියට ද මාගේ නමස්-කාරය වේවා, ඒ මයූරයා මේ පිරිත කොට ගොදුරු සෙවීම පිණිස හැසිරේ.

169. චක්ෂුස්මත් වූ එකරාජ වූ ස්වර්ණවර්ණ වූ පොළොව බබුළුවන්නා වූ සූර්යයා අස්තයට යෙයි. එහෙයින් රන්වන් වූ පොළොව බබුළුවන්නා වූ ඔබට නමස්කාර කෙරෙමි. තොප විසින් ආරක්ෂා කරන ලද්දමෝ රාත්‍රියෙහි වාස කරම්හ.

170. සියලු ධර්මයන් සිය නැණින් දැනැ ගන්නා වූ යම් (ක්ෂීණාසුව) බ්‍රාහ්මණ කෙනෙක් ඇද්ද ඔවුනට මාගේ නමස්කාරය වේවා, ඒ උතුමෝ මා පාලනය කෙරෙත්වා, බුදුවරයනට මාගේ නමස්කාරය වේවා, බොධිඥානයට ද මාගේ නමස්කාරය වේවා අර්හත්ඵලවිමුක්තීන් විමුක්තයනට ද මාගේ නමස්කාරය වේවා, විමුක්තියට ද මාගේ නමස්කාරය වේවා. ඒ මයූරයා මේ පිරිත කොට වාසය කෙළේ යි.

9. මොර ජාතක යි.

171. එවමෙව නූන[1] රාජානං වෙදෙහං මිථිලග්ගහං,
අස්සා වහන්ති ආජඤ්ඤා යථා හංසා විනීලකං.

172. විනීල දුග්ගං භජසි අභූමිං තාත සෙවසි,
ගාමන්තිකානි[2] සෙවස්සු එතං මාතාලයං තවා'ති.

10. විනීලකජාතකං.

දළ්හවග්ගො පඨමො.

තස්සුද්දානං:

වරමල්ලිකදද්දරසූකරකො
උරගුත්තම පක්ඛිම ගග්ගවරො,
මහති චමූ යා ච සිගාලවරො
සුහනුත්තමමොරවිනීල දස.

1. එවමෙවනූ-මජසං. (කානි).
2. ගාමන්තරානි-මජසං. ගාමන්ත ස්‍යා.

171. කාරණාකාරණ දන්නා වූ හංසයෝ යම්සේ විනීලක නම් වූ මා උසුලද්ද එමෙන් මැ විදෙහාධිපති වූ මියුලු නුවර රජු අශ්වයෝ උසුළත්.

172. විනීලය, තෝ පර්වත දුර්ගය සෙවුනෙහි දරුව, තට භූමි නො වූ පර්වත විෂමස්ථානය සෙවුනෙහි ග්‍රාමාන්තයෙහි වූ (කසළගොඩ අමුසොහොන් ආදි) ස්ථානයෝ සෙවන කර. තෙල තොප මවගේ වාසස්ථාන යි.

10. විනීල ජාතක යි.

පළමුවැනි දළ්හ වර්ග යි.

එහි උද්දානය:

උතුම් මලලික (රාජොවාදක) යැ, දද්දර (සිගාල) යැ, ශූකර ජාතක යැ, උරගජාතක යැ, පස්වැනි ගඟජාතක යැ, මහාසෙනා ඇති (අලීනචිත්ත) ජාතක යැ, සිගාල (ගුණ) ජාතක යැ, සුහනු ජාතක යැ, උතුම් වූ මොර ජාතක යැ, විසීලක ජාතක යැ, යන දසය යි.

2. සන්ථවවග්ගො

173. න සන්ථවං කාපුරිසෙන කයිරා
අරියො හි අරියෙන පජානමත්ථං
චිරානුවුත්ථොපි කරොති පාපං
ගජො යථා ඉන්දසමානගොත්තං.

174. යංත්වෙව[1] ජඤ්ඤා සදිසො මමන්ති
සීලෙන පඤ්ඤාය සුතෙන චාපි.
තෙනෙව මෙත්තිං කයිරාථ සද්ධිං,
සුඛාවහො[2] සප්පුරිසෙන සඞ්ගමොති.

1. ඉන්දසමානගොත්තජාතකං.

175. න සන්ථවස්මා පරමත්ථි පාපියො
යො සන්ථවො කාපුරිසෙන හොති,
සන්තප්පිතො සප්පිනා පායසෙන[3]
කිච්ඡා කතං පණ්ණකුටිං අදඩ්ඪහි.

176. න සන්ථවස්මා පරමත්ථි සෙය්‍යො
යො සන්ථවො සප්පුරිසෙන හොති,
සීහස්ස ව්‍යග්ඝස්ස ච දීපිනො ච
සාමා මුඛං ලෙහති සන්ථවෙනා'ති.

2. සන්ථවජාතකං.

177. කාළා මිගා සෙතදන්තා තව ඉමෙ[4]
පරොසතං හෙමජාලාභිසඤ්ඡන්නා[5],
තෙ තෙ දදාමීති සුසීම බ්‍රූසි
අනුස්සරං පෙත්තිපිතාමහානං.

178. කාළා මිගා සෙතදන්තා මම ඉමෙ[6]
පරොසතං හෙමජාලාභිසඤ්ඡන්නා,
තෙ තෙ දදාමීති වදාමි මාණව
අනුස්සරං පෙත්තිපිතාමහානන්ති.

3. සුසීමජාතකං.

1. යදෙව - සයා
2. සුඛොහවෙ - මජසං, සයා
3. පායාසෙන - මජසං, සයා.
4. තවිමෙ - මජස. සයා.
5. ජාලාභිජන්නා - මජසං, සයා.
6. මමිමෙ - සයා, මමිමෙ-මජසං,

2. සන්ථව වර්ගය

173. අර්ථය දන්නා වූ (ආචාර) ආර්ය පුද්ගල තෙමේ අනාර්ය වූ කුත්සිත පුද්ගලයා හා සහවාසය නො කරන්නේ ය. (කුමක් හෙයින් ද යත්) බොහෝ කාලයක් එක් වැ වාසය කළත් පව් කරන්නේ ය. බොහෝ කාලයක් එක් වැ වාසය කළ ඉන්ද-සමානගොත්ත නම් තාපසයා මැරූ හස්තියා මෙනි.

174. ශීලයෙන් ද ප්‍රඥාවෙන් ද ශ්‍රැතයෙන් ද යම් තැනැත්තකු මා හා සදෘශ යයි දන්නේ ද ඔහු හා සමග ම මිත්‍රත්වය කරන්නේ මැනැවි. සත්පුරුෂයා හා එක් වැ වාසය සුව එළවන්නේ යි.

1. ඉන්දසමානගොත්ත ජාතක යි.

175. කුත්සිත පුරුෂයා සමග යම් සහවාසයෙක් වේ ද ඒ සහවාසයට වඩා අධික වූ අන් නපුරෙක් නැත. (කුමක් හෙයින් ද යත්) ගිතෙලින් කිරිබතින් සන්තර්පිත වූ හෙවත් පුදනු ලැබූ ගින්න දුකසේ කරන ලද (ඒ කිරිබත පිසූ) අතුපැල දැවී ද (එහෙයිනි.)

176. සත්පුරුෂයා හා යම් සහවාසයෙක් වේ ද ඒ සහවාසයට වඩා අධික වූ අන් උතුම් බවෙක් නැත. (කුමක් මෙන් ද යත්) සහවාසය කරණ කොටගෙනැ සාමා මෘගධෙනුව සිංහයාගේ ද ව්‍යාඝ්‍රයාගේ ද දිවියාගේ ද මුහුණ ලෙවී. (එමෙනි.)

2. සන්ථව ජාතක යි.

177. සුසීම මහරජ, තොපගේ මේ සියයකට අධික වූ සුදු දළ ඇති කළුපැහැ ඇත්හු රන්දැලින් සාදන ලදහ. තෙල ඇතුන් පියමුතුන් සිරිත් සිහි කෙරෙමින් ඔවුනට (අන් බමුණනට) දෙමි යි කීයෙහි සැබැවෙක් ද?

178. මාණවකය, මාගේ මේ සියයකට අධික වූ සුදු දළ ඇති කළුපැහැ ඇත්හු රන්දැලින් සදන ලදහ. ඔවුන් පියමුතුන් සිරිත් සිහි කෙරෙමින් ඒ බමුණනට දෙමි යි කීමි.

3. සුසීම ජාතක යි.

179. යන්නු ගිජ්ඣො යොජනසතං කුණපානි අවෙක්ඛති,
කස්මා ජාලඤ්ච පාසඤ්ච ආසජ්ජාපි න බුජ්ඣසි.

180. යද පරාභවො හොති පොසො ජීවිතසඞ්ඛයෙ,
අථ ජාලඤ්ච පාසඤ්ච ආසජ්ජාපි න බුජ්ඣතී'ති.

4. ගිජ්ඣජාතකං.

181. සන්ධිං කත්වා අමිත්තෙන අණ්ඩජෙන ජලාබුජ,
විවරිය දඨං සෙසි කුතො තං[1] භයමාගතං.

182. සඞ්කෙථෙව අමිත්තස්මිං මිත්තස්මිම්පි න විස්සසෙ,
අභයා භයමුප්පන්නං අපි මූලානි කන්තතී'ති.

5. නකුලජාතකං.

183. උපසාළ්හකනාමානං සහස්සානි චතුද්දස,
අස්මිං පදෙසෙ දඩ්ඪානි නත්ථි ලොකෙ අනාමතං.

184. යම්හි සච්චඤ්ච ධම්මො ච අහිංසා සංයමො දමො,
එතදරියා සෙවන්ති එතං ලොකෙ අනාමතන්ති.

6. උපසාළ්හජාතකං.

185. අභුත්වා භික්ඛසි භික්ඛු න හි භුත්වාන භික්ඛසි,
භුත්වාන භික්ඛු භික්ඛස්සු මා තං කාලො උපච්චගා.

186. කාලං වොහං න ජානාමි ඡන්නො කාලො න දිස්සති,
තස්මා අභුත්වා භික්ඛාමි මා මං කාලො උපච්චගාති.

7. සමිද්ධිජාතකං.

1. තෙ - මජසං, සයා.

179. ගිජුලිහිණියා යොදුන් සියයක් ඉක්මවා සිටියා වූ ද කුණපයන් දකී. (එහෙත්) මරුදැලටත් මලපුඩුවටත් පැමිණ ද කුමක් හෙයින් එය නො දත්හි ද,

180. ජීවිතාවසානය පැමිණි යම් කලෙක්හි විනාශය වන්නේ ද එකල්හි සත්ත්ව තෙමේ මරුදැලට ද මලපුඩුවට ද පැමිණත් (ජීවිත විනාශ කාරණය) නො දනී.

4. ගිජ්ඣ ජාතක යි.

181. ජලාබුජය (මුගටිය) සතුරු වූ අණ්ඩජයා (සර්පයා) සමඟ මිතුරුකම් කොට දළ විවෘත කැරගෙනැ හෝනෙහි ය. තට බිය කොයින් ආයේ ද,

182. සතුරා කෙරෙහි ද සැක කරන්නේ මැ ය. මිතුරා කෙරෙහි ද විශ්වාස නො කරන්නේ ය. මිත්‍ර වූ අභයස්ථානයෙන් උපන් බිය මුල් ද කපා විනාශ කරන්නේ ය.

5. නකුල ජාතක යි.

183. උපසාළ්හක නමින් තුදුස් දහස් දෙනෙක් මේ ප්‍රදේශයෙහි දවන ලදහ. මේ ලොව්හි අමෘතස්ථානයෙක් නැත.

184. යම් පුද්ගලයකු කෙරෙහි සත්‍යය ද ධර්මය ද අවිහිංසාව ද ශීලසංයමය ද ඉන්ද්‍රියදමනය ද යන මේ ගුණයෝ වෙත් ද ආර්යයෝ මේ ස්ථානය සෙවනය පිණිස එළඹෙත්. ලොව්හි මේ ගුණසමූහය (අමෘතභාවය සිදු කරනුයෙන්) අමෘතස්ථාන නම් වේ.

6. උපසාළ්හක ජාතක යි.

185. මහණ, යොවුන් වියෙහි කාමයන් අනුභව නො කොට භික්ෂාවෙහි හැසිරෙහි. කාමයන් අනුභව කොට භික්ෂාවෙහි නො හැසිරෙන්නෙහි. මහණ, තරුණ කාලයෙහි කාමයන් අනුභව කොට මහලු වියෙහි භික්ෂාවෙහි හැසිරෙව. (කාමයන් අනුභවයට සුදුසු කාලය තොප නො ඉක්මෙවා).

186. මම (ඔබ කියන) කාලය නො දනිමි. කාලය සැඟවුණේ නො දක්නා ලැබෙයි. එහෙයින් කාමයන් අනුභව නො කොට භික්ෂාවෙහි හැසිරෙමි. මා තපස්කාලය නො ඉක්මෙවා.

7. සමිද්ධි ජාතක යි.

187. සෙනො බලසා පතමානො ලාප ගොචරඨායිනං,
සහසා අජ්ඣප්පත්තො මරණං තෙනුපාගමි.

188. සොහං නයෙන සම්පන්නො පෙත්තිකෙ ගොචරෙ රතො,
අපෙතසත්තු මොදු සම්පස්සං අත්ථමත්තනොති.

8. සකුණග්ඝිජාතකං.

189. යො වෙ මෙත්තෙන චිත්තෙන සබ්බලොකානුකම්පති,
උද්ධං අධො ච තිරියඤ්ච අප්පමාණෙන සබ්බසො.

190. අප්පමාණං හිතං චිත්තං පරිපුණ්ණං සුභාවිතං,
යං පමාණකතං කම්මං න තං තත්‍රාවසිස්සති'ති.

9. අරකජාතකං.

191. නායං පුරෙ උන්නමති[1] තොරණග්ගෙ කකණ්ටකො,
මහොසධ විජානාහි කෙන ථද්ධො කකණ්ටකො.

192. අලද්ධපුබ්බං ලද්ධානං අඩ්ඪමාසං කකණ්ටකො,
අතිමඤ්ඤති රාජානං වෙදෙහං මිථිලග්ගහන්ති.

10. කකණ්ටක ජාතකං*.

සන්ථවවග්ගො දුතියො.

තස්සුද්දානං.

අථ ඉන්දසමානසපණ්ණකුටි
සුසිමුත්තමගිජ්ඣජලාබුජකා,
උපසාළ්හකභිඞ්ගු සලාපවරො
අථ මෙත්තවරො දස උන්නමතීති.

1. ඔනමතීති - අට්ඨකථා දුකනිපාත.
*. මහාඋම්මග්ගජාතකෙ.

187. වෙගයෙන් දිවෙන උකුසු ගොචරයෙහි සිටියා වූ කිරිල්ල වෙතට වහා පැමිණියේ ඒ ශීඝ්‍ර ගමනින් මරණයට පැමිණියේ ය.

188. නීතියෙන් සම්පූර්ණයෙමි, පිය පරපුරෙන් ආ ගොචරයෙහි ඇලුණෙමි. පහ වූ සතුරා ඇති ඒ මම තමහට අර්ථයක් බලාපොරොත්තුවෙමින් සතුටු වෙමි.

8. සකුණග්ඝි ජාතක යි.

189. යමෙක් ඒකාන්තයෙන් මැ අප්‍රමාණ වූ මෛත්‍රී සිතින් උඩින් ද යටින් ද සරසින් ද යි සර්වප්‍රකාරයෙන් සකල ලෝකයා කෙරෙහි අනුකම්පා කෙරේ ද.

190. අප්‍රමාණ වූ හිත වූ මෛත්‍රී චිත්තය සම්පූර්ණ කොට මනා වැ වඩන ලද ද, (එසේ මැ) ප්‍රමාණවත් වැ කරන ලද (යම් කාමාවචර) කුශලකර්මයෙක් වේ ද ඒ කර්මය මෛත්‍රී චිත්තයෙහි නො සිටිනේ ය. (අර්පණාප්‍රාප්ත මෛත්‍රී චිත්තය කාමාවචර කුශල කර්මය යටපත් කොට සිටී යනු අදහසය.)

9. අරක ජාතක යි.

191. තොරණෙහි අගැ සිටින මේ කටුස්සා පූර්වයෙහි උඩඟු නො වී ය. මහෞෂධය, කටුස්සා කවර හෙයින් උඩඟු වී දැ යි දනුව.

192. කටුස්සා පෙර නො ලද විරූ අඩමස්සක් ලදින් මියුලු නුවර වෛදෙහ රජු ඉක්මවා සිතා යි.

10. කකණ්ටක ජාතක යි.

දෙවෙනි සන්ථව වර්ග යි.

එහි උද්දානය :

පණ්ණකුටිය දැවූ සණ්ඨවජාතකය සමග ඉන්ද්‍රසමාන ගොත්ත ජාතකය යැ. උතුම් වූ සුසීම ජාතක යැ. ගිජ්ඣ ජාතක යැ. (ජලාබුජක) නකුල ජාතක යැ. උපසාළ්හක යැ. (භික්ඛු) සමිද්ධි ජාතකයැ. (ලාප) සකුණග්ඝි ජාතක යැ. (මෙත් වැඩූ) අරක ජාතක යැ. (උන්නමනය ඇති) කකණ්ටක ජාතකය යන දසය වෙත්.

3. කල්‍යාණධම්මවග්ගො

193.
කල්‍යාණධම්මොති යදා ජනින්ද
ලොකෙ සමඤ්ඤා අනුපාපුණාති,
තස්මා න හීයෙථ නරො සපඤ්ඤො
හිරියාපි සන්තො ධුරමාදියන්ති.

194.
සායං සමඤ්ඤා ඉධ ම'ජ්ජපත්තා
කල්‍යාණධම්මොති ජනින්ද ලොකෙ,
තා'හං සමෙක්ඛං ඉධ පබ්බජිස්සං
න හි ම'ත්ථි ඡන්දො ඉධ කාමභොගෙ'ති.

1. කල්‍යාණධම්මජාතකං.

195. කො නු සද්දෙන මහතා අභිනාදෙති දද්දරං,
කිං සීහා නප්පටිනදන්ති[1] කො නාමෙසො මිගාධිභූ

196. අධමො මිගජාතානං සිගාලො තාත වස්සති,
ජාතිමස්ස ජිගුච්ඡන්තා තුණ්හී සීහා සමච්ඡරෙති.

2. දද්දරජාතකං.

197. තාත මාණවකො එසො තාලමූලං අපස්සිතො,
අගාරකඤ්චිදං අත්ථි හන්ද දෙමස්ස'ගාරකං.

198. මා ඛො තං තාත පක්කොසි දූසෙය්‍ය නො අගාරකං,
නෙතාදිසං මුඛං හොති බ්‍රාහ්මණස්ස සුසීලිනො'ති.

3. මක්කටජාතකං.

199.
අදම්හ තෙ වාරි පහූතරූපං[2]
ඝම්මාභිතත්තස්ස පිපාසිතස්ස,
සොදානි පිත්වාන කිකිං කරොසි
අසංගමො[3] පාපජනෙන සෙය්‍යො.

200. කො තෙ සුතො වා දිට්ඨො වා සීලවා නාම මක්කටො,
ඉදානි කො තං උහච්ච[4] එසා අස්මාක ධම්මතා'ති.

4. දුතියමක්කටජාතකං.

---

1. න සීහා පටිනාදන්ති–මජසං. තං සීහා නප්පටිනදන්ති.–සයා.
2. බහුතතරූපං – මජසං. බහුතරූපං–සයා.
3. සඞ්ගමො න–සයා.
4. උහජ්ජං – මජසං. ඔහච්චං–සයා.

3. කල්‍යාණධර්ම වර්ගය

193. නිරිඳුනි, ලොව්හි යම් කලෙකැ කල්‍යාණධර්ම ඇත්තේ යයි සම්මතයට පැමිණී ද නුවණැති මනුෂ්‍ය තෙමේ ඒ සොඳුරුබව නො පිරිහෙළයි. විළිබියෙන් යුත් සත්පුරුෂයෝ පැවිද්ද ලබාගනිත්.

194. නිරිඳුනි, ලොව්හි කල්‍යාණධර්ම යයි යමක් ඇත්තේ ද ඒ මේ ප්‍රඥප්තිය මා විසින් අද ලබන ලද ද ඒ ප්‍රඥප්තිය මම බලන්නෙම්, පැවිදි වන්නෙමි, කාමානුභවයෙහි කැමැත්තෙක් නැති.

1. කල්‍යාණධම්ම ජාතක යි.

195. මෘගරාජය, මේ රිදී පර්වතය මහත් ශබ්දයෙන් ගුගුරුවන්නේ කවරෙක් ද කවර හෙයින් සිංහයෝ ප්‍රතිනාද නො කෙරෙත් ද මේ තෙමේ කිනම් ඇත්තෙක් ද.

196. පුත්‍රය, මෘගජාතීනට අධම වූ සිවලා හඬයි. මොහුගේ ජාතිය පිළිකුල් කෙරෙමින් සිංහයෝ නිහඬ වැ හිඳිත්.

2. දද්දර ජාතක යි.

197. පියාණෙනි, තෙල මාණවක තල්ගසමුලැ ඇසුරු කොට සිටී. මේ ගෙය ද ඉඩ ඇත. එබැවින් මොහුට අපගේ ගෙය ඉඩ දෙමු.

198. දරුව, ඔහු නො කැඳව, අපගේ ගෙය දූෂණය කරන්නේ ය, සුසිල්වත් බමුණකුගේ මුහුණ මෙබඳු නො වේ.

3. මක්කට ජාතක යි.

199. හිරු රැසින් තැවී පිපාසිත වූ තට බොහෝ ජලය දුනිමි. හේ තෝ ජලය බී දුන් කිං කිං (යී වඳුරු ශබ්ද) කෙරෙහි ය. පාපජනයන් හා එක් නොවීම ශ්‍රේෂ්ඨ යි.

200. කවර නම් වඳුරෙක් සිල්වතැ යි තා විසින් අසන ලද ද දක්නා ලද ද, දූන් තා හිසැ වර්චස් හෙළා කිලිටි කෙරෙමි. මෝ තොමෝ අපගේ ධර්මතා යි.

4. දුතියමක්කට ජාතක යි.

201. සබ්බෙසු කිර භූතෙසු සන්ති සීලසමාහිතා,
පස්ස සාඛා මිගං ජම්මං ආදිච්චමුපතිට්ඨති.

202. නාස්ස සීලං විජානාථ අනඤ්ඤාය පසංසථ
අග්ගිහුත්තඤ්ච ඌහන්තං[1] ද්වෙ ච භින්නා කමණ්ඩලූ'ති.

5. ආදිච්චුපට්ඨානජාතකං.

203. බාලො වතායං දුමසාඛගොචරො
පඤ්ඤා ජනින්ද නයිමස්ස විජ්ජති,
කලායමුට්ඨිං අවකිරිය කෙවලං
එකං කලායං පතිතං ගවෙසති.

204. එවමෙව මයං රාජ යෙ චඤ්ඤෙ අතිලොභිනො,
අප්පෙන බහු ජිය්‍යාම[2] කලායෙනෙව වානරොති.

6. කලායමුට්ඨිජාතකං.

205. ධනුහත්ථ කලාපෙහි නෙත්තිංසවරධාරිභි,
සමන්තා පරිකිණ්ණම්හා කථං මොක්ඛො භවිස්සති.

206. අප්පෙව බහුකිච්චානං අත්ථො ජායෙථ කොචි නං,
අත්ථි රුක්ඛස්ස අච්ඡින්නං බජ්ජතඤ්ඤෙව තින්දුකන්ති.

7. තින්දුකජාතකං.

207. ජනිත්තම්මෙ භවිත්තම්මෙ[3] ඉති පඞ්කෙ අවස්සයිං,
තං මං පඞ්කො අජ්ඣභවි යථා දුබ්බලකං තථා
තං තං වදාමි භග්ගව සුණොහි වචනං මම.

1. ඌහදං–මජසං. ඌහනං – සයා.
2. බහුං ජෙය්‍යාම – සයා.
3. ජනිතං මෙ භවිතං මෙ – සයා.

201. සියලු භූතයන් (සත්ත්වයන්) කෙරෙහි සිල්වත් එකඟ සිතැත්තෝ ඇත්ල. හීන වූ වඳුරා බලව. (හෙතෙමේ) සූර්යයා වඳිමින් සිටී.

202. මොහුගේ ශීලය නො දන්නහු ය, නො දැනැ ප්‍රශංසා කරන්නහුය. (මොහු විසින්) ගිනිදෙවි පුදන කෙණෙස්ස ද වර්චසින් කිලිටි කරන ලද, දෙ කුණ්ඩිකාවෝ ද බිඳින ලදහ.

5. ආදිච්චුපට්ඨාන ජාතක යි.

203. ජනෙශ්වරය, වෘක්‍ෂශාඛාවන්හි හැසිරෙන මේ වඳුරා එකතින් මැ අඥාන ය, මොහුට නුවණ නැත. කළුමැමිට බිම හෙළා බිමහුණු එක් මැ මැඇටය සොයයි.

204. එපරිද්දෙන් මැ මහරජ, දැඩි ලොභී වූ අපි ද යම් අනෙක් කෙනෙක් ද යි යන සියල්ලෝ මැ මැඇට මිටින් වඳුරා මෙන් බෙහෙවින් පිරිහෙමු.

6. කළායමුට්ඨි ජාතක යි.

205. දුනු හියවුරු ගත් දුනුවායන් විසින් ද උතුම් කඩු ගත් යොධයන් විසින් ද හාත්පසින් පිරිවරනලදුම්හ. මෙයින් මිදීමෙක් කෙසේ නම් වන්නේ ද.

206. බොහෝ කටයුතු ඇතියනට කිසි අර්ථයෙක් උපන්නේ වී නම් යෙහෙක. තිඹිරි ගසෙහි එල නො කැඩූ තැන් ඇත. තින්දුක එල කන්නට ලැබේවා.

7. තින්දුක ජාතක යි.

207. මාගේ උපන් බිම ය කියා ද වැඩුණු බිම ය කියා ද මඩෙහි වැදැ හොත්තෙමි. මා ඒ මඩ දුර්වලවූවකු යම්සේ ද එසේ මැ විනාශයට පැමිණවී ය. භාර්ගවය, එහෙයින් තට කියමි. මාගේ වචන අසව.

208. ගාමෙ වා යදි වා රඤ්ඤෙ සුඛං යත්‍රාධිගච්ඡති,
තං ජනිත්තං භවිත්තඤ්ච[1] පුරිසස්ස පජානතො,
යම්හි ජීවෙ තම්හි[2] ගච්ඡෙ න නිකෙතහතො සියාති.

8. කච්ඡපජාතකං.

209. තඤ්ච අප්පඤ්ච උච්ඡිට්ඨං තඤ්ච කිච්ඡෙන නො අදු,
සොහං බ්‍රාහ්මණජාතිකො මං භුත්තං තම්පි උග්ගතං.

210. එවං ධම්මං නිරං කත්වා යො අධම්මෙන ජීවති,
සතධම්මොව ලාභෙන ලද්ධේනපි න නන්දතී'ති.

9. සතධම්මජාතකං.

211. දුද්දදං දදමානානං දුක්කරං කම්මකුබ්බතං,
අසන්තො නානුකුබ්බන්ති සතං ධම්මො දුරන්නයො.

212. තස්මා සතඤ්ච අසතඤ්ච නානා හොති ඉතො ගති,
අසන්තො නිරයං යන්ති සන්තො සග්ගපරායණා'ති.

10. දුද්දදජාතකං.

කල්‍යාණධම්මවග්ගො තතියො.

තස්සුද්දනං:

සුසමඤ්ඤමිගාධිභූ මාණවකො
වාරිපහූතරුපාදිවනුපට්ඨානා,
සකළායසත්තිනුකපඬ්ඪා පුන
සතධම්ම සුදුද්දදකෙන දස.

---

1. තං ජනිතං භවිතඤ්ච "ජානිතං–සෳා.
භාවිතනන්ති දීඝවසෙනාපි පාඨො සොයෙවත්ථො අට්ඨකථා
2. යහිං ජීවෙ තහිං ගච්ඡෙ–සෳා.

208. ගමෙහි වේවයි අරණ්‍යයෙහි වේවයි යම් තැනෙක්හි සුව පැමිණියේ ද ඒ ස්ථානය කරුණු දන්නා වූ පුරුෂයාට උපන් තැන ද වැඩුණු තැන ද වේ. යම් තැනෙක්හි ජීවත්වියහැක්කේ ද එතැනට යන්නේ ය. වසනතැන නැති වූයේ නො වන්නේ යි.

8. කච්ඡප ජාතක යි.

209. ඒ බත ද ස්වල්පය (මඳ ය), ඒ මඳබත ද ඉඳුල් ය, ඒ මඳ වූ ඉඳුල් වූ බත දුකසේ දින (ලැබිණ). ඒ මම පිරිසුදු බමුණුකුල ඇත්තෙමි. මා විසින් කන ලද එකී ආහාරය ද ලේත් සමඟ උඩට නැඟිණ (වමනය වීය).

210. එලෙසින් (ආජීව පාරිශුද්ධි ශීල නම් වූ) ධර්මය දුරු කොට යම් මහණෙක් අධර්මයෙන් ජීවත් වේ ද හේ සතධර්ම බ්‍රාහ්මණයා මෙන් ලද අහරින් තුටු නො වේ. (දුකට පැමිණේ.)

9. සතධම්ම ජාතක යි.

211. අසත්පුරුෂයෝ (හැම දෙනා විසින් මැ නො කළ හැකි හෙයින්) දුද්දද නම් වූ දන් දෙන්නවුන් ද දුෂ්කර ක්‍රියා කරන්නවුන් ද අනුකරණ නො කෙරෙති. (එසේ මැ) සත්පුරුෂයන්ගේ ස්වභාව සඞ්ඛ්‍යාත දනය (මෙ බඳු ඵලවිපාක ඇතැයි) නො දත හැකි වෙති.

212. එහෙයින් සත්පුරුෂයන්ගේ ද අසත්පුරුෂයන්ගේ ද මෙයින් මතු භවයෙහි ප්‍රතිසන්ධිය වෙනස් වෙයි. අසත්පුරුෂයෝ නිරයට යෙති. සත්පුරුෂයෝ ස්වර්ගපරායණ වෙත්.

10. දුද්දද ජාතක යි.

තෙවන කල්‍යාණ වර්ග යි.

එහි උද්දානය:

සුසමුන්දක කල්‍යාණධම්ම ජාතක යැ (මිගාධිභූ) දද්දර ජාතක යැ, (මාධවක) මක්කට ජාතක යැ, (වාරි පභූත) දුතිය මක්කට ජාතක යැ, ආදිච්චුපට්ඨාන ජාතක යැ, කළායමුට්ඨි තින්දුක ජාතක සහිත වූ (පඩිත) කච්ඡප ජාතක යැ, සතධම්ම ජාතකය හා දුද්දද ජාතකයෙන් දසය වේ.

4. අසදිසවග්ගො

213. ධනුග්ගහො අසදිසො රාජපුත්තො මහබ්බලො,
දූරෙපාතී[1] අක්ඛණවෙධී මහාකායප්පදාලනො.

214. සබ්බාමිත්තෙ රණං කත්වා න ච කිඤ්චි විහෙඨයි[2],
භාතරං සොත්ථිං කත්වාන සඤ්ඤමං අජ්ඣුපාගමී'ති.

1. අසදිසජාතකං.

215. සඞ්ගාමාවචරො සූරො බලවා ඉති විස්සුතො,
කින්නු තොරණමාසජ්ජ පටික්කමසි කුඤ්ජර.

216. ඔමද්ද ඛිප්පං පලිඝං එසිකානි ච අබ්බහ[3],
තොරණානි[4] පමද්දිත්වා ඛිප්පං පවිස කුඤ්ජරාති.

2. සඞ්ගාමාවචරජාතකං.

217. *වාලොදකං අප්පරසං නිහීනං
පිත්වා මදො ජායති ගද්‍රභානං,
ඉමඤ්ච පීත්වාන රසං පණීතං
මදො න සඤ්ජායති සින්ධවානං.

218. අප්පං පිවිත්වාන නිහීනජච්චො
සො මජ්ජති[5] තෙන ජනින්ද පුට්ඨො,
ධොරය්හසීලො ච කුලම්හි ජාතො
න මජ්ජති අග්ගරසං පිවිත්වා'ති.

3. වාලොදකජාතකං.

219. දූසිතො ගිරිදත්තෙන හයො සාමස්ස පණ්ඩවො,
පොරාණං පකතිං හිත්වා තස්සෙව අනුවිධීයති.

220. සචෙ ච[6] තනුජො පොසො සිඛරාකාරකප්පිතො,[7]
ආනනෙ තං ගහෙත්වාන මණ්ඩලෙ පරිවත්තයෙ
ඛිප්පමෙව පහත්වාන තස්සෙව අනුවිධීයතීති.

4. ගිරිදත්තජාතකං.

---

1. දූරෙපතී - සීමු.
2. විහෙඨයි - මජසං.
3. අබ්භුත - මජසං. උබ්බහ-සයා.
4. තොරණානි ච - මජසං.
5. මජ්ජතෙ - මජසං.
6. සචෙ ච - මජසං.
7. සිඞ්ගාරාකාර - සයා

*. වාලුදකන්තිපි පාඨො. - අට්ඨකථා.

4. අසදෘශ වර්ගය

213. මහත් වූ බල ඇති සර (ඊතල) දුරට විදිනා වූ ඉලක්ක නො වරදවා විදින මහාකායයන් පළන්නා වූ අසදෘශ නමැති රාජ පුත්‍ර ධනුර්ධර තෙමේ;

214. සියලු සතුරන් යුද කොට පලවා හැර කිසිවක්හු නො පෙළී ය. මලණුවන් සුවපත් කොට ශීලසංයමයට හෙවත් පැවිද්දට පැමිණියේ යි.

1. අසදිස ජාතක යි.

215. යුද මැඩ හැසිරෙන ශූර වූ එඩි ඇති බලවතැ යි කියා ප්‍රසිද්ධයෙහි ය. හස්තිය, වාසල් දොරටුවට පැමිණ කවර හෙයින් පසුබයිහි ද?

216. යතුරු අගුල වහා මඩිනු, එසිකාස්තම්භයන් ද (අගුලුකණුව) වහා උදුරව. හස්තිරාජය, වාසල් දොරටුව මැඩැ වහා (නුවරට) පිවිසෙව.

2. සඞගාමාවචර ජාතක යි.

217. (තියද කඩින් පෙරූ) අල්ප වූ හීන වූ රස ඇති ජලය බී කොටළුවනට මද හටගනී. ප්‍රණීත වූ මේ රසය බී සෛන්ධව-යනට මද නො හටගනී. (මීට කාරණා කිම් දැ යි විචාළේ ය.)

218. ජනෙන්ද්‍රය, හීනජාති ඇති ඒ හීනභාවයෙන් පහස ලැබූ හෙතෙමේ රසමද ජලය බී මත් වෙයි. ධුරවහනසුලු උසස් කුල-යෙහි උපන් (හෙයින්) සෛන්ධවයා අග්‍ර වූ මිදිරස බී ද මත් නො වේ.

3. වාලොදක ජාතක යි.

219. සාම රජුගේ පණ්ඩව නම් අශ්වයා ගිරිදත්ත නම් කොර අස්පලුවා විසින් දූෂණය කැරිණ. පුරාණ (නො කොර) ස්වභාවය හැර අස්පලුගේ කොරය අනු වැ හික්මේ.

220. ඉදින් ඕහට අනුරූප වැ උපන් සොඳුරු බැවින් කල්පිත වූ (සැදුම් ලත්) පුරුෂයෙක් මුවලනුව ගෙනැ අසු අශ්වමණ්ඩලයෙහි ඇවිද්ද වී නම් කොරබව හැර වහා මැ අශ්වයාගේ උතුම් ස්වභාවය අනු වැ හික්මේ.

4. ගිරිදත්ත ජාතක යි.

221. යථොදකෙ ආවිලෙ අප්පසන්නෙ
න පස්සති සිප්පිසම්බුකං මච්ඡගුම්බං
එවං ආවිලෙ හි චිත්තෙ
න පස්සති අත්තදත්ථං පරත්ථං.

222. යථොදකෙ අච්ඡෙ විප්පසන්නෙ
සො පස්සති සිප්පිසම්බුකං මච්ඡගුම්බං
එවං අනාවිලෙ හි චිත්තෙ
සො පස්සති අත්තදත්ථං පරත්ථන්ති.

5. අනභිරතිජාතකං.

223. වණ්ණගන්ධරසූපෙතො අම්බායං[1] අහුවා පුරෙ,
තමෙව පූජං ලභමානො කෙනම්බො කටුකප්ඵලො.

224. පුචිමන්දපරිවාරො අම්බො තෙ දධිවාහන,
මූලං මූලෙන සංසට්ඨං සාඛා සාඛා නිසෙවරෙ[2]
අසතං සන්නිවාසෙන තෙනම්බො කටුකප්ඵලො'ති.

6. දධිවාහනජාතකං.

225. උච්චෙ විටභි[3] මාරුය්හ මන්තයව්හො රහොගතා,
නීචෙ ඔරුය්හ මන්තව්හො මිගරාජාපි සොස්සති[4].

226. යං සුපණ්ණො සුපණ්ණෙන[5] දෙවො දෙවෙන මන්තයෙ,
කිං තෙත්ථ[6] චතුමට්ටස්ස බිලං[7] පවිස ජම්බුකාති.

7. චතුමට්ඨජාතකං.

---

1. අම්බායං - මජසං. ස්‍යා.
2. සාඛා සාඛං නිවිසරෙ - මජසං.
3. විටපි - මජසං. ස්‍යා.
4. සුස්සති - මජසං.
5. සුවණ්ණො සුවණ්ණෙන, - මජසං.
6. කිං තත්ථ - ස්‍යා. සී.
7. විලං - ස්‍යා.

221. යම්සේ මඩින් මිශ්‍ර වූ නො පැහැදුණු ජලයෙහි රන්වන් බෙල්ලන් ද වටබෙල්ලන් ද මසුන් ද (බලන්නේ නමුදු) නො දකී. එමෙන් මැ සිත කැලඹුණු කල්හි ද ආත්මාර්ථ පරාර්ථයන් නො දකී. (නො පෙනේ.)

222. යම්සේ නො කැලඹුණු පැහැදුණු දියෙහි රන්වන් බෙල්-ලන් ද මසුන් ද හේ (බලන පුරුෂයා) දකී ද එමෙන් මැ හිත (ලොභාදියෙන්) නො කැලඹුණු කල්හි ආත්මාර්ථය ද පරාර්ථය ද හේ (රාගාදීන් දුරු කළ සිතැති පුරුෂ) දකී.

5. අනභිරත ජාතක යි.

223. මේ අඹරුක පූර්වයෙහි වර්ණයෙන් ද සුවඳින් ද රසයෙන් ද යුක්ත වූයේ වී ය. පූර්වයෙහි කළ සැලැකිලි දනුදු ලබමින් මේ අඹ රුක කවර හෙයින් තිත්ත වූ ඵල ඇත්තේ වී ද?

224. දධිවාහන රජුනි, ඔබේ අඹරුක කොහොඹ රුක් පිරිවර කොට ඇත්තේ මූලයෝ මුලින් එක් වැ සිටියහ. ශාඛාවෝ ශාඛා-වන් හා සෙවුනාහ. ඒ අමධුර වූ කොහොඹ රුක් හා සහවාසයෙන් මිහිරි අඹරුක අමිහිරි පල ඇත්තේ වී ය.

6. දධිවාහන ජාතක යි.

225. උස් ගසෙකැ වෙළපට නැඟී (තොපි) රහසේ මන්ත්‍රණය කරන්නහු ය. ගසින් බැසැ බිමැ සිට මන්ත්‍රණය කරවු. එවිට මෘගරාජයා ද එය අසයි.

226. යම් කරුණෙකින් හංසයා හංසයා හා ද දෙවියා දෙවියා හා ද මන්ත්‍රණ කෙරේ ද ඒ මන්ත්‍රණයෙහි ශරීර යැ ජාති යැ ස්වර යැ ගුණ යැ යන සතර කරුණෙකින් හීන වූ තට කවර නම් ප්‍රයොජනයෙක් ද, ජම්බූකය (සිගාලය) බිලයට පිවිසෙව.

7. චතුමට්ට ජාතක යි.

227. සීහඞ්ගුලී සීහනඛො සීහපාදපතිට්ඨිතො,
සො සීහො සීහසඞ්ඝම්හි එකො නදති අඤ්ඤථා.

228. මා ත්වං නදී රාජපුත්ත අප්පසද්දො වනෙ වස,
සරෙන[1] ඛො තං ජානෙය්‍යුං න හි තෙ පෙත්තිකො සරො'ති

8. සීහකොත්ථුකජාතකං.

229. නෙතං සීහස්ස නදිතං න ව්‍යග්ඝස්ස[2] න දීපිනො,
පාරුතො සීහචම්මෙන ජම්මො නදති ගද්‍රභො.

230. චිරම්පි ඛො තං ඛාදෙය්‍ය ගද්‍රභො හරිතං යවං,
පාරුතො සීහචම්මෙන රවමානොව දූසයී'ති.

9. සීහචම්මජාතකං.

231. පස්ස සද්ධාය සීලස්ස චාගස්ස ච අයං ඵලං,
නාගො නාවාය වණ්ණෙන සද්ධං වහති උපාසකං[3].

232. සබ්භිරෙව සමාසෙථ සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං හි සන්නිවාසෙන සොත්ථිං ගච්ඡති *නහාපිතො'ති.

10. සීලානිසංසජාතකං.

අසදිසවග්ගො චතුත්ථො.

තස්සුද්දානං:

ධනුග්ගහකුඤ්ජරඅප්පරසො
ගිරිදත්තමනාවිලචිත්තවරං,
දධිවාහනජම්බුකසීහනඛො
හරිතයවනාගවරෙන දස.

1. සරෙන මාතං – මජසං.
2. බ්‍යග්ඝස්ස න ච දීපිනො – මජසං.
3. වහතූපාසකං – මජසං, ස්‍යා.
*. න්හාපිතොපි පාඨො – අට්ඨකථා

227. සිංහයනට බඳු ඇඟිලි ඇති සිංහයනට බඳු නිය ඇති සිංහ පාදයන්ගෙන් පිහිටි මේ සිංහ තෙමේ සිංහ රළෙහි හුඳෙකලා වැ අනෙක් පරිද්දෙකින් (සිගාල) නාද කෙරේ.

228. සිංහරාජ පුත්‍රය, තෝ නාද නො කර. නිහඬ වැ වෙනෙහි (සිංහයන් අතරෙහි) වාසය කරව. තා ස්වරයෙන් (සිවල් බව) දැනගන්නාහු ය. තට පියාගේ ස්වරය නැත.

8. සීහකොත්ථුක ජාතක යි.

229. මේ සිංහයකුගේ නාදය නො වෙයි. ව්‍යාඝ්‍රයකුගේ ද දිවියකුගේ ද නාදය නො වෙයි. සිංහහම් පොරවන ලද ලාමක වූ කොටළුවා නාද කෙරේ.

230. කොටළුවා සිංහහම් පොරවන ලදු වැ බොහෝ කාලයක් නිල්වන් යව කෑවේ ය. තමාගේ කොටළු හඬ නඟන්නේ (ජාතිය ප්‍රකාශ කොට) දූෂණයට (විනාශයට) පැමිණියේ යි.

9. සීහචම්ම ජාතක යි.

231. ශ්‍රද්ධාවෙහි ද ශීලයෙහි ද ත්‍යාගයෙහි ද ඵලය (අනුසස්) බලව. දිව්‍යනාගයා නැවක ආකාරයෙන් ශ්‍රද්ධාවත් උපාසකයා උසුලයි.

232. පණ්ඩිතයන් හා එක් වැ වාසය කරවු. සත්පුරුෂයන් හා මිතුරුකම් කරවු. සත්පුරුෂයන් හා සහවාසයෙන් කරනැහැවියා සුවසේ යයි.

10. සීලානිසංස ජාතක යි.

සිවුවැනි අසදෘශ වර්ග යි.

එහි උද්දනය:

(ධනුග්ගහ) අසදිස ජාතක යැ, (කුඤ්ජර) සඞ්ගාමාවචර ජාතක යැ, (අප්පරස) වාළොදක ජාතක යැ, ගිරිදත්ත ජාතක යැ, (අනාවිලචිත්ත) අනභිරත ජාතක යැ, දධිවාහන ජාතක යැ, (ජම්බුක) චතුමට්ට ජාතක යැ, (සීහ හඬ) සීහ කොත්ථුක ජාතක යැ, (හරිතයව) සීහචම්ම ජාතක යැ, (නාගවරෙන) සීලානිසංස ජාතකය යන මෙයින් ජාතක දසය වේ.

5. රූහකවග්ගො

233. අපෙ'හා රූහක[1] ඡින්නාපි ජියා සන්ධියතෙ පුන,
සන්ධියස්සු පුරාණියා මා කොධස්ස වසං ගමී.

234. විජ්ජමානාසු[2] මරුවාසු විජ්ජමානෙසු කාරුසු,
අඤ්ඤං ජියං කරිස්සාම අලඤ්ඤෙව පුරාණියා'ති.

1. රූහකජාතකං.

235. ඉත්ථී සියා රූපවතී සා ච සීලවතී සියා,
පුරිසො තං න ඉච්ඡෙය්‍ය සද්දහාසි මහොසධ.

236. සද්දහාමි මහාරාජ පුරිසො දුබ්භගො සියා,
සිරී ච කාලකණ්ණී ච න සමෙන්ති කුදාචනන්ති.

2. සිරිකාලකණ්ණි ජාතකං.[3]

237. අයමෙව සා අහම්පි සො අනඤ්ඤො
අයමෙව සො හත්ථච්ඡින්නො අනඤ්ඤො
යමාහ කොමාරපතී[4] මමන්ති
වජ්ඣිත්ථියො නත්ථි ඉත්ථීසු සච්චං.

238. ඉමඤ්ච ජම්මං මුසලෙන හන්ත්වා
ලුද්දං ඡවං පරදාරූපසෙවිං,
ඉමිස්සා ච නං පාපපතිබ්බතාය
ජීවන්තියා ඡින්දථ කණ්ණනාසන්ති.

3. චූළපදුමජාතකං.

239. න සන්ති දෙවා පවසන්ති නූන
නහ නූන[5] සන්ති ඉධ ලොකපාලා,
සහසා කරොන්තානං අසඤ්ඤතානං
නහ නූන සන්ති පටිසෙධිතාරො[6].

1. අපිරූහක - මජසං. - සීමු.
2. විජ්ජමානෙසු වාකෙසු - මජසං.
3. මහාඋම්මග්ගජාතකෙ.
4. යමාහු කොමාරි - මජසං සයා. යමාහකො මරිපතිකෙ "යමාහුකුමාරපතීතිපි, පාඨො අට්ඨකථා.
5. නහිනූන - මජසං සයා.
6. පටිසෙධිතායො - මජසං.

5. රුහක වර්ගය

233. රුහකය, සිඳී ගිය දුන්නෝ ලනුව ද නැවැත සන්ධි කරනු ලැබේ. (එපරිද්දෙන්) තා පුරාණී නම් බිරිය හා සමඟී වැ වස. ක්‍රොධයාගේ වසයට නො යව.

234. (දුනු දිය තනන) මරුවනම් වැහැරි ඇති කල්හි දුනු දිය කරන්නවුන් ඇති කල්හි අනෙක් දුනුදියක් කරන්නෙමු. පුරාණී බිරිය නො කැමැත්තෙමි.

1. රුහක ජාතක යි.

235. ස්ත්‍රිය රූ ඇත්තී වන්නී ය, ඒ රූමත් ස්ත්‍රිය ආචාරශීලී ද වන්නී ය. පුරුෂයෙක් එබඳු ස්ත්‍රිය ද නො කැමැත්තේ ය. මහෞෂධ-යෙනි, (මේ කරුණ ඔබ) අදහන්නෙහි දූ යි (රජ විචාළේ ය).

236. මහරජ, එය අදහමි. පුරුෂයා පින් නැත්තේ වී නම් ශ්‍රියත් (වාසනාවත්) කාලකණ්ණියත් අවාසනාවත් කිසි කලෙකත් එකතු නො වේ.

2. සිරිකාලකණ්ණි ජාතක යි.

237. හෝ (මා විසින් පොෂණය කරනු ලැබූ) තැනැත්තී මැ ය. මම ද (මැ පොෂණය කළ තැනැත්තා විනා) අනෙකෙක් නො වෙමි. අත් සිඳින ලද මේ කොටා ද අනිකෙක් නො වේ. මාගේ කුමාර කලැ හිමියා යි යමක් කී ද ඕ තොමෝ මැ ය. ස්ත්‍රීහු වධයට සුදුසු ය. ස්ත්‍රීන් කෙරෙහි ඇත්තක් නැත.

238. රෞද්‍ර වූ නිර්ගුණභාවයෙන් මළකඳක් බඳු වූ පරදරයන් සෙවුනා ලාමක වූ මේ කොටා ද මොහොලින් තලා (දමවු). නින්දිත පතිවෘතා ඇති ජීවත් වන්නා වූ මැ මැගේ කන් නැහැ කපවු.

3. චුල්ලපදුම ජාතක යි.

239. (සිල්වතුන් රක්නා) දෙවියෝ නැතැ යි සිතමි. (එබඳු කටයුතුවලින්) බැහැර යෙති යි සිතමි. මෙලොව ලොකපාලක දෙවියෝ ද නැතැ යි සිතමි. අපරීක්ෂ්‍යකාරී වැ දරුණු කම් කරන්නා වූ දුශ්ශීලයන්ගේ දරුණු ක්‍රියා වළකන්නෝ ද නැතැ යි සිතමි.

340. අකාලෙ වස්සති තස්ස කාලෙ තස්ස න වස්සති,
සග්ගා ච චවතිට්ඨානා නනු සො තාවතා හතො'ති.

4. මණිචොරජාතකං.

241. පබ්බතූපත්ථරෙ[1] රම්මෙ ජාතා පොක්ඛරණී සිවා,
තං සිගාලො[2] අපාපායි ජානං සීහෙන රක්ඛිතං.

242. පිවන්ති වෙ[3] මහාරාජ සාපදනි මහානදිං
න තෙන අනදී හොති ඛමස්සු යදි තෙ පියා'ති.

5. පබ්බතූපත්ථරජාතකං.[4]

243. යෙ න කාහන්ති ඔවාදං නරා බුද්ධෙන දෙසිතං,
ව්‍යසනං තෙ ගමිස්සන්ති රක්ඛසීහිව වාණිජා.

244. යෙ ච කාහන්ති ඔවාදං නරා බුද්ධෙන දෙසිතං,
සොත්ථිං පාරං ගමිස්සන්ති වලාහෙනෙව වාණිජා'ති.

6. වලාහස්සජාතකං.

245. න නං උම්හයතෙ[5] දිස්වා න ච නං පටිනන්දති,
චක්ඛූනි චස්ස න දදති පටිලොමඤ්ච වත්තති.

246. එතෙ[6] භවන්ති[7] ආකාරා අමිත්තස්මිං පතිට්ඨිතා,
යෙහි අමිත්තං ජානෙය්‍ය දිස්වා සුත්වා ච පණ්ඩිතො'ති.

7. මිත්තාමිත්තජාතකං.

247. පවාසා ආගතො තාත ඉදනි න චිරාගතො,
කච්චින්නු තාත තෙ මාතා න අඤ්ඤමුපසෙවති.

---

1. පබ්බතපත්ථරෙ - මජ්සං.
2. සිඞ්ගාලො අපපායි - මජ්සං.
3. පිපන්ති වෙ - කත්ථචි.
4. පබ්බතපත්ථර - මජ්සං.
5. උම්භියතෙ - මජ්සං.
6. යෙතෙ අ.
7. භමන්ති නා.

240. (නො දැහැමි රජුගේ විජිතයෙහි) නො කල් වැසි වසී, ඒ රටෙහි කාලයෙහි නො වසී. ඒ නො දැහැමි රජ දෙව්ලොවින් මිදෙ යි. (අපායයෙහි ඉපිද) ඒකාන්තයෙන් විනාශයට පත්වී ය.

4. මණිචොර ජාතක යි.

241. සිත්කලු වූ හිමාලය පර්වත සමීපයෙහි සිහිල් දියැති පොකුණෙක් වී ය. ඒ පොකුණ සිංහයකු විසින් රක්‍ෂා කරන ලද බව දන්නා සිවලෙක් බැසැ පැන් බී ගියේ ය.

242. මහරජ, ඒකාන්තයෙන් මැ සිවුපාවෝ මහානදියෙහි දිය බොත් මැ ය. එයින් (ඒ නදී) අනදී වූයේ නො වේ. ඉදින් තොපට ඒ අඩුව ප්‍රිය වී නම් (ඇමැතිත් ප්‍රිය වී නම් දෙදෙනාට මැ) කමා කරව.

5. පබ්බතූපත්ථර ජාතක යි.

243. යම් කෙනෙක් බුදුරජාණන් වහන්සේ විසින් දෙශනා කරන ලද අවවාද නො කෙරෙත් ද ඔවුහු රාක්‍ෂසීන්ගෙන් විනාශයට පැමිණි වෙළෙඳුන් මෙන් වනසට පැමිණෙත්.

244. යම් කෙනෙක් බුදුරජාණන් වහන්සේ විසින් දෙශනා කරන ලද අවවාද කෙරෙත් ද ඔවුහු වලාහක කුලයෙහි උපන් අශ්වරාජයා නිසා කැමැති තැනට පැමිණි වෙළෙඳුන් මෙන් සුවසේ පරතෙරට (නිවනට) පැමිණෙත්.

6. වලාහස්ස ජාතක යි.

245. ඔහු දැකැ සිනහ පහළ නො කෙරේ නම් වචනයට සතුටු නො වේ නම් ඔහු දෙස සෘජුව නො බලා නම් ඔහුට විරුද්ධ වැ පවතී.

246. යම් ආකාරයෙකින් පණ්ඩිතයා දැකැ ද අසා ද අමිත්‍රයා (හතුරා) දැනැගනී ද මේ ආකාරයෝ සතුරා කෙරෙහි පිහිටියාහු වෙති.

7. මිත්තාමිත්ත ජාතක යි.

247. දරුව, විදෙශයෙන් ආයෙම් බොහෝ කල් නො වෙමි. කිමෙක් ද තොපගේ මව අනිකකු සේවනය නො කරා ද?

248. න ඛො පනෙතං සුභණං ගිරං සච්චූපසංහිතං,
සයෙථ පොට්ඨපාදෙව මුම්මුරෙ[1] උපකූසිතො'ති.*

8. රාධජාතකං.

249. උභයං මෙ න ඛමති උභයං මෙ න රුච්චති,
යා චායං කොට්ඨමොතිණ්ණා න දස්සං[2] ඉති භාසති,

250. තං තං ගාමපති බ්‍රූමි කදරෙ අප්පස්මිං ජීවිතෙ,
ද්වෙ මාසෙ කාරං කත්වාන[3] මංසං ජරග්ගවං කිසං,
අප්පත්තකාලෙ චොදෙසි තම්පි මය්හං න රුච්චති.

9. ගහපතිජාතකං.

251. සරීරදව්‍යං වද්ධව්‍යං[4] සොජච්චං සාධුසීලියං*,
බ්‍රාහ්මණන්තෙව පුච්ඡාම කං[5] නු තෙසං වනිම්හසෙ.

252. අත්ථො අත්ථි සරීරස්මිං වද්ධව්‍යස්ස[6] නමො කරෙ,
අත්ථො අත්ථි සුජාතස්මිං සීලං අස්මාක රුච්චතීති.

10. සාධුසීලජාතකං.

රුහකවග්ගො පඤ්චමො.

තස්සුද්දනං.

අම්බෙහාරුහකරූපවතීමුසලො
පවසනානි සපඤ්චමපොක්ඛරණී,
අථ මුත්තිමවාණිජ උම්භයතෙ
චිරආගත කොට්ඨ සරීර දස.

1. මංජුරෙ සයා, මුම්මරෙ – මජසං.
* උපකූජිසොතිපි පාඨො අයමෙවඅත්ථො අට්ඨකථා.
2. නද්දසං – මජසං.
3. සංකරංකත්වා – මජසං. සඞ්ගරං කත්වා සයා.
4. වුඩ්ඪබ්‍යං – මජසං, සයා.
* සුජච්චන්තිපි පාඨො. අට්ඨකථා.
5. කිනනු – මජසං, සයා.
6. වුඩ්ඪභාස්ස – මජසං සයා.

248. සත්‍යයෙන් යුක්ත වූ මේ වචනය ඇති සැටියෙන් කිව යුතු නො වේ. (ඉදින් ඇති සැටියෙන් ප්‍රකාශ කළ කෙනෙක් වෙත් නම්) ගිනි මුසු අලුයෙහි දවා හොවන ලද පොට්ඨපාදයා මෙන් හෝනේ මැ යි.

8. රාධ ජාතක යි.

249–250. දෙබස මැ මට සිහිය නො හෙයි. දෙබස මැ මට රිසි නො වෙයි. මේ තැනැත්තී (වී නැති බව කැලැ මැ දන්නී) කොටුවට බටුවා වී නො දක්මි යි (නැතැ යි) කිය යි. එකරුණින් ගම්පතිය, තොපට මෙය කියමි: කෂ්ටතර වූ අල්ප ජීවිතය පවත්නා කල්හි වී පිණිස මස් දෙන්නේ දෙමසකට සත්‍යකාර කොට (ගිවිසැ) කෘශ වූ ගොන්මාල්ලා දී දූන් නො පත් කල්හි ඉල්ලයි එ ද මට නො රුස්නේ යි. (තොප දෙදෙනාගේ වඤ්චා ප්‍රයොග දනිමි'යී සේ යි.)

9. ගහපති ජාතක යි.

251. එකකුගේ සුරුපි බව ඇත. එකකුගේ වෘද්ධ භාවය ඇත. එකකුගේ කුලවත් බව ඇත. එකකුගේ ආචාරශීලී බව ඇත. බ්‍රාහ්මණය තොප විචාරමි. මොවුනතුරෙන් කවරක්හු කැමැති වමෝ ද?

252. මනොඥ ශරීරයෙහි ද අභිවෘද්ධියෙක් ඇත් මැ ය. වෘද්ධ භාවයට නමස්කාර කෙරෙමි. උසස් කුලයෙහි උපන්නහු කෙරෙහි ද වැඩෙක් ඇත. (එහෙත්) ආචාරශීලය මැ අපට රුස්නේ යි.

10. සාධුසීල ජාතක යි.

පස්වැනි රුහක වර්ග යි.

එහි උද්දනය:

රුහක ජාතක යැ (රූපවතී) සිරිකාලකන්නි ජාතක යැ, මොහොලින් තැළීම පනවන චුලලපදුම ජාතක යැ, ප්‍රවාසය සිතන මණිචොර ජාතක යැ පස්වැනි පොක්ඛරණින් යුත් පබ්බතූපත්ථර ජාතක යැ යළි වෙළඳුන් ගේ මිදීම දක්වන වලාහස්ස ජාතක යැ, උම්හයතෙ යනු පවසන මිත්තා මිත්ත ජාතක යැ, (විරාගත) රාධ ජාතක යැ, (කොටඨ) ගහපති ජාතක යැ, අභිරූප ශරීරය පවසන සාධුසීල ජාතක යැ යන දසය යි.

6. නතංදළ්හවග්ගො

253. න තං දළ්හං බන්ධනමාහු ධීරා
යදායසං දාරුජං බබ්බජඤ්ච,[1]
සාරත්තරත්තා මණිකුණ්ඩලෙසු
පුත්තෙසු දාරෙසු ච යා අපෙක්ඛා.

254. එතං දළ්හං බන්ධනමාහු ධීරා
ඔහාරිනං සිථිලං දුප්පමුඤ්චං,
එතම්පි ඡෙත්වාන වජන්ති ධීරා
අනපෙක්ඛිනො කාමසුඛං පහායාති.

1. බන්ධනාගාරජාතකං.

255. හංසා කොඤ්චා මයූරා ච හත්ථියො[2] පසදා[3] මිගා,
සබ්බෙ සීහස්ස භායන්ති නත්ථි කායස්මිං තුල්‍යතා.

256. එවමෙව මනුස්සෙසු දහරො චෙපි පඤ්ඤවා
සො හි තත්ථ මහා හොති නෙව බාලො සරීරවා'ති.

2. කෙළිසීලජාතකං.

257. විරූපක්ඛෙහි මෙ මෙත්තං මෙත්තං එරාපථෙහි මෙ,
ඡබ්‍යාපුත්තෙහි මෙ මෙත්තං මෙත්තං කණ්හාගොතමකෙහි ච.

258. අපාදකෙහි මෙ මෙත්තං මෙත්තං දිපාදකෙහි මෙ,
චතුප්පදෙහි මෙ මෙත්තං මෙත්තං බහුප්පදෙහි මෙ.

259. මා මං අපාදකො හිංසි මා මං හිංසි දිපාදකො,
මා මං චතුප්පදො හිංසි මා මං හිංසි බහුප්පදො.

260. සබ්බෙ සත්තා සබ්බෙ පාණා සබ්බෙ භූතා ච කෙවලා,
සබ්බෙ භද්‍රානි පස්සන්තු මා කඤ්චි[4] පාපමාගමා.

---

1. දාරුජපබ්බජඤ්ච - මජසං ස්‍යා
2. හත්ථයො - මජසං.
3. සී. සපද - මජසං, වසද.
පසදමිගාතිපි පාඨො. පසදමිගාති අත්ථො. අට්ඨකථා.
4. කිඤ්චි - මජසං ස්‍යා.

6. නතංදළ්හ වර්ගය

253. අයොමය බන්‍ධනය ද දරුමය බන්‍ධනය ද වැහැරි ආදි-යෙන් කළ බන්‍ධනය ද දළ බැඳුම් යයි නුවණැත්තෝ නො කියත්. මණිකුණ්‍ඩලයන්හි දැඩි ඇල්මක් ඇද්ද අඹුදරුවන් කෙරෙහි යම් අපෙක්‍ෂාවක් ඇද්ද–

254. (යට කී) මේ බන්‍ධනය දැඩි යයි නුවැණැත්තෝ කියත්. ඔබ්නොබ ඇදූහෙළෙන්නා වූ සිථිල වූ මුදුලිය නො හැක්කා වූ යම් ක්ලෙශ බන්‍ධනයෙක් ඇද්ද එය ද සිඳැ කාමයන්හි අපෙක්‍ෂා නැති නුවණැත්තෝ කම්සුව හැරපියා තපසට යෙති.

1. බන්ධනාගාර ජාතක යි.

255. හංසයෝ ද කොස් ලිහිණියෝ ද මොණරු ද ඇත්හු ද එළුවෝ ද වෙනත් මෘගයෝ ද යන මේ සියල්ලෝ සිංහයාට බිය වෙත්. ශරීරයෙහි සමාන බවෙක් නැත. (ශරීරයෙහි උස් මිටි බව කරුණක් නො වේ යනු අදහස යි.)

256. එපරිද්දෙන් මැ මනුෂ්‍යයන් අතර ද ඉදින් වයසින් බාල-නමු දු නුවණැත්තේ වී නම් හේ මැ එහි මහත් වන්නේ ය. මහත් ශරීර ඇත්තේ නමුදු අඥනයා මහත් නො වන්නේ යි.

2. කෙළිසීල ජාතක යි.

257. විරූපක්ඛ නම් නාකුලය සමඟ ද මාගේ මෛත්‍රිය වේ. එරාපථ නම් නාකුලය සමඟ ද මාගේ මෛත්‍රිය වේ. ඡබ්‍යාපුත්ත නම් නාකුලය සමඟ ද මාගේ මෛත්‍රිය වේ. කණ්හාගොතමක නම් නාකුලය සමඟ ද මාගේ මෛත්‍රිය වේ.

258. පා නැතියන් හා ද මාගේ මෛත්‍රිය වේ. දෙපාවන් හා ද මාගේ මෛත්‍රිය වේ. සිවු පාවන් හා ද මාගේ මෛත්‍රිය වේ. බහුපාවන් හා ද මාගේ මෛත්‍රිය වේ.

259. අපාදක සතෙක් මට හිංසා නො කෙරේවා. දෙපා සතෙක් මට හිංසා නො කෙරේවා. සිවුපා සතෙක් මට හිංසා නො කෙරේවා. බහුපා සතෙක් මට හිංසා නො කෙරේවා.

260. සියලු සත්ත්වයෝ ය, සියලු ප්‍රාණීහු ය, සියලු භූතයෝ ය යන සියල්ලෝ මැ යහපතක් මැ දකිත්වා. කිසිවකු කරා දුකෙක් නො ඒවා.

261. අප්පමාණො බුද්ධො අප්පමාණො ධම්මො අප්පමාණො සඞ්ඝො,
පමාණවන්තානි සිරිංසපානි[1]
අහි විච්ඡිකා සතපදී උණ්ණානාභී සරබූ[2] මූසිකා.

262. කතා මෙ රක්ඛා කතා මෙ පරිත්තා පටික්කමන්තු භූතානි,
සොහං නමො භගවතො නමො සත්තන්නං සම්මාසම්බුද්ධානන්ති.

3. ඛන්ධවත්තජාතකං[3].

263. අපි වීරක පස්සෙසි සකුණං මඤ්ජුභාණකං[4],
මයූරගීවසඞ්කාසං පතිං මය්හං[5] සවිට්ඨකං.

264. උදකථලචරස්ස පක්ඛිනො නිච්චං ආමකමච්ඡභොජිනො,
තස්සානුකරං සවිට්ඨකො සෙවාලෙ[6] පළිගුණ්ඨිතො[7] මතො'ති.

4. වීරකජාතකං.

265. සොභති[8] මච්ඡො ගඞ්ගෙය්‍යො අථො සොභති යාමුනො,
චතුප්පදොයං[9] පුරිසො නිග්‍රොධපරිමණ්ඩලො,
ඊසකායතගීවො ච සබ්බෙව අතිරොචති.

266. යං පුච්ඡිතො නං තං අක්ඛා අඤ්ඤං අක්ඛාති[10] පුච්ඡිතො,
අත්තප්පසංසකො පොසො නායං අස්මාක රුච්චතී'ති.

5. ගඞ්ගෙය්‍යජාතකං.

267. ඉඞ්ඝ වඩ්ඪමයං[11] පාසං ඡින්ද දන්තෙහි කච්ඡප,
අහං තථා කරිස්සාමි යථා නෙහිති ලුද්දකො.

268. කච්ඡපො පාවිසී වාරිං කුරුඞ්ගො පාවිසී වනං,
සතපත්තො දුමග්ගම්හා දූරෙ පුත්තෙ අපානයීති.

6. කුරුඞ්ගමිගජාතකං.

---

1. සරිසපානි-මජ්සං.
2. සරභූ-කම්වි.
3. ඛන්ධකපරිත්ත-සයා.
4. මඤ්ජුභාණිකං-මජ්සං.
5. පතිමය්හං-කම්වි.
6. සෙවාලෙහි-සයා.
7. පතිගුණ්ඨිතො-මජ්සං.
8. සොභන්ති මච්ඡා සී. ගඞ්ගෙය්‍යා අථො සොභන්ති යමුනා. සයා.
9. චතුස්සදෙයං-මජ්සං
10. අක්ඛාති. අ.
11. වට්ටමයං-මජ්සං.

261. බුදුරද (අනන්ත ගුණැතියෙන්) අප්‍රමාණය. ධර්මය අප්‍රමාණය. සඞ්ඝයා අප්‍රමාණය. දීර්ඝජාතිහු ද නයි ද ගෝනුස්සෝ ද සියපාවෝ ද (පත්තෑයෝ ද) මකුළුවෝ ද සිකනලු ද මීයෝ ද ප්‍රමාණවත්හ.

262. මා විසින් (රුවන්තියා ගුණ බෙලෙන්) ආරක්ෂාව කරන ලදී. මා විසින් පරිත්‍රාණ ද කරන ලදී. (මට අහිත වූ) භූතයෝ පහවෙත්වා. හේ මම භාග්‍යවතුනට නමස්කාර කෙරෙමි. (විපස්සී ආදි) සත් බුදුවරුනට මාගේ නමස්කාරය වේවා.

3. බන්ධවත්ත ජාතක යි.

263. වීරකය, මියුරු කොට හඬන මොණර කරකට බඳු පැහැති මාගේ වල්ලභයා වන සවිට්ඨක නම් පක්ෂියා දක්හිද?

264. දියෙහි ද ගොඩ ද හැසිරෙන නිත්‍යයෙන් අමු මස් කන ඒ පක්ෂියාට අනු වැ ක්‍රියා කරන (තී සැමි) සවිට්ඨක නම් කවුඩා සෙවෙලෙහි වෙළී මෙළේ යි.

4. වීරක ජාතක යි.

265. ගංගාවෙහි උපන් මත්ස්‍යයා ද හොබනේ ය. යමුනාවෙහි උපන් මත්ස්‍යයා ද හොබනේ ය. නිග්‍රොධ පරිමණ්ඩලකාය ඇති රියහිසක් සේ දික් වූ ග්‍රීවා ද ඇති පා සතරක් ඇති මේ සත්ත්ව තෙමේ (මේ ඉදිබුවා) සියල්ලන් මැ (තොප දෙදෙනා මැ) ඉක්මවා බබළ යි.

266. යමක් ඇසී ද එය නො කීයේ ය. විචාරන ලද්දේ අනෙකක් කිය යි. ආත්මප්‍රශංසා කරන මේ සත්ත්වයා (මේ ඉදිබුවා) අපට නො රුස්නේ ය.

5. ගඬෙගයා ජාතක යි.

267. එබැවින් ඉදිබුව, (මුවා බැඳුණු) වරපටින් ඇඹරු මලපුඩුව දතින් කපව. වැදි යම් සේ නො ඒ ද මම එසේ කෙරෙමි. (වැද්දගේ ගමන වළක්වමි.)

268. ඉදිබුවා දියට පිවිසියේ ය. මුවා වනයට පිවිසියේ ය. ශතපත්‍රයා (කෑරලා) තමා හුන් අතු අගින් දරුවන් ගෙනෑ අඳුරට ගියේ යි.

6. කුරුඞගමිග ජාතක යි.

269. අයමස්සකරාජේන දෙසො විචරිතො මයා,
අනුකාමයානුකාමෙන[1] පියෙන පතිනා සහ.

270. නවෙන සුඛදුක්ඛෙන පොරාණං අපිධීයති[2],
තස්මා අස්සකරඤ්ඤාව කීටො පියතරො මමන්ති.

7. අස්සකජාතකං.

271. අලමෙතෙහි අම්බෙහි ජම්බූහි පනසෙහි ච,
යානි පාරං සමුද්දස්ස වරං මය්හං උදුම්බරො.

272. මහතී වත තෙ බොන්දි න ච පඤ්ඤා තදූපිකා,
සුංසුමාර වඤ්චිතො මෙසි ගච්ඡදනි යථාසුඛන්ති.

8. සුංසුමාරජාතකං.

273. දිට්ඨා මයා වනෙ රුක්ඛා අස්සකණ්ණවිභීටකා[3],
න තානි එවං සක්කන්ති යථා ත්වං රුක්ඛ සක්කසි.

274. පුරාණකක්කරො[4] අයං භෙත්වා පඤ්ජරමාගතො,
කුසලො වාළපාසානං අපක්කමති භාසතී'ති.

9. කක්කරජාතකං.

275. අම්භො කො නාමයං රුක්ඛො සීනපත්තො සකණ්ටකො[5],
යත්ථ එකප්පහාරෙන උත්තමඞ්ගං විසාටිතං.

276. ආචරිතායං[7] විතුදං වනානි
කට්ඨඞ්ගරුක්ඛෙසු අසාරකෙසු,
අථාසද ඛදිරං ජාතසාරං
යත්ථබ්භිද ගරුළො උත්තමඞ්ගන්ති.

10. කන්දගලකජාතකං.

නතංදළ්හවග්ගො ජට්ඨො.

තස්සුද්දානං.

දළ්හබන්ධනහංසවරො ච පුන
විරූපක්ඛ සවිට්ඨකමච්ඡවරො,
සකුරුඞ්ගසඅස්සකඅම්බවරො
පුන කක්කරකො ගරුළෙන දස.

1. අනුකාමයමානෙන – මඡසං සයා.
2. අපිධීයති – මඡසං.
3. අස්සකණ්ණවිභෙදකා – මඡස, සයා.
4. පුරාණකුක්කුටො – මඡසං.
5. සණ්හපත්තො – සයා. සීනාපත්තො.
6. අචාරිවතායං – සයා.

269. ඔහු කැමැත්තා වූ මා විසින් කැමැති වූ ප්‍රිය වූ ස්වාමි වූ අස්සක නම් රජු හා පෙර මේ ප්‍රදෙශය හැසිරෙන ලද.

270. අළුත් වූ සුවඳුක් දෙකින් පැරැණි සුවඳුක් දෙක මුවහ කරනු ලැබේ. එහෙයින් අස්සක නම් රජුට වඩා මේ ගොම පණුවා මැ මට අතිශයින් ප්‍රිය වේ.

7. අස්සක ජාතක යි.

271. ගඞ්ගාවෙන් එතෙර යම් මිහිරි ඵලයෙක් දක්නා ලද ද ඒ අඹ පලයෙන් ද දඹ පලයෙන් ද වැළවරකායෙන් ද මට කම් නැත. මාගේ උදුම්බර වෘක්‍ෂය මැ (මට) උතුම්.

272. සුංසුමාරය, තාගේ සිරුර එකතින් මහත් වේ. ඒ සිරුරු පමණට නුවණ නැත. මා විසින් වංචා කරන ලද්දෙහි ය. දූන් කැමැති පරිදි නැඟී යව.

8. සුංසුමාර ජාතක යි.

273. වෘක්‍ෂය, මා විසින් වෙනෙහි දක්නා ලද අශ්වකර්ණ නම් වූ ද බුළු නම් වූ ද වෘක්‍ෂයෝ වෙති. ඒරුක්හු තෝ යම් සේ ඔබිනොබ හැසිරෙන්නෙහි ද එසේ නො ඇවිදිත්.

274. මැදිරිය බිඳැ ගෙනැ ආ මේ පුරාණ කක්කරයා (සේවටුවා) වාලයෙන් ඇඹරූ පාසයෙන් ගැළැවීමෙහි දක්‍ෂ වූයේ පලා යයි. (මිනිස් බසින්) බණන්නේ ය.

9. කකකර ජාතක යි.

275. පින්වත, යම් රුකෙක්හි එක් පහරින් මුදුන බිඳින ලද ද කුඩා පත් ඇති කටු සහිත වූ මේ කවර නම් ඇති රුකෙක් වේ ද?

276. (ඉඹුල් ආදි) හර නැති කාෂ්ට අවයව ඇති වෘක්‍ෂයන් විදිමින් මේ කන්‍දගලකයා ඇවිදින ලද්දේ ය. පසුව පක්ෂියා යම් රුකෙක්හි ඇන හිස පළා ගත්තේ ද එසේ වූ හර ඇති කිහිරි රුකට පැමිණියේ යි.

10. කන්දගලක ජාතක යි.

සවැනි නතංදළ්හ වර්ග යි.

එහි උද්දනය;

දළ්හබන්ධන–බන්ධනාගාර ජාතක යැ' හංසාදීන් පවසන කෙළිසීල ජාතකය ද යළි විරූපකඛාදි නම් ඇති බන්ධවත්ත ජාතක යැ සවිටඨක නම් කවුඩා පවසන වීරක ජාතක යැ, (මචඡවර) ගඞ්ගෙය්‍ය ජාතක යැ, කුරුඞ්ගමිග ජාතකය හා අඞ්සක ජාතකය සහිත අඹපල සඳහන් කරන සුංසුමාර ජාතකය කකකර ජාතක යැ, (ගරුළ) කන්‍දගලක ජාතකය යන මෙයින් දසය වේ.

7. බීරණත්ථම්භකවග්ගො

277. අකාසි යොග්ගං[1] ධුවමප්පමත්තො
සංවච්ඡරං බීරණත්ථම්භකස්මිං,
ව්‍යාකාසි සඤ්ඤං[2] පරිසං විගය්හ
න නියාමො[3] තායති අප්පපඤ්ඤං.

278. ද්වයං[4] යාචනකො තාත සොමදත්ත නිගච්ඡති,
අලාභං ධනලාභං වා එවං ධම්මා හි යාචනා’ති.

1. සොමදත්ත ජාතකං.

279. අඤ්ඤො උපරිමො වණ්ණො අඤ්ඤා වණ්ණොව හෙට්ඨිමො
බ්‍රාහ්මණිං ත්වෙව පුච්ඡාමි කිං හෙට්ඨා කිඤ්ච උප්පරි.

280. අහං නටොස්මි භද්දන්තෙ භික්ඛකොස්මි ඉධාගතො,
අයං හි කොට්ඨමොතිණ්ණො අයං සො යං ගවෙසසීති.

2. උච්ඡිට්ඨභත්තජාතකං.

281. ඉසීනමන්තරං කත්වා භරුරාජාති[5] මෙ සුතං,
උච්ඡින්නො සහ රට්ඨෙන[6] ස රාජා විභවං ගතො

282. තස්මා හි ඡන්දගමනං නප්පසංසන්ති පණ්ඩිතා,
අදුට්ඨචිත්තො භාසෙය්‍ය ගිරං සච්චූපසංහිතන්ති.

3. භරුජාතකං[7].

283. පුණ්ණං නදිං යෙන ච පෙය්‍යමාහු
ජාතං යවං යෙන ච ගුය්හමාහු,
දූරං ගතං යෙන ච අව්හයන්ති
සොත්‍යාගතො හන්ද ච භුඤ්ජ බ්‍රාහ්මණ.

284. යතො මං සරති රාජා වායසම්පි පහෙතවෙ:
හංසා[8] කොඤ්චා මයූරා ච අසතියෙව පාපියාති.

4. පුණ්ණනදීජාතකං.

---

1. යොගං – මජසං.
2. ව්‍යාකාසි අඤ්ඤං – මජසං. සයා.
3. නියමො – මජසං. නිස්සමො කම්බො.
4. දයං – මජසං.
5. කුරුරාජාති – මජසං.
6. රට්ඨෙහි – මජසං. සයා.
7. කුරුජාතකං – මජසං.
8. හංසකොඤ්චමයූරානං අසතියෙව පාපියො – මජසං. "අට්ඨකථායං පන හංසකොඤ්චමයූරානන්ති පාඨො සො සුන්දතරො"

7. බීරණත්ථම්භක වර්ගය

277. බීරණත්ථම්භක සොහොනෙහි අවුරුද්දක් අප්‍රමාද වැ නිරතුරු පුහුණු කෙළේ ය. පිරිස් අතරට වැද ඒ සංඥාව විකෘත කෙළේ ය. උත්සාහය ප්‍රඥා නැත්තහු නො රකී.

278. පුත සොමදත්තය, ඉල්ලන්නේ අලාභයට ද ධනලාභයට ද යි දෙකකට පැමිණෙයි. යාච්ඤාව නම් මෙබඳු ස්වභාව ඇත් මැ ය.

1. සොමදත්ත ජාතක යි.

279. මතු භාගයෙහි අහර අන් අයුරෙකි. යට භාගයෙහි අහර අන් අයුරෙක් මැ යැ. බැමිණිය තී මැ විචාරමි. යට කවර නම් බතෙක් ද උඩ කවර නම් බතෙක් දැ යි.

280. ස්වාමීනි, මම නළුයෙක්මි, අහර සොයන්නෙම් මෙහි ආයෙමි. තෙපි යමකු සොයවු ද ඇගේ සොර සැමි වූ හේ කොටුවට බැසැ ගත්තේ ය.

2 උච්ඡිට්ඨභත්ත ජාතක යි.

281. හරු නම් රජ සෘෂීනට අනතුරු කොට රාජ්‍යය හා සමඟ උසුන් වූ ඒ රජ විනාශයට ගියේ ය යි මා විසින් අසන ලදී.

282. එහෙයින් ඡන්දගතිය පණ්ඩිතයෝ ප්‍රශංසා නො කෙරෙති. අදුෂ්ට වූ (මෛත්‍රී) සිතැත්තේ සත්‍යයෙන් යුක්ත වූ තෙපුල් බණන්නේ ය.

3. හරු ජාතක යි.

283. පිරුණා වූ නදිය යමකු විසින් පිය යුතු ය යි කියා ද, වැඩුණා වූ යව (සස්‍යයන්) යමකු විසින් සැඟවීමට සුදුසු ය යි කියා ද, දුර ගිය ප්‍රියයකු පැමිණීම යමකු කරණ කොටගෙනැ කියා ද, හේ තොපට ගෙනෙන ලදී. එබැවින් බ්‍රාහ්මණිය අනුභව කරව.

284. රජ තෙමේ කාකමාංශයකු දු එවනු පිණිස යම් කලෙකැ මා සිහි කෙරෙයි ද හංසයෝ ය කොස් ළිහිණියෝ ය මයූරයෝ ය යන මොවුන් ලද කල්හි කිම සිහි නො කෙරෙයි ද, එසේ සිහි නො කිරීම ම ලාමක ය.

4. පුණ්ණනදී ජාතක යි.

---

1. තොපට වැඩක් මැ වේවයි – රාජවූරාරී.

285. අවධි වත අත්තානං කච්ඡපො ව්‍යාහරං[1] ගිරං,
සුග්ගහිතස්මිං කට්ඨස්මිං වාචාය සකියාවධි.

286 එතම්පි දිස්වා නරවිරියසෙට්ඨ[2]
වාචං පමුඤ්චෙ කුසලං නාතිවෙලං
පස්සසි බහුභාණෙන
කච්ඡපං ව්‍යසනං ගතන්ති.

5. කච්ඡපජාතකං.

287. න වායමග්ගි තපති න සූලො සාධු තච්ඡිතො,
යඤ්ච මං මඤ්ඤති මච්ඡී අඤ්ඤං සො රතියා ගතො.

288. සො මං දහති රාගග්ගි චිත්තං චූපතපෙති මං,
ජාලිනො මුඤ්චථයිරා මං න කාමෙ හඤ්ඤතෙ කවචීති.

6. මච්ඡජාතකං.

289. සබ්බො ලොකො අත්තමනො අහොසි
අකොවිද ගාමධම්මස්ස සෙග්ගු,
කොමාරිකො නාම තවජ්ජධම්මො
යං ත්වං ගහිතා පවනෙ පරොදසි.

290. යො දුක්ඛඵුට්ඨාය භවෙය්‍ය තාණං
සො මෙ පිතා දූභි වනෙ කරොති,
සා කස්ස කන්දාමි වනස්ස මජ්ඣෙ
යො තායිතා සො සහසා කරොතී'ති.

7. සෙග්ගුජාතකං.

291. සඨස්ස සාඨෙය්‍යමිදං සුචින්තිතං
පච්චොඩ්ඩිතං පතිකූටස්ස කූටං,
ඵාලඤ්චෙ අදෙය්‍යුං[3] මූසිකා
කස්මා කුමාරං කුලලා නො හරෙය්‍යුං[4]

1. කච්ඡපො සො පබ්‍යාහරං - මජ්ඣං. කච්ඡපෙව පබ්‍යාහරං, ස්‍යා.
2. නරවීරසෙට්ඨං - මජ්ඣං, ස්‍යා.
3. ඛාදෙය්‍යුං - මජ්ඣං ස්‍යා.
4. හරෙය්‍යුං - මජ්ඣං න.

285. කැසුබු තෙමේ බස් තෙපලනුයේ ඒකාන්තයෙන් තමා නැසීය. මුවින් මනාකොට ඩැහැගත් දඬුකඩ ඇති කල්හි තමාගේ තෙපුලෙන් තෙමේ මැ තමා නැසී.

286. මිනිසුන් කෙරෙහි වීර්‍ය්‍යයෙන් ශ්‍රෙෂ්ඨ වූ මහරජ, තෙල කරුණ දැක (පණ්ඩිත පුරුෂ) සත්‍යාදීන් ප්‍රතිසංයුක්ත හෙයින් කුශල වූ තෙපුල කල්යල් නො ඉක්මවා බණන්නේ යැ, බොහෝ කොට බිණීමෙන් වනසට පැමිණි කසුබුවා දක්නෙහි යයි.

5. කච්ඡප ජාතක යි.

287. මේ ගින්න මා නො තවයි, මැනැවින් සස්නා ලද හුල ද නො තවයි, මැසිනි 'හේ කාම රති හෙතුයෙන් අන් මැසින්නක වෙත ගියේ වනැ' යි මා ගෙන සිතා නම්-(එය මා තවයි.)

288. ඒ රාග නැමැති ගින්න මා දවයි, ඒ රාගසම්ප්‍රයුක්ත සිත ද මා තවයි, ස්වාමී වූ කෙවුලෙනි, මා මුදපියව, කාම විෂයෙහි සිටි නොහොත් කාම හෙතුයෙන් හැසිරෙන කිසිවෙක් (තොප වැනියන් විසින්) නො නසනු ලැබේ.

6. මච්ඡ ජාතක යි.

289. සියලු ලෝවැසි තෙම කාමසේවන හෙතුයෙන් සතුටු විය, සෙග්ගු, තෝ ග්‍රාමධර්මයෙහි අදක්‍ෂ වුව, දුව කුමරිය, යම් හෙයෙකින් මහවෙනෙහි (කාම සෙවන පිණිස) අත ගන්නා ලද තෝ හඬයි ද දූන් තීගේ ස්වභාව කෙ නම් වී ද?

290. යමෙක් දුකින් පහස්නා ලද්දියට පිහිට වන්නේ ද, ඒ මාගේ පියෙ වෙනෙහි ද්‍රොහිකම් කෙරෙයි. ඒ මම් වනමැද කවරක්හට හඬම් ද, යමෙක් රක්‍ෂා කරනුයේ වී නම් හේ සැහැසිකම් කෙරේ යයි.

7. සෙග්ගු ජාතක යි.

291. ශඨ (කෛරාටික) වූවහුට මේ ශඨබව මොනවට සිතන ලද, කූට (කපටි) වූවහුට පෙරළා කපටි බව මනාකොට අටවන ලද, ඉදින් මීයෝ සිවැල් කැවාහු නම් කුමක් හෙයින් උකුස්සෝ කුමරු නො ගෙන ගියාහු ද?

292. කූටස්ස හි සන්ති කූටකූටා
භවති චාපි[1] නිකතිනො නිකත්‍යා,
දෙහි පුත්තනට්ඨ ඵාලනට්ඨස්ස ඵාලං
මා තෙ පුත්තමහාසි ඵාලනට්ඨො'ති.

8. කූටවාණිජජාතකං.

293. හිරඤ්ඤං මෙ සුවණ්ණං මෙ එසා රත්තිංදිවා කථා,
දුම්මෙධානං මනුස්සානං අරියධම්මං අපස්සතං.

294. ද්වෙ ද්වෙ ගහපතයො ගෙහෙ එකො තත්ථ අමස්සුකො,
ලම්බත්ථනො වෙණිකතො අථො අඞ්කිතකණ්ණකො.
කීතො ධනෙන බහුනා සො තං විතුදතෙ ජනන්ති.

9. ගරහිතජාතකං.

295. සුඛං ජීවිතරූපොසි රට්ඨා විවනමාගතො,
සො එකකො අරඤ්ඤස්මිං රුක්ඛමූලෙ කපණො විය ඣායසි

296. සුඛං ජීවිතරූපොස්මි රට්ඨා විවනමාගතො,
සො එකකො අරඤ්ඤස්මිං
රුක්ඛමූලෙ කපණො විය ඣායාමි
සතං ධම්මං අනුස්සරන්ති.

10. ධම්මද්ධජජාතකං.

බීරණත්ථම්භකවග්ගො සත්තමො.

තස්සුද්දානං:

අථ බීරණත්ථම්භවරො ච නටො
හරුරාජවරුත්තමපුණ්ණනදී,
බහුභාණි අග්ගි පවනෙ මූසිකා
සහලම්බත්ථනො කපණෙන දස.

1. පරො – සයා.

292. කූට (කපටි) වූවහුට කූටාතිකූටයෝ ඇත, නැවත වංචකයා-හට වංචාවෙන් යුක්ත වූයෙක් වේ මැය, පුත්‍රයා නට තැනැත්ත, සිවැල් නට තැනැත්තවුට සිවැල් දෙව, සිවැල් නට තැනැත්තේ තාගේ පුතු නහමක් ගෙනයේවා.

8. කූටවාණිජ ජාතක යි.

293. මාගේ මසුරනැ මාගේ රත්රනැ යි ආයර්‍යධර්මය නො දක්නා ප්‍රඥා රහිත මිනිසුන්ගේ රූ දවලැ පැවැති තෙල කථාව වෙයි.

294. ගෘහයෙහි ගැහැවියෝ දෙදෙනෙක් දෙදෙනෙක් වෙති, ඔවුන් කෙරෙහි එකෙක් දළිරවුළු නැත්තෙ යැ, එල්බෙන තන ඇත්තෙ යැ, සකස් කළ කෙස්කලඹ ඇත්තෙ යැ, යළි විදූනා ලද කන් ඇත්තෙ යැ, බොහෝ ධනයෙන් විකිණි ගන්නා ලද්දෙ යැ, හේ ඒ (දස්කම්කරු ආදී) ජනයා මුව සැතින් විදුනේ යි.

9. ගරහිත ජාතක යි.

295. සුවසේ ජීවත්වූ ස්වභාව ඇතියෙහි රටින් නික්මැ නිර්ජල වනයට ආයෙහි ඒ තෝ එකලා වූයෙහි වනයෙහි ගස්මුලෙක කෘපණයක්හු සෙයින් (සිතිවිලි) සිතහි. (ඒ කුමක් හෙයිනැයි?)

296. ඒ මම සුවසේ ජීවත්වූ පියවි ඇතියෙමි, සිය රටින් නික්මැ නිරුදක වනයට ආයෙමි එකලා වැ බැගෑපත් වූවකු සෙයින් බුද්ධාදි සත්පුරුෂයන්ගේ (අටලෝ) දහම් සිහි කෙරෙමින් ධ්‍යාන කෙරෙමි යි.

10. ධම්මද්ධජ ජාතක යි.

සත්වැනි බීරණත්ථම්භක වර්ග යි.

එහි උද්දනය:

බීරණත්ථම්භයෙහි සිට පුහුණ කළ සොමදත්ත ජාතක යැ, නළුවකු ඇති උච්චිට්ඨභත්ත ජාතකයැ, හරු ජාතකයැ, පුණ්ණනදී ජාතක යැ, (බහුභාණී) කච්ඡප ජාතක යැ, ගිනි සඳහන් කළ මච්ඡ ජාතක යැ, (පවනෙ) සෙග්ගු ජාතක යැ, සිවැල් මීයන් කෑ කූටවාණිජ ජාතක යැ, ලම්බත්‍ථන පැවැසූ ගරහිත ජාතකය සමග (කපණෙන) ධම්මද්ධජ ජාතකයෙන් දසය වේ.

8. කාසාවවග්ගො

297. අනික්කසාවො කාසාවං යො වත්ථං පරිදහෙස්සති,
අපෙතො දමසච්චෙන න සො කාසාවමරහති.

298. යො ච වන්තකසාවස්ස සීලෙසු සුසමාහිතො,
උපෙතො දමසච්චෙන ස වෙ කාසාවමරහතී'ති.

1. කාසාවජාතකං.

299. ඉදං තදාචරියවචො පාරාසරියො යදබ්‍රවි[1],
මා සු ත්වං අකරා[2] පාපං යං ත්වං පච්ඡා කතං තපෙ

300. යානි කරොති පුරිසො තානි අත්තනි පස්සති,
කල්‍යාණකාරී කල්‍යාණං පාපකාරී ච පාපකං,
යාදිසං වපතෙ[3] බීජං තාදිසං හරතෙ ඵලන්ති.

2. චූළනන්දියජාතකං.

301. නමෙ නමන්තස්ස භජෙ භජන්තං
කිච්චානුකුබ්බස්ස කරෙය්‍ය කිච්චං,
නානත්ථකාමස්ස කරෙය්‍ය අත්ථං
අසම්භජන්තම්පි න සම්භජෙය්‍ය.

302. චජෙ චජන්තං වනථං න කයිරා[4]
අපෙතචිත්තෙන න සම්භජෙය්‍ය,
දිජො දුමං ඛීණඵලන්ති[5] ඤත්වා
අඤ්ඤං සමෙක්ඛෙය්‍ය මහා හි ලොකොති.

3. පුටභත්තජාතකං.

1. පොරාණාචරියොබ්‍රවි – මජ්ඣසං.
2. අකරි – මජ්ඣසං. ස්‍යා.
3. වපතෙ – මජ්ඣසං.
4. කාරියා න – මජ්ඣසං.
5. ඛීණඵලං ච – ස්‍යා.

8. කාසාව වර්ගය

297. ප්‍රහීණ නො කරන ලද කෙලෙස් කසට ඇති යමෙක් **කාෂාය වස්ත්‍රය** (සිවුර) හඳනේ පොරෝනේ ද ඉන්ද්‍රිය දමනයෙන් හා **පරමාර්ථ සත්‍යයෙන්** (චතුසත්‍යාවබොධයෙන්) පහ වූ හෙතෙමේ කසාවතට (සිවුරට) නුසුදුසු යි.

298. යමෙක් දුරු කරන ලද කෙලෙස් කසට ඇත්තේ ද හෙවත් කෙලෙස් නසන ලද්දේ ද (ලොකොත්තර – මාර්ගඵල) ශීලයෙහි මනාකොට පිහිටියේ ද ඉන්ද්‍රිය දමනයෙන් හා පරමාර්ථසත්‍යයෙන් **යුක්ත** ද **හෙතෙමේ** ඒකාන්තයෙන් කසාවතට (සිවුරට) **සුදුසු** යි.

1. කාසාව ජාතක යි.

299. පාරාසරිය බමුණු තෙමේ, තෝ පාපය නො කරව, යම්බඳු පාපයක් කරන ලද ද තෝ පසුව තැවෙන්නෙහිය කියා යම් වචනයක් එකල්හි කීයේ ද මේ ආචාර්යවචන යි.

300. පුරුෂ තෙමේ යම් ක්‍රියාවක් කෙළේ ද ඒ ක්‍රියාව තමා කෙරෙහි දකී. කල්‍යාණ ක්‍රියා කරන්නේ කල්‍යාණයක් ම දකී. පාපක්‍රියා කරන්නේ පාපයක් ම (අයහපතක් ම) දකී. යම්බඳු බීජුවටක් වපුරා ද එබඳු ම ඵලයක් ගෙනයන්නේ ය.

2. චූලනන්දි ජාතක යි.

301. (ආචාර වශයෙන්) නමස්කාර කරන්නාහට නමස්කාර කරන්නේ ය. තමා සෙවුනහු සේවනය කරන්නේ ය. තමාගේ කෘත්‍යයට අනුව කටයුතු කරන්නාහට ප්‍රතිකෘත්‍ය (පෙරළා කටයුතු) කරන්නේ ය. අවැඩ කැමැත්තහුට වැඩක් (අර්ථයක්) නො කරන්නේ ය. තමා භජනය නො කරන්නහු ද භජනය නො කරන්නේ ය.

302. තමා අත්හරින්නහු තෙමේ ද හරන්නේ ය. ඔහු කෙරෙහි තෘෂ්ණාව නො කරන්නේ ය. පහ වූ චිත්තයෙන් (හෙවත් හිතවත්-කමින් සිත බැහැර වූ කල්හි ඔහු) නො සෙවුනේ ය. වෘක්ෂය ඵලයන්ගෙන් හීන යයි දැනැගත් පක්ෂියා අන් රුකක් සොයා යන්නේ ය. ලෝකය මහත් ය, විශාලය. (ලෝකය මිනිසුන්ගෙන් පිරී පවත්නා බැවින් තමා කෙරෙහි ස්නෙහ නො කරන පුරුෂයා හැරදමා ස්නෙහ කරන පුරුෂයකු සොයා ගතයුතුය යනු කී සේයි.)

3. පුටභත්ත ජාතක යි.

303. යස්සෙතෙ චතුරො ධම්මා වානරින්ද යථා තව,
සච්චං ධම්මො ධිති චාගො දිට්ඨං සො අතිවත්තති.

304. යස්ස චෙතෙ න විජ්ජන්ති ගුණා පරමභද්දකා,
සච්චං ධම්මො ධිති චාගො දිට්ඨං සො නාතිවත්තතී'ති.

4. කුම්භීලජාතකං.

305. අත්ථි මෙ පුරිසො දෙව සබ්බකිච්චෙසු ව්‍යාවටො,
තස්ස චෙකො පරාධත්ථි තත්ථ ත්වං කිංනු මඤ්ඤසි.

306. අම්හාකම්පත්ථි[1] පුරිසො එදිසො ඉධ විජ්ජති,
දුල්ලභො අඞ්ගසම්පන්නො ඛන්තිරස්මාක රුච්චතීති.

5. ඛන්තිවණ්ණනජාතකං.

307. කාලෙ නික්ඛමනා සාධු නාකාලෙ සාධු නික්ඛමො,
අකාලෙන හි නික්ඛම්ම එකකම්පි බහුජ්ජනො,
න කිඤ්චි අත්ථං ජොතෙති ධංකසෙනාව කොසියං.

308. ධීරො ච විධිවිධානඤ්ඤූ පරෙසං විවරානුගූ,
සබ්බාමිත්තෙ වසීකත්වා කොසියොව සුඛී සියා'ති.

6. කොසියජාතකං.

309. සූරො සූරෙන සඞ්ගම්ම වික්කන්තෙන පහාරිනා,
එහි නාග නිවත්තස්සු කින්නු භීතො පලායසි?
පස්සන්තු අඞ්ගමගධා මම තුය්හඤ්ච වික්කමං.

310. න තං පාද වධිස්සාමි න දන්තෙහි න සොණ්ඩියා,
මීළ්හෙන තං වධිස්සාමි පූති හඤ්ඤතු පූතිනා'ති.

7. ගූථපාණකජාතකං.

---

1. අම්හාකඤ්චත්ථි අ.

303. වානරෙන්ද්‍රය, වාක්සත්‍යය ද පරීක්‍ෂාඥානය ද ධෛර්‍ය්‍යය ද ත්‍යාගය ද යන මේ ධර්මයෝ සතර දෙන තට මෙන් යම් පුද්ගලයකුට විද්‍යාමාන වෙත් ද හෙතෙමේ සතුරා ඉක්මවා පවතී.

304. වාක්සත්‍යය ද පරීක්‍ෂාඥානය ද ධෛර්‍ය්‍යය ද ත්‍යාගය ද යන මේ අතිසුන්‍දර වූ ගුණයෝ යමක්හට විද්‍යාමාන නො වෙත් ද හෙතෙමේ සතුරා ඉක්මවා නො පවතී.

4. කුම්භිල ජාතක යි.

305. දෙවයෙනි, මාගේ සියලු කෘත්‍යයන්හි ව්‍යාවෘත වූ පුරුෂයෙක් ඇත. ඔහුගේ ද එක් අපරාධයෙක් ඇත. ඒ අපරාධයෙහි ලා ඔබ කුමක් සිතන්නෙහි ද? (කවර නම් දඬුවමක් අනුමත කරන්නෙහි ද?)

306. අපගේ ද එබඳු පුරුෂයෙක් ඇත. (හේ) මෙතන්හි ම ඇත. (සිටී) සකලගුණාඞගයෙන් සැදුණු පුද්ගලයෝ දුර්ලභයහ. (එහෙයින් මෙබඳු අවස්ථාවන්හිදී) අපට ඉවැසීම අභිමත යි. (සුදුසුයි.)

5. ඛනතිවණ්ණන ජාතක යි.

307. සුදුසු කාලයෙහි නික්මීම නොහොත් පරාක්‍රමය යහපත් වේ. අකාලයෙහි (තම නිවාසස්ථානයෙන්) නික්මීම නොහොත් පරාක්‍රමය යහපත් නො වේ. අකාලයෙහි නික්ම නොහොත් වීර්‍ය්‍ය කොට කිසි දියුණුවක් නො බබළයි හෙවත් නො ලබයි. (නො කල්හි නික්මුණු) බකමූහුණුවා නැසූ කාකසේනාව මෙන් (නො කල්හි) හුදෙකලා වූවහු (වීර්‍ය්‍ය කළ ද) බොහෝ දෙනා වට කොට විනාශයට පමුණුවන්නාහු ය.

308. (පැරැණි පඬිවරුන් ව්‍යවස්ථා කොට තබන ලද) විධියගේ විධාන දන්නා වූ නොහොත් විධාන ක්‍රම දන්නා වූ අන්‍යයන්ගේ සිදුරු දන්නා වූ ප්‍රාඥයා සියලු සතුරන් වසඟ කොට නුවණැති බකමූහුණා මෙන් සුවපත් වූයේ වන්නේ යි.

6. කොසිය ජාතක යි.

309. ශූර ගුණයෙන් යුක්ත වූ වික්‍රම ස්වභාව ඇති පහර දෙන්නා වූ පුරුෂයා හා ශූර පුරුෂ තෙමේ එක්තැනට පැමිණ (ඔවුනොවුන් සටන් නො කොට කුමට යේ ද?) හස්තිය, මෙහි එව නවතුව. කුමට බිය වූයේ පළා යෙයි ද? මාගේ ද තාගේ ද වික්‍රමය අඟුමඟධ දෙරට වැස්සෝ බලත්වා.

310. තා පාදයෙන් නො මරමි, දළ සහළෙන් නො මරමි, සොඬිනුත් නො මරමි. අශුචියෙන් ම තා මරමි, අශුචියෙන් අශුචිය නසනු ලැබේවා. (කුරුවැණියක් ඇතකු දැකැ සටනට කැඳවූ අවස්ථාවෙහි ඇතුවර්චස් පිණ්ඩයක් හෙළා කුරුවැණියා මැරූ සැටි දක්වේ.)

7. ගූථපාණක ජාතක යි.

311. තයො ගිරිං අන්තරං කාමයාමි
පඤ්චාලා කුරුයො කෙකකෙ ච,
තතුත්තරිං[1] බ්‍රාහ්මණ කාමයාමි
තිකිච්ඡ මං බ්‍රාහ්මණ කාමනීතං.

312. කණ්හාහි දට්ඨස්ස කරොන්ති හෙකෙ
අමනුස්සවද්ධස්ස කරොන්ති පණ්ඩිතා,
න කාමනීතස්ස කරොති කොචි
ඔක්කන්තසුක්කස්ස හි කා තිකිච්ඡා'ති.

8. කාමනීතජාතකං.

313. ගජග්ගමෙඝෙහි හයග්ගමාලිහි
රථූමිජාතෙහි සරාභිවස්සිහි,
ථරුග්ගහාවට්ටදළ්හප්පහාරිහි
පරිවාරිතා තක්කසිලා සමන්තතො.

314. අභිධාවථා ච පතථා ච
විවිධවිනාදිතා ච දන්තිභි,
වත්තතජ්ජ තුමුලො ඝොසො
යථා විජ්ජුතා ජලධරස්ස ගජ්ජතොති.

9. පලාසිජාතකං[2].

315. ධජමපරිමිතං අනන්තපාරං
දුප්පසහං ධඞ්කෙහි සාගරම්මිව[3],
ගිරිමිව අනිලෙන දුප්පසහො
දුප්පසහො අහමජ්ජ තාදිසෙන

316. මා බාලියං විප්පලපි න හිස්ස තාදිසං
විළය්හසෙ න හි ලභසෙ නිසෙධකං,
ආසජ්ජසි ගජමිව එකචාරිනං
යො තං පාද නළමිව පොථයිස්සතී'ති,

10. දුතියපලාසිජාතකං[4].

කාසාවවග්ගො අට්ඨමො.

තස්සුද්දානං:

වරවත්ථවචොදුමකිණ්ණඵලං
චතුරො ධම්මවරං පුරිසුත්තම,
ධඞ්කමගධා ච තයො ගිරිනාම
ගජග්ගවරොධජවරෙන දස.

---

1. තදුත්තරිං – මජසං.
2. පලායිතජාතකං – මජසං පලායිජාතකං නා සයා.
3. සාගරංව – මජසං *. "අට්ඨකථායම්පන තෙනෙව සො නත්ථි සුතෙන බාදතීතිපි පාඨො"
4. දුතියපලායිත – මජසං සයා, දුතියපලායී නා.

311. බ්‍රාහ්මණය, උත්තරපඤ්චාලය ද කුරුරට ද කෙකක නම් රට ද යන මේ තුන් රාජ්‍යයන්ගේ අන්තරය ද ප්‍රාර්ථනා කෙරෙමි. (මා අනුභව කෙරෙමින් සිටි) බරණැස් රජයට වඩා වැඩියක් ප්‍රාර්ථනා කෙරෙමි. බමුණ, කාමයෙන් විනාශයට පමුණුවන ලද මා (මට) පිළියම් කරව.

312. කෘෂ්ණ සර්පයන් විසින් දෂ්ට කරන ලද්දහුට සමහර කෙනෙක් පිළියම් කෙරෙති. පඬිවරු අමනුෂ්‍යයන් විසින් මඩනා ලද්දහුට පිළියම් කෙරෙති. කාමයෙන් හානියට පමුණුවන ලද්දහුට කිසිවෙක් පිළියම් නො කෙරෙති. (ඒ එසේ මැයි) කුශලධර්ම දුරු කොට අකුශලධර්මයෙහි පිහිටියාහට පිළියම් කවරේ ද?

8. කාමනීත ජාතක යි.

313. උත්තම හස්ති නැමැති මෙසයෙන් ද අග්‍ර වූ තුරඞ්ග මාලාවන්ගෙන් ද සර (ඊතල) නමැති වර්ෂාවන් ඇති රථ තරඞ්ග මාලාවන්ගෙන් ද කඩුමිටි ඇත්තා වූ වේගයෙන් පරිභ්‍රමණය කොට දැඩි පහර දෙන යොධයන්ගෙන් ද හාත්පසින් තක්සලා නම් නගරය වටකරන ලද්දේ ය.

314. නානාප්‍රකාරයෙන් මහානාද කරන්නා වූ තෙපි හස්තීන් හා සමග දුවවු පනිවු. අද මහත් වූ ඝොෂාවෙක් පවතීවා. ගර්ජනා කරන්නා වූ මෙසයාගේ මුඛයෙන් නික්මෙන විදුලියක් මෙන් දුවන්නාහු නුවර වහා වට කරව.

9. පලාසි ජාතක යි.

315. රථයෙහි මයුරපාදයෙහි නගන ලද ධවජ අපමණය. මාගේ සේනාව කෙළවර නැත්තේ ය. සමුද්‍රොල්ලඞ්ඝනයෙහි අසමත් කාකයා මෙන් සතුරන් විසින් මැඩපිය නො හැක්කේ ය. පර්වතචලනයෙහි අසමත් වාතය මෙන් මාගේ සේනාව තා විසිනුත් විනාශ කොට නො හැක්කේ ය. මම අද තා සේ වූවන් විසින් මැඩපිය නො හැක්කෙම් වෙමි.

316. (තාගේ) බාලභාවය ප්‍රකාශ නො කරව. තා සේ වූ පුරුෂයෝ රාජ්‍යය ගැන්මෙහි සමර්ථයෝ නො වෙත්. හුදෙක් ක්ලෙශ දහයෙන් දවනු ලැබෙහි මා වළකන්නට නුසුදුස්සෙහි ය. හුදෙකලා ව හැසිරෙන ඇත් රජක්හු සමීපයට මෙන් එන්නෙහි ය. පාදයෙන් සුණු කළ හුණනළක් මෙන් හෙතෙම් තා මැඩසුණු කෙරේ.

10. දුතිය පලාසි ජාතක යි.

අටවැනි කාසාව වර්ග යි.

එහි උද්දනය:

උතුම් වස්ත්‍ර ඇති කාසාව ජාතක යැ, ආචාර්‍ය්‍යවචනය දක්වන චූළනන්දිය ජාතක යැ, ක්ෂීණඵලවෘක්ෂය දක්වන පුටභත්ත ජාතකයැ. (චතුරොධම්ම) කුම්භිල ජාතක යැ, උතුම් පුරුෂයා දක්වන ඛන්තිවණ්ණන ජාතක යැ, (වඩ්ඪ) කොසිය ජාතකය හා (මගධ) ගූථපාණ ජාතක යැ, (තයොගිරි) කාමනීත ජාතක යැ, පාලාසි ජාතකය හා දුතියපාලාසි ජාතකයෙන් දසය වේ.

9. උපාහනවග්ගො

317. යථාපි කීතා පුරිසස්සුපාහනා
සුඛස්ස අත්ථාය දුඛං උදබ්බහෙ,
ඝම්මාභිතත්තා තලසා පපීළිතා
තස්සෙව පාදෙ පුරිසස්ස ඛාදරෙ.

318. එවමෙව දුක්කුලීනො අනරියො
තම්හාක විජ්ජඤ්ච සුතඤ්චමාදිය,
තමෙව සො තත්ථ සුතෙන ඛාදති
අනරියො වුච්චති පානදූපමොති[1].

1. උපාහනජාතකං.

319. එකචින්තිතොව අයමත්ථො බාලො අපරිනායකො,
න හි ඛුජ්ජෙන වාමෙන භොති සඞ්ගන්තුමරහසි.

320. පුරිසූසභං මඤ්ඤමානා අහං ඛුජ්ජමකාමයිං
සොයං සඞ්කුචිතො සෙති ඡින්නතන්ති යථා ථූණාති.

2. වීණාථූණජාතකං.

321. කාමං යහිං ඉච්ඡසි තෙන ගච්ඡ
විද්ධොසි මම්මම්හි විකණ්ණකෙන,
හතොසි හත්තෙන සවාදිතෙන
ලොලො ච මච්ඡෙ අනුබන්ධමානො.

322. එවම්පි ලොකාමිසං ඔපතන්තො,
විහඤ්ඤති චිත්තවසානුවත්ති,
සො හඤ්ඤති ඤාතිසඛානමජ්ඣෙ
මච්ඡානුගො සොරිව සුංසුමාරොති.

3. විකණ්ණකජාතකං.

---

3. දූපාහනූපමො – මජසං.

9. උපාහන වර්ගය

317. පුරුෂයාහට සුව පිණිස යම්සේ මිලදී ගන්නා ලද (තපුරු කොට, කළ) උපාහනයෝ (පාවහන්) දුක් එළවත් ද, ග්‍රීෂ්මයෙන් විශෙෂයෙන් තැවුණා වූ පාදයෙන් පීඩිත වූවාහු ඒ පුරුෂයාගේ ම පාදයන් කා වණකරන්නාහ.

318. එපරිද්දෙන් යම් මැ හීන කුලයෙක උපන්නා වූ අනාර්ය පුද්ගලයා ආචාර්යවරයාගෙන් විද්‍යාව හා ශ්‍රුතය ද ගෙන එහි ශ්‍රුතයෙන් හෙතෙමේ එය ම කරන්නේ ය. අනාර්ය පුරුෂයා උපාහනයක් බඳුයි කියනු ලැබේ.

1. උපාහන ජාතක යි.

319. (මේ කුදු පුරුෂයා සමඟ පලාගිය මැනැවැයි යන) මේ කාරණය හුදෙකලාව සිතන ලද ද (මේ කුද ඥනවිරහයෙන්) බාලය. (ස්වශක්තියෙන් යන්නට අපොහොසත් හෙයින්) අපරිණායකය. පින්වතිය, ඝොර වූ අත්පා ඇති කුද හා සමාගමයට සුදුසු නො වෙහි.

320. කුද පුරුෂයන්හට උතුමෙකැයි සිතන්නා වූ මම කුදු පුරුෂයා කැමති වීමි. ඒ මා කැමති කුද සිඳින ලද තත් ඇති වීණාදණ්ඩක් මෙන් හැකුළුණේ හොවී.

2. වීණාථූන ජාතක යි.

321. ඒකාන්තයෙන් (තෝ) යම් තැනෙක්හි කැමැත්තෙහි නම් එහි යව. මර්මස්ථානයෙහි හීයෙන් විදුනා ලද්දෙහි ය. මත්ස්‍යයන් අනුව දුවන්නා වූ ලොල් වූ තෝ බෙරවැයුම් සහිත වූ බත කරණ කොටගෙනැ නටුයෙහිය.

322. ලෝකාමිසයැයි කියන ලද පඤ්චකාමයට අනුව දුවන්නා වූ චිත්තවසී වැ පවත්නාවූ පුද්ගලයා එපරිද්දෙන් ම වැනැසේ. හේ මත්ස්‍යයන් අනුව දුවන්නා වූ සු-සුමාරයා මෙන් නෑ මිතුරන් මධ්‍යයෙහි වැනසේ.

3. විකණ්ණක ජාතක යි.

323. ත්වමෙව දනි මකර යං කාමො ව්‍යගමා තයි,
සොයං අප්පටිසන්ධිකො ඛරාජින්නංව [1]රෙරුකං.

324. අතිච්ඡා අතිලොභෙන අතිලොභමදෙන ච,
එවං හායති අත්ථම්හා අහංව අසිතාභූයා'ති.

4. අසිතාභූජාතකං.

325. සුඛා ඝරා වච්ඡනඛ සහිරඤ්ඤා සභොජනා,
යත්ථ භුත්වා ච පිත්වා ච[2] සයෙය්‍යාථ[3] අනුස්සුකො.

326. ඝරා නානීහමානස්ස ඝරා නාභණතො මුසා,
ඝරා නාදින්නදණ්ඩස්ස පරෙසං අනිකුබ්බතො
එවං ඡිද්දං දුරභිභවං කො ඝරං පටිපජ්ජතී'ති.

5. වච්ඡනඛජාතකං.

327. භද්දකො වත යං පක්ඛී දිජො කුමුදසන්නිභො
වූපසන්තෙහි පක්ඛෙහි මන්දමන්දෙව ඣායති.

328. නාස්ස සීලං විජානාථ අනඤ්ඤාය පසංසථ,
අම්හෙ දිජො න පාලෙති තෙන පක්ඛී[4] න ඵන්දතී'ති.

6. බකජාතකං.

329. කො නු ඛො භගවා හෙතු එකච්චෙ ඉධ පුග්ගලෙ,
අතීව හදයං නිබ්බාති චිත්තඤ්චාපි පසීදති.

330. පුබ්බෙව සන්නිවාසෙන පච්චුප්පන්නහිතෙන වා,
එවං තං ජායතෙ පෙමං උප්පලංව යථොදකෙ'ති.

7. සාකෙතජාතකං.

1. රෙනුකං – මජසං, ස්‍යා.
2. භුත්වාපිවිත්වා ච – මජසං, ස්‍යා.
3. සයෙය්‍යාසි – ස්‍යා.
4. පක්ඛෙ සී.

323. තා කෙරෙහි යම්බඳු වූ (මාගේ) කාමයෙක් (ධ්‍යාන බලයෙන්) පහවී ද ගුණවිශෙෂය දුන් (මා නො කැමැති වැ කිනනරාව පස්සේ දිවූ) තෝ ම කෙළෙහි ය. කියතෙකින් සිඳින ලද ඇත්දළක් මෙන් (ධ්‍යානයෙන් ඔබන ලද) ඒ මේ ක්ලෙශකාමය ප්‍රතිසන්ධාන නො කොට හැකි වී.

324. ඒ ඒ වස්තුවෙහි ලොභ කරන තැනැත්තේ අධික ලොභයෙන් ද අතිලොභ සඞ්ඛ්‍යාත පුරුෂමදයෙන් ද අසිතාභූ නම් රාජකන්‍යාව කෙරෙන් පිරිහුණු මා මෙන් අභිලාෂිතාර්ථයෙන් පිරිහේ.

4. අසිතාභූ ජාතක යි.

325. වච්ඡනඛය, මධුරාහාර අනුභව කොට ද මධුර පානයන් පානය කොට ද යම් සිරියහනෙක්හි උකටලී නො ව හෝනෙහි ය. එසේ හෙයින් හිරණ්‍ය සහිත වූ ද භොජන සහිත වූ ද ගෘහයෝ සුවයයි ගෘහ වර්ණා කළෝ.

326. උත්සාහවත් නො වන්නාහට ගෘහයෝ නැත. බොරු කියන්නාහට ගෘහයෝ නැත. නො ගන්නා ලද දඬු ඇති මෙරමාහට දඬුවම් නො කරන්නාහට ගෘහයෝ නැත. මෙකී පරිද්දෙන් ඡිද්‍ර ඇති දුරාරාධ්‍ය වූ ගිහිගෙට කවරෙක් නම් පැමිණේ ද? (නො පැමිණෙන්නේ මැයි)

5. වච්ඡනඛ ජාතක යි.

327. හෙළැඹුල පෙති බඳු පියාපත් ඇති මේ පක්ෂියා ඉතා යහපත් ය. සන්හුන් පියාපත් ඇතිව (මසුන් දෙස බලමින්) මඳින් මඳ ඉතා දුබල එකකුමෙන් සිතයි.

328. මොහුගේ ආචාරසීලයක් නො ම දනුව නො දත ප්‍රශංසා කරව. පක්ෂියා අප නො රකී (මසුන්ගෙන් කවරකු අල්ලා ගනිම්දැ යි සිතන හෙයින්) පියා පත් නො සොලවයි.

6. බක ජාතක යි.

329. භාග්‍යවත්නි, මෙලොවැ ඇතැම් පුහුලකු දුටුමතින් හදවත ඉතා නිවී යයි. සිත ද පැහැදේ. මීට හේතු කවරේ ද?

330. පෙර. භවයෙහි එක් වැ විසීමෙන් වේවයි මේ භවයෙහි කළ හිතයෙන් වේවයි, මෙසේ ඒ ප්‍රෙමය හටගනී. (මඩත් දියත් නිසා) දියේ උපුල් හටගන්නා මෙනි.

7. සාකෙත ජාතක යි.

331. ඉඞ්ඝ එකපදං තාත අනෙකත්ථපදනිස්සිතං,
කිඤ්චි සඞ්ගාහිකං බ්‍රූහි යෙනත්ථෙ සාවයාමසෙ.

332. දක්ඛෙය්‍යෙකපදං තාත අනෙකත්ථ පදස්සිතං[1],
තඤ්ච සීලෙන සංයුත්තං ඛන්තියා උපපාදිතං.
අලං මිත්තෙ සුඛාපෙතුං අමිත්තානං දුඛාය චාති.

8. එකපදජාතකං.

333. ආසීවිසං මමං සන්තං පවිට්ඨං කුම්භමුඛං,
රුච්චතෙ හරිතා මාතා යං මං ඛාදන්ති මච්ඡකා.

334. විලුම්පතෙව පුරිසො යාවස්ස උපකප්පති,
යදා චඤ්ඤෙ විලුම්පන්ති සො විලුත්තො විලුප්පතී'ති[2].

9. හරිතමාතුජාතකං.

335. සබ්බො ජනො හිංසිතො පිඞ්ගලෙන
තස්මිං මතෙ පච්චයං[3] වෙදයන්ති,
පියො නු තෙ ආසි අකණ්හනෙත්තො
[4]කස්මා නු ත්වං රොදසි ද්වාරපාල.

336. න මෙ පියො ආසි අකණ්හනෙත්තො
භායාමි පච්චාගමනාය තස්ස
ඉතො ගතො හිංසෙය්‍ය මච්චුරාජං
සො හිංසිතො ආනෙය්‍ය පුන ඉධ.

337. දඩ්ඪො වාහසහස්සෙහි සිත්තො ඝටසතෙහි සො,
පරික්ඛතා ච සා භූමි මා භායි නාගමිස්සතී'ති.

10. මහාපිඞ්ගලජාතකං.

උපාහනවග්ගො නවමො.

තස්සුද්දානං:

වරුපාහනබුජ්ජවිකණ්ණකකො
අසිතාභූයා පක්ඛිම වච්ඡනඛො,
දිප්පෙමවරුත්තම එකපදං
කුම්භමුඛපිඞ්ගලකෙන දසාති.

1. පදනිස්සිතං – සීමු.
2. "විලුම්පතෙතිපි පාඨො. අයමෙවත්ථො. විලුම්පන්තිපි පඨන්ති තස්සත්ථො න සමෙති" අට්ඨකථා.
3. පච්චයා–සී.
4. අට්ඨකථායං පන, කස්මා තුවන්ති පාඨො.

331. පියාණෙනි, අයදිම් යම් පදයකින් දියුණුව අස්වන්නමෝ ද එබඳු අරුතැති පද සංග්‍රහ වූ එක පදයක් කිව මැනැව.

332. දරුව (ඒ) ලාභොත්පාදක ඥාන සම්ප්‍රයුක්ත වීර්‍ය්‍ය සඞ්ඛ්‍යාත අනෙකාර්ථනිඃශ්‍රිත පදය යි එද සීලයෙන් සංයුක්ත වූයේ ක්‍ෂාන්තියෙන් සමුපෙත වූයේ මිතුරන් සැපවත් කරන්නටත් සතුරන් දුක් පත් කරන්නටත් සමර්ථ වේ.

8. එකපද ජාතක යි.

333. විෂදළ ඇති මා කෙමිනමුවට (කෙමිනෙහි කටට) පිවිසි කලැ යම්බඳු මා මාලුවෝ කත් ද, නිල්මැඩිදෙන මව කොට ඇතිය, තොපට එය රුස්නේ ද?

334. යම්තාක් ඔහුට ඓශ්වර්‍ය්‍ය සමෘද්ධිය ඇත් ද ඒ තාක් පුරුෂයා (මෙරමා) පහරනේ මැයැ. යම් කලෙකැ සෙස්සෝ ඓශ්වර්‍ය්‍යයෙහි සිට පහරිත් ද (එකලැ) පහරන ලද හේ පහරනා ලැබේ.

9. හරිතමාතු ජාතක යි.

335. පිංගල රජු විසින් සියලුදෙනා හිංසා කරනු ලැබීය. ඔහු මළ කලැ (ජනයා) ප්‍රීත වෙත්. දෙරටුපාලය, පිඟුවන් ඇස් ඇත්තා තට ප්‍රිය වී ද? කවරහෙයින් තෝ හඬන්නෙහි ද?

336. පිඟුවන් ඇස් ඇති රජ මට ප්‍රිය නො වේ. ආපසු ඔහුගේ පෙරළා පැමිණීමට බිය වෙමි. මෙලොවින් ගියේ මෘත්‍යුරාජයාට (යමරජුට) හිංසා කරන්නේ යැ පිඩිත වූ ඒ මෘත්‍යුරාජ යළි මෙහි ගෙනෙන්නේය.

337. හේ දර ගැල් දහසකින් දවන ලද්දේය. දිය කළ සියයකින් තෙමන ලද ඒ බිම ද සාරා දමන ලද, නො බව හේ පෙරළා නො එන්නේ යි.

10. මහාපිංගල ජාතක යි.

නවවැනි උපාහන වර්ගය යි.

එහි උද්දානය:

උපාහන ජාතක යැ, කුද උතුමැයි සිතූ වීණාථූන ජාතක යැ, විකණ්ණක ජාතක යැ, අසිතාභූ ජාතක යැ, පස්වැනි වච්ජනඛ ජාතක යැ, (දිප්) බක ජාතක යැ, උතහම ප්‍රෙමය පවසන සාකෙත ජාතක යැ, එකපද ජාතක යැ, (කුම්නාමුඛ) හරිතමාතු ජාතකය හා මහාපිඞ්ගල ජාතකයෙන් දසය වේ.

10. සිඟාලවග්ගො

338. සිඟාලො මානත්ථද්ධොව පරිවාරෙන අත්ථිකො,
පාපුණි මහතිං භූමිං රාජාසි සබ්බදාඨීනං.

339. එවමෙවං මනුස්සෙසු යො හොති පරිවාරවා[1],
සො හි තත්ථ මහා හොති සිඟාලො විය දාඨින’න්ති.

1. සබ්බදාඨි[2]ජාතකං.

340. බාලො වතායං සුනඛො යො වරත්තං න ඛාදති,
බන්ධනා ච පමුඤ්චෙය්‍ය[3] අසිතො ච ඝරං වජෙ.

341. අට්ඨිතං මෙ මනස්මිං මෙ අථො මෙ හදයෙ කතං,
කාලඤ්ච පතිකඞ්ඛාමි යාව පස්සුපතූ ජනොති.

2. සුනඛජාතකං.

342. සත්තතන්තිං සුමධුරං රාමණෙය්‍යං අවාචයිං,
සො මං රඞ්ගම්හි අව්හෙති සරණං මෙ හොහි කොසිය.

343. අහං තං සරණං සම්ම අහමාචරිය පූජකො,
න තං ජයිස්සති සිස්සො සිස්සමාචරිය ජෙස්සසී’ති.

3. ගුත්තිලජාතකං.

344. යං පස්සති න තං ඉච්ඡති
යඤ්ච න පස්සති තං කිර ඉච්ඡති,
මඤ්ඤාමි චිරං චරිස්සති
න හි තං ලච්ඡති යං සො ඉච්ඡති.

---

1. පරිවාරිතො-සී.
2. සබ්බදාඨී - ස්‍යා.
3. “පමුඤ්චෙය්‍යා’ති පමොචෙය්‍ය, අයමෙව වා පාඨො.

10. සිගාල වර්ගය

338. පිරිවර නිසා මානයෙන් තද වූ සිවලා තව තවත් පිරිවර කැමති වූයේ, මහත් සම්පත්තියට පැමිණියේ ය. දළැති සියලු සතුනට රජ විය.

339. එපරිදි මැ මනුෂ්‍යයන් අතුරෙහි පිරිවර ඇත්තේ වේ ද, හේ දළ ඇතියන්ට රජ වූ හිවලා සේ ගරු කළයුතු වේ. (සිවල්හු සෙයින් පිරිවර නිසා වැනසේ යී සේයි)

1. සබ්බදාඨ ජාතක යි.

340. යමෙක් වරපට නො කා නම් ඒ මේ සුනඛ තෙම එකත්නෙන් මුදා වූයේ වෙයි. බන්ධනයෙන් මිදුණේ සුහිතව ගෙට යන්නේ යැ.

341. තොප කියන දෑය මාගේ සිත්හි පිහිටියේ යැ. යළි ඒ තොප විසින් මාගේ හෘදයෙහි කරන ලද පලා යන්නට නිසි කල් බලමි. යම්තාත් මේ ජනතෙමේ නිද්‍රොපගත වේවා.

2. සුනඛ ජාතක යි.

342. තත් සතක් ඇති ඉමිහිරි රමණීය වූ වීණා ගායනය ඉගැන්විමි. ඒ (ශිෂ්‍යයා) මා රඟමඩලට (වාද පිණිස) කැඳවයි. ශක්‍රය මට පිහිට වන්න.

343. මිතුර, මම තොපට පිහිට වෙමි. මම ගුරුන් පුදන්නෙක්මි. ඒ ශිෂ්‍යයා නො දිනන්නේ ය. ඇදුරු තෙම (සිසුහු) දිනන්නේය.

3. ගුත්තිල ජාතක යි.

344. යමක් දකී ද එය නො කැමැති ය. යමක් නො දකී ද එය කැමැති ය. (ජලයෙන් විනිර්මුක්ත වූ ගඞ්ගාවක් සොයමින් බොහෝ කල් ඇවිදින්නේය යි සිතමි. යමක් හේ කැමැති ද එය නො ලබන්නේ ය.

345. යං ලභති න තෙන තුස්සති
යං පත්ථෙති ලද්ධං හීළෙති,
ඉච්ඡා හි අනන්තගොචරා
වීතිච්ඡානං[1] නමො කරොමසෙති.

4. වීතිච්ඡජාතකං.

346. කාලො ඝසති භූතානි සබ්බානෙව සහත්තනා,
යො ච කාලඝසො භූතො ස භූතපචනිං පචි.

347. බහූනි නරසීසානි ලොමසානි බ්‍රහානි ච,
ගීවාසු පටිමුක්කානි කොචිදෙවෙත්ථ කණ්ණවාති.

5. මූලපරියායජාතකං.

348. හන්ත්වා ඣත්වා වධිත්වා ච දෙති දානං අසඤ්ඤතො,
එදිසං භත්තං භුඤ්ජමානො ස පාපෙන උපලිප්පති.

349. පුත්තදාරම්පි චෙ හන්ත්වා දෙති දානං අසඤ්ඤතො,
භුඤ්ජමානොපි සප්පඤ්ඤො න පාපෙන උපලිප්පතී'ති.

6. තෙලොවාදජාතකං[2].

350. අද්ධා පාදඤ්ජලී සබ්බෙ පඤ්ඤාය අතිරොචති,
තථා හි ඔට්ඨං භඤ්ජති උත්තරිං නූන පස්සති.

351. නායං ධම්මං අධම්මං වා අත්ථානත්ථංව බුජ්ඣති,
අඤ්ඤත්‍ර ඔට්ඨනිබ්භොගා නායං ජානාති කිඤ්චනන්ති.

7. පාදඤ්ජලිජාතකං.

352. සබ්බෙහි කිංසුකො දිට්ඨො කින්නෙත්ථ[4] විචිකිච්ඡථ,
න හි සබ්බෙසු ඨානෙසු සාරථී පරිපුච්ඡිතො.

---

1. විගතිච්ඡානං – සයා.
2. බාලොවාද – මජසං සයා.
3. කිනෙත්ථ – නා.

345. යමක් ලබා ද ඉන් තුටු නොවේ, යමක් පතා ද ලද දෙය පිළිකුල් කරයි. ආසාව අනන්ත අරමුණු ඇත්තේ ය. පහ කළ ආසා ඇත්තවුන්ට නමස්කාර කරමු.

4. වීතිච්ඡ ජාතක යි.

346. කාලය තමා හා සමග හැම සතුන් මැ කයි. කාලය කෑ යම් සත්ත්වයෙක් ඇද්ද, ඒ සත්ත්වයා භූතපචනි සඞ්ඛ්‍යාත තෘෂ්ණාව දැවී.

347. බොහෝ ලෝම ඇති මහත් වූ ගෙල හා බැඳි නර ශීර්ෂයෝ බොහෝ වෙති. මොවුනතුරෙහි කිසිවෙක් මැ කන් (ප්‍රඥාවිත් නැණවත්හු) ඇත්තේ යි.

5. මූලපරියාය ජාතක යි.

348. දුශ්ශීලයා පහර දී, ක්ලාන්තකරවා මරා දන් දේ ද, එබඳු දන් වළඳන ඒ පුද්ගලයා ද පාපයෙන් තැවැරේ.

349. ඉදින් දුශ්ශීල තෙම අඹුදරුවනුදු මරා දන් දේ ද, එය වළඳන ප්‍රඥාවන්තයා පාපයෙන් නො තැවැරේ.

6. තෙලොවාද ජාතක යි.

350. පාදඤ්ජලි කුමාරයා ඒකාන්තයෙන් ම අප හැමට වඩා ප්‍රඥාවෙන් ඉතා බබළයි. එය එසේ මැ යැ. තොල් බිඳියි, මතුයෙහි අන් කරුණක් ඒකාන්තයෙන් බලයි.

351. මේතෙම (පාදඤ්ජලී කුමාරයා) දහම ද නො දහම ද දියුණුව ද පිරිහීම ද නො දනී. තොල් බිඳුම විනා අන් කිසිවක් නො දනී.

7. පාදඤ්ජලී ජාතක යි.

352. හැමදෙනා විසින් කැලගස දක්නා ලද. මේ කරුණෙහි කුමට සැක කරවු ද? සියලු තන්හි (කැලගස පෙන්නූ අවස්ථාවන්හි) රියැදුරා නො විචාරන ලදී.

353. එවං සබ්බෙහි ඤාණෙහි යෙසං ධම්මා අජානිතා,
තෙ වෙ ධම්මෙසු කම්පන්ති කිංසුකස්මිංව භාතරො'ති.

8. කිංසුකොපමජාතකං.

354. එකපුත්තකො භවිස්සසි
ත්වං ච නො හෙස්සසි ඉස්සරො කුලෙ,
ඔරොහ දුමස්මා සාලක
එහි දානි ඝරකං වජෙමසෙ.

355. නනු මං හදයෙති මඤ්ඤසි
යඤ්ච මං හනසි වෙළුයට්ඨියා,
පක්කම්බවනෙ රමාමසෙ
ගච්ඡ ත්වං ඝරකං යථාසුඛන්ති.

9. සාලකජාතකං.

356. අයං ඉසී උපසමසංයමෙ රතො
සන්තිට්ඨති සිසිරභයෙන අට්ටිතො,
හන්ද අයං පවිසතුමං අගාරකං
විනෙතු සීතං දරථඤ්ච කෙවලං.

357. නායං ඉසී උපසමසංයමෙ රතො,
කපී අයං දුමවරසාඛගොචරො,
සො දූසකො රොසකො චාපි ජම්මො
සචෙ වජෙ ඉමම්පි දූසයෙ ඝරන්ති.

10. කපිජාතකං.

සිගාලවග්ගො දසමො.

තස්සුද්දානං:

අථ රාජසිගාලවරො සුනඛො
තථා කොසිය ඉච්ඡති කාලඝසො,
අථ දූනවරොට්ඨපි සාරථිනා
පුනපච්චනඤ්ච සිසිරකපි දස.

දුකනිපාතො නිට්ඨිතො.

වග්ගුද්දානං:

දළ්හඤ්ච[1] වග්ගං අපරෙන සන්ථවං
කල්‍යාණවග්ගං සදිසො ච රුහකං,
නතංදළ්හං[2] බීරනථම්භකං පුන
කාසාවුපාහනසිගාලකෙන දසා'ති.

1. දළ්හුඤ්ච–නා.
2. හනතං–නා.

353. එපරිදි සියලු විදර්ශනා ඥානයෙන් යම් කෙනකුන් විසින් ස්පර්ශායතනාදි ධර්මයෝ නො දන්නා ලද ද ඔවුහු එකාන්තයෙන් කැලගස පිළිබඳ සැකකළ සොහොයුරන් සේ ධර්මයන්හි සැක කරත්.

8. කිංසුකොපම ජාතක යි.

354. සාලකය, තෝ එක ම පුතා වූයෙහි ය, අපගේ ගෙහි අධිපති වන්නෙහි ය. රුකින් බසිහි, එව දූන් ගෙට යම්හ.

355. මා තොපගේ මිතුරෙකැ යි සිතහි ද? යම් හෙයකින් උණ යටියෙන් මා පහළෙහි ද, එ හෙයින් තොප හා නො එමි. විළිකුන් අඹ උයන්හි රමණය කරම්හ. තෙපි සුවසේ ගෙට යව.

9. සාලක ජාතක යි.

356. රාගාදි කෙලෙසුන් සන්සිඳීමෙහි ඇලුණු මේ තවුස් සීතල නිසා හටගත් බියෙන් පෙළුණේ (ගෙදෙර) සිටී. අනේ මේ තවුස් මේ ගෙට පිවිසේවා! සියලු සීත පීඩා දුරු කෙරේවා!

357. මේ කෙලෙස් සන්සිඳීමේ ඇලුණු තවුසෙක් නො වෙයි. මේ වෘක්ෂශාඛා ගොචර කොට ඇති වඳුරෙකි. හෙතෙම ගිය ගිය තැන මල මූ කිරීම් ආදියෙන් දූෂණය කරන්නෙකි, කිපෙන්-නෙකි, ලාමකයෙකි. ඉදින් පිවිසියේ වී නම් මේ ගෙය ද දූෂණය කරන්නේ යි.

10. කපි ජාතක යි.

දසවැනි සිගාල වර්ගයි.

එහි උද්දානය

සිවලා රජ වූ සබ්බදාඨ ජාතක යැ, සුනඛ ජාතක යැ, එසේ මැ (කොසිය) ගුත්තිල ජාතක යැ, (ඉච්ඡති) වීතිච්ඡ ජාතක යැ, (කාලසසො) මූලපරියාය ජාතක යැ, තෙලොවාද ජාතක යැ, (ඔට්ඨ) පාදඤ්ජලි ජාතක යැ, (සාරපීනා) කිංසුකොපම ජාතකයෙන් හා සාලක ජාතක යැ, කපි ජාතකය යන මෙයින් දසය වේ.

දුක නිපාතය නිමියේ යි.

වර්ග උද්දානය:

දළ්හ වර්ගය ද, අනාය වූ සන්ථත වර්ගය ද, කල්‍යාණ ධම්වර්ගය ද, අසදිස වර්ගය ද, රුහක වර්ගය ද, නතංදළ්හ වර්ගය ද, යළි බීරණ-ත්ථම්භක වර්ග ය ද, කාසාව වර්ගය ද, උපාහන වර්ගය ද, සිගාල වර්ගය ද යන මෙයින් වර්ග දසය වේ.

තිකනිපාතො

1. සඞ්කප්පවග්ගො

358. සඞ්කප්පරාගධොතෙන විතක්කනිසිතෙන ච,
නාලඞ්කතෙන භද්‍රෙන න උසුකාරකතෙන ච.

359. න කණ්ණායතමුත්තෙන නපි මොරූපසෙවිනා,
තෙනම්හි හදයෙ විද්ධො සබ්බඞ්ගපරිදූහිනා.

360. ආවෙධඤ්ච න පස්සාමි යතො රුහිරමස්සවෙ,
යාව අයොනිසො චිත්තං සයං මෙ දුක්ඛමාහත'න්ති.

1. සඞ්කප්පජාතකං.

361. අජ්ජාපි මෙ තං මනසි[1] යං මං ත්වං තිලමුට්ඨියා,
බාහාය මං ගහෙත්වාන ලට්ඨියා අනුතාළයි.

362. නනු ජීවිතෙ න රමසි යෙනාසි බ්‍රාහ්මණාගතො,
යං මං බාහං ගහෙත්වාන තික්ඛත්තුං අනුතාළයී.

363. අරියො අනරියං කුබ්බානං යො දණ්ඩෙන නිසෙධති,
සාසනත්තං[2] න තං වෙරං ඉති නං පණ්ඩිතා විදූති.

2. තිලමුට්ඨිජාතකං.

364. මමන්නපානං විපුලං උළාරං
උප්පජ්ජතීමස්ස මණිස්ස හෙතු,
තං තෙ න දස්සං අතියාචකොසි
න චාපි තෙ අස්සමං ආගමිස්සං.

365. සුසූ යථා සක්ඛරධොතපාණී
තාසෙසි මං සෙලං යාචමානො,
තං තෙ න දස්සං අතියාචකොසි
න චාපි තෙ අස්සමං ආගමිස්සං.

---

1. සරසි – මජසං
2. සාසනං තං–මජසං, සයා.

ත්‍රිකනිපාතය

1. සඞ්කප්ප වර්ගය

358. කාමවිතර්ක සම්ප්‍රයුක්ත රාගජලයෙන් දෝනා ලද විතර්ක ශිලාංයෙහි මුවත් තැබූ, නො සැරසූ හී වඩුවකු විසිනුදු නො කළ –

359. දකුණු කන්සිළුව දක්වා ඇද නො හැරියාවූ ද මොනරපත් ආදියෙන් නො සාදන ලද සියලඟ දවන්නා වූ ඒ කෙලෙස් ර්යෙන් (මගේ) හදවත විදින ලද්දේ –

360. විදිනා ලද තැනකුදු ලේ වැගිරෙන තැනකුදු නො දක්මි. ඉතා අනුවණ ලෙසින් සිත වැඩී ද එහෙයින් මා විසින් මේ දුක පමුණුවා ගන්නා ලදී.

1. සංකප්ප ජාතක යි.

361. තලම්ටක් නිසා මා අත්කරගන්වා තෙපි මා උණ ලියෙන් තැලූහු ද, අද දක්වා ඒ පහර මා සිත්හි ඇත.

362. බමුණ, යම්බඳු මගේ අතකරගන්වා තෙවරක් තැලූහු ද, (මෙහි) පැමිණි හෙයින් ජීවිතයෙහි නො ඇලෙතී සිතමි.

363. යම් ආර්යයෙක් නො කටයුතු කරන්නහු දඬුවමින් වළකා ද එය හික්මවනු පිණිසය. වෛර පිණිස නො වේ යයි පඬිවරු දනිති.

2. තිලමුට්ඨි ජාතක යි.

364. මේ මාණික්‍ය රත්නය නිසා මට උදර වූ බොහෝ ආහාරපාන උපදී. තොපට එය නො දෙමි. පමණ ඉක්ම යාච්ඤා කරව, එසේ හෙයින් තොපගේ අසපුවට ද යළි නො එන්නෙමි.

365. තෙල් පහණ උලා මුවහත් කළ කඩුවක් ගත් තරුණයකු මෙන් තෙපි මැණික්ගල ඉල්ලනුයේ මා තැති ගැන්වූහ, අධිකව යාච්ඤා කරව, තොපට එය නො දෙමි. තොපගේ අසපුවට ද යළි නො එන්නෙමි.

366. න තං යාචෙ යස්ස පියං ජිගිංසෙ
දෙස්සො හොති අතියාචනාය,
නාගො මණිං යාචිතො බ්‍රාහ්මණෙන
අදස්සනංයෙව තදජ්ඣගමා’ති.

3. මණිකණ්ඨජාතකං.

367. භුත්වා තිණපරිඝාසං භුත්වා ආචාමකුණ්ඩකං,
එතං තෙ භොජනං ආසි කස්මා දානි න භුඤ්ජසි.

468. යත්ථ පොසං න ජානන්ති ජාතියා විනයෙන වා,
පහූ තත්ථ මහාබ්‍රහ්මෙ අපි ආචාමකුණ්ඩකං.

369. ත්වඤ්ච ඛො මං පජානාසි යාදිසායං හයුත්තමො,
ජානන්තො ජානමාගම්ම න තෙ භක්ඛාමි කුණ්ඩකන්ති.

4. කුණ්ඩකකුච්ඡිසින්ධවජාතකං,

370. යාව සො මත්තමඤ්ඤාසි භොජනස්මිං විහඞ්ගමො,
තාව අද්ධානමාපාදි මාතරඤ්ච අපොසයි.

371. යතො ච ඛො බහුතරං භොජනං අජ්ඣුපාහරි
තතො තත්ථෙව සංසීදි අමත්තඤ්ඤූ හි සො අහූ.

372. තස්මා මත්තඤ්ඤුතා සාධු භොජනස්මිං අගිද්ධතා[1].
අමත්තඤ්ඤූ හි සීදන්ති මත්තඤ්ඤූව න සීදරෙති.

5, සූකජාතකං.

373, ජරූදපානං ඛණමානා වාණිජා උදකත්ථිකා,
අජ්ඣගංසු ආයො ලොහං තිපුසීසඤ්ච වාණිජා:
රජතං ජාතරූපඤ්ච මුත්තා වෙළුරියා බහූ.

374. තෙ ච තෙන අසන්තුට්ඨා භිය්‍යො භිය්‍යො අඛාණිසුං,
තෙ තත්ථාසිවිසො ඝොරො තෙජස්සී[2] තෙජසා හනි.

1. “පාළියං පන අගිද්ධිමාති ලිඛිතං. තතො අයං අට්ඨකථාපාඨොව සුන්දරතරො”
2. තෙජසී – සීමු.

366. යමකුට යමක් ප්‍රිය යයි දන්නේ ද එය නො ඉල්ලන්නේ ය. අධික යාචනයෙන් ද්වේෂ්‍ය වෙයි. බමුණහු විසින් මැණික අයදනා ලද නාරජ එතැන් පටන් නො දක්මට මැ පැමිණියේ යි.

3. මණිකණ්ඨ ජාතක යි.

367. (අශ්ව වෘෂභාදීන්) කා ඉතිරි වූ තණ ද කැඳබත් ද කා වැඩුණ හෙයින් මෙය තට භොජනය විය. දැන් එය කුමක් හෙයින් නො කන්නේ ද?

368. බමුණුතුමනි, යම් තැනෙකැ බොහෝදෙනා උපතින් උසස් බව හා ආචාරශීලයෙන් යුතු බව නො දනිත් ද එහි දී කැඳවතුර ද කුඩු ද පරිභොග කරමි.

369. ඔබ වනාහි මා ශ්‍රෙෂ්ඨ අශ්වයෙකැයි හොඳින් දන්නෙහි ය. දන්නකු වන ඔබ වෙත පැමිණ දන්නෙක් වන මම ඔබේ කුඩු නො කමි.

4. කුණ්ඩකකුච්ඡි සින්ධව ජාතක යි.

370. ඒ කුරුල්ලා යම් තාක් ආහාරයෙහි පමණ මෙතරම්ය යි දැන සිටියේ ද, එතෙක් ජීවත් විය. මා පියන් ද පෝෂණය කෙළේය.

371. යම් කලෙකැ ඒ කුරුල්ලා අහරෙහි පමණ නො දත්තේ ද අධික ලෙස ආහාර අනුභව කෙළේ ද, එකලැ මුහුදෙහි ම හැලුණේය.

372. අහරෙහි පමණ නො දන්නෝ යම් හෙයකින් ගිලෙද් ද, දන්නෝ නො ගිලෙද්ද, එහෙයින් අහරෙහි පමණ දැනීමත් එහි ගිජු නො වීමත් මැනවි.

5. සූක ජාතක යි.

373. දියෙන් ප්‍රයෝජන ඇති වෙළෙන්දෝ පැරණි ළිඳක් සාරන්නාහු කළුයකඩ, තඹ, ඊයම්, රිදී, රන්, මුතු හා දියමන්ති ද ලැදහ.

374. එයින් අසතුටු වූ ඔවුහු වැඩි වැඩියක් සෑරූහ. එහි (ළිඳෙහි) හුන් දරුණු තෙදැති නයා තෙදින් (විසෙන්) ඔවුන් නැසී ය.

375. තස්මා ඛණෙ නාතිඛණෙ අතිඛාතං හි පාපකං,
ඛාතෙන ච ධනං ලද්ධං අතිඛාතෙන නාසිතන්ති.

6. ජරූදපානජාතකං.

376. නායං ඝරානං කුසලො ලොලො අයං වලීමුඛො,
කතං කතං ඛො දූසෙය්‍ය එවං ධම්මමිදං කුලං.

377. නයිදං චිත්තවතො ලොමං නායං අස්සාසිකො මිගො,
සත්ථං මෙ ජනසන්ධෙන නායං කිඤ්චි විජානති.

378. න මාතරං වා පිතරං භාතරං භගිනිං සකං,
භරෙය්‍ය තාදිසො පොසො සිට්ඨං දසරථෙන මෙති.

7. ගාමණීචණ්ඩජාතකං[1].

379. යාවතා චන්දිමසූරියා පරිහරන්ති දිසා භන්ති විරොචනා,
සබ්බෙව දාසා මන්ධාතු යෙ පාණා පථවිනිස්සිතා.

380. න කහාපණවස්සෙන තිත්ති කාමෙසු විජ්ජති,
අප්පස්සාද දුඛා කාමා ඉති විඤ්ඤාය පණ්ඩිතො.

381. අපි දිබ්බෙසු කාමෙසු රතිං සො නාධිගච්ඡති,
තණ්හක්ඛයරතො හොති සම්මාසම්බුද්ධසාවකො’ති.

8. මන්ධාතුජාතකං.

382. නයිමස්ස විජ්ජාමයමත්ථි කිඤ්චි
න බන්ධවො නො පන තෙ සහායො,
අථ කෙන වණ්ණෙන තිරීටවච්ඡො
තෙදණ්ඩිකො භුඤ්ජති අග්ගපිණ්ඩං.

1. ගාමණිචන්ද - මජසං, ශ්‍යා.

375. එහෙයින් සාරන්න. පමණට වඩා නො සාරන්න. පමණ ඉක්මවා සෑරීම ලාමකය, (හෙවත් මෝඩ කමකි.) සෑරීමෙන් ධනය ලදී. පමණට වඩා සෑරීමෙන් නසන ලදී.

6. ජරූදපාන ජාතක යි.

376. මේ විලිමුවා නිවාස තනන්නට දක්‍ෂයකු නොවේ. මෙතෙම කළ කළ දේවල් දූෂණය කිරීමේ ලෝලයෙකි. මේ වඳුරු කුලය නම් (කළ දෙය දූෂණය කිරීම වැනසීම යන) මෙබඳු ස්වභාව ඇත්තේය.

377. විමර්ශන ඥානයෙන් යුක්තයකුට මෙබඳු රළුලොම් නැත. මේ මෙරමා අස්වසන්නාවූ මෘගයකු නොවේ. මොහු කිසිත් නො දනීය යි ජනසන්ධ රජතුමා විසින් මට අනුසාසනා කරන ලදී. හෙවත් කියන ලදී.

378. එබඳු වඳුරු ජාතික සත්ව තෙමේ මව, පියා, සහෝදරයා සහෝදරිය හෝ යහළුවකු පෝෂණය නො කරන්නේය යි දශරථ රජු විසින් මට මේ ශාස්ත්‍රය කියන ලදී.

7. ගාමණිචණ්ඩ ජාතක යි.

379. සඳහිරු දෙදෙනා යම් පමණ තැන් මෙර පැදකුණු කෙරෙද්ද යම් පමණ දිසා බබුළුවත් ද, යම් පමණ බබළන ස්වභාවය ඇත්තාහු ද ඒතාක් තන්හි පොළොව ඇසුරු කොට වෙසෙන යම් පමණ මනුෂ්‍ය ප්‍රාණීහු වෙත් ද ඔහු හැම දෙනා මන්ධාතු රජුගේ දසයෝ යැ.

380. කහවනු වැස්සෙන් පවා කාමයෙහි තෘප්තියක් නො පෙනේ. කාමයෝ අල්ප ආස්වාද ඇත්තාහ යි ද, දුකට හේතු වන්නාහයි ද මෙසේ පණ්ඩිත තෙම දනැ.

381. හෙ (පණ්ඩිතයා) දිව්‍ය වූ කාමසම්පතෙහි දු ඇල්මට නො පැමිණේ. සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක නිවනෙහි ඇලුණේ වෙයි.

8. මන්ධාතු ජාතක යි.

382. විද්‍යාවෙන් නිපද වූ කිසිවක් මේ තාපසයාට නැත. තොපගේ නෑයෙක් හෝ යහළුවෙක් හෝ නොවේ. ත්‍රිදණ්ඩයක් ඇති තිරීටවච්ඡ නම් වූ මෙතෙම කවර කරුණක් නිසා බොහෝ රසැති අග්‍රභෝජනය වළඳන්නේ ද.

383. ආපාසු මෙ යුද්ධපරාජිතස්ස
එකස්ස කත්වා විවනස්මි ඝොරෙ,
පසාරයී කිච්ඡගතස්ස පාණිං
තෙනුද්ධතාරිං දුඛසම්පරෙතො.

384. එතස්ස කිච්චෙන ඉධානුපත්තො
වෙසායිනො විසයා ජීවලොකෙ,
ලාභාරහො තාත තිරීටවච්ඡො[1]
දෙථස්ස භොගං යජතඤ්ච යඤ්ඤන්ති.

9. තිරීටවච්ඡජාතකං.

385. යස්සත්ථා දූරමායන්ති අමිත්තමපි යාචිතුං,
තස්සූදරස්සහං දූතො මා මෙ කුජ්ඣි රථෙසභ.

886. යස්ස දිවා ච රත්තො ච වසමායන්ති මාණවා
තස්සූදරස්සහං දූතො මා මෙ කුජ්ඣි රථෙසභ.

387. දදමි තෙ බ්‍රාහ්මණ රොහිණීනං
ගවං සහස්සං සහ පුඞ්ගවෙන,
දූතො හි දූතස්ස කථං න දජ්ජං
මයම්පි තස්සෙව භවාම දූතා'ති.

10. දූතජාතකං.

සඞ්කප්පවග්ගො පඨමො.

තස්සුද්දානං:

උසුකාරවරො තිලමුට්ඨිමණී
හයරාජවිහඞ්ගමආසීවිසො,
ජනසන්ධකහාපණවස්ස පුන
තිරීට පුන දූතවරෙන දස.

1. තිරීටි - මජසං, තිරීටි - සයා.

383. සටනින් පරදවන ලද්දේ ජලය රහිත බියකරු වනයෙහි හුදෙකලාව විපතට පත් මට ආපදයෙහි ළිඳෙන් ගොඩ එන්නට අත දිගු කෙළේය. ඒ උපකාරය නිසා දුකින් පෙළුණු මම ගොඩ ආවෙමි.

384. මේ තාපසයාගේ උපකාරයෙන් මෙහි පැමිණියෙමි. පරලොවෙන් මිදී මෙලොව වසමි. දරුව, තිරීටවච්ඡ තවුසා ලාබ (සිවුපසය) ලබන්නට නිස්සෙකි. පරිභොග කටයුතු දේ ද, යාග කිරීමට ගන්නා යාගද්‍රව්‍ය ද දෙවු.

9. තිරීටවච්ඡ ජාතක යි.

385. යමක්හු සඳහා සතුරාගෙන් වුව ද යමක් ඉල්ලා ගන්නට දූරස්ථානයකට වුව යෙත් ද, මම ඒ උදරයාගේ දූතයෙක්මි. රජතුමනි මට නො කිපුන මැනැවි.

386. සත්ත්වයෝ රෑ දවල්හි යම් උදරයක්හුගේ වසඟයට යෙත් ද මම ඒ උදරයාගේ දූතයෙක්මි. රජතුමනි මට නො කිපුන මැනැවි.

387. බමුණ, වෘෂභ රාජයකු සහිතව රතු පැහැති ගවයන් දහසක් තොපට දෙමි. දූතයෙක් දූතයකුට කෙසේ නො දෙන්නේ ද? අපි ද ඔහුගේ ම (උදරයාගේ) දූතයෝ වෙමු.

10. දූත ජාතක යි.

පළමුවන සංකප්ප වර්ග යි.

එහි උද්දානය:

උසිකාරය පවසන සංකප්ප ජාතක යැ, තිලමුට්ඨි ජාතක යැ (මණි) කණ්ඨ ජාතක යැ, අස්රජකු ඇති කුණ්ඩකකුච්ඡිසින්ධව ජාතක යැ, (විහඞ්ගම) සුක ජාතක යැ, ආශීවිෂයකු ඇති ජරූදපාන ජාතක යැ, ජනසන්ධ රජු ඇති ගාමණීචණ්ඩ ජාතක යැ, යළි කහවනු වැසි සඳහන් මන්ධාතු ජාතක යැ, තිරීටවච්ඡ ජාතක යැ, යළි දූත ජාතකයෙන් දසය වේ.

2. පදුමවග්ගො

388. යථා කෙසා ච මස්සූ ච ඡින්නං ඡින්නං විරූහති,
එවං රූහතු තෙ නාසා පදුමං දෙහි යාචිතො.

389. යථා සාරදිකං බීජං ඛෙත්තෙ වුත්තං විරූහති,
එවං රූහතු තෙ නාසා පදුමං දෙහි යාචිතො.

390. උභොපි පලපන්තෙතෙ අපි පදුමානි දස්සති,
වජ්ජුං වා තෙ න වා වජ්ජුං නත්ථි නාසාය රූහනා,
දෙහි සම්ම පදුමානි අහං යාචාමි යාචිතො.

1. පදුමජාතකං.

391. පාණි චෙ මුදුකො චස්ස නාගො චස්ස සුකාරිතො,
අන්ධකාරො ච වස්සෙය්‍ය අථ නූන තදා සියා.

392. අනලා මුදුසම්භාසා දුප්පූරා තා[1] නදීසමා,
සීදන්ති නං විදිත්වාන ආරකා පරිවජ්ජයෙ.

393. යං එතා උපසෙවන්ති ඡන්දසා වා ධනෙන වා,
ජාතවෙදොව සණ්ඨානං ඛිප්පං අනුදහන්ති නං.

2. මුදුපාණිජාතකං.

394. අභිජ්ජමානෙ වාරිස්මිං සයං ආගම්ම ඉද්ධියා,
මිස්සීභාවිත්ථියා ගන්ත්වා සංසීදසි මහණ්ණවෙ.

395. ආවට්ටනී මහාමායා බ්‍රහ්මචරියවිකොපනා,
සීදන්ති නං විදිත්වාන ආරකා පරිවජ්ජයෙ.

396. යං එතා උපසෙවන්ති ඡන්දසා වා ධනෙන වා,
ජාතවෙදොව සණ්ඨානං ඛිප්පං අනුදහන්ති නං.

3. චුල්ලපලොභනජාතකං.

397. පණාදො නාම සො රාජා යස්ස යූපො සුවණ්ණයො,
තිරියං සොළස පබ්බෙධො උච්චමාහු සහස්සධා.

---

1. දුප්පූරත්තා – මජසං.

2. පදුම වර්ගය

388. යම් සේ හිසකෙස් ද රැවුළු ද කැපූ කැපූසේ යළි වැඩේ ද එලෙස තොපගේ නාසය නැවත හටගනීවා. ඉල්ලන ලදුයෙහි පියුමක් දෙව.

389. යම් සේ ශරත් සමයෙහි ගෙන තැන්පත් කළ සරු බිජුවට කෙතෙහි වපුළේ මනා සේ වැඩේ ද, එපරදි ඔබේ නාසය නැවත හටගනීවා. ඉල්ලන ලදුයෙහි පියුමක් දෙව.

390. තුලුහු දෙදෙන මැ මල් දෙන්නේයයි සිතා බොරු කියති. ඔහු කියත්වයි නො කියත්වයි. නාසිකාවගේ වැඩීමෙක් නැත මිතුර, ඉල්ලන ලද්දෙහි පියුම් දෙව යි.

1. පදුම ජාතක යි.

391. ඉදින් අත්තල මොළොක් වී නම්, හස්තියා සුසික්ෂිත වී නම්, රැය අඳුරු වී නම් වැසි ද වස්නේ වී නම් අපගේ අදහස එකැතින් සඵල වන්නේ යි.

392. පුරුෂයන්ගෙන් තෘප්ත නො වන්නා වූ මෘදු සම්භාෂණ ඇති පුරවන්නට බැරි ගඟක් සමාන වූ ස්ත්‍රීහු තමාට වසඟයන් අපායේ ගිල්ලති. මෙය දැන ඇය දුරින් දුරු කරන්න.

393. තෙල ස්ත්‍රීහු රුචියෙන් වේවයි ධන හෙතුයෙන් වේවයි යම් පුරුෂයකු ඇසුරු කෙරෙත් ද තමා සිටි තැන දවන ගින්න සේ සේවනය කළහු ම වහා දවති.

2. මුදුපාණිජාතක යි.

394. අභිද්‍යාමාන උදකයෙහි තෙමේ සෘද්ධිබලයෙන් අවුත් ස්ත්‍රිය හා මිශ්‍රභාවයට ගොස් මහසයුරේ ගිලෙහි.

395. මේ ඉතිරියෝ කාමයෙන් (පුරුෂයන්) පොළොඹවන්නෝය. මහාමායා ඇත්තෝය. බඹසර නම් වූ උතුම් හැසිරීම නසා පුරුෂයන් අපායේ ගිල්වත්. මෙය දැන ඇය දුරින් ම දුරු කරන්නේ යැ.

396. තෙල ස්ත්‍රීහු කැමැත්තෙන් වේවයි ධන හෙතුවින් වේවයි යම් පුරුෂයකු ඇසුරු කෙරෙත් ද, තමා සිටි තැනැ දවන ගින්න සේ සේවනය කළහු ම වහා දවත්.

3. චුල්ලපලොභන ජාතක යි.

397. යම් රජක්හුගේ ස්වර්ණමය වූ ප්‍රාසාදය සරසින් සොළොස් හීසනක් පමණ වේ ද, උසින් දහස් හීසනක් පමණ වේ යයි කීහු ද එ රජ පණාද නම.

398. සහස්සකණ්ඩං සතභෙණ්ඩු ධජාලු[1] හරිතාමයො,
අනච්චුං තත්ථ ගන්ධබ්බා ඡසහස්සානි සත්තධා.

399. එවමෙතං තද ආසි යථා භාසසි භද්දජි,
සක්කො අහං තද ආසිං වෙය්‍යාවච්චකරො තවන්ති.

4. මහාපණාදජාතකං.

400. දිස්වා ඛුරප්පෙ ධනුවෙගනුන්නෙ
ඛග්ගෙ ගහීතෙ තිඛිණෙ තෙලධොතෙ,
තස්මිං භයස්මිං මරණෙ වියූළ්හෙ
කස්මා නු තෙ නාහු ඡම්භිතත්තන්ති.

401. දිස්වා ඛුරප්පෙ ධනුවෙගනුන්නෙ
ඛග්ගෙ ගහීතෙ තිඛිණෙ තෙලධොතෙ,
තස්මිං භයස්මිං මරණෙ වියූළ්හෙ
වෙදං අලත්ථං විපුලං උළාරං.

402. සො වෙදජාතො අජ්ඣභවිං අමිත්තෙ
පුබ්බෙව මෙ ජීවිතමාසි චත්තං,
න හි ජීවිතෙ ආලයං කුබ්බමානො
සූරො කයිරා සූරකිච්චං කදචිති.

5. ඛුරප්පජාතකං.

403. යෙනාසි කිසියා පණ්ඩු යෙන භත්තං න රුච්චති,
අයං සො ආගතො තාතො[2] කස්මාදනි පලායසි.

404. සචෙ පනාදිකෙනෙව සන්ථවො නාම ජායති,
යසො හායති ඉත්ථීනං තස්මා තාත පලායහං.

405. යස්සිතං කුලෙ ජාතං ආගතං යා න ඉච්ඡති,
සොචති චිරරත්තාය වාතග්ගමිව කුන්දලීති.

6. වාතග්ගජාතකං.

406. සිඞ්ගී මිගො ආයතචක්ඛුනෙත්තො
අට්ඨිත්තචො වාරිසයො අලොමො,
තෙනාභිභූතො කපණං රුදමි
මාහෙව මං පාණසමං ජහෙය්‍ය.

407. අය්‍ය[3] තං න ජහිස්සාමි කුඤ්ජර සට්ඨිහායන[4],
පථව්‍යා චාතුරන්තාය සුප්පියො හොසි මෙ තුවං.

408. යෙ කුළීරා සමුද්දස්මිං ගඞ්ගාය නම්මදය ච,
තෙසං ත්වං වාරිජො සෙට්ඨො මුඤ්ච රොදන්තියා පතින්ති.

7. කක්කටකජාතකං[5].

1. "අට්ඨකථායං පන ඛාසාලුහරිතාමයොති පාඨො හරිතමණිමයෙහි වාරකවාටවාතපානෙහි සමන්නාගතොති අත්ථො. ඛාසාති කිර වාරකවාට වාතපානානං නාමං" අට්ඨකථා.
2. භත්තා – මජසං, භත්තො – සයා.
3. අසය න තං. සයා.
4. කුඤ්ජරං සට්ඨිහායනං – මජසං, සයා
5. කුළීරජාතකං – මජසං, සුවණ්ණකක්කටක – සයා.

398. උසින් දහස්කඬ පමණ වූ ඒ මාලිගාව සියක් මහල් ඇත්තේ යැ ධ්වජ බහුල වූයේ යැ. නිල්මැණිකින් සදනලද්දේ යැ. එහි සදහසක් නළුවෝ සප්තප්‍රකාර වැ නැටූහ.

399. භද්‍රජි යම් සේ කියා නම් එකල්හි තෙලපහය මෙසේ වී. එකල්හි තොපට (විස්කම් ලවා මාලිගාව කරවූ) වතාවත්කරු සක්දෙව් රජ මම වීමි.

4. මහාපණාද ජාතක යි.

400. චාප (දුනු) වේගයෙන්, හරනා ලද මහහීනල ද තෙල් සණලා මුවහත් කළ කඩු ද දක මරණය එළැඹ සිටි ඒ භයෙහි තොපට කුමක් හෙයින් තැතිගැන්මෙක් නො වී ද.

401. චාපවේගයෙන් හරනාලද, ඊතල ද, තෙල්සණලා මුවහත් කළ කඩු ද දක මරණය සමීප වැ සිටි ඒ භයෙහි උදර වූ මහත් සතුටක් ලදිමි.

402. ප්‍රීත වූ ඒ මම සතුරන් මැඩීමි. පළමු මාගේ ජීවිතය හරනාලද. ජීවිතයෙහි ආලය කරන ශූර තෙම කිසි කලෙක ශූරක්‍රියා නො කරන්නේ යි.

5. ඛුරප්ප ජාතක යි.

403. යම් කරුණෙකින් කෘශ වැ පඩුවන් වී ද, යම් (ප්‍රෙම) කරුණෙකින් ආහාර අරුචි වී ද, තී පතන ඒ ප්‍රියයා ආයේ යැ. දූන් කුමට පලායෙහි ද?

404. පළමු මැ සංසර්ග මිත්‍රත්වය නො හටගනී. යම් හෙයෙකින් ස්ත්‍රීන්ගේ ගර්ව සඞ්ඛ්‍යාත යසස පිරිහේ ද, එහෙයින් දරුව, පලායෙමි.

405. යම් ස්ත්‍රියක් තමා සමීපයට ආ ප්‍රශස්ත කුලයෙහි උපන් පුරුෂයා නො කැමති වේ ද, ඕ තොමෝ ''වාතගග'' නම් අසු නො කැමැති වූ 'කුන්දලී' නම් කොටළුදෙන මෙන් දිගුකලක් ශොක කරන්නී යැ.

6. වාතගගසින්ධව ජාතක යි.

406. දිග ඇස් ඇති ඇට මැ හම ඇති දියෙහි වෙසෙන ලෝම රහිත වූ ''සිංගිමිග'' නම් කකුළුවෙක, ඔහු විසින් මඩනා ලද්දෙම් අසරණ වැ හඬමි. ප්‍රාණ සම වූ මා නො හැරපියව.

407. සැටවිය ඉක්ම ථාමහීන වූ කුඤ්ජර සවාමීනි, විපතට පත් තොප නො හරින්නෙමි. සතර දිග පැතිරගිය මුහුද අවසන් කොට සිටි මහපොළොවටත් වඩා තොප මට ප්‍රිය යැ.

408. මුහුදෙහි ද ගඞ්ගානදියෙහි ද නම්ද නදියෙහි ද යම් කකුළු කෙනෙක් ඇද්ද, එ හැමට වඩා ජලයෙහි උපන් තෙපි රූසපුයෙන් හා මහත්ත්වයෙන් ශ්‍රෙෂ්ඨ වූවහු යැ, හඬන්නා වූ මාගේ සැමියා මුදව.

7. කකකටක ජාතක යි.

409. යො වෙ සබ්බසමෙතානං අහුවා සෙට්ඨසම්මතො
තස්සායං එදිසී පඤ්ඤා කිමෙව ඉතරා පජා.

410. එවමෙව තුවං බ්‍රහ්ම අනඤ්ඤාය විනින්දසි,
කථං මූලං අදිස්වාන රුක්ඛං ජඤ්ඤා පතිට්ඨිතං.

411. නාහං තුම්හෙ විනින්දාමි යෙ චඤ්ඤෙ වානරා වනෙ,
විස්සසෙනොව ගාරය්හො යස්සත්ථා රුක්ඛරොපකා'ති.

8. ආරාමදූසකජාතකං.

412. න හි වණ්ණෙන සම්පන්නා මඤ්ජුකා පියදස්සනා,
ඛරවාචා පියා හොන්ති අස්මිං ලොකෙ පරම්හි ච.

413. නනු පස්සසිමං කාළිං දුබ්බණ්ණං තිලකාහතං,
කොකිලං සණ්හභාණෙන බහුන්නං පාණිනං පියං.

414. තස්මා සඛිලවාචස්ස මන්තභාණී අනුද්ධතො,
අත්ථං ධම්මඤ්ච දීපෙති මධුරං තස්ස භාසිතන්ති.

9. සුජාතජාතකං.

415. සබ්බෙහි කිර ඤාතීහි කොසියො ඉස්සරො කතො,
සචෙ ඤාතීහනුඤ්ඤාතො භණෙය්‍යාහං එකවාචියං.

416. භණ සම්ම අනුඤ්ඤාතො අත්ථං ධම්මඤ්ච කෙවලං,
සන්ති හි දහරා පක්ඛී පඤ්ඤාවන්තො ජුතින්ධරා.

117. න මෙ රුච්චති භද්දං වො උලූකස්සාභිසෙචනං,
අක්කුද්ධස්ස මුඛං පස්ස කථං කුද්ධො කරිස්සතීති.

10. උලූකජාතකං.

[1]පදුමවග්ගො දුතියො.

තස්සුද්දානං:

පදුමුත්තමනාගසිරිව්හයනො
සමහණ්ණවයූපඛුරප්පවරො,
අථ කුන්දලිකුඤ්ජරරුක්ඛ පුන
ඛරවාචඋලූකවරෙන දසා'ති.

---

1. කොසියවග්ගො - අට්ඨකථා

409. රැස් වූ හැමදෙනා අතුරෙහි යමෙක් ඒකාන්තයෙන් ශ්‍රෛෂ්ඨය යි ප්‍රසිද්ධ වූයේ ද ඔහුගේ ප්‍රඥාව ද මෙබඳු විය, අන්‍යයන් ගැන කවර කථා ද?

410. බමුණ, තෙපි හෙතු නො දන මෙසේ නින්ද කරව. පොළොවට ඇද තිබෙන මුල නො දැක කෙසේ ගස අඳුනන්නහු ද?

411. මම තොපටත් වනයෙහි වෙසෙන අනෙක් වානරයන්ටත් නින්ද නො කරමි. තොප වැන්නවුන් ආරාමරොපක ධූරයට පත් කළ විශ්වසෙන රජතුමා මැ නින්ද කටයුතු වෙයි.

8. ආරාමදූසක ජාතක යි.

412. වර්ණවත් වූ මධුරනාද ඇති දැකුම්කලූ වූවා හු ද, රළුබසින් යුතු වූවාහු නම් මෙලොව ද පරලොව ද කිසිවක්හුහටත් ප්‍රිය නො වෙති.

413. කළුපැහැති දුර්වර්ණ වූ තලකැලැල් ඇති මේ කෙවිලිය සිලිටි බසින් බොහෝ වූ ප්‍රාණීන්ට ප්‍රිය වූවා නො දක්නෙහි ද?

414. එහෙයින් මටසිලිටි කථා ඇති වන්නේ යැ. නුවණින් පිරිසිඳ කථා කරන මත්තභාණී වන්නේ යැ. උඩඟු නො වන්නේ යැ. ඔහුගේ මධුර භාෂිතය අර්ථයත් ධර්මයත් ප්‍රකාශ කරයි.

9. සුජාත ජාතක යි.

415. සියලු නෑයන් විසින් මහමුහුණු රජ කරන ලද්දේ යැ, ඉදින් නෑයන් විසින් අනුදන්නාලද්දෙම් නම් මම වචනයක් කියමි.

416. යහළුව, අප විසින් අනුදන්නා ලද්දෙහි යැ. හෙතුව හා ප්‍රවෙණි ධර්මය කියව, ප්‍රඥාවත් ප්‍රඥාලොකයත් ඇති තරුණ පක්ෂීහු ඇත් මැ යි.

417. තොප හැමට සෙත් වේවා, මහමුහුණු අභිෂෙක කරනු මට රිසි නො වෙයි. නො කිපියහුගේ මුහුණ බලව. කිපියේ කුමක් කරන්නේ දැයි නො දනිමි.

10. උලූකජාතක යි.

දෙවැනි පදුමවර්ග යි.

එහි උද්දනය

පදුම ජාතක යැ, මුදුපාණි ජාතක යැ, සයුරෙහි ගැලීම කියන චුල්ල-පලොභන ජාතක යැ, මහායූපය ඇති මහාපණාද ජාතකය හා ඛුරප්ප ජාතක යැ, යළි ශොක කරන කුඤලිය ඇති වාතග්ගසින්ධව ජාතක යැ, (කුඤ්ජර) කසාටක ජාතක යැ, (රුක්ඛ) ආරාමදූසක ජාතක යැ, (බරවාච) සුජාත ජාතක යැ, උලූක ජාතක යැ යන දසය යි.

3. අරඤ්ඤවග්ගො

418. ආරඤ්ඤකස්ස[1] ඉසිනො චිරරත්තතපස්සිනො[2],
කිච්ඡා කතං උදපානං කථං සම්ම අවාහසි[3].

419. එස ධම්මො සිගාලානං යම්පිත්වා ඔහදමසෙ,
පිතුපිතාමහං ධම්මො න තං උජ්ඣාතුමරහසි.

420. යෙසං වො එදිසො ධම්මො අධම්මො පන කීදිසො,
මා වො ධම්මං අධම්මං වා අද්දසාම කුදචනන්ති.

1. උදපානදූසකජාතකං.

421. යෙන මිත්තෙන සංසග්ගා[4] යොගක්ඛෙමො[5] විහිංසති,
පුබ්බෙවජ්ඣාභවන්තස්ස රක්ඛෙ අක්ඛීව පණ්ඩිතො.

422. යෙන මිත්තෙන සංසග්ගා යොගක්ඛෙමො පවඩ්ඪති,
කරෙය්‍යත්තසමං වුත්තිං සබ්බකිච්චෙසු පණ්ඩිතො.

423. එථ ව්‍යග්ඝා නිවත්තව්හො පච්චමෙථ[6] මහාවනං,
මා වනං[7] ඡින්දි නිබ්‍යග්ඝං ව්‍යග්ඝා මාහෙසු නිබ්බනා'ති.

2. ව්‍යග්ඝජාතකං.

424. කො නු උද්ධිතභත්තොව[8] පූරහත්ථොව බ්‍රාහ්මණො,
කහන්නු භික්ඛං අචරි කං සද්ධං උපසඞ්කමි.

425. අහං කපිස්මි[9] දුම්මෙධො අනාමාසානි ආමසිං,
ත්වං මං මොචය භද්දන්තෙ මුත්තො ගච්ඡෙය්‍ය පබ්බතං.

426. කච්ඡපා කස්සපා හොන්ති කොණ්ඩඤ්ඤා හොන්ති මක්කටා,
මුඤ්ච කස්සප කොණ්ඩඤ්ඤං කතං මෙථුනකං තයා'ති.

3. කච්ඡපජාතකං.

---

1. ආරඤ්ඤිකස්ස - මජසං.
2. චිරරත්තං - මජසං.
3. අවාහසි - සීමු.
4. සංසග්ගො - සී.
5. යොගක්ඛෙම්මා - සී.
6. පච්චුපෙථ - මජසං, ස්‍යා.
7. මා නො වනං - ස්‍යා.
8. වඩ්ඪිත - ස්‍යා, උඩ්ඩිත - මජසං.
9. කපිස්මි - ස්‍යා.

3. ආරණ්‍ය වර්ගය

418. යහළු ශෘගාලය, වනවැසි වූ බොහෝ කල් තපස් රක්නා වූ ඍෂීන් විසින් දුකසේ කරන ලද ළිඳ කුමට මළ මූත්‍රයෙන් දූෂණය කෙළෙහි ද?

419. යම් තැනෙකැ දිය බී එහි මල මූත්‍ර කරමෝ නම් තෙල සිවලුන්ගේ දහමෙකි. පිය මුතුන්ගේ දහමෙකි. එයට දෙස් නගන්නට නො සුදුස්සෙහි.

420. ඒ තොපගේ දහම මෙබඳු වී නම් අදහම කෙබඳු වේ ද? තොපගේ දහමක් හෝ අදහමක් හෝ කිසි කලෙක අපි නො දක්මහ.

1. උදපාන දූසක ජාතක යි.

421. යම්බඳු පාපමිත්‍ර සංසර්ගය හෙතු කොටගෙන කායචිත්ත සුඛය පිරිහේ ද, පණ්ඩිත පුරුෂ තෙම ඒ පාපමිත්‍රයා විසින් අභිභවනය කළයුතු දූය තමාගේ දෙ ඇස් මෙන් කැල මැ රැකගන්නේ යැ.

422. යම්බඳු කල්‍යාණමිත්‍රයකු සමග සංසර්ග හෙතුවින් කාය චිත්තසුඛය වැඩේ ද ඒ කල්‍යාණමිත්‍රයාගේ සියලු කටයුත්තෙහි පණ්ඩිත පුරුෂ තෙම පැවැත්ම තමා හා සම කරන්නේ යැ.

423. එව ව්‍යාඝ්‍රයෙනි, පෙරළා එව මහවනයට එළඹෙවු. වගුන් රහිත වනය නො සිඳිවා ව්‍යාඝ්‍රයෝ වන විරහිත වූවාහු නො වෙත්වා.

2. ව්‍යග්ඝ ජාතක යි.

424. පිරූ බත් පාත්‍රයක් ගත්තකු මෙන් (මෙ) කවරෙක් ද? (කාර්තික පූජායෙහි ලද) පූර්ණ පාත්‍රයක් අතැති බමුණකු මෙන් (මේ) කවරෙක් ද? කවර පෙදෙසක පිඩු සිඟා හැසුරුනේ ද? කවර ශ්‍රද්ධාවන්තයකු කරා එළැඹියේ ද?

425. මම මූඪ වඳුරෙක්මි. ස්පර්ශ නො කටයුතු තැන් ස්පර්ශ කෙළෙමි. තෙපි මා මුදනු මැනැවි. මිදුණෙම් පර්වතයට යමි. තොපට යහපතක් වේවා!

426. ඉදිබුවෝ කාෂ්‍යප ගොත්‍රය ඇත්තෝ වෙති. වඳුරෝ කොණ්ඩඤ්ඤ ගොත්‍ර ඇත්තෝ වෙති. කාශ්‍යපය, කොණ්ඩඤ්ඤයා මුදව, කාශ්‍යප ගොත්‍රයෙහි උපන්හු විසින් කොණ්ඩඤ්ඤ ගොත්‍රයෙහි උපන් මොහු හා නො සම මෛථුන කෘත්‍යයෙක් කරන ලදි.

3. කච්ඡප ජාතක යි.

427\. කායං බලාකා සිඛිනී චොරී ලඞ්ඝිපිතාමහා,
ඔරං බලාකෙ ආගච්ඡ චණ්ඩො මෙ වායසො සඛා.

428\. නාහං බලාකා සිඛිනී අහං ලොලොස්මි වායසො,
අකත්වා වචනං තුය්හං පස්ස ලූනොස්මි ආගතො.

429\. පුන පාපජ්ජසි සම්ම සීලං හි තව තාදිසං,
න හි මානුසකා භොගා සුභුඤ්ජා හොන්ති පක්ඛිනා'ති.

4. ලොලජාතකං.

430\. කායං බලාකා රුචිරා කාකනීළස්මිං[1] අච්ඡති,[2]
චණ්ඩො කාකො සඛා මය්හං තස්ස චෙතං කුලාවකං.

431\. නනු මං සම්ම ජානාසි දිජ සාමාකභොජන,
අකත්වා වචනං තුය්හං පස්ස ලූනොස්මි ආගතො.

432\. පුනපාපජ්ජසි සම්ම සීලං හි තව තාදිසං,
න හි මානුසකා[3] භොගා සුභුඤ්ජා හොන්ති පක්ඛිනා'ති.

5. රුචිරජාතකං.

433\. තව සද්ධඤ්ච සීලඤ්ච විදිත්වාන ජනාධිප
වණ්ණං අඤ්ජනවණ්ණෙන කාලිඞ්ගස්මිං[4] නිම්මහසෙ.[5]

434\. අන්නභච්චා ච භච්චා ච යොධ උද්දිස්ස ගච්ඡති,
සබ්බෙ තෙ අප්පටික්ඛිප්පා[6] පුබ්බාචරියවචො ඉදං.

---

1. නිඩ්ඩස්මි – සයා.
2. මච්ඡති – සයා
3. මානුසිකා – මජසං.
4. කලිඞ්ගස්මිං – මජසං.
5. වනිම්මහසෙ – මජසං.
6. අපටික්ඛිපා – මජසං.

427. සිළු ඇති සෙරවූ මේසය මුතුන් කොට ඇති මේ කෙකිනි කවරක් ද? කෙකින්න මැනට නැඟිළුව, මාගේ මිතුරු කවුඩා චණ්ඩ ය.

428. මම සිළු ඇති කෙකිනි නො වෙමි. මම ලොල් වූ කවුඩෙක්මි. තොපගේ වචනය නො කළ නිසා පියාපත් සිඳුනා ලද්දෙම් වෙමි. ගොදුරු බිමැ සිට ආයෙහි මා බලව.

429. යහළුව, මෙබඳු දුකකට නැවැත පත් වන්නෙහිය. තොපගේ ආචාරසීලය එවැනිය. මනුෂ්‍යයන්ගේ භොගයෝ පක්ෂියා විසින් සුවසේ බුදින්නට යොග්‍ය නො වෙත්.

4. ලොල ජාතක යි.

430. සිත්කලු වූ මේ කෙකිනි කවුඩු කැඳුල්ලේ හිඳී. හෝ කවරක් ද? මාගේ මිතුරු කවුඩා නපුරුය. මේ ඔහුගේ කැඳුල්ල ය.

431. සබඳිනි පක්ෂිය, බොඩහමු බුදිනාව, මා අඳුනන්නෙහි නො වේ ද? තොප කී අවවාද නො කොට පියාපත් සිඳුනා ලද්දෙම් වෙමි. ගොදුරු බිමැ සිට ආයෙහි මා බලව.

432. යහළුව, මෙබඳු දුකකට නැවැත පත්වන්නෙහිය. තොපගේ ආචාර සීලය එවැනිය. මනුෂ්‍යයන්ගේ භොගයෝ පක්ෂියා විසින් සුවසේ බුදින්නට යොග්‍ය නො වෙත්.

5. රුචිර ජාතක යි.

433. මහරජාණෙනි, නුඹ වහන්සේගේ ශ්‍රද්ධාව ද ශීලය ද දැන අඳුන්වන් වූ මඟුලැතු කරණ කොටගෙන කලිඟුරජු සමීපයෙහි ඇතු ගෙන එම්හයි ස්වර්ණරජතාදිය විනිමය වශයෙන් ගතුම්හ.

434. කැඳබත් ආදි ආහාර අනුන්ගෙන් ලබා ජීවත් වන්නෝ ද, එසේ අනුන්ගෙන් නො ලබා ජීවත් වන්නෝ ද යන මොවුනතුරෙන් කිසිවෙක් කිසිවක් පතා කෙනකු කරා යේ නම් ඔවුන්ගේ අයැදුම් පිළිකෙව් නො කටයුතුය. මේ මවුපියන්ගේ වචනය යි.

435. දදමි වො බ්‍රාහමණා නාගමෙතං
රාජාරහං රාජ භොග්ගං[1] යසස්සිනං,
අලඞ්කතං හෙමජාලාභිඡන්නං
සසාරථිං ගච්ඡථ යෙන කාම'න්ති.

6. කුරුධම්මජාතකං.

436. වස්සානි පඤ්ඤාස සමාධිකානි
වසිම්හ සෙලස්ස ගුහාය රොමක,
අසඞ්කමානා අභිනිබ්බුතත්තා[2]
හත්ථත්තමායන්ති මමණ්ඩජා පුරෙ.

437. තෙදානි වක්කඞ්ග කිමත්ථමුස්සුකා
භජන්ති අඤ්ඤං ගිරිකන්දරං දිජා,
න නූන මඤ්ඤන්ති මමං යථා පුරෙ
චිරප්පවුත්ථා[3] අථවා න තෙ ඉමෙ.

438. ජානාම තං න මයමස්ම මූළ්හා[4]
සොයෙව[5] ත්වංනෙත මයමස්ම නාඤ්ඤෙ,
චිත්තඤ්ච තෙ අස්මිං ජනෙ පදුට්ඨං
ආජීවක තෙන තං උත්තසාමාති.

7. රොමකජාතකං.

439. කමත්ථමභිසන්ධාය[6] ලහුචිත්තස්ස දූභිනො[7],
සබ්බකාමදුහස්සෙව[8] ඉදං දුක්ඛං තිතික්ඛසි.

440. සිඞ්ගෙන නිහනාහෙතං පදසා ච අධිට්ඨහ,
භීයො බාලා පකුජ්ජෙය්‍යුං නො චස්ස පටිසෙධකො.

441. මමෙවායං මඤ්ඤමානො අඤ්ඤමෙප්‍පවං කරිස්සති,
තෙ තං තත්ථ වධිස්සන්ති සා මෙ මුත්ති භවිස්සතී'ති.

8. මහිසජාතකං.

---

1. භොගං – මජසං.
2. අභිනිබ්බුතචිත්තා – මජසං. සයා.
3. චිරප්පවුඩ්ඪා – සයා චිරප්පවුට්ඨා – මජසං.
4. සම්මූළ්හා – සයා මයං සම්පමූළ්හා – මජසං.
5. සොච – මජසං. සයා.
6. කිමත්ථ මභිසන්ධාය – මජසං. සයා.
7. දුබ්භිනො – මජසං. සයා.
8. සබ්බකාම රහස්සෙව – මජසං.

435. බමුණෙනි, රජුන්ට සුදුසු රජුන්ගේ පරිහරනයට සුදුසු පිරිවර ඇති රන්දැලින් අලංකාර කළ (හෙවත් රන් අබරණින් සැරසූ) ඇත්ගොව්වන් සහිත මේ ඇත්රජු තොපට දෙමි. කැමැති මහෙකින් ගෙන යවු.

6. කුරුධම්ම ජාතක යි.

436. පරෙවිය, පනස් අවුරුද්දකට වැඩි කලක් ගල්ගුහාවෙහි විසුම්හ. සන්සුන් සිතැති පක්ෂීහු මා සැක නො කරන්නෝ පෙර මගේ අත්පසට එති.

437. පක්ෂිය, දැන් ඒ පක්ෂීහු කුමට කලකිරුනාහු පර්වතයෙන් අන් ගිරිකඳුරකට යෙත් ද? පෙරැ පරිදි මේ පක්ෂීහු මට ගරු නො කෙරෙතියි සිතමි. නැතහොත් දිගුකල් මොවුහු පිටත වැසැ පැමිණි හෙයින් මේ ඔහු ම යයි නො හඳුනත් ද?

438. තොප දනුම්හ. අපි මුළා නො වම්හ. තෙපි ඒ තවුස් මය. අපිදු ඔහු මය අන්‍යයෝ නො වම්හ. තොපගේ මේ සිත පක්ෂි ජනයා කෙරෙහි දුෂ්ට ය. ආජීවකය, එහෙයින් තට බිය වම්හ.

7. රෝමක ජාතක යි.

439. සැහැල්ලු සිතැති මිත්‍ර ද්‍රෝහියාගේ මේ දුක (හිංසාව) කැමැති හැමදේ දෙන ස්වාමියකු (කරන දෙයක්) සේ සිතා කවර හෙයින් ඉවසා සිටින්නෙහි ද?

440. මොහු අඟින් ඇන නසව. පාදයෙන් මැඩ පියව. වළකනු-යෙක් නො වී නම් මෝඩයෝ බොහෝ කිපෙන්නාහ.

441. මෙතෙම (සෙස්සන්) මා මෙන්ය යි සිතන්නේ සෙස්සන්ට ද මෙසේ කරන්නේය. ඔහු එහිලා ඒ වඳුරා මරන්නාහ. මට ඒ පවින් මිදීම වන්නේ ය.

8. මහිස ජාතක යි.

442. යථා මාණවකො පස්සෙ සිගාලිං වනගොචරිං,
අත්ථකාමං පවෙදෙන්තිං[1] අනත්ථකාමාති මඤ්ඤති
අනත්ථකාමං සතපත්තං අත්ථකාමොති මඤ්ඤති.

443. එවමෙව ඉධෙකච්චො පුග්ගලො හොති තාදිසො,
හිතෙහි වචනං වුත්තො පතිගණ්හාති[2] වාමතො.

444. යෙ ච ඛො නං පසංසන්ති භයා උක්කංසයන්ති ච[3]
තඤ්හි සො මඤ්ඤතෙ මිත්තං සතපත්තංව මාණවො'ති.

9. සතපත්තජාතකං.

445. අද්ධා හි නූන මිගරාජා පුටකම්මස්ස කොවිදෙ,
තථාහි පුටං දූසෙති අඤ්ඤං නූන කරිස්සති.

446. න මෙ පිතා වා මාතා වා පුටකම්මස්ස කොවිදෙ[4],
කතං කතං ඛො දූසෙම එවං ධම්මමිදං කුලං.

447. යෙසං වො එදිසො ධම්මො අධම්මො පන කීදිසො[5],
මා වො ධම්මං අධම්මං වා අද්දසාම කුදාචන'න්ති.

10. පුටදූසකජාතකං.

අරඤ්ඤවග්ගො[6] තතියො.

තස්සුද්දානං:

උදපානවරං වනබ්‍යග්ඝකපි
සිබ්බිනි ච බලාකරුචිරවරො,
සුජනාධිපරොමකදූස පුන
සතපත්තවරො පුටකම්ම දසා'ති.

1. පවෙදෙන්ති – මජසං. ස්‍යා.
2. පටිගණ්හති – මජසං. ස්‍යා.
3. වා – මජසං. ස්‍යා.
4. කොවිදා – ස්‍යා.
5. කිං දිසො – මජසං.
6. උදපානවග්ගො – ස්‍යා.

442. යම්සේ මාර්ගයෙහි මාණවක තෙම වනයෙහි හැසිරෙන වැඩ කැමැතිව කියන සිවල් දෙන අවැඩ කැමැතියකැ යි සිතා ද අවැඩ කැමැති කැරලා වැඩ කැමැත්තකු යි සිතා ද.

443. එලෙසම මෙලොව ඇතැම් පුහුලෙක් එබඳු වේ. හිත කැමැතියන් විසින් වචනය කියන ලද්දේ නො කටයුතු කොට ගන්නේ යි.

444. යම් කෙනෙක් ඔහු බියෙන් පසසත් ද හුවා බෙණෙත් ද ඔවුන් මිතුරුය යි හේ සිතයි. කැරලාගේ බස විශ්වාස කළ මාණවයා මෙනි.

9. සතපත්ත ජාතක යි.

445. ඒකාන්තයෙන් මෘගරාජයා මල්ගොවු සෑදිමට දක්ෂ යයි හඟිමි. ඒ එසේම ය. ලා ලූ මල්ගොවු දූෂණය කරයි, හෙවත් නසයි. මනාපතර අන් මල්ගොවු කරති හඟිමි.

446. මාගේ පියා හෝ මව හෝ මල්ගොවු කිරීමට දක්ෂ නො වෙති. කළ කළ දේ නසම්හ. මේ වඳුරු කුලය මෙබඳු ස්වභාව ඇත්තේ ය.

447. යම්බඳු වූ තොපගේ දහම මෙබඳු වී නම් නො දහම කෙබඳු වේ ද? තොපගේ දහම හෝ අදහම කිසිකලෙකත් නො දකුම්හ.

10. පූටදූසක ජාතක යි.

තෙවැනි අරණ්‍යවර්ග යි.

එහි උද්දානය:

උදපානදූසක ජාතක යැ, ව්‍යග්ඝ ජාතක යැ, (කපි) කච්ඡප ජාතක යැ, (සිඞ්ගී) ලොල ජාතක යැ, රුචිර ජාතක යැ, (සුජනාධිප) කුරුධම්ම ජාතක යැ, රොමක ජාතක යැ, යළි (දූසක) මහිස ජාතක යැ, සතපත්ත ජාතක යැ, (පුටකම්ම) පුටදූසක ජාතක යැ යන දසය යි.

4. අබ්භන්තරවග්ගො

448. අබ්භන්තරං[1] නාම දුමො යස්ස දිබ්බමිදං ඵලං,
භුත්වා දෙහළිනී නාරී චක්කවත්තිං විජායති.

449. තඤ්ච[2] භද්දෙ මහෙසීසි සා චා[3] සි පතිනො පියා,
ආහරිස්සති තෙ රාජා ඉදං අබ්භන්තරං ඵලං.

450. භත්තුරත්ථෙ පරක්කන්තො යං ඨානමධිගච්ඡති,
සූරො අත්තපරිච්චාගී ලභමානො භවාමහන්ති.

1. අබ්භන්තරජාතකං.

451. සෙය්‍යංසො සෙය්‍යසො හොති යො සෙය්‍යමුපසෙවති,
එකෙන සන්ධිං කත්වාන සතං වජ්ඣෙ අමොචයිං.

452. තස්මා සබ්බෙන[4] ලොකෙන සන්ධිං කත්වාන එකකො,
පෙච්ච සග්ගං නිගච්ඡෙය්‍ය ඉදං සුණොථ කාසයො[5].

453. ඉදං වත්වා මහාරාජා[6] කංසො බාරාණසිග්ගහො,
ධනුං තූණිඤ්ච[7] නික්ඛිප්ප සංයමං අජ්ඣුපාගමී'ති.

2. සෙය්‍යංසජාතකං[8].

454. වරං වරං ත්වං නිහනං පුරෙ චරි[9]
අස්මිං පදෙසෙ අභිභුය්‍ය සූකරෙ,
සොදනි එකො ව්‍යපගම්ම[10] ඣායසි
බලන්නු තෙ ව්‍යග්ඝ න වජ්ජ විජ්ජති.

455. ඉමෙ[11] සුදං යන්ති දිසොදිසං පුරෙ
භයට්ටිතා ලෙණගවෙසිනො පුථූ,
තෙ දනි සංගම්ම රසන්ති එකතො
යත්ථ ඨිතා දුප්පසහජ්ජ, මෙ මයා.

1. අම්භන්තරො – සයා.
2. ත්වංහි – මජසං. ත්වම්පි – සයා.
3. චාපි – සයා, මජසං.
4. ලොකෙන සබ්බෙන – මජසං.
5. කාසියා – මජසං., සයා.
6. ඉදං වත්වා සො රාජා – මජසං., සී.
7. ධනුං තුණ්ඩිඤ්ච – සයා, ධනුකණ්ණඤ්ච – මජසං.
8. සෙය්‍ය ජාතකං – මජසං., සයා.
9. චරං – සී.
10. බ්‍යග්ඝාපගම්ම - මජසං., බ්‍යග්ඝෙපගම්ම - සයා.
11. ඉමස්සුතායන්ති - මජසං., සයා.

4. අබ්භන්තරවර්ගය

448. යම් අඹගසෙකැ ඵලය දිව්‍යභොජනයට සුදුසු ද අබ්භන්තර නමැති ඒ අඹගසෙහි අඹ කා දෙළ ඇති ඉතිරිය සක්විත්තකු ප්‍රසූත කරයි.

449. සොඳුර, තී අගබිසෝ වෙහි ඒ තෙපි සැමියාට ප්‍රියමනාප වූවහු ය. රජතෙම තිට මේ අබ්භන්තර නමැති අඹගසේ ගෙඩි ගෙනෙන්නේය.

450. මාතෘ පිතෘ ස්වාමි යන ත්‍රිවිධ ස්වාමීන්ට වැඩ පිණිස වෑයම් කරන්නාවූ ජීවිත පරිත්‍යාග කරන ශූර පුරුෂයා යම්බඳු ස්වර්ග සැපතකට පැමිණේ ද මම ද එය ලබන්නෙම් වෙමි.

1. අබ්භන්තර ජාතක යි.

451. උසස් කුශල ධර්මයන්ගෙන් හෙබියා වූ පුහුලෙක් එබඳු කශල ධර්මයට ආශා ඇති පුහුලකු ඇසුරු කෙරේ ද (එහෙයින්) හෙතෙම පැසැසුම් ලබන්නේ හෝ උතුම් වන්නේ හෝ වෙයි. එකකු සමඟ මෙත් වඩා මරණයට කැප වූ සියයක් පමණ එයින් මිදුවෙමි.

452. සියලු ලෝකවාසීන් සමඟ එක්ව (මෛත්‍රී භාවනා වඩා) කවර හෙයින් පරලොවැ ස්වර්ග ගාමී නොවන්නේ ද? කසී රට වැසියෙනි, මෙය අසව්.

453. බරණැස් නගරයේ වෙසෙන කංස නමැති මහරජ තෙමේ මෙවදන් කියා දුන්න හා හියවුර හැරපියා ශීලසංයමයට පැමිණියේ ය.

2. සෙය්‍යංස ජාතක යි.

454. ව්‍යාඝ්‍රය තෝ පෙර මේ පෙදෙසේ සියලු හූරන් මැඩ ගෙන (හූරන් කෙරෙහි) උතුම් හූරන් මරමින් හැසිරුනෙහි ය. දැන් තෝ තනිව බැහැර වැ සිතමින් සිටින්නෙහි ය. ව්‍යාඝ්‍රය අද තාගේ කායශක්තිය නැත්තේ ද?

455. මේ හූරෝ පෙර හයින් පීඩිත වැ රැකෙන තැන් සොයන්නෝ වෙන් වෙන් වැ දිශාවෙන් දිශාවට යති. දැන් ඔහු එක් රැස් වැ එක්වලා නාද කෙරෙති. යම තැනෙක සිටියා වූ මොහු අද මා විසින් මැඩලිය නො හැකියෝ යි.

456. නමත්ථු සඞ්ඝානං සමාගතානං
දිස්වා සයං සඛ්‍යං වදාමි අබ්භුතං,
ව්‍යග්ඝං මිගා යත්ථ ජිනිංසු දාඨිනො
සාමග්ගියා දාඨබලෙසු මුච්චරෙති.

3. වඩ්ඪකීසූකරජාතකං.

457. යං උස්සුකා සඞ්ඝරන්ති අලක්ඛිකා බහුං ධනං,
සිප්පවන්තො අසිප්පා ච ලක්ඛිවා තානි භුඤ්ජති.

458. සබ්බත්ථ කතපුඤ්ඤස්ස අතිච්චඤ්ඤෙව[1] පාණිනො,
උප්පජ්ජන්ති බහූ භොගා අප්පනායතනෙසුපි[2].

459. කුක්කුටමණයො[3] දණ්ඩා ථීයො ච පුඤ්ඤලක්ඛණා,
උප්පජ්ජන්ති අපාපස්ස කතපුඤ්ඤස්ස ජන්තුනො'ති.

4. සිරිජාතකං.

460. දරියා[4] සත්තවස්සානි තිංසමත්තා වසාමසෙ,
හඤ්ඤාම[5] මණිනො ආභං ඉති නො මන්තිතං අහු.

461. යාව[6] යාව නිසංසාම භිය්‍යො වොදයතෙ මණි,
ඉදඤ්චදානි[7] පුච්ඡාම කිං කිච්චං ඉධ මඤ්ඤසි.

462. අයං මණි වෙළුරියො අකාචො විමලො සුභො[8],
නාස්ස සක්කා සිරිං ගන්තුං අපක්කමථ සූකරා'ති.

5. මණිසූකරජාතකං[9].

1. අතිමඤ්ඤෙව අතිවඤ්ඤෙව – සී.
2. අපිතායතනෙසුපි – මජසං.
3. කුක්කුටො – මජසං. ස්‍යා.
4. දරයා – මජසං.
5. හඤ්ඤාම – මජසං., ස්‍යා
6. යාවතා මණිං සංසාම – මජසං, යාවතා මණි සංසාම – ස්‍යා.
7. බ්‍රාහ්මණඤ්ඤෙව පුච්ඡාම – සී.
8. අකාචො විපුලො සුභො – මජසං.
9. මණිසංසජාතකං – මජසං.

456. රැස්වූ හූරු සමූහයාට නමස්කාර වේවා! අද්භූත වූ මිතුරු බවක් තෙමේ දැක කියමි. යම් තැනෙකලා දළැති හූරෝ ව්‍යාඝ්‍රයා දිනූ ද, දළ බල කොට ඇති හූරන්ගේ සමගි බලය නිසා සතුරා මැඩ මරණයෙන් මිදුණාහ.

3. වඩ්ඪකීසූකර ජාතක යි.

457. හස්ති ශිල්පාදි උගත් ශිල්ප ඇත්තා වූ ද ශිල්ප නැත්තාවූ ද ධන රැස්කිරීමේ මහත් වෑයම ඇති පින් නැති ජනයෝ බොහෝ ධනය රැස් කෙරෙද් ද පින් ඇත්තේ ම ඒ ධනය අනුභව කෙරේ.

458. හැමතන්හි ම කළ පින් ඇතියාහට අන්‍ය ප්‍රාණීන් අභිභවා අනායතනයෙහි දු බොහෝ වූ භොගයෝ උපදිත්.

459. අලාමක වූ කළ පින් ඇති සත්වයනට ශ්‍රීමත් වූ කුකුළෝ ද මාණික්‍යයෝ ද ආරක්ෂායෂ්ටි ද පුණ්‍යලක්ෂණ ස්ත්‍රීහු ද උපදනාහු යි.

4. සිරි ජාතක යි.

460. තිහක් පමණ දෙනා සත් අවුරුද්දක් මැණික් ගුහාවෙහි විසුම්හ. මාණික්‍යයේ දීප්තිය වනසම්හයි, අප විසින් මන්ත්‍රණය කරන ලද්දේ වී.

461. මැණික යම් තාක් ගටමෝ ද බෙහෙවින් නිර්මල වෙයි. බමුණ තොප ම විචාරම්හ. මේ කරුණෙහිලා කුමක් කටයුතු දැයි ඔබ සිතන්නෙහි ද?

462. මේ මැණික වෙරළුම්ණෙක කර්කශ නො වෙයි. නිම්ලය සුන්‍දර ය. මෙහි සිරිය නසන්නට නො පිළිවන සූකරයෙනි ඉවත යව යි කී ය.

5. මණිසූකර ජාතක යි.

463\. මා සාලූකස්ස පිහයී[1] ආතුරන්නානි[2] භුඤ්ජති,
අප්පොස්සුක්කො භුසං ඛාද එතං දීඝායුලක්ඛණං.

464\. ඉදානි සො ඉධාගන්ත්වා අතිථී යුත්තසෙවකො,
අථ දක්ඛසි සාලූකං සයන්තං මුසලුත්තරං.

465\. විකන්තං[3] සූකරං දිස්වා සයන්තං මුසලුත්තරං,
ජරග්ගවා[4] විචිනෙතස්සු වරම්හාකං භුසාමිවා'ති.

6. සාලූකජාතකං.

466\. නානුම්මත්තො නාපිසුනො නානටො[5] නාකුතූහලො,
මූළ්හෙසු ලභතෙ ලාභං එසා තෙ අනුසාසනී.

467\. ධිරත්ථු තං යසලාභං ධනලාභඤ්ච බ්‍රාහ්මණ,
යා වුත්ති විනිපාතෙන අධම්මචරියාය වා[6].

468\. අපි චෙ පත්තමාදාය අනාගාරො පරිබ්බජෙ,
එසාව ජීවිකා සෙය්‍යො යා වාධම්මෙන එසනා'ති.

7. ලාභගරහජාතකං[7].

469\. අගඝනන්ති මච්ඡා අධිකං සහස්සං
න සො අත්ථි යො ඉමං සද්දහෙය්‍ය,
මය්හඤ්ච අස්සු ඉධ සත්ත මාසා
අහම්පි තං මච්ඡුද්දානං[8] කිණෙය්‍යන්ති.

470\. මච්ඡානං භොජනං දත්වා මම දක්ඛිණමාදිසි[9],
තං දක්ඛිණං සරන්තියා කතං අපචිතිං තයා.

1. පිහයි – සීමු.
2. ආතුරන්නානි – සී., මජ්ඣං.
3. විකන්තං – සී. ස්‍යා.
4. ජරග්ගවා වා චිනෙතස්සු – සී. ජරග්ගවා අචිනෙතස්සු – ස්‍යා.
5. නතො – මජ්ඣං.
6. අධම්මචරණෙන වා – සී. මජ්ඣං.
7. ලාභගරහිත – ස්‍යා.
8. මච්ඡද්දානං – මජ්ඣං. ස්‍යා.
9. මදසි – මජ්ඣං.

463. සාලූක නම් සූකරයාගේ ස්වභාවය නහමක් පතව, සාලූකයා මරණ භොජනය අනුභව කරයි. උහුගේ අහරට උත්සාහ නො කොට බොල් මුසු පිදුරු කව, මේ දීර්සායු ලබන්නට හෙතු යි.

464. දූත් සෙවකයන්ගෙන් යුක්ත වූ ඒ වෛවාහික ආගන්තුක පුරුෂ තෙම මෙහි අවුදින් සිටියේ යි. අනතුරු ව මොහොල් බඳු උඩුතොල ඇති මරණ පිණිස හෝනා වූ සාලූක නම් සූකරයා දක්නෙහි.

465. මොහොලක් වැනි උඩුතොල ඇති ව වැතිර සිටුනා කපාලූ සූකරයා දැක ගොන්නු අපගේ රඩු (පිදුරු) ම උතුමැ යි සිතූහ.

6. සාලූක ජාතක යි.

466. උමතු නො වූයේ කේලාම් නො කියනුයේ නො නටනුයේ කුහුල්කතා නැත්තේ මෝඩයන් සමීපයේ ලාභ නො ලබ යි. මේ තට අපගේ ලාභානුශාසනා යි.

467. බමුණ යශස්ලාභයට ද ධනලාභයට ද තමා නැසෙන පරිදි අධර්මචය්‍ය්‍ාායෙන් වන ජීවිකා වෘත්තියෙක් වේ නම් ඊට ද නින්ද වේවා!

468. අධාර්මික සෙවුමෙන් දිවි පවත්වනුවාට වඩා අගාරික වැ හෙවත් පැවිදිව පාත්‍රයක් ගෙන සිඟා ලද අහරෙන් පවත්වන මේ දිවිපැවැත්ම ශ්‍රෙෂ්ඨ යි.

7. ලාභගරහ ජාතක යි.

469. මත්සායයෝ (මසුරන්) දහසකට වඩා අගිති යන්න අදහන්නෙක් නැත. මෙහි මට ද මාසක සතක් ඇත. මම ද ඒ මාළු වැළ මිල දී ගතිමි.

470. මසුන්ට කෑම දී මට පින් අනුමෝදන් කෙළේ ය. තා අනුමෝදන් කළ ඒ පින සිහි කරන මා විසින් තොපගේ ධනය රක්නා ලදි.

471. පදුට්ඨචිත්තස්ස න ඵාති හොති
න චාපි නං දෙවතා පූජයන්ති,
යො භාතරං පෙත්තිකං සාපතෙය්‍යං
අවඤ්චයී දුක්කතකම්මකාරී'ති.[1]

8. මච්ඡුද්දනජාතකං[2].

472. නානාඡන්දා[3] මහාරාජ එකාගාරෙ වසාමසෙ,
අහං ගාමවරං ඉච්ඡෙ බ්‍රාහ්මණී ච ගවං සතං.

473. ජනෙතා ච[4] ආජඤ්ඤරථං කඤ්ඤා ච මණිකුණ්ඩලං
යා චෙසා පුණ්ණිකා ජම්මී[5] උදුක්ඛලං[6] අභිකඞ්ඛති.

474. බ්‍රාහ්මණස්ස ගාමවරං දෙථ බ්‍රාහ්මණියා ගවං සතං,
පුත්තස්ස ආජඤ්ඤරථං කඤ්ඤාය මණිකුණ්ඩලං
යඤ්චෙතං පුණ්ණිකං ජම්මිං පටියාදෙථ උදුක්ඛල'න්ති.

9. නානාඡන්දජාතකං.

475. සීලං කිරෙව කල්‍යාණං සීලං ලොකෙ අනුත්තරං,
පස්ස ඝොරවිසො නාගො සීලවාති න හඤ්ඤති.

476. සොහං සීලං සමාදිස්සං ලොකෙ අනුමතං සිවං,
අරියවුත්ති[7] සමාචාරො යෙන වුච්චති සීලවා.

477. ඤාතීනඤ්ච පියො හොති මිත්තෙසු ච විරොචති,
කායස්ස භෙදා සුගතිං උපපජ්ජති[8] සීලවාති.

10. සීලවීමංසජාතකං.

අබ්භන්තරවග්ගො චතුත්ථො.

තස්සුද්දානං:

දුමකංසවරුත්තම බ්‍යග්ඝමිගා
මණියො මණි සාලුකමව්හයනො,
අනුසාසනියොපි ච මච්ඡවරො
මණිකුණ්ඩලකෙන කිරෙන දසාති

1. දුක්කට කම්මකාරීති – මජසං සයා.
2. මච්ඡද්දන ජාතකං – මජසං සයා.
3. නානාඡන්දා, නානච්ඡන්දා– මජසං.
4. පුතෙතා – මජසං සයා.
5. පුණ්ණිකජම්මිං – මජසං පුණ්ණකා ජම්මී – සයා
6. උදුක්ඛලම්හි කඞ්ඛති.
7. අරියවත්ත – සයා.
8. උපපජ්ජති – සයා.

471. දුෂ්ටසිත් ඇතියාට දෙලෝ දියුණුව සිදු නො වේ. අධර්මකම් කරන්නෙක් පියා සතු වස්තුව සොහොයුරාට වඤ්චා කෙළේ ද දෙවියෝ ඔහු නො පුදත්.

8. මච්ඡුද්දන ජාතකයි.

472. මහරජ, වෙන වෙන රිසි ඇති අපි එකගෙයි වසම්හ. මම ගම්වරයක් කැමැත්තෙමි. බැමිණී ගවයන් සියයක් කැමැත්තී ය.

473. ඡත්ත මාණවක ආජානෙය අසුන් යෙදූ රියක් ද, ලේලි මිණිකොඩොලක් ද, පුණ්ණිකා නම් මිඩි තොමෝ කුලුමොහොල් සහිත වනක් ද කැමැති ය.

474. බමුණාට ගම්වරයක් ද බැමිණියට ගවයන් සියයක් ද ඡත්‍ර නම් බ්‍රාහ්මණපුත්‍රයාහට ආජානෙය අසුන් යෙදූ රියක් ද ලේලියට මිණිකොඩොලක් ද හීන වූ මේ පූර්ණිකා දසියට වනක් මොහොලක් ද පිළියෙළ කොට දෙවු.

9. නානාච්ඡන්ද ජාතකයි.

475. ආචාර සීලය ම හොබනේ ල, සීලය ලොකයේ අනුත්තර ය, බලවු දරුණු විෂ ඇති නයා පවා සිල්වතැයි හිංසා කරනු නො ලැබේ.

476. සිල්වතා යම් සීලයක් නිසා ආර්ය පැවැතුම් ඇත්තේ ය යි කියනු ලැබේ ද, ලොවැ නිර්භය තත්ත්වයෙකැ යි දන්නා ලද ද එබඳු සීලය මම සමාදන් වෙමි.

477. සිල්වතා නෑයන්ට ප්‍රිය වෙයි. මිතුරන් අතරේ ද බබළයි. මරණින් මතු දෙව්ලොවැ උපදී.

10. සීලවීමංස ජාතකයි.

සතරවැනි අබ්භන්තර වර්ග යි.

එහි උද්දනය:

(දුම) අබ්‍යන්තර ජාතක යැ, උතුම් වූ සෙය්‍යංස ජාතක යැ, ව්‍යඝ්‍රයා නැසූ වඩ්ඪකීසූකර ජාතක යැ, (මණි) සිරි ජාතක යැ, මණිසූකර ජාතක යැ, සාලූක ජාතක යැ, (අනුසාසනි) ලාභගරහ ජාතක යැ, මච්ඡුද්දන ජාතක යැ, (මණිකුණ්ඩල) නානාච්ඡන්ද ජාතක යැ (කිරෙන) සීලං කිර යනාදි වූ සීලවීමංස ජාතක යැ යන මෙයින් දසය වේ.

5. කුම්භවග්ගො

478. සබ්බකාමදදං කුම්භං කුටං[1] ලද්ධාන ධුත්තකො,
යාව සො[2] අනුපාලෙති තාව සො සුඛමෙධති.

479. යදා මත්තො ච දිත්තො ච පමාදා කුම්භමබ්භිදා,
තතො නග්ගො ච පොත්ථො ච පච්ඡා බාලො විහඤ්ඤති.

480. එවමෙව යො ධනං ලද්ධා අමත්තා පරිභුඤ්ජති,
පච්ඡා තපති දුම්මෙධො කුටං භිත්වාව ධුත්තකො'ති.

1. භද්‍රඝටජාතකං[3].

481. බාරාණස්සං[4] මහාරාජ කාකරාජා නිවාසිකො[5],
අසීතියා සහස්සෙහි සුපත්තො පරිවාරිතො.

482. තස්ස දෙහලිනී භරියා සුඵස්සා මච්ඡමිච්ඡති,[6]
රඤ්ඤො මහානසෙ පක්කං පච්චග්ඝං රාජභොජනං.

483. තෙසාහං පහිතො දූතො රඤ්ඤො චම්හි ඉධාගතො,
භත්තු අපචිතිං කුම්මි නාසායමකරං වණන්ති.

2. සුපත්තජාතකං.

484. ඵුට්ඨස්ස මෙ අඤ්ඤතරෙන ව්‍යාධිනා
රොගෙන බාළ්හං දුක්ඛිතස්ස රුප්පතො,
පරිසුස්සති ඛිප්පමිදං කළෙබරං
පුප්ඵං යථා පංසුනි ආතපෙ කතං.

485. අජඤ්ඤං ජඤ්ඤසඞ්ඛාතං අසුචිං සුචිසම්මතං,
නානාකුණපපරිපූරං ජඤ්ඤරූපං අපස්සතො.

486. ධිරත්ථු තං ආතුරං පූතිකායං
ජෙගුච්ඡියං අසුචිං බ්‍යාධිධම්මං,
යත්ථප්පමත්තා අධිමුච්ඡිතා පජා
හාපෙන්ති මග්ගං සුගතූපපත්තියා'ති.

3. කායවිච්ඡන්දජාතකං.

1. කූට – සී. ස්‍යා.
2. නං – මජ්සං.
3. සුරාඝටජාතකං – මජ්සං භද්‍රඝටභෙදක ජාතකං – ස්‍යා.
4. බාරාණස්‍යං – මජ්සං, ස්‍යා.
5. නිවාසකො – මජ්සං, ස්‍යා.
6. සුඵස්සා භක්ඛිතු මිච්ඡති – මජ්සං, ස්‍යා.

5. කුම්භ වර්ගය

478. සියලු වස්තු කාමයන් දීමට සමත් කළය ලැබ ධූර්තයා යම්තාක් කල් රකී ද ඒතාක් සුව වඩා.

479. යම් කලෙක සුරාමදයෙන් මත් වූයේ උඩඟු වූයේ සැලැකිලි රහිත වූයේ කළය බින්දේ ද? ඉක්බිති නග්න වූ කඩමාලු හැන්ද වූ මූඪයා පසුව වැනැසේ ද.

480. එපරිදි යමෙක් ධනය ලැබැ පමණ නොදනැ පරිභොග කෙරේ ද ඒ අනුවණයා හඳුසටය බිඳ ගත් ධූර්තයා සේ පසුව තැවේ.

1. හඳුසට ජාතක යි.

481. මහරජ බරණැස්නුවර නිවැසි අසූදහසක් පමණ කවුඩුවන් පිරිවරා ගත් සුපත්ත නමැති කවුඩු රජෙක් ඇත.

482. ඔහට දෙළදුක් ඇති සුඵස්සා නම් බිරිඳ රජුගේ මුළුතැන් ගෙයි පිසූ අළුත් වූ නොහොත් වෙන වෙන මහඇඟි වූ රාජ භොජනය අනුභව කරන්නට කැමැත්තී ය.

483. මම ඔවුන්ගේ දූතියෙක්මි. රජතුමා විසින් මෙහෙයවන ලද්දෙම් මෙහි ආයෙමි, සිය සැමියාට සත්කාර කෙරෙමි, එහෙයින් මේවඩන්නාගේ නාසයෙහි වණය කෙළෙමි.

2. සුපත්ත ජාතක යි.

484. එක්තරා රොගයෙකින් දැඩි වැ පහරනලද එහෙයින් ම දුඃඛිත වූ පෙළන ලද මාගේ මේ සිරුර අව් පහරන වැල්ලෙහි ලූ මලක් මෙන් වහා වියැළේ.

485. මනාප නො වූ (බාලයන් විසින්) මනාප යැ යි සංඛ්‍යාවට ගිය අපවිත්‍ර වූ පවිත්‍ර යැ යි සම්මත වූ කෙශාදි නොයෙක් කුණපයෙන් පිරිපුන් මේ සිරුර නුවණින් නො දක්නාහට මනාප ස්වරූපයෙන් වැටහෙන්නේ ය.

486. යම් ශරීරයෙක්හි (ක්ලෙශමූර්ඡායෙන්) අතිශයින් මුසපත් වූ ප්‍රජාවෝ සුගතියෙහි උපතට මහ පිරිහෙළත් ද, එසේ වූ නිති ගිලන් වූ පිළිකුල් කටයුතු වූ අපවිත්‍ර වූ ව්‍යාධිස්වභාවය ඇති මේ කුණුකයට නින්ද වේවා!

3. කායවිච්ඡනද ජාතක යි.

487. කොයං බින්දුස්සරො වග්ගු පවදන්තානමුත්තමො,
අච්චුතො ජම්බුසාඛාය මොරච්ඡාපොව කූජති.

488. කුලපුත්තොව ජානාති කුලපුත්තෙ පසංසිතුං,
ව්‍යග්ඝච්ඡාපසරීවණ්ණෙණ[1] භුඤ්ජ සම්ම දදමි තෙ.

489. චිරස්සං වත පස්සාමි මුසාවාදී සමාගතෙ,
වන්තාදං කුණපාදඤ්ච අඤ්ඤමඤ්ඤං පසංසකෙ'ති.

4. ජම්බුඛාදකජාතකං.

490. උසභස්සෙව තෙ ඛන්ධො සීහස්සෙව විජම්භිතං,
මිගරාජ නමො ත්‍යත්ථු අපි කිඤ්චි ලභාමසෙ.

491. කුලපුත්තොව[2] ජානාති කුලපුත්තෙ පසංසිතුං,
මයූරගීවසඞ්කාස ඉතො පරියාහි වායස.

492. මිගානං කොත්ථුකො[3] අන්තො පක්ඛීනං පන වායසො,
එරණ්ඩො අන්තො රුක්ඛානං තයො අන්තා සමාගතා'ති.

5. අන්තජාතකං.

493. කොනායං[4] ලොණතොයස්මිං සමන්තා පරිධාවති,
මච්ඡෙ මකරෙ ච වාරෙති ඌමීසු[5] ච විහඤ්ඤති.

494. අනන්තපායී සකුණො අතිත්තොති දිසාසුතො,
සමුද්දං පාතුමිච්ඡාමි සාගරං සරිතං පතිං.

495. ස්වායං හායති චෙව පූරතෙ ච මහොදධි,
නාස්ස නායති පීතන්තො[6] අපෙය්‍යො කිර සාගරො'ති.

6. සමුද්දජාතකං.

1. ඛ්‍යග්ඝච්ඡාපි සරීරවණ්ණා මජසං. ව්‍යග්ඝච්ඡාප සදිසවණ්ණ – ස්‍යා.
2. කුලපුත්තො පජානාති – මජසං, ස්‍යා.
3. සිඞ්ගාලො – මජසං. කොට්ඨුකො – ස්‍යා.
4. කොනවායං – ස්‍යා.
5. උම්මීසු – මජසං. ඌමීසු – සී.
6. පිවන්තො – මජසං.

487. බින්දු (පිඩු වූ) ස්වර ඇතියේ මධුර නාද ඇතියේ හඬන්නවුන් අතුරෙන් උතුම් වූයේ ජම්බු අත්තක හිඳ මොනර පැටියකු සේ නාද කරන්නේ කවරෙක් ද?

488. කුලපුතුන් පසසන්නට කුලපුතෙක් ම දනී. වග පොව්වකු සමාන පැහැයෙන් යුත් මිතුර තෙපි (දඹ) අනුභව කරන්න. තොපට දෙමි.

489. බොරු කියන, හමුවූ කලැ ඔවුනොවුන් පසසාගන්නා වූ වමනය කන්නා වූ කවුඩා ද මළකුණු කන හිවලා ද බොහෝ කලෙකින් දකිමි.

4. ජම්බුඛාදක ජාතක යි.

490. තොපගේ කඳ වෘෂභරාජයකුගේ වැන්න, විජෘම්භණය සිංහයකුගේ මෙනි. මෘගරාජය, තොපට නමස්කාර වේවා! කිසිවක් ලබමෝ නම් මැනවි.

491. කුලපුතුන් පසසන්නට කුලපුතෙක් ම දනී. මොනරකු ගේ ගෙල බඳු ගෙලැති කවුඩාණෙනි මෙහි එන්න.

492. මෘගයන් අතුරෙන් හිවලා හීන යැ, පක්ෂීන් අතුරෙන් කවුඩා හීන යැ, වෘක්‍ෂයන් අතුරෙන් එරඬුගස හීන යැ. හීනයෝ තිදෙනෙක් එක්වූහ.

5. අන්ත ජාතක යි.

493. ලවණජලයෙහි හාත්පසැ දුවයි. මාලුවන් හා මෝරුන් වළකයි. රැලෙහි ද ගැවේ. මේ කවරෙක් ද?

494. ගංගාවන්ට ස්වාමිවූ මුහුද බොන්නට රිස්සෙමි. එහෙයින් අනන්තපායී පක්ෂියා වෙමි. සපුරන්නට නො හැකි ආශාවෙන් යුත් හෙයින් අතෘප්ත යයි දිශාවන්හි ප්‍රසිද්ධ වෙමි.

495. මේ සාගරය දිය බස්නා වේලායෙහි බසී. වැඩෙන වේලායෙහි පිරෙයි. සාගරය බීමෙන් අඩු නො වේ. එහෙයින් සයුර අපෙය (ක්‍ෂයකොට පානය කළ නො හැකි) වේ.

6. සමුද්ද ජාතක යි.

496\. උච්චෙ සකුණ ඩෙමාන[1] පත්තයාන විහඞ්ගම,
වජ්ජාසි ඛො ත්වං වාමූරුං චිරං ඛො සා කරිස්සති.

497\. ඉදං ඛො සා න ජානාති අසිං සත්තිඤ්ච ඔඩ්ඩිතං,
සා චණ්ඩී කාහති කොධං තං මෙ තපති නො ඉධ[2].

498\. එස උප්පලසන්නාහො නික්ඛමුස්සීසකෙ[3] කතං,
කාසිකඤ්ච මුදුං වත්ථං තප්පතු[4] ධනකාමිකා'ති[5].

7. කාමවිලාපජාතකං.

499\. උදුම්බරා චිමෙ පක්කා නිග්‍රොධා ච කපිත්ථනා,
එහි නික්ඛම[6] භුඤ්ජස්සු කිං ජිඝච්ඡාය මීයසි.

500\. එවං සො සුහිතො හොති යො වඩ්ඪමපචායති,[7]
යථාහමජ්ජ සුහිතො දුමපක්කානිමාසිතො.

501\. යං වනෙජො වනෙජස්ස වඤ්චෙය්‍ය කපිනො කපි,
දහරොපි[8] තං න සද්ධෙය්‍ය න හි ජිණ්ණො ජරාකපි'ති.

8. උදුම්බරජාතකං.

502\. පුරෙ තුවං සීලවතං සකාසෙ
ඔක්කන්තිකං[9] කීළසි අස්සමම්හි,
කරොහරෙ මක්කටියානි මක්කට
න තං මයං සීලවතං රමාම.

503\. සුතා හි මය්හං පරමා විසුද්ධි
කොමායපුත්තස්ස[10] බහුස්සුතස්ස,
මාදනි මං මඤ්ඤදි තුවං යථා පුරෙ
ඣානානුයුත්තා[11] විහරාම ආවුසො.

---

1. ඩෙහන – මජසං.
2. ඉදං – මජසං.
3. නික්ඛඤ්චුස්සීසකො හිතං – මජසං නික්ඛඤ්චුස්සීසකෙ – සයා.
4. තපෙපතු – සී. මජසං සයා.
5. ධනිකා පියා – මජසං.
6. නීක්ඛමම – මජසං.
7. යො වුඩ්ඪමපචායති – මජසං. සයා.
8. දහරො කපි සද්ධෙය්‍ය – මජසං.
9. ඔක්කනතිකං – මජසං.
10. කොමාරිය පුත්තසස – සයා. කොමාරපුත්තස්සං – මජසං.
11. ඣානා නියුත්තා – සී.

496. උස තන්හි පියාඹන්නා වූ පක්ෂිය, පියාපත් යාන කොට ඇති පක්ෂිය, තා කෙසෙල් කඳක් වැනි මනා කලවා ඇති තැනැත්තියට මා උලැ උන්බව කියව. ඇය බොහෝ කලෙකැ සිට සිහි කෙරේ.

497. කඩුවට හා තෙබට සමාන වූ හුලැ නගනා ලද බව ඕ තොමෝ නො දනී. චණ්ඩ වූ ඇය මට ක්‍රොධ කරයි. ඇගේ කොපය මා තවයි. උල ඇති දුක මා නො තවයි.

498. හිස්දෙර තැබූ උපුලක් සමාන මේ සන්නාහය ද රන් නිකෙකින් කළ මුද්ද ද කසී වස්ත්‍ර යුග්මය ද ඇත. වස්තුව රිසි මාගේ ප්‍රියාව මෙයින් තෘප්තිමත් වේවා.

7. කාමවිලාප ජාතක යි.

499. විලිකුන් පල ඇති දිඹුල්, නුග, ගිවුලු යන මේ ගස් පල බරින් නැමී ඇත. තෝ ද ගොස් අනුභව කරව. සාගීන්නේ මියැයනුයේ කිම?

500. අද මම රුක්එල කා සුවපත් වීම් ද එලෙස යමෙක් වැඩිමහල්ලන් පුද ද ඒ පුරුෂයා සුවපත් වේ.

501. වනයේ උපන් වඳුරා වනයේ උපන් වඳුරාට යම් රැවටීමක් කරන්නේ ද එය තා වැනි ළදරු වඳුරෙක් නො අද හන්නේ ය. ජරපත් මා වැනි මහලු වඳුරෙක් නො අදහන්නේ මැ යි.

8. උදුම්බර ජාතක යි.

502. කොළ වඳුර, පෙර තෝ කෙළිලොල් අප හමුයෙහි පැනපැනැ, කෙළනෙහි අපගේ අසපුවෙහි දී වැදිරිමුහුණ පෙන්නීම ආදී ක්‍රීඩා කරව. වානරය ක්‍රීඩා ප්‍රකෘතික වූ තා කෙරෙහි අපි නො ඇලෙම්හ. එයට කරුණු කිම.

503. ඇවැත්නි, බහුශ්‍රැත වූ කොමායපුත්‍රගේ උසස් ධ්‍යාන විශුද්ධි මා විසින් අසන ලද. තෙපි පෙර පරිදි මා පිළිබඳ ව නො සිතව. ධ්‍යාන ඇති ව වසමු.

504. සචෙපි සෙලස්මිං වපෙය්‍ය බීජං
දෙවො ච වස්සෙ නෙව හි තං රුහෙය්‍ය,
සුතා හි තෙ සා පරමා විසුද්ධි
ආරා තුවං මය්හට ඣානභූමියාති.

9. කොමායපුත්තජාතකං[1].

505. පරපාණරොධා[2] ජීවන්තො මංස ලොහිතභොජනො[3],
වකො වතං සමාදය[4] උපපජ්ජි උපොසථං.

506. තස්ස සක්කො වතඤ්ඤාය අජරූපෙනුපාගමි,
වීතතපො[5] අජ්ඣප්පත්තො[6] භඤ්ජි ලොහිතපො තපං.

507. එවමෙවං ඉධෙකච්චෙ සමාදානස්මිං දුබ්බලා,
ලහුං කරොන්ති අත්තානං වකොව අජකාරණා'ති.

10. වකජාතකං.

කුම්භවග්ගො පඤ්චමො.

තස්සුද්දානං:

වරකුම්භසුපත්තසිරිව්හයනො
සුවිසම්මතබින්දුවරො වූසභො,
සරිතංපතිවණ්ණජරාකපිනා
අථ මක්කටියා වකකෙන දසාති.

තිකනිපාතො නිට්ඨිතො.

වග්ගුද්දානං:

සඞ්කප්පො පදුමො චෙව උදපානෙන තතියං,
අබ්භන්තරං ඝටභෙදං තිකනිපාතම්හි ලක්ඛිතන්ති.

---

1. කොමාරපුත්තජාතකං – මජසං.
2. පරපාණඝාතෙ – ස්‍යා.
3. ලොහිතා – මජසං.
4. සමාදියි – සී.
5. විතලිතපො – මජසං. සී.
6. අජ්ඣපත්තො – මජසං ස්‍යා.

504. වානරය, ඉදින් ගල්තලායෙහි බීජ වපුරන්නාහු ද වැසි වලා ද මැනාවින් වස්නේ නමුදු ඒ (අක්ෂෙත්‍රයෙහි) වපුළ බීජය නො මැ හටගන්නේ ය. (එහෙයින් මැ) ඔවුන්ගේ අත්‍යුත්තම විසුද්ධි අසනලද නමුදු තෙපි ධ්‍යාන භූමියෙන් දුරු වවු.

9. කොමායපුත්ත ජාතක යි.

505. පරපණ නැසීමෙන් මස් ලේ අනුභව කොට ජීවත් වන්නා වූ වෘකයා පෙහෙවස් සමාදන් විය.

506. ශක්‍රයා ඔහුගේ ව්‍රතය දැනැ එළු වෙසින් ළඟට ආවේය. (එකෙණෙහි) තපස පහව ගියේ ලේ බොන හේ තපස බිඳගති.

507. එපරිදි මෙලොවැ ඇතැම් කෙනෙක් සමාදන් වූ සීලය රැක ගැනීමට (දුබල නොහොත්) සමත් නො වෙති. එළුවා නිසා සැහැල්ලු බවට පත් වෘකයා මෙන් තමා සැහැල්ලු කෙරෙති.

10. වක ජාතක යි.

පස්වැනි කුම්භවර්ග යි.

එහි උද්දානය:

(වරකුම්භ) භද්‍රඝට ජාතක යැ, සුපත්ත ජාතක යැ, දැහැන් සිරි කැඳ වූ කායවිච්ඡන්ද ජාතක යැ, (සුවිසම්මත) ජම්බුඛාදක ජාතක යැ, සිවලාට පැසසූ අන්ත ජාතක යැ, (සරිතංපති) සමුද්‍ද ජාතක යැ, චණ්ඩ වූ ස්ත්‍රියක් ඇති කාම විලාප ජාතක යැ, වඳුරකු දැක්වෙන උදුම්බර ජාතක යැ, වක ජාතකයෙන් දසය වේ.

තික නිපාතය නිමි.

වර්ග උද්දානය:

සඞ්කප්ප වර්ග යැ, පදුම ජාතකය ආදි වූ කොසිය වර්ග යැ, උදපාන දූසක ජාතකය ආදි කොට ඇති අරඤ්ඤ වර්ග යැ, අබ්භන්තර වර්ග යැ, කුම්භ වර්ගය යන පඤ්ච වර්ගය තික නිපාතයෙහි සැරැසී සිටියේ යි.

චතුක්කනිපාතො

1. විවරවග්ගො

508. විවරථ[1] ඉමාසං ද්වාරං නගරං පවිසිතුං මයා,
අරුණරාජස්ස සීහෙන සුසිට්ඨෙන සුරක්ඛිතං නන්දිසෙනෙන[2].

509. ජයො කලිඞ්ගානං අසය්හසාහිනං
පරාජයො අනයො අස්සකානං,
ඉච්චෙව තෙ භාසිතං බ්‍රහ්මචාරි
න උජ්ජුභූතා විතථං භණන්ති.

510. දෙවා මුසාවාදමුපාතිවත්තා
සච්චං[3] ධනං පරමං තෙසු සක්ක,
තං තෙ මුසාභාසිතං දෙවරාජ
කිං වා පටිච්ච මඝවා මහින්ද.

511. නනු තෙ සුතං බ්‍රාහ්මණ භඤ්ඤමානෙ
දෙවා න ඉස්සන්ති පුරිසපරක්කමස්ස,
දමො සමාධි මනසො අද්වෙජ්ඣො[4]
අව්‍යග්ගතා නික්ඛමනඤ්ච කාලෙ,
දළ්හඤ්ච විරියං පුරිසපරක්කමො ච
තෙනෙව ආසි විජයො අස්සකානන්ති.

1. චුල්ලකාලිඞ්ගජාතකං.

512. අදෙය්‍යෙසු දදං දානං දෙය්‍යෙසු නප්පවෙච්ඡති[5],
ආපාසු[6] ව්‍යසනං පත්තො සහායං නාධිගච්ඡති.

513. නාදෙය්‍යෙසු දදං දානං දෙය්‍යෙසු යො පවෙච්ඡති,
ආපාසු ව්‍යසනං පත්තො සහායමධිගච්ඡති.

---

1. විවරථ ඉමාසං ද්වාරං නගරං පවිසන්තු අරුණරාජස්ස, සීහෙනසුසත්ථෙන-සුරක්ඛිං නන්දිසෙනෙන, ස්‍යා. විවරථ ඉමාසං වාරං නගරන්තං පවිසිතුං – මජසං.
2. සුසිට්ඨෙන-නන්දිසෙනෙන – මජසං.
3. සච්චං තථ; පෙමකරංහු සක්ක – මජසං. සච්චං තතං පරමං කරන්තු සක්ක – ස්‍යා.
4. අභෙජ්ජා – මජසං.
5. න පවෙච්ඡති – මජසං.
6. ආවාසු බ්‍යසනං –මජසං.

චතුක්කනිපාතය

1. විවර වර්ගය

508. මොවුන්ට නගරයට පිවිසෙන්නට දොර හරිවූ. අස්සකරට අරුණ රජුගේ ශ්‍රේෂ්ඨ පුරුෂයා වූ ද මැනැවින් අනුශාසනා කළා වූ ද නන්දිසෙන නමැති මා විසින් මනාලෙස රැකි නගරයට (පිවිසෙත්වා)

509. දුස්සහ වූ භය ඉවසනසුලු කලිඟුරට වැසියනට ජය වෙයි. අස්සකරට වැසියන විනාශයට හා පරාජය වේ යයි තොප විසින් මෙසේ කියන ලද තපස්විය ඍජු වූවෝ බොරු නො කියත්.

510. ශක්‍රය දෙවියෝ මුසවා ඉක්ම සිටියහ. (බොරු නො කියති) ඔවුන් කෙරෙහි සත්‍යය උතුම් ධනය වෙයි. දිව්‍ය රාජ්‍ය, මඝවය, මහෙන්ද්‍රය තොප විසින් ඒ බොරුව කුමක් හෙයින් කියන ලද ද?

511. බමුණ ඒ ඒ තැන කියනා කල්හි තොප විසින් අසන ලද නො වේ ද? දෙවියෝ පුරුෂ ධෛර්යයට ඊෂ්‍යා නො කෙරෙති. ආත්ම දමනය ද චිත්ත සමාධිය ද චින්තයාගේ එකඟකම නො විසුළ බව ද සුදුසු අවස්ථාවෙහි ඉදිරියට යාම ද දැඩි උත්සාහය ද වීර්‍ය්‍යය ද (යන මේ) හෙතූන් නිසා අස්සකරට වාසීන්ට ජය අත් විය.

1. චුල්ලකාලිංග ජාතක යි.

512. දනාර්හ නො වන්නන් කෙරෙහි දන් දෙනුයේ දනාර්හයන් කෙරෙහි නො දේ ද, හේ ආපදායෙහි ව්‍යසයනට පැමිණියේ ඒ පුද්ගලයා විපතට සහායයකු නො ලබයි.

513. යමෙක් දනාර්හ නො වන්නන් කෙරෙහි දන් නො දේ ද, දනාර්හයන් කෙරෙහි පරිත්‍යාග කෙරේ ද ඒ පුද්ගල ආපදයෙහි විපතට පැමිණියේ මිතුරකු ලබයි.

514. සඞ්ඛ්‍යූගසම්භොගවිසෙසදස්සනං
අනරියධම්මෙසු සඨෙසු නස්සති,
කතඤ්ච අරියෙසු ච අඤ්ජසෙසු ච
මහප්ඵලං හොති අණුම්පි[1] තාදිසු.

515. යො පුබ්බෙ කතකල්‍යාණො අකා ලොකෙ සුදුක්කරං,
පච්ඡා කයිරා න වා කයිරා අච්චන්තං පූජනාරහො'ති.

2. මහාඅස්සාරොහජාතකං.

516. අනුත්තරෙ[2] කාමගුණෙ සමිද්ධෙ
භුත්වාන පුබ්බෙ වසි[3] එකරාජා,
සොදනි දුග්ගෙ නරකම්හි ඛිත්තො
නප්පජහෙ වණ්ණබලං පුරාණං.

517. පුබ්බෙව ඛන්ති ච තපො ච මය්හං
සම්පත්ථිතා දබ්බසෙනා[4] අහොසි,
තංදනි ලද්ධාන කථන්නු රාජ
ජහෙ අහං වණ්ණබලං පුරාණං.

518. සබ්බං කිරෙව[5] පරිනිට්ඨිතානි
යසස්සිනං පඤ්ඤවන්තං[6] විසය්හ,
යසො ච ලද්ධා පුරිමං[7] උළාරං
නප්පජහෙ වණ්ණබලං පුරාණං.

519. පනුජ්ජ දුක්ඛෙන සුඛං ජනින්ද
සුඛෙන වා දුක්ඛමසය්හසාහි,
උභයත්ථ සන්තො[8] අභිනිබ්බුතත්තා
සුඛෙ ච දුක්ඛෙ ච භවන්ති තුල්‍යා'ති.

3. එකරාජජාතකං.

520. ඉමානි මං දද්දර තාපයන්ති
වාචාදුරුත්තානි මනුස්සලොකෙ,
මණ්ඩූකභක්ඛා උදකන්තසෙවී
ආසීවිසං[9] මං අවිසා සපන්ති.

---

1. අණුම්පි තාදිසු – මජසං.
2. අනුත්තරො – මජසං.
3. වසී – මජසං.
4. දුබ්භිසෙන – මජසං. සයා.
5. සබ්බාකිරෙවං – මජසං. සබ්බාකිරෙව - සයා.
6. පඤ්ඤවතං – සී.
7. පුරිය – මජසං.
8. සත්ථා – සී.
9. ආසිවිසං – මජසං.

514. අනාය්‍ය ස්වභාවය ඇති කපටයන් හා එක්වීමත් එක් ව ක්‍රියා කිරීමත් (උපකාර වශයෙන් කරන දෙය) දියෙහි ඇඳි ඉරක් සේ වහා නසී. කළ ගුණ දන්නා වූ ඍජු වූ ශ්‍රෙෂ්ඨ පුද්ගලයන්ට කළ උපකාරය සුළු වුවත් දෙලොවින් ම මහත් ප්‍රයොජන වේ.

515. යමෙක් පෙර (උපකාර ඉල්ලන්නට පළමු ව) යමකුට උපකාර කෙළේ ද හේ ලොවෙහි දුෂ්කරයක් කෙළේ වෙයි. (උපකාර ලද පුහුලා පෙරලා උපකාර කළේ හෝ නො කෙළේ හෝ) උපකාර කළ පුහුලා පිදුම් ලබන්නට ඉතා සුදුසු වේ.

2. මහාඅස්සපුර ජාතක යි.

516. එකරාජය, පෙර තෙපි නිරුත්තර වූ සමෘද්ධ වූ පස්කම් ගුණයන් අනුභව කොට (හෙවත් විඳිමින්) විසුවහ. දැන් ඒ තෙපි නරාවළ බහාලන ලද්දහු (නමුදු) පැරණි ගුණවත්කම හා (ධ්‍යාන) බලය නො හරනහු.

517. දබ්බසෙනය, මා විසින් කැලැ මැ ඉවැසීම හා තපස හා පතන ලද. රජතුමනි, එය දැන් ලදින් පැරණි ගුණවත් කම හා (ධ්‍යාන) බලය කෙසේ මම හැරපියම් ද?

518. යසැත්තාණෙනි, පැනැත්තාණෙනි, කමන්නාණෙනි, සියල්ල පෙර මැ මා විසින් නිමවන ලද. පෙර (මම) නොලද උදර යසස හා මෛත්‍රීධ්‍යානය ලැබැ වර්ණය හා බලය නො හරින්නෙමි.

519. ඉවසන්නට නො හැකි දුක් ඉවසන රජතුමනි, දුකෙන් සුවය දුරු කොට, සුවයෙන් දුක දුරු කොට (වෙසෙන) සත්පුරුෂයෝ දෙතැන්හි නිවීගිය සන්තාන ඇතිව සුව දුක් දෙක්හි එක සමාන (කම්පා නොවන හෙයින්) වෙත්.

3. එකරාජ ජාතක යි.

520. දද්දරය, මිනිස්ලොවෙහි මැඩියන් කා උදකාන්තයෙහි (දියයට) වසන්නේ ය යන මේ නපුරු වචන මට දුක් උපදවයි. විෂ සහිත මා විෂ නැතියකු සේ (සිතා) (ගම්දරුවෝ) ආක්‍රොෂ කෙරෙති.

521. සකා රට්ඨා පබ්බාජිතො[1] අඤ්ඤං ජනපදං ගතො,
මහන්තං කොට්ඨං කයිරාථ දුරුත්තානං නිධෙතවෙ.

522. යත්ථ පොසං න ජානන්ති ජාතියා විනයෙන වා,
න තත්ථ මානං කයිරාථ වසමඤ්ඤාතකෙ ජනෙ.

523. විදෙසවාසං වසතො ජාතවෙදසමෙනපි,
ඛමිතබ්බං සපඤ්ඤෙන අපි දාසස්ස තජ්ජිතන්ති.

4. දද්දරජාතකං.

524. නත්ථි ලොකෙ රහො නාම පාපකම්මං පකුබ්බතො,
පස්සන්ති වනභූතානි තං බාලො මඤ්ඤති[2] රහො.

525. අහං රහො න පස්සාමි සුඤ්ඤං වාපි න විජ්ජති,
යත්ථ අඤ්ඤං න පස්සාමි අසුඤ්ඤං හොති තං මයා.

526. දුජ්ජච්චො ච[3] සුජච්චො ච නන්දො ච සුඛවච්ඡකො,
වෙජ්ජො අද්ධුවසීලො ච තෙ ධම්මං ජහුමත්ථිකා.

527. බ්‍රාහ්මණො ච කථං ජහෙ සබ්බධම්මානපාරගූ,
යො ධම්මමනුපාලෙති ධිතිමා සච්චනික්කමොති.

5. සීලවීමංසජාතකං.

528. කිං අණ්ඩකා ඉමෙ දෙව නික්ඛිත්තා කංසමල්ලකෙ,
උපලොහිතකා වග්ගූ තං[4] මෙ අක්ඛාහි පුච්ඡිතො.

529. යාති පුරෙ තුවං දෙවි භණ්ඩු නන්තකවාසිනී,
උච්ඡඞ්ගහත්ථා පචිනාසි තස්සා තෙ කොලියං ඵලං.

530. උඩ්ඩය්හතෙ[5] න රමති භොගා විප්පජහන්ති තං,
තත්ථෙවිමං පටිනෙථ යත්ථ කොලං පචිස්සති.

1. පබ්බජිතො - සීමු.
2. මඤ්ඤතෙ - සීමු.
3. අජ්ජච්ච ච - සීමු.
4. තෙ මෙ තමෙම - සීමු.
5. උඩ්ඩය්හතෙ - මජ්සං. සීමු.

521. සිය රටින් නෙරපන ලද තැනැත්තා අන් දනව්වකට ගිය (කලැ) නොමනා ලෙස කී කථා තබනු සඳහා ගබඩාවක් සාදන්නේ ය. (ඉවසන්නට හිත දියුණු කරන්නේ ය).

522. පුරුෂයා යම් තැනෙක වෙසේ ද එහි දී තමා පිළිබඳ තොරතුරු නො දත් පිරිස අතරේ වෙසෙන කලැ (මෙතරම් වැදගත් මට ජනයා) බුහුමන් නො කෙරෙති යි උඩඟු නොවන්නේ ය.

523. විදෙශයෙහි වෙසෙන නුවණැති ගිනි හා සමාන (අනුභාව සම්පන්න) කෙනකු වුවද දසයකුගේ තර්ජනය ද ඉවැසියයුතු ය.

4. දද්දර ජාතක යි.

524. පව් කරන්නාට ලොවැ රහසෙක් නැත. වනදෙවතාවෝ (එය) දකිත්. (එහෙයිනි.) (එහෙත්) මෝඩයා කළ පාපය රහසක් ලෙස සිතයි.

525. පව් කරන්නට යොග්‍ය රහස් තැනක් මම නො දකිමි. ජන ශූන්‍ය ස්ථානයකුදු නැත. ජන ශූන්‍ය අනෙක් තැනක් යම් තැනෙක නො දකිම් ද එබඳු තැන ශූන්‍ය නො වේය යි මා විසින් කියන ලදී.

526. දුජ්ජච්ච අජච්ච නන්ද සුඛවච්ඡ වෙජ්ජ අද්ධුවසීල යන ශිෂ්‍යයෝ ගැහැනුන් ලබාගන්නට තැබූ රිසිය හළුවෝ ය.

527. ඔවුන්ගෙන් පිට කෙනකු වන සිල්සපන් බමුණා ඒ ගැහැනියගේ ලැබීම කෙසේ හැරපියන්නේ ද? යමෙක් පන්සිල් දස සිල් රකිමින් ත්‍රිවිධ සුචරිතය මැනැවින් රක්නේ ද එබඳු ධෛර්ය සම්පන්න පුරුෂයා සීලය රකී.

5. සීලවීමංස ජාතක යි.

528. දෙවයන් වහන්ස, රන්තැටියේ තබන ලද රතු පැහැයෙන් යුතු මනා පෙනුමැති මේ ගෙඩි මොනවා ද? විචාරන ලද මට කියනු මැනැව.

529. දේවිය හිසමුඩු කොට කඩමාලු හැඳ ඇකයෙහි කළ අතැති ව එකතු කළ ගෙඩි වර්ගයක් වී නම්, තීගේ කුලයට අයත් ගෙඩි ජාතිය යි මේ.

530. ලෝකුඹු නිරයේ උපන්නියක සේ (මැය) දුවෙන්නේ ය. පින් මඳ හෙයින් රාජසම්පත විඳින්නට සිත නො ඇළේ. ඩෙබර කඩා එකතු කළ තැනට මැය නැවත ගෙන යවු.

531. හොන්ති හෙතෙ මහාරාජ ඉද්ධිප්පත්තාය[1] නාරියා,
ඛම දෙව සුජාතාය මාසස්සා[2] කුජ්ඣි[3] රථෙසභාති.

6. සුජාතාජාතකං.

532. අචෙතනං බ්‍රාහ්මණ අස්සුණන්තං
ජානො අජානන්තමිමං පලාසං,
ආරද්ධවිරියො ධුවං අප්පමත්තො
සුඛසෙය්‍යං පුච්ඡසි කිස්ස හෙතු.

533. දූරෙ සුතො චෙව බ්‍රහා ච රුක්ඛො
දෙසෙ ඨිතො භූතනිවාසරූපො,
තස්මා නමස්සාමි ඉමං පලාසං
යෙ චෙත්ථ භූතා තෙ ච ධනස්ස හෙතු.

534. සො තෙ කරිස්සාමි යථානුභාවං
කතඤ්ඤුතං බ්‍රාහ්මණ පෙක්ඛමානො,
කථං හි ආගම්ම සතං සකාසෙ
මොඝානි[4] තෙ අස්සු පරිඵන්දිතානි.

535. යො තින්දුරුක්ඛස්ස පරො[5] පිලක්ඛු
පරිවාරිතො පුබ්බයඤ්ඤො උළාරො,
තස්සෙව මූලස්මිං නිධී නිඛාතො
ආදයාදෙ ගච්ඡ තං උද්ධරාහී'ති.

7. පලාසජාතකං.

536. අකරම්හසතෙ කිච්චං යං බලං අහුවම්හසෙ,
මිගරාජ නමො ත්‍යත්ථු අපි කිඤ්චි ලභාමසෙ.

537. මම ලොහිතභක්ඛස්ස නිච්චං ලුද්දානි කුබ්බතො,
දන්තන්තරගතො සන්තො තං බහුං යම්පි[6] ජීවසි.

538. අකතඤ්ඤුමකත්තාරං කතස්ස අප්පතිකාරකං[7],
යස්මිං කතඤ්ඤුතා නත්ථි නිරත්ථා තස්ස සෙවනා.

539. යස්ස[8] සම්මුඛචිණ්ණෙන[9] මිත්තධම්මො න ලබ්භති,
අනුසුය්‍ය[10]මනක්කොසං සණිකං තම්හා අපක්කමෙ'ති.

8. ජවසකුණජාතකං.

1. ඉද්ධිපත්තාය, ඉද්ධිප්පත්තාය – සී. මජසං.
2. මාසු – මජසං.
3. කුජ්ඣ – මජසං.
4. මොඝා – සයා.
5. පුරො පිලක්ඛු – මජසං. පරො පිලක්ඛො – සයා.
6. යම්හි – සී.
7. පටිකාරක – මජසං. අප්පටිකාරකං – සයා. කරස්සප්පටිකාරකං – සී.
8. යත්ථ – සයා.
9. සම්මුඛ – මජසං.
10. අනුසුය්‍ය – මජසං.

531. මහරජ ඉසුරුබර වූ (කලැ) ඉතිරියට මෙබඳු පමා දෙස් වෙති. දෙවයන් වහන්ස, සමාවන්නෝ මැනැවි. රජතුමනි, මේ සුජාතාවට නො කිපෙන්නෝ මැනැවි.

6. සුජාතා ජාතක යි.

532. බමුණ, සිත නැති නො ඇසෙන නොදන්න මෙය කැලගසක් බව දන්නේ ය. (එහෙත්) හැමදා වැයමෙන් හා සැල-කිල්ලෙන් සුවසේ නිදියේ දූ යි විචාරයි. එයට හෙතු කවරේ ද?

533. මේ ගස දූර දෙශයන්හි ද ප්‍රසිද්ධ ය. විශාල ය. සම බිමෙක පිහිටා ඇත. දෙවියන්ට නිවාසයෙකි. එහෙයින් මේ කැලගසේ යම් දෙවියෙක් වේ නම් ධනාශාවෙන් නමදිමි.

534. බමුණ, කළ ගුණ දන්නා මම මගේ ශක්තිප්‍රමාණයෙන් තට උපකාර කරන්නෙමි. ඔබගේ විමසීම් විසින් වාක්එන්දිත ද හැමදීම් ආදි කායඑන්දිත ද සත්පුරුෂයන් හමුවේ කෙසේ නිෂ්ඵල වේ ද?

535. තිඹිරිගසෙන් එපිට පළොල්ගස මුලැ වටා සාරා යාග වශයෙන් තැන්පත් කළ නිදන්සැළි ද හිමියෙක් නැති නිධානය ද ගන්න.

7. පලාස ජාතක යි.

536. මෘගරාජය, අපට යම් තරමක බලයක් වී ද ඒ පමණින් ඔබට වැඩ කෙළෙමු. ඔබට නමස්කාර වේවා! කිසිවක් ලබමෝ නම් මැනවි.

537. නිතියෙන් රුදුරුකම් කෙරෙමින් ලේ මස් කන මාගේ දත් අතරට ගොස් නො මැරී ජීවත් වීම ම තා ලද උපකාරය වේ.

538. කළගුණ නො දත් සිය කැමැත්තෙන් උපකාරයකුදු නො කරන උපකාර කළහුට ප්‍රත්‍යුපකාර නො කරන කෙනකු වේ නම්, කළ ගුණ යමකුට නො වේ නම් ඔහුගේ ආශ්‍රය නිෂ්ඵල ය.

539. යමකුගේ හමුවේ කළ ගුණයෙන් මිත්‍රධර්මය නො ලැබේ ද, (එකලැ) ඔහුට ඊර්ෂ්‍යා නො කොට නො දෙඩා සෙමෙන් ඔහුගෙන් ඉවත් වන්නේ ය.

8. ජවසකුණ ජාතක යි.

540. සබ්බමිදං[1] චරිමවතං උභො ධම්මං න පස්සරෙ,
උභො පකතියා චුතා යොචායං සජ්ඣාපයති[2].
යො ච ධම්මං අධීයති.

541. සාලීන භොජනං[3] භුඤ්ජෙ සුචිං මංසූපසෙචනං,
තස්මා එතං න සෙවාමි ධම්මං ඉසීහි සෙවිතං.

542. පරිබ්බජ මහා ලොකො[4] පචන්තඤ්ඤෙපි පාණිනො,
මා[5] තං අධම්මො ආචරිතො අස්මා කුම්භමිවාභිදා.

543. ධිරත්ථු තං යසලාභං ධනලාභඤ්ච බ්‍රාහ්මණ,
යා වුත්ති විනිපාතෙන අධම්මචරණෙන වා'ති.

9. ඡවකජාතකං[6].

544. සසමුද්දපරියායං මහිං සාගරකුණ්ඩලං
න ඉච්ඡෙ සහනින්දාය එවං සෙය්‍ය විජානහි.

545. ධිරත්ථු තං යසලාභං ධනලාභඤ්ච බ්‍රාහ්මණ'
යා වුත්ති විනිපාතෙන අධම්මචරණෙන වා.

546. අපි චෙ පත්තමාදාය අනාගාරො[7] පරිබ්බජෙ,
සායෙව[8] ජීවිකා සෙය්‍යො යා චාධම්මෙන එසනා.

547. අපි චෙ පත්තමාදාය අනාගාරො පරිබ්බජෙ,
අඤ්ඤං අහිංසයං ලොකෙ අපි රජ්ජෙන තං වරන්ති.

10. සෙය්‍යජාතකං.

විවරවග්ගො[9] පඨමො.

තස්සුද්දානං:

විවරඤ්ච අදෙය්‍යසමිද්ධවරං
අථ දද්දරපාපමහාතිරහො,
අථ කොලිපලාසවරඤ්ච කර
චරිමං සසමුද්දවරෙන දස.

---

1. සම්පදමිදං චරිමං කතං සබ්බං ඉදඤ්ච මිරිකතං – සයා.
2. මනතජ්ඣායති-යොච මන්තං අධීයති – සීමු.මජසං. මනොජ්ඣාපෙති – යොච මන්තං අධීයති – සයා.
3. ඔදනං මජසං. සයා.
4. බ්‍රහෙම – මජසං.
5. මා තං අධම්මො ආචරිතො. මාත්වං අධම්මාචරිතො මා ත්වං අධම්මා අචරි – සී. සයා.
6. ඡවජාතකං – සයා.
7. අනගාරො – මජසං.
8. සා එව – සීමු.
9. කලිඞ්ගවග්ගො – මජසං.

540. අප කළ හැමදෙය ම ලාමක ය. යමෙක් ධර්මය හඳුරවා ද යමෙක් ධර්මය හදුරා ද දෙදෙන ම පැරණි ධර්මය (සිරිත්) නො බලති. දෙදෙන ම ප්‍රකෘති ධර්මයෙන් ගිලිහුණෝ ය.

541. නන් අයුරින් පිළියෙළ කළ පවිත්‍ර මාංසසූපයන් සමග ඇල්හාලේ බත බුදිමි. එහෙයින් බුද්ධාදි උතුමන් සෙවි මෙ දහම නො සෙවීමි.

542. මෙතැනින් අන් තැනකට යව. ලෝකය විශාල ය. සෙසු සත්ත්වයෝ ද (කෑම) පිසත්. ගලක හැපී කළයක් බිඳෙන පරිදි හැසිරුණු තා අධර්මය නිසා නො නැසේවා.

543. බමුණ, ඒ යසස් ලැබීමට හා වස්තු ලැබීමට ද අපායෙහි වැටීමට හෙතුවන යම් නො දැහැමි පැවැත්මක් වේ ද එයට ද නින්ද වේවා.

9. ඡවක ජාතක යි.

544. දැහැන්සුව සහිත පැවිද්ද හැර දමා සාගරයට කුණ්ඩලාභරණයක් වැනි චක්‍රවාට පර්වත සහිත මහපොළොව (ලබාගන්නට) නො කැමැත්තෙමි. සය්හය, මෙසේ දැනගනුව.

545. බමුණ යශස් ලැබීමට ද වස්තු ලැබීමට ද අපායෙහි වැටීමට හෙතුවන යම් නො දැහැමි පැවැත්මක් වේ ද එයට ද නින්ද වේවා.

546. ගෘහ රහිත වූයෙම් පාත්‍රය ගෙන හාත්පස ගෙහි භික්ෂාටනය කෙළෙම් ද, යම් බඳු අධර්ම එෂණාවක් ඇද්ද එයට වඩා ඒ භික්ෂාටනයෙන් කරන ජීවිකාව ම උතුම්.

547. ලොවැ අනිකකු නො පෙළමින් අනගාරිකව පාත්‍රයක් ගෙන ගේ නැති ව පිඬු සිඟා යන්නෙම් නම් එය රාජ්‍යයට වඩා උතුම් වේ.

10. සය්හ ජාතක යි.

පළමුවන විවර වර්ග යි.

එහි උද්දනය:

දෙර විවර කරවයි කී චූළකාළිඞ්ග ජාතක යැ, අදෙයොයසු යනාදිය පැවසූ මහාඅස්සාරොහ ජාතක යැ, සමෘද්ධ කාමගුණ ඇති එකරාජ ජාතක යැ, යළි දද්දර ජාතක යැ, පාපකාරීහට රහස් නැති සේ කී සීලවීමංස ජාතක යැ, (කොලි) සුජාතා ජාතක යැ, පලාස ජාතක යැ, අකරමහසෙ යනාදිය කී ජවසකුණ ජාතක යැ, චරිමවත දක්වූ ඡවක ජාතක යැ, (සමුද්දවර) සය්හ ජාතකයෙන් දසය වේ.

2. පුචිමන්දවග්ගො

548. උට්ඨෙහි චොර කිං සෙසි කො අත්ථො සුපිනෙන තෙ,
මා තං ගහෙසුං[1] රාජානො ගාමෙ කිබ්බිසකාරකං.

549. යන්නු චොරං ගහෙස්සන්ති ගාමෙ කිබ්බිසකාරකං,
කිං තත්ථ පුචිමන්දස්ස වනෙ ජාතස්ස තිට්ඨතො.

550. න ත්වං අස්සත්ථ ජානාසි මම චොරස්ස චන්තරං,
චොරං ගහෙත්වා රාජානො ගාමෙ කිබ්බිසකාරකං
අප්පෙන්ති නිම්බසූලස්මිං තස්මිං මෙ සඞ්කතෙ මනො.

551. සඞ්කෙය්‍ය සඞ්කිතබ්බානි රක්ඛෙය්‍යානාගතං භයං,
අනාගතභයා ධීරො උභො ලොකෙ අවෙක්ඛතී'ති.

1. පුචිමන්දජාතකං.

552. අපි කස්සපමන්දියා යුවා සපති හන්ති වා,
සබ්බන්තං ඛමතෙ ධීරො පණ්ඩිතො තං තිතික්ඛති.

553. සචෙපි සන්තො විවදන්ති ඛිප්පං සන්ධියරෙ පුන,
බාලා පත්තාව භිජ්ජන්ති න තෙ සමථමජ්ඣගූ.

554. එතෙ භූය්‍යො සමායන්ති සන්ධි තෙසං න ජීරති,
යො චාධිපන්නං ජානාති යො ච ජානාති දෙසනං.

555. එසො හි උත්තරිතරො භාරවාහො ධුරද්ධරො,
යො පරෙසාධිපන්නානං සයං සන්ධාතුමරහතී'ති.

2. කස්සපමන්දියජාතකං.

556. යො තෙ හත්ථෙ ච පාදෙ ච කණ්ණනාසඤ්ච ඡෙදයි,
තස්ස කුජ්ඣ මහාවීර මා රට්ඨං විනස්සා ඉදං.

557. යො මෙ හත්ථෙ ච පාදෙ ච කණ්ණනාසඤ්ච ඡෙදයි,
චිරං ජීවතු සො රාජා න හි කුජ්ඣන්ති මාදිසා.

558. අහූ අතීතමද්ධානං[2] සමණො ඛන්තිදීපනො,
තං ඛන්තියායෙව ඨිතං කාසිරාජා අඡෙදයි.

1. මං ගණ්හෙය්‍යුං ගහෙසුං - ස්‍යා.
2. අතීතමද්ධානෙ - සීමු. මජසං ස්‍යා.

2. පුචිමන්‍ද වර්ගය

548. චෞරය නැඟිටුව. කුමට වැදහෙයි ද? වැදහීමෙන් තට කවර ප්‍රයොජනයෙක් ද ? ගමෙහි දරුණුකම් කළ තා රජදරුවෝ අල්ලා නො ගනිත්වා.

549. ගමෙහි දරුණුකම් කළ සොරා අල්ලා ගනිති. යන යමෙක් වේ ද (එයින්) වනයෙහි ඉපද සිටිනා වූ කොහොඹ ගසට එහි ලා කුමක් වේ ද?

550. අසවත්‍ථය, මාගේ ද සොරාගේ ද අතර (වෙනස) ඔබ නො දන්නෙහි ය. ගමේ අපරාධ කළ සොරහු රජදරුවෝ ගෙන කොහොඹ උලෙහි තබත්. මාගේ සිත එකරුණෙහි ලා සැක කෙරේ.

551. සැක කටයුත්තන් සැක කරන්නේ යැ. නො පැමිණි බිය රක්නේ යැ. අනාගත හය හෙතු කොටගෙන ප්‍රාඥයා දෙලොව බලයි.

1. පුචිමන්ද ජාතක යි.

552. කාශ්‍යපය, ළදරුවා ළදරු බව නිසා බැණීම හෝ පහර දීම හෝ කෙරෙයි. ඒ සියල්ල නුවණැත්තා ඉවසයි. පණ්ඩිතයා එය කමා කෙරෙයි.

553. ඉදින් (වනාහි) සත්පුරුෂයෝ විවාද කෙරෙත් නමුදු, වහා එකතු වෙති. නැවත බාලයෝ (මැටි) පාත්‍ර මෙන් බිඳෙති. ඔවුහු සන්හිඳීමට නො පැමිණෙත්.

554. යමෙක් තමා මැඩගෙන උපන් දොෂය දනී ද, යමෙක් වරද දෙසීම පිළිගන්නා සේ දනි. මොවුහු නැවත එකතු වෙති. ඔවුන්ගේ මිතුරුකම නො නැසේ.

555. යමෙක් දොෂයෙන් දූෂිත වූ මෙරමාගේ සන්‍ධානය කරන්නට (සමගි කරන්නට) තෙමේ සුදුසු වේ ද මෙතෙම වනාහි උත්තරීතර වෙයි. භාරොද්වහනය කරන්නේ ද වේ. ධුරන්ධර ද වෙයි.

2. කස්සපමන්දිය ජාතක යි.

556. මහාවීරයාණෙනි, යමෙක් ඔබගේ අත් පා කන් නාසා කැප්පි ද ඔහුට කිපෙන්නේ මැනැවි. මේ රට විනාස නො කරව.

557. යමෙක් මගේ අත් පා කන් නාසා කැප්පි ද ඒ රජ සැරදේවා! මා වැන්නෝ නො කිපෙත්.

558. අතීත කාලයේ ඉවැසීමේ අගය ප්‍රකාශ කරන ශ්‍රමණයෙක් විය. ඉවැසීමේ ම පිහිටි ඔහු කසී රජ ඡේදනය කරවී.

559. තස්ස කම්මස්ස ඵරුසස්ස විපාකො කටුකො අහු,
යං කාසිරාජා වෙදෙහි නිරයම්හි සමප්පිතො'ති.

3. ඛන්තිවාදිජාතකං.

560. දුජ්ජීවිතං අජීවිම්හ යෙ සන්තෙ න දදම්හසෙ,
විජ්ජමානෙසු භොගෙසු දීපං නාකම්හ අත්තනො.

561. සට්ඨි[1] වස්සසහස්සානි පරිපුණ්ණානි සබ්බසො,
නිරයෙ පච්චමානානං කද අන්තො භවිස්සති.

562. නත්ථි අන්තො කුතො අන්තො න අන්තො පතිදිස්සති,
තද හි පකතං පාපං මමං[2] තුය්හඤ්ච මාරිසා[3].

563. සොහං[4] නූන ඉතො ගන්ත්වා යොනිං ලද්ධාන මානුසිං,
වදඤ්ඤූ සීලසම්පන්නො කාහාමි කුසලං බහු'න්ති.

4. ලොහකුම්භිජාතකං.

564. ඵරුසා වත තෙ වාචා මංසං යාචනකො අසි,
කිලොමසදිසී වාචා කිලොමං සම්ම දදමි තෙ.

565. අඞ්ගමෙතං මනුස්සානං භාතා ලොකෙ පවුච්චති,
අඞ්ගස්ස සදිසී වාචා අඞ්ගං සම්ම දදමි තෙ.

566. තාතාති පුත්තො වදමානො කම්පෙති හදයං පිතු,
හදයස්ස සදිසී වාචා හදයං සම්ම දදමි තෙ.

567. යස්ස ගාමෙ සඛා නත්ථි යථාරඤ්ඤං තථෙව තං,
සබ්බස්ස සදිසී වාචා සබ්බං සම්ම දදමි තෙ'ති.

5. මාංසජාතකං.

568. සත්ත මෙ රොහිතා මච්ඡා උදකා ථලමුබ්භතා,
ඉදං බ්‍රාහ්මණ මෙ අත්ථි එතං භුත්වා වනෙ වස.

569. දුස්ස මෙ ඛෙත්තපාලස්ස රත්තිභත්තං[5] අපාභතං,
මංසසූලා ච ද්වෙ ගොධා එකඤ්ච දධිවාරකං;
ඉදං බ්‍රාහ්මණ මෙ අත්ථි එතං භුත්වා වනෙ වස.

---

1. සට්ඨිං – සීමු. සියා.
2. මම – සීමු. මජසං. සයා.
3. මාරිස – සීමු. සයා.
4. සොහි – සීමු.
5. රතන – සීමු. මජසං.

559. නිරයේ පිහිටි (හෙවත් උපන්) කසීරජ යම් දුකක් වින්දේ ද එය කර්කශ විය. එය පරුෂ වූ ඒ කර්මයාගේ විපාක යි.

3. ඛන්තිවාදී ජාතක යි.

560. යම්බඳු අපි වස්තු විද්‍යමාන කල්හි නො දුන්නමෝ ද එහෙයින් භොග ඇති කල්හි තමහට ප්‍රතිෂ්ඨාවක් නො කළමෝ ද මෙසේ නපුරු ජීවිකාවෙන් ජීවත් වූම්හ.

561. සර්වප්‍රකාරයෙන් අවුරුදු හැටදහසෙක් පිරිණ. නිරැහි පැසෙන (අපට) කවද (මේ දුකේ) කෙළවරෙක් වේ ද?

562. නිදුකාණෙනි, මා විසිනු දු තා විසිනු දු එකල්හි බොහෝ පාපකර්ම කරන ලද. මේ දුකෙහි කෙළවරෙක් නැත. කවර අවසානයෙක් ද? කෙළවරෙක් නො පැනේ.

563. ඒ මම මින් (සැව) ගොස් මිනිස් දිවියක් ලදින් ත්‍යාගශීලි වූයෙම් සිල්සපත් වූයෙම් ඒකාන්තයෙන් බොහෝ කුසල් කෙරෙමි.

4. ලොහකුම්භි ජාතක යි.

564. යහළුව ඉල්ලන්නෙක් වෙහි. එකැතින් ඔබේ වචන පරුෂ ය. තොපගේ වචන දළඹුවට (ශරීරයේ කොටසක්) සමාන ය. එහෙයින් තොපට දළඹුව දෙමි.

565. ලොකයේ මනුෂ්‍යයන්ට සහොදරයා යන මේ සම්මුතිය (ශරීරයේ) අංගයකැ යි කියනු ලැබේ. මිතුර තොපගේ වචන අංග සමාන ය. එහෙයින් තොප ශරීරාංගයක් දෙමි.

566. පුතා පියාය යි කියන්නේ පියාගේ හදවත කම්පා කෙරේ. තොපගේ තෙපුල් හදවතට සමාන ය. (කථාව මිහිරි ය.) එහෙයින් තොපට හෘදයමාංශය දෙමි.

567. යමකුගේ ගමෙහි මිතුරෙක් නැද්ද. ඒ මිතුරන් නැති ගම අරණ්‍යයක් වැනි ය. තොපගේ මධුර වචන තමා සතු සියලු වස්තුවට සමාන ය. එහෙයින් සියලු මස් ගැල ම තොපට දෙමි.

5. මාංස ජාතක යි.

568. බමුණ, දියෙන් ගොඩ ලූ රේමස්හු සත් දෙනෙක් ඇත. මේ මත්ස්‍යාහාර අනුභව කොට වනයෙහි වාස කරව.

569. අපට නුදුරෙහි තෙල කුඹුරු රක්නහුට රැබතට ගෙනා පැලහූ මස්හුල් දෙකක් ද තලගොයෙක් ද දීකිරි කළයෙක් ද ඇත. මෙය වළඳා වෙනෙහි වසන්න.

570. අම්බපක්කොදකං සීතං සීතච්ඡායං මනොරමං
ඉදං බ්‍රාහ්මණ මෙ අත්ථි එතං භුත්වා වනෙ වස.

571. න සසස්ස තිලා අත්ථි න මුග්ගා නපි තණ්ඩුලා,
ඉමිනා අග්ගිනා පක්කං මමං භුත්වා වනෙ වසාති.

6. සසජාතකං.

572. මතමතමෙව රොදථ
න හි තං රොදථ යො මරිස්සති,
සබ්බෙව සරීරධාරිනො
අනුපුබ්බෙන ජහන්ති ජීවිතං.

573. දෙවමනුස්සා චතුප්පද
පක්ඛිගණා උරගා[1] ච භොගිනො,
සම්හි සරීරෙ අනිස්සරා
රමමානාව ජහන්ති ජීවිතං.

574. එවඤ්චලිතං අසණ්ඨිතං
සුඛදුක්ඛං මනුජෙසු අපෙක්ඛිය,
කන්දිතරුදිතං නිරත්ථකං
කිං වො සොකගණාභිකිරරෙ.

575. ධුත්තා[2] සොණ්ඩා අකතා
බාලා[3] සූරා අයොගිනො,
ධීරං මඤ්ඤන්ති බාලොති
යෙ ධම්මස්ස අකොවිදාති.

7. මතරොදනජාතකං.

576. යන්තං වසන්තසමයෙ කණවෙරෙසු භානුසු,
සාමං බාහාය පීළෙසි සා තං ආරොග්‍යමබ්‍රවි.

577. අම්හො න කිර සද්ධෙය්‍යං යං වාතො පබ්බතං වහෙ,
පබ්බතඤ්චෙ වහෙ වාතො සබ්බම්පි පඨවිං වහෙ;
යත්ථ සාමා කාලකතා සා මං ආරොග්‍යමබ්‍රවි.

578. න චෙව සා කාලකතා න ච සා අඤ්ඤමිච්ඡති,
එකභත්තා කිර සාමා තමෙව අභිකඞ්ඛති.

---

1. අරච – සිමු.
2. ධුත්තාච – මජසං.
3. සූරාවීරා–මජසං

570. බමුණ, ඉදුණු අඹ පලයෙක් ද සිහිල් දිය ද මනරම් සිහිල් සෙවණ ද මට ඇත. මෙය වළඳා වෙනෙහි වාස කරව.

571. සාවකුට තල නැත. මුං සහල් නැත. මේ ගින්නෙන් පැලැහුණු මා වළඳා වෙනෙහි වාසය කරව.

6. සස ජාතක යි.

572. මළහු මළහු ගෙනැ ම හඬවූ. යමෙක් මියයන්නේ ද ඒ මරණනියතය ගැනැ නො හඬවු. සිරුරු දරන හැමදෙනම අනුක්‍රම-යෙන් තම තමන්ගේ දිවි හරනාහු වෙති.

573. දෙව්මිනිස්හු ද සිවුපාවෝ ද පක්ෂි සමූහයා ද භොග ඇත්තෝ ද සිය සිරුරෙහි ආධිපත්‍යය නැති ව තමතමන් උපන් අත්බැව්හිත් ඇලුම් ඇති ව දිවි හරනාහු වෙති.

574. මෙසේ තුන් භවයෙහි නිශ්චලතාවක් සංස්ථානයක් නැති-යෙන් සලිත වූ නො පිහිටි සැපදුක් මනුෂ්‍යයන් කෙරෙහි අපෙක්‍ෂා කොට ගෙන හැඬීම වැලපීම නිරර්ථක ය. ශොක රාශීහු තොප කුමට මැඩපියද්ද?

575. ධූර්තවූ ලේ වූ සිප්සතර පුරුදු නො කළා වූ මෝඩ වූ නො කටයුත්තෙහි ශූර වූ, ධර්මයෙහි අදක්‍ෂ වූ යම් කෙනෙක් වෙද්ද ඔව්හු මා මෝඩයෙකැ යි සිතති.

7. මතරොදන ජාතක යි.

576. වසන්ත කාලයේ රක්ත වර්ණය ඇති කණේරු වෙනෙහි දී ඔබ සාමා නමැති යම් ස්ත්‍රියක් බාහුයෙන් පෙළී ද ඕ තොමෝ තොපට අරොග බව කිව.

577. පින්වත, සුළඟ පර්වතයක් (තණපතක් සේ) පා කර හරින්නේ නම් එය විශ්වාස කළ නො හේ ම ය. ඉදින් සුළඟ පර්වතයක් පා කරා නම් පොළොව ද පා කරයි. යම් තැනෙකැ සාමා මරණයට පත් වූ ද ඕතොමෝ මට අරොග බව කිව යනු දූ නො විය හේ මැ යි.

578. සාමා කලුරිය නො කළා ය. ඕ තොමෝ අනිකකු නො කැමැත්තී ය. එකභක්තික වූ සාමා තොප ම පතන්නී ය.

579. අසන්ථුතං මං චිරසන්ථුතෙන
නිමීනි සාමා අධුවං ධුවෙන,
මයාපි සාමා නිමිනෙය්‍ය අඤ්ඤං
ඉතො අහං දූරතරං ගමිස්සන්ති.

8. කණවෙරජාතකං.

580. සුසුඛං වත ජීවාමි ලභාමි චෙව භුඤ්ජිතුං
පරිපන්ථෙ ච තිට්ඨාමි කාතු[1] භනෙන්ත ගති මම.

581. මනො චෙ තෙ න පනමති පක්ඛි පාපස්ස කම්මුනො,
අබ්‍යාවටස්ස භද්‍රස්ස න පාපමුපලිප්පති.

582. ඤාතකො නො නිසිනෙනාති බහූ ආගච්ඡතෙ ජනො,
පටිච්ච කම්මං ඵුසති තස්මිං මෙ සඞ්කතෙ මනො.

583. පටිච්ච කම්මං න ඵුසති මනො චෙ නප්පදුස්සති,
අප්පොස්සුක්කස්ස භද්‍රස්ස න පාපමුපලිප්පතී'ති.

9. තිත්තිරජාතකං.

584. සුවචං වත නවචි වාචාය අද්දං ගිරිං,
කිම්හි තස්සං වජන්තස්ස වාචා අද්ද පබ්බතං.

585. යං හි කයිරා තං හි වදෙ යං න කයිරා න තං වදෙ,
අකරොන්තං භාසමානං පරිජානන්ති පණ්ඩිතා.

586. රාජපුත්ත නමො ත්‍යත්ථු සච්චෙ ධම්මෙ ඨිතොවසි,
යස්ස තෙ ව්‍යසනං පත්තො සච්චස්මිං රමතෙ මනො.

587. යා දළිද්දී දළිද්දස්ස අඩ්ඪා අඩ්ඪස්ස කිත්තිමා,
ස හිස්ස පරමා භරියා සහිරඤ්ඤස්ස ඉත්ථියොති.

10. සුවචජාතකං.

පුචිමන්දවග්ගො දුතියො.

තස්සුද්දානං:

අථ චොරසකස්සපබ්බන්තිවරො
දුජ්ජීවිතතා ච වරාචරුසා,
අථ සසමතඤ්ච වසන්තසුඛං
සුවචං වත නවචිනා ච දස.

1. කාසු – මජසං කාසු – සී.

579. සාමා සංසර්ගයක් නො කළා වූ අසපීර වූ මා දිගු කලක් සංසර්ග කළ සපීර සැමියාගෙන් පිරිවට (හුවමාරු) කළා සාමා මා කරණකොටගෙන ද අනෙකකු පිරිවට ගන්නී ය. මම මෙතැනින්නුත් ඉතා ඈතට යන්නෙමි.

8. කණවෙර ජාතක යි.

580. ස්වාමීනි, එකාන්තයෙන් ඉතා සුවසේ ජීවත් වෙමි. කෑම ද ලබමි. එහෙත් උපද්‍රවයෙහි සිටිමි. මට කවර පිහිටක් ද?

581. පක්ෂිය, තොපගේ සිත පාපක්‍රියාවට නො නැමේ. පාප කර්මයෙහි නො යෙදෙන යහපත් පැවතුම් ඇති තොපට පාපය නො ඇලේ. (හෙවත් පාපයක් නැත.)

582. අපේ නෑයෙක් හුන්නේ යයි බොහෝ දෙනා (පක්ෂීහු) එති. මා නිසා ප්‍රාණඝාත අකුශලය ලබයි. මගේ සිත (මේ කරුණෙහි ලා) සැක කෙරේ.

583. ඉදින් තොපගේ සිත අදූෂිත නම් (වධක චෙතනා නැති නම්) තා නිසා ප්‍රාණඝාත කර්මය සිදු නො වේ. පාපකර්මයට උත්-සාහ රහිත වූ යහපත් පැවැත්ම ඇතියාට පාපය නො ඇලේ. (හෙවත් පාපය සිදු නො වේ.)

9. තිත්තිර ජාතක යි.

584. වචනමාත්‍රයෙන් දිය හැකි ව තිබියදී ද දෙන්නට පිළිවන් දෙය එකාන්තයෙන් නුදුන්නේ ය. වචනමාත්‍රයෙන් රන්මුවා පව්ව දෙන ඔහුට කවර හානියක් ද? එහෙත් වචනමාත්‍රයෙන් නුදුන්නේ ය.

585. යමක් කරන්නේ ද එය කියන්නේ ය. යමක් නො කරන්නේ ද එය නො කියන්නේ ය. දනාදි පුණ්‍යක්‍රියා නො කරන බොරු කියන්නවුන් පණ්ඩිතරු දැනගනිත්.

586. රාජපුත්‍රය, සත්‍යවචනයෙහි ද ස්වභාවධර්මයෙහි ද පිහිටි යම්බඳු ඔබ විපතට පැමිණියේ වුව ද (ඔබේ) සිත සත්‍යකතා-යෙහි ම ඇලේ. එහෙයින් තොපට නමස්කාර වේවා.

587. යම් ස්ත්‍රියක් දිළිඳු සැමියාට දිළිඳු බිරිඳ වී ද ධනවත් සැමියාට ධනවත් බිරිඳ වී ද කීර්තිය ඇති ඕ තොමෝ මොහුගේ උතුම් වූ බිරිඳ ය. රන්රුවන් ආදි ඉසුරු ඇතියහුට ස්ත්‍රීහු වෙති. (ඒ ආශ්චර්‍ය්‍ය නො වේ.)

10. සුච්චජ ජාතක යි.

දෙවෙනි පුචිමන්‍ද වර්ග යි.

එහි උද්දන:

සොරකු සඳහන් කරන පුචිමන්ද ජාතක යැ, කස්සපමන්දිය ජාතකය, සහිත උතුම් ක්ෂාන්තිවාදී ජාතක යැ, දූටය ජීවිත ඇති ලොහකුම්භි ජාතක යැ, පරුෂාදී වචන ඇති මංස ජාතක යැ, යළි සස ජාතක හා (මතංච) මත රොදන ජාතකය ද වසන්ත සමය කියන කණවෙර ජාතක යැ, (සුබං) තිත්තිර ජාතක යැ, සුච්චජ ජාතකයෙන් දසය වේ.

3. කුටිදූසකවග්ගො

588. මනුස්සස්සෙව තෙ සීසං හත්ථපාදා ච වානර,
අථ කෙන නු වණ්ණෙන අගාරං තෙ න විජ්ජති.

589. මනුස්සස්සෙව මෙ සීසං හත්ථපාදා ච සිඞ්ගිල,
යාහු සෙට්ඨා මනුස්සෙසු සා මෙ පඤ්ඤා න විජ්ජති.

590. අනවට්ඨිතචිත්තස්ස ලහුචිත්තස්ස දුබ්භිනො[1],
නිච්චං අද්ධුවසීලස්ස සුචිභාවො[2] න විජ්ජති.

591. සො කරස්සු අනුභාවං වීතිවත්තස්සු සීලියං.
සීතවාතපරිත්තාණං කරස්සු කුටිකං කපීති.

1. කුටිදූසකජාතකං.

592. දද්දභායති[3] භද්දන්තෙ යස්මිං දෙසෙ වසාමහං,
අහමෙතං න ජානාමි කිමෙතං දද්දභායති.

593. බෙලුවං පතිතං[4] සුත්වා දද්දභන්ති[5] සසො ජවි,
සසස්ස වචනං සුත්වා සන්තත්තා මිගවාහිනී.

594. අප්පත්වා පදවිඤ්ඤාණං පරඝොසානුසාරිනො,
පමාදපරමා බාලා තෙ හොන්ති පරපත්තියා.

595. යෙ ච සීලෙන සම්පන්නා පඤ්ඤායූපසමෙ රතා,
‘ආරකා විරතා ධීරා න හොන්ති පරපත්තියාති.

2. දද්දභජාතකං[7].

596. අචයං යාචනකො රාජ බ්‍රහ්මදත්ත නිගච්ඡති,
අලාභං ධනලාභං වා එවං ධම්මා හි යාචනා.

597. යාචනං රොදනං ආහු පඤ්චාලානං රථෙසභ,
යො යාචනං පච්චක්ඛාති තමාහු පටිරොදනං.

598. මා මද්දසංසු[8] රොදන්තං පඤ්චාලා සුසමාගතා,
තුවං වා පටිරොදන්තං තස්මා ඉච්ඡාමහං රහො.

---

1. දූභිනො – සීමු.
2. සුඛභාවො – සීමු.
3. දද්දූභායති – මජසං.
4. බෙලුවං නිපතිත – සීමු.
5. දභක්කන්ති – සීමු.
6. ආරතා – සීමු.
7. දුද්දුභ ජාතකං – මජසං
8. මා අද්දසසු – මජසං – සයා.

3. කුටිදූසක වර්ගය

588. වානරය, තොපගේ හිස ද අත්පාද මිනිසකුට සමාන ය. එසේ කලැ කවර නම් කාරණයෙකින් තොපට ගෙයක් නැත් ද?

589. සිංගිලය, මගේ හිස ද අත්පාද මනුෂ්‍යයකුගේ වැනි ය. මනුෂ්‍යයන් කෙරෙහි යමක් ශ්‍රෙෂ්ඨය යි කියත් ද, ඒ ශ්‍රෙෂ්ඨ වූ ප්‍රඥාව මට නැත.

590. එක අරමුණෙක නො පවත්නා වහා වෙනස්වන සිත් ඇති මිත්‍රද්‍රොහි වූ අස්ථිර ගති ඇත්තාට පවිත්‍ර බවක් නැත.

591. චතුර ප්‍රඥාව ලැබෙන උපායක් කරව. දුසිල් බව (නො හික්මුණු ගතිය) දුරු කරව. සීතවාත පරිත්‍රාණයට සමර්ථ කැදැල්ලක් කරව.

1. කුටිදූසක ජාතක යි.

592. ඔබට සෙතක් වේවා! මම යම් දෙසෙක වෙසෙම් ද එහි දද්දභ යන හඬ කෙරෙයි. මම ද මෙය නො දනිමි. කවර කරුණෙකින් දද්දභ යන මේ හඬ කෙරේ ද?

593. වැටුණු බෙලිගෙඩියේ හඬ අසා සාවා දද්දභ යයි (කියා දිව්වේ ය.) සාවාගේ වචනය අසා තැතිගත් දහස් ගණන් මෘග සෙනාව ද දිවූ.

594. විඥානපදයට නො පැමිණ (කනින් නො අසා) පරඝොෂය අනුව යන පරතොඝොෂ සඞ්ඛ්‍යාත ප්‍රමාදය පරම කොට ඇති ඒ අන්ධබාලයෝ අනුන්ගේ වචන හදහා කරන්නෝ වෙති.

595. යම් කෙනෙක් ආර්ය සීලයෙන් සමෘද්ධ වූවාහු මාර්ග ඥානයෙන් කෙලෙසුන් සන්හිඳුවා ලීමෙහි ඇලුණාහු වෙත්ද පාප ක්‍රියායෙන් දුරු වූ වෙන් වූ ඒ පණ්ඩිතයෝ ප්‍රත්‍යක්‍ෂ බැවින් මෙරමා බස් විශ්වාස නො කෙරෙති.

2. දද්දභ ජාතක යි.

596. බඹදත් රජතුමනි, යාච්ඤා කරන්නේ වස්තුව ලැබීමට හෝ නො ලැබීමට යන මේ දෙකට පැමිණෙයි. යාච්ඤාව මෙබඳු ස්වභාව ඇත්තේ ය.

597. පංචාලෙශ්වරය, ඉල්ලීම හැඬීමකැ යි පුරාතනයෝ කීහ. යමෙක් ඉල්ලීම ප්‍රතික්‍ෂෙප කෙරේ ද එය පෙරළා හැඬීමකැ යි කීහ.

598. රැස්ව සිටින පංචාලරට වැසියෝ හඬන මා ද පෙරළා හඬන ඔබ ද නො දකිත්වා. එහෙයින් මම රහස් කැමැත්තෙමි. (හෙවත් රහසිගත ව සිටිනු කැමැත්තෙමි.)

599. දදමි තෙ බ්‍රාහ්මණ රොහිණීනං
ගවං සහස්සං සහ පුඞ්ගවෙන,
අරියො හි අරියස්ස කථං න දජ්ජා[1]
සුත්වාන ගාථා තව ධම්මයුත්තා'ති.

3. බ්‍රහ්මදත්තජාතකං.

600. කල්‍යාණරූපො වතයං චතුප්පදො
සුභද්දකො චෙව සුපෙසලො ච,
යො බ්‍රාහ්මණං ජාතිමන්තූපපන්නං
අපචායති මෙණ්ඩවරො යසස්සී.

601. මා බ්‍රාහ්මණ ඉත්තරදස්සනෙන
විස්සාසමාපජ්ජි චතුප්පදස්ස,
දළ්හප්පහාරං අභිකඞ්ඛමානො
අපසක්කති[2] දස්සති සුප්පහාරං.

602. ඌරට්ඨි භග්ගං පතිතො බාරිභාරො[3]
සබ්බං භණ්ඩං බ්‍රාහ්මණස්සීධ භින්නං,
බාහාපග්ගය්හ කන්දති.
අභිධාවථ හඤ්ඤතෙ බ්‍රහ්මචාරී

603. එවං සො නිහතො සෙති යො අපූජං නමස්සති,[4]
යථාහමජ්ජ පහටො හතො මෙණ්ඩෙන දුම්මතී'ති.

4. චම්මසාටකජාතකං.

604. සමණං තං මඤ්ඤමානො උපගඤ්ඡිං අසඤ්ඤතං,
සො මං දණ්ඩෙන පාහාසි යථා අස්සමණො තථා.

605. කිං තෙ ජටාහි දුම්මෙධ කිං තෙ අජිනසාටියා,
අබ්භන්තරං තෙ ගහනං බාහිරං පරිමජ්ජසි.

606. එහි ගොධ නිවත්තස්සු භුඤ්ජ සාලීනමොදනං,
තෙලං ලොණඤ්ච මෙ අත්ථි පහූතං [5]මය්හ පිප්ඵලි.

607. එස භිය්‍යො පවෙක්ඛාමි වම්මිකං සතපොරිසං,
තෙලං ලොණඤ්ච කිත්තෙසි අහිතං මය්හ පිප්ඵලීති.

5. ගොධජාතකං.

608. කායෙන යො නාවහරෙ වාචාය න මුසා භණෙ,
යසො ලද්ධා න මජ්ජෙය්‍ය[6] ස වෙ කක්කාරුමරහති.

---

1. දජ්ජා – මජ්සං.
2. අවසක්කති – සීමු, ස්‍යා.
3. ඌරුට්ඨි භග්ගං පවට්ටිතො බාරිභාරො – සබ්බංභණ්ඩං බ්‍රාහ්මණස්ස භින්නං.
බාහාය පග්ගය්හ කන්දති- අභිධාවථ හඤ්ඤතෙ බ්‍රහ්මචාරී – මජ්සං.
ඌරට්ඨිභග්ගා පතිතො බාරිභාරො-සබ්බංභණ්ඩං බ්‍රාහ්මණස්සෙව භින්නං
උභොපි බාහා පග්ගය්හෙව කන්දති-අභිධාවථ හඤ්ඤති බ්‍රහ්මචාරිං ස්‍යා.
4. පසංසති – සීමු.
5. මය්හං පිප්ඵලි– මජ්සං.
6. මජ්ජෙය්‍යු. – මජ්සං, ස්‍යා

599. බමුණ, වෘෂභයකු හා රතුදෙනුන් දහසක් තොපට දෙමි. **සහෙතුකව** (ඔබ) කී ගාථාවන් අසා ආර්යයෙක් ආර්ය වූ තොපට **කුමක්** හෙයින් නො දෙන්නේ ද?

3. බ්‍රහමදත්ත ජාතක යි.

600. යශස්වී වූ යම් බැටළුවෙක් උතුම් ජාතිය හා මන්ත්‍රයෙන් යුතු (මන්ත්‍ර දන්නා) බ්‍රාහමණයාට ගරු කෙරේ ද (මේ ගුණයෙන් යුතු) මේ සිවුපාවා ඉතා යහපත් ගති ඇත්තේ උත්තම වූයේ ද භික්මුණේ ද වේ.

601. බමුණ, සිවුපාවා දුටුපමණින් විශ්වාස නො කරව, දැඩි පහරක් දෙනු කැමැති ව පසුබසී. දැඩි පහරක් දෙන්නේ ය.

602. කලවා ඇටය කැඩිණි. තවුස්පිරිකර වැටිණි. තවුසාගේ තවුස්පිරිකර සියල්ල කැඩී බිඳී ගියේ ය. තවුසා නසනු ලැබේ. තෙපි ඉදිරියට දුවව යි (පිරිස කියමින්) දෙ අත් නගා ගෙන **හඬයි.**

603. නුවණ නැති මම අද බැටළුවා විසින් පහර දෙන ලදුව යම්සේ නටුයෙමි ද එසේ යමෙක් පූජාර්හ නො වූවහුට නමදී ද හෙතෙම මැරී හෝනේ යි.

4. වම්මසාටක ජාතක යි.

604. අසංයත වූ තා ශ්‍රමණයෙකැ යි සිතමින් ළඟට ආවෙමි. හෙතෙම අශ්‍රමණයකු මෙන් මට දණ්ඩකින් පහර දුනි.

605. **අඥානය,** තට ජටා කුමට ද? තට අඳුන් දිවිසම් කුමට ද? තාගේ අභ්‍යන්තරය කෙලෙසුන්ගෙන් ගහන ය. එසේ වුව ද (සිරුර) ඔප කරන්නෙහි ය.

606. ගොධය, මෙහි එව නවතුව, ඇල්හාලේ බත බුදිනු. (තවත්) බොහෝ තලතෙල්, ලුණු, වගපුල් මට ඇත.

607. ඒ මම සතපොරිස ප්‍රමාණ වූ තුඹසකට යළිත් ඇතුළු වෙමි. තලතෙල් ලුණු ඇතැ යි කියහි. වගපුල් ආදිය මට අපථ්‍ය යි.

5, ගොධ ජාතක යි.

608. යමෙක් කයින් සොරකම් නො කරේ ද, වචනයෙන් බොරු නො කියා ද, යශස් ලැබැ මත් නො වේ ද, හෙතෙම එකාන්තයෙන් දිව කැකිරිමල් පළඳින්නට සුදුසුය.

609. ධම්මෙන විත්තමෙසෙය්‍ය න නිකත්‍යා ධනං හරෙ,
භොගෙ ලද්ධා න මජ්ජෙය්‍ය ස වෙ කක්කාරුමරහති.

610. යස්ස චිත්තං අහාලිද්දං සද්ධා ච අවිරාගිනී,
එකො සාදුං න භුඤ්ජෙය්‍ය ස වෙ කක්කාරුමරහති.

611. සම්මුඛා වා පරොක්ඛා[1] වා යො සන්තෙ න පරිභාසති,
යථාවාදී තථාකාරී ස වෙ කක්කාරුමරහතීති.

6. කක්කාරුජාතකං.

612. වාති චායං තතො ගන්ධො යත්ථ මෙ වසතී පියා,
දූරෙ ඉතො හි කාකාති යත්ථ මෙ නිරතො මනො.

613. කථං සමුද්ද මතරි කථං අතරි[2] කෙබුකං,
කථං සත්ත සමුද්දනි කථං සිම්බලිමාරුහි.

614. තයා සමුද්දමතරිං තයා අතරි කෙබුකං,
තයා සත්ත සමුද්දනි තයා සිම්බලිමාරුහිං,

615. ධිරත්ථු මං මහාකායං ධිරත්ථු මං අචෙතනං,
යත්ථ ජායායහං ජාරං ආවහාමි වහාමි චාති.

7. කාකාතිජාතකං.

616. බහූනනං විජ්ජති භොතී තෙහි කිමෙව භවිස්සති,[3]
තස්මා එතං න සොචාමි පියං සම්මිල්ලභාසිනිං.[4]

617. තං තඤ්ච අනුසොචෙය්‍ය[5] යං යං තස්ස න විජ්ජති,
අත්තානමනුසොචෙය්‍ය සදා මච්චුවසං ගතං.[6]

618. නහෙව ඨිතං නාසීනං න සයානං න පද්ධගුං,
යාව පාති නිම්මිසති තත්‍රාපි සරතී වයො.

619. තත්ථත්තනි[7] වතපද්ධෙ විනාභාවෙ අසංසයෙ,
භූතං සෙසං දයිතබ්බං වීතං අනනුසොචියතති.[8]

8. අනනුසොචියජාතකං.

---

1. තිරොක්ඛා වා – සීමු.
2. පතරි – සීමු.
3. තෙහි මෙ කිං භවිස්සති – සීමු.
4. සම්පිලා භාසිනිං – මජසං.
5. තංතං අනුසොචෙය්‍යං – මජසං.
6. සදා මච්චුවසං පත්තං – මජසං
7. තත්ථාත්තනි – සීමු. වාතපාතෝ සය්‍යා – තත්ථත්තනි වත බන්ධා – මජසං.
8. මතං තං – මජසං. – අනනුසොචියං.

609. දැහැමින් ධනය සපයන්නේ ය. කපටි ක්‍රමෙන් ධනය රැස් නො කරන්නේය. වස්තුව ලැබැ මත් නොවන්නේ ය. හෙතෙම ඒකාන්තයෙන් දිවකැකිරිමල් පළඳින්නට සුදුසු ය.

610. යමකුගේ සිත කහපැහැය සේ ඉක්මණින් වෙනස් නො වේ ද ස්වල්ප හෙතුවක් නිසා ශ්‍රද්ධාව නො බිඳේ ද රසවත් ආහර ලැබැ තනි ව නො බුදී ද හෙතෙම ඒකාන්තයෙන් කැකිරිමල් පළඳන්නට සුදුසු ය.

611. යමෙක් අභිමුඛයේ හෝ අනභිමුඛයේ සත්පුරුෂයන්ට පරිභව නො කෙරේ ද යථාවාදී තථාකාරී වේ ද හෙතෙම ඒකාන්තයෙන් කැකිරිමල් පළඳින්නට සුදුසු ය.

6. කකකාරු ජාතක යි.

612. යම් ගුරුළු භවනයෙකැ මගේ ප්‍රියාව වාස කෙරේ ද එයින් මේ සුවඳ හමයි. යමක් කෙරෙහි මගේ සිත ඇලුණේ ද ඒ කාකාතිය මෙයින් ඈත ය.

613. මුහුද තරණය කෙළේ කෙසේ ද, කෙබ්බුක ගංගාව තරණය කෙළේ කෙසේ ද, සත් සමුදුර තරණය කෙළේ කෙසේ ද, ඉඹුල් ගසට කෙසේ නැංගේ ද?

614. තා නිසා මුහුද තරණය කෙළෙමි. තා නිසා කෙබ්බුක ගඟ තරණය කෙළෙමි. තා නිසා සත්සමුදුර තරණය කෙළෙමි. තා නිසා ඉඹුල්ගසට නැංගෙමි.

615. යම් හෙයෙකින් මාගේ ප්‍රියාවගේ සොරසැමියා මම යම් තැනෙක උසුලා ගෙන ගියෙම් ද, යලිත් උසුලා ගෙන ආවෙම් ද, මහත් සිරුර ඇති මට නින්ද වේවා. සිරුර විශාල බැවින් සැහැල්ලු බව හා බර බව නො දැනෙන මට නින්ද වේවා.

7. කාකාතී ජාතක යි.

616. මේ පින්වතී (අප හැර දන්) බොහෝ වූ මළවුන් අතරේ ඇත. ඔවුන් හා වෙසෙන තෙල තැනැත්තී මට කවරක් වන්නී ද? එහෙයින් ප්‍රිය වූ තෙල සම්මිලභාසිනියට ශොක නො කරමි.

617. ඉදින් ඒ ශොක කරන්නහුගේ යම් යම් දැයක් නිරුද්ධ වී ද, ඒ ඒ දැය ගෙන ශොක කෙරේ නම් හැම මොහොතක ම මරු වසඟයට යන්නා වූ තමා ගැන ද ශොක කරන්නේ යැ.

618. ආයුසංස්කාරය සිටින්නහු අනුව නො නැවැතී යයි. හුන්නහු අනුව නො නැවැතී යයි. සයනය කරන්නහු අනුව නො නැවතී යයි වැදහෙව සිටින්නහු අනුව නො නැවතී යයි. ඇසිපිය හෙළන තරම් සුලු කාලය තුළ දී ද වයස ගෙවී යයි.

619. එහි ලා තමා (වයසින්) අර්ධ වැ සිටි කල්හි (ජීවිතයෙන්) වෙන්වීම නිසැක කල්හි සෙසු ජීවීන් ගැන මෛත්‍රී කළයුතු යැ. මළහු ගෙනැ ශොක නො කටයුතු.

8. අනනුසොචිය ජාතක යි.

620. යං අන්නපානස්ස පුරෙ ලභාම
තං දානි සාඛාමිගමෙව ගච්ඡති,
ගච්ඡාම දානි වනමෙව රාධ
අසක්කතා චස්ම ධනඤ්ජයාය.[1]

621. ලාභො අලාභො අයසො යසො ච
නින්දා පසංසා ච සුඛඤ්ච දුක්ඛං,
එතෙ අනිච්චා මනුජෙසු ධම්මා
මා සොචි කිං සොචසි පොට්ඨපාද.

622. අද්ධා තුවං පණ්ඩිතකොසි රාධ
ජානාසි අත්ථානි අනාගතානි,
කථන්නු සාඛාමිගං දක්ඛිසාම
නිද්ධාපිතං රාජකුලතොව ජම්මං.

623. චාලෙති කණ්ණං භකුටිං කරොති
මුහුං මුහුං භායයතෙ කුමාරෙ,
සයමෙව තං කාහති කාළබාහු
යෙනාරකා ඨස්සති අන්නපානාති.

9. කාළබාහුජාතකං.

624. සීලං කිරෙව කල්‍යාණං සීලං ලොකෙ අනුත්තරං,
පස්ස ඝොරවිසො නාගො සීලවාති න හඤ්ඤති.

925. යාවදෙවස්සහූ කිඤ්චි තාවදෙව අඛාදිසුං,
සඞ්ගම්ම කුලලා ලොකෙ න හිංසන්ති අකිඤ්චනං.

626. සුඛං නිරාසා සුපති ආසා ඵලවතී සුඛා,
ආසං නිරාසං කත්වාන සුඛං සුපති පිඞ්ගලා.

627. න සමාධිපරො අත්ථි අස්මිං ලොකෙ පරම්හි ච,
න පරං නාපි අත්තානං විහිංසති සමාහිතො'ති.

10. සීලවීමංසජාතකං.

කුටිදූසකවග්ගො තතියො.

තස්සුද්දානං:

සමනුස්ස සදද්දභ යාචනකො
අථ මෙණ්ඩවරුත්තම ගොධවරො,
අථ කාය සකෙබුක භොතිවරො
අථ රාධ සුසීලවරෙන දස.

---

1. ධනඤ්ජයායං – මජසං

620. රාධයෙනි, පෙර මේ රජු සමීපයෙන් යම් ආහාරපානයක් ලබමෝ ද, දැන් එය වඳුරකු කරා යයි. එහෙයින් ධනංජය රජු විසින් නො සලකා හරන ලදුවම්හ. දැන් වනයට ම යම්හ යි.

621. පොට්ඨපාදය, ලාභ, අලාභ, අයස, යස, නින්‍දා, ප්‍රශංසා, සුව, දුක් යන මේ අටලෝදහම් මිනිසුන් කෙරෙහි අනිත්‍ය වේ. ශොක නොකර කුමට ශොක කෙරෙහි ද?

622. රාධයෙනි, තෙපි ඒකාන්තයෙන් පණ්ඩිතයවු. මතු වන්නා වූ දෙය දන්නහු ය. රජ මැදුරෙන් පලවා හැරි හීන වඳුරා කෙසේ දකිමු ද?

623. කන සොලවයි. බැම බිඳියි. මොහොතින් මොහොත රජ කුමරුවන් බිය ගන්වයි. ආහාරපානයෙන් ඉවත්වී සිටින හෙයින් කාළබාහු වඳුරා තෙමේ ම එය කරන්නේ ය.

9. කාළබාහු ජාතක යි.

624. ලොකයෙහි සීලය යහපත් ය. සීලය නිරුත්තර ය. (හෙවත් සීලයට වඩා උසස් ගුණයෙක් නැත.) බලව, දරුණු විෂ සහිත නාගයා පවා සිල්වත් ය යි නසනු නො ලැබේ.

625. යම්තාක් මේ උකුස්සාගේ මුඛයෙහි කන දෙයක් වී ද ඒ තාක් උකුස්සෝ එකතු වැ කෑහ. ලොවැ කිසිත් නැත්තහුට (කිසිකෙනෙක්) හිංසා නො කෙරෙත්.

626. ආසා නැත්තී සුවසේ නිදන්නී ය. බලවත් වූ ආසාව සුවයට හෙතු වේ. පිංගලා නම් දාස්ස ආසාව නසා සුවසේ නිදන්නී ය.

627. මෙලොව ද පරලොව ද සමාධියට වඩා උසස් අන් සුවයෙක් නැත. එකඟ සිතැත්තේ අනුන්ට ද තමන්ට ද හිංසා නො කරයි.

10. සීලවීමංසක ජාතක යි.

නෙවන කුටිදූසක වර්ග යි.

එහි උද්දානය:

වඳුරා මිනිසුන්ට සමය යි පැවැසූ කුටිදූසක ජාතක යැ, දද්දභ ජාතක ය සහිත යාචනය දක්වන බ්‍රහ්මදත්ත ජාතක යැ, යළි මෙණ්ඩියා උතුමැයි කී චම්මසාටක ජාතක යැ, ගොධ ජාතක යැ, යළි කාප සුචරිතාදිය කියන කක්කාරු ජාතක යැ, කෙබුක නදය ඇති කාකාතී ජාතක යැ, (හොතිවරො) අනනු සොචිය ජාතක යැ, රාධ නම් ගිරවා ඇති කාළබාහු ජාතකය හා උතුම් සීල වීමංස ජාතකයෙන් දසය වේ.

4. කොකාලික වග්ගො

628. යො වෙ කාලෙ අසම්පත්තෙ අතිවෙලං පභාසති,
එවං සො නිහතො සෙති කොකිලායිව අත්‍රජො.

629. න හි සත්ථං සුනිසිතං විසං හලාහලං ඉව,
එවං නිකට්ඨෙ[1] පාතෙති වාචා දුබ්භාසිතා යථා.

630. තස්මා කාලෙ අකාලෙ ච වාචං රක්ඛෙය්‍ය පණ්ඩිතො,
නාතිවෙලං පභාසෙය්‍ය අපි අත්තසමම්හි වා

631. යො ච කාලෙ මිතං භාසෙ මතිපුබ්බො විචක්ඛණො,
සබ්බෙ අමිත්තෙ ආදෙති සුපණ්ණො උරගං ඉවා'ති .

1. කොකාලිකජාතකං.

632. අපි හන්ත්වා හතො බ්‍රෑති ජෙත්වා ජිතොති භාසති,
පුබ්බමක්ඛායිනො රාජ එකදත්‍ථුං[2] න සද්දහෙ.

633. තස්මා පණ්ඩිතජාතියො සුණෙය්‍ය ඉතරස්ස පි,
උභින්නං වචනං සුත්වා යථා ධම්මො තථා කරෙ.

634. අලසො ගිහී කාමභොගී න සාධු
අසඤ්ඤතො පබ්බජිතො න සාධු,
රාජා න සාධු අනිසම්මකාරී
යො පණ්ඩිතො කොධනො තං න සාධු.

635. නිසම්ම ඛත්තියො කයිරා නානිසම්ම දිසම්පති,
නිසම්ම කාරිනො [3]රාජ යසො කිත්ති ච වඩ්ඪතී'ති.

2. රථලට්ඨිජාතකං.

636. තදෙව මෙ ත්වං විදිතො වනමජ්ඣෙ රථෙසභ,
යස්ස තෙ ඛග්ගබද්ධස්ස[4] සන්නද්ධස්ස තිරීටිනො
අස්සත්ථදුමසාඛාය පක්කා[5] ගොධා පලායථ.

637. නමෙ නමන්තස්ස භජෙ භජන්තං
කිච්චානුකුබ්බස්ස කරෙය්‍ය කිච්චං,
නානත්ථකාමස්ස කරෙය්‍ය අත්ථං
අසම්භජන්තම්පි න සම්භජෙය්‍ය.

---

1. නිකට්ඨෙ – සීමු. නිකක්කෙ – සයා
2. එකදත්‍ථු – සීමු. අඤ්ඤදත්‍ථු – මජසං
3. රඤ්ඤෙ සද – සීමු.
4. බන්ධස්ස – සීමු.
5. පක්කගොධා. – සීමු. මජසං

4. කොකාලික වර්ගය

628. යමෙක් කථා කළයුතු කාලය නො පැමිණි කල්හි පමණට වඩා කථා කෙරේ ද හෙතෙම කෝකිලාවගේ පුත්‍රයා මෙන් මැරී මෙසේ හෝනේ වෙයි.

629. යම්සේ හලාහල විෂයක් මෙන්, දුබැසි වදන් දිවි නසා ද මැනැවින් මුවත් තැබූ අවිය ද එසේ ජීවිත නො නසයි.

630. එ හෙයින් (කථාවට) කල්හි ද නො කල්හි ද නුවණැත්තේ වචනය රක්නේ ය. (සීමිත ව කතා කරන්නේ ය) තමා හා සමානයකු සමග වුව ද පමණ ඉක්මවා කතා නො කරන්නේ ය.

631. නුවණ පෙරදැරි වූ විචක්ෂණ වූ යමෙක් සුදුසු අවස්ථාවෙහි ප්‍රමාණවත් ව කථා කෙරේ ද හෙතෙම ගුරුළා සර්පයකු අල්ලා ගත්තා සේ සතුරන් අල්ලන්නේ ය.

1. කොකාලික ජාතක යි.

632. තෙමේ පහර දී අනුන් විසින් පහර දෙන ලදිමි යි කියයි. තෙමේ අනුන් පරදා අනුන් විසින් පරදවන ලදිමි යි කියයි. රජතුමනි, පළමුව කීවහුගේ වදන් ඒකාන්තයෙන් විශ්වාස නො කරන්නේ මැනැවි.

633. එහෙයින් පණ්ඩිත ස්වභාව ඇති රජතුමා අනිකාගේ කීම ද අසන්නේ ය. දෙදෙනාගේ කීම අසා සුදුසු පරිදි විනිශ්චය කරන්නේ ය.

634. සම්පත් කැමැති අලස ගිහියා නො මැනැවි, හික්මීමක් නැති පැවිද්ද නො මැනැවි, පරීක්ෂාවෙන් තොරව ක්‍රියා කරන රජ නො මැනැවි, යම් පණ්ඩිතයෙක් කිපෙන සුලු වේ නම් හේ ද නො මැනැවි.

635. දිසම්පති රජතුමනි, ක්ෂත්‍රියයා විමසා ක්‍රියා කරන්නේ ය, කරන දෙය නො විමසා නො කරන්නේ ය, විමසා කරන්නහුගේ පරිවාරාදි යසස ද කීර්තිය ද වැඩේ.

2. රථලට්ඨි ජාතක යි.

636. රජතුමනි, කඩුව දරා සන්නද්ධ වැ රිටිසුඹුලු හඳනා වූ තොපගේ පැලැහූ ගොයා වනමැද ඇසැතු රුක්හි ශාඛායෙන් පලාගියා වේ ද, එදවස් මැ මා විසින් තෙපි දන්නා ලද්දහු යැ.

637. යමෙක් තමා දෙස නැමේ ද ඔහුට මැ තෙමේ ද නැමෙන්නේ ය. තමා භජනය කරන්නහු තෙමේ ද භජනය කරන්නේ ය. තමහට අනුකූල වැ ක්‍රියා කරන්නහුට සුදුසු කෘත්‍යයක් තෙමේ ද තමහට අනර්ථ කැමැත්තාහට තෙමේ ද අර්ථයක් නො කරන්නේ ය. තමා ළඟට නො එන්නවුන් කරා තෙමේ ද නො යන්නේ ය.

638. චජෙ චජන්තං වනථං න කයිරා
අපෙතචිත්තෙන න සම්භජෙය්‍ය,
ද්විජො දුමං ඛීණඵලන්ති[1] ඤත්වා
අඤ්ඤං සමෙක්ඛෙය්‍ය මහා හි ලොකො.

639. සො තෙ කරිස්සාමි යථානුභාවං
කතඤ්ඤුතං ඛත්තියෙ පෙක්ඛමානො,
සබ්බඤ්ච තෙ ඉස්සරියං දදාමි
යස්සිච්ඡසි තස්ස තුවං දදාමීති.

3. පක්කගොධජාතකං.

640. ගවඤ්චෙ තරමානානං ජිම්හං ගච්ඡති පුඞ්ගවො,
සබ්බා තා ජිම්හං ගච්ඡන්ති නෙත්තෙ ජිම්හං ගතෙ සති.

641. එවමෙව මනුස්සෙසු යො හොති සෙට්ඨසම්මතො,
සො චෙ අධම්මං චරති පගෙව ඉතරා පජා
සබ්බං රට්ඨං දුඛං සෙති රාජා චෙ හොති අධම්මිකො.

642. ගවඤ්චෙ තරමානානං උජුං ගච්ඡති පුඞ්ගවො,
සබ්බා තා උජුං ගච්ඡන්ති නෙත්තෙ උජුගතෙ සති.

643. එවමෙව මනුස්සෙසු යො හොති සෙට්ඨසම්මතො,
සො චෙපි ධම්මං චරති පගෙව ඉතරා පජා
සබ්බං රට්ඨං සුඛං සෙති රාජා චෙ හොති ධම්මිකො'ති.

4. රාජොවාදජාතකං.

644. බ්‍රහා පවඩ්ඪකායො[2] සො දීඝදාඨො ච ජම්බුක,
න ත්වං තම්හි කුලෙ ජාතො යත්ථ ගණ්හන්ති කුඤ්ජරං.

645. අසීහො සීහමානෙන යො අත්තානං විකුබ්බති,
කොත්ථූව[3] ගජමාසජ්ජ සෙති භූම්‍යා අනුත්ථුනං.

646. යසස්සිනො උත්තමපුග්ගලස්ස
සඤ්ජාතඛන්ධස්ස මහබ්බලස්ස,
අසමෙක්ඛිය ථාමබලූපපත්තිං
ස සෙති නාගෙන හතොව[4] ජම්බුකො.

647. යො චිධ කම්මං කුරුතෙ පමාය
ථාමබලං අත්තනි සංවිදිත්වා,
ජප්පෙන මන්තෙන සුභාසිතෙන
පරික්ඛවා සො විපුලං ජිනාතී'ති.

5. ජම්බුකජාතකං.

1. ඛීණඵලංව – සීමු.
2. පවද්ධකායො – මජ්සං.
3. කුත්ථූව – සීමු.
4. හතොයං – මජ්සං, සයා.

638. තමා හරනහු තෙමේ ද හරනේ යැ. (ඔහුට) ආශා නො කරන්නේ ය. නො ඇලුණු සිතින් භජනය නො කරන්නේ යැ. පක්ෂියා ගස ගෙඩි රහිත බව දැනැ ගෙඩි ඇති අන් ගසක් සොයා යන්නේ ය. ලොව විශාල වේ මැ ය.

639. ක්ෂත්‍රියාවනි, කළ ගුණ සලකන මම ශක්ති පමණින් තිට උපකාර කරන්නෙමි. තිට සියලු සම්පත් දෙමි. තෝ යමකුට යමක් දෙනු කැමැත්තෙහි ද ඔහුට දෙව.

3. පක්කගොධ ජාතක යි.

640. ගඟ තරණය කරන ගවයන් අතුරෙහි ප්‍රධාන ගවයා වක්ව යේ ද, ප්‍රධාන ගවයා වක් වැ ගිය කලැ සියලු ගවයෝ වක් වැ යෙති.

641. එපරිද්දෙන් මනුෂ්‍යයන් අතරේ යමෙක් ශ්‍රෙෂ්ඨ යයි සම්මත වේ ද, ඉදින් හේ නො දැහැමි ව හැසිරේ ද (ක්‍රියා කෙරේ ද) සෙස්සන් ගැන කවර කථා ද? ඉදින් රජතුමා අධාර්මික වේ ද (එකල) රටවැසි සියලුදෙන දුකින් හෝනේ යි.

642. ගඟ තරණය කරන ගවයන් අතුරෙහි ප්‍රධාන ගවයා ඍජු ව පීනා යේ ද, ප්‍රධාන ගවයා ඍජු වැ පීනා යන කලැ සියලු ගවයෝ ඍජු ව යෙති.

643. එ පරිද්දෙන් මනුෂ්‍යයන් අතුරෙහි යමෙක් ශ්‍රෙෂ්ඨ යයි සම්මත වේ ද ඉදින් හේ දැහැමි ව ක්‍රියා කෙරේ ද සෙස්සන් ගැන කවර කථා යැ? ඉදින් රජතුමා දැහැමි වේ ද (එකල) රටවැසි සියලු දෙනා සුවසේ හොනේ යි.

4, රාජොවාද ජාතක යි.

644. ජම්බුකය, හේ මහත් වූ වැඩුණු කය ඇත්තෙ යැ. දික්වූ දළ ඇත්තෙ යැ. යම් සිංහ කුලයෙකැ උපන්නාහු ඇතු අල්ලා ගනිත් ද, තෙපි ඒ කුලයෙහි නූපන්නාහු ය.

645. සිංහයකු නො වී සිංහ මානය උපදවා ගෙන යමෙක් සිංහවෙස් මවා ගනී ද (හේ) ඇතු වෙත පැමිණි හිවලා මෙන් කෙඳිරිගාමින් බිම හෝනේ ය.

646. ඉසුරු ඇති වට වැ හැසුණු කඳට ඇති මහබල ඇති ඥාණබලයෙන් යුක්ත වූ උත්තම පුද්ගලයාගේ ශක්තිය බලය උත්පත්තිය ද නො විමසා (ක්‍රියා කළ) ඒ සිවලා ඇතු විසින් නසන ලද්දේ හෝනේ යි.

647. යමෙක් මෙලො වැ තමා කෙරෙහි වූ ඥාණබල හා කායබල දැනැ පරීක්ෂාවෙන් ක්‍රියා කෙරේ ද හෙතෙම ජපයෙන් අධ්‍යයනයෙන් ද සාකච්ඡායෙන් ද සුබැසි කථායෙන් ද පරීක්ෂායෙන් යුක්ත වූයේ වේ ද හේ මහත් ජය ලබයි.

5. ජමබුකජාතක යි,

648. තිණං තිණන්ති ලපසි කො නු තෙ තිණමාහරි,
කින්නු තෙ තිණකිච්චත්ථි තිණමෙව පභාසසි.

649. ඉධාගමා බ්‍රහ්මචාරී බ්‍රහා ඡත්තො බහුස්සුතො,
සො මෙ සබ්බං සමාදය තිණං නික්ඛිප්ප ගච්ඡති.

650. එවෙතං හොති කත්තබ්බං අප්පෙන බහුමිච්ඡතා,
සබ්බං සකස්ස ආදනං අනාදනං තිණස්ස ච
චාටීසු පක්ඛිපිත්වාන[1] තත්ථ කා පරිදෙවනා.

651. සීලවන්තො න කුබ්බන්ති බාලො සීලානි කුබ්බති,
අනිච්චසීලං දුස්සීල්‍යං[2] කිං පණ්ඩිච්චං කරිස්සතී'ති.

6. බ්‍රහාඡත්තජාතකං.

652. න තෙ පීඨමදයිම්හා න පානං නපි භොජනං,
බ්‍රහ්මචාරි ඛමස්සු මෙ එතං පස්සාම අච්චයං.

653. නෙවාභිසජ්ජාමි න චාපි කුප්පෙ
න චාපි මෙ අප්පියමාසි කිඤ්චි,
අථොපි මෙ ආසි මනොවිතක්කො
එතාදිසො නූන කුලස්ස ධම්මො.

654. එසස්මාකං කුලෙ ධම්මො පිතුපිතාමහො සදා,
ආසනං උදකං පජ්ජං සබ්බෙතං නිපදාමසෙ.

655. එසස්මාකං කුලෙ ධම්මො පිතුපිතාමහො සදා,
සක්කච්චං උපතිට්ඨාම උත්තමං විය ඤාතකන්ති.

7. පීඨජාතකං.

656. විදිතං ථූසං උන්දූරානං විදිතං පන තණ්ඩුලං
ථූසං ථූලං විවජ්ජෙත්වා තණ්ඩුලං පන ඛාදරෙ.

657. යා මන්තනා අරඤ්ඤස්මිං යා ච ගාමෙ නිකණ්ණිකා,
යඤ්චෙතං ඉතිචීතිච එතම්පි විදිතං මයා.

658. ධම්මෙන කිර ජාතස්ස පිතා පුත්තස්ස මක්කටො,
දහරස්සෙව සන්තස්ස දන්තෙහි ඵලමච්ඡිදා.

659. යමෙතං පරිසප්පසි[3] අජකාණොව සාසපෙ,
යොපායං හෙට්ඨතො සෙසි[4] එතම්පි විදිතං මයා'ති.

8. ථුසජාතකං.

1. තිණස්ස චාටීසු ගතො. - සයා.
2. දුස්සීලං. - සීමු.
3. පරිසප්පෙපසි. - මජසං:
4. සෙති - සීමු:

648. තෘෂ්ණා තෘෂ්ණා යයි කියන්නෙහි ය. ඔබගේ තෘෂ්ණා කවරෙක් හැරගනී ද ඔබ හුදෙක් තෘෂ්ණා ගැන මැ කියහි. තෘෂ්ණායෙන් තොපට කවර ප්‍රයොජනයෙක් ඇද්ද?

649. උස් වූ බහුශ්‍රුත වූ ඡත්‍ර නමැති උත්තමචර්යා ඇතියෙක් මෙහි පැමිණියේ ය. හෙතෙම මාගේ සියලු ධනය ගෙන සැළියේ තෘෂ්ණා බහා ගියේ යැ.

650. ස්වල්ප වූ තෘෂ්ණායෙන් බොහෝ ධනය කැමැත්තේ මෙලෙස කටයුතු ය. පියා සතු සියලු ධනය ගැනීම ය, නො ගතයුතු තෘෂ්ණා සැළියේ ලා ගමන් කිරීම ය (යන මේ දැ බ්‍රහාජත්තයා කෙළේ ය) ඒ කරුණෙහි කවර හැඬීමෙක් ද.

651. සිල්වත්හු මෙබඳු දෙය නො කරති. අඥාන තෙම අනාචාරස්වභාවය නිසා මෙසේ කරයි. බොහෝ කල් නො පවතින සිල් ඇති දුස්සීලයාට පණ්ඩිතකම කුමක් කෙරේ ද?

6. බ්‍රහාජත්ත ජාතක යි.

652. බඹසැරිය, තොපට පුටුවක් නො දෙවුම්හ. ආහාරයක් හෝ පානයක් හෝ නො දෙවුමහ. මාගේ වරද දකිමි. (මට) ක්ෂමා කරව.

653. තොපගේ දනයෙකැ නො ලැගෙමි. (කිසිවක් නො දිනැ යි) නො ද කිපෙමි. මට කිසිවක් අප්‍රිය ද නො වී ය. එහෙත්, මෙය එකාන්තයෙන් කුලස්වභාව ය යි මට අදහසෙක් විය.

654. ආසන, පා දෝනා දිය හා පා ගල්වන තෙල් යන මේ සියල්ල හැමද දෙමු. මෙය අපගේ පියමුතුන් පරපුරේ (චාරිත්‍ර) ධර්ම යි.

655. උතුම් නෑයකුට මෙන් මැනැවින් උපස්ථාන කරමු. මෙය අපේ පියමුතුන් පරපුරේ හැමද පැවති (චාරිත්‍ර) ධර්මය යි.

7. පිය ජාතක යි.

656. මීයන් විසින් වී පොතු ද දන්නා ලද යැ. සහල් ද දන්නා ලද යැ. ඔහු පොතු හැරපියා සහල් කන්නාහු ය.

657. උයනෙහි යම් රහස් සාකච්ඡාවක් වී ද ගමෙහි ද යම් රහස් කීමෙක් වී ද මට පහර දීමට ඉඩක් සෙවී ද මෙය මා විසින් දන්නා ලදී.

658. උපන් වඳුරා ළපටි වියේ සිටියදී ම පියා (වඳුරු) විසින් වඳුරු පැටියාගේ කොෂය දතින් සිඳපී ල.

659. අඹ කෙතකට වන් කණ එළුදෙනක මෙන් ඔබමොබ යන්නෙහි ය. යම්බඳු මෙතෙම සයනය යට හෝනේ ද මෙ ද මා විසින් දන්නා ලදී.

8. ධුස ජාතක යි.

660. අදස්සනෙන මොරස්ස සිඛිනො මඤ්ජුභාණිනො,
කාකං තත්ථ අපූජෙසුං මංසෙන ච ඵලෙන ච.

661. යදා ච සරසම්පන්නො මොරො බාවෙරුමාගමා,
අථ ලාභො ච සක්කාරො වායසස්ස අහායථ.

662. යාව නුප්පජ්ජති බුද්ධො ධම්මරාජා පභඞ්කරො,
තාව අඤ්ඤෙ අපූජෙසුං පුථූ සමණබ්‍රාහ්මණෙ.

663. යදා ච සරසම්පන්නො බුද්ධො ධම්මමදෙසයි,
අථ ලාභො ච සක්කාරො තිත්ථියානං අහායථා'ති.

9. බාවෙරුජාතකං.

664. අදසි දානානි පුරෙ විසය්හ
දදතො ච තෙ ඛයධම්මො අහොසි,
ඉතො පරං චෙ න දදෙය්‍ය දානං
තිට්ඨෙය්‍යුං තෙ සඤ්ඤමන්තස්ස භොගා.

665. අනරියමරියෙන සහස්සනෙත්ත
සුදුග්ගතෙනාපි අකිච්චමාහු,
මා වො ධනං තං ජනින්ද අහුවා[1]
යම්භොගහෙතු විජහෙම සද්ධං.

666. යෙන එකො රථො යාති යාති තෙන පරො රථො,
පොරාණං නිහිතං වත්තං වත්තතඤ්ඤෙව වාසව.

667. යදි හෙස්සති දස්සාම අසන්තෙ කිං දදාමසෙ,
එවං භූතාපි දස්සාම මා දානං පමදම්හසෙ'ති

10. විසය්හජාතකං.

කොකාලිකවග්ගො චතුත්ථො.

තස්සුද්දානං:

අතිවෙලං පභාසති ජිනවරො
වනමජ්ඣරථෙසභජිම්භගමො,
අථ ජම්බුතිණාසනපීඨවරං
අථ තණ්ඩුල මොර විසය්හ දස.

1. අහුදෙවරාජ. – සීමු.

660. සිළු ඇති මිහිරි නාද ඇති මොනරා දක නැති හෙයින් එහි මනුෂ්‍යයෝ මස්වලින් හා පලවැළයෙන් කවුඩා පිදූහ.

661. යම් කලෙක මිහිරිනාද ඇති මොනරා බාවේරු පෙදෙසට ආයේ ද එකල කවුඩා ලාභයෙන් හා සත්කාරයෙන් පිරිහුනේ ය.

662. යම්තාක් ධර්මරාජන් වූ ලොව එළි කරන්නා වූ බුදුරජාණන් වහන්සේ ලොව නූපදී ද එතෙක් අන්තොටු බොහෝ මහණ බමුණන් ලෝවැසියෝ පිදූ.

663. යම් කලක බ්‍රහ්මඝොෂයෙන් යුතු බුදුරජාණන් වහන්සේ දහම් දෙසූ ද එකල තීර්ථකයන්ට ලාභ සත්කාර නැති විය.

9. බාවේරු ජාතක යි.

664. විසය්හය, පෙරැ දන් දීන. දෙන්නා වූ තොපගේ වස්තු විනාශ විය. මින්පසු දන් නො දෙන්නේ නම් දීමෙන් වළකින තොපට පෙර පරිදි භොගයෝ සිටුනාහ හෙවත් ඉතිරි වන්නාහ.

665. දහස් ඇස් ඇත්තාණෙනි, ජන දෙවුවාණෙනි, ඉතා දිළිඳු වූ ආය්‍ය්‍යයා විසින් වුවත් පාපක්‍රියාවන් නො කටයුතුය යි කියත් වස්තුව නිසා ශ්‍රද්ධාව අත් හරී නම් ඒ ධනයෙන් ප්‍රයොජනයෙක් නැත.

666. ශක්‍රය, යම් මගෙකින් රියක් යේ ද ඒ මගින් අනෙක් රියක් යයි. පෙරැ මා තැබූ දන්වැට මා සිටුනා තාක් (දවසින් දවස) වැඩේවා.

667. ඉදින් වස්තු විද්‍යමාන වී නම් දෙන්නෙමු. වස්තුව නැති කල කුමක් දෙන්නෙමු ද (මෙසේ තණ සපයන්නකු වූව ද) අනාථ ව සිටුනේ නමුදු දන් දීමට ප්‍රමාද නො වම්හ.

10. විසය්හ ජාතක යි.

සතරවන කොකාලික වර්ග යි.

එහි උද්දනය:

වේලාව ඉක්මවා කථා කළ කොකාලික ජාතක යැ, (ජිනවර) රථලට්ඨි ජාතක යැ, (වනමජෙඣ) ගොධ ජාතක යැ, (රථෙසභ) රාජොවාද ජාතක යැ, යළි ජම්බුක ජාතක යැ, (තිණ) බ්‍රහාජතන ජාතක යැ, පිය ජාතක යැ, (තණ්ඩුල) ථූස ජාතක යැ, මොණරකු ඇති බාවෙරු ජාතක යැ, විසය්හ ජාතක ය යන මෙයින් දසය වේ.

5. චූළකුණාලවග්ගො

668. නරානමාරාමකරාසු නාරිසු
අනෙකචිත්තාසු අනිග්ගහාසු ච,
සබ්බත්තනා පීතිකරාපි චෙ සියා
න විස්සසෙ තිත්ථසමා හි නාරියො.

669. යං වෙ දිස්වා කණ්ඩරි කින්නරානං[1]
සබ්බිත්ථියො න රමන්ති අගාරෙ,
තං තාදිසං මච්චං චජිත්වා භරියා
අඤ්ඤං දිස්වා පුරිසං පීඨසප්පිං[2]

670. බකස්ස ච පාවාරිකස්ස රඤ්ඤො
අච්චන්තකාමානුගතස්ස භරියා,
අවාචරී බද්ධවසානුගස්ස
කං වා ඉත්ථී නාතිචරෙ තදඤ්ඤං.

671. පිඞ්ගියානී සබ්බලොකිස්සරස්ස
රඤ්ඤො පියා බ්‍රහ්මදත්තස්ස භරියා,
අවාචරී බද්ධවසානුගස්ස
තං වාපි සා නාජ්ඣගා කාමකාමිනී'ති.

1. කින්නරීජාතකං[3].

672. අසක්ඛිං වත අත්තානං උද්ධාතුං උදකා ථලං,
න දානාහං පුන තුය්හං වසං ගච්ඡාමි වාරිජ.

673. අලමෙතෙහි අම්බෙහි ජම්බූහි පනසෙහි ච,
යානි පාරං සමුද්දස්ස වරං මය්හං උදුම්බරො.

674. යො ච උප්පතිතං අත්ථං න ඛිප්පමනුබුජ්ඣති,
අමිත්තවසමන්වෙති පච්ඡා ච අනුතප්පති.

675. යො ච උප්පතිතං අත්ථං ඛිප්පමෙව නිබොධති,
මුච්චතෙ සත්තුසම්බාධා න ච පච්ඡානුතප්පතී'ති.

2. වානරජාතකං.

1. යංච දිස්වා කින්නරී කින්නරානං.-මජසං. යඤ්ච දිස්වා කින්නර කින්නරීනං - සයා.
2. පීඨසබ්බි-මජසං.
3. කුණ්ඩලික ජාතකං - සයා

5. චූලකුණාල වර්ගය

668. මිනිසුන් කෙරේ ඇලීම කරන නොයෙක් සිතුවිලි ඇති නිග්‍රහ කොට හික්මවන්නට නො හැකි ස්ත්‍රීන් විශ්වාස නොකරන්නේ ය. ඉදින් හැම ස්ත්‍රීහු තමන් අප්‍රීති වන්නේ වුව ද තොටුපල සමානයහ.

669. කණ්ඩරී රජුටත් කින්නරී බිසොවටත් යම් රාගකාරණයෙක් වී ද එය දැක හැම ස්ත්‍රීහු සිය සැමියන්ගේ ගෙහි නො ඇලෙති. එය එසේ ම ය. කණ්ඩරී රජුගේ භාය්‍යාව පිළු වූ අන් පුරුෂයකු දැක රජු හැර දුමී ය.

670. අතිශය කාමාශක්ත බක, පාවාරික යන රජවරුන්ගේ බිසෝවරු මෙහෙකරුවන් හා අනාචාරයෙහි හැසුරුණාහ. ස්ත්‍රීහු සිය සැමියා කෙරෙන් පිටත් කවර පුරුෂයකු සමග වුව නොහැසිරෙත් ද?

671. මුළු ලොවට අධිපති බඹදත් රජුගේ පිංගියානි නැමැති කාමසම්පත් පතන ප්‍රිය බිරිඳ මෙහෙකරුවකු හා අනාචාරයෙහි හැසුරුණා ය. ඕතොමෝ ඔහු ද අගබිසෝ තනතුර ද යන (දෙකින්) පිරිහුණා ය.

1. කින්නරී ජාතක යි.

672. කුම්භීලය, (මම) තමා දියෙන් ගොඩ නගන්නට ඒකාන්තයෙන් සමත් වීමි. දැන් මම යළිත් තාගේ වසඟයට නො යමි.

673. සාගරයක් වැනි ගඟෙන් එතෙර යම්බඳු ඵලජාතියක් ඇද්ද (එයින් මට) කම් නැත. තෙල අඹ දඹ වැල වරකා වලට වඩා දිඹුල්ගෙඩි මට උතුම්.

674. යමෙකුත් උපන් අර්ථය වහා නො වටහා ගනී ද හෙතෙම සතුරන්ගේ වසඟයට පැමිණෙයි. පසුව තැවෙන්නේ ද වේ.

675. යමෙක් උපන් අර්ථය වහා වටහා ගනී ද හෙතෙම සතුරු පීඩාවෙන් මිදෙන්නේ ය. පසුව නො තැවෙන්නේ යි.

2. වානර ජාතක යි.

676. අවසිම්හා තවාගාරෙ නිච්චං සක්කතපූජිතා,
තුවමෙව දානි ච'කරි[1]. හන්ද රාජ වජාමහං.

677. යො වෙ කතෙ පටිකතෙ කිබ්බිසෙ පටිකිබ්බිසෙ,
එවං තං සම්මති වෙරං වස කුන්තිනි මාගමා.

678. න කතස්ස ච කත්තා ච මෙත්ති සන්ධියතෙ පුන,
හදයං නානුජානාති ගච්ඡඤ්ඤෙව රථෙසභ.

679. කතස්ස චෙව කත්තා ච මෙත්ති සන්ධියතෙ පුන,
ධීරානං නො ච බාලානං වස කුන්තිනි මාගමා'ති.

3. කුන්තිනීජාතකං.

680. යො නීලියං මණ්ඩයති සණ්ඩාසෙන විහඤ්ඤති,
තස්ස සා වසමන්වෙතු යා තෙ අම්බෙ අවාහරි.

681. වීසං වා පඤ්චවීසං[2] වා ඌනතිංසංව ජාතියා,
තාදිසා පතිමාලද්ධා යා තෙ අම්බෙ අවාහරි.

682. දීඝං ගච්ඡතු අද්ධානං එකිකා [3]අභිසාරියා,
සඞ්කෙතෙ පති මාද්දස යා තෙ අම්බෙ අවාහරි.

683. අලඞ්කතා සුවසනා මාලිනී චන්දනුස්සද,
එකිකා සයනෙ සෙතු යා තෙ අම්බෙ අවාහරීති.

4. අම්බචොරජාතකං.

1. මකරි – මජසං.
2. පණ්ණුවීසං – සී.
3. අභිසාරිකා–සී.

676. රජතුමනි, තොපගේ ගෙහි නිතර සත්කාර කරනලදු වැ පුදනලදු වැ විසූවෙමු. දැන් තෙපි ම නිවසින් යන කරුණු කෙළෙහි. එහෙයින් මම යමි.

677. යමෙක් අනුන් විසින් දරුණු අපරාධ තමාට කළ කලැ තමා විසිනු දු දරුණු අපරාධ අනුන්ට කළේ ද එකාන්තයෙන් එය කරන ලදැ යි දනී ද මෙසේ වූ කල වෛරය සන්හිඳේ. කොස් ලිහිණිය, මෙහි වසව (පිටත) නො යව.

678. රජතුමනි, අනුන්ට පීඩා කළ පුද්ගලයාගේ ද පීඩා ලද පුද්ගලයාගේ ද මිත්‍රත්වය නැවත ඇති නො වේ. මාගේ හිත මෙහි වාසයට කැමති නො වේ. එහෙයින් යන්නෙමි.

679. උපකාර ලබන්නාගේ ද උපකාර කරන්නාගේ ද මිත්‍රත්වය නැවත ගැළපේ. ප්‍රාඥයන්ගේ මිතුරුකම නැවත ඇති වේ. බාලයන්ගේ මිතුරුකම නැවත ඇති නො වේ. කුන්තිනිය, මෙහි වසව (පිටත) නො යව.

3. කුන්තිනී ජාතක යි.

680. යම් තැනැත්තියක් තොපගේ අඹ සොරකම් කළා ද ඕ තොමෝ පැසුණු කෙස් කළු කරන, සුදු කෙස් උගුල්ලා වෙහෙසට පත්වන්නකුගේ වසඟයට යේවා.

681. යම් තැනැත්තියක් තොපගේ අඹ සොරකම් කළා ද ඕ තොමෝ උපතින් විසි අවුරුද්ද, පස්විසි අවුරුද්ද හෝ එකුන්තිස් අවුරුද්දට පත් වයස ඇති සැමියකු ලබාවා.

682. යම් තැනැත්තියක් තොපගේ අඹ සොරකම් කළා ද ඕ තොමෝ ගණිකාවක වී හුදෙකලා ව දිගමග යේවා. සලකුණු කී තැනෙහි දී සැමියා නො දකීවා.

683. යම් තැනැත්තියක් තොපගේ අඹ සොරකම් කළා ද ඕ තොමෝ මනාලෙස හැඳි පැළඳි වස්ත්‍ර හා මල්දම් ඇත්තී සඳුන්කල්ක ගල්වා සැරසුණී තනි ව යහනේ සයනය කෙරේවා.

4. අම්බචෝර ජාතක යි.

684. වනං යදග්ගි දහති පාවකො කණ්හවත්තනී,
කථං කරොසි පචලක එවං දන්ධපරක්කමො.

685. බහූනි රුක්ඛඡිද්දානි පථව්‍යා[1] විවරානි ච,
තානි චෙ නාභිසම්භොම හොති නො කාලපරියායො.

686. යො දන්ධකාලෙ තරති තරණීයෙ ච දන්ධති,
සුක්ඛපණ්ණංව අක්කම්ම අත්ථං භඤ්ජති අත්තනො.

687. යො දන්ධකාලෙ දන්ධෙති තරණීයෙ ච තාරයි,
සසීව රත්තිං විභජං තස්සත්ථො පරිපූරතී'ති.

5. ගජකුම්භජාතකං.[2]

688. මනුස්සින්දං ජහිත්වාන සබ්බකාමසමිද්ධිනං,
කථං නු භගවා කෙසි කප්පස්ස රමති අස්සමෙ.

689. සාධූනි රමණීයානි සන්ති වක්ඛා මනොරමා,
සුභාසිතානි කප්පස්ස නාරද රමයන්ති මං.

690. සාලීනං ඔදනං භුඤ්ජෙ සුචිමංසූපසෙචනං,
කථං සාමාකනීවාරං අලොණං ඡාදයන්ති තං.

691. අසාදුං යදි වා සාදුං[3] අප්පං වා යදි වා බහුං,
විස්සත්ථො යත්ථ භුඤ්ජෙය්‍ය විස්සාසපරමා රසාති.

6. කෙසවජාතකං.[4]

692. සබ්බායසං කූටමතිප්පමාණං
පග්ගය්හ සො තිට්ඨති අන්තලික්ඛෙ,
රක්ඛාය මෙ ත්වං විහිතො නුසජ්ජ
උදාහු මෙ වායමසෙ වධාය.

693. දූතො අහං රාජිධ රක්ඛසානං
වධාය තුය්හං පහිතොහමස්මි,
ඉන්දො ච තං රක්ඛති දෙවරාජා
තෙනුත්තමඞ්ගං න තෙ ඵාලයාමි.[5]

1. පථබ්‍යා – මජ්සං.
2. රාජකුම්භජාතකං – මජ්සං
3. සාදුං වායදි වා සාදුං – මජ්සං.
4. කෙසිජාතකං.–මජ්සං
5 නභිඵලයාමි–සීමු.

684. පචලකය, පාවක නම් වූ ද කෘෂ්ණ වර්තනී නම් වූ ද ගින්න යම්කලෙක වනය දවා ද එකලැ මඳ විරිය ඇත්තේ කෙසේ කරන්නෙහි ද?

685. ගස්බෙන ද පොළවෙහි ගුල් ද බොහෝ වෙති. ඉදින් ඒවා කරා නො පැමිණියමෝ නම් අපට මරණය ම වෙයි.

686. යමෙක් කටයුතු සෙමින් කළයුතු කාලයේ ඉක්මනට කෙරේ ද, ඉක්මනට කටයුතු කාලයෙහි සෙමින් කෙරේ ද හේ පැගී ගිය වියළි තල්පතක් මෙන් දියුණුව නසයි.

687. යමෙක් වැඩ සෙමින් කටයුතු කල්හි සෙමින් කෙරේ ද ඉක්මනින් කටයුතු කල්හි ඉක්මනින් කෙරේ ද හේ රාත්‍රියේ පුර අව පක්‍ෂයන් අනුව බෙදෙන හඳ මෙන් අභිමතාර්ථය සම්පූර්ණ කරයි.

5. ගජකුම්භ ජාතක යි.

688. හැම සැපතින් සම්පූර්ණ අපගේ රජතුමා හැරපියා කෙශව නැමැති භාග්‍යවත් තපස්වී කප්ප තවුසාගේ අසපුවෙහි කෙසේ ඇලේ ද?

689. නාරදය, කප්ප තවුසාට මිහිරි වූ ළගන්නා වූ සුබැසි වචන ද සිත් අලවන රුක් ද ඇත. මොහු මාගේ සිත් අලවති යි.

690. පිරිසුදු මස්රස සහිත ඇල්සාලේ බත කිදියෙ යැ. ලුණු නැති බොඩහමු හුරුහැල් කෙසේ ඒ තොප පිනවා ද.

691. විශ්වාසය ඇති කල්හි අමිහිරි වූ ද මිහිරි වූ ද මඳ වූ ද බොහෝ වූ ද ආහාර අනුභව කෙරේ ද (එය රසවත් වේ). රසයෝ විශ්වාසය පරම කොට ඇත්තෝ ය.

6. කෙසව ජාතක යි.

692. ඉතා විශාල යකුළ ඔසොවා ගෙන ඒ ඔබ අහසේ සිටී. තෙපි මාගේ රැක්ම පිණිස නියුක්තවහු ද නැතහොත් මා මරන්නට සිතන්නහු ද?

693. රජාණෙනි, තොපට වධ පිණිස මම මෙහි මෙහෙයවන ලද්දෙමි. දෙවියන්ගේ රජ වූ ශක්‍රයා තා රක්නේ ය. එහෙයින් තොපගේ හිස නො පළමි.

694. සචෙ ච මං රක්ඛති දෙවරාජා
දෙවානමින්දො මඝවා සුජම්පති,
කාමං පිසාචා කඩ්ඪන්තු සබ්බෙ
න සන්තසෙ රක්ඛසියා පජාය.

695. කාමං කන්දන්තු කුම්භණ්ඩා සබ්බපංසුපිසාචකා,
නාලං පිසාචා යුද්ධාය මහතී සා විහිංසිකා'ති.

7. අයකූටජාතකං.

696. අරක්ඛ[1] ගාමමාගම්ම කිං සීලං කිං වතං අහං,
පුරිසං තාත සෙවෙය්‍යං තං මෙ අක්ඛාහි පුච්ඡිතො.

697. යො තං විස්සාසයෙ තාත විස්සාසඤ්ච ඛමෙය්‍ය තෙ,
සුස්සූසී ච තිතික්ඛී ච තං භජෙහි ඉතො ගතො.

698. යස්ස කායෙන වාචාය මනසා නත්ථි දුක්කටං,
ඔරසීව පතිට්ඨාය තං භජෙහි ඉතො[2] ගතො.

699. හලිද්දරාගං කපිචිත්තං පුරිසං රාගවිරාගිනං,
තාදිසං තාත මා සෙවි නිම්මනුස්සම්පි චෙ සියා'ති.

8. ආරක්ඛජාතකං.

700. නෙව ඉත්ථීසු සාමඤ්ඤං නාපි භක්ඛෙසු සාරථී,
අථස්ස සන්ධිභෙදස්ස පස්ස යාව සුචින්තිතං.

701. අසි තික්ඛොව මංසම්හි පෙසුඤ්ඤං පරිවත්තති,
යත්ථූසභඤ්ච සීහඤ්ච භක්ඛයන්ති මිගාධමා.

732. ඉමං සො සයනං සෙති යයිමං පස්සසි සාරථී,
යො වාචං සන්ධිභෙදස්ස පිසුනස්ස නිබොධති.

1. අරක්ඛ . – මජසං
2. තං භජෙය්‍යාසිතොගතො – මජසං.

694. ඉදින්, දෙවියන්ට අධිපති වූ ද මඝවා නැමැති වූ ද සුජාතාගේ සැමියා වූ ද දිව්‍යරාජයා මා රකී නම් සියලු පිසාචයෝ හඬත්වා. රකුසන්ට බිය නො වෙමි.

695. සියලු කුම්භාණ්ඩයෝ ද පිසාචයෝ ද රිසිසේ හඬත්වා. මා හා සටන් කරන්නට පිසාචයෝ පොහොසත් නො වෙති. යක්‍ෂයන්ගේ බිහිසුණු දර්ශන මහත් වෙයි.

7. අයකූට ජාතක යි.

696. පියාණෙනි, මම වනයෙන් ගමට පැමිණියෙමි කවර සිල් ඇති කෙබඳු පැවතුම් ඇති පුරුෂයකු ඇසුරු කෙරෙම් දැයි විතාරන ලද්දෙහි. එය මට කියන්නේ මැනැවි.

697. පුත්‍රය, යමෙක් තා විශ්වාස කෙරේ ද, තාගේ විශ්වාස කැමැත්තේ ද, තා කියනදෙය අසනු කැමැත්තේ ද කරන වැරැදි ඉවසා ද මෙයින් ගියේ ඔහු ඇසුරු කරව.

698. යමකුගේ කය වචනය සිත යන තිදෙරින් වැරැදි කිරීමක් නැත් ද, මෙයින් ගියේ ඔහු ළෙහි හොවා වැඩූ පුතකු සේ (සිතා) ඇසුරු කරව.

699. පුත්‍රය, කහපාට මෙන් අසපිර වූ වඳුරකු සේ චපල සිතැති ඇලීම සහ නො ඇලීම වෙනස්වන ස්වභාවය ඇති පුරුෂයා දඹදිවැ මිනිසුන්ගෙන් හිස්වැ ගිය ද ඇසුරු නො කරව.

8. අරක්‍ෂක ජාතක යි.

700. රථාචාර්‍ය්‍යය, ස්ත්‍රීන් දෙදෙනා කෙරේ සමාන බවක් නැත. ආහාරයෙහි ද සමාන බවක් නැත. එයින් කලහයට කරුණු නැතයි සේ යි. එහෙත් මිතුරන්ගේ මිතුරුකම බිඳැ දෙදෙනාගේ මස් කන්නට සිතූ මේ දුෂ්ට සිවලාගේ සිතිවිල්ල බලව.

701. ප්‍රිය බව සුන් වැ ගිය තැනෙකැ හිවල්ලු වෘෂභයා ද සිංහයා ද අනුභව කරති, තියුණු කඩුව මාංසය මෙන් පිසුනු බස මිත්‍රත්වය පෙරලයි නොහොත් මිත්‍රත්වය කපා දමයි.

702. රථාචාර්‍ය්‍යය, මේ දෙදෙනාගේ යම් මෘතශයනයක් දක්නෙහි ද යමෙක් මිත්‍රභෙද කරන්නහුගේ කීම සත්‍ය යැ යි පිළිගනී ද හේ ද මෙසේ මරණයට පැමිණේ,

703. තෙ ජනා සුඛමෙධන්ති නරා සග්ගගතාරිව,
යො වාචං සන්ධිභෙදස්ස නාව බොධෙන්ති[1] සාරථී'ති.

9. සන්ධිභෙදජාතකං.

704. හන්ති හත්ථෙහි පාදෙහි මුඛඤ්ච පරිසුම්භති,
ස වෙ රාජ පියො හොති කං තෙනමභිපස්සසි.

705. අක්කොසති යථාකාමං ආගමඤ්චස්ස න ඉච්ඡති,
ස වෙ රාජ පියො හොති කං තෙනමභිපස්සසි.

706. අබ්භක්ඛාති අභූතෙන අලිකෙනමභිසාරයෙ,
ස වෙ රාජ පියො හොති කං තෙනමභිපස්සසි.

707. හරං අන්නඤ්ච පානඤ්ච වත්ථසෙනාසනානි ච,
අඤ්ඤදත්ථු හරා සන්තා තෙ වෙ රාජ පියා හොන්ති,
කං තෙන මභිපස්සසීති.

10. දෙවතාපඤ්හො.

චූළකුණාලවග්ගො පඤ්චමො.

තස්සුද්දානං:

නරානං අසකබ්වසිම්භවරො
නීලියමගගිවරඤ්ච පුන,
පුන රසායසකූටවරො
තථාරඤ්ඤසාරථී හන්ති දස.

චතුක්කනිපාතො නිට්ඨිතො.

තත්‍ර වග්ගුද්දානං:

විවරං පුචිමන්දඤ්ච
කුටිදූසං බහුභාණකං,
චූළකුණාලවග්ගො සො
පඤ්චමො සුප්පකාසිතොති.

1. බොධනති – සීමු.

703. රථාචායර්‍යිය, මිතුරන්ගේ මිතුරුකම බිඳින්නහුගේ කීම යම් කෙනෙක් සත්‍යයැ යි නො පිළිගනිත් ද ඔවුහු දෙව්ලොව ගියවුන් සේ සැප විඳිති.

9. සන්‍ධිභෙද ජාතක යි.

704. රජතුමනි, අතින් පහරනෝ යැ. පයින් පහරනෝ යැ. මුහුණ පහරනෝ යැ. (එහෙත්) හෙතෙම එකාන්තයෙන් ප්‍රිය වේ. පහර දීමේ හෙතුවෙන් ප්‍රියවන්නා කවරේ දැ යි දන්නෙහි ද?

705. රජතුමනි, කැමැති සේ ආක්‍රොශ කෙරෙයි (එහෙත්) ඔහුට ආක්‍රොශ පැමිණීම රිසි නො වේ. හෙතෙම එකාන්තයෙන් ප්‍රිය වේ. ඒ කරුණු නිසා ප්‍රියවන්නා කවරෙක් දැ යි දන්නෙහි ද?

706. රජතුමනි, අභූත චොදනාවෙන් චොදනා කරයි. බොරු සිහිපත් කරවන්නේ ය. හෙතෙම එකාන්තයෙන් ප්‍රිය වේ. ඒ කරුණු නිසා ප්‍රියවන්නා කවරෙක් දැ යි දන්නෙහි ද?

707. රජතුමනි, ආහාරපාන ද රෙදිපිළි ද ඇඳපුටු ආදිය ද ගෙන යන ඔව්හු එකාන්තයෙන් ප්‍රිය වෙත්, ඒ කරුණු නිසා ප්‍රියවන්නා කවරෙක් දැ යි දන්නෙහි ද?

10. දෙවතා පඤ්හ ජාතක යි.

පස්වන චූළකුණාල වග යි.

එහි උද්දානය:

මිනිසුන්ගේ ඇලීම පවසන කින්නරී ජාතක යැ, 'අසක්ඛිං' යන පදය ඇති වානර ජාතක යැ, 'අවසිමහ' යනාදි වූ කුන්තිනී ජාතක යැ, නීලිය සඳහන් කරන අම්බචොර ජාතක යැ, අග්නිදහය කියන ගජකුම්භ ජාතක යැ, ස්වාදු රස දක්වන කෙසව ජාතක යැ, යළි අයකූට ජාතක යැ, එසේම අරඤ්ඤ ජාතක යැ, සාරථියා ඇමතූ සන්‍ධිභෙද ජාතක යැ, 'හනති' පදයද ඇති දෙවතා පඤ්හ යැ යන දසය යි.

චතුක්ක නිපාතය නිමි.

එහි වර්ග උද්දානය:

විවර වර්ග යැ, පුචිමන්‍ද වර්ග යැ, කුටිදූසක වර්ග යැ, බහු-භාණකයකු ඇති කොකාලික වර්ග යැ, පස්වැනි චූළකුණාල වර්ගය ද මොනවට ප්‍රකාශ කරන ලද්දේ යි.

පඤ්චකනිපාතො

1. මණිකුණ්ඩලවග්ගො

708. ජිනො[1] රට්ඨස්ස[2] මණිකුණ්ඩලෙ ච
පුත්තෙ ච දරෙ ච තථෙව ජිනො,
සබ්බෙසු භොගෙසු අසෙසිතෙසු
කස්මා න සන්තප්පසි සොකකාලෙ.

709. පුබ්බෙ ච මච්චං විජහන්ති භොගා
මච්චො වා තෙ[3] පුබ්බතරං ජහාති,
අසස්සතා භොගිනො කාමකාමී
තස්මා න සොචාමහං සොකකාලෙ.

710. උදෙති ආපූරති[4] වෙති චන්දො
අත්ථං තපෙත්වාන[5] පලෙති සූරියො,
විදිතා මයා සත්තුක ලොකධම්මා
තස්මා න සොචාමහං සොකකාලෙ.

711. අලසො ගිහී කාමභොගී න සාධු
අසඤ්ඤතො පබ්බජිතො න සාධු,
රාජා න සාධු අනිසම්මකාරී
යො පණ්ඩිතො කොධනො තං න සාධු.

712. නිසම්ම ඛත්තියො කයිරා නානිසම්ම දිසම්පති,
නිසම්මකාරිනො රඤ්ඤො යසො කිත්ති ච වඩ්ඪතීති.

1. මණිකුණ්ඩලජාතකං.

713. කින්නු සන්තරමානොව ලායිත්වා හරිතං තිණං,
ඛාද ඛාදති විලපි ගතසත්තං ජරග්ගවං.

714. න හි අන්නෙන පානෙන මතො ගොණො සමුට්ඨහෙ,
ත්වඤ්ච තුච්ඡං විලපසි යථා තං දුම්මති තථා.

715. තථෙව තිට්ඨති සීසං හත්ථපාද ච වාළධි,
සොතා තථෙව තිට්ඨන්ති මඤ්ඤෙ ගොණො සමුට්ඨහෙ.

---

1. ජීනෙනා – ස්‍යා, මජසං
2. රට්ඨස්ස – ස්‍යා
3. මච්චො ධනෙ – මජසං, සීමු.
4. පූරෙති ඛීයති – ස්‍යා
5. අත්ථං තපෙත්වාන – මජසං.

පඤ්චකනිපාතය

1. මණිකුණ්ඩල වර්ගය

708. (මහරජ, තෙපි) රට අශ්ව මිණිකොඩොල් යන මෙයින් පිරිහුණුහු. එසෙයින් ම දූදරුවන්ගෙන් හා බිරිඳගෙන් පිරිහුණුහු. සියලු ඉසුරු ඉතුරු නැතිව නැතිව ගිය කල්හි ශොක වියයුතු අවස්ථායෙහි කවර හෙයින් ශොක නොවන්නහු ද?

709. කාමකාමිය, (කාමය කැමැත්තාණෙනි) වස්තු සම්පත් සත්ත්වයා පළමු ව හැරයයි. (නැති වෙයි) සත්ත්වයා ද පළමු කොට ම වස්තු සම්පත් හැරයයි. (මැරෙයි) වස්තු සම්පත් ඇත්තෝ සදකාලික නො වෙති. එහෙයින් ශොක කටයුතු කල්හි මම ශොක නො කරමි.

710. සත්තුකය, චන්ද්‍රයා උදවී ක්‍රමයෙන් පිරී බැසයයි. සූර්‍ය්‍යා ද ලොව උණුසුම් කොට බැස යයි. මා විසින් ලොක ධර්‍මයන් (අටලෝ දහම) දන්නා ලදී. එහෙයින් ශොක කටයුතු කල්හි මම ශොක නො කරමි.

711. පස්කම් සුවයට ගිජු අලස ගිහියා නො මැනැවැ. හික්මීමක් නැති පැවිද්ද නො මැනැවැ. නො විමසා ක්‍රියා කරන රජ නො මැනැවැ. යම් පණ්ඩිතයෙක් කිපෙන සුලු ද ඒ කිපීම නො මැනැවි.

712. නරදෙවයාණෙනි, ක්‍ෂත්‍රිය තෙමේ විමසා කටයුතු කරන්නේ ය. නො විමසා කටයුතු නො කරන්නේ ය. විමසා කටයුතු කරන්නහුගේ පිරිවර ද කීර්තිය ද වඩනේ යි.

1. මණිකුණ්ඩල ජාතක යි.

713. තිල්තණ වහා කපා ගෙන අවුත් මළ මහලු ගොනාට කව කවැ යි කියන්නේ කිම?

714. ආහාරපානයෙන් මළ ගොනා නොම නැගිටියි. මෝඩයකු මෙන් තෝ නිෂ්ඵල දූයක් කියමින් හඬනෙහි.

715. හිස අත්පා හා වලඟ එසේ ම (පෙර පරිදි) ඇත්තේ ය දෙකන් ද එලෙසින් ම ඇත්තේ ය. එහෙයින් ගොනා නැගීසිටී යයි සිතමි.

716\. නෙවය්‍යකස්ස සීසං වා හත්ථපාද න දිස්සරෙ,
රුදං මත්තිකථූපස්මිං නනු ත්වඤ්ඤෙව දුම්මති.

717\. ආදිත්තං වත මං සන්තං ඝතසිත්තංව පාවකං,
වාරිනා විය ඔසිඤ්චං සබ්බං නිබ්බාපයෙ දරං.

718\. අබ්බූළ්හං වත මෙ සල්ලං සොකං හදයනිස්සිතං,
යො මෙ සොකපරෙතස්ස පිතුසොකං අපානුදි.

719\. සොහං අබ්බූළ්හසල්ලොස්මි වීතසොකො අනාවිලො,
න සොචාමි න රොදමි තව සුත්වාන මාණව.

720\. එවං කරොන්ති සප්පඤ්ඤා යෙ හොන්ති අනුකම්පකා,
විනිවත්තයන්ති[1] සොකම්හා සුජාතො පිතරං යථා.

2. සුජාතජාතකං.

721\. නයිදං නිච්චං භවිතබ්බං බ්‍රහ්මදත්ත
ඛෙමං සුභික්ඛං සුඛතා ච කායෙ,
අත්ථච්චයෙ මා අහු සම්පමූළ්හො
භින්නප්ලවො සාගරස්සෙව මජ්ඣෙ.

722\. යානි කරොති පුරිසො තානි අත්තනි පස්සති,
කල්‍යාණකාරී කල්‍යාණං පාපකාරී ච පාපකං,
යාදිසං වපතෙ බීජං තාදිසං හරතෙ ඵලං.

723\. ඉදං තදචරියවචො පාරාසරියො[2] යදබ්‍රවි,
මාස්සු ත්වං අකරා පාපං යං තං පච්ඡා කතං තපෙ.

724\. අයමෙව සො පිඞ්ගිය ධොනසාඛො[3]
යම්හි[4] ඝාතයිං ඛත්තියානං සහස්සං,
අලඞ්කතෙ චන්දනසාරලිත්තෙ
තමෙව දුක්ඛං පච්චාගතං මමං.

725\. සාමාපි ඛො චන්දන ලිත්තගත්තා[5]
සිඞ්ගුව සොභඤ්ජනකස්ස උග්ගතා,
අදිස්වාව කාලං කරිස්සාමි උබ්බරිං
තං මෙ තතො[6] දුක්ඛතරං භවිස්සතීති.

3. ධොනසාඛ ජාතකං.[7]

---

1. විනිවත්තෙන්ති – මජසං.
2. පාරාසාවරියො – මජසං.
3. වෙනසාඛො – මජසං
4. යහං – මජසං.
5. චන්දනලිත්තග්ගත්තී. – සීමු. සයා.
6. ඉතො – සීමු.
7. ධොන සාඛ – සීමු, මජසං.

716. අපේ මිය ගිය මුත්තාගේ හිස වේවයි අත් පා වේවයි දක්නට නැත. මැටිසැය අභිමුඛයෙහි හඬන තෙපි මැ අඥාන නො වහු ද?

717. ගිතෙලින් ඉසිත ලද ගින්නක් මෙන් ශොකාග්නීන් දැල්වුණු මා දිය ඉසැ නිවන්නකු සෙයින් සියලු පීඩා හැර නිවාලූයේ ය.

718. පියා මළ සොවින් පෙළුණු මාගේ ශොකය යමෙක් දුරු කෙළේ ද හේ හදවතේ ඇවිණී තුබූ ශොක නමැති උල ඇද දැම්මේ ය.

719. මම උදුරා ලූ සොක හුල් ඇති වෙමි, පහව ගිය ශොක ඇති වෙමි, නො කැලඹුණ සිත් ඇත්තෙම් වෙමි. මාණවය, තොපගේ වචන අසා ශොක නො වෙමි, නො හඬමි.

720. අනුකම්පාව ඇති නුවණැති යම් කෙනෙක් වෙත් නම් ඔවුහු සොවින් පෙළුණු පියා ශොක රහිත කළ සුජාත මෙන් ශොකයෙන් වළකති.

2. සුජාත ජාතක යි.

721. බ්‍රහ්මදත්තය, නිරුපද්‍රැත බවත් ආහාරපාන සුලභ වීමත් හැමදා එකසේ නො වේ. මුහුද මැද දී නැව කැඩී ගිය තැනැත්තේ ඉතා දුකට පත්වන්නේ යම්සේ ද එසේ වස්තු විනාශයෙහි දී මූළා වේ.

722. පුරුෂයා යම් ක්‍රියාවක් කෙරේ ද එහි ඵලය තමා දකී. යහපත කරන්නා යහපත ද අයහපත කරන්නා අයහපත ද දකී. යම් වර්ගයක බීජයක් රොපණය කෙරේ ද එබඳු ඵලයක් ලබයි.

723. තෝ පව් නො කරව, යම්බඳු පාපයක් කරන ලද්දෙහි නම් එය තා තවා යයි එකල්හි කීයේ ද මෙය පාරාසරිය නමැති ගුරු ඇදුරුතුමාග් ප්‍රකාශයයි.

724. පිංගිය බමුණ, සඳුන්කල්ක තවරා සැරසුණු දහස්ගණනක් ක්ෂත්‍රියයන් යම් ගසක්මුල දී විනාශ කරවීම් ද, පැතුරුණු අතු ඇති ඒ ගස, දුක මා කරා නැවත පැමිණවී.

725. සඳුන්කල්ක ගල්වා ශොභමාන වූ සාමා ද මඳ සුළඟේ සැලෙන මුරුංගා ගසක්සේ මනස්කාන්ත උබ්බරී බිසව ද නො දැක මිය යන්නෙමි. මරණ දුකට වඩා ඇය නො දැකීමේ දුක ඉතා වැඩි ය.

3. ධොනසාඛ ජාතක යි.

726. උරගොව තචං ජිණ්ණං හිත්වා ගච්ඡති සං තනුං,
එවං සරීරෙ නිබ්භොගෙ පෙතෙ කාලකතෙ සති,

727. ඩය්හමානො න ජානාති ඤාතීනං පරිදෙවිතං,
තස්මා එතං න සොචාමි ගතො සො තස්ස යා ගති.

728. අනබ්භිතො තතො ආග[1] අනනුඤ්ඤාතො[2] ඉතො ගතො,
යථා ගතො තථා ගතො තත්ථ කා පරිදෙවනා.

729. ඩය්හමානො න ජානාති ඤාතීනං පරිදෙවිතං,
තස්මා එතං න සොචාමි ගතො සො තස්ස යා ගති.

730. සචෙ රොදෙ කිසා අස්සං තස්සා මෙ කිං ඵලං සියා,
ඤාතිමිත්තසුහජ්ජානං භිය්‍යො නො අරති සියා.

731. ඩය්හමානො න ජානාති ඤාතීනං පරිදෙවිතං,
තස්මා එතං න සොචාමි ගතො සො තස්ස යා ගති.

732. යථාපි දරකො චන්දං ගච්ඡන්තමනුරොදති,
එවං සම්පදමෙවෙතං යො පෙතමනුසොචති.

733. ඩය්හමානො න ජානාති ඤාතීනං පරිදෙවිතං,
තස්මා එතං න සොචාමි ගතො සො තස්ස යා ගති.

734. යථාපි උදකකුම්භො භින්නො අප්පටිසන්ධියො,
එවං සම්පදමෙවෙතං යො පෙතමනුසොචති.

735. ඩය්හමානො න ජානාති ඤාතීනං පරිදෙවිතං
තස්මා එතං න සොචාමි ගතො සො තස්ස යා ගතීති.

4. උරගජාතකං.

736. අඤ්ඤෙ සොචන්ති රොදන්ති අඤ්ඤෙ අස්සුමුඛා ජනා,[3]
පසන්නමුඛවණ්ණාසි කස්මා සත න සොචසි.

1. ආගා – මජසං. ස්‍යා.
2. නනුඤ්ඤාතො – මජසං. ස්‍යා
3. අඤ්ඤෙ අස්සු මුඛො ජනො.

726. දිරූ හැව හැර යන සර්පයා මෙන් ජීවිතෙන්ද්‍රිය නැති හෙයින් සිය ශරීරය හැරද පරලොව ගිය කල්හි,

727. දවනු ලබන්නේ නෑයන්ගේ හඬා වැලැපීම් නො දනී. එහෙයින් මළා වූ මොහුට නො හඬමි. ඔහුගේ යම් ගතියක් ඇද්ද හේ එපරිදි ගියේ ය.

728. කැඳවීමක් නැති ව එලොවින්, ආයේ ය. අනුදැනීමක් නැති ව මෙලොවින් ගියේ ය. කැඳවීමක් නැති ව යම්සේ ආයේ ද එසේ අනුදැනීමක් නැති ව ගියේ ය. එහි ලා කවර හැඬීමෙක් ද?

729. දවනු ලබන්නේ නෑයන්ගේ හඬා වැලැපුම් නො දනී. එහෙයින් මළා වූ ඔහුට නො හඬමි. ඔහුගේ යම් ගතියක් ඇද්ද හේ එපරිදි ගියේ ය.

730. ඉදින් හඬන්නේ නම් කෘශ ශරීර ඇත්තෙකිම වෙමි. ඒ මට කවර ප්‍රයොජනයක් වේ ද? ඥාතිමිත්‍රහිතවතුන්ට (මා කෙරෙහි) වැඩියක් නො ඇල්ම වන්නේ ය.

731. දවනු ලබන්නේ නෑයන්ගේ හඬා වැලැපුම් නො දනී. එහෙයින් මළා වූ ඔහුට නො හඬමි. ඔහුගේ යම් ගතියක් ඇද්ද හේ එපරිදි ගියේ ය.

732. අහසේ යන හඳ දැක කුඩා ළමයෙක් එය ඉල්ලා යම්සේ හඬා ද, එසේ යමෙක් මිය පරලොව ගිය පුද්ගලයාට නැවත නැවත ශොක කෙරේ ද එය ළමයාගේ හැඬීම වැන්න.

733. දවනු ලබන්නේ නෑයන්ගේ හඬාවැලැපුම් නො දනී. එහෙයින් මළා වූ ඔහුට නො හඬමි. ඔහුගේ යම් ගතියක් ඇද්ද හේ එපරිදි ගියේ ය.

734. බිඳුණු වතුරකළය නැවත ගැළපිය නො හැක්කේ යම්සේ ද, යමෙක් මිය ගියහුහට නැවත ශොක කෙරේ ද එය මෙසේ නිෂ්ඵල තැතකි.

735. දවනු ලබන්නේ නෑයන්ගේ හඬා වැලැපුම් නො දනී. එහෙයින් මළ ඔහුට නො හඬමි. ඔහුගේ යම් ගතියක් ඇද්ද හේ එපරිදි ගියේ ය.

4. උරග ජාතක යි.

736. සත රජතුමනි, සෙස්සෝ ශොක කරති, හඬති. සෙසු ජනයා කඳුළු සහිත මුහුණු ඇත්තෝ ය. (තෙපි) පහන්මුහුණ ඇත්තහු ය. කවර හෙයින් ශොක නො කරන්නහු ද?

737. නාබ්භතීතහරො සොකො නානාගතසුඛාවහො,
තස්මා ධංක[1] න සොචාමි නත්ථි සොකො දුතියතා.

738. සොචං පණ්ඩු කිසො හොති භත්තඤ්චස්ස න රුච්චති,
අමිත්තා සුමනා හොන්ති සල්ලවිද්ධස්ස න රුච්චති.

739. ගාමෙ වා යදි වා රඤ්ඤෙ නින්නෙ වා යදි වා ථලෙ,
ඨිතං මං නාගමිස්සති[2] එවං දිට්ඨපදෙ අහං

740. යස්සත්ථා නාලමෙකොව සබ්බකාමරසාරහො,
සබ්බාපි පථවී තස්ස න සුඛං ආවහිස්සතීති.

5. සතජාතකං[3].

741. එකො අරඤ්ඤෙ ගිරිකන්දරායං
පග්ගය්හ පග්ගය්හ සිලං පවෙච්ඡසි,[4]
පුනප්පුනං සන්තරමානරූපො
කාරණ්ඩිය කො නු තව යිධත්ථො.

742. අහං හිමං සාගරසෙවිතන්තං
සමං කරිස්සාමි යථාපි පාණිං,
විකිරිය සානූනි ච පබ්බතානි ච
තස්මා සිලං දරියා පක්ඛිපාමි.

743. නයිමං මහිං අරහති පාණිකප්පං
සමං මනුස්සො කරණායමෙකො,
මඤ්ඤාමිමඤ්ඤෙව දරිං ජිගිංසං
කාරණ්ඩිය හායසි ජීවලොකං.

744. සචෙ අයං භූතධරං න සක්කා
සමං මනුස්සො කරණායමෙකො,
එවමෙව ත්වං බ්‍රහ්මෙ ඉමෙ මනුස්සෙ
නානාදිට්ඨිකෙ නානයිස්සසි තෙ.

745. සංඛිත්තරූපෙන භවං මමත්ථං
අක්ඛාසි කාරණ්ඩිය එවමෙතං
යථා න සක්කා පථවී සමායං
කාතුං මනුස්සෙන තථා මනුස්සාති.

6. කාරණ්ඩියජාතකං.

1. වංක – සීමු.
2. න තං මං ආගමිස්සති – සීමු.
3. ධඞ්කජාතකං. – ස්‍යා.
4. පවෙක්ඛසි – සීමු, මජසං.

737. ධංකය, ශොකය ගිය දෙය යළි නොගෙනේ නො පැමිණි සැපය ගෙනෙන්නේ නො වේ. එහෙයින් ශොක නො කරමි. ශොකයට සහාය නො වෙමි.

738. ශොක කරන්නා පඬු පැහැය ඇත්තේ වේ, කෘශ වේ. ඔහුට ආහාරය ප්‍රිය නො වේ. ශොක නැමති හුලෙන් විදිනා ලදුව පෙළෙන කල්හි ඔහුගේ සතුරෝ ප්‍රීත වෙති.

739. ගමෙහි හෝ ඉදින් වනයේ හෝ වළ තන්හි හෝ ගොඩ තන්හි හෝ සිටින මා වෙත විපත් නො එන්නේ ය. මම ධ්‍යාන දක්නා ලද්දෙම් වෙමි. නැතහොත් අටලෝදහම දන්නා ලද්දෙම් වෙමි.

740. යමක්හුගේ සියලු සම්පත් රස එළවන එක් මැ ආත්මය තෙම ධ්‍යාන රස එළවන්නට සමත් නො වේ. එහෙයින් මුළු පොළොව ද ඔහුට (කායික චෛතසික) සුඛය නො එළවන්නේ යි.

5. සත ජාතක යි.

741. කාරණ්ඩිය, හුදෙකලාව වනයෙහි වසනුයෙහි යුහුසුලු ස්වභාවයක් ඇති ව නැවත නැවතත් කඳුරැළියෙහි ගල් දමන්නෙහි ය. මෙයින් තොපට කවර ප්‍රයොජනයෙක් ද?

742. මම සයුරෙන් වට වූ මේ මහපොළොව සියලු කඳු හා පර්වත විසුරුවා හැර අල්ල මෙන් සම කරන්නෙමි. එහෙයින් කඳුරැළියෙහි ගල් දමන්නෙමි.

743. කාරණ්ඩිය, එක් මිනිසෙක් මේ මහපොළොව අත්ල මෙන් සම කරන්නට නො හැකි වේ යයි සිතමි. තෙපි කඳුරැළිය පිරවීමට යත්න දරන්නහු මැ මේ සත්ත්වලොකය හරනහු යයි (හෙවත් මරණයට පත්වන්නේ ය) සිතමි.

744. බ්‍රාහ්මණය, එක් මනුෂ්‍යයෙක් සතුන් ධරා සිටුනා මේ මහපොළොව සම කරන්නට සමත් නො වේ ද එපරිදි තෙපි ද නානාදෘෂ්ටික වූ මේ මනුෂ්‍යයන් සිල් ගන්නැ යි කියා ඔවා දී තොප වශයට නො පමුණුවන්නහු යි.

745. කාරණ්ඩිය, මිනිසකු විසින් මේ පොළොව සම කරන්නට යම්සේ නො හැකි ද, එසේ මැ සියලු මනුෂ්‍යයෝ ද හික්මවන්නට නො පිළිවන්හ යි භවත් මාගේ ශුභ සිඳීය සලකා ස්වල්ප වශයෙන් මට යමක් කියේ ද එය එසේ ම ය.

6. කාරණ්ඩිය ජාතක යි.

746. වන්දාමි තං කුඤ්ජර සට්ඨිහායනං
ආරඤ්ඤකං යූථපතිං යසස්සිං,
පක්ඛෙහි තං පඤ්ජලිකං කරොමි
මා මෙ වධී පුත්තකෙ දුබ්බලාය.

747. වන්දාමි තං කුඤ්ජර එකචාරිං
ආරඤ්ඤකං පබ්බතසානුගොචරං,
පක්ඛෙහි තං පඤ්ජලිකං කරොමි
මා මෙ වධී පුත්තකෙ දුබ්බලායං.

748. වධිස්සාමි තෙ ලටුකිකෙ පුත්තකානි
කිං මෙ තුවං කාහසි දුබ්බලාසි,
සතං සහස්සානිපි තාදිසීනං
වාමෙන පාදෙන පපොථයෙය්‍යා.

749. නහෙව සබ්බත්ථ බලෙන කිච්චං
බලං හි බාලස්ස වධාය හොති,
කරිස්සාමි තෙ නාගරාජා අනත්ථං
යො මෙ වධී පුත්තකෙ දුබ්බලාය.

750. කාකඤ්ච පස්ස ලටුකිකං මණ්ඩූකං නීලමක්ඛිකං,
එතෙ නාගං අඝාතෙසුං පස්ස වෙරස්ස වෙරිනං.
තස්මා වෙරං න කයිරාථ අප්පියෙන ච කෙනචී'ති.

7. ලටුකිකජාතකං.

751. අහමෙව දූසියා භූනහතා රඤ්ඤො මහාපතාපස්ස,
එතං මුඤ්චතු ධම්මපාලං හත්ථෙ මෙ දෙව ඡෙදෙහි.

752. අහමෙව දූසියා භූනහතා රඤ්ඤො මහාපතාපස්ස,
එතං මුඤ්චතු ධම්මපාලං පාදෙ මෙ දෙව ඡෙදෙහි.

753. අහමෙව දූසියා භූනහතා රඤ්ඤො මහාපතාපස්ස,
එතං මුඤ්චතු ධම්මපාලං සීසං මෙ දෙව ඡෙදෙහි.

754. නහනූනිමස්ස රඤ්ඤො මිත්තාමච්චා ච විජ්ජරෙ සුහද,
යෙ න වදන්ති රාජානං මා ඝාතයි ඔරසං පුත්තං.

755. නහනූනිමස්ස රඤ්ඤො මිත්තා ඤාතී ච විජ්ජරෙ සුහද,
යෙ න වදන්ති රාජානං මා ඝාතයි අත්‍රජං පුත්තං.

756. චන්දනරසානුලිත්තා බාහා ඡිජ්ජන්ති ධම්මපාලස්ස,
දයාදස්ස පථව්‍යා පාණා මෙ දෙව රුජ්ඣන්තීති.

8. චූළධම්මපාලජාතකං.

746. හැට අවුරුද්දෙන් බැස යන මද ඇති ඇත් රජුනි, තොප වදිමි. අරණ්‍යයෙහි ජාතය, යූථපතිය, පිරිවර ඇතියව මාගේ පියාපතින් තොප වදිමි. දුබල මාගේ දරුවන් නො නසව.

747. හස්තිරාජය, තොප වදිමි. එකලා වැ හැසිරෙනුව ආරණ්‍යකය, පර්වත හා කඳු සමීපයන්හි ආහාර සොයනුව, පියාපතින් තොප වදිමි. දුබල මාගේ දරුවන් නො නසව.

748. කැටකිරිල්ල තීගේ දරුවන් මරන්නෙමි. දුබල වූ තෝ මට කුමක් කරන්නෙහි ද? තී බඳු ලක්‍ෂයක් වුව ද වම් පයින් (පාගා) සුණුවිසුණු කරන්නෙමි.

749. හස්තිරාජය, හැම තන්හි කාය ශක්තියෙන් ප්‍රයොජන නැත. අනුවණයාගේ බලය (පර) හිංසාව පිණිස වෙයි. යමෙක් දුබල මාගේ දරුවන් මැරී ද ඒ තොපට විපතක් කරන්නෙමි.

750. කවුඩා කැටකිරිල්ල මැඩියා හා නිලමැස්සා බලව, මොව්හු හස්ති නාගයා මැරූහ. වෛර ඇතියන්ගේ වෛරයේ තරම බලව. එහෙයින්, කිසි කෙනකුන් කෙරෙහි වෛර නො කරව.

7. ලටුකික ජාතක යි.

751. දේවයන් වහන්ස, මහාප්‍රතාප රජුට වැරදි කෙළෙම් නමුත් නසන ලද වැඩ ඇත්තේ නමුත් මම් ම ය. මේ ධර්‍මපාල කුමරුවා මුදවා මාගේ අත් කපන්නේ මැනැවි.

752. දේවයන් වහන්ස, මහාප්‍රතාප රජුට වැරැදි කෙළෙම් නමුත් නසන ලද වැඩ ඇත්තේ නමුත් මම් ම ය. මේ ධර්‍මපාල කුමරුවා මුදවා! මාගේ පා කපව.

753. දේවයන් වහන්ස, මහාප්‍රතාප රජුට වැරැදි කෙළෙම් නසන ලද වැඩ ඇතියෙම් මම් ම ය. මේ ධර්‍මපාල කුමරුවා මුදවා! මාගේ හිස සිඳුව.

754. ඖරස පුත්‍රයා නො මරව යි රජතුමාට යම් කෙනෙක් නො කියත් ද, (එහෙයින්) මේ රජුට මිතුරෝ ද නෑයෝ ද හිතවත්තු ද එකානතයෙන් නැත්තාහ යි සිතමි.

755. පුතා නො මරව යි රජතුමාට යම් කෙනෙක් නො කියත් ද (එහෙයින්) මේ රජුට මිතුරෝ නෑයෝ හිතවත්තු එකානතයෙන් නැත්තාහ යි සිතමි.

756. පොළොවට හිමිකරු වූ ධර්‍මපාල කුමාරයාගේ සඳුන් කල්ක ගල්වන ලද දෑත කපති. දෙවයන් වහන්ස, මාගේ පණ නිරුද්ධ වේ.

8. චුලලධම්මපාල ජාතක යි.

757. වික්කම රෙ මහාමිග වික්කම රෙ හරීපද[1],
ඡින්ද වාරත්තිකං පාසං නාහං එකො වනෙ රමෙ.

758. වික්කමාමි න පාරෙමි භූමිං සුම්භාමි වෙගසා,
දළ්හො වාරත්තිකො පාසො පාදං මෙ පරිකන්තති.

759. අත්ථරස්සු පලාසානි අසිං නිබ්බාහ ලුද්දක,
පඨමං මං හනිත්වාන[2] හන පච්ඡා මහාමිගං.

760. න මෙ සුතං වා දිට්ඨං වා භාසන්තිං මානුසිං මිගිං,
ත්වඤ්ච භද්දෙ සුඛී හොහි එසො චාපි මහාමිගො.

761. එවං ලුද්දක නන්දස්සු සහ සබ්බෙහි ඤාතිහි,
යථාහමජ්ජ නන්දාමි මුත්තං දිස්වා මහාමිගන්ති.

9. සුවණ්ණමිගජාතකං.

762. වාති ගන්ධො තිමිරානං කුසමුද්දො ච ඝොසවා,
දූරෙ ඉතො හි සුසන්ධි තම්බකාමා[3] තුදන්ති මං.

763. කථං සමුද්දමතරි කථං අද්දක්ඛි සෙරුමං[4],
කථං තස්සා ච තුය්හඤ්ච අහු සග්ගසමාගමො[5].

764. භරුකච්ඡා පයාතානං වාණිජාන ධනෙසිනං[6],
මකරෙහබ්භිදා[7] නාවා ඵලකෙනාහමප්ලවිං.

765. සා මං සණ්හෙන මුදුනා නිච්චං චන්දනගන්ධිනී,
අඞ්කෙන[8] උද්ධරී භද්දා මාතා පුත්තංව ඔරසං.

766. සා මං අන්නෙන පානෙන වත්ථෙන සයනෙන ච,
අත්තනාපි ච මද්දක්ඛී[9] එවං තම්බ විජානහීති.

10. සුසන්ධිජාතකං[10].

මණිකුණ්ඩලවග්ගො පඨමො.

තස්සුද්දානං:

අථ ජිනවරොහරිතං තිණකො
අථ භින්නප්ලවො උරගොවසතො,
දරියා පුන කුඤ්ජර භූනහතා
මිගපුත්තමසග්ගවරෙන දස.

1. වික්කමරෙ හරිපද වික්කමරෙ මහාමිග - මජසං.
2. වධිත්වාන – මජසං.
3. තප්පකාහ – මජසං.
4. සෙදුමං – මජසං.
5. අග්ග – ස්‍යා.
6. ධනෙසීනං - මජසං.
7. මඞ්කරෙහිභිද – ස්‍යා.
8. අඞ්ගෙන – ස්‍යා.
9. මන්දක්ඛී - මජසං, ස්‍යා.
10. සුයොනන්දි ජාතකං – මජසං.

757. එම්බා මෘගය, මහාමෘගය, වෑයම් කරව. රන්වන් පා ඇති මෘගය වෑයම් කරව. වරපටින් තැනූ පුඩුව සිඳින්න. එකලා වූ වනයෙහි (වාසයට) මම නො ඇලෙමි.

758. උත්සාහ ගනිමි. පුඩුව සිඳලන්නට නො හැක්කෙමි. වේගයෙන් පොළොවට පහර දෙමි, තද වරපටින් කළ පුඩුව මගේ පා කපයි.

759. වැද්දණෙනි, මස් තැබීමට කොළ අතුරව. කඩුව කොපුවෙන් ඉවත ගනුව. පළමුව මා මරා පසුව මහාමෘගයා මරව.

760. මනුෂ්‍ය භාෂාවෙන් කියන (කථාකරන) මුවදෙනක (පිළිබඳ) මා අසා නැත. දකින ලද්දේ ද නැත. සොඳුර, තෝ සුවපත්ව, මහමුවා ද සුවපත් වේවා!

761. වැද්දණෙනි, පුඩුවෙන් ගැළවුණු මහාමෘගයා දැක මම අද යම්සේ සතුටු වෙම් ද, එසේ තෙපි ද තොපගේ නෑයන් සමග සතුටු වේවා!

9. සුවණ්ණමිග ජාතක යි.

762. තඹ රජතුමනි, මිඳෙල්ලමල්හි සුවඳ හමයි. දිය සයුර ද හඬ නගයි. සුසන්ධි බිසොව මෙයින් දුර දෙසෙක වසයි. කාම සිතුවිලි මගේ හදවත පෙළයි.

763. සයුර කෙසේ තරණය කෙළෙ ද සේරුම දූපත කෙසේ දුටුවේ ද සගගය, ඇගේ ද තාගේ ද සමාගමය හෙවත් එක්වීම කෙසේ වී ද.

764. හරුකච්ඡ නැමැති තොටුපලින් පිටත්ව ධන සෙවීමට යන වෙළෙඳුන්ගේ නැව මෝරුන් විසින් බිඳින ලද මම පුවරුකඩෙකින් එතෙර ගියෙමි.

765. නිතර හමා යන සඳුන් සුවඳැති ඒ භද්‍රාවෝ මුදුමොළොක් බසින් කතා කොට ඖරස පුත්‍රයකු ගන්නා මවක මෙන් මා දෝතින් ගොඩට ගත්හ.

766. තඹය, ඒ චිත්‍රලොචනාවෝ මා ආහාරපානයෙන් ද වස්ත්‍රයෙන් හා සයනයෙන් ද පිනවූහ. එපමණක් නොව අභිරමණයෙන් ද මා පිනවූහ. එය මෙසේ දනු මැනැවි.

10. සුසනධි ජාතක යි.

පළමුවන මණිකුණ්ඩල වර්ග යි.

එහි උද්දනය :

මණිකුණ්ඩල (ජිනවර) ජාතක යැ, සුජාත (හරිත) ජාතක යැ, ධොනසාක (හිත්‍යපලව) ජාතක යැ, උරගජාතක යැ, ඝතජාතක යැ, කාරණ්ඩිය (දිරි) ජාතක යැ, ලටුකික (කුක්කුර) ජාතක යැ, චුල්ලධම්මපාල (භූනහත) ජාතක යැ, සුවණ්ණමිග (මිගපූතන) ජාතක යැ, සුසන්ධි (සගග) ජාතක යැ යි දසයෙක් වේ.

2. වණ්ණාරොහවග්ගො

767. වණ්ණාරොහෙන ජාතියා බලනික්ඛමනෙන ච[1],
සුබාහු න මයා සෙය්‍යො සුදඨ[2] ඉති භාසසි.

768. වණ්ණාරොහෙන ජාතියා බලනික්ඛමනෙන ච,
සුදඨො න මයා සෙය්‍යො සුබාහු ඉති භාසසි.

769. එවඤ්චෙ මං විහරන්තං සුබාහු සම්ම දුබ්භසි,
නදනාහං තයා සද්ධිං සංවාසමභිරොචයෙ.

770. යො පරෙසං වචනානි සද්දහෙථ[3] යථාතථං,
ඛිප්පං භිජ්ජෙථ මිත්තස්මිං වෙරඤ්ච පසවෙ බහුං.

771. න සො මිත්තො යො සදා අප්පමත්තො
භෙදසඞ්කී රන්ධමෙවානුපස්සී,
යස්මිඤ්ච සෙති උරසීව පුත්තො
ස වෙ මිත්තො යො අභෙජ්ජො පරෙහීති.

1. වණ්ණාරොහජාතකං.

772. සීලං සෙය්‍යො සුතං සෙය්‍යො ඉති මෙ සංසයො අහු,
සීලමෙව සුතා සෙය්‍යො ඉති මෙ නත්ථි සංසයො.

773. මොඝා ජාති ච වණ්ණො ච සීලමෙව කිරුත්තමං,
සීලෙන අනුපෙතස්ස සුතෙනත්ථො න විජ්ජති.

774. ඛත්තියො ච අධම්මට්ඨො වෙස්සො චාධම්මනිස්සිතො,
තෙ පරිච්චජ්ජුභො ලොකෙ උපපජ්ජන්ති දුග්ගතිං.

775. ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා චණ්ඩාලපුක්කුසා,
ඉධ ධම්මං චරිත්වාන භවන්ති තිදිවෙ සමා.

776. න වෙද සංපරායාය න ජාති නොපි බන්ධවා,
සකඤ්ච සීලං සංසුද්ධං සම්පරායසුඛාවහන්ති.

2. සීලවීමංස ජාතකං.

1. බලා – සීමු.
2. සුදඨො – මජසං, සීමු.
3. සද්දහෙය්‍ය – මජසං.

2. වණ්ණාරොහ වර්ගය

767. සුදඨයෙනි, (තෙපි) ශරීරවර්ණයෙන් ද ආරොහපරිණාහයෙන් ද උත්තම ජාතියෙන් ද කාය බලයෙන් හා වීර්‍ය්‍ය බලයෙන් ද සුබාහු නම් ව්‍යාඝ්‍රයා මට වඩා උසස් නො වේ යයි කියවු ද?

768. එම්බා සුබාහු, (තෙපි) ශරීරවර්ණයෙන් ද ආරොහපරිණාහයෙන් ද උත්තම ජාතියෙන් ද කාය බලයෙන් හා වීර්‍ය්‍ය බලයෙන් ද සුදඨ මට වඩා උසස් නො වේ යයි කියවු ද?

769. සගය, සුබාහු මෙසේ තා හා සමග වැවසන මා හිවලාගේ බස් පිළිගෙන නසනු කැමැත්තහු ය. මෙතැන් පටන් මම තා සමග වසනු නො කැමැත්තෙමි.

770. යමෙක් මෙරමාගේ මිථ්‍යාවචනයන් තථ්‍ය ලෙස හඳහා ගනී ද හේ මිතුරා කෙරෙහි වහා බිඳෙන්නේ යැ. බොහෝ වූ වෛරය ද දනවන්නේ යැ.

771. යමෙක් හැමදා නො පමාව මිත්‍රභෙදයෙහි සැක ඇත්තේ ද මිත්‍රයාගේ සිදුරු මැ දක්නාසුලු වේ ද හේ මිතුරෙක් නො වෙයි. යමෙක් ඖරස පුත්‍රයකු මෙන් වෙසේ ද අනුන් විසින් බිඳිය නොහැකි වේ ද හෙ එකාන්තයෙන් මිතුරෙක් වේ.

1. වණ්ණාරොහ ජාතක යි.

772. සීලය ශ්‍රෙෂ්ඨ වේ ද ශ්‍රුතය ශ්‍රෙෂ්ඨ වේ ද? යි මට සැකයෙක් විය. ශ්‍රුතයට වඩා ශීලය මැ ශ්‍රෙෂ්ඨ වේ යන මෙහි (දැන්) සැකයෙක් මට නැත.

773. ක්‍ෂත්‍රියාදි ජාති ද ශරීර වර්ණ ද තුච්ඡ යැ. සීලය ම උතුම් වේ ල. සීලයෙන් යුක්ත නො වූවහුගේ ශ්‍රුතයෙන් ප්‍රයොජනයෙක් නැත.

774. අධර්මයෙහි පිහිටි ක්‍ෂත්‍රියයා ද අධර්මය ඇසුරු කළ වෛශ්‍යයා ද යන දෙදෙන දෙව්මිනිස් දෙලොව හැර දුගතියෙහි උපදිති.

775. ක්‍ෂත්‍රිය යැ බ්‍රාහමණ යැ වෛශ්‍ය යැ ශුද්‍ර ය. චණ්ඩාල යැ බබුරු යැ යන කුලයන්හි උපන්නෝ මෙලොව පින්කම් කොට දෙව්ලොව දී සම වෙති.

776. වෙදයෝ ද ජාතිය ද නෑයෝ ද පරලොව සුව පිණිස නො වෙත්. තමාගේ පිරිසුදු සීලය මෙලොව පරලොව සුව පිණිස වේ.

2. සීලවීමංස ජාතක යි.

777. හිරිං තරන්තං විජිගුච්ඡමානං
තවාහමස්මී ඉති භාසමානං,
සෙය්‍යානි කම්මානි අනාදියන්තං
නෙසො මමන්ති ඉති නං විජඤ්ඤා.

778. යං හි කයිරා තං හි වදෙ යං න කයිරා න තං වදෙ,
අකරොන්තං භාසමානං පරිජානන්ති පණ්ඩිතා.

779. න සො මිත්තො යො සදා අප්පමත්තො
භෙදාසඞ්කී රන්ධමෙවානුපස්සී,
යස්මිඤ්ච සෙති උරසීව පුත්තො
ස වෙ මිත්තො යො අභෙජ්ජො පරෙහි.

780. පාමොජ්ජකරණං ඨානං පසංසාවහනං සුඛං,
ඵලානිසංසො භාවෙති වහන්තො පොරිසං ධුරං.

781. පවිවෙකරසං පිත්වා රසං උපසමස්ස ච,
නිද්දරො හොති නිප්පාපො ධම්මපීතිරසං පිව'න්ති.

3. හිරිජාතකං.

782. කො නු සන්තම්හි පජ්ජොතෙ අග්ගිපරියෙසනං චරං,
අද්දක්ඛි රත්තිං ඛජ්ජොතං ජාතවෙදං අමඤ්ඤථ.

783. ස්වාස්ස ගොමයචුණ්ණානි අභිමත්ථං තිණානි ච,
විපරීතාය සඤ්ඤාය නාසක්ඛි පජ්ජලෙතවෙ.

784. එවම්පි අනුපායෙන අත්ථං න ලභතෙ මගො,
විසාණතො ගවං දොහං යත්ථ ඛීරං න වින්දති.

785. විවිධෙහි උපායෙහි අත්ථං පප්පොන්ති මාණවා,
නිග්ගහෙන අමිත්තානං මිත්තානං පග්ගහෙන ච.

786. සෙනාමොක්ඛපලාභෙන වල්ලභානං නයෙන ච,
ජගතිං ජගතීපාලා ආවසන්ති වසුන්ධරන්ති.

4. ඛජ්ජොපනකපඤ්හා.

777. ලජ්ජාව දුරු කරන මිතුරුබව පිළිකුල් කරන මම ඔබගේ මිත්‍රයෙක්මි යි වචන මාත්‍රයෙන් කියන, දෙමි කරමි යන ප්‍රතිඥාව අනුව ක්‍රියා නො කරන මේ පුද්ගල මාගේ මිත්‍රයෙක් නො වේ යයි ඔහු දැනගන්නේ ය.

778. යමක් කරන්නේ ද එය මැ කියන්නේ ය. යමක් නො කරන්නේ ද එය නො කියන්නේ ය, නො කරන දැය කියන ඔහු පඬිවරු හඳුනති.

779. යමෙක් හැමදා නො පමා වැ මිත්‍රභෙදයෙහි සැක ඇත්තේ ද මිතුරාගේ සිදුරු මැ දක්නාසුලු වේ ද හේ මිතුරෙක් නො වෙයි. යමෙක් ඖරස පුත්‍රයකු මෙන් වෙසේ ද අනුන් විසින් බිඳිය නො හේ ද හෙ එකාන්තයෙන් මිතුරෙකි.

780. දන සීල භාවනාදි පුරුෂයාට අයත් පුණ්‍යක්‍රියා කිරීමට වැයම් කරන, ඵලය හා ආනිශංසය විඳිනු රිසි පුද්ගලයා සතුටට හේතුවන පැසැසුම් ගෙන දෙන සැපය දියුණු කරයි.

781. දහම්රස පානය කරන්නේ ත්‍රිවිධ විවෙකරසය ද (කාය විවෙක, චිත්තවිවෙක, උපධිවිවෙක) කෙලෙස් සන්හිඳුවාලීමෙන් ව්‍යුපශමසුඛය ද පීඩා නැතියෙක් ද පව් නැතියෙක් ද වේ.

3. හිරි ජාතක යි.

782. කවරෙක්, දැල්වෙන ගිනි ඇති කල ගිනි සොයා ඇවිදිනුයේ රාත්‍රියේ කණාමැදිරියකු දැකැ ගිනිය යි සිතා ද,

783. හෙතෙම කණාමැදිරියා මතුයෙහි ගොමරිටි තණරොඩු එකතු කොට වැරදි කල්පනාවෙන් ගිනි පිඹින්නේ නමුදු ගිනි දල්වන්නට නොහැකි වී ද,

784. එපරිදි පිළිවෙළ වරදවාගෙන සොයන අඥානයා ප්‍රයොජන නො ලබයි. ගවහඟින් කිරි දෙවන්නා කිරි නොලබන්නාක් මෙනි.

785. නොයෙක් ක්‍රමයන්ගෙන් මිනිස්සු දියුණුවට පැමිණෙත්. සතුරන්ට නිග්‍රහ කිරීමෙන් ද මිතුරන්ට සංග්‍රහ කිරීමෙන් ද,

786. සෙනාවට ප්‍රධාන ඇමැතියන් ලැබීමෙන් ද විශ්වාස කටයුතු ඇමැතියන්ගේ උපක්‍රමයන්ගෙන් ද යන උපායයන්ගෙන් පොළොව අයිති කරගෙන රජවරු වෙසෙති.

4. ඛජ්ජොපණක ප්‍රශ්නය.

787. ධුත්තොමහි[1] සම්ම සුමුඛ ජූතෙ අක්ඛපරාජිතො,
හරෙහි[2] අම්බපක්කානි විරියනෙන භක්ඛයාමසෙ.

788. අලිකං වත මං සම්ම අභූතෙන පසංසසි,
කො තෙ සුතො වා දිට්ඨො වා සුමුඛො නාම මක්කටො.

789. අජ්ජාපි මෙ තං මනසි යං මං තං අහිතුණ්ඩික,
ධඤ්ඤාපණං පවිසිත්වා මත්තො ඡාතං හනාසි මං.

790. තාහං සරං දුක්ඛසෙය්‍යං අපි රජ්ජම්පි කාරයෙ,
නෙවාහං යාචිතො දජ්ජං තථා හි භයතජ්ජිතො.

791. යඤ්ච ජඤ්ඤා කුලෙජාතං ගබ්භෙ තිත්තං අමච්ඡරිං,
තෙන සඛිඤ්ච මිත්තඤ්ච ධීරො සන්ධාතුමරහතී'ති.

5. අහිතුණ්ඩිකජාතකං.

792. මධුවණ්ණං මධුරසං මධුගන්ධං විසං අහු,
ගුම්බියො ඝාසමෙසානො අරඤ්ඤෙ ඔදහී විසං.

793. මධු ඉති මඤ්ඤමානා යෙ තං විසමසායිසුං[3],
තෙසං තං කටුකං ආසි මරණං තෙනුපාගමුං.

794. යෙ ච ඛො පටිසඞ්ඛාය විසං තං පරිවජ්ජයුං,
තෙ ආතුරෙසු සුඛිතා ඩය්හමානෙසු නිබ්බුතා.

795. එවමෙව මනුස්සෙසු විසං කාමා සමොහිතා,
ආමිසං බන්ධනං චෙතං මච්චුවසො ගුහාසයො.

796. එවමෙවං ඉමෙ කාමෙ ආතුරා පරිචාරකෙ,
යෙ සදා පරිවජ්ජෙන්ති සඞ්ගං ලොකෙ උපච්චගුන්ති.

6. ගුම්බියජාතකං.

1. ධුත්තොමහි – සීමු.
2. සෙවෙහි – සීමු, හාරෙහි – මජසං.
3. විසමබාදිසුං – මජසං. සයා.

787. යහළු සුමුඛය, (මම) ද්‍යූ කෙළියෙන් පැරදුණු ධූර්තයෙක්මි. අඹපල හෙළාලව. තොපගේ වීර්යය අනුභව කරමු. තොපගේ වීර්යයෙන් උපන් අඹ පල අනුභව කරමු යි සේයි.

788. යහළුව, නැති ගුණයෙන් මා පසස්නෙහි එය එකැතින් මුසා යැ. වානරයා සුන්‍දර මුහුණු ඇත්තෙකැ යි කවර තැනෙකැ තා විසින් අසන ලද ද දක්නා ලද හෝ වේ ද?

789. අහිතුණ්ඩිකය, මත් වූ තෙපි සයින් පෙළුණු මා ධාන්‍යාපණයට ඇතුළු කොට යම් හෙයෙකින් (උණපත්තෙන්) පහර දුන්නෙහි ද එය අද දක්වා මා සිත්හි පවතී.

790. (ඉදින් තෙපි බරණැස් රජය ගෙනැදී) මා ලවා රජය කරවන්නහු වී නමුදු ධාන්‍යාපණයෙහි ඒ දුක්‍ඛශයනය සිහි කරන මම තොප විසින් අයදනා ලද්දෙමි එක් අඹපලයකුදු නො දෙමි. එසේ මැ යි. තොප විසින් මම බියෙන් තැති ගන්වන ලදිමි.

791. ප්‍රාඥ තෙම යමකුත් පූජ්‍යකුලයෙහි උපනෙකැ මවුකුස හෝ (සරසා පිළියෙළ කරන ලද) යහන් ගැබ්හි තෘප්තයෙකැ නොමසුරෙකැ යි දන්නේ ද ඔහු හා සමග යහළු බව ද මිතුරු බව ද සටනාවට නිසි වේ.

5. අහිතුණ්ඩික ජාතක යි.

792. මී වැනි පැහැය ඇති මී වැනි රස ඇති මී වැනි සුවඳ ඇති විෂයෙක් විය. ගුම්බිය නමැති යකෙක් ආහාර සොයනුයේ වනයෙහි විෂ බහාලී ය.

793. මී යයි සිතා යම් කෙනෙක් එය කැවෝ ද ඔවුන්ට එය කටුක විය. එයින් ඔව්හු මළහ.

794. යම් කෙනෙක් නුවණින් සලකා බලා ඒ විෂ වර්ජනය කළෝ ද ඔව්හු මරණාසන්න වූවන් අතරේ සුවපත් වූහ. විෂ තෙදින් දැවෙනුවන් අතුරෙහි නිවියහ.

795. එපරිදි පංචකාමයෝ මිනිසුන් අතුරෙ ඒ ඒ තැනැ තබා ලූ විෂයකැ යි දතයුත්තාහ. මේ පංචකාම ආමිෂ ද බන්‍ධන ද වෙයි. තෙල පංචකාමය ශරීරය නැමැති ගුහායෙහි වෙසෙන මාරයා මැ යි.

796. එපරිදි කෙලෙස් පරිවාරකයන් ඇති මේ පංචකාමයන් මරණාසන්න නුවණැති යම් පුරුෂ කෙනෙක් හැම කල්හි දුරු කෙරෙත් ද ඔහු ලොකයෙහි සඞ්ග සඞ්ඛ්‍යාත රාගාදි කෙලෙසුන් ඉක්මවා ගියාහු වෙත්.

6. ගුම්බිය ජාතක යි.

797. යවායං සාළියඡාපොති කණ්හසප්පං අගාහයි,
තෙන සප්පෙනයං දට්ඨො හතො පාපානුසාසකො.

798. අහනන්තමහනන්තාරං[1] යො නරො හන්තුමිච්ඡති,
එවං සො නිහතො සෙති යථායං පුරිසො හතො.

799. අහනන්තමඝාතෙන්තං[2] යො නරො හන්තුමිච්ඡති,
එවං සො නිහතො සෙති යථායං පුරිසො හතො.

800. යථා පංසුමුට්ඨිං පුරිසො පටිවාතං පටික්ඛිපෙ,
තමෙව සො රජො හන්ති තථායං පුරිසො හතො.

801. යො අප්පදුට්ඨස්ස නරස්ස දුස්සති
සුද්ධස්ස පොසස්ස අනඞ්ගණස්ස,
තමෙව බාලං පච්චෙති පාපං
සුඛුමො රජො පටිවාතංව ඛිත්තොති.

7. සාළියජාතකං.

802. අමිත්තහත්ථත්ථගතා තචසාරසමප්පිතා,
පසන්නමුඛවණ්ණත්ථ කස්මා තුම්හෙ න සොචථ.

803. න සොචනාය පරිදෙවනාය
අත්ථො ච ලබ්භා[3] අපි අප්පකොපි,
සොචන්තමෙනං දුඛිතං විදිත්වා
පච්චත්ථිකා අත්තමනා භවන්ති.

804. යතො ච ඛො පණ්ඩිතො ආපදසු
න වෙධති අත්ථවිනිච්ඡයඤ්ඤූ,
පච්චත්ථිකාස්ස දුඛිතා භවන්ති
දිස්වා මුඛං අවිකාරං පුරාණං.

805. ජප්පෙන මන්තෙන සුභාසිතෙන
අනුප්පදානෙන පවෙණියා වා
යථා යථා යත්ථ ලභෙථ අත්ථං
තථා තථා තත්ථ පරක්කමෙය්‍ය.

806. යතො ච ජානෙය්‍ය අලබ්භනෙය්‍යො*
මයාව[4] අඤ්ඤෙන වා එස අත්ථො,
අසොචමානො අධිවාසයෙය්‍ය
කම්මං දළ්හං කින්ති කරොමිදනීති.

8. තචසාරජාතකං.

1. අහනන්තාර මහනන්තාරං – සිමු, මජසං.
2. අහනන්තාරමඝාතෙන්තං – මජසං.
3. අත්ථොව ලබ්භා – ස්‍යා අත්ථොවලබ්භා – මජසං
4. මයා වා – මජසං, ස්‍යා.
(* සචෙ පජානෙය්‍ය අලබ්භනෙය්‍යො – අංගුත්තරනිකාය)

797. දුෂ්ට වෛද්‍යවරයෙක් සැළලිහිණි පැටියෙකැ යි (කියා) බාලයකු ලවා නයකු ගැන්වී ද මේ ලාමක අනුසාසකයා ඒ සර්පයා විසින් ඩසින ලදුව මළේ ය.

798. යම් මිනිසෙක් (අනුන්) නොපහරන නො මරන කෙනකු නසන්නට කැමැති වේ ද හේ මේ පුරුෂයා මළේ යම්සේ ද එසේ නටුයේ මරණශයශායෙන් හෝනේ ය.

799. යම් මිනිසෙක් (අනුන්) නොපහරන නො මරන කෙනකු මරන්නට කැමැති වේ ද හේ මේ පුරුෂයා මළේ යම්සේ ද එසේ නැසුණේ හෝනේ ය.

800. යම්සේ පුරුෂයෙක් පස්මිටක් උඩුසුළඟට දමා ද, එ රජස් ඔහු මැ පහරනේ ද එසේ මේ පුරුෂයා ද නැසුණේ ය.

801. යමෙක් නිරපරාධ වූ නිකෙලෙස් වූ පුරුෂයාට දෙවෂ කෙරේ ද උඩුසුළඟට දැමූ දූලි ලෙසින් අපරාධ කළ එ මැ අනුවණයා කරා පාපය පෙරළා එන්නේ ය.

7. සාළිය ජාතක යි.

802. සතුරන් අතට පත් වැ හුණ අඩුවක බඳනා ලද තෙපි ප්‍රියමනාප මුහුණ ඇත්තහු ය. කවර හෙයින් තෙපි ශොක නො කරවු ද?

803. ශොක වීමෙන් ද හැඬීමෙන් ද මද වූ හෝ ප්‍රයොජනයක් ලද නො හැකි ය. දුක්ඛිත වූ එහෙයින් මැ ශොක කරන මොහු දුනගත් සතුරෝ සතුටු වෙති.

804. අර්‍ථ විනිශ්චය දන්නා නුවණැත්තා යම්හෙයකින් විපතෙහි දී නොසැලේ ද එහෙයින්, විකෘත නො වූ පළමු පැවැති මුහුණ දක්නා සතුරෝ දුකට පත් වෙති.

805. මන්ත්‍ර ජප කිරීමෙන් ද සාකච්ඡාවෙන් ද ප්‍රියවචනයෙන් ද අල්ලස් දීමෙන් ද ප්‍රවෙණි කථායෙන් ද යි යම් යම් පරිද්දෙකින් යම් තැනෙකැ ප්‍රයොජනයෙක් ලැබේ ද එහි ලා ඒ ඒ අයුරින් වැයම් කරන්නේ ය.

806. මා විසින් හෝ අන් කෙනකුන් විසින් හෝ තෙල අර්‍ථ ලබන්නට නො හැකි යයි යම් හෙයකින් දනී නම් දැඩි කර්මයෙකැ දූන් කුමක් කෙරෙම් දැ යි ශොක නො කෙරෙමින් ඉවසන්නේ යි.

8. තචසාර ජාතක යි.

807\. ක්‍යාහං දෙවානමකරං කිං පාපං පකතං මයා,
යම්මෙ සිරස්මිං ඔහච්ච[1] චක්කං භමති මත්ථකෙ.

808\. අතික්කම්ම රමණකං සදාමත්තඤ්ච දූභකං[2],
බ්‍රහ්මත්තරඤ්ච[3] පාසාදං කෙනට්ඨෙන ඉධාගතො.

809\. ඉතො බහුතරා භොගා අත්‍ර මඤ්ඤෙ භවිස්සරෙ,
ඉති එතාය සඤ්ඤාය පස්ස මං ව්‍යසනං ගතං.

810\. චතුබ්භි අට්ඨජ්ඣගමා අට්ඨාහි ච සොළස[4],
සොළසාහි ච බත්තිංස අත්‍රිච්ඡං චක්කමාසදෙ.
ඉච්ඡාහතස්ස පොසස්ස චක්කං භමති මත්ථකෙ.

811\. උපරි විසාලා[5] දුප්පූරා ඉච්ඡා විසදගාමිනී[6],
යෙ තං අනුගිජ්ඣන්ති තෙ හොන්ති චක්කධාරිනො'ති.

9. මිත්තවින්දකජාතකං.

812\. හංසො පලාසමවච නිග්‍රොධො සම්ම ජායති[7],
අඞ්කස්මිං[8] තෙ නිසින්නොව සො තෙ මම්මානි ඡෙච්ඡති.

813\. වඩ්ඪතුමෙව[9] නිග්‍රොධො පතිට්ඨස්ස භවාමහං,
යථා පිතා ච මාතා ච[10] එවමෙසො භවිස්සති.

814\. යං ත්වං අඞ්කස්මිං වඩ්ඪෙසි[11] ඛීරරුක්ඛං භයානකං,
ආමන්ත ඛො තං ගච්ඡාම වුඩ්ඪිමස්ස න රුච්චති.

815\. ඉදනි ඛො මං භායති මහානෙරු නිදස්සනං,
හංසස්ස අනභිඤ්ඤාය මහා මෙ භයමාගතං.

816\. න තස්ස වුඩ්ඪි කුසලප්පසත්ථා
යො වඩ්ඪමානො ඝසතෙ පතිට්ඨං,
තස්සූපරොධං පරිසඞ්කමානො
පතාරයී මූලවධාය ධීරොති.

10. පලාසජාතකං.

වණ්ණාරොහවග්ගො දුතියො.

1. උහච්ච සීමු. ඌහච්ච – මජසං.
2. අතික්කම්මරම්මණං–සදාමත්තඤ්චදූභකං – මජසං.
3. බ්‍රහ්මත්තරඤ්ච – සීමු, මජසං.
4. අට්ඨාහිචාපිසොළස දුප්පූරං – මජසං.
5. උපරි විසාලං – මජසං.
6. ඉච්ඡා විසටගාමිනී – මජසං, සීමු.
7. සම්පජායති – මජසං.
8. අඞ්ගස්මිං – මජසං.
9. වඩ්ඪිතමෙව – මජසං.
10. පිතාවා මාතා වා – සීමු.
11. වඩ්ඪෙසි – සීමු, මජසං.

807. යම් හෙයෙකින් මගේ හිස පැහැර චක්‍රය මස්තකයෙහි බමා ද එබඳු කවර වරදක් මම දෙවියන්ට කෙළෙම් ද මා විසින් කවර පාපයක් කරන ලද ද?

808. පළිඟු රිදී මැණික් සහ රුවන් යන ප්‍රාසාදයන් ඉක්ම කවර හෙයෙකින් මෙහි ආයෙහි ද?

809. මෙ සතර පහයෙහි සම්පතට වඩා මෙහි බොහෝ ඇති වනැ යි මේ හැඟීමෙන් විපතට පත් මා බලව.

810. සතර දෙනකුන්ගෙන් නො සතුටු ව අටදෙනකුන් ළඟට ගියේ යැ. අට දෙනකුන්ගෙනුදු නො සතුටු ව සොළොස් දෙනකුන් ළඟට ගියේ යැ. සොළොස් දෙනකුන්ගෙනුදු නොසතුටු ව දෙතිස් දෙනකුන් ළඟට ගියේ ය. අධික අධිකය පතන්නේ උරචක්‍රයට පැමිණියේ ය. තණ්හායෙන් නැසුණ පුරුෂයා මතැ උරචක්‍රය බමා.

811. මතු මත්තෙහි විශාල වූ පුරවන්නට නො හැකි තෘෂ්ණා තොමෝ (රූපාදි අරමුණෙහි) පැතිර පවත්නී ය. යම් කෙනෙක් ඒ තෘෂ්ණාව පුනපුනා ගිජු වැ ගනිත් ද ඔහු චක්‍රධාරී වෙති.

9. මිත්තවින්දක ජාතක යි.

812. හංසයා පලාස දෙවියාට මෙසේ කී ය: යහළුව, නුගරුකෙක් හටගනී. ඒ නුගරුක තොපගේ අඩක සඞ්ඛ්‍යාත වෙලෙප්හි හුන්නේ මැ තොපගේ මර්‍මයන් සිඳුනේ යැ.

813. නුගරුක වැඩේවා. මේ රුකට මම පියකු මෙන් හෝ මවක මෙන් හෝ පිහිට වෙමි. තෙල තැනැත්තේ මහලු මාපියනට දරුවකු මෙන් පිහිට වන්නේ යැ.

814. යම් හෙයෙකින් තෙපි බිය ගෙන දෙන කිරිගස ඇකයේ වඩවු ද (එහෙයින්) තොප අමතා යම්හ. මේ නුගරුක්හි වර්ධනය මට රුස්නේ නො වෙයි.

815. (බාල කල්හි මා තුටු කළ මේ නුගරුක) දැන් (වැඩීගියෙ) මා බිය පත් කරයි. හංසයාගේ මහමෙර බඳු වචනය අසා නො දැන මට මහබියෙක් ආයේ ය.

816. යමෙක් වැඩෙනුයේ තමහට වූ මූල ප්‍රතිෂ්ඨාව නසා ද ඔහුගේ ඒ වැඩීම නුවණැත්තන් විසින් නො පසස්නා ලද ය ඔහුගෙන් වන විනාශය යයි සැක කරන නුවණැත්තේ මුලිනුපුටන්නට වැයම් කරන්නේ ය.

10. පලාස ජාතක යි.

දෙවැනි වණ්ණාරොහ වර්ග යි.

3. අඩ්ඪවග්ගො

817\. එවම්භූතස්ස තෙ රාජ ආගතස්ස වසෙ මමං,
අත්ථි නු කොචි පරියායො යො තං දුක්ඛා පමොචයෙ.

818\. එවම්භූතස්ස මෙ තාත ආගතස්ස වසෙ තව,
නත්ථි නො කොචි පරියායො යො මං දුක්ඛා පමොචයෙ.

819\. නාඤ්ඤං සුචරිතං රාජ නාඤ්ඤං රාජ සුභාසිතං,
තායතෙ මරණ කාලෙ එවමෙවිතරං ධනං.

820\. අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ,
යෙ තං උපනය්හන්ති වෙරං තෙසං න සම්මති.

821\. අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ,
යෙ තං න උපනය්හන්ති වෙරං තෙසූපසම්මති.

822\. නහි වෙරෙන වෙරානි සම්මන්තීධ කුදචනං,
අවෙරෙන ච සම්මන්ති එස ධම්මො සනන්තනොති.

1. දීඝිතිකොසලජාතකං.

823\. අගාරා පච්චුපෙතස්ස අනාගාරස්ස[1] තෙ සතො,
සමණස්ස න තං සාධු යං පෙතමනුසොචසි.

824\. සංවාසෙන හවෙ සක්ක මනුස්සස්ස මිගස්ස වා,
හදයෙ ජායතෙ පෙමං තං න සක්කා අසොචිතුං.

825\. මතං මරිස්සං රොදන්ති යෙ රුදන්ති ලපන්ති ච,
තස්මා ත්වං ඉසි මා රොදි රොදිතං මොඝමාහු සන්තො.

826\. රොදිතෙන හවෙ බ්‍රහ්මෙ මතො පෙතො සමුට්ඨහෙ,
සබ්බෙ සඞ්ගම්ම රොදම අඤ්ඤමඤ්ඤස්ස ඤාතකෙ.

827\. ආදිත්තං වත මං සන්තං ඝතසිත්තංව පාවකං,
වාරිනා විය ඔසිඤ්චං සබ්බං නිබ්බාපයෙ දරං.

828\. අබ්බහී වත මෙ සල්ලං යමාසි හදයනිස්සිතං,
යො මෙ සොකපරෙතස්ස පුත්තසොකං අපානුදි.

1. අනගාරස්ස – මජ්සං.

3. අඩඝ වර්ගය

817. රජතුමනි, මගේ වසයට පත් ඔබ දුකින් මුදන්නට කිසියම් හෙතුවක් තිබේ ද ?

818. දරුව, තාගේ වසයට පත් මෙබඳු මා දුකින් මුදු ද එයට කිසි යම් හෙතුවක් නැත.

819. රජතුමනි, සුචරිතයට වඩා අනෙකක් මරණකාලයෙහි රක්නේ නො වෙයි. සුභාෂිතයට වඩා අනෙකක් මරණකාලයෙහි රක්නේ නො වෙයි. ඒ දෙකට වඩා මුතු මැණික් ආදි අන් ධනය මරණකාලයෙහි රක්නේ නො වේ. ධනයට වඩා සුචරිතය හා සුභාෂිතය ශ්‍රෙෂ්ඨ යයි කී සේ ය.

820. මට ආක්‍රොෂ කෙළේ ය, මට ගැසුවේ ය, මා පැරදවීය, මා සතු දූය පැහැර ගත්තේ යයි යම් කෙනෙක් වෛර බඳිත් ද ඔවුන්ගේ වෛරය නො සන්හිඳෙයි.

821. මට ආක්‍රොෂ කෙළේ ය මට ගැසුවේ ය, මා පැරදවීය, මා සතු දූය පැහැර ගත්තේ යයි යම් කෙනෙක් වෛර නො බඳිත් ද ඔවුන්ගේ වෛරය සන්හිඳේ.

822. මෙලොවැ වෛරයෙන් වෛරය කිසි කලෙක නො සන්හිඳෙයි. අවෛරයෙන් (මෛත්‍රියෙන්) වෛරය සන්හිඳේ. මෙය සනාතන (හැම කල්හි පවත්නා) ධර්මයෙකි.

1. දීඝිති කොසල ජාතක යි.

823. මිය ගිය කෙනකුට ශොක කිරීම යන යමක් වේ ද එය ගිහි ජීවිතය හැරද පැවිදි වූ ශ්‍රමණයකු වූ ඔබට නො ගැළපේ.

824. ශක්‍රය, එක් ව විසීමෙන් එකාන්තයෙන් මනුෂ්‍යයාගේ සහ මෘගයාගේ සිතෙහි ප්‍රෙමය හටගනී. ශොක නො කර සිටින්නට නො පිළිවන.

825. මළවුන්ටත් මැරෙන්නවුන්ටත් යම් කෙනෙක් හඬත් ද වැළපෙත් ද ඒ හැඬීම හිස් ක්‍රියාවකැ යි බුද්ධාදි සත්පුරුෂයෝ කීහ. එහෙයින් සෘෂිය නො හඬන්න.

826. බ්‍රහ්මය, එකාන්තයෙන් හැඬීම නිසා මියගිය තැනැත්තේ නැගිටී නම් හැමදෙන එක් වී ඔවුනොවුන්ගේ මළ නෑයන්ට හඬමු.

827. ගිතෙල් ඉසැ දැල්වූ ගින්නක් මෙන් මගේ සිත එකාන්තයෙන් ශොක ගින්නෙන් ඇවිළ පැවැත්තේ ය. දිය ඉසින ලද කලෙක මෙන් සියලු දහ නිවී ගියේ ය.

828. සොවින් පෙළුණු මගේ පුත්‍රශොකය යමෙක් දුරු කෙළේ ද හේ මගේ හදවතේ ඇනී තුබූ ශොක නමැති හුල එකාන්තයෙන් උදුරාලී ය.

829. සොහං අබ්බූළ්හසල්ලොස්මි වීතසොකො අනාවිලො,
න සොචාමි න රොදමි තව සුත්වාන වාසවාති.

2. මිගපොතජාතකං.

830. කුහිං ගතා කත්ථ ගතා ඉති ලාලප්පතී ජනො,
අහමෙව එකො ජානාමි උදපානෙ මූසිකා හතා

831. යස්සෙතං[1] ඉති චීති ච ගද්‍රභොව නිවත්තසි,
උදපානෙ මූසිකං හන්ත්වා යවං භක්ඛිතුමිච්ඡසි.

832. දහරො චාසි දුම්මෙධ පඨමුප්පත්තිකො[2] සුසු,
දීඝමෙතං සමාසජ්ජ[3] න තෙ දස්සාමි ජීවිතං.

833. නානානලිකබ්භවනෙනාහං[4] නාඩගපුත්තසිරෙන වා[5],
පුත්තෙන සිපත්ථයිතො සිලොකෙහි පමොචිතො.

834. සබ්බං සුතමධීයෙථ හීනමුක්කට්ඨමජ්ඣිමං,
සබ්බස්ස අත්ථං ජානෙය්‍ය න ච සබ්බං පයොජයෙ
හොති තාදිසකො කාලො යත්ථ අත්ථාවහං සුත'න්ති.

3. මූසිකජාතකං.

835. සබ්බං භණ්ඩං සමාදය පාරං තිණ්ණොසි බ්‍රාහ්මණ,
පච්චාගච්ඡ ලහුං ඛිප්පං මම්පි තාරෙහිදානිතො.

836. අසන්ථුතං මං චිරසන්ථුතෙන[6]
නිමීනි හොති අධුවං ධුවෙන,
මයාපි හොති නිමිනෙය්‍ය අඤ්ඤං
ඉතො අහං දූරතරං ගමිස්සං.

837. කායං එළගලාගුම්බෙ[7] කරොති අහුහාසියං,
නයිධ නච්චං වා ගීතං වා තාලං වා සුසමාහිතං
අනම්හි කාලෙ සුසොණි කින්නු ජග්ඝසි සොභනෙ.

838. සිගාල බාල දුම්මෙධ අප්පපඤ්ඤොසි ජම්බුක,
ජිනො මච්ඡඤ්ච පෙසිඤ්ච කපණො විය ඣායසි.

839. සුදස්සං වජ්ජං අඤ්ඤෙසං අත්තනො පන දුද්දසං,
ජිනා පතිඤ්ච ජාරඤ්ච මම්පි ත්වඤ්ඤෙව ඣායසි.

---

1. යඤ්චෙතං – සීමු, මජසං.
2. පඨමුප්පත්තිතො – සයා. මජසං. සීමු.
3. දීඝං චෙතං සමාපජ්ජ – මජසං.
4. නානලිකබ්භවනෙන – මජසං.
5. නාඩගපුත්තසිතෙන වා – මජසං.
6. අසන්ධතං මං චිරසන්ධතෙනනිමීසි හොති – මජසං.
7. කායං එළගණගුම්බෙ – සයා. එළගණී ගුම්බෙ – මජසං.

829. ශක්‍රය, ඒ මම ශොක නමැති උල උදුරන ලද්දෙම් වෙමි. ශොක රහිත වූ නො කැළඹුණ සිතැති මම ඔබේ කිම අසා ශොක නො කරමි, නො හඬමි.

2. මිගපොතක ජාතක යි.

830. (මූෂිකා) කොහි ගියාදෝ කොහි ගියාදෝ යි කියමින් ජනයා වැළපෙති. මූෂිකාව ළිඳ සමීපයේ නසන ලදැ යි එකලා මම දනිමි.

831. යම් හෙයකින් පහර දීමට සුදුසු තැනක් සොයා කොට එවා පසුබසින්නේ යම්සේ ද එසේ පසු බසින කරුණ දනිමි. ළිඳ ළඟ මූෂිකාව මරා යව නම් රජු ද බුදින්නට කැමැත්තෙහි ද ?

832. බාලය, (තෝ) තරුණ වෙහි. ප්‍රථම වයස් ඇතියෙහි. තරුණ වෙහි, දිග යටිය ඇති අවියක් එල්බගෙන සිටිනෙහි, තට දිවි නො දෙන්නෙමි.

833. අහසේ වූ දිව්‍ය විමානය නිසා ද ශරීරාංග සමාන පුත්‍රයා නිසා ද මිදුණෙම් නො වෙමි. පුතා විසින් මාගේ මරණය පතන ලදුයෙම් ආචාර්‍ය්‍යන් බැඳ දුන් ගාථා නිසා (මරණයෙන්) මිදුණෙමි.

834. ලාමක වූ ද මධ්‍යම වූ ද උත්කෘෂ්ට වූ ද විද්‍යාවන් හදරන්නේ ය. සියලු ශාස්ත්‍රයන්හි අර්ථය දැනගන්නේ ය. හැම ශාස්ත්‍රයක් ම ක්‍රියාත්මක නො කරන්නේ ය. යම් කලෙක යම් ශාස්ත්‍රයකින් ප්‍රයොජන ලැබේ ද, එබඳු කාලයක් වන්නේ ය. එකල ශාස්ත්‍රයෙන් ප්‍රයොජන ගන්නේ ය.

3. මූසික ජාතක යි.

835. බමුණ සියලු භාණ්ඩ ගෙන එතෙරට ගියෙහි. වහා නැවත එව. මේ නදියෙන් මා ද වහා එතෙර කරව.

836. පින්වතිය, ඇසුරක් නැති අලුතෙන් හමු වූ මා වෙත හැරුණි, දිගු කලක් ඇසුරු කළ ස්ථිර සැමියාගෙන් වෙනස් වූවා ය. ති මා කෙරෙනු දු අනෙකකු පාවා ගන්නී ය. මම මෙතැනිනුත් ඉතා ඈතට යන්නෙමි.

837. තුවරලා ලැහැබෙක සවර තැනැත්තියක් මහහඬින් සිනාසේ ද නැටුමක් ගැයුමක් හෝ කුලුතාලමක් මෙහි නැත සුන්දර ඌරු යුග්මයක් ඇති රුසිරු තැනැත්තිය හැඩියයුතු අවසථාවෙහි සෙන්නේ කුමක් හෙයින් ද ?

838. මෝඩ වූ නුවණ රහිත වූ ජම්බුකය, තෝ ඥානය නැත්තෙහි මාළුවා ද මස්වැදැල්ල ද යන දෙක ම නැති වූයේ අසරණයකු සේ සිතිවිලි සිතන්නෙහි.

839. මෙරමාගේ වරද දකින්නට පහසු ය, තමාගේ වරද දකින්නට අපහසු ය. තෝ සැමියා සහ සොර සැමියා යන දෙදෙනා-ගෙන් පිරිහුනෙහි ය, මා මෙන් තො ද සිතන්නෙහි ය.

840. එවමෙතං මිගරාජ යථා භාසසි ජම්බුක,
සා නූනාහං ඉතො ගන්ත්වා භත්තු හෙස්සං වසානුගා.

841. සො හරෙ මත්තිකං ථාලං කංසථාලම්පි සො හරෙ,
කතංයෙව තයා පාපං පුනපෙවං කරිස්සසීති.

4. චූළධනුග්ගහජාතකං.

842. ඉදානි ඛොම්හි සුඛිතො අරොගො
නික්කණ්ටකො නිප්පතිතො කපොතො,
කාහාමිදානි හදයස්ස තුට්ඨිං
තථාහි මං මංසසාකං බලෙති.

843. කායං බලාකා සිඛිනී චොරී ලඞ්ඝිපිතාමහා,
ඔරං බලාකෙ ආගච්ඡ චණ්ඩො මෙ වායසො සඛා.

844. අලං හි තෙ ජග්ඝිතායෙ මමං දිස්වාන එදිසං,
විලූනං සූදපුත්තෙන පිට්ඨමද්දෙන මක්ඛිතං.

845. සුන්හාතො සුවිලිත්තොසි අන්නපානෙන තප්පිතො,
කණ්ඨෙ ච තෙ වෙළුරියො අගමා නු කජඞ්ගලං.

846. මා තෙ මිත්තො අමිත්තො වා අගමාසි කජඞ්ගලං,
පිඤ්ඡානි තත්ථ ලායිත්වා කණ්ඨෙ බන්ධන්ති වට්ටනං.

847. පුනපාපජ්ජසි සම්ම සීලං හි තව තාදිසං
න හි මානුසකා භොගා සුභුඤ්ජා හොන්ති පක්ඛිනා'ති.

5. කපොතජාතකං.

අඩ්ඪවග්ගො තතියො.

තස්සුද්දානං:

අථ වණ්ණ සසීල හිරි ලභතෙ
සුමුඛාමිසසාලිය මිත්තවරො,
අථ චක්ක පලාස සරාජ සතො
යවබාලකපොතකං පණ්ණරසාති.

පඤ්චකනිපාතො නිට්ඨිතො.

තත්‍ර වග්ගුද්දානං:

ජිනඤ්ඤ වණ්ණං අසමං වග්ගුපරි
සුදෙසිතා ජාතකන්ති පඤ්ච වීසති,
මහෙසිනො බ්‍රහ්මචරිත්තමුත්තම
මවොච ගාථා අත්ථවතී සුබ්‍යඤ්ජනා'ති.

840. මෘගරාජය, ඔබ යමක් කීහු ද මෙය මෙසේ ම ය. ඒ ඒ මම මෙතැනින් ගොස් ඒකාන්තයෙන් අතික් හිමියකු ලැබ ඔහු අනුව යන්නෙමි.

841. යමෙක් මැටිතලියක් සොරා ගනී ද හේ ඒ පුරුද්දෙන් රන්තලියක් සොරකම් කරන්නේ ය. තෝ පාපකර්මය කළා ය. නැවත ද මෙසේ කරන්නී ය.

4. චුල්ලධනුග්ගහ ජාතක යි.

842. දැන් පරෙවියා නික්මුණේ ය. එහෙයින් සුවපත් ව නීරෝග ව සතුරු නමැති කවු නැතිවූයෙම් වෙමි. දැන් මාගේ සිතට මනාපවූවක් කරන්නෙමි. එය එසේ ම ය. මේ මස් ද අතින් මස් ද මා උත්සාහවත් කරයි.

843. වැහිවලාව මුත්තණුවන් කොට ඇති සෙරක වූ සිළු ඇති කෙකින්න කවරක් ද කෙකින්න මැතට එන්න. මාගේ මිතුරු කවුඩා නපුරු ය.

844. අරක්කැමියාගේ පුතා විසින් සිඳුනා ලද පියාපත් ඇත්තේ, අතන ලද පිටි ගැල්වූ මගේ සිරුර දක සිනාසීමෙන් කම් නැත.

845. ස්නානය කොටැ පවිත්‍ර වැ මැනැවින් විලවුන් ගල්වන ලදුයෙහි ය. ආහාරපානයෙන් තෘප්තිමත් කරන ලදුයේ ය, තොපගේ ගෙලෙහි වෛඩූර්ය මැණිකෙකි. බරණැස් නගරයට ගියේ ද ?

846. තොපගේ මිතුරෙක් හෝ සතුරෙක් හෝ කජංගල නගරයට (බරණැස්) නොයේවා කවර හෙයින් ද යත්, එහි ගියවුන්ගේ පියාපත් සිඳැ ගෙලෙහි කැබිලිත්තක් එල්වයි.

847. මිතුරු නැවත මෙබඳු දුකකට පැමිණෙන්නෙහි ය. තොපගේ ගතිය එබඳු ය. මනුෂ්‍යයනට අයත් සම්පත් පක්ෂියකු විසින් පහසුයෙන් බිදිය නො හැකි ය.

5. කපොත ජාතක යි.

තුන්වන අඩ්ඪ වර්ග යි.

එහි උද්දානය :

වණ්ණාරොහජාතක යැ, සීලවීමංසජාතක යැ, හිරිජාතක යැ, ඛජ්ජොපනකජාතක යැ, අහිකුණ්ඩික (සුමුඛ) ජාතක යැ, ගුම්බිය (ආමිස) ජාතක යැ, සාලියජාතක යැ, තචසාර (අමිත්ත) ජාතක යැ, මිත්තවින්දක (වක්ත) ජාතක යැ, පලාසජාතක යැ, දීඝිති කොසල (සරාජ්) ජාතක යැ, මිගපොතක (සනො) ජාතක යැ, මූසික (යව) ජාතක යැ, චුල්ලධනුග්ගහ (බාලක) ජාතක යැ, කපොත ජාතක යැ යි පසළොසෙකි.

පංචක නිපාතය නිමි.

වර්ග උද්දානය:

මහර්ෂි වූ බුදුන්ගේ උත්තම බ්‍රහ්මචර්‍ය්‍යා ප්‍රකාශිත අර්ථවත් වූ සුවඤ්ජන වූ ගාථා ඇති 'ජින' යි ආරබ්ධ මණිකුණ්ඩල වර්ග යැ, වර්ණාරොහ වර්ග යැ මත්තෙහි අපරිපූර්ණ වූ අර්ධවර්ග යැ, යන ජාතක යි සුදෙශිත පස්විසි ජාතකය වදළහ.

848. මාස්සු කුජ්ඣි[1] භූමිපති මාස්සු කුජ්ඣි රථෙසභ,
කුද්ධං අප්පටිකුජ්ඣන්තො රාජා රට්ඨස්ස පූජිතො.

849. ගාමෙ වා යදි වාරඤ්ඤෙ නින්නෙ වා යදි වා ථලෙ,
සබ්බත්ථමනුසාසාමි මාස්සු කුජ්ඣි රථෙසභ.

850. අවාරියපිතා නාම අහු ගඞ්ගාය නාවිකො,
පුබ්බෙ ජනං තාරයිත්වා[2] පච්ඡා යාචති වෙතනං
තෙනස්ස භණ්ඩනං හොති න ච භොගෙහි වඩ්ඪති.

851. අතිණ්ණංයෙව යාචස්සු අපාරං තාත නාවික,
අඤ්ඤො හි තිණ්ණස්ස මනො අඤ්ඤො හොති තරෙසිනො[3].

852. ගාමෙ වා යදි වාරඤ්ඤෙ නින්නෙ වා යදි වා ථලෙ,
සබ්බත්ථ අනුසාසාමි මාස්සු කුජ්ඣිත්ථ නාවික.

853. යායෙවානුසාසනියා රාජා ගාමවරං අදා,
තායෙවානුසාසනියා නාවිකො පහරී මුඛං.

854. භත්තං භින්නං හතා භරියා ගබ්භො ච පතිතො ඡමා.
මිගොව ජාතරූපෙන න තෙනත්ථං අවඩ්ඪීතුන්ති[4].

1. අවාරියජාතකං.

855. මා තාත කුජ්ඣි න හි සාධු කොධො
බහුම්පි තෙ අදිට්ඨං අස්සුතඤ්ච,
මාතා පිතා දිසතා සෙතකෙතු
ආචරියමාහු දිසතං පසත්ථා.

856. අගාරිනො අන්නදපානවත්ථද
අව්හායිකා තම්පි දිසං වදන්ති
එසා දිසා පරමා සෙතකෙතු
යං පත්වා දුක්ඛී සුඛිනො භවන්ති.

857. ඛරාජිනා ජටිලා පඞ්කදන්තා
දුම්මුක්ඛරූපා යෙ මෙ ජපන්ති මන්තෙ,
කච්චි නු තෙ මානුසකෙ පයොගෙ
ඉදං විදූ පරිමුත්තා අපායා.

1. කුජ්ඣ – මජ්සං.
2. තාරෙත්වාන – මජ්සං.
3. තාරෙසිනො - සයා.
4. අබන්ධිංසු – මජ්සං.

848. භූමිපාලයාණෙනි, නො කිපෙන්නේ මැනැවි. රජතුමනි, කොප නො කරන්නේ මැනැවි. කිපියා වූ තැනැත්තහුහට පෙරළා කොප නො කරන රජ රටවැසියා විසින් පුදනු සුදුසු ය.

849. ගමෙහි හෝ වනයෙහි හෝ වලතන්හි හෝ ගොඩබිමෙහි හෝ අනුශාසනා කරමි. රජතුමනි, නො කිපුන මැනැවි.

850. අවාරියපිතු නැමැති තොටියෙක් ගඟෙහි විය. හේ පළමු වැ ජනයා ගඟින් එතෙර පමුණුවා පසුව කුලිය ඉල්ලයි. එයින් ඔහුට කලහ ඇති වෙයි. ධනයෙන් හේ නො වැඩේ.

851. දරුව, තොටිය, ජනයා ගඟෙන් තරණය කරවන්නට පළමු ව කුලිය ඉල්ලන්න. ගඟ තරණය කළවුන්ගේ සිත අනෙකෙකි. (වෙනස් වේ) එතෙරවීම සොයන්නහුගේ සිත අනෙකකි.

852. ගමෙහි හෝ වනයෙහි හෝ වලතන්හි හෝ ගොඩබිමෙහි හෝ අනුශාසනා කරමි. තොටිය නොකිපුන මැනැවි.

853. යම් අනුශාසනාවක් නිසා රජතුමා තවුසාට ගම්වරක් දුන්නේ ද ඒ අනුශාසනාව ම නිසා තොටියා තවුසාගේ කටට ගැසුවේ ය.

854. බත් බඳුන බිඳින ලදී. බිරිඳ නසන ලදී. ගැබ ද බිම හෙලන ලදී. මුතුමැණික් ආදිය මැඩ ගෙන ගියේ වුව ද එයින් මුවකුට ප්‍රයොජනයක් ලද නොහැක්කා සේ මෝඩයෙක් පඬිවරයකුගේ ඔවා අසා ද එයින් ප්‍රයොජනයක් ගන්නට නො හැකි වේ.

1. අවාරිය ජාතක යි.

855. දරුව සෙතකෙතු, නො කිපෙන්න. කොප වීම මනා නො වේ. තා නොදුටු නො ඇසූ දේ බොහෝ ය. මවුපියෝ පූර්ව දිසාව වශයෙන් ද ගුරුවරු දකුණු දිසාව වශයෙන් ද බුද්ධාදි ආර්යයෝ කියත්.

856. සෙතකෙතුව, අහාරපාන හා රෙදිපිළි දෙන (එසේ ම) දන් පිණිස කැඳවන ගෘහස්ථයෝ වෙත් ද එය ද දිසාවකැ යි බුද්ධාදි උතුමෝ කියති. යම් දිසාවකට පැමිණ දුක්පත් ජනයා සුවපත් වෙත් ද මේ දිසාව උතුම් වේ,

857. රළු අඳුන්දිවිසම් අඳින ජටාමඬුලු අපවිත්‍ර දත් යනා මෙවා නිසා කිලිටි පෙනුම ඇති යම් තවුස් කෙනෙක් වෙත් ද ඔවුහු මතුරු දපත් (නම්) කෙසේ ද මෙය දන්නා මොවුහු අපායෙන් මිදුණෝ ද?

858. පාපානි කම්මානි කරිත්ව රාජ
බහුස්සුතො නෙව චරෙය්‍ය ධම්මං,
සහස්සවෙදපි න තං පටිච්ච
දුක්ඛා පමුච්චෙ චරණං අපත්වා.

859. සහස්සවෙදොපි න තං පටිච්ච
දුක්ඛා පමුච්චෙ චරණං අපත්වා,
මඤ්ඤාමි වෙද අඵලා භවන්ති
සසඤ්ඤමං[1] චරණඤ්ඤෙව සච්චං.

860. නහෙව වෙද අඵලා භවන්ති
සසංයමං චරණඤ්ඤෙව[2] සච්චං,
කිත්තිං හි පප්පොති අධිච්ච වෙදෙ
සන්තං පුනොති[3] චරණෙන දන්තො ති.

2. සෙතකෙතුජාතකං.

861. පඞ්කො ච කාමා පලිපො ච[4] කාමා
භයඤ්ච මෙතං තිමූලං පවුත්තං,
රජො ච ධූමො ච මයා පකාසිතා[5]
හිත්වා තුවං පබ්බජ බ්‍රහ්මදත්ත.

862. ගථිතා ච රත්තා අධිමුච්ඡිතා ච
කාමෙස්වාහං[6] බ්‍රහ්මණ භිංසරූපං,
තං නුස්සහෙ ජීවිකත්ථො පහාතුං
කාහාමි පුඤ්ඤානි අනප්පකානි.

863. යො අත්ථකාමස්ස හිතානුකම්පිනො
ඔවජ්ජමානො න කරොති සාසනං,
ඉදමෙව සෙය්‍යො ඉති මඤ්ඤමානො
පුනප්පුනං ගබ්භමුපෙති මන්දො.

864. සො ඝොරරූපං නිරයං උපෙති
සුභාසුභං මුත්තකරීසපූරං,
සත්තා සකායෙ න ජහන්ති ගිද්ධා
යෙ හොන්ති කාමෙසු අවීතරාගා.

865. මීළ්හෙන ලිත්තා රුහිරෙන මක්ඛිතා
සෙම්හෙන ලිත්තා උපනික්ඛමන්ති,
යං යං හි කායෙන ඵුසන්ති තාවදෙ
සබ්බං අසාතං දුක්ඛමෙව[8] කෙවලං.

---

1. සසංයමං - සයා.
2. චරණමෙව - මජසං.
3. සන්තිං පුණෙති - සීමු. මජසං.
4. පලිපාච - සීමු.
5. පකාසිකො - මජසං.
6. කාමෙසවහං - මජසං.
7. සුභා සුභ - මජසං.
8. දුඛමෙව.

858. රජතුමනි, උගත්කු වුවත් පාපක්‍රියාහි නිරත වෙමින් පුණ්‍යක්‍රියාහි නො යෙදේ නම්, දහස් ගණන් වේදමන්ත්‍ර දත්තේ වුව ද සීලයට හා අටසමවතට නො පැමිණ අවාදූකින් නො මිදෙන්නේ ය.

859. බහුශ්‍රැතකම ඇත්තේ වුව ද සිල්සපන් නො වී ඒ බහුශ්‍රැතකම හෙතුකොටගෙන අපායාදි දුකෙන් නො මිදෙන්නේ ය. එහෙයින් වෙදය නිෂ්ඵලය යි සිතමි. සීලය සහිත චරණය ම සත්‍යයකි.

860. වෙදය නිෂ්ඵල වූයේ නො වෙයි. සීලය සහිත සමාපත්තිය උතුම්. එය එසේ ම ය. වෙදය හදරා කීර්තියට පැමිණේ නැවත චරණධර්මයන් නිසා දමිත වැ නිවනට පැමිණේ.

2. සෙතකෙතු ජාතක යි.

861. බ්‍රාහ්මණය, කාමය මඩ වැනි ය. (එසේ ම) පැතිරගිය මඩකි. මුල් තුනෙකින් පිහිටි (ගසක් සේ) කාමය අවල ව පිහිටියෙන් බිය උපදවයි. දූවිල්ලක් ලෙස ද දුමක් ලෙස මා විසින් ප්‍රකාශ කොට ඇත. නුඹ මේ කාමය හැර පැවිදි වන්න.

862. බ්‍රාහ්මණය, කාමයන් දැඩි ආශා ඇතියේ එහි ඉතා ඇලුණේ ඒ නිසා මුසපත් වූයෙන් ජීවිකාවට කැමැත්තේ බිය උපදවන ඒ කාමය දුරුකරන්නට වෑයම් නො කරමි. (එහෙත්) බොහෝ පින්කම් කරන්නෙමි.

863. යමෙක් දියුණු ව කැමැති ව හිතෛෂී ව අනුකම්පා පෙරටු ව ඔවා දෙනුයේ වුව ද මෙය ම වඩා මනා යයි තමා ගත් මතයේ එල්බගෙන) සිතමින් අනුශාසිත පරිදි ක්‍රියා නො කෙරේ ද හෙතෙම නැවත නැවත මව්ගැබට පැමිණේ.

864. හේ සසරට බිය වූ කුලපුත්‍රයන්හට පිළිකුල් වූ මලමූත්‍ර යෙන් පිරුණු දරුණු ස්වභාවය ඇති මව්කුස නම් වූ නිරයට පැමිණේ. යම් කෙනෙක් කාමයන්හි පහව නොගිය ආශා ඇත්තේ ද එහි ගිජු වූයේ ද ඇලුණේ ද ඔහු මව්කුස වාසය නො හරිත්.

865. අශුචියෙන් තැවරී, ලෙයින් වැකී, සෙමින් ගැවී සත්හු නික්මෙත් ද, යමක් සිරුරෙන් ස්පර්ශ කෙරේ ද එකෙණෙහි ම සියල්ල දුක් ය.

866. දිස්වා වදාමි නහි අඤ්ඤතො සවං
පුබ්බෙනිවාසං බහුකං සරාමි,
චිත්‍රාහි ගාථාහි සුභාසිතාහි
දරීමුඛො නිජ්ඣාපයී සුමෙධන්ති.

3. දරීමුඛජාතකං.

867. කාකොළා[1] කාකසඞ්ඝා ච මයඤ්ච පතතං වරා,
සබ්බෙව සදිසා හොම ඉමං ආගම්ම පබ්බතං.

868. ඉධ සීහා ච ව්‍යග්ඝා ච සිගාලා ච මිගාධමා,
සබ්බෙව සදිසා හොන්ති අයං කො නාම පබ්බතො.

869. ඉමං නෙරූති ජානන්ති මනුස්සා පබ්බතුත්තමං,
ඉධ වණ්ණෙන සම්පන්නා වසන්ති සබ්බපාණිනො.

870. අමානනා යත්ථ සියා සන්තානං වා විමානනා,
හීනසම්මානනා වා'පි න තත්ථ වසතිං වසෙ.

871. යත්ථාලසො ච[2] දක්ඛො ච සූරො භීරු ච පූජියා,
න තත්ථ සන්තො නිවසන්ති[3] අවිසෙසකරෙ නගෙ[4].

872. නායං නෙරු විභජති හීනමුක්කට්ඨමජ්ඣිමෙ[5]
අවිසෙසකරො නෙරු හන්ද නෙරුං ජහාමසෙ.

4. නෙරුජාතකං.

873. ආසාවතී නාම ලතා ජාතා චිත්තලතාවනෙ,
තස්සා වස්සසහස්සෙන එකං නිබ්බත්තතෙ ඵලං.
තං දෙවා පයිරුපාසන්ති තාව දූරඵලං සතිං[6].

874. ආසිංසෙව තුවං රාජ ආසාඵලවතී සුඛා,
ආසිංසෙථෙව සො පක්ඛී ආසිංසෙථෙව[7] සො දිජො.

875. තස්ස වාසා සමිජ්ඣිත්ථ තාව දූරගතා සතී[8]
ආසිංසෙව තුවං රාජ ආසා ඵලවතී සුඛා.

---

1. කාකොළා – මජසං
2. යත්ථ ච අලසො ච – සිමු.
3. වසන්ති – මජසං, සයා.
4. විසෙස අකරෙ ජනෙ – මජසං.
5. හීනඋක්කට්ඨ – මජසං, සයා.
6. දූරිඵලෙසති – මජසං, සයා.
7. අසීසථෙව. සයා. අදූසිංසථෙව – මජසං.
8. තසෙසවාසා. මජසං. තස්සවාසා සම්ජිජ්ඣති – තාවදූරගතෙසති – සයා.

866. අනෙකකුගෙන් අසා නො කියමි. පෙරවූසූ කඳපිළිවෙළ දක්නා නුවණින් දැකැ කියමි. බහුල වශයෙන් පෙරවූසූ කඳපිළිවෙළ සිහි කරමි. දරිමුඛ පසේබුදු රජාණන් වහන්සේ විසිතුරු ගාථායෙන් වදරා නුවණැති රජුට තම අදහස ගැන්වී ය.

3. දරිමුඛ ජාතක යි.

867. වනකවුඩුවෝ ද පියවි කවුඩුවෝ ද පක්ෂීන්ට ශ්‍රෙෂ්ඨ වූ අපි ද මේ පර්වතයට පැමිණ සමාන වෙමු.

868. මේ පර්වතයේ දී සිහවගහිවල් යන හැමදෙන සමාන වෙති. මේ පර්වතයේ නම කුමක් ද?

869. මේ උතුම් පර්වතය රුවන් පව්ව යයි මිනිස්සු දනිත්, මේ පව්වේ දී සියලු ප්‍රාණීහු පැහැපත් ව වෙසෙති.

870. යම් තැනෙකැ සිල්සපන් ගුණවතුන්හට ගරුබුහුමන් නො කෙරේ ද අවමන් කෙරේ ද, දුසිල් මිනුෂ්‍යයනට සම්මාන කෙරේ ද එහි වාසය නො කරන්නේ ය.

871. යම් තැනෙකැ අලසයා, දක්‍ෂයා, ශූරයා සහ බියගුල්ලා යන මොවුන් පිදියයුත්තෝ වෙත් ද විශෙයක් නො කරන ඒ පර්වතයෙහි සත්පුරුෂයෝ නො වසත්.

872. මේ ස්වර්ණ පර්වතය හීන උත්කෘෂ්ට මධ්‍යම යනුවෙන් බෙදීමක් නො කරයි. මේ ස්වර්ණ පර්වතය විශෙෂයක් නො කරයි. එහෙයින් ස්වර්ණපර්වතය අත් හරිමු.

4. නෙරු ජාතක යි.

873. චිත්‍රලතා වනයෙහි ආසාවතී නැමැති වැලක් හටගත්තේ එහි අවුරුදු දහසෙකින් ගෙඩියක් හටගත්තේ ය. එතරම් දිග කාලයකගේ ඇවෑමෙන් ඵල හටගන්නා ඒ වැල සමීපයට දෙවියෝ නැවත නැවත එති.

874. රජතුමනි, ඔබ ද පතන්නෙහි ය ආසාව ඵලවත් වූයේ සැප ගෙන දේ යයි පක්ෂියා බලාපොරොත්තු වේ ම ය. ඒ පක්ෂියා ලබම් යි පතන්නේ ය.

875. එතෙක් දුර ගිය ඔහුගේ ආසාව සම්පූර්ණ විය. එහෙයින් රජතුමනි ඔබ ද පතනු මැනැවි. ආසාව ඵලවත් වූයේ සැප ගෙන දෙයි.

876. සමෙසි[1] ඛො මං වාචාය න ච සමෙසි කම්මුනා,
මාලා සෙරෙය්‍යකස්සෙව වණ්ණවන්තා අගන්ධිකා.

877. අඵලං මධුරං වාචං යො මිත්තෙසු පකුබ්බති,
අදදං අවිස්සජං භොගං සන්ධි තෙනස්ස ජීරති.

878. යං හි කයිරා තං හි වදෙ යං න කයිරා න තං වදෙ,
අකරොන්තං භාසමානං පරිජානන්ති පණ්ඩිතා.

879. බලඤ්ච වත මෙ ඛීණං පාථෙය්‍යඤ්ච න විජ්ජති,
සඞ්කෙ පාණූපරොධාය හන්දදානි වජාමහං.

880. එතදෙව හි මෙ නාමං යං නාමස්මිං රථෙසභ,
ආගමෙහි මහාරාජ පිතරං ආමන්තයාමහ'න්ති.

5. ආසඞ්කජාතකං.

881. න මෙ රුච්චි මිගාලොප යස්ස තෙ තාදිසා ගති,
අතුච්චං තාත පතසි අභූමිං තාත සෙවසි.

882. චතුක්කණ්ණංව කෙදරං යදා තෙ පඨවී[2] සියා,
තතො තාත නිවත්තස්සු මාස්සු එත්තො පරං ගමි.

883. සන්ති අඤ්ඤෙපි සකුණා පත්තයානා විහඞ්ගමා,
අක්ඛිත්තා වාතවෙගෙන නට්ඨා තෙ සස්සතීසමා.

884. අකත්වා අපරණ්ණස්ස[3] පිතු වුද්ධස්ස සාසනං[4],
කාලෙ වාතෙ[5] අතික්කම්ම වෙරම්භානං වසං ගතො[6].

885. තස්ස පුත්තා ච දාරා ච යෙ චඤ්ඤෙ අනුජීවිනො,
සබ්බෙ ව්‍යසනමාපාදුං අනොවාදකරෙ දිජෙ.

886. එවම්පි ඉධ වුද්ධානං[7] යො වාක්‍යං නාවබුජ්ඣති,
අතිසීමං චරො දිත්තො ගිජ්ඣොවාතීතසාසනො.
සබ්බෙ සංඛ්‍ය නපප්පොන්ති අකත්වා බුද්ධසාසනන්ති.

6. මිගාලොපජාතකං.

1. සංසෙසි – මජසං.
2. පඨවී – මජසං.
3. අපකණ්ණස්ස – මජසං.
4. පිතුවද්ධස්ස භාසනං - මජසං
5. කාලවාතෙ – මජසං.
6. අගා – සීමු. මජසං. සයා.
7. වඩ්ඪානං – සීමු.

876. සුවඳ නැති පාට සහිත කටුකරඬු මල් පරිදි මා කථාවෙන් සතුටු කෙළෙහි ය. ක්‍රියාවෙන් සතුටු නො කෙළෙහි ය.

877. යමෙක් (කිසිවක්) නො දෙන්නේ සම්පත් නො හරින්නේ, යාළුවන්ට නිෂ්ඵල වූ මිහිරිකථා කියා ද (කථාවෙන් පමණක් සංග්‍රහ කෙරේ ද) ඔහු හා මිතුරුකම නො ගැළපේ.

878. යමක් කරන්නේ ද එය කියන්නේ ය, යමක් නො කරන්නේ ද එය නො කියන්නේ ය. කියන ලෙස නො කරන්නවුන් නුවණැත්තෝ දනගණිති.

879. මාගේ බලය ක්‍ෂය විය, මාර්ගොපකරණ ද නැත. මාගේ පණ නැති වේ යයි සැක කරමි. එහෙයින් දූන් මම හැර යමි.

880. රජතුමනි, මෙහි යම්බඳු නමක් වේ ද මේ මාගේ නම වේ. මහරජතුමනි, බලව මම පියා කැඳවමි.

5. ආසංක ජාතක යි.

881. මිගාලොපය, තාගේ ඒ ගමන් මට රුස්නේ නො වේ. පුත, ඉතා උඩට නො යව. තෝ තට නුසුදුසු බිම සෙවුනෙහි.

882. යම් වෙලාවක තට පොළොව හතරැස් කුඹුරක් සේ පෙනෙන්නේ වේ ද දරුව, එයින් නවතුව. ඉන් ඔබ්බට නො යව.

883. පියාපත් යානා කොට අහසින් යන සෙසු පක්ෂීහු ද වෙති. (ඉහළ අහසේ පවතින) වායුවෙගයෙන් අදින ලදු ව ඔවුහු මළහ. පොළොව හා පර්වතය සමාන කොට සිතන ඔවුහු ජවා මළෝ ය.

884. අපරණ්ණ නමැති මහලු පියාගේ අනුශාසනය පරිදි ක්‍රියා නො කොට කෘෂ්ණ වාතය ඉකුත් කොට ගියේ වෙරම්බ වාතයේ වසහයට ගියේ ය.

885. මෘගාලොප නම් සකුණයා පියාගේ අවවාදයෙහි නො පවත්නා කල්හි (වෙරම්බවාතයෙහි වසහයට ගිය හෙයින්) ඔහුගේ දරුවෝ ද බිරියෝ ද, ඔහු නිසා දිවි රැකගන්නෝ ද යන හැම නටහ.

886. මෙසේ යමෙක් මෙ ලොවැ ගුණනුවණැති වැඩිහිටි-යන්ගේ කීම වටහා නොගෙන ක්‍රියා කෙරෙත් ද ඔවුහු අනුශාසනාව ඉක්මවා ගිය උඩඟු වූ සීමාව ඉක්මවා ගිය මෘගාලොප ගිජුලිහිණියා මෙන් විනාශ වෙති.

6. මෘගාලොප ජාතක යි.

887. කා නු කාළෙන වණ්ණෙන න චාසි පියදස්සනා,
කා වා ත්වං කස්ස වා ධීතා කථං ජානෙමු තං මයං.

888. මහාරාජස්සහං ධීතා විරූපක්ඛස්ස චණ්ඩියා,
අහං කාළී අලක්ඛිකා කාළකණ්ණීති මං විදූ
ඔකාසං යාචිතො දෙහි වසෙමු තව සන්තිකෙ

889. කිං සීලෙ කිං සමාචාරෙ පුරිසෙ නිවිසසෙ[1] තුවං,
පුට්ඨා මෙ කාළි අක්ඛාහි යථා ජානෙමු තං මයං.

890. මක්ඛී පළාසී සාරම්භී ඉස්සුකී මච්ඡරී සඨො,
සො මය්හං පුරිසො කන්තො ලද්ධං යස්ස[2] විනස්සති.

891. කොධනො උපනාහී ච පිසුනො ච විභෙදකො.
කණ්ටකවාචො* ඵරුසො සො මෙ කන්තතරො තතො.

892. අජ්ජසුවෙති පුරිසො සදත්ථං නාවබුජ්ඣති,
ඔවජ්ජමානො කුප්පති සෙය්‍යසො අතිමඤ්ඤති.

893. දවප්පලුද්ධො[3] පුරිසො සබ්බමිත්තෙහි ධංසති,
සො මය්හං පුරිසො කන්තො තස්මිං හොමි අනාමයා.

894. අපෙහි එත්තො ත්වං කාළි නෙතං අම්හෙසු විජ්ජති,
අඤ්ඤං ජනපදං ගච්ඡ නිගමෙ රාජධානියො.

895. අහම්පි ඛො තං ජානාමි නෙතං තුම්හෙසු විජ්ජති,
සන්ති ලොකෙ අලක්ඛිකා සඞ්ඝරන්ති බහුං ධනං.
අහං දෙවො ච මෙ භාතා උභො නං විධමාමසෙ.

896. කානු දිබ්බෙන වණ්ණෙන පථබ්‍යා සුපතිට්ඨිතා,
කා වා ත්වං කස්ස වා ධීතා කථං ජානෙමු තං මයං.

---

1. නිවිසෙ - මජ්ස, ස්‍යා.
2. යසං - මජසං,
3. දෙවපපපුරිසො ලුද්ධො - මජසං.
*. කණ්ඨකවාචො. නාරද

887. වස්ත්‍රාභරණයෙන් කාළවර්ණ හෙයින් නො ද ප්‍රිය දර්ශන ඇති තෝ කවරහි? කවරක්හුගේ හෝ දුහිතෘ වෙහි? අපි තී කෙසේ දනුමෝ ද? හඳුනමෝ දැ යි යී සේ යි.

888. මම විරූපාක්ෂ රජුගේ දූ වෙමි. ක්‍රොධ කිරීම ස්වභාව කොට ඇති හෙයින් චණ්ඩී නම. කළුපැහැ ඇතියෙන් කාළී නම. අධන්‍යයෙමි. අන්‍යයෝ මා කාලකණ්ණි යයි දනිති. ආරාධිත තෙපි මට අවකාශ දෙව. එක් රැයක් තොප සමීපයේ වසමු.

889. කෙබඳු සිල් ඇති කෙබඳු සමාචාර ඇති පුරුෂයකු සමීපයේ තෝ වෙසෙහි ද. මා විසින් විචාරන ලදුවයෙහි යම්සේ තී කවරක් දැ යි අපි දත හැකි වන්නමෝ ද එසේ කියව.

890. යම් පුරුෂයෙක් ගුණමකු ද අනුන් දෙස් කියා ද, කරණුත්තරිය කමී ඇත්තේ ද, ඊර්ෂ්‍යා ඇත්තේ ද, මසුරු වේ ද කපටි වේද, ලද ධනය ධූර්තකමී නිසා වනසා ද එබඳු පුරුෂ මට ප්‍රිය වෙයි.

891. යම් පුරුෂයෙක් කිපෙන සුලු ද බද්ධවෛර ඇත්තේ ද කේලාම් කියා ද මිත්‍රභෙදය කෙරේ ද සදෙස් බස් තෙපලා ද රළු වචන කියා ද හේ යට කී පුරුෂයාට වඩා ප්‍රිය ය.

892. පුරුෂයා මේ අද කටයුතු දෙය ය, මේ සෙට කටයුතු දෙය යයි තම දියුණුවට අවශ්‍ය කටයුතු නො දනී ද, ඔවා දෙන කලැ කිපේ ද තමාට වඩා බුහුමන් ලද යුත්තා පහත් කොට සිතා ද.

893. පංචකාමයෙහි බහුල ආශා ඇති, සියලු මිතුරන්ගෙන් පිරිහෙයි ඒ පුරුෂයා මට ප්‍රිය ය. මේ ගුණයන්ගෙන් හෙබි පුඟුලන් හා නිදුක් ව නිශ්ශොක ව වසමි.

894. කාළිය, තෙපි මෙතැනින් ඉවත්ව යව. තොප ප්‍රිය කරන මේ ගුණ අප කෙරේ නැත. අනෙක් දනව්වකට හෝ නියම්ගමකට හෝ රජදහනකට හෝ යව.

895. තෙල කරුණු තොප කෙරෙහි අවිද්‍යමානය යි මම ද දනිමි. ලොවැ පින් නැත්තෝ වෙසෙති. ඔව්හු බොහෝ ධනය රැස් කෙරෙති. මම ද මාගේ සොහොයුරු දෙවියා ද යන දෙදෙන ඒ ධනය නසමු.

896. විසිතුරු පැහැයෙන් යුතු ව පොළොවෙහි මැනැවින් පිහිටා සිටින තෝ කවර? කවරක්හුගේ හෝ දූ වෙහි? අපි තී කෙසේ දනුමෝ ද.

897. මහාරාජ්ඤස්සහං ධීතා ධතරට්ඨස්ස සිරීමතො,
අහං සිරී ච ලක්ඛී ච භූරිපඤ්ඤාති මං විදූ.
ඔකාසං යාචිතො දෙහි වසෙමු තව සන්තිකෙ.

898. කිං සීලෙ කිං සමාචාරෙ පුරිසෙ නිවිසසෙ තුවං,
පුට්ඨා මෙ ලක්ඛී අක්ඛාහි යථා ජානෙමු තං මයං.

899. යො චාපි සීතෙ අථවාපි උණ්හෙ
වාතාතපෙ ඩංසසිරිංසපෙ ච,
ඛුදං පිපාසං අභිභුය්‍ය සබ්බං
රත්තින්දිවං යො සතතං නියුත්තො.
කාලාගතඤ්ච න හාපෙති අත්ථං
සො මෙ මනාපො නිවසෙව[1] තම්හි.

900. අක්කොධනො[2] මිත්තවා චාගවා ච
සීලූපපන්නො අසඨොජ්ජුභූතො,
සඞ්ගාහකො සඛිලො සණ්හවාචො
මහත්තපත්තොපි නිවාතවුත්ති.

901. තස්සාහං පොසෙ විපුලා භවාමි
උම්මී[3] සමුද්දස්ස යථාපි වණ්ණං,
යො චාපි මිත්තෙ අථවා අමිත්තෙ
සෙට්ඨෙ සරික්ඛෙ අථවාපි හීනෙ.

902. අත්ථං චරන්තං අථවා අනත්ථං
ආවී රහො සඞ්ගහමෙව වත්තෙ,
වාචං න වජ්ජා ඵරුසං කදාචි
මතස්ස ජීවස්ස ච තස්ස හොමි.

903. එතෙස යො අඤ්ඤතරං ලභිත්වා
කන්තා සිරී මජ්ජති අප්පපඤ්ඤො*,
තං දිත්තරූපං විසමං චරන්තං
කරීසජාතං ච[4] විවජ්ජයාමි.

904. අත්තනා කුරුතෙ ලක්ඛිං අලක්ඛිං කුරුතත්තනා,
න හි ලක්ඛිං අලක්ඛිං වා අඤ්ඤො අඤ්ඤස්ස කාරකො'ති.

7. සිරිකාලකණ්ණිජාතකං.

1. නිවසෙ.
2. අකොධනෙ. සයා. අක්කොධනො – සීමු, මජසං.
3. උමමී – සයා.
4. කරීසට්ඨානංව – මජසං.
*. කන්තාසිරි, කන්තසිරි, කන්තං සිරින්ති තයොපි පාඨා අට්ඨකථා.

897. මම සිරිමත් ධෘතරාෂ්ට්‍ර මහරජුගේ දූ වෙමි. මම සිරි සහ ලක්ෂ්මී යන නම් ඇත්තී වෙමි. මා මහ නුවණැත්තිය යි දෙවියෝ දනිති. අයදනා ලදුයෙහි අවකාශ දෙව. නොප සමීපයේ වසමු.

898. කෙබඳු සිල් ඇති කෙබඳු සමාචාර ඇති පුරුෂයකු සමීපයේ තෙපි වසන්නහු ද, මා විසින් විචාරන ලද තෙපි යම්සේ තී කවරක් දූ යි අපි දත හෙන්නමෝ ද එසේ කියව.

899. යමෙක් සීත හා උණුසුම, අව්සුළං මැසි මදුරුවන් හා සර්පයන් සාපවස් යන මේ සියල්ල තණපතක් කොට ද නොගෙන මැඩලා රෑදවල් නිරතුරු තම අභිවෘද්ධිය ලබනු සඳහා වැඩෙහි යෙදුනේ වේ ද, සුදුසු කාලය පැමිණි කල එළඹ සිටි ප්‍රයොජනය නො පිරිහෙළා ද එබඳු පුරුෂයා මට මනාප ය ඔහු කෙරේ වසමු.

900. යමෙක් ක්‍රොධ නො කෙරේ ද, මිතුරන් ඇත්තේ ද, ත්‍යාගශීලි ද, හික්මීමෙන් යුතු ද, කෛරාටික නො වේ ද, අවංක ද, මිතුරන්ට සංග්‍රහ කෙරේ ද, මොළොක් කථා ඇත්තේ ද ඉසුරෙන් හා බලයෙන් උසස් වුව ද නිරහංකාර වේ ද එබඳු ගුණ ඇති ඒ පුරුෂයා කෙරෙහි යම්සේ සමුද්‍රයාගේ පැහැය බලන්නාවුනට එහි රළවැළ විපුල ව වැටහේ ද, එසේ මම ඒ පුහුලා සමීපයේ විශාල වෙමි. යමෙක් මිතුරා කෙරෙහි ද නැතහොත් සතුරා කෙරෙහි ද තමාට වඩා උසස් වූවහු කෙරෙහි ද, තමා සමාන වූවහු කෙරෙහි ද නැතහොත් පහත් වූවහු කෙරෙහි ද.

901. තමාට වැඩ පිණිස කරන්නහුට ද නැතහොත් අවැඩ කරන්නහුට ද එළිපිට හෝ රහසිගත ව සිවුසඟරාවතින් සංග්‍රහ කෙරේ ද.

902. පරුෂ වචන කිසිකලෙකත් නො කියා මළා වූ හෝ ජීවත් වන්නා වූ හෝ ඔහු වෙතට මම ළං වෙමි. (මේ ගුණ ඇත්තා අත් නො හරිමි යි කී සේ යි.)

903. යම් අනුවණ පුද්ගලයෙක් මේ සම්පත් අතුරෙන් සම්පතක් ලබා සැපවත් වූයේ, සම්පත් සඳහා නැවත නැවත උත්සාහ නො කෙරේ ද, නො සැලකිලි වේ ද උඩඟු වේ ද පාපක්‍රියාහි නිරත වේ ද ඒ පුහුලා අශුචි වළක්සේ දුරු කරමි.

904. තමා විසින් තමාට සැපත ඇති කරගන්නේ ය. තමා විසින් තමාට විපත ඇති කරගන්නේ ය. සැපත හෝ විපත අනෙකකුට අනෙකෙක් නො කරන්නේ ය.

7. සිරිකාලකණ්ණි ජාතක යි.

905\. සුවිත්තපත්තච්ඡදනා තම්බචූළ විහඞ්ගම,
ඔරොහ දුමසාඛාය[1] මුධා භරියා භවාමි තෙ.

906\. චතුප්පදී ත්වං කල්‍යාණි ද්විපදහං[2] මනොරමෙ,
මිගී පක්ඛී අසංයුත්තා අඤ්ඤං පරියෙස සාමිකං.

907\. කොමාරිකා තෙ හෙස්සාමි මඤ්ජුකා පියභාණිනී,
වින්ද මං අරියෙන වෙදෙන සාවයා මං යදිච්ඡසි.

908\. සකුණාදිනි[3] ලොහිතපෙ චොරී කුක්කුටපොථිනී,
න ත්වං අරියෙන වෙදෙන මමං භත්තාර මිච්ඡසි.

909\. එවම්පි චතුරා නාරී දිස්වාන[4] පවරං නරං,
නෙන්ති සණ්හාහි වාචාහි බිළාරී විය කුක්කුටං.

910\. යො වෙ[5] උප්පතිතං අත්ථං නඛිප්පමනුබුජ්ඣති,
අමිත්තවසමන්වෙති පච්ඡා ච මනුතප්පති.

911\. යො ච උප්පතිතං අත්ථං ඛිප්පමෙව නිබොධති,
මුච්චතෙ සත්තුසම්බාධා කුක්කුටොව බිළාරියා'ති.

8. කුක්කුටජාතකං.

912\. ධම්මං චරථ ඤාතයො ධම්මං චරථ භද්දං වො,
ධම්මචාරී සුඛං සෙති අස්මිං ලොකෙ පරම්හි ච.

913\. භද්දකො වතයං පක්ඛී දිජො පරමධම්මිකො,
එකපාදෙන තිට්ඨන්තො ධම්මමෙවානුසාසති.

914\. නාස්ස සීලං විජානාථ අනඤ්ඤාය පසංසථ,
භුත්වා අණ්ඩඤ්ච ඡාපෙ ච ධම්මො ධම්මොති භාසති.

915\. අඤ්ඤං භණති වාචාය අඤ්ඤං කායෙන කුබ්බති,
වාචාය නො ච කායෙන තං ධම්මං අධිට්ඨිතො.

1. දුමං – මජසං.
2. විපාදහං – මජසං
3. කුණපාදිනි, –අට්ඨකථා
4. දිස්වාන සධනං – මජසං.
5. යොච – සයා.

905. විසිතුරුපතින් කළ සෙවෙණි ඇතියව, තඹසිළුව ආකාශචාරීය, අත්තෙන් බිමට බසිනු. කිසිවක් නො ගෙන මම තොපගේ බිරිඳ වෙමි.

906. සුන්දරිය, තෝ සිවුපා ඇත්තෙහි. මනරම් තැනැත්තිය, මම දෙපා ඇත්තෙමි. මෘගී වූ තො ද පක්ෂී වූ මම ද යි අපි දෙදෙන (අඹුසැමි වනුවට) අයුත්තම්හ. එහෙයින් අන් සැමියකු සොයාගනු.

907. මම තොපට කුමරි බිරිඳ වන්නෙමි. මිහිරිබසින් හෘදයංගම බස් බෙණෙන්නෙමි. සුන්දර ලාභය ලබව. ඉදින් කැමැති නම් මා දසි භාර්යාවක් කොට අස්වා ගනුව.

908. පක්ෂීන් කන තැනැත්තිය, සතුන්ගේ ලේ බොන්නිය, සෙර, කුකුළන් මරන්නිය, තෝ බ්‍රහ්මචර්ය ලාභයෙන් මා ස්වාමි කොට කැමැති නො වන්නෙහි ය.

909. මෙලෙස දක්‍ෂකම් ඇති ස්ත්‍රීහු පුරුෂයකු දැක මටසිළුටු බසින් බැණැ කුකුළකු ගන්නට තැත් කළ බැළලිය මෙන් සිය වසඟයට පමුණුවත්.

910. යමෙක් උපන් කරුණ වහා වටහා නො ගනී ද එහෙයින් සතුරාගේ වසඟයට පැමිණේ. පසු තැවෙන්නේ ද වේ.

911. යමෙක් උපන් අර්‍ථය වහා වටහා ගනී ද හේ බැළලියගෙන් මිදුණු උපාය දක්‍ෂ කුකුළා මෙන් සතුරු පීඩාවන්ගෙන් මිදේ.

8. කුක්කුට ජාතක යි.

912. නැයෙනි කුසල් කරව. නැවත නැවත කුසල් කරව. තොපට යහපතක් වන්නේ ය. කුසල් කරන්නේ දෙලොව සුවසේ වසන්නේ ය.

913. මේ පක්ෂි තෙම එකාන්තයෙන් භද්‍ර යැ. පරමධාර්මික පක්ෂියෙක. එක් පයින් සිටුනේ ධර්මානුශාසනා මැ කෙරෙයි.

914. මොහුගේ සීලය (කෙබඳු දැ යි) නො දන්නහු ය, නො දැන ප්‍රශංසා කරන්නහු ය. හේ බිජුවට ද පැටවුන් ද කා ධර්මය ධර්මය යි කිය යි.

915. වචනයෙන් අනෙකක් කියයි. කයින් අනෙකක් කරයි. ඒ ධර්මයෙහි වචනයෙන් මිස කයින් පිහිටියේ නො වේ යි.

916. වාචාය සඛිලො මනොවිදුග්ගො
ඡන්නො කූපසයොව කණ්හසප්පො,
ධම්මධජො ගාමනිගමාසු සාධු සම්මතො
දුජ්ජානො පුරිසෙන බාලිසෙන.

917. ඉමං තුණ්ඩෙහි පක්ඛෙහි පාදා චිමං විහෙඨථ,
ඡවං හිමං විනාසෙථ නායං සංවාසනාරහො'ති.

9. ධම්මධජජාතකං.

918. සචෙ බ්‍රාහ්මණ ගච්ඡසි සාකෙතං අජ්ජුනාවනං,
වජ්ජාසි නන්දියං නාම පුත්තං අස්මාකඔරසං.
මාතා පිතා ච තෙ වුද්ධා තෙ තං ඉච්ඡන්ති පස්සිතුං.

919. භුත්තා මයා නිවාපානි රාජිනො පාණභොජනං,
තං රාජපිණ්ඩං අවභොත්තුං නාහං බ්‍රාහ්මණමුස්සහෙ.

920. ඔදහිස්සාමහං පස්සං ඛුරප්පාණිස්ස රාජිනො,
තදහං සුඛිතො මුත්තො අපි පස්සෙය්‍ය මාතරං.

921. මිගරාජා පුරෙ ආසිං කොසලස්ස නිකෙතවෙ,
නන්දියො නාම නාමෙන අභිරූපො චතුප්පදො.

922. තං මං වධිතුමාගච්ඡි දායස්මිං අජ්ජුනාවනෙ,
ධනුං අද්වෙජ්ඣං කත්වාන උසුං සන්ධාය කොසලො.

923. තස්සාහං ඔදහිං පස්සං ඛුරප්පාණිස්ස රාජිනො,
තදහං සුඛිතො මුත්තො මාතරං දට්ඨුමාගතො'ති.

10. නන්දියමිග[1]ජාතකං.

අවාරියවග්ගො පඨමො.

තස්සුද්දානං:

අථ කුජ්ඣ රථෙසභකෙතුවරො
දරිමුඛ සනෙරුතා ච පුන,
ආසානන්දසිරි ච සුචිත්තවරො
අථධම්මිකනන්දි මිගෙන දස.

1. මිගරාජ - සයා,

916. කථාවෙන් මෘදු ය, මනසින් වැදගත නො හැක්කේ ය. බිලයකැ හෝනා කළුනයකු සෙයින් ප්‍රච්ඡන්න යැ (සුචරිතධර්මය ධ්වජ කොට ඇවිදුනා හෙයින්) ධර්මධ්වජ වූ ගම්නියම්ගම්හි මැනැවැ යි සම්භාවිත වූ මේ දුශ්ශීලයා අශ්‍රුත පුරුෂයා විසින් දත නො හැකි ය.

917. මේ කපටයා තුඬින් ද පියාපතින් ද පයින් ද පහරවූ, මේ හීනයා නසවූ, මේ හීනයා එක් ව වාසයට නිසි නො වේ.

9. ධම්මධජ ජාතක යි.

918. බමුණ, සාකේත නගරයේ අංජන උයනට යන්නෝ නම් තොපගේ මහලු මව්පිය දෙදෙන තා දක්නට කැමැත්තෝ ය යි අපගේ ඖරස පුත්‍ර නන්දියට කියව.

919. බමුණ (මුවන්ට) ගොදුරු පිණිස වපුළ රජු අයත් තණ හා පැන් මා විසින් අනුභව කරන ලදී. රජු සතු ඒ ආහාරය නිකම් බුදින්නට මම වැයම් නො කරමි.

920. දුනුහී ගෙන ආ රජුට මා විදුව කියා මම සිරුරේ ඇළය පෙන්වා සිටිමි. එසඳ සුවපත් වූ මරණින් මිදුණු මම මැණියන් දක්නෙමි නම් යෙහෙකැ.

921. කොසොල් රජුගේ වාසභවනයට සමීප වූ උයන්හි ශොභාසම්පන්න වූ නන්දිය නමැති සිවුපාවෙක් වූයෙමි ද.

922. මුවන්ට වාසය පිණිස දුන් අංජන උයන්හි දී කොසොල් රජ දුනුදිය නඟා ඊතලය පිහිටුවා මා විදිනට ආයේ ය.

923. ඊතල ගත් රජුට මගේ සිරුරේ ඇළය පෙන්වා මා මරව යි කියා සිටිමි. ඉක්බිති සුවපත් ව මරණින් මිදී මැණියන් දක්නට ආමි.

10. නන්දියමිග ජාතක යි.

පළමුවන අචාරිය වග යි,

තස්සුද්දනය:–

ආචාරියා කුජ්ඣ ජාතක යැ සෙතකෙතු ජාතක යැ දරිමුඛ ජාතක යැ නෙරු ජාතක යැ ආසඞ්කා (ආසා) ජාතක යැ මිගාලොප (නන්‍ද) ජාතක යැ සිරිකාලකණ්ණි ජාතක කුක්කුට (සුචිත්‍ත) ජාතක යැ ධම්මධජ ජාතක යැ නන්දියමිග ජාතක යැ ජාතක දසයෙකි.

924. සච්චං කිරෙව මාහංසු හත්‍ථං[1] බාලොති පණ්ඩිතා,
පස්ස බාලො රහොකම්මං ආවිකුබ්බං න බුජ්ඣති,

925. ත්වං නුඛො සම්ම බාලොසි ඛරපුත්ත විජානහි,
රජ්ජුයා හි පරික්ඛිත්තො වඞ්කොට්ඨො ඔහිතො මුඛො.

926. අපරම්පි[2] සම්ම තෙ බාල්‍යං[3] යො මුත්තො න පලායසි,
සො ච බාලතරො සම්ම යං ත්වං වහසි සෙනකං.

927. යන්නු සම්ම අහං බාලො අජරාජ විජානහි,
අථ කෙන සෙනකො බාලො තං මෙ අක්ඛාහි පුච්ඡිතො

928. උත්තමත්‍ථං ලභිත්වාන හරියාය යො පදස්සති[4],
තෙන ජහිස්සතත්තානං[5] සා චෙවස්ස[6] න හෙස්සති.

929. න වෙ පියං මෙති ජනින්ද තාදිසො
අත්තං නිරං කත්වා පියානි සෙවති,
අත්තාව සෙය්‍යො පරමාව සෙය්‍යා
ලබ්භා පියා ඔචිතත්ථෙන පච්ඡාති.

1. ඛරපුත්තජාතකං.

930. අකක්කසං අඵරුසං ඛරධොතං සුපාසියං,
සුඛුමං තිඛිණග්ගඤ්ච කො සූචිං කෙතුමිච්ඡති.

931. සුමජ්ජඤ්ච සුපාසඤ්ච අනුපුබ්බං සුවට්ටිතං[7],
ඝනඝාතිමං පටිත්ථද්ධං[8] කො සූචිං කෙතුමිච්ඡති.

932. ඉතොදානි පතායන්ති සූචියො බළිසානි ච,
කොයං කම්මාරගාමස්මිං සූචිං වික්කෙතුමිච්ඡති.

933. ඉතො සත්ථානි ගච්ඡන්ති කම්මන්තා විවිධා පුථූ,
කොයං කම්මාරගාමස්මිං සූචිං වික්කෙතුමරහති.

---

1. කලකං - ස්‍යා, ගරං. - මජසං.
2. අයම්පි -- මජසං.
3. බාලො - මජසං.
4. හරියා න හවිස්සති - මජසං.
5. චජිස්සතත්තානං -මජසං.
6. සාචෙතස්ස ජහිස්සති - මජසං.
7. සුවට්ටිතං - මජසං
8. පටිතද්ධං - මජසං.

924. එළුවා මූඪ යයි පණ්ඩිතයෝ සැබැවක් මැ කිවු ල. බලව, රහස් තන්හි කටයුතු දෙය නො රහස් තන්හි කරනුයේ අයොග්‍ය බව නො දනී.

925. මිතුරු කොටළු පුත්‍රය, තෙපි වනාහි මට වඩා බාලවහු. කවර හෙයින යත්: වියගස සමග ගෙල රැහැනින් බඳනා ලදහු, වක්වූ තොල් ඇත්තවු, (මුඛබන්ධන රජ්ජුයෙන්) බඳනා ලද මුව ඇත්තහු මට වඩා අඥනය යි දනුව.

926. යහළුව, බන්ධනයෙන් මුදා ලූ තෙපි නො පලායවු ද එය තොපගේ තවත් මෝඩ කමෙකි. තෙපි යම්බඳු සෙනක නම් රජකු උසුලවූ ද හෙ ද අප දෙදෙනාට වඩා අතිශයින් බාල වෙයි.

927. සගය අජරාජය, යම්හෙයෙකින් මා අඥනය යි දනු ද, සෙනක රජ කවර හෙතුයෙකින් මූඪ වී ද, මා විසින් විචාරන ලද්දහු එය මට කියව.

928. යමෙක් සියලු ශබ්ද දනැගන්නා මන්ත්‍ර සඞ්ඛ්‍යාත උතුම් ධනය ලැබගෙන බිරිඳට දෙන්නේ ද එයින් ඔහුගේ ජීවිතය හැරපියන්නේ යැ. ඒ බිරිඳ ද ඔහට නො වන්නී ය.

929. නරෙන්ද්‍රය තොප වැන්නෙක් මේ වස්තුව මට ප්‍රිය යයි ජීවිතය හැරපියා ප්‍රිය වස්තූන් සෙවන නො කෙරේ මැ යැ. පරම ශ්‍රෙෂ්ඨ වස්තූන්ට ද වඩා ජීවිතය මැ ශ්‍රෙෂ්ඨ ය. වඩනලද ජීවිතය ඇත්තහු විසින් පසුව ප්‍රිය වස්තු ලද හැක්ක.

1. ඛරපුත්ත ජාතක යි.

930. රළු නැති මටසිළුටු කරගලෙහි ගා ශුද්ධ කළ සුන්දර පාශ ඇති සියුම් වූ තියුණු තුඩ ද ඇති ඉදිකටුව මිල දී ගන්නට කවරෙක් කැමැති වේ ද.

931. (කුරුඳුගල් සුන්නෙන්) මැනැවින් මදනා ලද සුන්දර පාශ ඇති අනුක්‍රමයෙන් මොනොවට වට වූ කිනිහිරය විනිවිදුනා තද ඉදිකටුව මිලයට ගන්නට කවරෙක් කැමැති වේ ද.

932. දන් ඉදිකටු ද බිළිකටු ද මේ කඹුරුගමින් ඒ ඒ දිග පැතිර යන්නාහ. කඹුරුගමේ ඉදිකටු විකුණන්නට කැමැති මේ කවරෙක් ද?

933. මෙයින් ආයුධ ද බැහැර යති. නානාවිධ බොහෝ කර්මාන්තයෝ ද (මෙයින් ගෙනගිය උපකරණයෙන් මැ) පවතිත්. මේ කඹුරුගමේ ඉදිකටු විකුණන්නට මේ කවරෙක් සුදුසු වේ ද.

934. සූචිං කම්මාරගාමස්මිං වික්කෙතබ්බා පජානතා
ආචරියාව ජානන්ති[1] කම්මං සුකතදුක්කතං.

935. ඉමඤ්ච තෙ පිතා භද්දෙ සූචිං ජඤ්ඤා මයා කතං,
තයා ච මං නිමන්තෙය්‍ය යඤ්චත්‍ථඤ්ඤං ඝරෙ ධනන්ති.

2. සූචිජාතකං.

936. නවඡන්දකෙදනි දීයති[2]
පුණ්ණායං දෙණි සුවාමිනී ථිතා,
බහුකෙ ජනෙ පාසපාණිකෙ
නො ච ඛො මෙ පටිභාති භුඤ්ජිතුං.

937. තසසි හමසි ලෙණමිච්ඡසි
අත්තාණොසි[3] කුහිං ගමිස්සසි,
අප්පොස්සුකො භුඤ්ජ තුණ්ඩිල
මංසත්ථාය හි පොසියාමසෙ.

938. ඔගහ රහදං අකද්දමං
සබ්බං සෙදමලං පවාහය,
ගණ්හාහි නවං විලෙපනං
යස්ස ගන්ධො[4] න කදචි ඡිජ්ජති.

939. කතමො රහදො අකද්දමො
කිංසු සෙදමලන්ති වුච්චති,
කතමඤ්ච නවං විලෙපනං
කස්ස ගන්ධො න කදචි ඡිජ්ජති.

940. ධම්මො රහදො අකද්දමො
පාපං සෙදමලන්ති වුච්චති,
සීලඤ්ච නවං විලෙපනං
තස්ස ගන්ධො න කදචි ඡිජ්ජති.

941. නන්දන්ති සරීරඝාතිනො
න ච නන්දන්ති සරීරධාරිනො,
පුණ්ණාය ච පුණ්ණමාසියා
රමමානාව ජහන්ති ජීවිතන්ති.

3. තුණ්ඩිලජාතකං.

1. ආචරියාව සජානන්ති. - මජසං.
2. නවඡන්නකෙ දෙනි - ස්‍යාං. නවච්ඡද්දකෙ - මජසං.
3. අතාණෙසි - මජසං.
*. සූචින්ති විභත්තිවිපල්ලාසො කතොති - අට්ඨකථා.
4. කස්සගන්ධො - මජසං

934. දන්නා තැනැත්තා විසින් ඉදිකටුව කඹුරුගම්හි විකිණියයුතු ය. කුමක් හෙයින් ද යත්, මනා නො මනා කර්මාන්තය ශිල්පාචාරීහු මැ දනිත්.

935. සොඳුර තීගේ පියා මා විසින් කරන ලද මේ ඉදිකටුව හැඳින්නේ වී නම් තී ද මට පවරන්නේ ය. ගෙහි යම් අන් ධනයකුත් ඇත් ද එය ද පවරන්නේ යි.

2. සූචි ජාතක යි.

936. අලුත් අයුරෙකින් පිළියෙළ කළ දීමනාවක් දෙනු ලැබේ. අපගේ බත්ඔරුව පිරී තිබේ. අපගේ ස්වාමිදුව ද සිටිනී ය. පාශ ගත් අනැති බොහෝ දෙනා වෙති. මට කන්නට රුචිය ඇති නො වේ.

937. තුණ්ඩිලය, තැති ගත්තෙහි, ඒ මේ අත කැරකෙන්නෙහි ය, පිහිට කැමැත්තෙහි ය, අසරණ වූයේ කොහි යන්නෙහි ද, අල්පොත්සුක ව අනුභව කරන්න. මස සඳහා අපි පොෂණය කරනු ලබම්හ.

938. මඩ නැති විලට බසුව. ඩහදිය කුණු සියල්ල ඉවත් කරව. යමක් පිළිබඳ ගන්ධය කිසිකලෙකත් නො නැසේ ද එබඳු නව විලෙපනයක් ගනුව.

939. මඩ නැති විල කවරේ ද? කුමක් ඩහදිය මලය යි කියනු ලැබේ ද? නව විලෙපනය යනු කුමක් ද? කුමක් පිළිබඳ ගන්ධය කිසිකලෙකත් නො නැසේ ද?

940. තුන් සුචරිතය ආදි ගුණදහම් මඩ නැති විල ය. සියලු පාපයෝ ඩහදියමල ය. සීලය නව විලෙපනය යි. සීලයේ ගන්ධය කිසිකලෙක නො නැසේ.

941. අන්‍යායන් නසන්නෝ (අන්‍යායන් නැසීමේ දී) සතුටු වෙති. සිරුරු දරන්නෝ (තමහට මරණ වාරය පැමිණි සඳ) සතුටු නො වෙති. පුන්සඳ උදු වැ ඇති (අද වැනි) දවස්හි (ගුණයෙන් පිරුණු අප වැන්නෝ) ප්‍රීති සිතැති ව ම ජීවිතය අත් හරිති.

3. තුණ්ඩිල ජාතක යි.

942. සිඞ්ගී මිගො ආයතචක්ඛුනෙත්තො
අට්ඨිත්තචො වාරිසයො අලොමො,
තෙනාභිභූතො කපණං[1] රුදමි
හරෙ සඛා කිස්ස නු මං ජහාසි.

943. සො පස්සසන්තො මහතා ඵණෙන
භුජඞ්ගමො කක්කටමජ්ඣපත්තො,[2]
සඛා සඛාරං* පරිතායමානො
භුජඞ්ගමං කක්කටකො ගහෙසි.

944. න වායසං නො පන සප්පරාජං[3]
ඝාසත්ථිකො කක්කටකො අදෙය්‍ය,
පුච්ඡාමි තං ආයතචක්ඛුනෙත්ත
අථ කිස්ස හෙතුම්හ[4] උභො ගහීතා.

945. අයං පුරිසො මම අත්ථකාමො
යො[5] මං ගහෙත්වාන දකාය නෙති,
තස්මිං මතෙ දුක්ඛමනප්පකං මෙ
අහඤ්ච එසො ච උභො න හොම.

946. මමඤ්ච දිස්වාන පවද්ධකායං
සබ්බො ජනො හිංසිතුමෙව මිච්ඡෙ
සාදුඤ්ච ථූලඤ්ච මුදුඤ්ච මංසං
කාකාපි මං දිස්වා විහෙඨයෙය්‍යුං.

947. සචෙ තස්ස හෙතුම්හ[4] උභො ගහීතා
උට්ඨාතු පොසො විසමාවමාමි,
මමඤ්ච කාකඤ්ච පමුඤ්ච ඛිප්පං
පුරෙ විසං ගාළ්හමුපෙති මච්චං.

948. සප්පං පමොක්ඛාමි න තාව කාකං
පටිබද්ධකො හොහිති තාව කාකො,
පුරිසඤ්ච දිස්වාන සුඛිං අරොගං
කාකං පමොක්ඛාමි යථෙව සප්පං.

949. කාකො තදා දෙවදත්තො අහොසි
මාරො පන කණ්හසප්පො අහොසි,
ආනන්දභද්දො කක්කටකො අහොසි
අහං තදා බ්‍රාහ්මණො හොමි සත්ථාති.

4. සුවණ්ණකක්කටක ජාතකං.

---

1. කපණො-මඡසං
2. කක්කටකජ්ඣපත්තො-මඡසං. කක්කටකමජ්ඣපත්තො-සයා
3. කණ්හසප්පං-මඡසං
4. හෙතු-මඡසං
5. සො-මඡසං

* සකංසඛාරන්තිපි පාඨො අත්තනො සහායන්ති අත්ථො-අට්ඨකථා

942. එම්බා යහළුව, දිග ඇස් ඇති කටුව ම සිවිය කොට ඇති දියෙහි වෙසෙන ලොම් නැති අඬු නමැති අං ඇති සිංගීමිග නමැති කකුළුවෙකි. ඔහු විසින් මඩනා ලද්දුයෙන් අසරණ ව හඬමි. කුමක් හෙයින් මා හැර යෙහි ද?

943. මිතුරු වූ ඒ සර්පයා මිතුරු කපුටා රක්නේ විශාල පෙණයක් සහිත ව ප්‍රශ්වාස කරමින් කකුළුවා වෙත පැමිණියේ ය. කකුළුවා ඒ සර්පයා ද අල්ලා ගත්තේ ය.

944. කකුළුවා ආහාර වශයෙන් කපුටා හෝ සර්පයා හෝ නො ගත්තේ ය. දිගු නෙතැත්තාණනි, තා විචාරමි. කවර හෙයින් අප දෙදෙනා අල්ලා ගත්තෙහි ද?

945. මේ පුරුෂයා මට හිත කැමැත්තේ ය. හේ මා දියට පමුණුව යි. ඔහු මළ කල්හි මට බොහෝ දුක් වන්නේ ය. මම ද මෙ තෙමේ ද යන දෙදෙනා ම ජීවත් නො වෙමු.

946. හොඳින් වැඩුණු ශරීරය ඇති, රසවත් වූ මහත් වූ මොළොක් වූ මස් සහිත මා දැක හැමදෙන හිංසා කරන්නට කැමැති වන්නෝ ය. මා දැක කවුඩෝ ද හිංසා කරන්නෝ ය.

947. ඉදින් ඔහු නිසා අප දෙදෙනා ගන්නා ලද්දහු නම් පුරුෂයා නැඟීසිටීවා. විෂ උරා ගනිමි. මිනිසාට විෂ වෙදනා වැඩි වන්නට පෙර මා ද කවුඩා ද වහා මුදව.

948. සර්පයා මුදමි. කවුඩා නො මුදමි. කවර හෙයින් ද යත්, කවුඩා තට ඇපකරුවකු වන්නේ ය. යම්සේ සර්පයා මිදූ-යෙම් ද, පුරුෂයා නීරොග වූ පසු කවුඩා ද එසේ මුදන්නෙමි.

949. කවුඩා එදවස දෙව්දත් වීය. මරහු වනාහි කෘෂ්ණ සර්පයා විය. යහළු කක්කටක ආනන්ද තෙරුන් වහන්සේ වූහ. ශාස්තෘ වූ මම බ්‍රාහමණ වීමි.

4. සුවණ්ණකක්කටක ජාතක යි.

950. සකුණො මය්හකො නාම ගිරිසානුදරීචරො
පක්කං පිප්ඵලිමාරුය්හ මය්හං මය්හන්ති[1] කන්දති.

951. තස්සෙවං[2] විලපන්තස්ස දිජසඞ්ඝා සමාගතා
භුත්වාන පිප්ඵලිං යන්ති විලපිත්වෙව සො දිජො.

952. එවමෙව ඉධෙකච්චො සඞ්ඝරිත්වා බහුං ධනං,
නෙවත්තනො න ඤාතීනං යථොධිං පටිපජ්ජති.

953. න සො අච්ඡාදනං භත්තං න මාලං න විලෙපනං,
අනුභොති සකිං කිඤ්චි න සඞ්ගණ්හාති ඤාතකෙ.

954. තස්සෙවං විලපන්තස්ස මය්හං මය්හන්ති[1] රක්ඛතො,
රාජානො අථවා චොරා දයාදයෙව අප්පියා
ධනමාදය ගච්ඡන්ති විලපිත්වෙව සො නරො.

955. ධීරො ච භොගෙ අධිගම්ම සඞ්ගණ්හාති ච ඤාතකෙ,
තෙන සො කිත්තිං පප්පොති පෙච්ච සග්ගෙ ච මොදතීති.

5. මය්හකජාතකං.

956. දුබ්බණ්ණරූපං තුවමරියවණ්ණී
පුරක්ඛත්වා[3] පඤ්ජලිකො නමස්සසි,
සෙය්‍යො නු තෙ සො උදවා[4] සරික්ඛො
නාමං පරස්සත්තනො චාපි බ්‍රෑහි.

957. න නාමගොත්තං ගණ්හන්ති රාජ
සම්මග්ගතානුජ්ජුගතාන දෙවා,
අහඤ්ච තෙ නාමධෙය්‍යං වදාමි
සක්කොහමස්මි තිදසානමින්දො.

958. යො දිස්වා භික්ඛුං චරණූපපන්නං
පුරක්ඛත්වා[3] පඤ්ජලිකො නමස්සති,
පුච්ඡාමි තං දෙවරාජෙතමත්ථං
ඉතො චුතො කිං ලභතෙ සුඛං සො.

959. යො දිස්වා භික්ඛුං චරණූපපන්නං
පුරක්ඛත්වා පඤ්ජලිකො නමස්සති,
දිට්ඨෙව ධම්මෙ ලභතෙ පසංසං
සග්ගඤ්ච සො යාති සරීරභෙදා.

---

1. මය්හ මය්හාන්ති - අට්ඨකථා.
2. තස්සෙව - මජ්ඣසං.
3. පුරක්ඛිත්වා - මජ්ඣසං, සයාං.
4. උදාහු - මජ්ඣසං, සයාං.

950. පර්වතයේ ද කඳුබෑවුම්හි ද පර්වත විවරයේ ද හැසිරෙන මය්හක නමැති පක්ෂියෙක් පැසුණුගෙඩි ඇති පුලිල ගසෙක සිට ‘‘මයහං මයහං’’ මගේ මගේ ය යි කියමින් හඬයි.

951. මෙසේ ඔහු හඬද්දී ම ගසට රැස් වූ පක්ෂි සමූහයෝ පුලිලගෙඩි කා යති. ඒ පක්ෂියා හඬන්නේ ම ය.

952. එ සෙයින් ම මෙලොව ඇතැමෙක් බොහෝ ධනය රැස් කොට බෙදුව මනා කොටස් බෙදා නො දෙති. තමා ද නිසි ප්‍රයොජන නො ලබයි.

953. හේ එක්වරෙක් හෝ ඇඳුම්වලින් හා ආහාරයෙන් ප්‍රයොජන නො ගනී. මලින් සැරසීම හෝ විලෙවුන් අලෙවූ දීම හෝ නො කරයි. කිසිම නෑයකුට සංග්‍රහ නො කරයි.

954. මගේ මගේ යයි රකිමින් හඬන්නා වූ ඔහුගේ වස්තුව රජවරු ද නැතහොත් හොරු ද අප්‍රියයෝ ද ගෙනයත්. ඒ මිනිසා හඬන්නේ ම ය.

955. නුවණැත්තා වස්තුව ලැබ නෑයන්ට සංග්‍රහ කරයි. එයින් හේ කීර්තිය ඇත්තේ වේ. පරලොව ද ස්වර්ගයේ (ඉපිද) සතුටු වේ.

5. මය්හක ජාතක යි.

956. සොඳුරු රූ ඇති තෙපි විරූප වූවකු (පැවිද්දකු) පෙරටු කොට ඇඳිලි බැඳ නමස්කාර කරවූ. මෙතෙම තොපට වඩා උතුම් ද නැතහොත් සමාන වේ ද. අනෙකාගේ ද තමාගේ ද නම කියව.

957. රජතුමනි, මනා පිළිවෙත් ඇති සෘජුමගට පිළිපන් උතුම් වූ විශුඬිදෙවියන්ගේ නම් ගොත් උත්පත්තියෙන් දෙවි වූවෝ නො ගනිත්. මම ඔබට මගේ නම කියමි. තව්තිසා දෙව්ලෝ වාසීන්ට අධිපති වූ මම ශක්‍රයා වෙමි.

958. දෙව්රජුනි, මෙය ඔබ විචාරමි. යමෙක් සීලසම්පන්න වූ භික්‍ෂූන් වහන්සේ දැක (උන්වහන්සේ) ඉදිරියේ ඇඳිලි බැඳ නමස්කාර කෙරේ ද හේ මින් සැවැ කිනම් සුවයක් ලබන්නේ ද.

959. යමෙක් සිල්සපන් භික්‍ෂූන් වහන්සේ දැක (උන් වහන්සේ) ඉදිරියේ ඇඳිලි බැඳ නමදී ද හේ මේ දිවියේ දී ම පැසසුම් ලබයි. මරණින් මතු දෙව්ලොවට පැමිණේ.

960. ලක්ඛී වත මෙ උදපාදි අජ්ජ
යං වාසවං භූතපතිද්දසාම,
භික්ඛුඤ්ච දිස්වාන තවඤ්ච සක්ක
කාහාමි පුඤ්ඤානි අනප්පකානි.

961. අද්ධා හවෙ සෙවිතබ්බා සපඤ්ඤා
බහුස්සුතා යෙ බහුඨානචින්තිනො,
භික්ඛුඤ්ච දිස්වාන මමඤ්ච රාජ
කරොහි පුඤ්ඤානි අනප්පකානි.

962. අක්කොධනො නිච්චපසන්නචිත්තො
සබ්බාතිථීයාචයොගො භවිත්වා,
නිහච්චමානං අභිවාදයිස්සං
සුත්වාන දෙවින්ද සුභාසිතානී'ති.

6. ධජවිහෙඨජාතකං.

963. යමෙතං වාරිජං පුප්ඵං අදින්නං උපසිඞ්ඝසි,
එකඞ්ගමෙතං ථෙය්‍යානං ගන්ධත්ථෙනොසි[1] මාරිස.

964. න හරාමි න භඤ්ජාමි ආරා සිඞ්ඝාමි වාරිජං,
අථ කෙන නු වණ්ණෙන ගන්ධත්ථෙනොති වුච්චති.

965. යොයං භිසානි ඛණති පුණ්ඩරීකානි භඤ්ජති,
එවං ආකිණ්ණකම්මන්තො කස්මා එසො න වුච්චති.

966. ආකිණ්ණලුද්දො පුරිසො ධාතිචෙලංව මක්ඛිතො,
තස්මිං මෙ වචනං නත්ථි තඤ්ච අරහාමි වත්තවෙ.

967. අනඞ්ගණස්ස පොසස්ස නිච්චං සුචිගවෙසිනො,
වාලග්ගමත්තං පාපස්ස අබ්භාමත්තංව ඛායති.

968. අද්ධා මං යක්ඛ ජානාසි අථො මං අනුකම්පසි,
පුනපි යක්ඛ වජ්ජාසි යදා පස්සසි එදිසං.

969. නෙව තං උපජීවාම නපි තෙ භතකම්හසෙ,
ත්වමෙව භික්ඛු ජානෙය්‍ය යෙන ගච්ඡෙය්‍ය සුග්ගති'න්ති.

7. භිසපුප්ඵජාතකං.

---

1. ගන්ධත්ථෙනොසි - මජසං. සයා.

960. අද දෙවියන්ගේ ස්වාමියා වූ ශක්‍රයා දුටුවෙමු ද එහෙයින් කර්මවිපාක ඥානය පහළ විය. ශක්‍රය භික්ෂූන් වහන්සේ ද ඔබ ද දැක බොහෝ පින් කරන්නෙමි.

961. බහුශ්‍රැත වූ බොහෝ දේ සිතන නැණවත් යම් කෙනෙක් වෙත් ද ඔහු ඒකාන්තයෙන් ඇසුරු කළ යුත්තාහ.

962. දෙව්රජතුමනි, ඔබේ සුබැසි වදන් අසා කෝප නැතියෙක් ව හැමවිට පහන් සිතැති ව සියලු ආගන්තුකයන්ගේ ඉල්ලීමට සුදුස්සෙක් වැ මානය නසා වඳින්නෙමි.

6. ධජවිහෙඨ ජාතක යි.

963. යම් හෙයෙකින් දියේ හටගත් කයින් වචනයෙන් නො දුන් මේ පියුම සුඹුනෙහි ද මෙය අදත්තාදනයේ එක් කොටසෙකි. එසේ හෙයින් නිදූකාණනි, සුවඳසොරෙක් වූයෙහි ය.

964. පියුම නො ගෙන යමි. නො කඩමි. දුරින් සිට සිඹිමි. ඉක්බිති කවර කරුණෙකින් සුවඳසොරා යි කියනු ලැබේ ද?

965. යමෙක් නෙළුම්අල සාරයි ද හෙළනෙළුම් කඩයි ද මෙබඳු දරුණු කම් කරන්නහු සොරා යයි නො කියනු ලැබේ ද?

966. නිරන්තරයෙන් දරුණුකම් කරන පූරුෂයා කිරිමවගේ අපවිත්‍ර වස්ත්‍රය මෙන් පාපක්‍රියා නිසා හැමවිට අපිරිසුදු ය. එහෙයින් ඔහු ගැන මාගේ කථාවක් නැත. තොප කියන්නට නිස්සෙමි (ශ්‍රමණයන් ඔවා අසන්නට කැමැති හෙයිනි.)

967. නිදෙස් වූ නිරන්තරයෙන් (නිදෙර) පවිත්‍ර වූ ගුණදහම් සොයන පුරුෂයාගේ පාපය කෙසගක් තරම් වුව ද මහවැහි වලාකුළක් මෙන් වැටහේ.

968. එම්බා දෙවතාව තෙපි ඒකාන්තයෙන් මා දැනගත්තහු ය. නැවත මට අනුකම්පා කරව. දෙවිය, යම් කලෙක මෙවැනි දෙසක් දුටුයෙහි නම් එකල්හි දු නැවත ඔවා ලෙසින් කියව.

969. භික්ෂුව (තවුසාණෙනි) තොප ඇසුරු කොට ජීවත් නො වම්හ. ඔබගේ බැළයක් නිසා ජීවත් නො වම්හ. යමක් නිසා සුගතියට යන්නේ ද තෙපි ම එය දැන ගනුව යි.

7. භිසපුප්ඵ ජාතක යි.

970. සුසුඛං වත ජීවන්ති යෙ ජනා විඝාසාදිනො,
දිට්ඨෙව ධම්මෙ පාසංසා සම්පරායෙ ච සුග්ගති.

971. සුකස්ස භාසමානස්ස න නිසාමෙථ පණ්ඩිතා,
ඉදං සුණාථ සොදරියා අම්හෙ වායං පසංසති.

972. නාහං තුම්හෙ පසංසාමි කුණපාද සුණාථ මෙ,
උච්ඡිට්ඨභොජිනො තුම්හෙ න තුම්හෙ විඝාසාදිනො.

973. සත්තවස්සා පබ්බජිතා මජ්ඣාරඤ්ඤෙ සිඛණ්ඩිනො,
විඝාසෙනෙව යාපෙන්තා මයඤ්චෙ භොතො ගාරය්හා,
කෙනු භොන්තො පසංසියා.

974. තුම්හෙ සීහානං ව්‍යග්ඝානං වාළානඤ්චාවසිට්ඨකං,
උච්ඡිට්ඨෙනෙව යාපෙන්තා මඤ්ඤව්හො විඝාසාදිනො.

975. යෙ බ්‍රාහ්මණස්ස සමණස්ස අඤ්ඤස්ස ච වණිබ්බිනො,
දත්වාන සෙසං භුඤ්ජන්ති තෙ ජනා විඝාසාදිනො’ති.

8. විඝාසජාතකං.

976. පණීතං භුඤ්ජසෙ භත්තං සප්පිතෙලඤ්ච මාතුල,
අථ කෙන නු වණ්ණෙන කිසො ත්වමසි වායස.

977. අමිත්තමජ්ඣෙ වසතො තෙසු ආමිසමෙසතො,
නිච්චං උබ්බිග්ගහදයස්ස කුතො කාකස්ස දළ්හියං.

978. නිච්චං උබ්බෙගිනො කාකා ධඞ්කා පාපෙන කම්මුනා,
ලද්ධා පිණ්ඩො න පීණෙති කිසො තෙනස්මි වට්ටක.

979. ලූඛානි තිණබීජානි අප්පස්නෙහානි භුඤ්ජසි,
අථ කෙන නු වණ්ණෙන ථූලො ත්වමසි වට්ටක.

980. අප්පිච්ඡා අප්පචින්තාය අවිදූරගමනෙන ච,
ලද්ධාලද්ධෙන යාපෙන්තො ථූලො තෙනස්මි වායස.

981. අප්පිච්ඡස්ස හි පොසස්ස අප්පචින්තිසුඛස්ස ච,
සුසඞ්ගහිතමානස්ස වුත්ති සුසමුදානියා’ති.

9. වට්ටකජාතකං.

970. යම් කෙනෙක් ඉඳුල් කා ජීවත් වෙත් ද ඔවුහු ඒකාන්තයෙන් ඉතා සුවසේ ජීවත් වෙති. මේ ජීවිතයේ ම ප්‍රශංසා ලැබිය යුත්තෝ ය. පරලොව සුගතිය ලබන්නෝ ය.

971. පඬිවරුනි, ගිරවාගේ වචනය නො අසවු. සහෝදරයෙනි, මෙය අසවූ, මෙතෙම අපට පසසයි.

972. කුණප භක්‍ෂකයෙනි, මා කියන්නක් අසවු. මම තොපට ප්‍රශංසා නො කරමි. තෙපි ඉඳුල් කන්නහු ය. කා ඉතුරු කළ දෙය කන්නෝ නො වෙති.

973. මෛධ්‍යාරණ්‍යයෙහි වෙසෙන සිළුව සහිත පැවිද්දන් වූ අපට සත් වසක් ගෙවිණ. ඉඳුල් කා යැපෙන අපි භවත්හු විසින් ගර්හා කළ යුත්තෝ වමෝ නම් භවත්හු විසින් ප්‍රශංසා කළ යුත්තෝ කවුරු ද?

974. තෙපි හැම සිංහ ව්‍යාඝ්‍ර ආදි ව්‍යාල මෘගයන් කා ඉතුරු කළ දෙය අනුභව කොට ඉන් යැපෙන්නාහු විඝාසාද යම්හ යි හඟිවු.

975. යම් කෙනෙක් බමුණකුට හෝ ශ්‍රමණයකුට හෝ වෙනත් යාචකයකුට හෝ ආහාර දී ඉතුරු ආහාර බුදිත් ද විඝාසාදයෝ වෙති.

8. විඝාස ජාතක යි.

976. (කවුඩු) මයිලණුවනි, රසැති ආහාර අනුභව කෙරෙහි. ගිතෙල් සහ තලතෙල් අනුභව කෙරෙහි. යළි කවර හෙයෙකින් කෘශ වූයෙහි ද?

977. සතුරන් මැද වෙසෙන ඔවුනතරෙහි ආහාර සොයා දිවි රකින නිතර උද්වෙගයට පැමිණි සිතැති කවුඩාට කවර පුෂ්ටිමත් සිරුරෙක් ද?

978. ධඞ්කා[1] නම් වූ කවුඩෝ නිතර බියෙන් සැලෙති. මිනිසුන් සතු දෑය පැහැර ගැනීමේ පාපකර්‍මයෙන් ලැබූ ආහාරය (අප) නො පිණවයි. වටුව, එහෙයින් මම කෘශයෙමි.

979. වටුව, රළු වූ ඔජාව මඳ තෘණ බීජ බුදින්නෙහි ය. එහෙත් තෝ, පිරුණු මස්ලේ සහිත වූයේ කවර හෙතුවකින් ද?

980. කවුඩ, ආහාරයේ ආශාව අඩු බව ද සිතුවිලි ස්වල්ප වීම ද දුර ගමන් නොයාම ද ලද දෙයින් තුටු වීම ද නිසා මම තර වීමි.

981. ආශා මඳ වූ සිතුවිලි අඩු වූ සැප සහිත වූ පමණ දැන ආහාරය අනුභව කරන්නා වූ පුද්ගලයාට ජීවිතය සුවසේ පවත්වා ගත හැකි ය.

9. වට්ටක ජාතක යි.

---

1. ධඞ්කා – වක්‍ර වූ ග්‍රීවා ඇති හෙයින් ධඞ්කයයි කියනලද – රාජමුරාරි සන්නය.

982. චිරස්සං වත පස්සාම සහායං මණිධාරිනං,
සුකතාය මස්සුකුත්තියා සොභතෙ වත මෙ සඛා.

983. පරූළ්හකච්ඡනඛලොමො අහං කම්මේසු ව්‍යාවටො,
චිරස්සං නහාපිතං ලද්ධා ලොමනං අපහාරයිං.

984. යං නු ලොමං අහාරෙසි දුල්ලභං ලද්ධකප්පකං,
අථ කිඤ්චරහි තෙ සම්ම කණ්ඨෙ කිණිකිණායති.

985. මනුස්සසුඛුමාලානං මණි[1] කණ්ඨෙසු ලම්බති,
තෙසාහමනුසික්ඛාමි මා ත්වං මඤ්ඤි දවා කතං.

986. සචෙපි මං පිහයසි මස්සුකුත්තිං සුකාරිතං,
කාරයිස්සාමි තෙ සම්ම මණිඤ්චාපි දදාමි තෙ.

987. ත්වඤ්ඤෙව මණිනා ඡන්නො සුකතාය ච මස්සුයා,
ආමන්ත ඛො තං ගච්ඡාමි පියං මෙ තව දස්සනන්ති.

10. කාකජාතකං.

සෙනකවග්ගො දුතියො.

තස්සුද්දානං:

අථ පස්ස සසූචි ච තුණ්ඩිලකො
මිගමඤ්ජාක පඤ්ඤම සඞ්ඛවරො,
අථ පඤ්ජලිවාරිජ මෙණ්ඩ පුන
අථ වට්ටක කපොතවරෙන දස.

ඡක්කනිපාතං නිට්ඨිතං.

තත්‍රවග්ගුද්දානං භවති:

අථ වග්ගං පකිත්තිස්සං ඡනිපාතවරුත්තමෙ,
අවාරියො සෙනකො දෙව වුත්තා සුබ්‍යඤ්ජනාති.

1. මණිං – මජසං.

982. මැණිකක් දරන යහළුවකු එකාන්තයෙන් කලෙකින් දකිමු. මනා ලෙස රවුල කපා ඇති මාගේ යහළුවා දක්‍ෂකලු ය.

983. රාජකාර්යයෙහි නියැලී සිටි හෙයින් වැඩී ගිය කිසිලි රොම හා නිය ඇත්තේ වීමි. බොහෝ කලෙකින් කරනැවැමියකු හමුවී ලෝම ඉවත් කරවීමි.

984. යම් හෙයෙකින් බොහෝ කලෙකින් කරනැවැමියකු ලදින් ලෝම ඉවත් කරවූයෙහි ද (එය එසේ වේවා.) යහළුව, එහෙත් තොපගේ බොටුවෙහි කුමක් කිණි කිණි යන නාදය කරන්නේ ද?

985. සියුමැලි මනුෂ්‍යයන්ගේ බොටුවෙහි මැණිකක් එල්බෙයි. මම ඔවුන් අනුව හික්මෙමි. හෙවත් ඔවුන් ලෙස මම ද පිළි පදිමි. නුඹ එය විනොදය තකා කරන ලද්දකැ යි නො සිතව.

986. සබඳ මැනැවින් කරන ලද රැවුළු කැපීම (තෙපිත්) කැමැත්තහු නම්, තොපට ද එය කරවන්නෙමි. තොපට මේ මැණික ද දෙමි.

987. තෝ ම මේ මැණිකට සුදුස්සෙහි. මනා ලෙස කරනලද රවුළු කැපීමට ද තෝ ම සුදුස්සෙහි. මිතුර, තා නො දැකීම මට ප්‍රිය වෙයි. එහෙයින් තා අමතා යමි.

10. කාක ජාතක යි.

දෙවැනි සෙනක වර්ග යි.

එහි උද්දනය:–

බරපුත්‍ත (පඤ්ඤ) ජාතක යැ සූචි ජාතක යැ තුණ්ඩිල ජාතක යැ සුවණ්ණ කක්කටක (මිග) ජාතක යැ මයහක ජාතක යැ ධජවිහෙඨක ජාතක යැ භිසපුප්ඵ (වාරිජ) ජාතක යැ විභාස (මොක්ඛ) ජාතක යැ වට්ඨක ජාතක යැ කාක ජාතක යැ යි දසයෙකි.

ඡක්ක නිපාතය නිමි.

වග්ගුද්දනය:–

ජාතක නිපාත වරයෙහි අවාරිය යැ සෙනක යැ යි සුසඤ්ඤජන වර්ග දෙකක් මැ කියන ලදී.

988. දියඩ්ඪකුක්කු උදයෙන කණ්ණිකා
විදත්ථියො අට්ඨ පරික්ඛිපන්ති නං,
සසිංසපා සාරමය[1] අඵෙග්ගුකා
කුහිං ඨිතා උපරිතො න ධංසති.

989. යා තිංසති සාරමයා අනුජ්ජුකා
පරිකිරිය[2] ගොපාණසියො සමට්ඨිතා,
තා සඞ්ගහීතා[3] බලසා ච පීළිතා
සමට්ඨිතා උපරිතො න ධංසති.

990. එවං මිත්තෙහි දළ්හෙහි පණ්ඩිතො
අභෙජ්ජරූපෙහි සුචීහි මන්තිහි,
සුසඞ්ගහීතො සිරියා න ධංසති
ගොපාණසී භාරවහාව කණ්ණිකා.

991. ඛරත්තචං බෙල්ලං* යථාපි සත්ථවා
අනාමසන්තොපි කරොති තිත්තකං,
සමාහරං සාදුං කරොති පත්ථිවා
අසාදු[4] කයිරා තනුවට්ට මුද්ධරං[5].

992. එවම්පි ගාමනිගමෙසු පණ්ඩිතො
අසාහසං රාජධනානි සංහරං,
ධම්මානුවත්තී පටිපජ්ජමානො
සඵාති කයිරා අවිහෙඨයං පරං.

993. ඔදාතමූලං සුචිවාරිසම්භවං
ජාතං යථා පොක්ඛරණීසු අම්බුජං,
පදුමං යථා අග්ගිනිකාසිඵාලිමං
න කද්දමො න රජො න වාරි ලිම්පති.

994. එවම්පි වොහාරසුචිං අසාහසං
විසුද්ධකම්මන්තමපෙතපාපකං,
න ලිම්පති කම්මකිලෙසතාදිසො
ජාතං යථා පොක්ඛරණීසු අම්බුජ'න්ති.

1. කුක්කුජාතකං.

1. සාසිංසපා සාරමයා – මජසං.
2. පකිරියා – මජසං.
3. කාහි සුසංගහිතා – මජසං.
4. අසාදුං – මජසං. අසාධු – සයා.
5. තනුබන්ධමුද්ධරං තනුවද්ධමුද්ධරං – මජසං. සයා.
*. බෙල්ලන්ති වා පාඨෙ අයමෙව අත්ථො – අට්ඨකථා.

988. කැණිමඬල උසින් රියන් එකහමාරකි. අට වියතෙක් එය පිරිකෙව් කෙරෙයි. (වටප්‍රමාණය වියත් අටකි.) එලය නැති ඇට්ටේරිය අරටුවෙන් සෑදූ කැණිමඬල කොහි පිහිටියා (බිමට) නො වැටේ ද?

989. ඍජු නැති සාරදරුයෙන් තැනූ තිසක් පමණ ගොනැස්හු හාත්පසින් සම ව පිරිවරා සිටියාහු ද ඔවුහු (එකිනෙක) මනා කොට එකට බලයෙන් පෙළන ලද්දහු මනාකොට එකට බැඳී සමබරට උඩින් සිටියාහු වෙත් ද, එහෙයින් නො වැටෙත්.

990. මෙසේ නුවණැති රජ දැඩි මිතුරු වූ නො බිඳෙන සුලු වූ පිරිසුදු ගති පැවැතුම් ඇති මැතිවරුන් හා දැඩිසේ සම්බන්ධ වූයේ, මනාසේ සම්බන්ධ වූ ගොණැස් බර දරන කැණිමඬල මෙන් රාජසම්පතින් නො පිරිහේ.

991. යම්සේ අවි ඇත්තේ සන ලෙල්ල ඇති නාරන්ගෙඩියේ ලෙල්ල සැස ඉවත් නො කරන්නේ, නාරන්ගෙඩියේ රස තිත්ත කෙරේ ද, ලෙල්ල සැස ඉවත් කරන්නේ රස මිහිරි කෙරේ ද, තුනී ලෙල්ල සැස ඉවත් කරන්නේ (එහි රසය) අමිහිරි කෙරේ ද,

992. මෙසේ නුවණැති රජ තෙමේ සැහැසි නො වී ගම්නියම්ගම්හි අයබදු අය කරන්නේ අනුන් නො පෙළා දහම් අනුව පැවැත්මෙන් පිළිපදනේ හේ අභිවෘඩිය කරන්නේ ය.

993. පොකුණුවල සුදුමුල් ඇති පිරිසුදු ජලයේ හටගත් හිරු රැසින් පිපුණු පියුම්හි යම්සේ මඩ හෝ රජස් (දූවිලි) හෝ ජලය හෝ නො තැවරේ ද,

994. අගති රහිත ව නඩු විනිශ්චය කරන සාහසික ක්‍රියා නැති, පාපක්‍රියා නැති හෙයින් පවිත්‍ර වූ රජ තෙමේ පොකුණුවල හටගත් පියුම (පොකුණුදිය හා නො තැවරෙන්නා) මෙන් කම් ක්ලෙශ හා නො වැකෙයි.

1. කුක්කු ජාතක යි.

995. යථා චාපො නින්නමති ජියා චාපි නිකූජති,
හඤ්ඤතෙ නූන මනොජො මිගරාජා සඛා මම.

996. හන්දදානි වනං තාණං[1] පක්කමාමි යථාසුඛං,
නෙතාදිසා සඛා හොන්ති ලබ්භා මෙ ජීවතො සඛා.

997. න පාපජනසංසෙවී අච්චන්තං සුඛමෙධති,
මනොජං පස්ස සෙමානං ගිරියස්සානුසාසනී.

998. න පාපසම්පවඞ්කෙන මාතා පුත්තෙන නන්දති,
මනොජං[2] පස්ස සෙමානං අච්ඡන්නං සම්හි ලොහිතෙ.

999. එවමාපජ්ජති[3] පොසො පාපියඤ්ච නිගච්ඡති,
යො වෙ හිතානං වචනං න කරොති අත්ථදස්සිනං.

1000. එවඤ්ච සො හොති තතො ච පාපියො
යො උත්තමො අධමනුජපසෙවී
පස්සුත්තමං අධමජනූපසෙවිතං[4]
මිගාධිපං සරවරවෙධනිබ්බුතං,

1001. නිහීයති පුරිසො නිහීනසෙවී
න ච හායෙථ කදාචි තුල්‍යසෙවී,
සෙට්ඨමුපනමං[5] උදෙති ඛිප්පං
තස්මා අත්තනො උත්තරිං හජෙථාති.

2. මනොජජාතකං.

1002. රාජා තෙ හත්තං පාහෙසි සුචිමංසූපසෙචනං,
මඛාදෙවස්මිං[6] අධිවත්ථො[7] එහි නික්ඛම හුඤ්ජස්සු.

1003. එහි මාණව ඔරෙන[8] හික්ඛමාදය සූපිතං[9],
ත්වඤ්ච මාණව හික්ඛා[10] ච උහො හක්ඛා හවිස්සථ.

1004. අප්පකෙන තුවං යක්ඛ ථුල්ලමත්ථං ජහිස්සසි,
භික්ඛං තෙ නාහරිස්සන්ති ජනා මරණසඤ්ඤිනො.

---

1. හන්දදානි වනන්තානි – රාමු.
2. මනොජ – මජ්සං.
3. එවමාපජ්ජතෙ – මජ්සං. ස්‍යා.
4. අධම්මනූපසෙවිතං – මජ්සං.
5. සෙට්ඨමුපගමඤ්ච – මජ්සං.
6. මාඝදෙවස්මිං – මජ්සං. මඝදෙවස්මිං – ස්‍යා.
7. අධිවත්ථ – මජ්සං.
8. ඔරෙය – ස්‍යා.
9. සූපිනං – මජ්සං.
10. හික්ඛංච – මජ්සං.

995. යම් පරිදි දුන්න නැමේ ද දුනුදිය පොළන (ලද්දී) හඬ නභා ද මේ කරුණෙන් මාගේ මනොජ නමැති යහළු සිංහයා මරනු ලැබීය යි සිතමි.

996. එබැවින් දුන් සුවසේ ක්‍ෂෙම වූ වනයට යමි. මෙවැනි මළාහු යාළුවෝ නො වෙති. ජීවත්වන මා විසින් යාළුවෝ ලැබිය හැක්කාහ.

997. පව්වු ජනයා ඇසුරු කරනුයේ බොහෝකල් සුව නො ලැබෙයි. ඊපහර ලැබ හෝනා මනොජයා බල. ගිරිය නම් හිවලා ගේ අනුශාසනය මෙබඳු ය.

998. පවට නැමුණු පුත්‍රයා නිසා මව සතුටු නො වේ. ඒ එසේ මැ ය. තමාගේ ම ලෙයෙහි ගැලී හෝනා මනොජයා බල.

999. යමෙක් අනාගත අභිවෘද්ධිය දක්නා හිතෛෂීන්ගේ ඔවා අනුව ක්‍රියා නො කෙරේ ද, එබඳු පුරුෂ තෙම මෙ වැනි දුකට පැමිණේ. ලාමක බවට ද පැමිණෙයි.

1000. උතුම් වූ යමෙක් ගුණානුවණින් හීනයකු ඇසුරු කෙරේ ද හේ හීනයාට වඩා පහත් කෙනකු වන්නේ ය. ඒ එසේ මැ ය. හීනයකු ඇසුරු කළ හී පහරින් මළා වූ උත්තම සිංහයා බල.

1001. හීන ජනයන් ඇසුරු කරන පුරුෂ තෙම පිරිහෙයි. සමානයකු (ගුණයෙන්) ඇසුරු කරනුයේ කිසිකලෙක නො පිරිහෙයි. සීලාදිගුණයන්ගෙන් පිරුණු කෙනකුන් ඇසුරු කරනුයේ වහා දියුණුවට පැමිණෙයි. එහෙයින් තමාට වඩා ගුණැතියන් ඇසුරු කරන්නේ යි.

2. මනොජ ජාතක යි.

1002. මඛාදෙව නමැති නුගයෙහි වෙසෙන දෙවිය, රජතුමා පවිත්‍ර මස්රසයෙන් යුතු බත එවී ය. මැතට අවුත් වළඳනු මැනැවි.

1003. මාණවකය, මස්රස සහිත ආහාරය ගෙන ඔබින් මෙහි එව. මාණවකය, තො ද (තා ගෙනා) බත ද මට ගොදුර වන්නවූ ය.

1004. යක්‍ෂය, මරණබිය ඇති ජනයෝ තට ආහාරය නො ගෙනෙති. එහෙයින් තෝ මද දූයෙකින් මහත් ප්‍රයොජනයක් අත් හරනෙහි ය හෙවත් නො ලබන්නෙහි ය.

1005. ලද්ධායං යක්ඛ[1] තව නිවචභික්ඛං
සුචිං පණීතං රසසා උපෙතං,
භික්ඛඤ්ච තෙ ආහරියො නරො ඉධ
සුදුල්ලභො හොහිති[2] ඛාදිතෙ මයි.

1006. මමෙස[3] සුතනො අත්ථො යථා භාසසි මාණව,
මයා ත්වං සමනුඤ්ඤාතො සොත්ථිං පස්සසි මාතරං.

1007. ඛග්ගං ඡත්තඤ්ච පාතිඤ්ච[4] ගච්ඡෙවාදය[5] මාණව,
සොත්ථිං පස්සතු තෙ මාතා ත්වඤ්ච පස්සාහි මාතරං.

1008. එවං යක්ඛ සුඛී හොහි සහ සබ්බෙහි ඤාතිභි,
ධනඤ්ච මෙ අධිගතං රඤ්ඤො ච වචනං කතන්ති.

3. සුතනුජාතකං.

1009. තෙ කථන්නු කරිස්සන්ති වුද්ධා ගිරිදරීසයා,
අහං බද්ධොස්මි[6] පාසෙන නීලියස්ස වසං ගතො.

1010. කිං ගිජ්ඣ පරිදෙවසි[7] කා නු තෙ පරිදෙවනා,
න මෙ සුතො වා දිට්ඨො[8] වා භාසන්තො මානුසිං දිජො.

1011. භරාමි මාතාපිතරො වුද්ධෙ[9] ගිරිදරීසයෙ,
තෙ කථන්නු කරිස්සන්ති අහං වසං ගතො තව.

1012. යන්නු ගිජ්ඣො යොජනසතං කුණපානි අවෙක්ඛති,
කස්මා ජාලඤ්ච පාසඤ්ච ආසජ්ජාපි න බුජ්ඣසි.

1013. යදා පරාභවො හොති පොසො ජීවිතසඞ්ඛයෙ,
අථ ජාලඤ්ච පාසඤ්ච ආසජ්ජාපි න බුජ්ඣති.

1014. භරස්සු මාතාපිතරො වුද්ධෙ ගිරිදරීසයෙ,
මයා ත්වං සමනුඤ්ඤාතො සොත්ථිං පස්සාහි ඤාතකෙ.

1015. එවං ලුද්දක නන්දස්සු සහ සබ්බෙහි ඤාතිභි,
භරිස්සං මාතාපිතරො වුද්ධෙ ගිරිදරීසයෙති.

4. ගිජ්ඣජාතකං.

1. ලද්ධාවයක්ඛා – සී.
2. හෙහිති – මජසං, සයා.
3. මමෙව – මජසං, සයා.
4. පාටිඤ්ච – සයා.
5. ගච්ඡමාදය – මජසං,
6. බන්ධොස්මි – මජසං,
7. පරිදෙවෙසි – මජසං. සයා
8. දිට්ඨං වා සුතං – මජසං.
9. වද්ධෙ.

1005. යක්ෂය, තට රසයෙන් යුත් පවිත්‍ර මිහිරි ආහාරය ලැබෙන්නේ ය. මා කෑ කල්හි ආහාරය ගෙනෙන්නකු දැකීම ඉතා දුලබ වෙයි.

1006. මාණවකය සුතනුවෙනි, තෝ යමක් කීයෙහි ද එය මට වැඩ පිණිස වේ. තෝ මා විසින් අනුදන්නා ලද්දෙහි සුවසේ ගොස් මව දකින්නෙහි ය.

1007. මාණවකය, තොපගේ කඩුව ද ඡත්‍රය ද රන්තලිය ද ගෙන මැ යව. තොපගේ මව සුවසේ දකීවා. තො ද මව බලව.

1008. යක්ෂය, මා විසින් ධනය ලබන ලදී. රජ කී ලෙස කරන ලදී. සියලු නෑයන් සමග තෙපි සුවපත් වෙවයි.

3. සුතනු ජාතක යි.

1009. පාශයෙන් බැඳුණු මම් නීලිය නම් වැද්දගේ වසයට ගියෙම් වෙමි. පර්වත කුහරයෙහි වෙසෙන මහලු වූ ඒ මගේ මවුපියෝ කුමක් කරන්නාහු දෝ හෝ.

1010. ගිජුලිහිණිය, කුමක් හෙයින් වැලැපෙහි ද? තාගේ හැඬීම කවර? මිනිස් බසින් කථා කරන පක්ෂියෙක් මා විසින් අසන ලද්දේ හෝ දක්නා ලද්දේ හෝ නැති.

1011. මහලු වූ ගිරිකුහරයෙහි වෙසෙන මවුපිය දෙදෙන පොෂණය කෙරෙමි. මම තොපගේ වසයට ගියෙමි. ඒ මවුපියෝ කුමක් කෙරෙද්ද (හෙවත් ජීවත් වන්නේ කෙසේ ද?)

1012. ගිජුලිහිණියා යොදුන් සියයෙකින් ඔබ්බෙහි තුබූ කුණපයන් ඉවෙන් දැනගන්නට සමත් යයි කියනු ලැබේ. දැල හා පාශය සමීපයට පැමිණ ද කුමක් හෙයින් (බැඳෙන බව) නො දත්තේ ද?

1013. යම් කලෙකැ විනාශය වේ ද එකලැ පුරුෂ ජීවිත විනාශය ඇති කල්හි දැලට ද පාශයට ද ළංවුවත් බැඳෙන බව නො දනී.

1014. පර්වතගුහාවෙහි වෙසෙන මහලු මවුපියන් පෝෂණය කරව. මා විසින් අනුදන්නා ලද තෝ සුවසේ ගොස් නෑයන් බලව.

1015. වැද්දණෙනි, පර්වතගුහාවෙහි වෙසෙන මහලු මවුපියන් (යම්සේ) පෝෂණය කෙරෙම් ද, එසේ සියලු නෑයන් සමග තෙපි බොහෝ කල් සතුටු වව!

4. ගිජ්ඣ ජාතක යි.

1016. අනුතීරචාරි භද්දන්තෙ සහායමනුධාව මං,
මහා මෙ ගහිතො[1] මච්ඡො සො මං හරති වෙගසා.

1017. ගම්භීරචාරි භද්දන්තෙ දළ්හං ගණ්හාහි ථාමසා,
අහං තං උද්ධරිස්සාමි සුපණ්ණො උරගම්මිව.

1018. විවාදො නො සමුප්පන්නො දබ්භපුප්ඵ සුණොහි මෙ,
සමෙහි මෙධගං[2] සම්ම විවාදො වූපසම්මතං[3].

1019. ධම්මට්ඨොහං පුරෙ ආසිං බහු අට්ටං[4] මෙ තීරිතං,
සමෙමි මෙධගං සම්මා[5] විවාදො උපසම්මතු.

1020. අනුතීරචාරි නඞ්ගුට්ඨං සීසං ගම්භීරචාරිනො,
අථායං[6] මජ්ඣිමො ඛණ්ඩො ධම්මට්ඨස්ස භවිස්සති.

1021. චිරම්පි භක්ඛො අභවිස්ස සචෙ න විවදෙමසෙ,
අසීසකං අනඞ්ගුට්ඨං සිගාලො හරති රොහිතං.

1022. යථාපි රාජා නන්දෙය්‍ය රජ්ජං ලද්ධාන ඛත්තියො,
එවාහමජ්ජ නන්දාමි දිස්වා පුණ්ණමුඛං පතිං.

1023. කථන්නු ථලජො සන්තො උදකෙ මච්ඡං පරාමසි,
පුට්ඨො මෙ සම්ම අක්ඛාහි කථං අධිගතං තයා.

1024. විවාදෙන කිසා හොන්ති විවාදෙන ධනක්ඛයා,
ජීනා උද්දා විවාදෙන භුඤ්ජ මායාවි රොහිතං.

1025. එවමෙවං මනුස්සෙසු විවාදො යත්ථ ජායති,
ධම්මට්ඨං පටිධාවන්ති සො හි නෙසං විනායකො
ධනාපි තත්ථ ජීයන්ති රාජකොසො පවඩ්ඪතී'ති.

5. දබ්භපුප්ඵජාතකං.

---

1. රොහිතො - මජ්සං.
2. මෙධකං - රාමු.
3. උපසම්මතු - ජා අ.
4. අත්ථං - රාමු.
5. සම්ම - මජ්සං, සයා.
6. අච්චායං - මජ්සං.

1016. ඉවුර ළඟ හැසිරෙන මිතුර තොපට යහපතක් වේවා ! මා වෙත දුව එන්න, මා විසින් මහත් වූ මසෙක් ගන්නා ලද, ඒ මාළුවා මා ඉක්මනින් දියට ගෙන යයි.

1017. ගැඹුරෙහි හැසිරෙනුව, තොපට යහපතක් වේවා ! දැඩිව ගනුව, ගුරුළෙක් සර්පයෙකු සෙයින් මම තා දියෙන් නඟා ගන්නෙමි.

1018. දබ්බපුප්ඵය, (කුසතණමල් පැහැය ඇති සිවලා) මා කියන්නක් අසන්න. අපගේ විවාදයෙක් උපන, යහළුව කලහය සන්හිඳුවනු මැන, විවාදය සන්හිඳේවා.

1019. මම පෙර ධර්මයෙහි සිටියෙමි. මා විසින් බොහෝ අර්ථ නිශ්චය කරන ලද. යහළුව, කලහය සන්හිඳුවමි, තොප දෙදෙනාගේ විවාදය සන්හිඳේවා.

1020. ඉවුරෙහි හැසිරෙන්නාට නඟුට හිමි වේ. ගැඹුරෙහි හැසිරෙන්නාට හිස හිමිවේ. මේ මැද කොටස නඩුව විසඳූ මට හිමි ය.

1021. ඉදින් විවාද නො කළමෝ නම් දවස් කීපයකට ප්‍රමාණවත් මාළු ලැබෙන්නේ ය. හිස සහ නඟුට නැති රොහිත මාළුවා හිවල් තෙමේ ගෙන යයි.

1022. ක්ෂත්‍රිය රජෙක් රාජ්‍යයක් ලැබැ සතුටු වන්නේ යම් සේ ද එසේ අද මම (සතුටෙන්) පිරුණු මුහුණ ඇති ස්වාමියා දැක සතුටු වෙමි.

1023. ගොඩ සිට දියේ ගැවසෙන මාළුවා අල්ලා ගත්තේ කෙසේ ද, මිතුර විචාරන ලද මට එය කියන්න. තොප විසින් එය ලැබුයේ කෙසේ ද?

1024. මායාකාරිය, විවාදයෙන් කෘෂ වෙති. විවාදයෙන් ධනය නැසේ. විවාදය නිසා මස්කාවෝ පිරිහුනාහ. රේමසා බුදින්න.

1025. එසේ මිනිසුන් අතරේ යම් තැනක විවාදය හටගනී ද විනිසකරුවන් සමීපයට යති. හේ ඔවුන්ගේ විවාදය සන්හිඳුවන්නා වෙයි. ඒ නිසා ධනය පිරිහේ. රාජ කොෂ්ටාගාරය සර වේ.

5. දබ්භපුප්ඵ ජාතක යි.

1026. දසණ්ණකං තිඛිණධාරං අසිං සම්පන්නපායිනං,
පරිසායං පුරිසො ගිලති කිං දුක්කරතරං තතො.
යදඤ්ඤං දුක්කරං ඨානං තං මෙ අක්ඛාහි පුච්ඡිතො.

1027. ගිලෙය්‍ය පුරිසො ලොභා අසිං සම්පන්නපායිනං,
යො ච වජ්ජා දදාමීති තං දුක්කරතරං තතො
සබ්බඤ්ඤං සුකරං ඨානං එවං ජානාහි මාගධ[1].

1028. ව්‍යාකාසි ආයුරො පඤ්හං අත්ථධම්මස්ස කොවිදො,
පුක්කුසං දානි පුච්ඡාමි කිං දුක්කරතරං තතො;
යදඤ්ඤං දුක්කරං ඨානං තං මෙ අක්ඛාහි පුච්ඡිතො.

1029. න වාචමුපජීවන්ති අඵලං ගිරමුදීරිතං,
යො ච දත්වා අවාකයිරා තං දුක්කරතරං තතො;
සබ්බඤ්ඤං සුකරං ඨානං එවං ජානාහි මාගධ.

1030. ව්‍යාකාසි පුක්කුසො පඤ්හං අත්ථං ධම්මස්ස කොවිදො,
සෙනකං දානි පුච්ඡාමි කිං දුක්කරතරං තතො;
යදඤ්ඤං දුක්කරං ඨානං තං මෙ අක්ඛාහි පුච්ඡිතො.

1031. දදෙය්‍ය පුරිසො දානං අප්පං වා යදි වා බහුං,
යො ච දත්වා නානුතප්පෙ තං දුක්කරතරං තතො;
සබ්බඤ්ඤං සුකරං ඨානං එවං ජානාහි මාගධ.

1032. ව්‍යාකාසි ආයුරො පඤ්හං අථො පුක්කුසපොරිසො,
සබ්බෙ පඤ්හෙ අභිභොති[2] යථා භාසති සෙනකො'ති.

6. දසණ්ණකජාතකං.*

1033. විබ්භන්තචිත්තො කුපිතින්ද්‍රියොසි
නෙත්තෙහි තෙ වාරිගණා සවන්ති,
කිං තෙ නට්ඨං කිං පන පත්ථයානො
ඉධාගමා බ්‍රාහ්මණ ඉඞ්ඝ බ්‍රෑහි[3].

1. මද්දව – මජසං.
2. අතිභොති – මජසං.
3. බ්‍රෑහෙම තදිඞ්ඝබ්‍රෑහි – රාමු.
*. පණ්ණකජාතකං – මජසං.

1026. මේ පුරුෂ (ධනලොභයෙන්) පිරිස්මැද හිඳ දසාර්ණක දෙශයෙහි ජාත වූ පිරිපුන් වැ ලේ බොන තියුණු මුවහත් ඇති කඩුව ගිලී. මීට වඩා දුෂ්කර වූ අන් කරුණෙක් ඇද්ද? විචාරන ලද මට කියන්න.

1027. මගධාධිපතිතුමනි, පුරුෂයෙක් වස්තුලොභයෙන් පිරිපුන් වැ ලේ බොන කඩුව ගිලින්නේ ය. යමෙක් දෙමි යි කියන්නේ නම් එය ඊට වඩා අතිශයින් දුෂ්කර වෙයි. මෙයින් අන් සියලු කරුණු කරන්නට පහසු වේ යයි මෙසේ දත මැනව.

1028. ඒ අර්ථද්‍යොතක ශාස්ත්‍රයෙහි නිපුණ වූ ආයුර තෙම ප්‍රශ්නයාගේ අර්ථය ප්‍රකාශ කෙළේ ය. (ප්‍රශ්නයට පිළිතුර දුන්නේ ය.) දැන් පුක්කුසයන් පුළුවුස්මි. ඒ 'දෙමි' යන වචනයට වඩා ඉතා දුෂ්කර කාරණය කුමක් ද? යම් අනෙක් දුෂ්කර කරුණක් ඇද්ද? විචාරන මට කියව.

1029. මගධාධිපතිතුමනි, කියන ලද නිෂ්ඵල වචනය නිසා කිසිකෙනෙක් ජීවත් නො වෙති. යමෙක් යමක් දෙමි යි පිළින කොට ඒ පරිදි එය දී එහි ලොභය දුරු කෙරේ ද, එය කඩුව ගිලිනුවාට වඩා කරන්නට දුෂ්කර ය. අනෙක් හැම දේ කරන්නට පහසු බව දනු මැනැව.

1030. අරුත් විසඳන ග්‍රන්ථ සංඛ්‍යාත ශාස්ත්‍රයෙහි නිපුණ පුක්කුස තෙම ප්‍රශ්නයට පිළිතුර එළි කෙළේ ය. දැන් සේනකයන් විචාරමි. එයට වඩා දුෂ්කර කාර්යය කුමක් ද? යම් අනෙක් දුෂ්කර කාර්යයක් තිබේ ද? විචාරන මට කියව.

1031. මගධෙශ්වරය, යම් පුරුෂයෙක් ස්වල්ප වූ හෝ බොහෝ වූ හෝ දනක් දෙන්නේ ද, දීමෙන් පසු නො තැවෙන්නේ ද එය ඊට වඩා දුෂ්කර ය. අනෙක් හැම කරුණ කරන්නට පහසු බව දනුව.

1032. ආයුරත් පුක්කුස පුරුෂයාත් ප්‍රශ්න විසඳාලූහ. සේනක තෙමේ යම් පරිදි විසඳන ලද ද එය සියලු පැනවිසඳුම් ඉක්මවා සිටී. හෙවත් හැම විසඳුමකට වඩා එය උතුම්.

6. දසණ්ණක ජාතක යි.

1033. බ්‍රාහ්මණය, චංචල සිත් ඇත්තෙහි ඇලළීගිය චක්ෂුරින්ද්‍රිය ඇත්තෙහි නෙතින් කඳුළුබිඳු වැගිරෙයි. තොපගේ කුමක් නටුයේ වී ද කුමක් ප්‍රාර්ථනා කරන්නෙහි මෙහි ආයෙහි ද යි එබැවින් ඒ කරුණ කියව.

1034. මීයෙථ භරියා වජ්ජතො මමජ්ජ
අගච්ඡතො මරණං ආහ යක්ඛො,
එතෙන දුක්ඛෙන පවෙධිතොස්මි
අක්ඛාහි මෙ සෙනක එතමත්ථං.

1035. බහූනි ඨානානි විචින්තයිත්වා
යමෙත්ථ වක්ඛාමි තදෙව සච්චං,
මඤ්ඤාමි තෙ බ්‍රාහ්මණ සත්තුභස්තං
අජානතො කණ්හසප්පො පවිට්ඨො.

1036. ආදාය දණ්ඩං පරිසුම්භ භස්තං
පස්සෙළමූගං උරගං ද්විජිව්හං,
ඡින්දජ්ජ කඞ්ඛං විචිකිච්ඡිතානි
භුජඞ්ගමං පස්ස පමුඤ්ච භස්තං.

1037. සංවිග්ගරූපො පරිසාය මජ්ඣෙ
සො බ්‍රාහ්මණො සත්තුභස්තං පමුඤ්චි,
අථ නික්ඛමි උරගො උග්ගතෙජො
ආසීවිසො සප්පො ඵණං කරිත්වා.
සුලද්ධලාභා ජනකස්ස රඤ්ඤො
යො පස්සති සෙනකං සාධුපඤ්ඤං.

1038. විවත්තච්ඡද්දො[1] නුසි සබ්බදස්සී
ඤාණං නු තෙ බ්‍රාහ්මණ භිංසරූපං
ඉමානි මෙ සත්ත සතානි අත්ථි
ගණ්හාහි සබ්බානි දදමි තුය්හං,
තයා හි මෙ ජීවිතමජ්ජ ලද්ධං
අථොපි භරියායමකාසි සොත්ථිං.

1039. න පණ්ඩිතා වෙතනමාදියන්ති
චිත්‍රාහි ගාථාහි සුභාසිතාහි,
ඉතොපි තෙ බ්‍රහ්මෙ දදන්තු විත්තං
ආදාය තං ගච්ඡ සකං නිකෙතන්ති.

7. සත්තුභස්තජාතකං.

1040. යෙ මෙ අහං න ජානාමි අට්ඨිසෙන වනිබ්බකෙ,
තෙ මං සඞ්ගම්ම යාචන්ති කස්මා මං ත්වං න යාචසි.

1041. යාචකො අප්පියො හොති යාචං අදදමප්පියො,
තස්මාහන්තං න යාචාමි මා මෙ විද්දෙසනා[2] අහූ.

---

1. විවටච්ඡාද – මජ්සං. විවටච්ඡදෙ – සයා.
2. විදෙස්සනං – සයා. මජ්සං.

1034. සේනක පඬිතුමනි, අද ගෙට යන මාගේ බිරිඳ මියෙයි ල, ගෙට නොයන මට (අතරමග) මරණයයි යකෙක් (දෙවියෙක්) කී ය. මේ දුකින් වෙවුළමි. සෙනකයෙනි, මෙ කරුණ මට කියව.

1035. බමුණ, බොහෝ වූ මරණ කරුණු සිතා අවබොධ කොට ගෙන මෙහි යමක් කියම් ද එ මැ සත්‍ය යැ. තොපගේ අත්සුණු පසුම්බියට තොප නොදන්නා පරිද්දෙන් කළුනයෙක් පිවි- සියේ යැ යි සිතමි.

1036. දණ්ඩක් ගෙන පසුම්බියට ගසව. මුවින් කෙළ වැගි- රෙන දිව් දෙකක් ඇති සර්පයා (පසුම්බියෙන් නික්මෙන්නා) බලව. අද තොපගේ සැකය විචිකිච්ඡාව සිඳුව. සර්පයා බලව. පසුම්බිය මුදව.

1037. තැතිගත් ස්වභාවයෙන් සිටි ඒ බමුණු තෙමේ පිරිස මැද අත්සුණු පසුම්බිය මිදුයේ ය. එකලැ උග්‍රතෙජස් ඇති වහා පැති- රෙන විෂ ඇති සර්පයා පෙණය දක්වා පසුම්බියෙන් නික්මිණ. යමෙක් මනා නුවණැති සේනක පඬිතුමා නිතර දක්නේ ද ජනක රජතුමා ලද උසස් ලාභයෝ යි.

1038. බ්‍රාහ්මණයෙනි, කිම? තෙපි විවෘත ඥෙයධර්ම ඇති සර්‍වඥ බුද්ධ වවු ද? (අසර්‍වඥ වූ මැ) තොපගේ ඥානය (සර්‍වඥතාඥානය මෙන්) බලවත් වෙයි. යම් හෙයෙකින් අද තොප විසින් දෙන ලද ජීවිතය මා විසින් ලබන ලද යැ. තව ද මාගේ අඹුවට ද සෙතක් කෙළේ ද. එහෙයින් මේ මා සතු කහවණු සත්සියයක් ඇත. ඒ හැම තොපට දෙමි. එය ගනු මැනැවි.

1039. සුභාෂිත වූ චිත්‍රගාථාවන් කරණකොට ගෙන පඬිවරු කුලී නො ගනිති. බ්‍රාහ්මණය, තොපට මෙයිනුදු (මාගේ පාමුල් පෙට්ටියෙනු) දූ (කහවණු තුන්සියක්) ධනය දෙත්වා. එය ගෙන සිය නිවෙසට යව.

7. සත්තුභස්ත ජාතක යි.

1040. ආයර්‍ය අස්ජිසෙනයෙනි, යම් යාචක කෙනකුන් මම නො හඳුනම් ද ඔහු පවා මා කරා පැමිණ ඉල්වති. තෙපි කුමක් හෙයින් නො ඉල්වවු ද?

1041. යාචක තෙම අප්‍රිය වෙයි යාච්ඤා කළ දූය නො දෙන්නෙ ද වෙයි. එහෙයින් මම තොප අතින් නො ඉල්වමි. (ඉල්වූ කල තොපට ද ඉල්වූ දූය නො දෙන කල අපට ද උපදනා) ද්වෙෂය නො වේවා.

1042. යො වෙ යාචනජීවානො කාලෙ යාචං න යාචති,
පරඤ්ච පුඤ්ඤා ධංසෙති අත්තනාපි න ජීවති.

1043. යො ච යාචනජීවානො කාලෙ යාචං හි යාචති,
පරඤ්ච පුඤ්ඤං ලබ්භෙති අත්තනාපි ච ජීවති.

1044. න වෙ දිස්සන්ති සප්පඤ්ඤා දිස්වා යාචකමාගතෙ,
බ්‍රහ්මචාරි පියො මෙසි වරතං භඤ්ඤමිච්ඡසි.

1045. න වෙ යාචන්ති සප්පඤ්ඤා ධීරො වෙදිතුමරහති[1],
උද්දිස්ස අරියා තිට්ඨන්ති එසා අරියානයාචනා.

1046. දදමි තෙ බ්‍රාහ්මණ රොහිණීනං
ගවං සහස්සං සහ පුඞ්ගවෙන,
අරියො හි අරියස්ස කථං න දජ්ජා
සුත්වාන ගාථා තව ධම්මයුත්තාති.

8. අට්ඨිසෙනජාතකං.

1047. යත්ථ වෙරී නිවසති[2] න වසෙ තත්ථ පණ්ඩිතො,
එකරත්තං දිරත්තං වා දුක්ඛං වසති වෙරිසු.

1048. දියො වෙ[3] ලහුචිත්තස්ස පොසස්ස අනුවිධියතො,
එකස්ස කපිනො හෙතු යූථස්ස අනයො කතො.

1049. බාලො ච පණ්ඩිතමානී යූථස්ස පරිහාරකො.
සචිත්තස්ස වසං ගන්ත්වා සයෙථායං[4] යථා කපි.

1050. න සාධු බලවා බාලො යූථස්ස පරිහාරකො,
අහිතො භවති ඤාතීනං සකුණානංව චෙතකො[5].

1051. ධීරො ච බලවා සාධු යූථස්ස පරිහාරකො.
හිතො භවති ඤාතීනං තිදසානං ච වාසවො,

---

1. විදිතුමරහති – සයා.
2. නිවිසති – මජ්සං.
3. වෙ – මජ්සං.
4. පසෙසථායං – මජ්සං.
5. චෙටකො – මජ්සං.

1042. සිඟමනෙන් ජීවත්වන යමෙක් ඉල්වියයුතු දූය සුදුසු කාලයෙහි නො ඉල්ලා ද හේ අනෙකා ද පිනෙන් පිරිහෙළයි. තෙමේ ද සුවසේ ජීවත් නො වේ.

1043. සිඟමනෙන් ජීවත්වන යමෙක් ඉල්ලියයුතු දූය සුදුසු සමයෙහි ඉල්ලා ද හේ අනෙකාට පින ලබාදෙයි. තෙමේ ද සුවසේ ජීවත් වේ.

1044. තපස්විය, (දනය දනඵලය දන්නා) නුවණැත්තෝ තමා වෙත පත් යාචකයන් දැක ඒකාන්තයෙන් නො කිපෙති. තෙපි මට ප්‍රිය වවු. කියයුතු යම් දූයක් කැමැත්තවූ නම් ඒ දූය ඉල්ලවූ.

1045. නුවණැත්තෝ ඒකාන්තයෙන් නො ඉල්ලති. නුවණැති උපසථායක අවසථාවට සුදුසු දූය දැනගන්නට වටී. ආර්යයෝ (වාග් භෙද නො කොට) උදෙසා සිටිති, මේ ආර්ය යාචනා යි.

1046. බමුණ, වෘෂභරාජයකු හා සමග රතුදෙනුන් දහසක් තොපට දෙමි. ධර්මයෙන් යුක්ත වූ තොපගේ ගාථා අසා තොප වැනි ආචාර ආර්යයක්හට ආර්යයෙක් කෙසේ නම් නො දෙන්නේ ද.

8. අස්පීසෙන ජාතක යි.

1047. යම් තැනෙක සතුරා වෙසේ ද එතැන නැණවතා නො වසන්නේ යැ. වෛරීන් අතුරෙහි එක රැයකුදු දෙරැයකුදු දූකසේ වසන්නේ යැ.

1048. ලඝු වූ සිත් ඇත්තේ අනුවර්තිත වූ පුරුෂයාහට ඒකාන්තයෙන් සතුරු වන්නේ යැ. (බලව ලඝු සිත් ඇති අන්ධ බාල වූ) එක් වඳුරකුගේ හෙතුයෙන් වානර සමූහයාට ව්‍යසනයක් කරන ලද.

1049. සේනා පරිහරනය කරන පණ්ඩිතයෙමි යි සිතන අඥන වූ තැනැත්තේ ද ස්වකීය චිත්තයාගේ වසඟයට ගොස් මේ වඳුරා සෙයින් (විනාශයට පැමිණ) හෝනේ යැ.

1050. ගණපරිහරණය කරන නොමනා පැවැතුම් ඇති බල-වත් වූ අඥන තෙම (තිත්තිර) සකුණයනට සේවටුවා මෙන් නෑයන්ට සතුරු වේ.

1051. ගණපරිහරණය කරන මනා පැවැතුම් ඇති බලවත් නැණවතා දෙව්ලෝවැසි ශක්‍රයා මෙන් නෑයන්ට හිතෙෂී වේ.

1052. යො ච සීලඤ්ච පඤ්ඤඤ්ච සුතඤ්චත්තනි පස්සති,
උභින්නමත්ථං චරති අත්තනො ච පරස්ස ච.

1053. තස්මා තුලෙය්‍යමත්තානං සීලපඤ්ඤාසුතාමිව,
ගණං වා පරිහරෙ ධීරො එකොවාපි පරිබ්බජෙති.

9. කපිජාතකං.

1054. ද්වාසත්තති ගොතම[1] පුඤ්ඤකම්මා
වසවත්තිනො ජාතිජරං අතීතා,
අයමන්තිමා වෙදගූ බ්‍රහ්මපත්ති[2]
අස්මාභිජප්පන්ති ජනා අනෙකා.

1055. අප්පං හි එතං න හි දීඝමායු
යං ත්වං බක මඤ්ඤසි දීඝමායු,
සතං සහස්සානං නිරබ්බුදනං,
ආයුං පජානාමි තවාහං බ්‍රහ්මෙ.

1056. අනන්තදස්සී භගවාහමස්මිං
ජාතිජරං සොකමුපාතිවත්තො,
කිම්මෙ පුරාණං වතසීලවත්තං
ආචික්ඛ මෙ තං යමහං විජඤ්ඤං.

1057. යං ත්වං අපායෙසි බහූ මනුස්සෙ
පිපාසිතෙ ඝම්මනි සම්පරෙතෙ,
තං තෙ පුරාණං වතසීලවත්තං
සුත්තප්පබුද්ධොව අනුස්සරාමි.

1058. යං එණිකූලස්මිං ජනං ගහීතං
අමොචයී ගය්හකනීයමානං,
තං තෙ පුරාණං වතසීලවත්තං
සුත්තප්පබුද්ධොව අනුස්සරාමි.

1059. ගඞ්ගාය සොතස්මිං ගහීතනාවං
ලුද්දෙන නාගෙන මනුස්සකප්පා,
අමොචයි ත්වං බලසා පසය්හ
තං තෙ පුරාණං වතසීලවත්තං.
සුත්තප්පබුද්ධොව අනුස්සරාමි.

---

1. භොගොතම - මජසං.
2. බ්‍රහ්මුප්පත්ති - මජසං.

1052. යමෙක් තමා කෙරෙහි සීලය ද ප්‍රඥාව ද ශ්‍රැතය ද දකී නම් හේ තමාට ද මෙරමාට ද යන දෙදෙනාට යහපතක් කරයි.

1053. එසේ හෙයින් ප්‍රාඥ තෙම ශීල යැ ප්‍රඥා යැ ශ්‍රැත යැ යන මොවුන් මෙන් තුලනය කොට (ශීලාදියෙහි පිහිටි බැව් පසක් කොට) සමූහ පරිහරන හෝ කරන්නේ ය. එකඟ වැ හෝ වෙසෙන්නේ ය.

9. කපි ජාතක යි.

1054. ගෞතමයෙනි, ජාති ජරා ඉක්මවා ගිය අනුන් තමා වසඟයට ගන්නා කළ පින් ඇති දෙසැත්තෑවක් බ්‍රහ්මයෝ මේ බ්‍රහ්මලොකයෙහි වෙසෙති. මෙය ප්‍රඥාවෙන් පැමිණි උත්තම පැමිණීම ය. අපි දු මෙසේ වම්හ යි බොහෝදෙන ඇඳිලි බැඳැ පතති.

1055. බක බ්‍රහ්මය, තෙපි යම් තැනෙක දීර්ඝායු ඇතැ යි සිතවු ද තෙල දීර්ඝායු නො වෙයි. මඳ ආයු පමණෙක. ඒ එසේ මැ යි. නිරබ්බුද සියක් දහසක් තොපට ආයු ඇතැ යි මම් දනිමි.

1056. භාග්‍යවතුන් වහන්ස, තෙපි 'මම අප්‍රමාණ වූ දූය දක්නෙම් වෙමි, ජාති ජරා ශොක යන මේවා ඉක්මවා සිටිමි'යි කියව. එබැවින් මාගේ පැරැණි කිනම් ව්‍රතයක් හෝ සීලසමාදන-යක් හෝ වී ද යමක් අසා මම දැනගන්නෙම් නම් තෙල මට කිව මැනැවි.

1057. බ්‍රහ්මයෙනි, යම් හෙයෙකින් තෙපි ග්‍රීෂ්ම කාලයෙහි ග්‍රීෂ්මය නිසා පීඩාවට පත් පිපාසිතයන් බොහෝ දෙනකුන්ට පැන් පානය කරවූහු ද තොපගේ ඒ පුරාණ ව්‍රත සමාදනය ද සිල්වත්-කම ද නිද පිබිදියක්හු මෙන් සිහි කෙරෙමි.

1058. ඒණී නමැති ගංඉවුරෙහි සොරුන් විසින් අල්වා ගන්නා ලද බලාත්කාරයෙන් ගෙනයනු ලබන යම් ජන කෙනකුන් මුදලී ද තොපගේ ඒ පුරාණ වත ද සීලය ද නිදපිබිදියක්හු මෙන් සිහි කෙරෙමි.

1059. මිනිසුන් නසනු කැමැති වූ රෞද්‍ර වූ නාගයකු විසින් ගඞ්ගාශ්‍රොතස්හි දී අල්වාගන්නාලද නැව (ගුරුළුවෙස් ගෙන) බලයෙන් මැඩලා මුදලී ද තොපගේ පුරාණ ව්‍රත සමාදනය ද ශීලය ද නිදපිබිදියක්හු මෙන් සිහි කෙරෙමි.

1060. කප්පො ච තෙ බද්ධචරො අහොසිං
සම්බුද්ධිමන්තං වතිනං අමඤ්ඤුං[1],
තං තෙ පුරාණං වතසීලවත්තං,
සුත්තප්පබුද්ධොව අනුස්සරාමි.

1061. අද්ධා පජානාසි මමෙතමායුං
අඤ්ඤම්පි ජානාසි තථාහි බුද්ධො,
තථාහි තායං ජලිතානුභාවො
ඔභාසයං තිට්ඨති බ්‍රහ්මලොකන්ති.

10. බකබ්‍රහ්මජාතකං.

කුක්කුවග්ගො පඨමො.

තස්සුද්දානං:

වරකණ්ණික චාපවරො සුතනො
අථගිජ්ඣ සරොහිත මච්ඡවරො,
පුන පණ්ණකසෙනකයාචනකො
අථවෙරී සබ්‍රහ්ම බකෙන දස.

1. සම්බුද්ධවන්තං වතිදං අමඤ්ඤා – මජසං. ස්‍යා.

1060. ('කෙසව' තාපස කාලයෙහි) තොපට 'කප්‍ප' නම් අතැවැසි වීමි. යම්බඳු වූ තොප බුද්ධිසම්පන්න යැ යි ද ව්‍රත සම්පන්න යැ යි ද සිතීමි. තොපගේ ඒ වත සමාදනය ද සීලය ද නිදපිබිදියක්හු මෙන් සිහි කෙරෙමි.

1061. (තෙපි) එකාන්තයෙන් මාගේ තෙල ආයුෂ දන්නහු ය. සෙසු සියල්ලත් දන්නහු ය. එහෙයින් තෙපි බුද්ධ වවු. එහෙයින් මැ තොපගේ මේ දිලිසෙන අනුභාවය බඹලොව එළිකරමින් පවතී.

10. බකබ්‍රහ්ම ජාතක යි.

පළමුවනා කුක්කු වර්ග යි

තස්සුද්දනය:

කුක්කු ජාතක (වරකණ්ණික) යැ මනොජජාතක (චාප) යැ සුතනු ජාතක යැ ගිජ්ඣජාතක යැ දබ්භපුප්ඵ ජාතක (රොහිතමච්ඡ) යැ දසණ්ණකජාතක යැ සත්තුභස්තජාතක යැ අට්ඨිසෙන ජාතක යැ කපිජාතක යැ බකබ්‍රහ්ම ජාතක යැ යි දසයෙකි.

1062. හිත්වා ගාමසහස්සානි පරිපුණ්ණානි සොළස,
කොට්ඨාගාරානි ඵීතානි සන්නිධිංදානි කුබ්බසි.

1063. හිත්වා ගන්ධාරවිසයං පහූතධනධානියං,
පසාසනිතො[1] නික්ඛන්තො ඉධදානි පසාසසි.

1064. ධම්මං භණාමි වෙදෙහ අධම්මො මෙ න රුච්චති,
ධම්මං මෙ භණමානස්ස න පාපමුපලිප්පති[2].

1065. යෙන කෙනචි වණ්ණෙන පරො ලභති රුප්පනං,
මහත්ථියම්පි චෙ වාචං න තං භාසෙය්‍ය පණ්ඩිතො.

1066. කාමං රුප්පතු වා මා වා භුසං වා විකිරීයතු,
ධම්මං මෙ භණමානස්ස න පාපමුපලිප්පති.

1067. නො චෙ අස්ස සකා බුද්ධි විනයො වා සුසික්ඛිතො,
වනෙ අන්ධමහිසොව[3] චරෙය්‍ය බහුකො ජනො.

1068. යස්මා ච පනිධෙකච්චෙ ආචාරම්හි[4] සුසික්ඛිතා,
තස්මා විනීතවිනයා චරන්ති සුසමාහිතා'ති.

1. ගන්ධාරජාතකං.

1069. අත්තානං සඞ්කමං කත්වා යො සොත්ථිං සමතාරයි,
කිං ත්වං තෙසං කිමො[5] තුය්හං හොන්ති එතෙ[6] මහාකපි.

1070. රාජාහං ඉස්සරො තෙසං යූථස්ස පරිහාරකො,
තෙසං සොකපරෙතානං භීතානං තෙ අරින්දම.

1071. උල්ලඞ්ඝයිත්වා[7] අත්තානං විස්සට්ඨ[8]ධනුනො සතං,
තතො අපරපාදෙසු දළ්හං බද්ධං ලතාගුණං.

1072. ඡින්නබ්භමිව වාතෙන නුන්නො රුක්ඛං උපාගමිං,
සොහං අප්පභවං තස්ස සාඛං හත්ථෙහි අග්ගහිං.

---

1. පසාසනතො – පසාසනාතො - වි. මජසං.
2. පාපමුපලිම්පති – මජසං, ස්‍යා.
3. වනෙ අන්ධමහිංසොව – මජසං. ස්‍යා.
4. ආරෙම්හි – මජසං. ස්‍යා.
5. කිමෙ – මජසං.
6. හොන්තෙ – මජසං.
7. සලංඝයිත්වා – සුලඞ්ඝයිත්වා . මජසං.
8. විසට්ඨ – මජසං.

1062. (උපභොග පරිභොග වස්තූන්ගෙන්) පිරුණු සොළොස් දහසක් ගම් ද (රත්රුවනින් පිරුණු) කොටුගුළු ද හැරපියා දැන් සන්නිධි (රැස් කිරීම) කරන්නෙහි.

1463. බොහෝ ධනධාන්‍ය ඇති ගන්ධාර රට හැරපියා (රටවැසියන්ට කරන) අනුශාසනයෙන් ඉවත්වූයෙහි. දැන් (මේ වනයෙහි) අනුශාසනා කරන්නෙහි.

1064. වෛදෙහය, ධර්මය කියමි. මට අධර්මය නො රුස්නේ ය. ධර්මය කියන්නා වූ මට පාප (සිතුවිලි) නො ඇලේ.

1065. යම් කිසි කරුණෙකින් අන්‍යයා ගැටීම ලබා ද (හෙවත් ක්‍රොධය උපදවා ගනී ද) මහත් අනර්ථ ඇති වූ ද ඒ තෙපුල ප්‍රාඥ තෙම නො කියන්නේ ය.

1066. එකාන්තයෙන් ගැටීම වේවයි නො වේවයි. දහවියා මිටක් සේ විසිරේවයි ධර්මය කියන මට පාප (සිතුවිලි) නො ඇලේ.

1067. ඉදින් තමාට නුවණ නැති නම්, මොනොවට හික්මෙන ලද ආචාරවිනය හෝ නො වී නම් බොහෝ වූ එබඳු ජනයා ඇස් නැති වල්මීවකු මෙන් වනයෙහි ඇවිදින්නේ ය.

1068. යම් හෙයෙකින් මෙලොව ඇතැම් කෙනෙක් ආචාරීන් කෙරෙහි මොනොවට හික්මුණාහු එහෙයින් හික්මුණු ආචාරවිනය ඇත්තාහු සමාහිත සිත් ඇති වැ හැසිරෙත්.

1. ගන්ධාර ජාතක යි.

1069. එම්බා මහාවානරය, (යම්) තෙපි තමා සංක්‍රමණයක් (හෙයක්) කොට (මේ වඳුරන්) සුවසේ තරණය කළවු යැ, තෙපි ඒ වඳුරනට කවුරු වවූ ද තුලුහු තොපට කවුරු වෙත් ද? යි.

1070. අරින්දම රජතුමනි, මම (අසූදහසක් පමණවූ) ඔවුනට රජ වෙමි. තොප කෙරෙන් බියට පත් සොවින් මඩනා ලද ඔවුන්ගේ සමූහය පරිහරණය කරමි.

1071. ඒ මම අනාරොපිත දුනුසියක් පමණ තැන් සිරුරු ලම්බන කොට (පැනැ) එතැනින් කටිභාගයෙහි දැඩි කොට බඳනා ලද වැල්බානක් ඇති වැ,

1072. වාතවෙගයෙන් සිඳී ගිය වලාකඩක් සේ පිනුයෙම් ගසට ළං වීමි. ඒ මම රුක්මතට පනනට නො හැකිවූයෙම් එරුකැ අත්තක් අතින් ගතිමි.

1073. තං මං වියායතං සන්තං සාඛාය ච ලතාය ච,
සමනුක්කමන්තා පාදෙහි සොත්ථිං සාඛාමිගා[1] ගතා.

1074. තං මං න තපතෙ බන්ධො වධො මෙ න තපෙස්සති,
සුඛමාහරිතං තෙසං යෙසං රජ්ජමකාරයිං.

1075. එසා තෙ උපමා රාජ අත්ථසන්දස්සනී කතා,
රඤ්ඤා රට්ඨස්ස යොග්ගස්ස බලස්ස නිගමස්ස ච.
සබ්බෙසං[2] සුඛමෙත්ථබ්බං ඛත්තියෙන පජානතා'ති.

2. මහාකපිජාතකං.

1076. අම්බාහමද්දං[3] වනමන්තරස්මිං
නීලොභාසං ඵලිනං සංවිරූළ්හං,
සමද්දසං ඵලහෙතු විභග්ගං
තං දිස්වා භික්ඛාචරියං චරාමි.

1077. සෙලං සුමට්ඨං නරවීර[4] නිට්ඨිතං
නාරී යුගන්ධාරයි අප්පසද්දං,
දුතියඤ්ච ආගම්ම අහොසි සද්දො
තං දිස්වා භික්ඛාචරියං චරාමි.

1078. දිජා[5] දිජං කුණපමාහරන්තං
එකං සමානං බහුකා සමෙච්ච,
ආහාරහෙතු පරිපාතයිංසු
තං දිස්වා භික්ඛාචරියං චරාමි.

1079. උසභාහමද්දං යූථස්ස මජ්ඣෙ
චලක්කකුං වණ්ණබලූපපන්නං,
තමද්දසං කාමහෙතු විතුන්නං
තං දිස්වා භික්ඛාචරියං චරාමි.

1080. කරණ්ඩු[6] නාම කලිඞ්ගානං ගන්ධාරානඤ්ච නග්ගජි,
නිමිරාජා විදෙහානං පඤ්චාලානඤ්ච දුම්මුඛො.
එතෙ රට්ඨානි හිත්වාන පබ්බජිංසු අකිඤ්චනා.

---

1. සාඛමිගා – මජසං. සයා.
2. මතො – මජසං. සබ්බෙසං සුඛ මෙට්ඨබ්බං – මජසං. සයා.
3. අම්බාහවනමන්තරස්මිං – මජසං.
4. නරවිද්දුනිට්ඨිතං – මජසං.
5. දිජාදිජා – මජසං. දිජාදිජානං
6. කරණ්ඩකොකලිඞ්ගානං – මජසං.

1073. වෘක්ෂශාඛායෙන් ද වෙත්‍රලතායෙන් ද, අදනාලද ඒ මා පයින් ඇක්මෙමින් සාමුවෝ (වඳුරෝ) සුවසේ ගියහ.

1074. ඒ මා පළමු වල්ලිබන්ධ තෙම නො තවයි. දැන් මටවන් (තොප කෙරෙන් පැමිණි) වධය මා නො තවන්නේ යැ. කවර හෙයින යත්: මම යම් කෙනකුන්ට රජ කෙළෙම් ද මා විසින් ඔවුනට සුව එළවනලද ද එහෙයිනි.

1075. රජතුමනි, තොපට අභිවෘද්ධිය දක්වන මේ උපමාව කරන ලද නුවණ ඇති ක්‍ෂත්‍රිය රජහු විසින් රාජ්‍යයට ද රට්ඨයෙහි යොදන අශ්වාදි සතුන්ට ද සෙනාවට ද ගම්නියම්ගම් වැසියන්ට ද යන හැමට සුව සෙවිය යුත්තේ ය.

2. මහාකපි ජාතක යි.

1076. වන අතුරෙහි මැනැවින් වැඩුණු නිල්පැහැ ඇති පල ගත් අඹරුකක් දිටිමි. එ රුක පල හෙතුවින් බිඳුනාලද ද දිටිමි. එය දැක (කලකිරී සංස්කාරයන්ගේ අනිත්‍යභාවය මෙනෙහි කොට පසේබුදු වැ) පිඩු සිඟා හැසිරෙමි.

1077. නුවණැති ශිල්පියකු විසින් නිමවනලද මට වූ ශබ්ද රහිත මිණිවළලු දෙකක් ස්ත්‍රියක් (දැතෙහි) දරුවා ය. (දැතේ දමා තුබූ වළලු දෙක එක අතක දමා ලූ කලැ) පළමු වළල්ල දෙවැන්නට පැමිණ හඬ නැඟී. එය දැකැ (බොහෝ දෙනා හා එක්ව විසීම කලහ සිදුවන්නට හෙතුය යි කලකිරී තිලකුණු වඩා පසේබුදු වැ) පිඩුසිඟා හැසිරෙමි.

1078. බොහෝ පක්ෂීහු රැස් වැ කුණපය ගෙන එන එකලා වූ පක්ෂියා ආහාර හෙතුවෙන් කොටමින් ලුහුබැඳ හෙළූහ. එය දැකැ (කලකිරී තිලකුණු වඩා පසේබුදු වැ) පිඩුසිඟා හැසිරෙමි.

1079. මම ගෙරි සමූහයා මැද සැලෙන මොල්ලිය ඇති පැහැයෙන් හා බලයෙන් යුතු වෘෂභයකු දුටිමි. ඔහු කාමය නිසා (අන්) ගොනකු විසින් අනිනු ලැබැ මළහු දිටිමි. එය දැකැ (කලකිරී සංස්කාරයන්ගේ අනිත්‍යතාව මෙනෙහි කොට පසේ බුදු වැ) පිඩුසිඟා හැසිරෙමි.

1080. කලිඟුදනවු වැසියන්ගේ කරණ්ඩුක නම් රජ යැ ගන්ධාර ජනපද වාසීන්ගේ නග්ගජි නම් රජ යැ විදෙහ ජනපද වාසීන්ගේ නිමි නම් රජ යැ පංචාල ජනපද වාසීන්ගේ දුර්මුඛ නම් රජ යැ යන රජවරු රාජ්‍යයන් හැරපියා පළිබොධ රහිත වැ පැවිදි වූහ.

1081. සබ්බෙව මෙ දෙවසමා සමාගතා
අග්ගී යථා පජ්ජලිතො තථෙවිමෙ,
අහම්පි එකොව චරිස්සාමි භග්ගවි
හිත්වාන කාමානි යථොධිකානි.

1082. අයමෙව කාලො නහි අඤ්ඤො අත්ථි
අනුසාසිතා මෙ න භවෙය්‍ය පච්ඡා,
අහම්පි එකාව චරිස්සාමි භග්ගව
සකුණීව මුත්තා පුරිසස්ස හත්ථා.

1083. ආමං පක්කඤ්ච ජානන්ති අථො ලොණං අලොණිකං,
තමහං දිස්වා පබ්බජිං චරෙව ත්වං චරාමහන්ති.

3. කුම්භකාරජාතකං.

1084. අහඤ්ච දළ්හධම්මාය[1] වහන්ති නාභිරාධයිං,
නුදන්ති උරසි සල්ලං යුද්ධෙ වික්කන්තචාරිනී.

1085. නභ නූන රාජා ජානාති[2] මම වික්කමපොරිසං,
සඞ්ගාමෙ සුකතං තානි දූතවිප්පහිතානි ච.

1086. සානූනාහං මරිස්සාමි අබන්ධු අපරාධිනී,[3]
තදහි කුම්භකාරස්ස දින්නා ඡකණහාරිකා.

1087. යාවතාසිංසති[4] පොසො තාවදෙව පවීණති,
අත්ථාපායෙ ජහන්ති නං ඔට්ඨිව්‍යාධිංව ඛත්තියො.

1088. යො පුබ්බෙ කතකල්‍යාණො කතත්ථො නාවබුජ්ඣති,
අත්ථා තස්ස පලුජ්ජන්ති යෙ හොන්ති අභිපත්ථිතා.

1. අහඤ්ච දළ්හධම්මස්ස. – මජසං. සයා.
2. රාජානජානාති – මජසං. සයා.
3. අපරාධිනී - මජසං.
4. යාවතා සීසති – මජසං.

1081. භගගවිය, මෙහැම දෙන මැ විශුද්ධ දෙවයන් (පූර්ව-ප්‍රත්‍යෙකබුද්ධයන්) සමාන විශුද්ධ වූවාහු එක්රැස් වූහ. දිලිසෙන ගිනි යම්සේ බබළා ද එසෙයින් මැ මොහු බබළති. අවධි වශයෙන් සිටි (රූපාදි) වස්තුකාමයන් හැරපියා එකලා ව හැසිරෙමි.

1082. භගගව, මෙ මැ පැවිද්දට කලි. අන්කලෙක් නැති. (අනුශාසකයන් දුර්ලභ හෙයින්) පසුව මට අනුශාසනා කරන්නෙක් නො වන්නෙ යැ. (එහෙයින්) මම ද පුරුෂයක්හු අතින් මිදුණු කිරිල්ලක සේ එකලා වැ හැසිරෙන්නෙමි.

1083. (අපගේ දරුවෝ) නො පැසුණු පැසුණු අහර දනිති. ලුණු ඇති ලුණු නැති අහර ද දනිති. (එයින් දිවිවඩනට හැකි වෙති.) උන්ගේ ඒ ක්‍රියාව දක මම පැවිදි වීමි. තෙපි ද පිඬු සිඟා හැසිරෙව. මම ද පිඬු සිඟා හැසිරෙමි.

3. කුම්භකාර ජාතක යි.

1084. දූත කටයුතු කරන උරෙහි බැඳි හෙල්ල දමා ගසන සටන්හි දස්කම් පා හැසිරෙන මම දළ්හධම්ම රජතුමාගේ සිත සතුටු නො කෙළෙම් නම් කවරෙක් සතුටු කෙරේ ද.

1085. මාගේ වික්‍රමය ද පුරුෂ පරාක්‍රමය ද සඞ්ග්‍රාමයෙහි සුකෘතයෝ ද දූත මෙහෙවර ද එකාන්තයෙන් තොපගේ රජ නො දනී.

1086. නෑයන් නැති පිහිටක් නැති ඒ මම එකාන්තයෙන් මියෙමි. යම් හෙයෙකින් කුඹලාට ගොම වැරටි අදනා කොට රජතුමා විසින් දෙන ලදිම් ද එහෙයිනි.

1087. පුරුෂ තෙම යම්තාක් (මොහුගෙන් අපි ඇතැ යි) ප්‍රාර්තනා කෙරේ ද ඒ තාක් සෙවුනේ යැ. ප්‍රයොජන පහවගිය කල්හි ඔහු ඔට්ඨිව්‍යාධි ඇතින්න හළ රජ මෙන් හැරපියත්.

1088. යමෙක් පෙර (අනුන් විසින්) කළ උපකාර ඇත්තේ කරනලද හිතවැඩ ඇත්තේ පසුව (ඒ උපකාර) නො දනී ද ඔහු විසින් පතන ලද යම් අපි කෙනෙක් ඇද්ද ඒ ඔහු වෙසෙසින් නැසෙත්.

1089. යො පුබ්බෙ කතකල්‍යාණො කතත්ථො මනුබුජ්ඣති,
අත්ථා තස්ස පවඩ්ඪන්ති යෙ හොන්ති අභිපත්ථිතා.

1090. තං වො වදමි භද්දං[1] වො යාවන්තෙත්ථ සමාගතා,
සබ්බෙ කතඤ්ඤුනො හොථ චිරං සග්ගම්හි ඨස්සථාති[2].

4. දළ්හධම්මජාතකං.

1091. යො මං පුරෙ පච්චුඩ්ඩෙති අරඤ්ඤෙ දූරමායති[3],
සො න දිස්සති මාතඞ්ගො සොමදත්තො කුහිං ගතො.

1092. අයං වා සො මතො සෙති අල්ලපිඩකංව ඡිජ්ජතො,
භූම්‍යා නිපතිතො සෙති අමරා වත* කුඤ්ජරො.

1093. අනගාරියුපෙතස්ස විප්පමුත්තස්ස චෙතසො,
සමණස්ස න තං සාධු යං පෙතමනුසොචසි.

1094. සංවාසෙන හවෙ සක්ක මනුස්සස්ස මිගස්ස වා,
හදයෙ ජායතී පෙමං තං න සක්කා අසොචිතුං.

1095. මතං මරිස්සං රොදන්ති යෙ රුදන්ති ලපන්ති ච,
තස්මා ත්වං ඉසි මාරොදි රොදිතං මොඝමාහු සන්තො.

1096. කන්දිතෙන හවෙ බ්‍රහ්මෙ මතො පෙතො සමුට්ඨහෙ,
සබ්බෙ සඞ්ගම්ම රොදම අඤ්ඤමඤ්ඤස්ස ඤාතකෙ.

1197. ආදිත්තං වත මං සන්තං ඝතසිත්තංව පාවකං,
වාරිනා විය ඔසිඤ්චං සබ්බං නිබ්බාපයෙ දරං.

1098. අබ්බහී වත මෙ සල්ලං සොකං හදයනිස්සිතං,
යො මෙ සොකපරෙතස්ස පුත්තසොකං අපානුදි.

1099. සොහං අබ්බූළ්හසල්ලොස්මි වීතසොකො අනාවිලො,
න සොචාමි න රොදාමි තව සුත්වාන වාසවා'ති.

5. සොමදත්තජාතකං.

1. භද්දනෙත – මජසං.
2. වසථාති – මජසං.
3. මායතො – මජසං.
*. අමරාවතාතිමතො වත. අමරීතිපි පාඨො. අට්ඨකථා.

1089. යමෙක් පෙර (අනුන් විසින් තමහට) කරනලද කල්‍යාණකර්ම ඇත්තේ කරන ලද හිතවැඩ ඇත්තේ පසුව දනී ද (සිහි කෙරේ ද) ඔහු විසින් ප්‍රාර්ථිත වූ යම් අර්ථ කෙනෙක් ඇද්ද ඔහු ප්‍රකර්ශයෙන් වඩනාහු වෙත්.

1090. මෙහි යම් පමණ කෙනෙක් රැස් වූද ඒ තාක් තොපට සෙතක් වේවා. එහෙයින් තොපට කියමි. හැමදෙන කළගුණ දන්නෝ වවූ. එයින් බොහෝ කල් දෙව්ලොව සම්පත් විඳිමින් සිටිවූ.

4. දළ්හධම්ම ජාතක යි.

1091. යමෙක් පෙර වනයේ බොහෝ දුර මට පෙරගමන් යේ ද, වැඩීගිය දික්වූ සිරුරු ඇති ඒ සෝමදත්ත නො දක්නා ලැබේ. හේ කොහි ගියේ ද?

1092. සිඳුනාලද මාලුවා ළපලුවක් සේ සෝමදත්ත මළේ හෝනේ වෙයි, මේ හේ ම යැ, බිම වැටී හෝනේ යැ, ඇතා එකාන්තයෙන් මළේ මැ ය.

1093. මළහුට ශොක කිරීම යැ යන යමක් ඇද්ද එය අනාගාරික වූ කාමයෙන් මිදුණු සිත් ඇති ශ්‍රමණයකුට නො මැනැවි.

1094. ශක්‍රය, එක්ව විසීම නිසා එකාන්තයෙන් මිනිසාට ද තිරිසනාට ද සිතෙහි ඇති ප්‍රෙමය උපදී. ඔහුට ශොක නො කොට සිටින්නට නො හැක්ක.

1095. යම් කෙනෙක් මළහුට හඬත් ද මමත් මැරෙන්නෙමී කියමින් වැලැපෙත් ද එය නිෂ්ඵල යයි සත්පුරුෂයෝ කීහු. එහෙයින් ඍෂිය, තෙපි නො හඬනු මැනැවි.

1096. බමුණ, හැඬීම නිසා එකාන්තයෙන් මැරී පරලොව ගිය පුද්ගලයා නැගී සිටී නම් ඔවුනොවුන්ගේ මළ නෑයනට අපි සියලුදෙනමෝ එක්වැගෙන හඬම්හ.

1097. ගිතෙල් ඉසින ලද දැල්වුණු ගින්නක් මෙන් (සොවින් දැවුණු) මා දිය ඉස නිවූ කලෙක මෙන් සියලු ශොක දහය නිවූයෙහි ය.

1098. යමෙක් ශොකයෙන් මඩනා ලද මාගේ පුත්‍රශොකය දුරු කෙළේ ද, (ඒ තෙපි) මාගේ හෘදය ඇසිරි කළ යම් ශල්‍ය- යෙක් වී ද එය එකාන්තයෙන් බැහැර කළහු යැ.

1099. ශොක රහිත නො කැලඹුණු සිත් ඇති ඒ මම උපුටාලූ ශොකශල්‍යය ඇතියෙම් වීමි. ශක්‍රය එහෙයින් තොපගේ බස් අසා ශොක නො කරමි, නො හඬමි.

5. සොමදත්ත ජාතක යි.

1100. කාළානි කෙසානි පුරෙ අහෙසුං
ජාතානි සීසම්හි යථාපදෙසෙ,
තානජ්ජ සෙතානි සුසීම දිස්වා
ධම්මං චර බ්‍රහ්මචරියස්ස කාලො.

1101. මමෙව දෙව පලිතං න තුය්හං
මමෙව සීසං මම උත්තමඞ්ගං,
අත්ථං කරිස්සන්ති මුසා අභාණිං[1]
ඒකාපරාධං ඛම රාජසෙට්ඨ.

1102. දහරො තුවං දස්සනියොසි රාජ
පඨමුග්ගතො හොහි යථා කළීරො,
රජ්ජඤ්ච කාරෙහි මමං ච පස්ස
මා කාලිකං අනුධාවී ජනින්ද.

1103. පස්සාමි වොහං දහරිං කුමාරිං
සාමට්ඨපස්සං සුතනුං සුමජ්ඣං,
කාළාපවාළාව[2] පවෙල්ලමානා
පලොභයන්තීව නරෙසු ගච්ඡති.

1104. තමෙන පස්සාමි පරෙන නාරිං
අසීතිකං නාවුතිකංව ජච්චා,
දණ්ඩං ගහෙත්වාන පවෙධමානං
ගොපාණසීභොග්ගසමං චරන්තිං.

1105. සොහං තමෙවානුවිචින්තයන්තො
ඒකො සයාමි සයනස්ස මජ්ඣෙ,
අහම්පි ඒවං ඉති පෙක්ඛමානො
න ගෙහෙ රමෙ බ්‍රහ්මචරියස්ස කාලො.

1106. රජ්ජුවාලම්බනී චෙසා යා ගෙහෙ වසතො රති,
ඒතම්පි ඡෙත්වාන වජන්ති ධීරා
අනපෙක්ඛිනො කාමසුඛං පහායා'ති.

6. සුසීමජාතකං.

---

1. අභාසිං – මජසං.
2. කාළපවාළාව – මජසං. කාලපල්ලවාව – සයා.

1100. සුසීම, හිසැ කේසයට අනුරූප පෙදෙස්හි හටගත් කෙසයෝ පෙර කළුපැහැයෙන් යුතු වූහ, දුන් සුදු වූ ඒ කෙස් දක දසකුසල්දහම්හි හැසිරෙව, මෛථුන විරති සංඛ්‍යාත බඹසරට ගම් සුදුසු කාලය වෙයි.

1101. දෙවයෙනි, නරකෙස් ඇති‍යේ මගේ හිසෙහි යැ, ඔබගේ හිසෙහි නො වෙයි, මාගේ මැ හිස යැ, මාගේ උතුමඟ යැ, තමහට අර්ථයක් කරන්නෙමි යි සිතා බොරු කීමි. රජතුමනි, එක් අපරාධයකට කමා කළ මැනැවි.

1102. රජතුමනි, තෙපි තරුණවහු, දකුම්කලුවහු, තුරුණු කිළිලක් (ගොබයක්) වැනි ජීවිතයෙහි පළමු වයසෙහි සිටින්නහු යැ. එහෙයින් රාජ්‍යය ද කරනු මැනැවි, මා ද බලනු මැනැවි. (නොහොත් මා අනාථ නො කරනු මැනැවි.) ජනෙන්ද්‍රය, කාලික වූ සුවය අනුව නො දුවනු මැනැවි, නොහොත් මේ ජීවිතයෙහි වින්ද යුතු රජසුව අත් නොහළ මැනැවි.

1103. සිලිටි පහස ද සොඳුරු සිරුර ද යහපත් මැදපෙදෙස ද ඇති කුමරිය මම් දකිමි, කළුවැල් ළපලුවක් මෙන් සැලෙන ඕ කෙලෙස් වසඟ වූවා පුරුෂයන් සමීපයෙහි යයි.

1104. උපතින් අසූ හැවිරිදි වූ හෝ අනූ හැවිරිදි වූ හෝ සැරයටියක් ගෙන වෙවුලමින් ගොනැස්සක් සෙයින් බිඳුණු සිරුරු ඇති ව ඇවිදින ඒ ස්ත්‍රිය පසුකලෙක දකිමි.

1105. ඒ මම් එය මැ නැවත නැවත සිතමින් යහන්මැද එකලා වැ හෝමි. මම ද මෙසේ (ජරාවට පත් වන්නෙමි යි) සිතා බලනුයෙම් ගෘහවාසයෙහි නො ඇලෙමි. (සොඳුර) මෙය බඹසර රක්නට සුදුසු කාලය යි.

1106. ගිහිගෙයි වසනුවහුගේ යම් පස්කම් සුවයෙහි ඇලීමෙක් වේ ද, තෙල එල්බෙන රැහැනක් වැන්න, පස්කම්සුවය ද හැරපියා ප්‍රාඥයෝ අපෙක්‍ෂා රහිත වූවාහු කම්සුව හැරපියා තපස් රක්නට යති යි.

6. සුසීම ජාතක යි.

1107. අහං දසසතං ව්‍යාමං උරගමාදය මාගතො,
තඤ්ච මඤ්ච මහාකායං ධාරයං නප්පවෙධසි.

1108. අථ ඉමං ඛුද්දකං පක්ඛිං අප්පමංසතරං මයා,
ධාරයං ව්‍යාධසෙ භීතො කමත්ථං කොටිසිම්බලි.

1109. මංසභක්ඛො තුවං රාජ ඵලභක්ඛො අයං දිජො,
අයං නිග්‍රොධබීජානි පිලක්ඛදුම්බරානි ච
අස්සත්ථානි ච භක්ඛිත්වා ඛන්ධෙ මෙ ඔදහිස්සති.

1110. තෙ රුක්ඛා සංවිරූහන්ති මම පස්සෙ නිවාතජා,
තෙ පරියොනන්ධිස්සන්ති අරුක්ඛං මං කරිස්සරෙ.

1111. සන්ති අඤ්ඤෙපි රුක්ඛාසෙ මූලිනො ඛන්ධිනො දුමා,
ඉමිනා සකුණජාතෙන බීජමාහරිත්වා හතා.

1112. අජ්ඣාරූළ්හාභිවඩ්ඪන්ති[1] බ්‍රහන්තම්පි වනස්පතිං,[2]
තස්මා රාජ පවෙධාමි සම්පස්සං නාගතං භයං.

1113. සඞ්කෙය්‍ය සඞ්කිතබ්බානි රක්ඛෙය්‍යානාගතං භයං.
අනාගතභයා ධීරො උභො ලොකෙ අවෙක්ඛතීති.

7. කොටිසිම්බලිජාතකං.

1114. රාජා අපුච්ඡි[3] විධුරං ධම්මකාමො යුධිට්ඨිලො,
අපි බ්‍රාහ්මණ ජානාසි කො එකො බහු සොචති.

1115. බ්‍රාහ්මණො අජයූථෙන බහුතෙධො[4] වනෙ වසං,
ධූමං අකාසි වාසෙට්ඨො[5] රත්තින්දිවමතන්දිතො.

1116. තස්ස තං ධූමගන්ධෙන සරභා මකසද්දිතා,[6]
වස්සාවාසං උපගච්ඡුං ධූමකාරිස්ස සන්තිකෙ.

1. අජ්ඣාරූහානි වඩ්ඪන්ති - සයා,
2. වනප්පති - මජසං. - සයා.
3. ආපුච්ඡි - මජසං.
4. බහුතෙජො. බහුතෙනො - සයා.
5. වාසිට්ඨි - මජසං.
6. මකසට්ටිතා - මජසං.

1107. මම බඹ දහසක් පමණ වූ නයකු ගෙන ආයෙමි. විශාල ශරීරයක් ඇති ඒ නයා ද මං ද දරමින් නො සැලෙහි.

1108. කොට්සිඹෙලිය, මට වඩා අත්‍යල්ප මාංශ ඇති මේ කුඩා පක්ෂියා දරා සිටිමින් තෝ කවර කරුණින් බිය වූයෙහි ද? යී.

1109. රජතුමනි, තෙපි මස් කන්නහු ය. මේ පක්ෂි තෙම ගෙඩි කන්නෙකි. මේ තෙමේ නුග පළොල් දිඹුල් ඇසතු යන මේ ගෙඩිවර්ග කා (මාගේ) කඳෙහි මල පහකරන්නේ ය.

1110. මාගේ පාර්ශවයෙහි (අතු අතරෙහි) වාත රහිත තැන්හි වැඩුණු නුග ආදි රුක්හු සරුවට වැඩෙති, ඒ ගස් මා වැළැඳගනී. (පසුව) මා රුක් නැත්තකු කෙරෙත්.

1111. නුග ආදි බිජුවට ගෙන එන මේ සකුණ සමූහයා විසින් නසනලද මුල් සහිත කඳ ඇති වෙනත් ගස්හු ඇතියහ.

1112. රජතුමනි, විශාලගස් යටපත් කරගෙන (ඇසටු ආදි ගස්) වැඩෙති. එහෙයින් අනාගත බිය දක්නෙමි සැලෙමි.

1113. සැක කටයුතු දෙය සැක කරන්නේ ය. නො පැමිණි බියෙන් රැකෙන්නේ ය. (නොහොත් ප්‍රාණාතිපාතාදි පාපක්‍රියාවන් නොකර හැරීම හා පව්වුමිතුරන්ගේ හා වෛරී පුහුලන්ගේ ඇසුරෙන් ඉවත් වන්නේ ය.) නුවණැත්තේ නො පැමිණි බියෙන් දෙලොව රැක ගන්නේ යී.

7. කොට්සිම්බලි ජාතක යි.

1114. සුචරිත ධර්මය ප්‍රිය කරන 'යුධිෂ්ඨිර' රජු විධුර පඬිතුමා අතින් විචාළේ ය. බමුණ, එකලා ව වසන කවරෙක් බොහෝ කොට ශොක කෙරේ ද යි කිම දන්නෙහි ද?

1115. එළු රැළ හා සමග බොහෝ දර ඇති ව වනයෙහි වෙසෙන 'වාසෙට්ඨ' බමුණු දවරයෙහි අනලස් වැ මදුරු උවදුරු නැති කරන්නට ගිනි දල්වා දුම් ඇති කෙළේ ය.

1116. මැසිමදුරුවන්ගෙන් පෙළුණු සරභ මෘගයෝ ඒ දුම් ගඳින් දුම හටගන්වන ඒ බමුණා සමීපයෙහි වැසිකල විසීමට පැමිණියහ.

1117. සරභෙසු මතං කත්වා අජායො නාවබුජ්ඣිථ,
ආගච්ඡන්තිං වජන්තිං වා තස්ස තා විනස්සුං අජා.

1118 සරභා ච සරදෙ කාලෙ පහීනමංසෙ වනෙ,
පාවිසුං ගිරිදුග්ගානි නදීනං පභවානි ච.

1119. සරභෙ ච ගතෙ දිස්වා අජා ච විභවං ගතා,
කිසො ච විවණ්ණො ආසි පණ්ඩුරොගී ච බ්‍රාහ්මණො.

1120. එවං යො සංනිරංකත්වා ආගන්තුං කුරුතෙ පියං,
සො එකො බහු සොචති ධූමකාරීව බ්‍රාහ්මණොති.

8. ධූමකාරිජාතකං.

1121. කොධ ජාගරතං සුත්තො කොධ සුත්තෙසු ජාගරො,
කො මමෙතං[1] විජානාති කො තං පටිභණාති මෙ.

1122. අහං ජාගරතං සුත්තො අහං සුත්තෙසු ජාගරො,
අහමෙතං විජානාමි අහං පටිභණාමි තෙ.

1123. කථං ජාගරතං සුත්තො කථං සුත්තෙසු ජාගරො,
කථං එතං විජානාසි කථං පටිභණාසි මෙ.

1124. යෙ ධම්මං නප්පජානන්ති සංයමොති දමොති ච,
තෙසු සුප්පමානෙසු අහං ජග්ගාමි දෙවතෙ.

1125. යෙසං රාගො ච දොසො ච අවිජ්ජා ච විරාජිතා,
තෙසු ජාගරමානෙසු අහං සුත්තාස්මි දෙවතෙ.

1126. එවං ජාගරතං සුත්තො එවං සුත්තෙසු ජාගරො.
එවමෙතං විජානාමි එවං පටිභණාමි තෙ.

1127. සාධු ජාගරතං සුත්තො සාධු සුත්තෙසු ජාගරො,
සාධු මෙතං විජානාසි සාධු පටිභණාසි මෙති.

9. ජාගරජාතකං.

---

1. කොධමෙතං – මජ්ඣං. කොමෙතංනු – සයා.

1117. සරභ මුවන් කෙරෙහි ස්නෙහය උපදවාගත් ඒ බමුණු වනයෙන් පෙරළා එන්නාවූ හෝ ගොවුදෙන් වනයට යන්නාවූ හෝ එළුවන් නො දනී. එහෙයින් ඕහුගේ ඒ එළුවෝ නැසුණහ.

1118. වනයෙහි මදුරුවන් ප්‍රහීණ ව ගිය සරත් කාලයෙහි සරභමුවෝ ගඞ්ගා හටගන්නා ගිරිදුර්ගවලට පිවිසියහ.

1119. සරභමුවන් වල් වැදුණු බව ද එළුවන් මළ බව ද දැකැ බමුණු කෘශ වූ දුර්වර්ණ වූ පාණ්ඩුරොගියෙක් විය.

1120. යමෙක් මෙලෙස ස්වකීයයන් බැහැර කොට අමුත්තන් ප්‍රිය කෙරේ ද හෙතෙම ධූමකාරී බමුණා මෙන් එකලා ව බොහෝ දුක් ඇතියෙක.

8. ධූමකාරී ජාතක යි.

1121. මෙලොව කවරෙක් නිදිවර්ජිතයන් අතුරෙහි සයනය කෙළේ ද? සයනය කළවුන් අතුරෙහි කවරෙක් නිදිවර්ජිත ද? මාගේ තෙල ප්‍රශ්නය දනී ද? කවරෙක් මේ ප්‍රශ්නය විසඳන්නට සමත් වේ ද?

1122. නිදි වර්ජිතයන් අතුරෙහි මම නිදන්නෙමි, සයනය කරන්නන් අතරෙහි මම නිදි වර්ජනය කරමි. මේ ප්‍රශ්නය මම දනිමි, තොප විසින් පහදන්නට මම පොහොසත්මි.

1123. නිදි වර්ජිතයන් අතුරෙහි කෙසේ නිදගත්තේ ද? නිදන්-නවුන් අතුරෙහි නිදි දුරු කළේ කෙසේ ද? මේ ප්‍රශ්නය කෙසේ දනිහි ද? මා ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දෙන්නට කෙසේ සමත් වෙහි ද?

1124. දේවතාවෙනි, සිල්වත් වීම ඉන්ද්‍රිය දමනය යන ගුණ ධර්මයන් යම් කෙනෙක් නො දනිත් ද, ඔවුහු කෙලෙස නින්දෙන් නිදද්දී මම අප්‍රමාද ගුණයෙහි පිහිටා නො නිද සිටිමි.

1125. දෙවතාවෙනි, යම් රහතුන් වහන්සේ කෙනකුන්ගේ රාගදෙසමොහයෝ නැසුණාහු ද ඒ ආර්යයන් නො නිදන කලැ මම නිදගත්තෙමි.

1126. නිදි දුරුකරන්නවුන් අතුරෙහි මම මෙසේ නිදමි, නිදන්නවුන් අතුරෙහි මම මෙසේ නිදි වර්ජනය කරමි. මෙසේ මේ ප්‍රශ්නය දනිමි. ඔබට මෙසේ ප්‍රකාශ කරන්නට සමත් වෙමි.

1127. මනාලෙස නො නිදන්නවුන් අතුරෙහි සයනය කෙළෙහි, මනාලෙස නිදන්නවුන් අතුරෙහි නො නිදන්නෙහි, මනාසේ ප්‍රශ්නය දත්තෙහි, මා ඇසූ ප්‍රශ්නය මනාලෙස විසඳන්නට සමත් වෙහි යි.

9. ජාගර ජාතක යි.

1128\. න කිරත්ථි අනොමදස්සිසු
පාරිචරියා බුද්ධෙසු අප්පිකා[1],
සුක්ඛාය අලොණිකාය ච
පස්ස ඵලං කුම්මාසපිණ්ඩියා.

1129\. හත්ථිගවාස්සා ච මෙ[2] බහූ
ධනධඤ්ඤං පඨවී ච කෙවලා,
නාරියො චිමා අච්ඡරූපමා
පස්ස ඵලං කුම්මාසපිණ්ඩියා.

1130\. අභික්ඛණං රාජකුඤ්ජර
ගාථා භාසසි කොසලාධිප,
පුච්ඡාමි තං රට්ඨවඩ්ඪන
බාළ්හං පීතිමනො පභාසසි.

1131\. ඉමස්මිං යෙව නගරෙ කුලෙ අඤ්ඤතරෙ අහුං,
පරකම්මකරො ආසිං භතකො සීලසංවුතො.

1132\. කම්මාය නික්ඛමන්තාහං චතුරො සමණෙ අද්දසං,
ආචාරසීලසම්පන්නෙ සීතිභූතෙ අනාසවෙ.

1133\. තෙසු චිත්තං පසාදෙත්වා නිසීදෙත්වා පණ්ණසන්ථතෙ,
අදසිං බුද්ධානං කුම්මාසං පසන්නො සෙහි පාණිභි.

1134\. තස්ස කම්මස්ස කුසලස්ස ඉදං මෙ එදිසං[3] ඵලං,
අනුභොමි ඉදං රජ්ජං ඵීතං ධරණිමුත්තමං.

1135\. දද භුඤ්ජ ච මා ච පමාදෙ[4]
චක්කං වත්තය කොසලාධිප,
මා රාජ අධම්මිකො අහු
ධම්මං පාලය කොසලාධිප.

1136\. සොහං තදෙව පුනප්පුනං
වටුමං ආචරිස්සාමි සොභනෙ,
අරියාචරිතං සුකොසලෙ
අරහන්තා මෙ මනාපා පස්සිතුං.

---

1. අප්පකා – මජසං.
2. චිමෙ – මජසං.
3. ඊදිසං. – මජසං.
4. දදං භුඤ්ජ මා ච පමාදෙ – මජසං.

1128. අලාමක වූ ප්‍රත්‍යෙකබොධිඥන ඇති පසේබුදුවරයන් කෙරෙහි කළ වැඳුම් පිදුම් ආදි පරිචර්යාවන්ගේ ආනිසංසය ස්වල්ප නො වේ. තෙල්, පැණි රහිත කොමුපිඩු දනයෙහි විපාක බල.

1129. ඇත් අස් ගවයෝ ද ධනධාන්‍යයෝ ද සියලු මහ පොළොව ද, දෙවඟනන් වැනි සුන්දර රූපිකාවෝ ද මට බොහෝ වෙති. කොමුපිඩු දනයෙහි විපාක බල.

1130. කුශලාධ්‍යාශය ඇති රාජශ්‍රෙෂ්ඨය, නිරතුරු ගාථා කියන්නෙහි ය රාජ්‍යය දියුණු කරන උතුමාණෙනි, ඔබ විචාරමි. ප්‍රමුදිත ව මෙහි අරුත් කියනු මැන.

1131. මේ නගරයේ ම එක්තරා කුලයෙක උපන්මි. අනුන්ට බැලමෙහෙකම් කොට දිවි රක්නෙමි පිරිසුදු පන්සිල් ඇති වීමි.

1132. කර්මාන්ත සඳහා යන මම ආචාරයෙන් හා ශීලයෙන් සම්පූර්ණ වූ පාප රහිත හෙයින් සිහිල් වූ ආශ්‍රව රහිත වූ ශ්‍රමණයන් වහන්සේ සතර නමක් දිටිමි.

1133. උන්වහන්සේ කෙරෙහි සිත පහදවා කොළ ඇතිරියෙහි වඩාහිඳුවා පහන් සිතැති ව පසේබුදුවරුන්හට සියතින් කොමුපිඩු පිළිගැන්වූයෙමි.

1134. මාගේ පුණ්‍යකර්මයේ විපාකඵලය මෙබඳු ය. හැම සම්පත්තියෙන් ආඪ්‍ය වූ උතුම් පොළොව සහිත රාජසම්පත විඳිමි.

1135. කොසලාධිපය, දන් දී වළඳනු මැනැවි. දනාදි පුණ්‍ය ක්‍රියාහි නොසැලැකිලි නොවන්නේ මැනැවි. චතුශ්චක්‍රක සම්පත් සපුරාලනු මැනැවි. රජතුමනි, අධාර්මිකයකු නොවනු මැනැවි. දහම් රකින්නේ මැනැවි.

1136. ඒ මම බුද්ධාදි ආර්යයන් නැවැත නැවැත පුරුදු කළ මඟෙහි ම හැසිරෙන්නෙමි, රහතුන් වහන්සේ දකින්නට මට රිසි ඇත.

1137. දෙවී වියච්ඡරූපමා
මජ්ඣෙ නාරිගණස්ස සොභසි,
කිං කම්මමකාසි භද්දකං
තෙනාසි වණ්ණවතී සුකොසලෙ.

1138. අම්බට්ඨකුලස්ස ඛත්තිය
දස්සාහං පරපෙස්සියා අහුං,
සඤ්ඤතා ධම්මජීවිනී
සීලවතී ච අපාපදස්සනා.

1139. උද්ධටභත්තං අහං තදා
චරමානස්ස අදාසිං භික්ඛුනො,
විත්තා සුමනා සයං අහං
තස්ස කම්මස්ස ඵලං මමෙදිස'න්ති.

10. කුම්මාසපිණ්ඩජාතකං.

1140. ආගමිස්සති මෙ පාපං ආගමිස්සති මෙ භයං,
තදා හි චලිතා සාඛා මනුස්සෙන මිගෙන වා.

1141. භීරුයා නූන මෙ කාමෙ අවිදූරෙ වසන්තියා,
කරිස්සති කිසං පණ්ඩුං සාව සාඛා පරන්තපං.

1142. සොචයිස්සති මං කන්තා ගාමෙ වසමනින්දිතා,
කරිස්සති කිසං පණ්ඩුං සාව සාඛා පරන්තපං.

1143. තයා මං හසිතාපඞ්ගි[1] මිහිතානි[2] භණිතානි ච,
කිසං පණ්ඩුං කරිස්සන්ති සාව සාඛා පරන්තපං.

1144. ආගමා නූන සො සද්ධෙ අසංසී නූන සො තව,
අක්ඛාතං නූන තං තෙන යොතං සාඛමකම්පයී.

---

1. අසිතා පඞ්ග – මජසං.
2. මිතානි හීතානි – මජසං

1137. දේවිය, (කොසොල්රජුගේ දුවක වූ නෙපි) කතුන් මැද අප්සරාවක මෙන් බබලන්නවූ ය. පෙර කිනම් කුශලකර්මයක් කළා ද? කවර කරුණෙකින් වර්ණවත් වූවා ද?

1138. රජතුමනි, මම කෙළෙඹිකුලයක පණිවුඩ ගෙනයන දසියක් වීමි. තිදෙරින් සංවර වූ දැහැමෙන් ජීවත් වන ආචාරසීල සම්පන්න වූ දැකුම්කලු වීමි.

1139. එකලැ මම තමහට ලැබුණු බත්කොටස ගෙනෙනුයේ පිඬුසිඟා වඩනා බුන් කෙලෙස් ඇති පසේබුදුන් වහන්සේට සතුටු සිත් ඇති ව දුනිමි. (පිදීමි) ඒ කර්මයේ ඵලය මෙබඳු ය.

10. කුම්මාස පිණ්ඩ ජාතක යි.

1140. අනිෂ්ටවූ දෙයක් මට එන්නේ ය. මට බියක් එන්-නේ ය. (යම්හෙයෙකින්) එකල්හි අත්ත මිනිසකු විසින් හෝ මෘගයකු විසින් හෝ සෙලැවිණි.

1141. බියවන ස්වභාව ඇති නුදුරෙහි වසන මගේ බැමිණිය නිසා මට කාමසිතුවිලි උපදී ද, පරන්තප දසයා බිය කළ ඒ අත්ත මෙන් මා කෘශ වූ පඬු පැහැය ඇත්තකු කරන්නේ ය.

1142. මාගේ ප්‍රිය වූ බිරිඳ ගමේ වසන්නී අනිඳිත වූවා උතුම් රූ ඇත්තී මා ශොක කරවා වියළවන්නී ය. පරන්තපයා බිය කළ ඒ අත්ත මෙන් මා කෘශ වූවකු ද පඬුපැහැ ඇත්තකු ද කරන්නේ ය.

1143. කළු ඇස්කෙළවර ඇත්ති ය, තී පවත්වන මන්දස්මිතය ද මධුර කථා ද පරන්තපයා බිය කළ ඒ අත්ත මෙන් මා කෘශ වූවකු ද පඬුපැහැ ඇත්තකු ද කරන්නේ ය.

1144. ඒ ශාඛා ශබ්දය තා කරා ආයේ යයි සිතමි. ඒ ශබ්දය තොපට දැනුම්දෙන ලදැ යි සිතමි, යමෙක් ඒ අත්ත සෙලැවී ද හෝ පියා මැරූ හෙතුව කියන ලදැ යි සිතමි.

1145. ඉදං ඛො ත්වං සමාගම්ම මම බාලස්ස චින්තිතං,
තදහි චලිතා සාඛා මනුස්සෙන මිගෙන වා.

1146. තථෙව ත්වං අවෙදෙසි අවඤ්චි පිතරං මම,
හන්ත්වා සාඛාහි ඡාදෙන්තො ආගමිස්සති මෙ භය'න්ති.

11. පරන්තපජාතකං.

ගන්ධාරවග්ගො දුතියො.

තස්සුද්දානං:

වරගාම මහාකපි භග්ගව ච
දළ්හධම්ම සකුඤ්ජර කෙසවරො,
උරගො විධුරො පුන ජාගරතා
අථ කොසලාධිප පරන්තපෙන ච.

සත්තකනිපාතං නිට්ඨිතං.

තත්‍ර වග්ගුද්දානං:

අථ සත්ත නිපාතම්හි වග්ගං මෙ භණතො සුණ,
කුක්කු ච පුන ගන්ධාරො ද්වෙ ච වුත්තා මහෙසිනා.

1145. බාල වූ මා සිතූ දෙය තා වෙත පැමිණියේ ය. එකලැ සෙලවුණු අත්ත මිනිසකු හෝ මෘගයකු හෝ සෙලවූයේ දැ යි නො පැනිණි.

1146. තෝ මාගේ පියා මැරුයෙහි ය, මරා අතුවලින් වසමින් එබඳු බියක් එන්නේ යයි දැනගත්තෙහි යයි.

11. පරන්තප ජාතක යි.

දෙවන ගන්ධාර වර්ග යි.

එහි උද්දනය:

ගන්ධාරජාතක (වරගාම) යැ මහාකපිජාතක යැ කුම්භකාරජාතක (භගභව) යැ දළහධම්මිජාතක යැ සොමදත්තජාතක (කුඤ්ජර) යැ සුසීමජාතක (කෙස) යැ කොටිසිම්බලිජාතක (උරග) යැ ධූමකාරි ජාතක (විධූර) යැ ජාගරජාතක යැ කුම්මාසපිණ්ඩජාතක යැ පරන්තප ජාතක යැ යි දසයෙකි.

සත්තක නිපාතය නිමි.

එහි වග් උද්දනය:

සත්තකනිපාතයෙහි කුක්කුවර්ග යැ ගන්ධාරවර්ග යැ යී වර්ග දෙකක් මැ මහර්ෂි වූ බුදුරජුන් විසින් වදරන ලදහ.

8. අට්ඨක නිපාතො

1147. ඔදාතවත්ථා සුචි අල්ලකෙසා
කච්චානි කිං කුම්භිමධිස්සයිත්වා,
පිට්ඨා තිලා ධොවසි තණ්ඩුලානි
තිලොදනො හොහිති[1] කිස්ස හෙතු.

1148. න ඛො අයං බ්‍රාහ්මණ භොජනත්ථා
තිලොදනො හොහිති සාධුපක්කො,
ධම්මො මතො තස්ස බහූතමජ්ජ[2]
අහං කරිස්සාමි සුසානමජ්ඣෙ.

1149. අනුවිච්ච කච්චානි කරොහි කිච්චං
ධම්මො මතො කොනු තවෙතසංසි,
සහස්සනෙත්තො අතුලානුභාවො
න මීයති[3] ධම්මවරො කදචි.

1150. දළ්හප්පමාණං[4] මම එත්ථ බ්‍රහ්මෙ
ධම්මො මතො නත්ථි මමෙත්ථ කඞ්ඛා,
යෙ යෙවදානි පාපා භවන්ති
තෙ තෙවදානි සුඛිතා භවන්ති.

1151. සුණිසා හි මය්හං වඤ්ඣා අහොසි
සා මං වධිත්වාන විජායි පුත්තං,
සාදානි සබ්බස්ස කුලස්ස ඉස්සරා
අහං පනම්හි අපවිද්ධා එකිකා.

1152. ජීවාමි වොහං නාහං මතොස්මි[5]
තවෙව අත්ථාය ඉධාගතොස්මි,
යා තං වධිත්වාන විජායි පුත්තං
සහාව පුත්තෙන කරොමි භස්මං.

1153. එතඤ්ච[6] තෙ රුච්චති දෙවරාජ
මමෙව අත්ථාය ඉධාගතොසි,
අහඤ්ච පුත්තො සුණිසා ච නත්තා
සම්මොදමානා ඝරමාවසෙම.

---

1. හෙහිති – මජසං. සයා.
2. බහූතමජ්ජා – බහුතතමජ්ජ – සයා. බහුතතමජ්ඣ – මජසං.
3. මීයයති – මජසං.
4. දළ්හ පමාණං – මජසං.
5. න මතොහමස්මි – මජසං. සයා.
6. එවඤ්ච – මජසං සයා.

8. අට්ඨක නිපාතය

1147. කච්චානිය, හැඳි සුදුවත් ඇත්තී පවිත්‍ර වූ තෙතකෙස් ඇත්තී මිනීඔළුවෙන් කළ උදුනෙහි පිසින තලිය තබා තලපිටි බහා සහල් දෙවන්නේ කුමට ද? තලබත් කුමට ද?

1148. සොඳුරු නුවණැති බමුණ, මේ තලබත අනුභව කිරීම පිණිස නො වේ. ධර්මය (වැඩිහිටියන් සැලැකීම හා ත්‍රිවිධ සුචරිතය) මළේ ය. මම සොහොනමැද සිට ඒ ධර්මයට මතකබත කරන්නෙමි.

1149. කච්චානිය, විමසා බලා කටයුතු කරව. ධර්මය මළේ යයි තොපට තෙල කීයේ කවරෙක් ද? අසම වූ තෙද ඇති දහසක් නෙත් ඇති (ශක්‍රසංඛ්‍යාත) ශ්‍රේෂ්ඨ ධර්මය කිසිකලෙක නො මැරේ යයි කී ය.

1150. බමුණ, මෙහි මාගේ දැඩි ප්‍රමාණය යි (හෙවත් විශ්වාසයයි.) මෙහි ලා මට සැකයෙක් නැත. දැන් යම් යම් කෙනෙක් පාපියෝ වෙත් ද ඔවුහු ම සැප ඇත්තෝ වෙත්.

1151. මාගේ ලෙහෙළි වඳ වූවා ය. ඈය මා තළා පෙළා පුතකු ප්‍රසූත කළා ය. දැන් ඕ තොමෝ ගෙදරට අධිපති වූවා ය. ගෙයින් බැහැර කරන ලද මම තනි ව අනාථ වීමි.

1152. මම දිවි ඇත්තෙමි, මම නො මළෙමි, තී නිසා මෙහි පැමිණියෙමි, යම් ස්ත්‍රියක් තොපට හිංසා කොට පුතකු වැදුවා ද පුතා සමග ඈය අළු කරමි යි කී ය.

1153. ශක්‍රය, මෙය තොපට රුචි වේ. මා නිසා මෙහි පැමිණියෙහි මම ද පුතා ද ලෙහෙළිය ද මුණුබුරා ද සතුටු වෙමින් ගෙහි වසම්හ.

1154. එතඤ්ච තෙ රුච්චති කාතියානි
හතාපි සන්තා න ජහාසි ධම්මං,
තුවඤ්ච පුත්තා සුණිසා ච නත්තා
සම්මෝදමානා සරමාවසෙථ.

1155. සා කාතියානී සුණිසාය සද්ධිං
සම්මෝදමානා සරමාවසිත්වා,
පුත්තා ච නත්තා ච උපට්ඨහිංසු
දෙවානමින්දෙන අධිග්ගහීතා'ති.

1. කච්චානිජාතකං.

1156. ඉදං පුරෙ නින්නමාහු බහුමච්ඡං මහොදිකං[1],
ආවාසො බකරාජස්ස පෙත්තිකං හවනං මම
ත්‍යජ්ජ හෙකෙන[2] යාපෙම ඔකං[3] න විජහාමසෙ.

1157. කො දුතියං අසීලස්ස[4] බන්ධුරස්සක්ඛි[5] හෙජ්ජති,
කො මෙ පුත්තෙ කුලාවකං මඤ්ච සොත්ථිං කරිස්සති.

1158. සබ්බා පරික්ඛතා ඵෙග්ගු යාව තස්සා ගතී අහු,
ඛීණභක්ඛො මහාරාජ සාරෙ න රමතී ඝුණො.

1159. සා නූනාහං ඉතො ගන්ත්වා රඤ්ඤො මුත්තා නිවෙසනා,
අත්තානං රමයිස්සාමි දුමසාඛනිකෙතිනී.

1160. සො නූනාහං ඉතො ගන්ත්වා රඤ්ඤො මුත්තො නිවෙසනා,
අග්ගොදකානි පිවිස්සාමි[6] යූථස්ස පුරතො වජං.

1161. තං මං කාමෙහි සම්පන්නං රත්තං කාමෙසු මුච්ඡිතං'
ආනයී හරතො[7] ලුද්දො බාහිකො හද්දමත්ථු තෙ

1162. අන්ධකාරතිමිසායං තුඞ්ගෙ උපරිපබ්බතෙ,
සා මං සණ්හෙන මුදුනා මා පාදං ඛලියස්මනි.

1163. අසංසයං ජාතිඛයන්තදස්සී
න ගබ්භසෙය්‍යං පුනරාවජිස්සං,
අයං හි මෙ අන්තිමා ගබ්භසෙය්‍යා
ඛීණො මෙ සංසාරො පුනබ්භවායා'ති.

2. අට්ඨසද්දජාතකං.

---

1. මහොදකං – මජසං. සයා.
2. හිඞ්ගෙන – මජසං. සයා.
3. ඔක්කන්තං න ජහාමසෙ – මජසං.
4. අසීලිස්ස – මජසං.
5. කන්ධරස්සක්ඛි භිජ්ජති – මජසං.
6. පිස්සාමි – මජසං.
7. වනතො – මජසං.

1154. කච්චානිය, මෙය තොපට රිසි වෙයි, නළනු ලැබූ ද තෙපි පුත්‍රයා කෙරෙහි මෛත්‍රිය නො හළවූ ය, තෙපි ද පුතා ද ලෙහෙළිය ද මුණුබුරා ද ප්‍රමුදිත ව වසවූ.

1155. කච්චාන ගොත්‍ර ඇති ඕ ලෙහෙළිය සමග සතුටින් ගෙහි වුසුවා ය. දෙවේන්ද්‍ර වූ ශක්‍රයාගේ රැක්ම ලද පුතා ද මුණු-බුරා ද ඇයට උවටන් කළහ.

1. කච්චානි ජාතක යි.

1156. කොක්රජුට වාසභවන වූ මාගේ පියා සතු ගෙය වූ මේ මඟුල්පොකුණ පෙර දියසොරොව්වෙන් දිය පිරුණු කලැ බොහෝ මසුන් ඇත්තේ ය යි ද, දිය බොහෝ ඇත්තේ ය යි ද කියති. (එහෙත්) අද අපි එක් මැඩියකුගෙන් දිවි රකුම්හ. කුස-ගින්නෙන් පෙළෙන්නමෝ නමුදු වාසස්ථාන හැර නො යම්හ.

1157. නො හික්මුණු බන්ධුර නමැති ඇත්ගොව්වාගේ දෙවැනි ඇස කවරෙක් බිඳී ද, මාගේ පුතුන් ද කූඩුව ද මා ද කවරෙක් රැක දෙන්නේ ද?

1158. යම් පමණ එළය තුබුණේ ද එළය සියල්ල ම කන ලද, මහරජතුමනි, කන්නට තුබූ දෙය ක්‍ෂය වූ කලැ ගුල්ලා අරටුයෙහි නො ඇලේ.

1159. ඒ මම මේ රජනිවෙසින් මිදී ගොස් රුක්අතු නිවාස කොටගෙන තමා කවද සිත් අලවා වෙසෙම් ද.

1160. ඒ මම මේ රජනිවෙසින් මිදී ගොස් මෘගසමූහයාගේ පෙරමුණෙහි යනුයෙම් ඉඳුල් නො කළ දිය බොන්නට කවද ලබම් ද.

1161. බාහික රටවැසි භරත නමැති වැද්ද පඤ්චකාමසම්පත්ති-යෙන් පිරුණු රාගයෙන් රත් වූ කාමයෙන් මුසපත් වූ ඒ මා මෙහි ගෙනාවේ ය. තොපට සෙතක් වේවා.

1162. ඝනාන්ධකාරයෙහි උස්වූ පර්වත මුදුනෙහි (සිටි) මාගේ බිරිඳ වූ කිඳුරිය ගලෙහි පය නො පැකිලේවා යි මොළොක් බසින් කීවා ය.

1163. නිවන්දුටු මම එකාන්තයෙන් ම මවුකුස වාසයට නැවත නො එන්නෙමි. මෙය මාගේ අවසාන ප්‍රතිසන්ධිය වේ. නැවත ඉපැදීම නම් වූ සසර ගමන ගෙවීගියේ යි.

2. අට්ඨසද්ද ජාතක යි.

1164. ඉදං සුවණ්ණකායූරං මුත්තා වෙළුරියා බහූ,
සබ්බං හරස්සු භද්දන්තෙ මඤ්ච දසිති සාවය.

1165. ඔරොපයස්සු කල්‍යාණි මා[1] බහුං පරිදෙවසි,
න චාහං අභිජානාමි අහන්ත්වා[2] ධනමාහතං.

1166. යතො සරාමි අත්තානං යතො පත්තොස්මි විඤ්ඤුතං,
න චාහං[3] අභිජානාමි අඤ්ඤං පියතරං තයා.

1167. එහි තං උපගූහිස්සං[4] කරිස්සඤ්ච පදක්ඛිණං,
න හි දානි පුනා අත්ථි මම තුය්හඤ්ච සඞ්ගමො.

1168. න හි සබ්බෙසු ඨානෙසු පුරිසො හොති පණ්ඩිතො,
ඉත්ථීපි පණ්ඩිතා හොති තත්ථ තත්ථ විචක්ඛණා.

1169. න හි සබ්බෙසු ඨානෙසු පුරිසො හොති පණ්ඩිතො,
ඉත්ථීපි පණ්ඩිතා හොති ලහුමත්ථවිචින්තිකා.

1170. ලහුඤ්ච වත ඛිප්පඤ්ච නිකට්ඨෙ සමචෙතයි,
මිගං පුණ්ණායතෙනෙව සුලසා සත්තුකං වධි.

1171. යොධ උප්පතිතං අත්ථං න ඛිප්පමනුබුජ්ඣති,
සො හඤ්ඤති මන්දමති චොරොව ගිරිගබ්භරෙ.

1172. යො ච උප්පතිතං අත්ථං ඛිප්පමෙව නිබොධති,
මුච්චතෙ[5] සත්තු සම්බාධා සුලසා සත්තුකාමිවාති.

3. සුලසාජාතකං.

1173. භූස හි[6] කුද්ධොති අවෙක්ඛියාන
න තාවදණ්ඩං පණයෙය්‍ය ඉස්සරො,
අට්ඨානසො අප්පතිරූපමත්තනො[7]
පරස්ස දුක්ඛානි භූසං උදීරයෙ.

---

1. බාළ්හං – මජසං.
2. අහනත්වා – මජසං.
3. නෙවාහං – මජසං.
4. උපගුය්හිස්සං – මජසං.
5. මුඤ්චතෙ – මජසං.
6. භුසම්පි – මජසං.
7. අප්පටි – මජසං සයා.

1164. පින්වත, ගෙලපළඳනා මේ ආභරණය ද මුතු රුස ද වෛදූර්යමාණික්‍යය ද යන සියල්ල ගනු මැනැව්. මා දසියකැ යි අස්වව හෙවත් කියව.

1165. සොඳුර, තිගේ පළඳනා ගළවා තබව, බොහෝ නො හඬව. (මෙරමා) නො නසා ගෙනා ධනය මම නො දනිමි. හෙවත් නො ගනිමි.

1166. යම් කලෙක සිට තමා සිහි කෙරෙම් ද, යම් කලෙක සිට (හොඳ නරක තේරුම් ගන්නා) නැණැති බවට පැමිණියෙම් ද (ඒතාක්) තට වඩා ප්‍රියතමයකු මම නො දනිමි.

1167. එනුමැන, තොප වැළැඳගන්නෙමි, පැදකුණු කරන්-නෙමි, මාගේ ද තොපගේ ද නැවැත එක්වීමෙක් නැත.

1168. හැම තැන්හි පුරුෂයා පණ්ඩිත නො මැ වෙයි. විචක්‍ෂණ වූ ස්ත්‍රිය ද ඒ ඒ තැන්හි පණ්ඩිත වේ.

1169. හැම තැන්හි පුරුෂයා පණ්ඩිත නො මැ වේ. වහා කරුණු සිතා වටහාගන්නා ස්ත්‍රිය ද පණ්ඩිත වේ.

1170. එකාන්තයෙන් ලැසි නො වී පමා නො වී ඔහු මරන්-නට උපක්‍රම සිතී ය, දක්‍ෂ මුවවැද්දෙක් දුන්නෙන් විද මුවකු මරන්නේ යම්සේ ද එසේ සුලසා තොමෝ සත්තුක නමැති සොරා මැරී ය.

1171. මේ ලොකයෙහි යමෙක් තමා වෙත පැමිණි කරුණ වහා තේරුම් නො ගනී ද නුවණ මඳ හේ පර්වත ප්‍රපාතයෙහි සොරා මෙන් විනාශ වේ.

1172. මේ ලොකයෙහි යමෙක් පැමිණි විපත වහා තේරුම් ගනී ද, හෙ සත්තුක නමැති සොරාගෙන් මිදුණු සුලසාව මෙන් සතුරු උවදුරින් මිදේ.

3. සුලසා ජාතක යි.

1173. (මම) අතිශයින් කිපියෙමි වෙමි යි (වරදකරු) බලා රජ තෙම යුහුසුලු ව දඬුවම් නො පමුණුවන්නේ ය. කවර හෙයින යත්: කිසිත් හෙතු රහිත ව රජකමට නුසුදුසු අනුන්ට බලවත් දුකට හෙතු වන දඬුවම් කියන්නේ ය. හෙවත් නියම කරන්නේ ය.

1174. යතොව ජානෙය්‍ය පසාදමත්තනො
අත්ථං නියුඤ්ජෙය්‍ය පරස්ස දුක්කතං,[1]
තදයමත්ථොති සයං අවෙක්ඛිය
අත්ථස්ස දණ්ඩං සදිසං නිවෙසයෙ.

1175. න චාපි ඣාපෙති පරං න අත්තනං[2]
අමුච්ඡිතො යො නයතෙ නයානයං,
යො දණ්ඩධාරො භවතීධ ඉස්සරො
සවණ්ණගුත්තො සිරියා න ධංසති.

1176. යෙ ඛත්තියා සෙ[3] අනිසම්මකාරිනො
පණෙන්ති දණ්ඩං සහසා පමුච්ඡිතා[4],
අවණ්ණසංයුත්තා[5] ජහන්ති ජීවිතං
ඉතො විමුත්තාපි ච යන්ති දුග්ගතිං.

1177. ධම්මෙ ච යෙ අරියපවෙදිතෙ[6] රතා
අනුත්තරා තෙ වචසා මනසා කම්මනා ච[7],
තෙ සන්තිසොරච්චසමාධිසණ්ඨිතා
වජන්ති ලොකං දුභයං තථාවිධා.

1178. රාජාහමස්මි නරපමදන[8]මිස්සරො
සචෙපි කුජ්ඣාමි ඨපෙමි අත්තනං[9],
නිසෙධයන්තො ජනතං තථාවිධං
පණෙමි දණ්ඩං අනුකම්ප යොනිසො.

1179. සිරී ච ලක්ඛී ච[10] තවෙව ඛත්තිය
ජනාධිප මා විජහි කුදචනං,
අක්කොධනො නිච්චපසන්නචිත්තො
අනීඝො[11] තුවං වස්සසතානි පාලය.

1180. ගුණෙහි එතෙහි උපෙත ඛත්තිය
ඨිතමරියවත්ති සුවචො අකොධනො,
සුඛී අනුප්පීළ[12] පසාස මෙදිනිං
ඉතො විමුත්තාපි ච යාහි සුග්ගතිං.

---

1. දුක්කටං – මජසං. සයා.
2. පරම්පි අත්තානං – මජසං.
3. ඛත්තියා – මජසං.
4. මුච්ඡිතා – මජසං.
5. අවණ්ණයුත්තා ච – මජසං,
6. අරියප්පවෙදිතෙ – මජසං. සයා.
7. කම්මුනා – මජසං. සයා.
8. පමුදාණං – මජසං. සයා.
9, අත්තානං – මජසං.
10. සිරිඤ්ච ලක්ඛිඤ්ච – මජසං.
11. අනීඝො – මජසං.
12. අනුප්පීළං සහ – සයා මජසං.

1174. යම් කලෙකැ තමා කෙරෙහි පැහැදීම ඇතැ යි දන්-නේ ද, අන්‍යයාගේ වරදට හෙතු සොයන්නේ ද මෙය ඔහුගේ වරද ය යි (සිතා) බලා ඉක්බිති ඔහුට යොග්‍ය දඬුවම නියම කරන්නේ ය.

1175. සතර අගතියෙන් අගතිගාමී නො වී යමෙක් යුක්තිය හෝ අයුක්තිය පිරික්සා ද හෙතෙම අන්‍යයා ද තමා ද නො පෙළයි. යම් රජෙක් වරදට සුදුසු දඬුවම් දෙවන්නේ වේ ද ඒ රජ තෙම ගුණයෙන් හා පිරිවරින් නො පිරිහෙයි.

1176. යම් රජෙක් නො විමසා ක්‍රියා කරන්නේ ද (කොපයෙන්) මුසපත් ව වහා දඬුවම් නියම කෙරේ ද හේ කීර්ති රහිතයෙක් ව ජීවිතය හරනේ ය. (මැරෙන්නේ ය) මෙයින් මැරී දුගතියට ද යෙයි.

1177. යම් රජ කෙනෙක් ආර්ය වූ දැහැමිරජුන් විසින් ප්‍රකාශිත දශරාජධර්මයෙහි ඇලුණෝ ද, ඔවුහු වචනයෙන් සිතින් හා ක්‍රියායෙන් උත්තමයහ. ශාන්තියෙහි සීලයෙහි හා සමාධියෙහි පිහිටි දැහැමි රජවරු දෙලොවට ම (දෙව්මිනිස් ලොකදෙක) පැමිණෙත්.

1178. මම ස්ත්‍රීපුරුෂයන්ගේ ස්වාමි වූ රජ වෙමි, ඉදින් කිපියේ වුව ද තමා නීතියෙහි පිහිටුවමි, (නීතියෙහි පිහිටා කටයුතු කරමි.) ජනයා නොමග යාමෙන් වළකා අනුකම්පා සහිත ව නුවණින් දඬුවම් දෙමි.

1179. ජනපතිතුමනි, පරිවාර සම්පත හා ප්‍රඥාව කිසිකලෙක ඔබ අත් නො හරීවා, කොප නැති ව පහන් සිතැති ව නිදුක් ව හවුරුදු සියයක් රට පාලනය කෙරේවා.

1180. රජතුමනි, මේ ගුණයන්ගෙන් යුක්ත ව ශ්‍රෙෂ්ඨ පැවැතුම් සහිත ව සුවච ව නො කිපෙන්නෙක් ව සැපවත් ව ජනයා නො පෙළා රට පාලනය කරනු මැනැවි. මෙයින් මිදී සුගතියට සැපත් වනු මැනැවි.

1181. එවං සුනීතෙන සුභාසිතෙන
ධම්මෙන ඤායෙන උපායසො නයං,
නිබ්බාපයෙ සංඛුභිතං මහාජනං
මහාව මෙඝො සලිලෙන මෙදිනින්ති.

4. සුමඞ්ගලජාතකං.

1182. අඞ්ගාරජාතා පඨවී කුක්කුලානුගතා මහී,
අථ ගායසි වත්තානි න තං තපති ආතපො.

1183. උද්ධං තපති ආදිච්චො අධො තපති වාලුකා[1],
අථ ගායසි වත්තානි න තං තපති ආතපො.

1184. න මං තපති ආතපො ආතප්පා[2] තපයන්ති මං,
අඤ්ඤා හි විවිධා රාජ තෙ තපන්ති න ආතපො.

1185. අද්දසං කාම තෙ මූලං සඞ්කප්පා කාම ජායසි,
න තං සඞ්කප්පයිස්සාමි එවං කාම න හොහිසි[3].

1186. අප්පාපි කාමා න අලං බහූහිපි න තප්පති,
අහහා බාලලපනා[4] පටිවිජ්ඣථ ජග්ගතො.

1187. අප්පස්ස කම්මස්ස ඵලං මම යිදං
උදයො අජ්ඣගමා[5] මහත්තපත්තං,
සුලද්ධලාභා වත මාණවස්ස
යො පබ්බජී කාමරාගං පහාය.

1188. තපසා පජහන්ති පාපකම්මං
තපසා නහාපිතකුම්භකාරභාවං,
තපසා අභිභුය්‍ය ගඞ්ගමාල
නාමෙනාලපසජ්ජ බ්‍රහ්මදත්තං.

---

1. වාළුකා – මජ්ඣං.
2. ආතපා – මජ්ඣං.
3. හෙහිසි – මජ්ඣං. සයා.
4. අහාහාබාලලාපනා – මජ්ඣං. අහොබාලානලපනා – සයා. අසාතාබාලලාපනා – මජ්ඣං.
5. අජ්ඣාගමා – මජ්ඣං.

1181. මෙසේ නීතියෙන් ද සුබැසි කථාවෙන් ද සුචරිත ධර්මයෙන් ද පරිත්‍යාගයෙන් ද නුවණින් ද යුක්ත ව රාජ්‍යානුශාසනා කරනුයේ ජලයෙන් පොළොව නිවන මහවැස්සක් සේ මහාජනයා නිවන්නේ ය. (සනසන්නේ ය.)

4. සුමංගල ජාතක යි.

1182. මහී නම් වූ පොළොව ගිනිඅ රු මෙන් උෂ්ණ වෙයි. උණුඅළු වැනි වැල්ල ඇත. එහෙත් වෘත්තයන් අනුව ගායනා කරන්නෙහි ය. අච්ච තා නො තවන්නේ ය.

1183. උඩින් සූර්යයා තවයි. යටින් වැල්ල තවයි. එහෙත් ගී ගයන්නෙහි ය. අච්ච තා නො තවන්නේ ය.

1184. අච්ච මා නො තවයි. වස්තුකාමක්ලෙශකාමයෝ ම තවති. මහරජතුමනි, වස්තුකාමක්ලෙශකාමයන් නිසා කටයුතු දෙය බොහෝ ය. ඔව්හු මා තවති. අච්ච මා නො තවයි.

1185. කාමය තාගේ මුල දිටිමි. කාම විතර්ක නිසා තෝ උපනෙහි ය. එහෙයින් තා ගැන නො සිතන්නෙමි. මෙසේ කළ කල්හි තා නූපදින්නෙහි ය.

1186. වස්තුකාමක්ලෙශකාමයෝ ස්වල්ප වුව ද සුදුසු නො වේ. වස්තුකාමක්ලෙශකාමයන් බොහෝ ලදුවත් පෘථග්ජනයා සෑහීමට පත් නො වේ. බාලලපන (මගේ රුව මගේ හඬ යනාදීන් කෙරෙන නැළැවීම) නම් කාමයෝ විපතට හෙතුවෙති. විදසුන් වඩනා යොගාවචර තෙමේ (කාමයන්) දුරු කරන්නේ ය.

1187. උදය නමැති මම මහඉසුරක් ලැබූයෙමි ද මෙය මාගේ ස්වල්ප වූ කර්මයක විපාක වෙයි. යමෙක් වස්තුකාම ක්ලෙශකාමයන්ගේ ආශාව හැරපියා පැවිදි වී ද, එය මහාලාභයෙක් විය.

1188. ගංගමාලය, යම් කෙනෙක් තපස නිසා පාපකර්මය යම්සේ දුරු කෙරෙත් ද, එසේ ම (තෙපි) සිය තපසින් නැහැවිකුඹල් බවත් දුරු කෙරෙත් ද? තපොගුණය නිසා තෙපි අප මැඩ අද 'බ්‍රහ්මදත්ත' යැ යි නමින් කථා කෙළෙහි. (එය තොපට වටනේ ද?)

1189. සන්දිට්ඨිකමෙව[1] පස්සථ
ඛන්ති සොරච්චස්ස අයං විපාකො,
යො සබ්බජනස්ස වන්දිතො
තං වන්දාම සරාජිකා සමච්චා.

1190. මා කිඤ්චි අවචුත්ථ[2] ගඞ්ගමාලං
මුනිං[3] මොනපථෙසු සික්ඛමානං,
එසො හි අතරි අණ්ණවං
යං තරිත්වා චරන්ති වීතසොකා'ති.

5. ගඞ්ගමාලජාතකං.

1191. ධම්මො හවෙ හතො හන්ති නාහතො හන්ති කිඤ්චනං,
තස්මා හි ධම්මං න හනෙ මා[4] තං ධම්මො හතො හනි.

1192. අලිකං භාසමානස්ස අපක්කමන්ති දෙවතා,
පූතිකඤ්ච මුඛං වාති සකට්ඨානා ච ධංසති.
යො ජානං පුච්ඡිතො පඤ්හං අඤ්ඤථා නං වියාකරෙ.

1193. සචෙ හි සච්චං භණසි හොහි රාජ යථා පුරෙ,
මුසා චෙ භාසසෙ රාජ භූමියං තිට්ඨ චෙතිය.

1194. අකාලෙ වස්සති තස්ස කාලෙ තස්ස න වස්සති,
යො ජානං පුච්ඡිතො පඤ්හං අඤ්ඤථා නං වියාකරෙ.

1195. සචෙ හි සච්චං භණසි හොහි රාජ යථා පුරෙ,
මුසා චෙ භාසසෙ රාජ භූමිං පවිස චෙතිය.

1196. ජිව්හා තස්ස ද්විධා හොති උරගස්සෙව දිසම්පති,
යො ජානං පුච්ඡිතො පඤ්හං අඤ්ඤථා නං වියාකරෙ.

1197. සචෙ හි සච්චං භණසි හොහි රාජ යථා පුරෙ,
මුසා චෙ භාසසෙ රාජ භිය්‍යො පවිස චෙතිය.

1198. ජිව්හා තස්ස න භවති මච්ඡස්සෙව දිසම්පති,
යො ජානං පුච්ඡිතො පඤ්හං අඤ්ඤථා නං වියාකරෙ.

1. අම්ම පස්සථ – මජසං.
2. වුත්ථ – මජසං.
3. මුනිනං – මජසං. සයා.
4. ත්වං – මජසං.

1189. ඉවැසිමෙත් ශීලයේත් යම් විපාකයෙක් වේ ද, ඒ දිටුදැමිවිපාකය ම බලවු, යමෙක් සියලු දෙනා විසින් වඳනා ලද්දේ වී ද, ඕහු රජුන් සහිත වැ ඇමැතියන් සහිත වැ වඳිමු.

1190. මෞනපථයෙහි (බොධිපාක්ෂිකධර්මයන්හි) හික්මෙන ගංගමාල පසේබුදුරදුනට කිසිවක් නො කියවු. යම් සසර සයුරක් තරණය කොට පහකළ සෝදුක් ඇති ව හැසිරෙත් ද., මෙ තෙම (ඒ) සසර සයුර තරණය කෙළේ ය.

5. ගංගමාල ජාතක යි

1191. (සත්‍ය) ධර්මය බොරු කීමෙන් නසන ලදුයේ එකාන්තයෙන් ජ්‍යෙෂ්ඨාපචායනය (වැඩිහිටියන් පිදීම නම් වූ ගුණය) තෙමේ මැ වැනැසේ. ධර්මය නො නටුයේ කිසිත් නො නසා. එහෙයින් සත්‍යධර්මය නො නසන්නේ මැනැවි. ධර්මය නැසුණේ ඔබ නො නසාවා.

1192. (කාරණයක්) විචාරන ලදුයේ, යමෙක් එය දන්නේ ම අන් ලෙසෙකින් කියා ද, දෙවියෝ (ඔහු) අත්හැර යති. (එසේ) බොරු කියන්නාගේ මුඛය ද දුගඳ හමයි. අහසේ තමා සිටි තැනින් ද ගිලිහේ.

1193. මහරජ, ඉදින් සත්‍යය කියෙහි නම් පෙර පරිදි අනුභාව සම්පන්න වන්නෙහි ය. චෙතිය රාජය, බොරු කියන්නෙහි නම් බිමට බැස සිටුනෙහි.

1194. යමෙක් දන්නා දෑයක් විචාරන ලදුයේ අන් අයුරෙකින් පවසන්නේ ද ඔහුගේ රාජ්‍යයට නොකල්හි වැසි වසී, සුදුසුකල්හි නො වසී.

1195. චෙතිය මහරජ, ඉදින් සත්‍යය බෙණෙන්නේ ද පෙර පරිදි ම අනුභාව සම්පන්න වන්නෙහි ය, බොරු කියන්නේ නම් පොළොවෙහි පිවිසෙන්නෙහි ය.

1196. චෙතිය මහරජ, යමෙක් විචාරන ලදුයේ දන්නා දෑය අන් අයුරෙකින් පවසන්නේ ද, ඕහුගේ දිව සර්පයකුගේ මෙන් දෙදිවි වේ.

1197. රාජය, ඉදින් සත්‍යය බෙණෙන්නේ ද පෙර පරිදි අනුභාව සම්පන්න වන්නෙහි ය. ඉදින් බොරු කියන්නෙහි නම් චෙතිය රජතුමනි, වැඩියක් බිමැ පිවිසෙහි ය.

1198. මහරජ, දන්නා දෙයක් විචාරන ලදුයේ, යමෙක් එය අන් අයුරෙකින් පවසන්නේ ද ඔහුට, මාලුවාට මෙන් දිව නැති වේ.

1199. සචෙ හි සච්චං භණසි හොහි රාජ යථාපුරෙ,
මුසා චෙ භාසසෙ රාජ හියොා පවිස චෙතිය.

1200. ඊයොව[1] තස්ස ජායන්ති න පුමා ජායරෙ කුලෙ,
යො ජානං පුච්ඡිතො පඤ්හං අඤ්ඤථා නං වියාකරෙ.

1201. සචෙ හි සච්චං භණසි හොහි රාජ යථා පුරෙ.
මුසා චෙ භාසසෙ රාජ හියොා පවිස චෙතිය,

1202. පුත්තා තස්ස න භවන්ති පක්කමන්ති දිසොදිසං,
යො ජානං පුච්ඡිතො පඤ්හං අඤ්ඤථා නං වියාකරෙ.

1203. සචෙහි සච්චං භණසි හොහි රාජ යථා පුරෙ,
මුසා චෙ භාසසෙ රාජ හියොා පවිස චෙතිය.

1204. සරාජා ඉසිනා සත්තො[2] අන්තලික්ඛෙ[3] චරො පුරෙ,
පාවෙක්ඛි පඨවිං චෙච්චො[4] හීනත්තො අත්තපරියායං.

1205. තස්මාහි ඡන්දගමනං නප්පසංසන්ති පණ්ඩිතා,
අදුට්ඨචිත්තො භාසෙය්‍ය ගිරං සච්චූපසංහිත'න්ති.

6. චෙතියජාතකං.

1206. යො ඉන්ද්‍රියානං කාමෙන වසං නාරද ගච්ඡති,
සො පරිච්චජ්ජුභො ලොකෙ ජීවන්තොව විසුස්සති.

1207. සුඛස්සානන්තරං දුක්ඛං දුක්ඛස්සානන්තරං සුඛං,
සොසි[5] පත්තො සුඛා දුක්ඛං පාටිකඞ්ඛ වරං සුඛං.

1208. කිච්ඡකාලෙ කිච්ඡසහො යො කිච්ඡං නානුවත්තති.
ස කිච්ඡන්තං සුඛං ධීරො යොගං සමධිගච්ඡති.

1209. නහෙව කාමාන කාමා නානත්ථා නත්ථකාරණා,
න[6] කතඤ්ච නිරඞ්කත්වා ධම්මා චවිතුමරහසි.

---

1. ඊයො තස්ස පජායන්ති – වි. මජසං.
2. පනෙතා – ස්‍යා. පනෙතා – මජසං.
3. අන්තලික්ඛචරො – මජසං.
4. ජචෙචා – මජසං.
5. සොපි පත්තො සුඛ දුක්ඛං – ස්‍යා. සොපි පනෙතා සුඛං දුක්ඛං, සොපි පත්තො සුඛා දුක්ඛ – මජසං.
6. න කතඤ්ච නිරඞ්කත්වා – නාරද.

1199. මහරජ, ඉදින් සත්‍යය බඹන්නෙහි ද පෙර පරිදි අනුභාව සම්පන්න වන්නෙහි ය. බොරු කියන්නෙහි නම් රජතුමනි, වැඩියක් පොළොවැ පිවිසෙන්නෙහි ය.

1200. මහරජ, දන්නා දූයක් විචාරන ලදුයේ යමෙක් එය අන් අයුරෙකින් පවසා ද, ඔහුගේ කුලයේ ගැහැනු උපදිත්. පිරිමි නූපදනාහ.

1201. මහරජ, ඉදින් සත්‍යය බෙණෙහි නම් පෙර පරිදි අනුභාව සම්පන්න වන්නෙහි ය. බොරු කියන්නෙහි නම් චෙතිය රජතුමනි, වැඩියක් පොළොවැ පිවිසෙහි ය.

1202. මහරජ, දන්නා දූයක් විචාරන ලදුයේ, යමෙක් එය අන් අයුරෙකින් පවසන්නේ ද, ඔහුට පුත්‍රයෝ නො වෙත්. වෙත් නම් උපකාර නො කොට දෙසැ දෙසැ යෙත්.

1203. මහරජ, ඉදින් සත්‍යය බෙණෙහි ද පෙර පරිදි අනු-භාවසම්පන්න වන්නෙහි ය. බොරු කියන්නෙහි නම් චෙතිය රජ තුමනි, වැඩියක් පොළොවෙහි පිවිසෙන්නෙහි.

1204. පෙර මේ චෙතිය රජ කපිල මහර්ෂීන් කරණ කොට ගෙන රජ වූයේ ආකාශචාරී ව සිට පිරිහී ගිය ස්වභාවය ඇතියේ කාලානුරූප ව පොළොවැ පිවිසියේ ය.

1205. එහෙයින් ප්‍රාඥයෝ ඡන්දදියෙන් අගතිගාමී වීම නො පසසත්. දූෂිත නොවූ සිතැත්තේ සාධූන් විසින් පසස්නා ලද සත්‍ය වචන ම කියන්නේ ය.

6. චෙතිය ජාතක යි.

1206. නාරදයෙනි, යමෙක් කාමාශායෙන් ඉඳුරන්ගේ වශයට යේ ද, හෙ තෙම, (දෙව්මිනිස්) දෙලොව හැරපියා (නිරයේ උපදී). ජීවත් වන්නේ නමුදු ඉච්ඡාවිඝාතය නිසා ශොකයෙන් වියළේ.

1207. පංචකාම සම්පත්තියට අනතුරු වැ නිරාදුකට ද සිල් රැකීම් ආදී විසින් විඳුනා දුකට අනතුරු වැ සැපතට ද පැමිණේ. හෙ (නාරදර්ෂි) තෙමේ ද සැපත නසා දුකට පැමිණියේ ය. (එබැවින්) ධ්‍යාන සැපත කැමැති වන්නේ මැනැවි.

1208. යමෙක් දුක් පැමිණි කලැ දුක් ඉවසා ද දුක මඩින්-නේ ද, ඒ ප්‍රාඥයා දුක අවසානයෙහි ලැබෙන සැපය වන ධ්‍යාන සැපත මැනැවින් ලබයි.

1209. අභිවෘද්ධියට කරුණු නො වන බැවින් ද අර්තකර නො වන බැවින් ද කාමයනට ආසා නො කටයුතු ය. උපදවන ලද ධ්‍යානය නසා කුසල ධර්මයෙන් ගිලිහෙන්නට සුදුසු නො වේ.

1210. දුක්ඛං ගහපතිං සාධු[1] සංවිභජ්ජඤ්ච[2] හොජනං,
අහාසො අත්ථලාහෙසු අත්ථබ්‍යාපත්ති අබ්‍යථො[3].

1211. එත්තාව තෙසං[4] පණ්ඩිච්චං අසිතො දෙවලො බ්‍රවි,
නයිතො[5] කිඤ්චි පාපියො ඉන්ද්‍රියානං වසං වජෙ.

1212. අමිත්තානංව හත්ථත්තං සිව පප්පොති මාමිව,
කම්මං විජ්ජඤ්ච දක්ඛෙය්‍යං විවාහං සීලමද්දවං.

1213. එතෙ ච යසෙ හාපෙත්වා නිබ්බත්තො[6] සෙහි කම්මෙහි,
සොහං සහස්ස ජීනොව අබන්ධු අපරායණො.
අරියධම්මා අතික්කන්තො[7] යථා පෙතො තථෙවහං.

1214. සුඛකාමෙ දුක්ඛාපෙත්වා ආපන්නොස්මි පදං ඉමං,
සො සුඛං නාධිගච්ඡාමි ඨිතො හානුමතාමිවා[8]ති.

7. ඉන්ද්‍රියජාතකං.

1215. ආදිත්තස්මිං අගාරස්මිං යං නීහරති හාජනං,
තං තස්ස හොති අත්ථාය නො ච යං තත්ථ ඩය්හති.

1216. එවමාදිපිතො ලොකො ජරාය මරණෙන ච,
නීහරෙථෙව දානෙන දින්නං හොති සුනීහතං

1217. යො ධම්මලද්ධස්ස දදාති දානං
උට්ඨානවිරියාධිගතස්ස ජන්තුනො[9],
අතික්කම්ම සො වෙතරණිං යමස්ස
දිබ්බානි ඨානානි උපෙති මච්චො.

1218. දානඤ්ච යුද්ධඤ්ච සමානමාහු
අප්පාපි සන්තා බහුකෙ ජිනන්ති,
අප්පම්පි චෙ සද්දහානො දදාති
තෙනෙව සො හොති සුඛී පරත්ථ.

---

1. දුක්ඛං ගහපති – සාධු – මජසං.
2. සංවිභජඤ්ච – මජසං.
3. අව්‍යථො – මජසං.
4. එත්තාව තෙතං – මජසං.
5. නත්ථි තා–නාසීතො – මජසං.
6. නිප්පත්තො – මජසං.
7. අපක්කන්තො – මජසං.
8. ඨිතො හානුමතා මිව – මජසං.
9. ජන්තු – මජසං.

1210. ගැහැවියකුට (වස්තුව ලබාගැනීමේ දී) ඇති වන වෙහෙස මනාප ය. ධනය බෙදා වැළැඳීම මනාප ය. මහත් ඉසුරු ලැබීමෙහි උඩඟු නො වීම මැනැව. ධන විනාශයේ දී ක්ලාන්ත නො වීම මැනැව.

1211. ඒ දෙවලර්ෂි යමක් කීයේ ද, මේ පාණ්ඩිත්‍යය ද මෙ පමණෙක් ම ය. යමෙක් ඉඳුරන්ගේ වශයට යන්නේ ද, මෙයට වඩා ලාමක බවෙක් නැත.

1212. සිවි රජතුමනි, සතුරන් අතට පත් කෙනකු බඳු මා මෙන් විනාශයට පැමිණේ ද, දිවි රක්නා කර්මාන්ත ද, හස්ත්‍යශ්වාදි ශිල්ප ද, ධන ඉපැයීමේ දක්‍ෂ බව ද, ආවාහ විවාහ සම්බන්ධය ද, පංචශීලය හා මෘදු වචන ඇති බව ද යන,

1213. මෙතෙක් අභිවෘද්ධිය සලසන කරුණු නසා සිය පාප කර්මයෙන් මනුෂ්‍යප්‍රෙත ව උපනිමි. ඒ මම දහසින් පැරදුණකු මෙන් නෑයන් නැතියෙක්මි, පිළිසරණක් නැත්තෙකිමි.

1214. ආර්ය (සත්පුරුෂ) ධර්මයෙන් පහ වූ මම ප්‍රෙතයකු බඳු වෙමි. සුව කැමැත්තන් දුකට පමුණුවා මේ තත්ත්වයට මනුෂ්‍යප්‍රෙත බවට පැමිණියෙමි. ඒ මම ගින්නෙහි සිටියකු මෙන් මහත් දහ ඇතියෙමි කායික වූ ද චෛතසික වූ ද සැපක් නො ලබමි.

7. ඉන්ද්‍රිය ජාතක යි.

1215. ගෙය ගිනිගත් කල්හි යම් කිසි බඩුවක් ගෙයින් බැහැර කෙරේ ද එය ගෙහිමියාට වැඩ පිණිස වේ. එසේ පිටතට නො ගත් යමක් වේ නම් එය එහි දැවීයෙයි.

1216. මෙසේ ලොකයා ජරායෙන් ද මරණයෙන් ද ගිනි ගත්තේ වේ. දන් දීමෙන් ම වස්තුව බැහැර කරන්නේ මැනවි. දුන් දෑය මනා කොට පිටතට ගන්නා ලද්දේ වේ.

1217. යම් සත්ත්ව කෙනෙක් මහන්සියෙන් දැහැමින් ලබා ගත් වස්තුවෙන් දන් දේ ද, හේ යමයාගේ වෛතරණී නදිය ද (අටමහ නිරය ද ඔසුපත් නිරයන් ද) ඉක්මැ දිව්‍යසම්පතට පැමිණේ. (දිවසැපත් ලබා.)

1218. දන් දීම ද යුද්ධ කිරීම ද සමානය යි කියත්. ජීවිතාශා රහිත ව සටන් වන් අය ස්වල්ප වුවත් බොහෝ සතුරන් දිනත්. (කුශලය ස්වල්ප වුව ද බොහෝ අකුශල් දිනිය හැක්කේ වේ). කර්මඵල අදහාගෙන ස්වල්ප වූ ද පරිත්‍යාගයක් කළොත් පරලොව දී එයින් ම හේ සැපවත් වේ.

1219. විචෙය්‍ය දානං සුගතප්පසත්ථං[1]
යෙ දක්ඛිණෙය්‍යා ඉධ ජීවලොකෙ
එතෙසු දින්නානි මහප්ඵලානි
බීජානි වුත්තානි යථා සුඛෙත්තෙ.

1220. යො පාණභූතානි අහෙඨයං චරං
පරූපවාදා න කරොති පාපං,
භීරුං පසංසන්ති න හි තත්ථ සූරං
භයා හි සන්තො න කරොන්ති[2] පාපං.

1221. හීනෙන බ්‍රහ්මචරියෙන ඛත්තියං උපපජ්ජති,
මජ්ඣිමෙන ච දෙවත්තං උත්තමෙන විසුජ්ඣති

1222. අද්ධාහි දානං බහුධා පසත්ථං[3]
දානා ච ඛො ධම්මපදං ව සෙය්‍යො,
පුබ්බෙව හි පුබ්බතරෙ ච සන්තො
නිබ්බානමෙවජ්ඣගමුං සපඤ්ඤා.

8. ආදිත්තජාතකං.

1223. ගඞ්ගා කුමුදිනී සන්තා සඞ්ඛවණ්ණා ච කොකිලා,
ජම්බු තාලඵලං දජ්ජා අථ නූන තදා සියා.

1224. යදා කච්ඡපලොමානං පාවාරො තිවිධො සියා,
හෙමන්තිකං පාපුරණං අථ නූන තදා සියා.

1225. යදා මකසදාඨානං අට්ටාලො සුකතො සියා,
දළ්හා ච අප්පකම්පි ච අථ නූන තදා සියා.

1226. යදා සසවිසාණානං නිස්සෙණි සුකතා සියා,
සග්ගස්සා රොහණත්ථා අථ නූන තදා සියා.

1227. යදා නිස්සෙණිමාරුය්හ චන්දං ඛාදෙය්‍යුං මූසිකා,
රාහුඤ්ච පරිපාතෙය්‍යුං අථ නූන තදා සියා.

---

1. සුගතපසට්ඨං – මජසං.
2. න කරොති – මජසං.
3. පසට්ඨං – මජසං.

1219. දක්ෂිණාර්හයන් සොයා දන් දීම සුගතයන් වහන්සේ විසින් පසස්නා ලදී. මෙ මිනිස් ලොව යම් දක්ෂිණාර්හ කෙනෙක් වෙද් ද, උන් වහන්සේ විෂයයෙහි දුන් දන් මහත් ඵල ගෙන දේ. සරුකෙතෙක වපුළ බිජුවට මෙනි.

1220. යමෙක් සතුන් නොපෙළා හැසිරේ ද, පරූපවාද බියෙන් පව් නො කෙරේ ද (එබඳු) පාපභීරුකයා පඬුවෝ පසසත්. පාප ශූරයා නො පසසත්. සත්පුරුෂයෝ (පවට) බිය නිසා පව් නො කරත්.

1221. හීන බ්‍රහ්මචර්යායෙන් රජ පවුලේ උපදී. මධ්‍යම ලෙසින් පුරන බ්‍රහ්මචර්යායෙන් දෙව් බවට පැමිණේ. උතුම් බ්‍රහ්මචර්යායෙන් (මගබඹසරින්) කෙලෙසුන් කෙරෙන් පිරිසිදු වේ.

1222. ඒකාන්තයෙන් ආමිසදනය බොහෝ පසස්නා ලදී. දනයට වඩා (ශමථවිදර්ශනා නිර්වාණ පර්යාප්ති සංඛ්‍යාත ත්‍රිවිධ) ධර්මපදය උතුම් වේ. පෙර සිටි මහනුවණැති කාශ්‍යපාදි බුදුවරයෝ ද වඩාත් පෙර සිටි වෙසසභූ ආදී බුදුවරු ද යන සත්පුරුෂයෝ නිවනට ම පැමිණියහ.

8. ආදිත්ත ජාතක යි.

1223. යම්කලෙක ගංගාවෝ තඩාග බවට හැරී සුදුනෙළුමෙන් සැදුණාහු වෙත් ද, කොවුලෝ සක මෙන් සුදුපැහැ වෙත් ද, දඹගස් තල්ගෙඩි දේ ද එකල්හි ඒකාන්තයෙන් (ඔබ හා) සමාගමය වන්නේ ය.

1224. යම් කලෙක කසුබු ලොමින් කළ තුන්වැදෑරුම් උතුරු සළුවෙක් ද හෙමන්ත කාලයට සුදුසු පොරෝනයක් ද වන්නේ නම් එකලැ ඒකාන්තයෙන් (ඔබ හා) සමාගමය වන්නේ ය.

1225. යම් කලෙක මදුරු තුඩුවලින් ශක්තිමත් නො සැලෙන අටල්ලෙක් මනාව කරන ලද්දේ නම්, එකල ඒකාන්තයෙන් (ඔබ හා) සමාගමය වන්නේ ය.

1226. යම් කලෙක දෙව්ලොවට නගිනු පිණිස සස අඟින් හිණක් මනාසේ තනන ලද නම්, එකල ඒකාන්තයෙන් (ඔබ හා) සමාගමය වන්නේ ය.

1227. යම් කලෙක මීයෙක් හිණට නැඟ හඳ සපා කන්නේ ද, රාහුග්‍රහයා පලවා හරනේ ද, එකල ඒකාන්තයෙන් (ඔබ හා) සමාගමය වන්නේ ය.

1228. යදා සුරාඝටං පිත්වා මක්ඛිකා ගණචාරිනී,
අඞ්ගාරෙ වාසං කප්පෙය්‍යුං අථ නූන තදා සියා.

1229. යදා බිම්බොට්ඨසම්පන්නො ගද්‍රභො සුමුඛො සියා,
කුසලො නච්චගීතස්ස අථ නූන තදා සියා.

1230. යදා කාකා උලූකා[1] ච මන්තයෙය්‍යුං රහොගතා,
අඤ්ඤමඤ්ඤං පිහයෙය්‍යුං[2] අථ නූන තදා සියා.

1231. යදා පුලස පත්තානං[3] ඡත්තං ථිරතරං සියා,
වස්සස්ස පටිඝාතාය අථ නූන තදා සියා.

1232. යදා කුළුඞ්ගො[4] සකුණො පබ්බතං ගන්ධමාදනං,
තුණ්ඩෙනාදාය ගච්ඡෙය්‍ය අථ නූන තදා සියා.

1233. යදා සාමුද්දිකං නාවං සයන්තං සවටාකරං[5],
චෙටො ආදාය ගච්ඡෙය්‍ය අථ නූන තදා සියාති.

9. අට්ඨානජාතකං.

1234. ඛමනීයං යාපනීයං කච්චි මාතුල තෙ සුඛං,
සුඛං තෙ අම්මා අවච සුඛකාමා හි තෙ මයං.

1235. නඞ්ගුට්ඨං මෙ අවක්කම්ම[6] හෙඨයිත්වාන[7] එළිකෙ,
සාජ්ජ මාතුලවාදෙන මුඤ්චිතබ්බා නු මඤ්ඤසි.

1236. පුරත්ථාමුඛො නිසින්නොසි අහං තං[8] මුඛමාගතා,
පච්ඡතො තුය්හ නඞ්ගුට්ඨං කථං ඛොහං අවක්කමිං[9].

1237. යාවතා චතුරො දීපා සසමුද්දා සපබ්බතා,
තාවතා මය්හ නඞ්ගුට්ඨං කථං ඛො තං විවජ්ජයි.

---

1. උලූඞකා – මජසං.
2. විහරෙය්‍යු – මජසං
3. පලාසමූලාල – මජසං. සයා.
4. කුලඞ්කො – මජසං. කුරාරො සයා.
5. සපටාකාරං – මජසං.
6. අපක්කම්ම – මජසං. සයා.
7. පොථයිත්වාන – මජසං.
8. තෙ – මජසං.
9. අපක්කමි – මජසං අවක්කමි – සයා.

1228. යම් කලෙක මැස්සෝ රා කළයක් බී සමූහ වැ හැසිරෙනුවෝ ගිනිඅඟුරෙහි වසන්නාහු ද, එකල එකාන්තයෙන් (ඔබ හා) සමාගමය වන්නේ ය.

1229. යම් කලෙක බිඹුපල (කෙම්ගෙඩි) වැනි තොල් ඇති, සුන්දර මුහුණ ඇති නෘත්‍යයට හා ගායනයට දක්ෂ කොටළුවෙක් වේ ද, එකල එකාන්තයෙන් (ඔබ හා) සමාගමය වන්නේ ය.

1230. යම් කලෙක කවුඩෝත් මහමූහුණෝත් රහසිගත ව සාකච්ඡා කරන්නාහු ද ඔවුනොවුනට පියමනාප වන්නාහු ද එකලැ එකාන්තයෙන් (ඔබ හා) සමාගමය වන්නේ ය.

1231. යම් කලෙක පුලසපත්‍රයෙන් කළ කුඩය වැස්ස වළකා ගන්නට ශක්තිමත් වන්නේ ද එකල එකාන්තයෙන් (ඔබ හා) සමාගමය වන්නේ ය.

1232. යම් කලෙක කුළුඬෑපක්ෂියෙක් ගන්ධමාදන පර්වතය තුඩින් ගෙන යන්නේ ද, එකල එකාන්තයෙන් (ඔබ හා) සමාගමය වන්නේ ය.

1233. යම් කලෙක යන්ත්‍රය සහ පලුපත් සහිත මුහුදු නැවක් කුඩා ගම්දරුවෙක් අතින් ගෙන යන්නේ ද, එකල එකාන්තයෙන් (ඔබ හා) සමා මය වන්නේ ය.

9. අටඨාන ජාතක යි.

1234. මයිලණුවෙනි, කෙසේ ද? ඉවැසිය හැකි ද? සුවසේ දිවි පැවැත්විය හැකි ද? අද ඔබගේ සුවය මව විචාළා ය. අපි ද තොපට සැප කැමැත්තමෝ වම්හ.

1235. එළිය, මාගේ නඟුට පාගා බලාත්කාර කොට අදම 'මයිලණුවෙනි'යි අමතා මිදීගත හැක්කැ යි හඟිහි ද?

1236. පෙරදිගට මුහුණ ලා හුන්නෙහි ය. මම මුබ වහන්සේගේ ඉදිරියෙන් ආයෙමි. තොපගේ නඟුට පසු පසැ වේ. එය කෙසේ මම මඩනෙම් ද?

1237. සාගර සහිත පර්වත සහිත සතර මහ දිවයින් යම් තාක් ද ඒතාක් මගේ වලග (පැතිර ගියේ) වේ. එය තෝ කෙසේ නම් නොම මැඩැ හරනෙහි ද?

1238. පුබ්බෙවමෙතං අසක්ඛිංසු[1] මාතාපිතා ච භාතරො,
දිස්වා දුට්ඨස්ස නඩ්ගුට්ඨං සමහි[2] වෙහාසයාගතා.[3]

1239. තඤ්ච දිස්වාන ආයන්තිං අන්තලික්ඛස්මිං එළිකෙ[4],
මිගසඞ්ඝා පලායිත්ථ භක්ඛා මෙ නාසිතො තයා.

1240. ඉච්චෙවං විලපන්තියා එළිකියා රුහංසසො,
ගලකං අන්වාවමද්දී නත්ථි දුට්ඨෙ සුභාසිතං.

1241. නෙව දුට්ඨෙ නයො අත්ථි න ධම්මො න සුභාසිතං,
නික්කමං දුට්ඨෙ යුඤ්ජෙථ[5] සො ච සබ්භි න රඤ්ජතීති.

10. දීපිජාතකං.

කච්චානිවග්ගො පඨමො.

තස්සුද්දානං:

පරිසුද්ධමනාවිලාවසුන්ධරා
බකරාජස්ස කායුරං දණ්ඩාවරො,
අථඅඞ්ගාරචෙතියදෙවිලින
අථ ආදිත්තගඞ්ගාදසෙළකිනාති.

අට්ඨකනිපාතං නිට්ඨිතං.

1. මක්ඛිංසු – මජසං.
2. සාමහ – මජසං. සයා.
3. වෙහාසයං – මජසං.
4. එළිකී – මජසං. එළිගී – සයා.
5. යුඤ්ජෙථ – මජසං. සයා.

1238. දුෂ්ටයාගේ වලග දිගය යන මේ කථාව මාපියෝ ද සොහොයුරෝ ද මට කැලැ මැ කීහ. (වලග ඇක්මෙන නිසා) ඒ මම අහසින් ආවෙමි.

1239. එළිස්සිය, අහසෙහි එන තී දැක මුවසමූහය පැන ගියා ය. මගේ ගොදුර තී විසින් නසන ලදී.

1240. මෙසේ කියා වලප්නා එළිස්සියගේ ගෙල ලොහිතපායී දිවි තෙම ඩැගැගෙන ඉරාලී ය. දුෂ්ටයා කෙරෙහි සුභාෂිත බිණුමක් නැත. (දුෂ්ටයා සමග මිහිරි කථාවෙන් බිණුමෙන් පලෙක් නො වේ.)

1241. දුෂ්ටයාට නීතියෙක් නැත. ස්වභාවයෙන් පිහිටි උතුම් ගතියෙක් නැත. හොඳ කථාවෙක් නැත. දුෂ්ටයා කෙරේ පරාක්‍රමය යොදන්නේ ය. දුෂ්ටයා ද සත්පුරුෂයන් හා නො ඇලේ.

10. දීපි ජාතක යි.

පළමුවන කච්චානිවර්ග යි.

එහි උද්දානය:

කච්චානීජාතක (පරිසුද්ධා) යැ අට්ඨසද්දජාතක (බකරාජස්ස) යැ සුලසාජාතකය (කායුර) යැ සුමඞ්ගලජාතක (දණ්ඩාව) යැ ගඞ්ගමාල ජාතක (අඞ්ගාර) යැ චේතිය ජාතක යැ ඉන්ද්‍රියජාතක යැ ආදිත්ත ජාතක යැ අට්ඨානජාතක (ගණ්ක) යැ දීපි ජාතක (එළක) යැ යන දසය යි.

අට්ඨක නිපාතය නිමි.

9. නවක නිපාත

1242. පරිසඞ්ඛුපථො නාම ගිජ්ඣපන්ථො සනන්තනො,
තත්‍රාසි මාතාපිතරො ගිජ්ඣො පොසෙසි ජිණ්ණකෙ.

1243. තෙසං අජගරං මෙදං අච්චහාසි පහූතසො[1],
පිතා ච පුත්තං අවච ජානං උච්චං[2]පපාතිනං
සුපත්තං පක්ඛ[3]සම්පන්නං තෙජස්සිං[4] දූරගාමිනං.

1244. පරිප්ලවන්තං[5] පථවිං යදා තාත විජානහි[6],
සාගරෙන පරික්ඛිත්තං චක්කංව පරිමණ්ඩලං.
තතො තාත නිවත්තස්සු මාස්සු එත්තො පරං ගමි.

1245. උද්ධං පත්තොස[7] වෙගෙන බලී පක්ඛී දිජුත්තමො,
ඔලොකයන්තො වක්කඞ්ගො පබ්බතානි වනානි ච.

1246. අද්දසා[8] පථවිං ගිජ්ඣො යථා ස්සාසි[9] පිතුස්සුතං,[10]
සාගරෙන පරික්ඛිත්තං චක්කංව පරිමණ්ඩලං.

1247. තඤ්ච සො සමතික්කම්ම පරමෙව පවත්තථ,
තඤ්ච වාතසිඛා තික්ඛා අච්චහාසි බලිං දිජං.

1248. නාසක්ඛාතිගතො පොසො පුනරෙව[11] නිවත්තිතුං,
දිජො ව්‍යසනමාපාදි වෙරම්භානං වසං ගතො.

1249. තස්ස පුත්තා ච දාරා ච යෙ චඤ්ඤෙ අනුජීවිනො,
සබ්බෙ ව්‍යසනමාපාදුං අනොවාදකරෙ දිජෙ.

1250. එවම්පි ඉධ වද්ධානං[12] යො වාක්‍යං නාවබුජ්ඣති,
අතිසීමචරො දිත්තො ගිජ්ඣොවාතීතසාසනො
ස වෙ[13] ව්‍යසනං පප්පොති[14] අකත්වා වුද්ධසාසනන්ති.

1. ගිජ්ඣජාතකං.

1. බහුධාසො – මජසං. බහූතසො – සයා. බහුතත්තො – සීමු.
2. උච්චා – සීමු.
3. ථාම – මජසං.
4. තෙජසිං – මජසං. සයා.
5. පරිපාලවිතං – මජසං.
6. විජානාහි – මජසං.
7. උපදත්තොසි – මජස.
8. අද්දසස – මජසං. අද්දස – සයා.
9. යථාවාසි – මජසං.
10. පිතුසකා – මජසං.
11. පුනදෙව – මජසං.
12. වුඩ්ඪානං – මජසං. සයා.
13. සබ්බෙ – මජසං. සයා.
14. පප්පොන්ති – මජසං. සයා.

9. නවක නිපාතය.

1242 උල් අමුනා කළ හෙයින් සංකුපථ නමැති පැරැණි වූ ගිජුකුළුමුදුනට මාර්ගයෙක් විය. එහි ගිජුළිහිණියෙක් මහලු මාපියන් පොෂණය කෙළේ ය.

1243. හේ ඔවුනට වුරුණුතෙල් සහිත පිඹුරුමස බොහෝ සෙයින් ගෙනායේ ය. පියා ද දන්නේ ඉහළ පියාඹන ශක්තිසම්පන්න, ඉතා දුර (පියාඹා) යන සුපත්ත නමැති පුත්‍රයාට මෙසේ කී ය.

1244. ''දරුව, යම් කලෙක මුහුදෙන් වට වූ මහපොළොව පිරිමඬුලු වූ රියසකක් මෙන් (දියෙහි) ඉල්පෙන්නා දනිහි ද (පෙනේ ද) එතැනින් නවතින්න. ඉන් ඔබ්බට නො යන්න.''

1245. ශක්තිමත් වූ පියාපත් ඇති, වක් වූ ගෙල ඇති පක්ෂි රාජ තෙම පර්වත ද වනපෙත් ද බලමින් වේගයෙන් අහසට පැන නැංගේ ය. (පියාඹා ගියේ ය.)

1246. 'යව'යි කියා පියාගෙන් යම්සේ අසන ලද ද, එසේ ම සයුරෙන් වට වූ රියසකක් සේ වට වූ පොළොව ගිජුළිහිණි තෙමේ දිටී ය.

1247. හේ පියාණන්ගේ ඔවා වශයෙන් කී තැනත් ඉක්මැ ඈතට ම ගියේ ය. වාතශිඛාව (වේගවත් වේරම්බ වාතය) ඒ ශක්තිමත් පක්ෂියා පැහැර ගත්තේ ය. (ඒ වාතයට අසුවිය.)

1248. පියා කී (පිළිවෙළ) මග ඉක්මවා ගිය පක්ෂියා වේරම්බ වාතයට අසු වැ නවතින්නට නො හැකි වූයේ විනාශයට පැමිණියේ ය.

1249. අවවාද අනුව නො පිළිපන් යම් ඒ ගිජුළිහිණියෙක් වී ද, ඔහුගේ දූදරුවෝ ද භාර්යාවෝ ද, සෙසු පිරිවර පිරිස ද යන හැමදෙනා ම ව්‍යසනයට පැමිණියාහ.

1250. එසේ ම මෙලොවැ යමෙක් වැඩිහිටියන්ගේ කීම වටහා නො ගනී ද, පමණ ඉක්මැ හැසිරෙන්නේ ද, කියන ලද අවවාද ඇති, එහෙත් අනුශාසනා ඉක්මැ ගිය ගිජුළිහිණියා මෙන්, නුවණැති වැඩිහිටියන්ගේ අවවාද නො පිළිගන්නාහු වැනැසෙති.

1. ගිජ්ඣ ජාතක යි.

1251. පුථුසද්දො සමජනො න බාලො කොචි මඤ්ඤථ,
සඞ්ඝස්මිං භිජ්ජමානස්මිං නාඤ්ඤං භිය්‍යො අමඤ්ඤරුං.

1252. පරිමුට්ඨා පණ්ඩිතාභාසා වාචාගොචරභාණිනො,
යාවිච්ඡන්ති මුඛායාමං යෙන නීතා න තං විදූ.

1253. අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ,
යෙ තං උපනය්හන්ති වෙරං තෙසං න සම්මති.

1254. අක්කොච්ඡි මං අවධි මං අජිනි මං අහාසි මෙ,
යෙ තං න උපනය්හන්ති[1] වෙරං තෙසූපසම්මති.

1255. නහි වෙරෙන වෙරානි සම්මන්තීධ කුදාචනං,
අවෙරෙන ච සම්මන්ති එසධම්මො සනන්තනො.

1256. පරෙ ච න විජානන්ති මයමෙත්ථ යමාමසෙ,
යෙ ච තත්ථ විජානන්ති තතො සම්මන්ති මෙධගා.

1257. අට්ඨිච්ඡින්නා පාණහරා ගවාස්ස ධනහාරිනො,
රට්ඨං විලුම්පමානානං තෙසම්පි හොති සඞ්ගති
කස්මා තුම්හාක නො සියා.

1258. සචෙ ලභෙථ නිපකං සහායං
සද්ධිං චරං සාධු විහාරි ධීරං,
අභිභුය්‍ය සබ්බානි පරිස්සයානි
චරෙය්‍ය තෙනත්තමනො සතීමා.

1259. නො චෙ ලභෙථ නිපකං සහායං
සද්ධිං චරං සාධු විහාරි ධීරං,
රාජාව රට්ඨං විජිතං පහාය
එකො චරෙ මාතඞ්ගරඤ්ඤෙව නාගො.

1260. එකස්ස චරිතං සෙය්‍යො
නත්ථි බාලෙ සහායතා,
එකො චරෙ න ච පාපානි කයිරා
අප්පොස්සුක්කො මාතඞ්ගරඤ්ඤෙව නාගොති.

2. කොසම්බජාතකං.

1. යෙච තං නූපනය්හන්ති – මජ්ඣං., ස්‍යා.

1251. පතළ ශබ්ද ඇති එහෙයින් ම සමාන වූ බහුතර ජන තෙමේ, කිසිවෙක් නමා අනුවණ යැ යි නො දත්තේ ය. සංඝ (සාමග්‍රිය) බිඳෙන කල්හි (තමන් නිසා) බිඳෙති යි යන අනිත් කාරණය ද බෙහෙවින් ම නො සිතූහ.

1252. සිහිය මඳ පණ්ඩිතාභාසය ඇත්තෝ (පණ්ඩිතමානීහු) කටට ආවක් කියන්නාහු වෙති. යම්තාක් කැමැති ද ඒතාක් මුව අයා සිට කියති. යම් විවාදයෙකින් මෙ නිර්ලජ්ජී බවට පැමුණුණේ ද එය නො දත්හ.

1253. මට ආක්‍රොශ කෙළේ ය. මට පහර දුන්නේ ය, මා පැරැද්දී ය, මා සතු දැය පැහැර ගත්තේ යැ යි (සිතමින්) යම් කෙනෙක් වෙර බඳිත් ද ඔවුන්ගේ වෛරය නො සන්හිඳේ.

1254. යම් කෙනෙක් මට ආක්‍රොශ කෙළේ ය, මට පහර දුන්නේ ය, මා පැරැද්දීය, මා සතු දැය පැහැර ගත්තේ යැ යි වෙර නො බඳිත් ද, ඔවුන්ගේ වෛරය සන්හිඳේ.

1255. මෙලොව කිසිකලෙකත් වෛරයෙන් වෛරයෝ නො සන්හිඳෙති. අවෛරයෙන් (මෛත්‍රී කිරීමෙන්) වෛරයෝ සන්හිඳෙති. මෙය බුද්ධාදි උතුමන්ගේ පැරැණි දහමෙකි.

1256. මේ සඟමැද විවාද කරන මෝඩ වූ අපි මරුමුවට යම්හ යි නො දනිති. එහි යමෙක් අපි මරුමුවට යම්හ යි දනිත් ද එයින් විවාදයෝ සන්හිඳෙති.

1257. ඇට සිඳුනා, දිවි තොර කරන, ගවයන් අසුන් රන් රුවන් ඈ වස්තුව පැහැර ගන්නා රට කොල්ලකන රජුන්ගේ ද එකතුව වෙයි. කුමක් හෙයින් තොප සමගි නො වන්නේ ද?

1258. නුවණැති, එක්ව හැසිරෙන, මනා පැවැත්ම ඇති, ධෛර්ය සම්පන්න වූ කලණ මිතුරකු ලබන්නේ නම්, හැම උවදුරු මැඩැ සතුටු සිතැති වැ සිහිය ඇති වැ ඔහු හා හැසි-රෙන්නේ ය.

1259. නුවණැති, එක්ව හැසිරෙන, මනා පැවැත්ම ඇති. ධෛර්ය සම්පන්න කල්‍යාණ මිත්‍රයකු නො ලදෙත් දිනූ රට හැර පියා වල් වන් (මහාජනක) රජු මෙන් ද, (රක්ෂිත වනයෙහි හුදෙකලා වූ) ඇත් රජු මෙන් ද, හුදෙකලා ව හැසිරෙන්නේ ය.

1260. හුදෙකලා ව විසුම ශ්‍රෙෂ්ඨ වේ. අනුවණයන් හා මිතුරු බවෙක් නැත. වනයෙහි තනි ව හැසිරෙන (පාරිලෙයක) ඇත්රජු මෙන් (පිරිස් පරිහරණයෙහි) උත්සාහ නැති ව හුදෙකලා ව හැසි-රෙන්නේ ය. පාපක්‍රියා නොකරන්නේ ය.

2. කොසම්බික ජාතක යි.

1261. දුමො යද හොති ඵලූපපන්නො
භුඤ්ජන්ති තං විහගා[1] සම්පතන්තා,
ඛීණන්ති ඤත්වාන දුමං ඵලච්චයෙ
දිසොදිසං යන්ති තතො විහඞ්ගමා.

1262. චර චාරිකං ලොහිතතුණ්ඩ මාචරි
කිං ත්වං සුව සුක්ඛදුමම්හි ඣායසි,
තදිඞ්ඝ මං බ්‍රූහි[2] වසන්තසන්නිභ
කස්මා සුව සුක්ඛදුමං න රිඤ්චසි.

1263. යෙ වෙ සඛීනං සඛාරො භවන්ති
පාණච්චයෙ[3] සුඛදුක්ඛෙසු හංස,
ඛීණං අඛීණන්ති න තං ජහන්ති,
සන්තො සතං ධම්මමනුස්සරන්තා.

1264. සොහං සතං අඤ්ඤතරොස්මි හංස
ඤාති ච මෙ හොති සඛා ච රුක්ඛො,
තං නුස්සහෙ ජීවිකත්ථො පහාතුං
ඛීණන්ති ඤත්වාන නහෙසධම්මො.

1265. සාධු සක්ඛිකතං හොති මෙත්ති[4] සංසති සන්ථවො,
සචෙ තං ධම්මං රොචෙසි පාසංසොසි විජානතං.

1266. සො තෙ සුව වරං දම්මි පත්තයාන විහඞ්ගම,
වරං වරස්සු වක්කඞ්ග යං කිඤ්චි මනසිච්ඡසි.

1267. වරඤ්ච මෙ හංස භවං දදෙය්‍ය
අයං[5] හි රුක්ඛො පුනරායුං ලභෙථ,
සො සාඛවා ඵලිමා සංවිරූළ්හො
මධුත්ථිකො තිට්ඨතු සොභමානො.

1268. තං පස්ස සම්ම ඵලිමං උළාරං
සහාව තෙ හොතු උදුම්බරෙන,
සො සාඛවා ඵලිමා සංවිරූළ්හො
මධුත්ථිකො තිට්ඨතු සොභමානො.

---

1. විහඞ්ගමා – මඡසං. ස්‍යා.
2. තදිඞ්ඝබ්‍රූහි – මඡසං. ස්‍යා.
3. පාණං වජෙ – මඡසං.
4. මිත්ත – මඡසං.
5. අයඤ්ච රුක්ඛො – මඡසං.

1261. යම් කලෙක ගස පලින් යුක්ත ද, (එ කලැ) පක්ෂීහු අත්තෙන් අත්තට යන්නාහු පල බුදිති. පල අවසන් කලැ ගස ඵල රහිත යැ යි දැන, පක්ෂීහු එතැනින් වෙනත් දිසා කරා යති.

1262. ලේපැහැති තුඩක් ඇති පක්ෂිය, චාරිකා කරන්නෙහි. “ගිරවාණෙනි, ඔබ වියැළීගිය මේ ගසේ සිට කුමක් සිතවු ද” යි කියන්නැ. වසන්ත සමයෙහි කැලැරොදෙක පැහැයට සමාන ගිරවාණෙනි, කවර හෙයින් මේ වියැළීගිය ගස අත් නො හරිවු ද?

1263. එම්බා හංසය, යහළුවනට යම් යහළු කෙනෙක් වෙත් ද, ඔව්හු ජීවිත විනාශයෙහි ද දුකසැප දෙක්හි ද ස්තුව පිරිහිණැ යි හෝ නො පිරිහිණැ යි කියා ද සත්පුරුෂයෝ සත්පුරුෂ ධර්මය සිහි කරන්නාහු සිය මිතුරන් නො හරිති.

1264. එම්බා හංසය, ඒ මම සත්පුරුෂයන් අතර එකෙකිමි, මට මේ ගස නෑයෙක් ද යහළුවෙක් ද වේ. මෙය පිරිහිණැ යි දැන තම ජීවිතය රකිනු සඳහා මෙය හරින්නට වෑයම් නො කරමි. පල රහිත යයි (සිතා) එය හැර දැමීම සත්පුරුෂ-ධර්මය නො වේ.

1265. යහළුකම ද මෛත්‍රිය ද පිරිස ඇසුරු කිරීම ද කරන ලද්දේ මැනැවි. ඒ ධර්ම තුන රැය්නෙහි නම් නුවණැත්තන්ගේ පැසැසුමට සුදුස්සෙක් වෙහි.

1266. පියාපත් යාන කොට ඇත්තා වූ අහසින් යන්නා වූ වක් ගෙළ ඇත්තා වූ ගිරවාණෙනි, ඒ මම ඔබට කැමැති වරයක් දෙමි. යමක් සිතින් කැමැත්තෙහි ද ඒ වරය ඉල්ලන්න.

1267. එම්බා හංසය, ඉදින් තෙපි මට වරයක් දෙන්නහු නම්, මේ දිඹුල්රුක නැවත ආයුෂ ලබාවා. ගස අතුපතර ඇති මිහිරි පල සහිත වැ මනාව වැඩුණෙක් වැ ශොභමාන වැ සිටීවා.

1268. මිතුර, මහත් පල ඇති ඒ ගස බලන්න. දිඹුල්ගස හා ම ඔබගේ වාසය වේවා, දිඹුල්ගස අතුපතර සහිත ව මනාව වැඩුණේ මිහිරිපල සහිත ව හොබනේ වේවා.

1269. එවං සක්ක සුඛී හොහි සහ සබ්බෙහි ඤාතිභි,
යථාහමජ්ජ සුඛිතො දිස්වාන ඵලිතං දුමං.

1270. සුවස්ස ච වරං දත්වා කත්වාන සඵලං දුමං,
පක්කාමි සහභරියාය දෙවානං නන්දනං වන'න්ති.

3. මහාසුකජාතකං.

1271. සන්ති රුක්ඛා හරිතපත්තා දුමා නෙකඵලා බහූ,
කස්මා නු සුක්ඛෙ කොළාපෙ සුකස්ස නිරතො මනො.

1272. ඵලස්ස උපභුඤ්ජිම්හා නෙකවස්සගණෙ බහූ,
අඵලම්පි විදිත්වාන සාව මෙත්ති යථාපුරෙ.

1273. සුක්ඛඤ්ච රුක්ඛං කොළාපං ඔපත්තමඵලං දුමං,
ඔහාය සකුණා යන්ති කිං දොසං පස්සසෙ දිජ[1]

1274. යෙ ඵලත්ථා සම්භජන්ති අඵලොති ජහන්ති නං,
අත්තට්ඨ[2]පඤ්ඤා දුම්මෙධා තෙ හොන්ති පක්ඛපාතිනො.

1275. සාධු සක්ඛි කතං හොති මෙත්ති සංසති සන්ථවො,
සචෙ තං ධම්මං රොචෙසි පාසංසොසි විජානතං.

1276. සො තෙ සුව වරං දම්මි පත්තයාන විහඞ්ගම,
වරං වරස්සු වක්කඞ්ග යංකිඤ්චි මනසිච්ඡසි.

1277. අපි නාම නං පුන පස්සෙ[3] සපත්තං සඵලං දුමං,
දලිද්දොව නිධිං ලද්ධා නන්දෙය්‍යාහං පුනප්පුනං.

1278. තතො අමතමාදාය අභිසිඤ්චි මහීරුහං,
තස්ස සාඛා විරූහිංසු[4] සීතච්ඡායා මනොරමා.

1. දිජා – මජසං.
2. අත්තත්ථ – මජසං.
3. පස්සෙමු – අ. පස්සෙය්‍යුං – මජසං.
4. විරූළ්හස්ස – මජසං.

1269. ශක්‍රදෙවෙන්ද්‍රය, අද මම ඵල සහිත ගස දැක යම්සේ සුවපත් වූයෙම් ද, එසේ ම ඔබ ද සියලු නෑයන් සමග සුවපත් වෙත්වා.

1270. දිඹුල්ගස ඵල සහිත කොට ගිරවාට වරය දී ශක්‍රයා බිරිය සමග දෙවියන්ගේ නන්‍දනොද්‍යානයට ගියේ ය.

3. මහාසුක ජාතක යි.

1271. නිල්කොළ සහිත රුක්හු ඇත. ගෙඩි සහිත බොහෝ රුක්හු වෙත්. පවන් හමන කලැ හඬන සිදුරු සහිත වියැළි රුකෙහි ගිරවාගේ සිත කවර හෙයින් ඇලුණේ ද?

1272. අවුරුදු බොහෝ ගණනක් (මේ ගසේ) ගෙඩි බුදීමු. ගසේ පල නැති බව දැනැ ද පෙර යම්සේ මිතුරු බවක් වී ද, පල නැති කල්හි දු (මිත්‍රකම) එසේ ම වේ.

1273. වියැළි ගියා වූ ද පවනින් හඬන්නා වූ ද හැලුණු කොළ ඇති රුක හැරපියා පක්ෂීහු යෙති. මෙහි ගිරවාණෙනි, කවර වරදක් දක්නහු ද?

1274. යම් කෙනෙක් පල අපෙක්‍ෂාවෙන් සෙවුනාහු ද, පල නැති කලැ (ඵල නැතැ යි) එය හැර දමත් ද, ඒ ආත්මාර්ථකාමී නුවණ ඇති අසත්පුරුෂ බුද්ධිමතා මිත්‍රපක්‍ෂය නසයි.

1275. යහළු බව කරන ලදුයේ මැනැව. මෛත්‍රිය ද පිරිස්හි සමාගමය ද කරන ලද්දේ මැනැව, ඒ ත්‍රිවිධධර්මය රුස්නෙහි නම් පණ්ඩිතයන් ගේ පැසැසුමට සුදුස්සෙහි.

1276. පියාපත් යාන කොට ඇත්තා වූ ද අහසින් යන්නා වූ ද වක් ගෙළ ඇත්තා වූ ද ගිරවාණෙනි, ඒ මම ඔබට කැමැති වරයක් දෙමි. සිතින් කැමැති වන යමක් ඇතොත් එය ඉල්ලන්න.

1277. කොළ සහිත පල සහිත ඒ ගස දක්නෝ නම් ඉතා මැනැවි. නිධානයක් ලද දිළින්දකු මෙන් එය නැවැත නැවැත අභිනන්දනය කරන්නෝ නම් ඉතා යෙහෙක.

1278. ඒ නදියෙන් දිය ගෙන දිඹුල්ගසට වක්කෙළේ ය. ඒ ගසේ සිහිල් සෙවණ දෙන සිත්කලු අතුපතර වැඩී ගියේ ය.

1279. එවං සක්ක සුඛී හොහි සහ සබ්බෙහි ඤාතිහි,
යථාහමජ්ජ සුඛිතො දිස්වාන සඵලං දුමං.

1280. සුවස්ස ච වරං දත්වා කත්වාන සඵලං දුමං,
පක්කාමි සහ භරියාය දෙවානං නන්දනං වන'න්ති.

4. චුල්ලසුකජාතකං.

1281. සුතං මෙතං මහාබ්‍රහ්මෙ කාමෙ භුඤ්ජති හාරිතො[1],
කච්චෙතං වචනං තුය්හං කච්චි සුද්ධො ඉරියසි.

1282. එවමෙතං මහාරාජ යථා තෙ වචනං සුතං,
කුම්මග්ගෙ[2] පටිපන්නොස්මි මොහනෙය්‍යෙසු මුච්ඡිතො.

1283. ආදු[3] පඤ්ඤා කිමත්ථියා නිපුණා සාධු චින්තනී[4],
යාය උප්පතිතං රාගං කිං මනො න විනොදයෙ.

1284. චත්තාරො මෙ මහාරාජ ලොකෙ අතිබලා භුසා,
රාගො දොසො මදො මොහො යත්ථ පඤ්ඤා න ගාධති.

1285. අරහං[5] සීලසම්පන්නො සුද්ධො චරති හාරිතො,
මෙධාවී පණ්ඩිතො චෙව ඉති නො සම්මතො භවං.

1286. මෙධාවිනම්පි හිංසන්ති ඉසිං ධම්මගුණෙ රතං,
විතක්කා පාපකා රාජ සුභා රාගූපසංහිතා.

1287. උප්පන්නායං සරීරජො
රාගො වණ්ණවිදූසනො තවං,
තං පජහ[6] භද්දමත්ථු[7] තෙ
බහුන්නාසි[8] මෙධාවීසම්මතො.

1288. තෙ අන්ධකරණෙ කාමෙ බහුදුක්ඛෙ මහාවිසෙ,
තෙසං මූලං ගවෙසිස්සං ඡෙච්ඡං රාගං සබන්ධනං.

1289. ඉදං වත්වාන හාරිතො ඉසි සච්චපරක්කමො,
කාමරාගං විරාජෙත්වා බ්‍රහ්මලොකූපගො අහූති.

5. හාරිතජාතකං.

1. හරිතො – මජසං.
2. කුමග්ගං – මජසං.
3. සාධු – මජසං.
4. චින්තිකිං – මජසං, සයා.
5. ගරහා – මජසා.
6. පජහථ – මජසං.
7. නමත්ථු – සයා.
8. බහුනාපි – සයා. බහුනාසි – මජසං.

1279. ශක්‍ර දෙවෙන්ද්‍රය, මම පල ඇති ගස දැක යම්සේ සුවපත් වීම් ද, එසේ ම ඔබ ද සියලු නෑයන් සමග සුවපත් වෙත් වා !

1280. දිඹුල්ගස පල සහිත කොට ගිරවාට වරය දී ශක්‍රයා බිරිය සමග දෙවියන්ගේ නන්දනොද්‍යානයට ගියේ ය.

4. චුල්ලසුක ජාතක යි.

1281. මහ බමුණ, හාරිත තවුසා කාමසම්පත් අනුභව කරතැ යි මා විසින් මෙය අසන ලදී. කිමෙක් ද? මේ වචනය බොරු ද? කිමෙක් ද, පවිත්‍ර වැ වෙසෙහි ද?

1282. මහරජ, ඔබ යම්සේ අසන ලද ද, එය එසේ ම ය. සත්ත්වයන් මුළා කරන පංචකාමගුණයෙහි මුළා වූයෙම් වැරැදි මඟ පිළිපන්නෙම් වෙමි.

1283. කෙබඳු සිතක් වුව ද, උපන් රාගය (ඒ සිතැ වූ) යම් ප්‍රඥාවෙකින් දුරු නො කරන්නේ වී නම්, සියුම් වූ, සර්වාර්ථයන් මැනැවින් සිතන, ඒ ප්‍රඥාව කුමට ද?

1284. මහරජ, යමෙක ප්‍රඥාව නො බැස ගනී ද එසේ වූ රාග ද්වෙෂ මද මොහ යන මේ සතර ලොවැ අත්‍යර්ථයෙන් ම ඉතා ම ප්‍රබලහ.

1285. පූජාර්හ වූ ශීලසම්පන්න වූ, හාරිත තවුසාණෝ පිරිසිදු වැ හැසිරෙති. නුවණැතියෝ යැ යි පණ්ඩිතයෙකැ යි අප විසින් බුහුමන් කරන ලදී.

1286. මහරජ, ශුභ නිමිති ගැනීමෙන් පැවැති, රාග නිඃශ්‍රිත වූ, ලාමක කාමවිතර්කයෝ දහම්ගුණයෙහි ඇලුණු නුවණැති වූ ද තවුසාට පවා හිංසා කෙරෙති.

1287. ඔබට යහපතෙක් වේ වා. ඔබ බොහෝ දෙනා අතුරෙහි නුවණ ඇත්තෙකැ යි ප්‍රසිද්ධ වූවෝ ය. ඔබේ සිරුරේ හටගත් ගුණවර්ණ රූපවර්ණ දෙක අපවිත්‍ර කරන මේ රාගය උපන. එය දුරු කරන්න.

1288. නුවණැස අඳුරු කරන, බොහෝ දුකට හෙතුවන මහා විෂයක් වැනි ඒ කාමයන් දුරු කරන්නට ඔවුන්ගේ මුල සොයන්-නෙමි. බැඳුම් සහිත රාගය සිඳින්නෙමි.

1289. සත්‍යය හා පරාක්‍රමය ඇති හාරිත නමැති තවුසා මෙය කියා කාමරාගය දුරු කොට බඹලොව ගියේ ය.

5. හාරිත ජාතක යි.

1290. බහුස්සුතං චිත්තකථිං[1] ගඞ්ගා වහති පාටලං[2],
වුය්හමානක[3] භද්දන්තෙ එකං මෙ දෙහි[4] ගාථකං.

1291. යෙන සිඤ්චන්ති දුක්ඛිතං යෙන සිඤ්චන්ති ආතුරං,
තස්ස මජ්ඣෙ මරිස්සාමි ජාතං සරණතො භයං,

1292. යත්ථ බීජානි රූහන්ති සත්තා යත්ථ පතිට්ඨිතා,
සා මෙ සීසං නිපීළෙති ජාතං සරණතො භයං.

1293. යෙන භත්තානි පච්චන්ති සීතං යෙන විහඤ්ඤති,
සො මං ඩහති[5] ගත්තානි ජාතං සරණතො භයං.

1294. යෙන භුත්තෙන යාපෙන්ති පුථූ බ්‍රාහ්මණඛත්තියා,
සො මං භුත්තො වියාපාදි[6] ජාතං සරණතො භයං.

1295. ගිම්හානං පච්ඡිමෙ මාසෙ වාතමිච්ඡන්ති පණ්ඩිතා,
සො මෙ භඤ්ජති ගත්තානි ජාතං සරණතො භයං.

1296. යං නිස්සිතා ජහති රුහං විහඞ්ගමා සොයං[7] අග්ගිං පමුඤ්චති,
දිසා භජථ වක්කඞ්ගා ජාතං සරණතො භයං.

1297. යමානයිං[8] සොමනස්සං මාලිනිං චන්දනුස්සදං,
සා මං සරා නීහරති[9] ජාතං සරණතො භයං.

1298. යෙන ජාතෙන නන්දිස්සං යස්ස ච භවමිච්ඡිසං,
සො මං සරා නිච්ඡුභති ජාතං සරණතො භයං.

1299. සුණන්තු මෙ ජානපදා[10] නෙගමා ච සමාගතා,
යතොදකං[11] තදාදිත්තං යතො ඛෙමං තතො භයං.

1300. රාජා විලුම්පතෙ රට්ඨං බ්‍රාහ්මණො ච පුරොහිතො,
අත්තගුත්තා විහරථ ජාතං සරණතො භයන්ති.

6. පදමාණවකජාතකං.

1. චිත්තකථං – මජසං සයා.
2. පාටිලිං – මජසං. සයා.
3. වුය්හමානතං – මජසං.
4. ගාහි – මජසං.
5. ඩය්හති – මජසං.
6. ව්‍යාපාදි – මජසං.
7. ස්වායං – මජසං.
8. යමානයී – මජසං.
9. නිච්ඡුභති – මජසං.
10. ජනපදා – මජසං.
11. යථොදකං – මජසං. යදෙදකං වි.

1290. නදී තොමෝ බහුශ්‍රැත වූ ද විසිතුරු කථා ඇත්තා වූ ද පාටල නමැති ගඳඹා ගෙන යයි. නදී දියෙන් ගෙන යනු ලබන තැනැත්තව, තට සෙත් වේවා මට එක් ගාථාවක් කියන්න.

1291. දුකට පත් තැනැත්තහු යම් ජලයෙකින් තෙමෙද්ද, ආතුරයා යම් ජලයෙකින් තෙමේ ද, ඒ දිය මැද මියයන්නෙමි. පිහිට වූ තැනින් බිය උපනි.

1292. යම් තැනෙක බිජුවට වැඩේ ද, සත්ත්වයෝ යම් තැනෙක පිහිටියෝ ද, ඒ පොළොව මගේ හිස පෙළයි. පිහිට වූ තැනින් බිය උපනි.

1293. යමක් නිසා බත පිසද්ද, යමක් නිසා සීත නසී ද, ඒ ගින්න මාගේ සිරුර දවයි. පිහිට වූ තැනින් බිය උපනි.

1294. අනුභව කළ යම් ආහාරයෙකින් බොහෝ බ්‍රාහමණ-යෝත් ක්‍ෂත්‍රියයෝත් යැපෙත් ද, අනුභව කරනලද ඒ ආහාරය මා විනාශ කරයි. පිහිට වූ තැනින් බිය උපනි.

1295. ග්‍රීෂ්ම ඍතුවේ අවසාන මාසයෙහි පඬිවරු වාතය කැමැති වෙති. ඒ වාතය මගේ සිරුර බිඳී. පිහිට වූ තැනින් බිය උපනි.

1296. පක්ෂීහු යම් ගසක් ඇසුරු කළෝ ද, ඒ ගස ගිනි පිට කෙරෙයි. කුරුල්ලනි, (අන්) දිසාවක් ඇසුරු කරවු. පිහිට වූ තැනින් බිය උපනි.

1297. මල්දම් පැළැඳි සඳුන් ගැල් වූ යමක සොම්නසින් ගෙනාවෙම් ද ඕ තොමෝ මා නිවෙසින් නෙරපන්නී ය. පිහිට වූ තැනින් බිය උපනි.

1298. උපන් යමකු නිසා ප්‍රීත වීම් ද, යමකුගේ දියුණුව බලාපොරොත්තු වූයෙම් ද, හේ මා ගෙයින් නෙරපයි. පිහිට වූ තැනින් බිය උපනි.

1299. රැස් වූ ජනපද වැසියෝ ද නියම්ගම් වැසියෝ ද මගේ කිම අසත්වා. යම් ජලයෙක් වී ද එය ගිනි ඇවිල ගත්තේ ය. යම් රජකුගෙන් ආරක්‍ෂාව වී ද ඔහුගෙන් බිය උපනි.

1300. රජතුමා ද පුරෝහිත බමුණා ද රට කොල්ල කති. පිහිට ඇති තැනින් බිය උපනි. තෙපි තොපගේ ම ආරක්‍ෂාව ඇත්තෝ ව වාසය කරවු.

6. පදමානවක ජාතක යි.

1301. අස්ස ඉන්ද සමො රාජ අච්චන්තං අජරාමරො,
සචෙ තං යඤ්ඤං යාජෙය්‍ය[1] ඉසිං ලොමසකස්සපං.

1302. සසමුද්දපරියායං මහිං සාගරකුණ්ඩලං,
න ඉච්ඡෙ සහ නින්දාය එවං සය්හ විජානහි.

1303. ධිරත්ථු තං යසලාභං ධනලාභං ච බ්‍රාහ්මණ,
යා වුත්ති විනිපාතෙන අධම්මචරණෙන වා.

1304. අපි චෙ පත්තමාදාය අනාගාරො පරිබ්බජෙ,
සා එව ජීවිකා සෙය්‍යො යා චාධම්මෙන එසනා.

1305. අපි චෙ පත්තමාදාය අනාගාරො පරිබ්බජෙ,
අඤ්ඤං අහිංසයං ලොකෙ අපි රජ්ජෙන තං වරං.

1306. බලං[2] චන්දො බලං සුරියො බලං සමණබ්‍රාහ්මණා,
බලං වෙලා සමුද්දස්ස බලාතිබලමිත්ථියො.

1307. යථා උග්ගතපං සන්තං ඉසිං ලොමසකස්සපං,
පිතු අත්ථා චන්දවතී වාජපෙය්‍යං අයාජයි[3].

1308. තං ලොභපකතං කම්මං කටුකං කාමහෙතුකං,
තස්ස මූලං ගවෙසිස්සං ඡෙච්ඡං රාගං සබන්ධනං.

1309. ධිරත්ථු කාමෙ සුබහූපි ලොකෙ
තපොව සෙය්‍යො කාමගුණෙහි රාජ,
තපො කරිස්සාමි පහාය කාමෙ
තවෙව රට්ඨං චන්දවතී ච හොතූති.

7. ලොමසකස්සපජාතකං.

1310. කාසායවත්ථෙ සකුණෙ වදාමි
දුවෙ දුවෙ නන්දිමනෙ[4] චරන්තෙ,
කං අණ්ඩජං අණ්ඩජා[5] මානුසෙසු
ජාතිං පසංසන්ති තදිඞ්ඝ බ්‍රූථ.

1. යජෙය්‍ය – මජසං.
2. බලා – මජසං.
3. අයාජසි – මජසං.
4. නන්දමනෙ – මජසං, ස්‍යා.
5. අණ්ඩජ – මජසං. ස්‍යා.

1301. ලොමස කසසප තවුසා ලවා පශුඝාතක යාගය කරවන්නේ නම් එකාන්තයෙන් අජරාමර වන්නෙහි ය. ශක්‍රයා හා සමාන රජෙක් වන්නෙහි ය.

1302. සය්හය, සයුර සීමා කොට ඇති, සයුරෙන් වට වූ මහපොළොවත් පශුඝාතක කර්මය නිසා ලැබෙන නින්දවත් කැමැති නො වෙමි. මෙසේ මෙය දනු මැනැවි.

1303. බමුණ, අධර්මයෙන් ලබන යම් කීර්තියෙක් හෝ ධනයෙක් හෝ වේ ද, අපායොත්පත්තියට හෙතුවන යම් දිවි පැවැත්මක් හෝ වේ ද අධර්ම චර්යාවෙක් හෝ වේ ද එයට නින්ද වේවා.

1304. අධාර්මික යම් සෙවීමක් වේ ද, එයට වඩා අනගාරික වැ පාත්‍රයක් ගෙන භික්‍ෂාටනයෙන් දිවි පැවැත්වීම ශ්‍රෙෂ්ඨ වේ.

1305. ගෙයක් නැතියේ නමුදු අන්‍යයන්හට හිංසා නො කොට පාත්‍රයක් ගෙන පිඩුසිඟා හැසිරෙන්නේ නම්, රාජ්‍යයට වඩා එය උතුම් වේ.

1306. අඳුර නසන හෙයින් චන්ද්‍රයා බලයෙකි. සූර්යයා ද එබඳු බලයෙකි. හොඳ නරක ඉවැසීමට සමත් හෙයින් මහණ බමුණෝ ද බල නම් වෙති. මුහුද වෙරළ ඉක්මැ නොයන හෙයින් වෙරළ ද බල නම් වේ. ස්ත්‍රීහු මෙසියල්ලට වඩා බල වෙති.

1307. යම්සේ උග්‍ර තපස් සහිත වූ ලොමස කසසප නමැති සෘෂිවරයා ලවා චන්ද්‍රවතී බිසෝ සිය පියාණනට යහපත පිණිස වාජපෙය්‍ය නම් යාගය කැර වී ද, එසේ හෙයින් මෙකී සියලු බලයනට වඩා ස්ත්‍රී බලයෙකි.

1308. මා විසින් මේ චන්ද්‍රවතිය කෙරේ ලොභ උපදවා ඒ ලොභයෙන් කළ කාමහෙතුක වූ ඒ පාපක්‍රියාව කටුක විපාක ඇත්තේ ය. ඒ පාපක්‍රියාවෙහි මූල හෙතුව සොයන්නෙමි. බැඳුම් සහිත රාගය සිඳ දමන්නෙමි.

1309. රජතුමනි, ලොකයෙහි ඉතා බොහෝ වූ ද කාමයනට නින්ද වේවා, මේ කාමසම්පත්තීනට වඩා තපස ශ්‍රෙෂ්ඨ වේ. එහෙයින් කාමයන් හැර දමා තපස්චර්යාව කරන්නෙමි. රට ද චන්ද්‍රවතී කුමරිය ද ඔබට ම වේවා.

7. ලොමසකස්සප ජාතක යි.

1310. කසටවත් පෙරෙවියන් බඳු රන්වන් පැහැ ඇති ව යුගළ යුගළ වැ සතුටු සිතැති ව හැසිරෙන පක්ෂීන් වූ තොපට කියමි. (විචාරමි) එම්බා කුරුල්ලෙනි, මිනිසුන් අතරේ කවර නමෙකින් තොපගේ ජාතිය පසසත් දැ යි කියවු.

1311. අම්හෙ මනුස්සෙසු මනුස්සහිංස
අනුබ්බකෙ චක්කවාකෙ වදන්ති,
කල්‍යාණභාවම්හ දිජෙසු සම්මතා
අභීතරූපා විචරාම අණ්ණවෙ.

1312. කිං අණ්ණවෙ කානි ඵලානි භුඤ්ජ
මංසං කුතො ඛාදථ චක්කවාකා,
කිං භොජනං භුඤ්ජථ වො අනොමා
බලඤ්ච වණ්ණො ච අනප්පරූපො.

1313. න අණ්ණවෙ සන්ති ඵලානි ධඞ්ක
මංසං කුතො ඛාදිතුං චක්කවාකෙ,
සෙවාලභක්ඛම්හ අවාක[1] භොජනා
න සාසහෙතු පකරොම පාපං.*

1314. න මෙ ඉදං රුච්චති චක්කවාකෙ
අස්මිං භවෙ භොජනසන්නිකාසො,
අහොසි මෙ පුබ්බෙ තතො මෙ අඤ්ඤථා
ඉච්චෙව මෙ විමති එත්ථ ජාතා.

1315. අහම්පි මංසානි ඵලානි භුඤ්ජෙ
අන්නානි ච ලොණියතෙලියානි,
රසං මනුස්සෙසු ලභාමි භොත්තුං
සූරොව සඞ්ගාම මුඛම්හි පෙත්වා[2].
න ච මෙ තාදිසො වණ්ණො
චක්කවාක යථා තව.

1316. අසුද්ධභක්ඛොසි ඛණානුපාතී
කිච්ඡෙන තෙ ලබ්භති අන්නපානං,
න තුස්සසි රුක්ඛඵලෙහි ධඞ්ක
මංසානි වා යානි සුසානමජ්ඣෙ.

1317. යො සාහසෙන අධිගම්ම භොගෙ
පරිභුඤ්ජති ධඞ්ක ඛණානුපාතී,
තතො උපක්කොසති නං සභාවො
උපක්කුට්ඨො වණ්ණබලං ජහාති.

1318. අප්පම්පි චෙ නිබ්බුතිං භුඤ්ජති යදි
අසාහසෙන අපරූපඝාතී
බලඤ්ච වණ්ණො ච තදස්ස හොති
න හි සබ්බො ආහාරමයෙන වණ්ණොති.

8. චක්කවාකජාතකං.

*. නසාස හෙතුපි කරොම පාපං – ස්‍යා. මජ්සං. මරම්මා සීහලපොත්ථකෙසු දිස්සති.
1. අපාක – මජ්සං.
2. සූරොව සඞ්ගාම මුඛං විජෙත්වා – මජ්සං.

1311. මනුෂ්‍ය හිංසකය, ඔවුනොවුන් කෙරේ ප්‍රිය සිතැති ව වසන අප චක්‍රවාකයන් යැ යි මිනිස්සු කියති. කුරුල්ලන් අතුරෙහි කලණමිතුරුදම් ඇත්තෝ යැ යි සම්මතයෝ වෙමු. බිය රහිත වැ විලෙහි හැසිරෙමු.

1312. සක්වාවෙනි, තොපගේ බලය ද පැහැය ද අලාමක ය. කිමෙක් ද?, මේ විලෙහි කවර ඵල වර්ග බුදින්නෝ ද? කවරකුගේ මස් කන්නහු ද? කෙබඳු අහරක් බුදිවු ද?

1313. කවුඩාණෙනි, විලෙහි ඵලවර්ග නැත. සක්වාවනට කන්නට මස් කොතැනින් ලැබේ ද? අපි පොතු රහිත සෙවෙල් බුදින්නමෝ වෙමු. ආහාරය සඳහා පව් නො කරමු.

1314. සක්වාවනි, තෙපගේ ආහාරය මට නො රිසියෙයි. එහෙයින් මේ චක්‍රවාක වර්ගයාගේ ආහාරයට සමාන ආහාර (සෙසු පක්ෂීනට) නැත්තේ යැ යි මට 'පෙර මෙසේ විය. එයට පසු අන් අයුරෙකින් වී ය' කියා තොපගේ ශරීර වර්ණය පිළිබඳ සැකයෙක් හටගනී.

1315. මමත් මස් ද ගෙඩි ද ලුණු හා තෙල් සහිත ආහාර ද බුදිමි. සංග්‍රාම භූමියෙහි ශූරයකු පරිදි මිනිසුන් සතු ආහාර පැහැර ගෙන කමි. සක්වාවනි, එසේ වුව ද තොපගේ පැහැයට සමාන පැහැයෙක් මට නැත.

1316. කාකය, ඔබ අපවිත්‍ර දෙය බුදින්නෙහි ය. ප්‍රමාද වූ මොහොතෙහි (සිටි තැනින්) වැටෙන සුලුයෙහි. කන බොන දෑය තට දුකසේ ලැබේ. රුක්හි ඵලයෙන් ද සොහොන්මැද යම් මසෙක් වේ නම් එයින් ද තෘප්ත නො වන්නෙහි ය.

1317. මොහොතින් (හුන් තැනින්) වැටෙන ස්වභාවය ඇති කාකය, යමෙක් බලහත්කාරයෙන් ලැබ ගත් ආහාර බුදී ද ඔහුට ස්වභාවධර්මය නින්ද කෙරේ. එසේ නින්ද කරන ලද (ඔහුගේ) වර්ණය ද බලය ද හරී.

1318. ඉදින් සැහැසිකම නො කිරීමෙන් ද අනුන් නොනසනුයෙ දැහැමින් ලද මඳ වූ හෝ ආහාර වළඳා (වෙසේ) නම්, ඔහුගේ ශරීර ශක්තිය ද පැහැය ද හටගන්නේ ය. වර්ණය මුළුමනින් ම ආහාරය නිසා හටගන්නේ නො වේ.

8. චක්කවාක ජාතක යි.

1319. සුතිතික්ඛං අරඤ්ඤම්හි පන්තම්හි[1] සයනාසනෙ,
යෙ ච ගාමෙ තිතික්ඛන්ති තෙ උළාරතරා තයා.

1320. අරඤ්ඤා ගාමමාගම්ම කිං සීලං කිං වතං අහං,
පුරිසං තාත සෙවෙය්‍යං තම්මෙ අක්ඛාහි පුච්ඡිතො.

1321. යො තෙ[2] විස්සසතෙ[3] තාත විස්සාසඤ්ච ඛමෙය්‍ය තෙ,
සුස්සූසී ච තිතික්ඛී ච තං භජෙහි ඉතො ගතො.

1322. යස්ස කායෙන වාචාය මනසා නත්ථි දුක්කතං,
උරසීව පතිට්ඨාය තං භජෙහි ඉතො ගතො.

1323. යො ච ධම්මෙන චරති චරන්තොපි න මඤ්ඤති,
විසුද්ධකාරිං සප්පඤ්ඤං තං භජෙහි ඉතො ගතො.

1324. හලිද්දිරාගං[4] කපිචිත්තං පුරිසං රාගවිරාගිනං,
තාදිසං තාත මා සෙවි නිම්මනුස්සම්පි චෙ සියා.

1325. ආසී[5]විසංව කුපිතං[6] මීළ්හලිත්තං මහාපථං,
ආරකා පරිවජ්ජෙහි යානීව විසමං පථං.

1326. අනත්ථා තාත වඩ්ඪන්ති බාලං අච්චුපසෙවතො,
මාස්සු බාලෙන සඞ්ගඤ්ඡි[7] අමිත්තෙනෙව සබ්බදා.

1327. තං තාහං තාත යාචාමි කරස්සු වචනං මම,
මාස්සු බාලෙන සඞ්ගඤ්ඡි දුක්ඛො බාලෙහි සඞ්ගමොති.

9. හලිද්දිරාගජාතකං.

---

1. පකතම්හි – මජසං, සයා.
2. තං - සයා.
3. විස්සාසයෙ – මජසං.
4. හලිද්ද – සයා.
5. ආසි – මජසං.
6. කුප්පිතං – මජසං.
7. සංගච්ඡි – මජසං, සයා.

1319. වනයේ ඉතා දුර පිහිටි සෙනාසනයේ ශීතාදිය ඉවැසිය හැකි ය. යම් කෙනෙක් ගමෙහි දී ශීතාදිය ඉවසත් ද ඔවුහු ඒ ඉවැසීමෙන් වනවාසීනට වඩා උදුර වෙති.

1320. පියාණෙනි, මම වනයෙන් ගමට අවුත් කෙබඳු වූ ශීලයක් කෙබඳු වතක් කෙබඳු පුරුෂයකු ඇසුරු කරම් ද? විචාරන ලද ඔබ එය මට කියන්න.

1321. පුත්‍රය, යමෙක් තා හා විශ්වාස කෙරේ ද, තා හා කළ විශ්වාසය බොහෝ කල් රකී ද, යමෙක් තාගේ කීම අසන්නට රිසියේ ද, යමෙක් තාගේ කීම ඉවසන්නේ ද, තෝ මේ වනයෙන් ගමට ගියෙහි ඔහු ඇසුරු කරව.

1322. මෙයින් නික්මැ ගිය තෝ, යමකුගේ කයින් හා වචනයෙන් හා සිතින් දුෂ්කෘතයෙක් (නොමනා ක්‍රියාවෙක්) නො වේ ද, (මව්) ළෙහි හොවා ගත් පුතකු සේ ඔහු සිතින් පිහිටුවා ගෙන (ඔහු කෙරෙහි විශ්වාසය පිහිටුවා) ඇසුරු කරව.

1323. යමෙක් සුචරිතයෙන් යුතු වැ හැසිරේ ද, එසේ හැසිරෙනුයේත් (මම් සුසිරි පුරමි යි) මානී නො වේ ද, දසපින්කම් කරන නුවණැති ඔහු, මෙයින් ගමට ගියෙහි, ඇසුරු කරව.

1324. දරුව, දඹදිව මිනිසුන්ගෙන් හිස්ව ගිය ද සපිර පැවැතුම් නැති, කහ පැහැයෙන් පැහැ ගැන්වූවා වැනි, වඳුරකුගේ සිත වැනි සිතැති, මොහොතින් ඇලීමත් මොහොතින් නො ඇලීමත් ඇති (චපල) පුරුෂයා ඇසුරු නො කරව.

1325. කිපුණු සපකු සේ, අශුචි වැකි මාවතක් සේ, යානයෙකින් යන්නහු විසම මඟක් සේ එවැනි මූඪයා දුරින් ම දුරු කරව.

1326. දරුව, මෝඩයා හා වැඩි ඇසුර කරන්නහුගේ අනර්ථ වැඩේ. හැම කල්හි ම සතුරකු සමඟ මෙන් ම මූඪයා සමඟ ද ඇසුරට නො යන්න.

1327. දරුව, මම තාගෙන් ඉල්ලමි. මාගේ වචනය කරව. මූඪයා හා ඇසුරට නො යව. කවර හෙයින් ද? මූඪ ආශ්‍රය දුක් ගෙන දෙන්නේ ය එහෙයිනි.

9. හලිද්දිරාග ජාතක යි.

1328. කුතො නු ආගච්ඡථ භො තයො ජනා
ස්වාගතං එථ[1] නිසීදථාසනෙ,
කච්චිත්ථ භොන්තො කුසලං අනාමයං
චිරස්සමබ්භාගමනං හි වො ඉධ

1329. අහමෙව එකො ඉධ මජ්ඣපත්තො
න චාපි මෙ දුතියො කොචි විජ්ජති,
කිමෙව සන්ධාය තෙ භාසිතං ඉසෙ
කුතො නු ආගච්ඡථ භො තයො ජනා.

1330. තුවඤ්ච එකො භරියා ච තෙ පියා
සමුග්ගපක්ඛිත්තනිකිණ්ණමන්තරෙ,
සා රක්ඛිතා කුච්ඡිගතාව තෙ සදා
වායුස්ස පුත්තෙන සහා තහිං රතා.

1331. සංවිග්ගරූපො ඉසිනා වියාකතො[2]
සො දනවො තත්ථ සමුග්ගමුග්ගිලි,
අද්දක්ඛි භරියං සුචි මාලධාරිනිං[3]
වායුස්ස[4] පුත්තෙන සහා තහිං රතං.

1332. සුදිට්ඨරූපුග්ගතපානුවත්තිනා.
හීනා නරා යෙ පමදවසංගතා
යථා හවෙ පාණරිවෙත්ථ රක්ඛිතා
දුට්ඨා මයී අඤ්ඤමභිප්පමොදති.

1333. දිවා ච රත්තො ච මයා උපට්ඨිතා
තපස්සිනා ජොතිරිවා වනෙ වසං,
සා ධම්මමොක්කම්ම අධම්මමාචරි
අකිරියරූපො[5] පමදහි[6] සන්ථවො.

1334. සරීරමජ්ඣම්හි ඨිතාති මඤ්ඤිහං[7]
මය්හං අයන්ති අසතිං අසඤ්ඤතං,
සා ධම්මමොක්කම්ම අධම්මමාචරි
අකිරියරූපො පමදහි සන්ථවො.

1335. සුරක්ඛිතං මෙති කථන්නු විස්සසෙ
අනෙකචිත්තාසු න හෙත්ථ රක්ඛණා,
එතා හි පාතාලපපාතසන්නිභා
එත්ථප්පමත්තො ව්‍යසනං නිගච්ඡති.

---

1. ස්වාගතා එථ – මජ්සං, ස්‍යා.
2. පබ්‍යාකතො – ස්‍යා. ව්‍යාකතො – මජ්සං.
3. භාරිනී. මජ්සං හරිනිං – ස්‍යා.
4. හරිස්ස – මජ්සං.
5. අක්‍රිය රූපො – මජ්සං ස්‍යා.
6. පමුදහි – මජ්සං. ස්‍යා.
7. මඤ්ඤාහං – මජ්සං.

1328. පින්වත්නි, තෙපි තිදෙන කොහි සිට එන්නහු ද? ආයේ මැනැවැ. මේ ආසනයෙහි ඉඳගනිවු. පින්වත්නි, කිම, දුකක් නැත්තෝ ද? නීරොගී ද? කලකට පසු ඔබගේ පැමිණීම විය.

1329. තවුසාණෙනි, මම හුදෙකලා වැ මෙහි පැමිණියෙමි. මට කිසි දු දෙවැන්නෙක් නැත. පින්වත, තෙපි තිදෙන කොහි සිට ආවහු දෑ යි තොප විසින් කවර හෙයින් කියන ලද ද?

1330. කරඬුවෙක තැබූ තොපගේ ප්‍රිය බිරිය බඩ තුළැ ය. තා විසින් රැකි තාගේ කුසට පත් ඇය වායුපුත්‍ර නමැති විද්‍යාධරයකු හා කුස තුළැ ම කෙලෙස් රතියෙන් ඇලී සිටින්නී ය.

1331. තවුසා විසින් මෙසේ කියන ලදු වැ කලකිරුණු දනව අසුරයා කරඬුව වමාළේ ය. එ විට වායුපුත්‍ර නමැති විද්‍යාධරයා ද එහි ඔහුට ඇලී හොත් සුවඳ මල්දරා සිටි බිරිය ද දිටී ය.

1332. තවුසාණන් වහන්ස, උග්‍ර ලෙස තාපස ධර්මය රක්නා වූ තොප විසින් කාරණය මැනැවින් දක්නාලද ස්වභාවය ඇත්තේ ය. යම්සේ එකාන්තයෙන් මෙහි ලා මාගේ පණ ලෙස රැකි බිරිය මා කෙරේ ද්‍රොහිණී වූවා අන් පුරුෂයකු වඩා රිසියෙයි. එහෙයින් යම් පුරුෂ කෙනෙක් මාගම් වසයට ගියෝ ද ඔව්හු හීනයෝ වෙති.

1333. වනයෙහි වෙසෙන තවුසකු විසින් ගින්නක් මෙන්, රෑ දවල්හි උවටන් කරන ලද්දී ද ඕ පතිවත දහමින් ඉවත් වැ අධර්මයෙහි හැසුරුණා ය. එහෙයින් ස්ත්‍රීන් හා ඇසුර නොකළ යුතු ස්වභාවය ඇත්තෙක.

1334. මාගේ කුස තුළැ සිටියා යි ද මෝ මාගේ යැයි ද අසත්පුරුෂ වූ, සංයම නැති මැය (ගැන) සිතීමි. එහෙත් ඕ පතිවත දහමින් ඉවත් වැ අධර්මයෙහි හැසුරුණා ය. එහෙයින් ස්ත්‍රීන් හා ඇසුර නො කටයුතු ය.

1335. මෝ මා විසින් මැනැවින් රක්නා ලදෑ යි නුවණැත්තේ කෙසේ නම් ස්ත්‍රිය හඳහන්නේ ද? නානාවිධ සිතුවිලි ඇති ස්ත්‍රීන් විෂයයෙහි රැකීමෙක් නැත. එය එසේ ම ය. ස්ත්‍රීහු ලොකාස්වාද-රතියෙන් තෘප්තිමත් නොවන හෙයින් මහමුහුදේ ප්‍රපාතයකට සමානයහ. මෙසේ වූ ස්ත්‍රීන් කෙරේ ප්‍රමත්ත වූ පුරුෂයා විනාශයට යෙයි.

1336. තස්මා හි තෙ සුඛිනො වීතසොකා
යෙ මාතුගාමෙහි චරන්ති නිස්සටා,
එතං සිවං උත්තම මාභිපත්ථයං[1]
න මාතුගාමෙහි කරෙය්‍ය සන්ථවන්ති.

10. සමුග්ගජාතකං.

1337. න ඛො මෙ රුච්චති ආළි පූතිමංසස්ස පෙක්ඛණා,
එතාදිසා සඛාරස්මා ආරකා පරිවජ්ජයෙ.

1338. උම්මත්තිකා අයං වෙණී වණ්ණෙති පතිනො සඛිං,
පජ්ඣාති පටිගච්ඡන්තිං ආගතං මෙළමාතරං.[2]

1339. ත්වං ඛොසි සම්ම උම්මත්තො දුම්මෙධො අවිචක්ඛණො
යො ත්වං මතාලයං කත්වා අකාලෙන විපෙක්ඛසි.

1340. න අකාලෙ විපෙක්ඛෙය්‍ය කාලෙ පෙක්ඛෙය්‍ය පණ්ඩිතො,
පූතිමංසොව පජ්ඣාති යො අකාලෙ විපෙක්ඛති.

1341. පියං ඛො ආළි මෙ හොතු පුණ්ණපත්තං දදහි මෙ,
පති සංජීවිතො මය්හං එය්‍යාසි පියපුච්ඡිකා.

1342. පියං ඛො ආළි තෙ හොතු පුණ්ණපත්තං දදමි තෙ,
මහතා පරිවාරෙන එස්සං[3] කයිරාහි[4] භොජනං.

1343. කීදිසො[5] තුය්හං පරිවාරො යෙසං කාහාමි භොජනං,
කිංනාමකා ච තෙ සබ්බෙ තං මෙ[6] අක්ඛාහි පුච්ඡිතා.

1344. මාලියො චතුරක්ඛො ච පිඞ්ගලො අථ ජම්බුකො,
එදිසො මය්හං පරිවාරො තෙසං කයිරාහි[7] භොජනං.

1345. නික්ඛන්තාය අගාරස්මා භණ්ඩකම්පි විනස්සති,
ආරොග්‍යං ආළිනො වජ්ජං ඉධෙව වස මාගමාති.

11. පූතිමංසජාතකං.

1346. යො තෙ පුත්තකෙ අඛාදි[8] දින්නභත්තො අදූසකෙ
තස්මිං දඨං නිපාතෙහි මා තෙ මුඤ්චිත්ථ[9] ජීවතො[10].

1347. ආකිණ්ණලුද්දො පුරිසො ධාතිචෙලංව මක්ඛිතො,
පදෙසං තං න පස්සාමි යත්ථ දඨං[11] නිපාතයෙ.

1. මභිපත්ථය – මජසං.
2. මෙළභං – මජසං.
3. එසං – සීමු.
4. කයිරාසි – සීමු.
5. කිංදිසො – මජසං.
6. තෙමෙ – සීමු
7. කයිරාසි – සීමු.
8. අක්ඛාදි – සයා.
9. මුච්චිත්ථ – සීමු.
10. ජීවක – සයා. ජීවිකො – මජසං.
11. දඨා – සයා.

1336. එහෙයින් යම් කෙනෙක් ස්ත්‍රීන්ගෙන් දුරු වැ හැසිරෙද්ද, ඔහු සැප ඇත්තෝ වෙති. ශොක නැත්තෝ වෙති. උතුම් ධ්‍යාන සුවය පතනුයේ මාගමුන් හා එක්ව හැසිරීම නො කරන්නේ ය.

10. සමුග්ග ජාතක යි.

1337. යෙහෙළිය, පූතිමාංස නමැති තිගේ සැමියාගේ බැල්ම මට නො රුස්නේ ය. මෙබඳු මිතුරාගෙන් ප්‍රයොගයෙන් දුරින් ම දුරු වන්නේ ය.

1338. උමතු වූ මේ වේණී තොමෝ සැමියා හමුවේ යෙහෙළියගේ ගුණ කියයි. ආවා වූ මේලමාතා නමැති එළිය පෙරළා යන්නිය ගැන ශොක කෙරේ.

1339. මිතුර, ඔබ මළ එකකුසේ කොට ගෙන නුසුදුසු වෙලාවෙහි බැලූහ. ඒ ඔබ විචාරබුද්ධිය රහිත පිස්සෝ වෙති.

1340. නුවණැත්තේ, අකාලයෙහි හෙවත් කාමගුණ ශුභ වශයෙන් සිතක් උපන් කල්හි නො බලන්නේ ය, කාලයෙහි හෙවත් අශුභ වශයෙන් සිත් උපන් කල්හි බලන්නේ ය, යමෙක් නුසුදුසු අවස්ථායෙහි බලා ද හේ, පූතිමාංස හිවලා මෙන් කනස්සලු වේ.

1341. යෙහෙළිය, මට ප්‍රිය තැනැත්තකු වේවා, මට තුටු පඬුරු දෙව, මාගේ සැමියා ජීවත් වේ. ප්‍රියයන් විචාරන්නිය මා සමග එන්න.

1342. යෙහෙළිය මාගේ ප්‍රිය තැනැත්තකු වේවා, ඔබට තුටු පඬුරු දෙමි, මහත් පරිවාර සම්පත් සහිත ව එන්නෙමි. අපට ආහාර පිළියෙළ කරන්න.

1343. යම් කෙනකුන්ට ආහාර පිළියෙළ කරම් ද (ඒ) ඔබගේ පිරිවර කෙබඳු ද? ඒ හැම කෙබඳු නම් ඇත්තෝ ද? විචාරන්නා වූ මට එය කියන්න.

1344. මාලිය, චතුරක්ඛ, පිංගල සහ ජම්බුක යන මොව්හු මාගේ පිරිවර සමූහය වේ. ඔවුනට සුදුසු ආහාර පිළියෙළ කරන්න.

1345. ගෙයින් බැහැර ගිය කලැ ගෙයි භාණ්ඩ විනාශ වෙයි, ඔබගේ මිතුරාට (ඔබේ) සුවදුක් කියමි. එහෙයින් මෙහි මැ (ගෙයි මැ) වාසකර, පිටතට නො යන්න.

11. පූතිමාංස ජාතක යි.

1346. තා විසින් පිස දුන් බත් ලැබූ යමෙක් තොපගේ නිරපරාධ වූ දරුවන් කැයේ ද ඔහුට දළින් පහර දෙව. තාගේ අතින් නො මිදේවා.

1347. ඉතා කැකුළු පැවැතුම් ඇති පුරුෂයා කිරිමවකගේ වස්ත්‍රයක් මෙන් අපවිත්‍ර ය. එහෙයින් සිරුරෙහි යම් කොටසෙක දළ පහර දෙම් ද එයට (යොග්‍ය) ශරීරයෙහි කොටසක් නො දකිමි.

1348. අකතඤ්ඤුස්ස පොසස්ස නිච්චං විවරදස්සිනො,
සබ්බං චෙ පථවිං දජ්ජා නෙව නං අභිරාධයෙ.

1349. කින්නු සුබාහු තරමානරූපො
පච්චාගතොසි සහ මාණවෙන,
කිං කිච්චමත්ථං ඉධමත්ථි තුය්හං
අක්ඛාහි මෙ පුච්ඡිතො එතමත්ථං.

1350. යො තෙ සඛා දද්දරො සාධුරූපො
තස්ස වධං පරිසඞ්කාමි අජ්ජ,
පුරිසස්ස කම්මායතනානි සුත්වා
නාහං සුඛිං දද්දරං අජ්ජ මඤ්ඤෙ

1351. කානිස්ස කම්මායතනානි අස්සු
පුරිසස්ස වුත්තිසමොධානතාය
කං වා පටිඤ්ඤං පුරිසස්ස සුත්වා
පරිසඞ්කසි දද්දරං මාණවෙන.

1352. චිණ්ණා කලිඞ්ගා චරිතා වණිජ්ජා[1]
වෙත්තාචරො සඞ්කුපථොපි චිණ්ණො,
නටෙහි චිණ්ණං සහ වාකුරෙහි[2]
දණ්ඩෙන යුද්ධම්පි සමජ්ජමජ්ඣෙ.

1353. බද්ධාකුලිකා මිතමාළ්හකෙන
අක්ඛා ජිතා[3] සංයමො අබ්භතීතො,
අප්පහිතං පුප්ඵකං අඩ්ඪරත්තං
හත්ථා දඩ්ඪා පිණ්ඩපටිග්ගහෙන.

1354. තානිස්ස කම්මායතනානි අස්සුං
පුරිසස්ස වුත්තිසමොධානතාය,
යථා අයං දිස්සති ලොමපිණ්ඩො
ගාවො හතා කිං පන දද්දරස්සාති.

12. තිත්තිරජාතකං.

ගිජ්ඣවග්ගො පඨමො.

තස්සුද්දානං:

වරගිජ්ඣ සමජ්ජනං හංසවරො
නිධිසව්හය හාරිත පාටලිකො,
අජරාමර ධංක තිත්තික්ඛකුතො
අථ අට්ඨාදස පෙක්ඛන දද්දරිති.

නවකනිපාතං නිට්ඨිතං.

1. වාණිජ්ජා – මජසං.
2. වාකරෙහි – අ.
3. විතා – සීමු.

1348. කළගුණ නො දන්නා නිතර අනුන්ගේ වරද සොයන පුරුෂයාට සියලු පොළොව ම දුන්නේ නමුදු ඔහු සතුටු කළ නො හැක.

1349. ව්‍යාඝ්‍රය, යුහුසුලු ගතියකින් මෙන් මාණවකයකු හා කුමක් හෙයින් පෙරළා ආයෙහි ද? මෙහි තොපට කුමන වැඩක් තිබේ ද? මා විසින් විචාරන ලද්දෙහි මේ කරුණ කියව.

1350. මනා පැවැතුම් ඇති තොපගේ මිතුරු වූ යම් වටුවෙක් වේ ද, දැන් ඒ පුරුෂයාගේ කටයුතු අසා ඇති හෙයින් සැක කරමි, අද වටුවා සැපසේ ඇතැ යි මම නො සිතමි.

1351. මේ පුරුෂයාගේ දිවි පැවැත්වීමට කෙබඳු වැඩක් (කරන ලද දෑ යි) ඇසූයේ ද, පුරුෂයාගේ කවර පොරොන්දුවක් අසා මාණවකයා විසින් තිත්තිර පඬිතුමා මරන ලදැ යි සැක කෙරෙහි ද?

1352. කලිඟු දෙශයෙහි හැසිරු පුරුදු ඇත. වෙළෙඳාම් කොට පුරුදු ඇත. වේවැලේ උපකාරයෙන් යායුතු කණු සහිත මාර්ගයන්හි ඇවිද පුරුදු ඇත. නළුවන් හා හැසිරෙන ලද වරදල් වැද්දන් හා හැසිරෙන ලද පිරිස්මැද මුගුරෙන් සටන් කොට පුරුදු ඇත.

1353. ඔහු විසින් සියොත්හු ද බඳින ලදහ. නැළියෙන් වී ආදි ධාන්‍ය මනින ලද. දූකෙළියෙන් දිනන ලද. ශීල සංයමය ඉක්මවා ගියේ ය. මධ්‍යමරාත්‍රියෙහි ලේ වැගිරීම නවතාලී ය. පිඩු සිඟාගිය අවදියෙහි උණු අහර පිළිගැනීමේ දී අත් දැවිණි.

1354. ජීවිකා වෘත්තිය පිණිස (කළ) මේ පුරුෂයාගේ ඒ කටයුතු ඇසීමි, වටුවාගේ ලොම්ගුලි (පිහාටුරොද) ජටායෙහි යම්සේ දක්නා ලැබේ ද, එහෙයින් ගවයෝ ද මොහු විසින් මරන ලදහ යි (සිතමි). වටුවා ගැන කියනු කවරේ ද?

තිත්තිර ජාතක යි.

පළමුවන ගිජ්ඣ වර්ග යි.

එහි උද්දානය:

ගිජ්ඣ ජාතක යැ කොසම්බි ජාතක යැ මහාසුක ජාතක යැ චුල්ලසුක ජාතක යැ හාරිත ජාතක යැ පදමාණවක ජාතක යැ ලොමසකස්සප ජාතක යැ චක්කවාක ජාතක යැ හලිද්දිරාග ජාතක යැ සමුග්ග ජාතක යැ පූතිමංස ජාතක යැ තිත්තිර ජාතක යැ යි ජාතක දසයෙකි.

නවක නිපාතය නිමි.

10. දසකනිපාතො

1355. චතුද්වාරමිදං නගරං ආයසං[1] දළ්හ පාකාරං,
ඔරුද්ධ පති[2]රුද්ධොස්මි කිං පාපං පකතං මයා.

1356. සබ්බෙ අපිහිතා ද්වාරා ඔරුද්ධොස්මි යථා ද්විජො[3],
කිමාධිකරණං[4] යක්ඛ චක්කාභිනිහතො අහං.

1357. ලද්ධා සතසහස්සානි අතිරෙකානි වීසති,
අනුකම්පකානං ඤාතීනං වචනං සම්ම නාකරි.

1358. ලඞ්ඝිං සමුද්දං පක්ඛන්දි සාගරං අප්පසිද්ධිකං.
චතුබ්භි[5] අට්ඨජ්ඣගමා අට්ඨාහිපි සොළස,
සොළසාහි ච බත්තිංසා[6] අත්‍රිච්ඡං[7] චක්කමාසදෙ;
ඉච්ඡාහතස්ස පොසස්ස චක්කං භමති මත්ථකෙ.

1359. උපරි විසාලා දුප්පූරා ඉච්ඡා විසටගාමිනී,
යෙ ච තං අනුගිජ්ඣන්ති තෙ හොන්ති චක්කධාරිනො.

1360. බහුං භණ්ඩං[8] අපහාය[9] මග්ගං අප්පටිවෙක්ඛිය,
යෙසං චෙතං අසඞ්ඛාතං[10] තෙ හොන්ති චක්කධාරිනො.

1361. කම්මං සමෙක්ඛෙ විපුලඤ්ච භොගං
ඉච්ඡං න සෙවෙය්‍ය[11] අනත්ථසංහිතං,
කරෙය්‍ය වාක්‍යං අනුකම්පකානං
තං තාදිසං නාතිවත්තෙය්‍ය චක්කං.

1362. කීව[12] චිරං නු මෙ යක්ඛ චක්කං සිරසි ඨස්සති,
කති වස්සසහස්සානි තං මෙ අක්ඛාහි පුච්ඡිතො.

1363. අතිසරො අච්චසරො මිත්තවින්ද සුණොහි මෙ,
චක්කං තෙ සිරමාවිද්ධං න තං ජීවං පමොක්ඛසීති.

1. චතුද්වාරජාතකං.

1364. කණ්හාවත්තායං පුරිසො කණ්හං භුඤ්ජති භොජනං,
කණ්හෙ භූමිපදෙසස්මිං න මය්හං මනසො පියො.

---

1. ආසයං – මජසං.
2. පටි – මජසං, ස්‍යා.
3. දිජො – මජසං, ස්‍යා.
4. කිමධි – මජසං.
5. චතුහි – අ.
6. ද්වත්තිංස – මජසං.
7. අත්‍රිච්ඡං – මජසං.
8. බහුබණ්ඩං – මජසං, ස්‍යා.
9. අවහාය – මජසං, වීමු.
10. අසඞ්ඛාතා – මජසං.
11. සෙවෙ – මජසං.
12. කිංව – මජසං.

10. දසක නිපාතය

1355. ශක්තිසම්පන්න වූ යමුවා තොරණ ඇති මේ නගරයෙහි දොරටු සතරෙක් ඇත. (නුවර වටා) පවුරෙන් වට කරන ලද්දේ ය. මා කවර පාපයෙක් කරන ලද ද?

1356. යක්ෂය, දොරටු සියල්ල වසා ඇත. මැදිරියක වෙසෙන පක්ෂියකු සේ ගමනට බාධා ඇත්තෙම් වෙමි, කවර කරුණක් නිසා මම චක්‍රයෙන් පහර ලද්දෙම් ද?

1357. මිතුර, (මවගෙන්) දහසක් ද වෙළෙඳාමෙන් එක්ලක්‍ෂ විසිදහසක් ද ලදුයේ නමුදු සානුකම්පික නෑයන්ගේ කීම පරිදි නො කෙළේ ය. විනාස බහුල වූ සාගර නමැති මුහුදට පැන්නේ ය.

1358. සතර දෙනාගෙන් සතුටු නො වූ (හේ) අට දෙනකු සමීපයට ගියේ ය. අට දෙනකු සමීපයෙන් සොළොස් දෙනකු සමීපයට ගියේ ය, සොළොස් දෙනකු සමීපයෙන් දෙතිස් දෙනකු සමීපයට ගියේ ය, (එහෙයින්) ක්‍ෂුර චක්‍රයට (ඉතා තියුණු මුවාත ඇති රවුම් අවිය) වඩාත් සමීප විය. තෘෂ්ණාව නිසා වනසට පත් පුරුෂයා මතැ ක්‍ෂුර චක්‍රය කැරකෙයි.

1359. මතු මත්තෙහි විශාල වන පූරවන්නට නො හැකි පංචකාමයන්හි පැතිරෙන තෘෂ්ණාව කෙරෙහි කෙනෙක් ගිජු වූහු ද ඔව්හු ක්‍ෂුර චක්‍රය දරන්නෝ වෙති.

1360. වස්තු රැසක් හැර දමා (යා යුතු) මග දෙස නො බලා කිසිවෙක් (සිය) සිත පිළිබඳ ව සැලැකිලිමත් නො වෙත් ද, ඔව්හු ක්‍ෂුර චක්‍රය දරන්නෝ ය.

1361. නැණවත් පුරුෂයා කරන දේ සදෙස් ද නිදෙස් දැ යි විමසන්නේ ය. දැහැමිව සපයා ගත් සිය වස්තු සම්භාරය ද විමසා බලන්නේ ය, අනුකම්පා ඇත්තන් කියන ලෙස ක්‍රියා කරන ඔබ ක්‍ෂුර චක්‍රය නො මඩනේ ය.

1362. යක්ෂය, මේ ක්‍ෂුර චක්‍රය මගේ හිසැ මත්තෙහි කෙතෙක් කල් පවත්නේ ද? අවුරුදු කීදහසක් සිටිනේ ද? විචාරන මට එය කියව.

1363. මිත්‍රවින්‍දක, මා කියන්නක් අසව, තෝ ඉතා බල-වත් දෙස් (පාපකම්) ඇත්තෙහි. තාගේ හිසැ ඇමිණී තිබෙන ක්‍ෂුරචක්‍රය තාගේ දිවිහිමියෙන් නො හරනේ යි.

1. චතුද්වාර ජාතක යි.

1364. කළු පැහැති මෙ පුරුෂයා කළු පැහැති බොජුන් බුදී. කළු පාට බිම් පියෙසකැ (මෙ තෙමේ) වෙසේ. (මෙය) මාගේ සිතට ප්‍රිය නො වේ.

1365. න කණ්හො තචසා හොති අන්තොසාරො බ්‍රාහ්මණො
යස්මිං පාපානි කම්මානි සවෙ කණ්හො සුජම්පති.

1366. එතස්මිං තෙ සුලපිතෙ පතිරූපෙ සුභාසිතෙ,
වරං බ්‍රාහ්මණ තෙ දම්මි යං කිඤ්චි මනසිච්ඡසි.

1367. වරං චෙ මෙ අදො සක්ක සබ්බභූතානමිස්සර,
සුනික්කොධං[1] සුනිද්දොසං නිල්ලොභං වුත්තිමත්තනො.
නිස්සෙනහමහිකඞ්ඛාමි එතෙ මෙ චතුරො වරෙ.

1368. කින්නු කොධෙ ච දොසෙ වා ලොභෙ සෙනහෙව බ්‍රාහ්මණ,
ආදීනවං සම්පස්සසි[2] තං මෙ අක්ඛාහි පුච්ඡිතො.

1369. අප්පො හුත්වා බහු හොති වඩ්ඪතෙ සො අඛන්තිජො,
ආසඞ්ගී බහුපායාසො තස්මා කොධං න රොචයෙ.

1370. දුට්ඨස්ස ඵරුසා වාචා පරාමාසො අනන්තරා,
තතො පාණී තතො දණ්ඩො සත්ථස්ස පරමා ගති[3]
දොසො කොධසමුට්ඨානො තස්මා දොසං න රොචයෙ.

1371. ආලොපසහසාකාරා නිකතී වඤ්චනානි ච,
දිස්සන්ති ලොභධම්මෙසු තස්මා ලොභං න රොචයෙ.

1372. සෙනහසඞ්ගථිතා ගන්ථා[4] සෙන්ති මනොමයා පුථූ,
තෙ භුසං උපතාපෙන්ති තස්මා සෙනහං න රොචයෙ.

1373. එතස්මිං තෙ සුලපිතෙ පතිරූපෙ සුභාසිතෙ,
වරං බ්‍රාහ්මණ තෙ දම්මි යං කිඤ්චි මනසිච්ඡසි.

1374. වරං චෙ මෙ අදො සක්ක සබ්බභූතානමිස්සර,
අරඤ්ඤෙ මෙ විහරතො නිච්චං එකවිහාරිනො.
ආබාධා මා උප්පජ්ජෙය්‍යුං අන්තරායකරා භුසා.

1375. එතස්මිං තෙ සුලපිතෙ පතිරූපෙ සුභාසිතෙ,
වරං බ්‍රාහ්මණ තෙ දම්මි යං කිඤ්චි මනසිච්ඡසි.

1376. වරං චෙ මෙ අදො සක්ක සබ්බභූතානමිස්සර
න මනො වා සරීරං වා මඞ්කතෙ සක්ක කස්සචි
කදාචි උපහඤ්ඤෙථ එතං සක්ක වරං වරෙති.

2. කණ්හජාතකං.

1. සුනිකොධං – මජසං.
2. ආදීනවං සමපස්සී – මජසං
3. පරාමසති – මජසං, සයා.
4. සඞ්ගත්ථිතා – සයා.

1365. ශක්‍රය, හම කළුපැහැය ඇති වීමෙන් (කෙනකු) කළු නො වේ. සීලාදි ගුණසාරයන් ඇතුළතැ පිහිටියේ (නම්) බ්‍රාහ්මණ නම් වෙයි. ඉදින් යමකු කෙරෙහි පාපකර්‍ම ඇත්තේ ද හේ එකැතින් කළුවෙක් වේ.

1366. බමුණ, තොපට ඔබින යහපත් ප්‍රකාශය නිමිත්තෙන් කැමැති වරයක් තොපට දෙමි.

1367. සර්වභූතයන්ට ඊශ්වර වූ දෙවෙන්ද්‍රය, මට වරයක් දේ නම්, මෙරමා කෙරෙහි ක්‍රොධ රහිත වූ, ද්වෙෂ රහිත වූ, ලොභ රහිත වූ, ස්නෙහ රහිත වූ වරයක් රුස්නෙමි. මේ වර සතර මට දෙනු මැනැවි.

1368. බමුණ, ක්‍රොධයෙහි, ද්වෙෂයෙහි, ලොභයෙහි හෝ ස්නෙහයෙහි කෙබඳු දොෂයක් දක්නෙහි ද? විචාළ මට එය කියව,

1369. ඉවැසීම නැති බැවින් හටගන්නා කොපය ස්වල්ප වශයෙන් ඉපිද පසුව වැඩි වේ. නැවත නැවත හටගනී. දොෂයට ලක් වූවහුගෙන් ඉවත් ව යන්නට නො දී ආක්‍රොෂ කරවයි. බොහෝ සිත් තැවුල් උපදී. එහෙයින් ක්‍රොධය නො රුස්නෙමි.

1370. ද්වෙෂයෙන් දූෂිත වූවහුගේ වචනය ඵරුෂ වෙයි, අනතුරු ව දැඩි ව ගැනීම වෙයි, පසුව අත්පහර දෙයි. දඬුපහර දෙයි, ආයුධ පහර දෙයි. අවි පහර දී ද්වෙෂය මස්තකප්‍රාප්ත කරයි. ද්වෙෂය ක්‍රොධයෙන් හටගනී, එහෙයින් ද්වෙෂය නො රුස්නෙමි.

1371. ගම් පැහැරීම, බලාත්කාරයෙන් පැහැර ගැනීම, වංචා කිරීම, යන මේ පාප ක්‍රියා ලොභය ඇති කල්හි (සිදු කරනු) දක්නට ලැබෙති. එහෙයින් ලොභය නො රුස්නෙමි.

1372. නූලකින් මල් ගොතන්නා සේ නානාවිධ බොහෝ ආරම්මණයන්හි තෘෂ්ණායෙන් ඇමිණීම බොහෝ තැවුලි උපදවති, එහෙයින් ස්නෙහය නො රුස්නේ ය.

1373. බමුණ, ඔබට ඔබින යහපත් ප්‍රකාශය නිමිත්තෙන් කැමැති වරයක් ඔබට දෙනු කැමැත්තෙමි.

1374. දෙවෙන්ද්‍රය, ඉදින් මට වරයක් දේ නම් නිතර හුදෙකලා ව වනයෙහි වාසය කරන මට තවුස්දම් රැක ගැනීමෙ දී අන්තරාය කරන ආබාධයෝ නූපදනාහු නම් එබඳු වරයක් දුන මැනැවි.

1375. බමුණ, ඔබට ඔබින යහපත් ප්‍රකාශය නිමිත්තෙන් කැමැති වරයක් ඔබට දෙනු කැමැත්තෙමි.

1376. සව් සතුනට ඉසුරු වූ ශක්‍රය, ඉදින් මට වරයක් දේ නම් මා නිසා කිසිවකුගේ සිත, කය හෝ වචනය කිසිකලෙකැ අපවිත්‍ර නොවන වරයක් දුන මැනැවි.

2. කණ්හ ජාතක යි.

1377. යො කොපනෙය්‍යෙ න කරොති කොපං,
න කුජ්ඣති සප්පුරිසො කදාචි,
කුද්ධොපි යො නාවිකරොති කොපං
තං වෙ නරං සමණං[1] ආහු ලොකෙ.

1378. ඌනොදරො[2] යො සහතෙ ජිඝච්ඡං
දන්තො තපස්සී[3] මිතපානභොජනො,
ආහාරහෙතු න කරොති පාපං
තං වෙ නරං සමණං ආහු ලොකෙ.

1379. ඛිඩ්ඩං රතිං විප්පජහිත්වා[4] සබ්බං
න චාලිකං භාසති කිඤ්චි ලොකෙ,
විභූසනට්ඨානා විරතො මෙථුනස්මා
තං වෙ නරං සමණං ආහු ලොකෙ.

1380. පරිග්ගහං ලොභධම්මඤ්ච සබ්බං
යො වෙ පරිඤ්ඤාය පරිච්චජෙති,
දන්තං ඨිතත්තං අමමං නිරාසං
තං වෙ නරං සමණං ආහු ලොකෙ.

1381. පුච්ඡාම කත්තාරං අනොමපඤ්ඤං
ගාථාසු නො විග්ගහො අත්ථි ජාතො,
ඡින්දජ්ජ කඞ්ඛං විචිකිච්ඡිතානි
තයජ්ජ කඞ්ඛං විතරෙමු සබ්බෙ.

1382. යෙ පණ්ඩිතා අත්ථදසා භවන්ති
භාසන්ති තෙ යොනිසො තත්ථ කාලෙ,
කථං නු ගාථානං[5] අභාසිතානං
අත්ථං නයෙය්‍යුං කුසලා ජනින්ද.

1383. කථං හවෙ භාසති නාගරාජා
කථං පන ගරුළො වෙනතෙය්‍යො,[6]
ගන්ධබ්බරාජා පන කිං වදෙති
කථං පන කුරුනං රාජසෙට්ඨො.

1384. ඛන්තිං හවෙ භාසති නාගරාජා
අප්පාහාරං ගරුළො වෙනතෙය්‍යො
ගන්ධබ්බරාජා රතිවිප්පහානං
අකිඤ්චනං කුරුනං රාජසෙට්ඨො'ති.*

1385. සබ්බානි එතානි සුභාසිතානි
නහෙත්ථ දුබ්භාසිතමත්ථි කිඤ්චි,
යස්මිඤ්ච එතානි පතිට්ඨිතානි
අරාව නාභ්‍යා[7] සුසමොහිතානි,
චතුබ්භි ධම්මෙහි සමඞ්ගිභූතං
තං වෙ නරං සමණං ආහු ලොකෙ.

1. සමණමාහු – මජසං, ස්‍යා.
2. ඔනොදරො - ස්‍යා.
3. තපිසං – මජසං.
4. විප්පජහිත්වාන – මජසං, ස්‍යා.
5. කථානං – මජසං, ස්‍යා.
6. ගරුළො පන වෙනතෙය්‍යො කිමාහ - මජසං, ස්‍යා.
7. නභ්‍යා - මජසං, ස්‍යා.
* අයං ගාථා මුද්දිත ජාතකපාළියං නත්ථි.

1377. සත්පුරුෂ තෙම කිසි කලෙක නො කිපෙයි, යමෙක් කිපියයුතු පුද්ගලයා කෙරෙහි කොප නො කෙරේ ද, යමෙක් කිපියේ නමුදු කොපය පහළ නො කෙරේ ද, ඒ පුරුෂයා එකාන්තයෙන් (ශමිතපාප බැවින්) ශ්‍රමණ යැ යි ලොකයෙහි (පණ්ඩිතයෝ) කීහ.

1378. ඌන වූ උදරය (අල්පාහාර) ඇති යමෙක් සාගිනි ඉවසා ද ඉන්‍ද්‍රිය දමනයෙන් සමන්වාගත වූයේ තපස් ඇතියේ ප්‍රමාණ කරනලද ආහාරපාන ඇතියේ ආහාර හෙතුයෙන් පව් නො කෙරේ ද ඒ පුරුෂයා එකාන්තයෙන් ශ්‍රමණ යැ යි ලොකයෙහි (පණ්ඩිතයෝ) කීහ.

1379. ලොකයෙහි සියලු (කායික, වාචසික) ක්‍රීඩා ද (දිව්‍ය කාමගුණ) රතිය ද දුරු කොට අල්පමාත්‍ර වූ ද මුසාවක් නො කියා ද (මාංස, ඡවි විභූෂණයෙන් ද මෛථුන සෙවනයෙන් ද වෙන් වූයේ වේද, ඒ පුරුෂයා එකාන්තයෙන් ශ්‍රමණ යැ යි ලොක-යෙහි (පණ්ඩිතයෝ) කීහ.

1380. යම් කෙනෙක් සියලු වස්තුකාමය ද තෘෂ්ණාව ද (ත්‍රිවිධ පරිඥායෙන්) දැන එකාන්තයෙන් හැරපියත් ද දැමුණු (මිථ්‍යා විතර්කාභාවයෙන්) සපීත ස්වභාව ඇති මමායන නැති (අඹුදරුවන් කෙරෙහි) ආශා නැති ඒ පුරුෂයා එකාන්තයෙන් ශ්‍රමණ යැ යි ලොකයෙහි (පණ්ඩිතයෝ) කීහ.

1381. අලාමකප්‍රඥ ඇති කළයුතු දැය කරන තොප පුළුවුසුම්හ, ගාථාවන්හි අපට උපන් විවාදයෙක් ඇත. අද අපගේ සැකය ද විචිකිත්සාවන් ද සිඳුව. තොප කරණකොටගෙන අපි හැමදෙනමෝ සැක දුරලම්හ.

1382. යම් පණ්ඩිත කෙනෙක් අර්‍ථ දක්නා සමර්‍ථ වෙත් ද ඔහු ඒ විවාදයෙහි (යුක්තප්‍රයුක්ත) කාලයෙහි නුවණින් කියති. රජවරුනි, ඡෙක වූවාහු නමුදු නො කියනලද ගාථාවන්ගේ අර්‍ථ කෙසේ නම් එළවා ද? (එහෙයින් කියව)

1383. (වරුණ) නාගරාජ කෙසේ කියා ද? යළි විනතාපුත්‍ර ගරුඩරාජ කෙසේ කියා ද? යළි ගන්‍ධර්වරාජ කුමක් කියා ද? යළි කුරු ජනපදවැසියන්ගේ රාජශ්‍රෙෂ්ඨ කෙසේ කියා ද? යි.

1384. (වරුණ) නාරජ ක්‍ෂාන්තිය මැ ශීල යැ යි කියයි. විනතාපුත්‍ර ගරුඩරාජ අල්පාහාර බව (ආහාර හෙතුයෙන් පව් නො කිරීම) ද ගන්‍ධර්වරාජ (සක්දෙව්රජ) පඤ්චකාම රති ප්‍රහාණය ද කුරුරජ පළිබොධ නැති බව ද ශීල යැ යි කියා යි.

1385. මෙ හැම සුභාෂිතයෝ යැ. මෙහි කිසි දුර්භාෂිතයෙක් නැත් මැ යි. තවද යම් පුද්ගලයක්හු කෙරෙහි තෙල ගුණජාතයෝ පිහිටියාහු චක්‍රනාභියෙහි සමවහිත (එක්රැස්) වූ අරයන් (දැව්) මෙන් වෙත් ද තෙල සතර දහමින් සමන්වාගත වූ ඒ පුරුෂයා එකාන්තයෙන් ශ්‍රමණ යැ යි ලොකයෙහි පණ්ඩිතයෝ කීහ.

1386. තුවං[1] නු සෙට්ඨො ත්වමනුත්තරොසි
ත්වං ධම්මගූ ධම්මවිදූ සුමෙධො
පඤ්ඤාය පඤ්හං සමධිග්ගහෙත්වා,
අවෙච්ඡි ධීරො විචිකිච්ඡිතානි
අවෙච්ඡි[2] කඞ්ඛං විචිකිච්ඡිතානි
චුන්දො යථා නාගදන්තං ඛරෙන.

1387. නීලුප්පලාභං විමලං අනග්ඝං
වත්ථං ඉමං[3] ධූමසමානවණ්ණං,
පඤ්හස්ස වෙය්‍යාකරණෙන තුට්ඨො
දදාමි තෙ ධම්මපූජාය ධීර.

1388. සුවණ්ණමාලං සතපත්තඵුල්ලං[4]
සකෙසරං රතනසහස්සමණ්ඩිතං
පඤ්හස්ස වෙය්‍යාකරණෙන තුට්ඨො
දදාමි තෙ ධම්මපූජාය ධීර

1389. මණිං අනග්ඝං රුචිරං පභස්සරං
කණ්ඨාවසත්තං මණිභූසිතං මෙ,
පඤ්හස්ස වෙය්‍යාකරණෙන තුට්ඨො
දදාමි තෙ ධම්මපූජාය ධීර.

1390. ගවං සහස්සං උසභඤ්ච නාගං
ආජඤ්ඤයුත්තෙ ච රථෙ දස ඉමෙ,
පඤ්හස්ස වෙය්‍යාකරණෙන තුට්ඨො
දදාමි තෙ ගාමවරානි සොළසාති.

3. චතුපොසථිකජාතකං*.

1391. බහුස්සුතො සුතධම්මොසි සක්ක
දිට්ඨා තයා සමණබ්‍රාහ්මණා ච,
අථක්ඛණෙ දස්සයසෙ විලාපං
අඤ්ඤනු කො තෙ පටිමන්තකො මයා.

1392. සුබහූ සුභා සුප්පටිමුත්තකම්බු
පග්ගය්හ සොවණ්ණමයාය[5] පාතියා[6],
භුඤ්ජස්සු භත්තං ඉති මං වදෙති
සද්ධා[7] චිත්තා තමහං නොති බ්‍රූමි.

1. තුවං හි – මජසං, ස්‍යා.
2. අවෙජ්ජි – මජසං, ස්‍යා.
3. ඉදං – මජසං, ස්‍යා.
4. ඵුල්ලිතං – මජසං, ස්‍යා.
*. විධුරජාතකෙ-පුණ්ණකජාතකෙතිපි වදන්ති.
5. සොවණ්ණමයා – මජසං.
6. පාටියා – ස්‍යා.
7. තදා – මජසං.

1386. තෙපි ශ්‍රෙෂ්ඨ වවු, තෙපි (උත්තරීතරයකු නැතියෙන්) අනුත්තර වවු. තෙපි ධර්මගොපක ද ධර්මඥ ද ධර්මවිදූ ද සුන්දර-ප්‍රඥ ඇතියහු ද වවු. ප්‍රාඥ තෙම ප්‍රඥායෙන් අපගේ ප්‍රශ්නය යථාභූත කොට දැනැ විචිකිත්සාවන් සින්දේ යැ. යම්සේ දන්ත ශිල්පියෙක් කියතින් ඇත්දළක් සිඳුනේ ද එසෙයින් සැකය ද විචිකිත්සාවන් ද සින්දේ යි.

1387. ප්‍රාඥය, (තොපගේ) ප්‍රශ්නව්‍යාකරණයෙන් තුටු වූයෙමි නිලුපුල් වන් නිර්මල වූ අනර්ඝ වූ ධූමයට බඳු පැහැ ඇති මේ වස්ත්‍රය ධර්මපූජා පිණිස තොපට දෙමි.

1388. ප්‍රාඥය, ප්‍රශ්නව්‍යාකරණයෙන් තුටු වූයෙමි දහසක් රුවනින් සැදූ කෙසුරු සහිත පිපි සියපත් (පියුම්) ඇති රන්මල්දම ධර්මපූජා පිණිස තොපට දෙමි.

1389. ප්‍රාඥය, ප්‍රශ්නව්‍යාකරණයෙන් තුටු වූයෙමි මාගේ ගෙලෙහි ලැගුණු මිණිරුවනින් අලංකාර වූ සිත්කලු වූ ප්‍රභාස්වර වූ අනගි මිණිරුවන ධර්මපූජා පිණිස තොපට දෙමි.

1390. ප්‍රශ්නව්‍යාකරණයෙන් තුටු වූයෙමි දෙනුන් දහසක් ද පුංගවයකු ද ඇතකු ද ආජානීය සෛන්ධවයන් යෙදූ මේ රිය දසයක් ද ගම්වර සොළසක් ද තොපට (ධර්මපූජාවට) දෙමි.

3. චතුපොසථික ජාතක යි.

1391. සභික බමුණ, තෙපි බහුශ්‍රැත වූවහු ඇසූ දහම් ඇත්තහු යැ, තොප විසින් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ද දක්නා ලදහ. (එහෙත්) නො කල්හි වලප්නහු යැ, (මෙහි) මා හැර පිළිවදන් දෙන්නේ (අනෙක් තැනැත්තේ) කවරෙක් ද?

1392. දුටු දුටුවන්ගේ සිත් ගන්නා මනා බැම ඇති, විසිතුරු රන්අබරණ පැළැඳි ස්ත්‍රියක් රන්තලියෙක ලූ බොජුන් ගෙන ප්‍රීති සිතැති ව බොජුන් බුදින්නැ යි කියතුදු, මම (ඊට) නො කැමැතිය යි ඇයට කියමි.

1393\. එතාදිසං බ්‍රාහ්මණ දිස්වා[1] යක්ඛං
පුච්ඡෙය්‍ය පොසො සුඛමාසසානො[2]
උට්ඨෙහි තං පඤ්ජලිකාභි පුච්ඡ[3]
දෙවීනුසි ත්වං උද මානුසී නු.

1394\. යං ත්වං සුඛෙනාභිසමෙක්ඛසෙ මං
භුඤ්ජස්සු භත්තං ඉති මං වදෙසි,
පුච්ඡාමි තං නාරි මහානුභාවෙ[4]
දෙවීනුසි ත්වං උද මානුසී නු.

1395\. දෙවී අහං සඞ්ඛ මහානුභාවා
ඉධාගතා සාගරවාරිමජ්ඣෙ,
අනුකම්පිකා නො ච පදුට්ඨචිත්තා
තමෙව අත්ථාය ඉධාගතොස්මි.

1396\. ඉධන්නපානං සයනාසනඤ්ච
යානානි නානා විවිධානි සඞ්ඛ,
සබ්බස්ස ත්‍යාහං පටිපාදයාමි
යං කිඤ්චි තුය්හං මනසාභිපත්ථිතං.

1397\. යං කිඤ්චි යිට්ඨංච හුතං ච මය්හං
සබ්බස්ස නො ඉස්සරා ත්වං සුගත්තෙ,
සුසොණි සුබ්භූ සුවිලාකමජ්ඣෙ
කිස්ස මෙ කම්මස්ස අයං විපාකො.

1398\. සමෙම පථෙ බ්‍රාහ්මණ එකභික්ඛුං
උග්ඝට්ටපාදං තසිතං කිලන්තං,
පටිපාදයී සඞ්ඛ උපාහනාහි
සා දක්ඛිණා කාමදුහා තවජ්ජ.

1399\. සා හොතු නාවා ඵලකූපපන්නා
අනවස්සුතා එරකවාතයුත්තා,
අඤ්ඤස්ස යානස්ස න හෙත්ථ භූමි
අජ්ජෙව මං මොලිනිං පාපයස්සු.

1400\. සා තත්ථ විත්තා[5] සුමනා පතීතා
නාවං සුචිත්තං අභිනිම්මිණිත්වා,
ආදය සඞ්ඛං පුරිසෙන සද්ධිං
උපානයී නගරං සාධු රම්ම'න්ති.

4. සඞ්ඛජාතකං.

1. දිස්වාන වි. – මජසං, ස්‍යා.
2. මාසසමානො – මජසං. මාසිසානො – සී.
3. පුච්ඡා – මජසං.
4. මහානුභාවෙන – මජසං.
5. තුට්ඨචිත්තා – මජසං. ස්‍යා.

1393. බමුණ තමාගේ සැපත රැස්නා වූ පුරුෂ තෙම මෙබඳු යක්ෂයා දැක (මෙසේ) විචාරන්නේ ය. ඔබ දෙව්දුවක් ද නැතහොත් මනුෂ්‍යස්ත්‍රියක් දැ යි, නැගීසිටගෙන බද්ධාඤ්ජලි වැ විචාරව.

1394. මහතෙදැති ඉතිරිය, මා බලා බත් බුදින්නැ යි මට කියන තී විකාරම්. තෝ දෙව්දුවක් ද? නැතහොත් මනුෂ්‍ය ස්ත්‍රියක් වහු ද?

1395. සඞ්ඛ බමුණ, මුහුදුදිය මැදට පැමිණි මම මහතෙදැති දෙව්දුවක්මු. සානුකම්පික වූ මම තොපගේ යහපත සලකා මෙහි පැමිණියමු. ප්‍රදුෂ්ට සිතැති ව පැමිණියා නො වෙමි.

1396. සඞ්ඛ බමුණ, තොප රුචි කරන කෑම් බීම් ද ආසන ද නානාවිධ යානාවන් ද යන මේ සියලු දෙය දෙමි.

1397. මනස්කාන්ත වූ සිරුරැති තොපගේ ඉහ, බැම, හා මැදපෙදෙස දුටුවන් ළගන්නා සුලු වෙයි, මාගේ කිසියම් දනයක හෝ ආගන්තුක සත්කාරයක හෝ (විපාක) වේ ද? එයට ඔබ ඉසුරු ය. මේවා මා කළ කවර කර්‍මයෙක විපාක ද?

1398. දැඩි රශ්මිය පැවැති සමයෙක මහමහැ උණුවැල්ලේ තැබූ පා ඇති පිපාසායෙන් හා ක්ලාන්තයෙන් විඩා වූ (සිරුරැති) පසේබුදුන් වහන්සේ නමකට වහන්සහළක් දුන්නේ ය. ඔබ දුන් ඒ දනය අද ඔබට කැමැති කැමැති දෙය දේ.

1399. (නැව් හැර) අන් යානාවකට බිමක් (මෙහි) නැත. ඒ නැව දිය ඇතුළු නො වන පරිදි බොහෝ පුවරු යොද සකස් වූවක් වේවා, මා අද ම මෝලිනී නගරයට ගෙනයව.

1400. එහි දී ඔහුගේ ප්‍රකාශයන් අසා අතිශයින් ම ප්‍රමුදිත වූ දෙව්දුව විසිතුරු නැවක් මවා සඞ්ඛ නමැති පුරුෂයා සමග සිත් අලවන මෝලිනී නගරයට ගෙන ගියා ය.

4. සඞ්ඛ ජාතක යි.

1401. යො තෙ ඉමං විසාලක්ඛිං පියං සම්මිල්ලභාසිනිං[1],
ආදාය බලා ගච්ඡෙය්‍ය කිං නු කයිරාසි බ්‍රාහ්මණ.

1402. උප්පජ්ජෙ[2] මෙ න මුච්චෙය්‍ය න මෙ මුච්චෙය්‍ය[3] ජීවතො
රජංව විපුලා වුට්ඨි ඛිප්පමෙව නිවාරයෙ.

1403. යන්නු පුබ්බෙ විකත්ථිත්ථො[4] බලම්හි ච අපස්සිතො,
ස්වාජ්ජ[5] තුණ්හීකතොදානි[6] සඞ්ඝාටිං සිබ්බමච්ඡසි.

1404. උප්පජ්ජි මෙ න මුච්චිත්ථ[7] න මෙ මුච්චිත්ථ ජීවතො,
රජංව විපුලා වුට්ඨි ඛිප්පමෙව නිවාරයිං.

1405. කින්තෙ උප්පජ්ජි නො මුච්චි[7] කින්තෙ නො මුච්චි ජීවතො,
රජංව විපුලා වුට්ඨි කතමං ත්වං නිවාරයි.

1406. යම්හි ජාතෙ න පස්සති අජාතෙ සාධු පස්සති,
සො මෙ උප්පජ්ජි නො මුච්චි කොධො දුම්මෙධගොචරො.

1407. යෙන ජාතෙන නන්දන්ති අමිත්තා දුක්ඛමෙසිනො,
සො මෙ උප්පජ්ජි නො මුච්චි කොධො දුම්මෙධගොචරො.

1408. යස්මිඤ්ච ජායමානස්මිං සදත්ථං නාවබුජ්ඣති.
සො මෙ උප්පජ්ජි නො මුච්චි කොධො දුම්මෙධගොචරො.

1409. යෙනාභිභූතො කුසලං ජහාති
පරක්කරෙ විපුලඤ්චාපි අත්ථං,
ස භීමසෙනො බලවා පමද්දී
කොධො මහාරාජ න මෙ අමුච්චථ.

1410. කට්ඨස්මිං මත්ථමානස්මිං පාවකො නාම ජායති,
තමෙව කට්ඨං ඩහති යස්මා සො ජායතෙ ගිනි.

---

1. සම්භිත භාසිනිං, - මජසං. සංසිලභාසිනි - සයා
2. උප්පජ්ජෙ. රා. උප්පජ්ජි - මජසං, සයා.
3. මුඤ්චෙය්‍ය - මජසං, සයා.
4. විකත්ථිතො - මජසං, සයා.
5. ස්වජ්ජ - මජසං.
6. තුණ්හීකතො - මජසං.
7. මුඤ්චිත්ථ - මජසං, සයා.

1401. බමුණ, යම් කෙනෙක්, විශාල ඇස් ඇති මනුෂ්‍යසමිතයෙන් කතා කරන ඔබගේ ප්‍රියාව පැහැරගෙන ගියෝ නම් කුමක් කෙරේ ද?

1402. මගේ සිතෙහි හටගත් කොපය ඇය නො මුදන්නේ ය. යම්තාක් කල් මම ජීවත් වෙම් ද ඒතාක් සිතෙහි කොපයට රැඳෙන්නට නො දෙමි. මහවැස්ස වහා ධූලි නවතන්නා සේ කොපය වළකා ගනිමි.

1403. පෙරැ ඔබ යමක් ප්‍රකාශ කළේ ද (දැන්) බලවතකු සේ තුෂ්ණීම්භූත ව සහළ සිවුර මසමින් සිටී.

1404. මාගේ කොපය උපන් නමුදු මෙරමාහට දැනෙන පරිදි නො පහළ විය, ජීවත් ව සිටින තුරු සිතෙහි කොපය ඉපදීමට ඉඩ නො දෙන්නේ ය. මහවැස්ස ධූලි වළකන්නා සේ කොපය වැළැක්කිමි.

1405. තොපගේ සිතෙහි ඉපැදුණේ කුමක් ද? ප්‍රකාශ නො වූයේ කුමක් ද? ජීවත් වන තොප කෙරෙන් නො මිදුණේ කුමක් ද? මහවැස්ස ධූලි වළකන්නා සේ තොප වැළැකුයේ කුමක් ද?

1406. යමක් හටගත් කලැ ආත්මාර්ථය නො දකී ද. (එය) නො හට ගත් කලැ (ආත්මාර්ථය) මනාසේ දකී ද. ඒ ක්‍රොධය මා සිතැ උපනි. මිදුණේ නො වේ. (හෙවත් කොපය හටගත් බව මෙරමාහට නො හැඟුණේය.) ක්‍රොධය මෝඩයන්ට ගොචර ය.

1407. යමක් හටගැනීම නිසා දුක රැස්නා සතුරෝ සතුටු වෙත් ද එය මට උපනි. නො මිදුණේ ය. ක්‍රොධය අඥනයන්ට ගොචර වෙයි.

1408. යමක් හටගන්නා කල්හි ආත්මාර්ථය අවබොධ නො වේ ද. එය මට උපන නො මිදුණේ ය. ක්‍රොධය අඥනයන්ට ගොචර වෙයි.

1409. මහරජ, කොපය විසින් මඩනා ලද කලැ දශපුණ්‍යක්‍රියා දුරු කෙරේ. මහත් වූ දියුණුව බැහැර කෙරේ. කෙලෙස් සෙනාවෙන් බලවත් වූ කොපය උතුමන් පවා මඩී, එය මාගෙන් නො මිදුණේ ය.

1410. වියැළි ලීය ගටන කලැ ගින්න හටගනී. ඒ ගින්න යම් ලීයක් නිසා උපදී නම් එය ම දවයි.

1411. එවං මනුස්සස්ස පොසස්ස බාලස්ස අවිජානතො
සාරම්භා ජායතෙ කොධො සොපි තෙනෙව ඩය්හති[1].

1412. අග්ගීව තිණකට්ඨස්මිං කොධො යස්ස පවඩ්ඪති,
නිහීයති තස්ස යසො කාළපක්ඛෙව චන්දිමා.

1413. අනින්ධො[2] ධූමකෙතූව කොධො යස්සූපසම්මති,
ආපූරති තස්ස යසො සුක්කපක්ඛෙව චන්දිමාති.

4. චූලබොධිජාතකං.

1414. සත්තාහමෙවාහං පසන්නචිත්තො
පුඤ්ඤත්ථිකො අචරිං[3] බ්‍රහ්මචරියං
අථාපරං යං චරිතං මමයිදං[4],
වස්සානි පඤ්ඤාස සමාධිකානි
අකාමකො වාපි අහං චරාමි
එතෙන සච්චෙන සුවත්ථි හොතු
හතං විසං ජීවතු යඤ්ඤදත්තො.

1415. යස්මා දානං නාභිනන්දිං කදචි
දිස්වානාහං අතිථිං වාසකාලෙ,
නචාපි මෙ අප්පියතං අවෙදුං
බහුස්සුතා සමණා බ්‍රාහ්මණා ච[5]
අකාමකො වා හි අහං දදමි,
එතෙන සච්චෙන සුවත්ථි හොතු
හතං විසං ජීවතු යඤ්ඤදත්තො.

1416. ආසීවිසො තාත පහූතතෙජො[6]
යො තං අදංසි[7] බිලරා[8] උදිච්ච
තස්මිඤ්ච මෙ අප්පියතාය අජ්ජ,
පිතරඤ්ච තෙ නත්ථි කොචි විසෙසො
එතෙන සච්චෙන සුවත්ථි හොතු
හතං විසං ජීවතු යඤ්ඤදත්තො,

1417. සන්තා දන්තා යෙව පරිබ්බජන්ති
අඤ්ඤත්‍ර කණ්හා අනකාමරූපා,
දීපායන කිස්ස ජිගුච්ඡමානො
අකාමකො චරසි බ්‍රහ්මචරියං.

---

1. දහති – මජසං, සයා.
   දය්හති – මජසං, සයා.
2. අනිධො – මජසං.
3. ආචරි – මජසං, සයා.
4. මමෙදං – මජසං
5. සමණබ්‍රාහ්මණා – මජසං.
6. බහුත්ත – මජසං.
7. අධසි – සයා. අදසී. – මජසං.
8. බිලාරා – මජසං.

1411. එ පරිදි මන්ද බුද්ධික කිසිත් නො දත් පුරුෂයාගේ සංරම්භයෙන් (එකට එක කීමෙන්) ක්‍රොධය හටගනී. හෙතෙම එම කොපයෙන් දවනු ලබයි.

1412. තණකොළ හා දර නිසා හටගන්නා ගින්න ලෙස, යමකුගේ (සිතැ) කොපය වැඩේ ද කෘෂ්ණ පක්ෂයෙහි චන්ද්‍රයා පරිදි ඔහුගේ යශස පිරිහේ.

1413. යමකුට හටගත් කොපය දර නැති ගින්න සේ නිවී සන්හිඳේ ද, පූරපසෙහි සඳ සේ ඔහුගේ යශස වැඩේ.

5. චූල්ලබොධි ජාතක යි.

1414. පින් කැමැති මම චිත්තප්‍රසාදය ඇති ව සත් දවසක් බ්‍රහ්මචාරී ව වුසූයෙම් ද, පනස් වසකට වැඩි කලක් තපස් රැක්කෙම් ද, මේ සත්‍ය බලයෙන් යඤ්ඤදත්ත කුමාරයා සුවපත් වේවා, නැසුණු විස ඇති ව ජීවත් වේවා.

1415. දන් දීමට මම කිසි කලෙකත් සතුටු නො වීම් ද, නවාතැන් ගැනීමට පැමිණි ආගන්තුකයා දැක සතුටු නො වීම් ද, බහුශ්‍රැත වූ මහණබමුණෝ මා නො කැමැත්තෙන් දන් දෙන බව නො දත්තෝ ද මේ සත්‍ය බලයෙන් යඤ්ඤදත්ත කුමාරයා සුවපත් වේවා, නැසුණු විස ඇති ව ජීවත් වේවා.

1416. දරුව, මහත් තෙදැති ඝොරවිෂ සහිත යම් ආශීර්විෂයෙක් තුඹසින් නැඟී තා ඩැසී ද, ඒ සර්පයා කෙරෙහි ත් ඔබ පියා කෙරෙහි ත් අද විශෙෂ ප්‍රිය බවක් නැත. මේ සත්‍ය බලයෙන් යඤ්ඤදත්ත කුමාරයා සුවපත් වේවා, නැසුණු විස ඇති ව ජීවත් වේවා.

1417. කණ්හදීපායනය, (ඔබ හැර) සෙස්සෝ සත්පුන් ව දමනය කළ ඉඳුරන් ඇති ව ප්‍රව්‍රජ්‍යාව කෙරෙහි කැමැති ව පැවිදි වෙති. කවර කරුණක් නිසා තවුස් දම් රැකීම පිළිකුල් කෙරෙමින් බඹසර විසීමට නො කැමැත්තෙහි ද?

1418. සද්ධාය නික්ඛම්ම පුනං[1] නිවත්තො
සො එළමූගොව බාලො[2]වතායං,
එතස්ස වාදස්ස ජිගුච්ඡමානො
අකාමකො චරාමි බ්‍රහ්මචරියං
විඤ්ඤූප්පසත්ථඤ්ච[3] සතඤ්ච ඨානං
එවම්පහං පුඤ්ඤකරො භවාමි.

1419. සමණෙ තුවං බ්‍රාහ්මණෙ අද්ධිකෙ ච
සන්තප්පයාසි අන්නපානෙන භික්ඛං,
ඔපානභූතං ච ඝරං තවයිදං
අන්නෙන පානෙන උපෙතරූපං
අථ කිස්ස වාදස්ස ජිගුච්ඡමානො
අකාමකො දානමිමං දදාසි.

1420. පිතරො ච මෙ ආසුං පිතාමහා ච
සද්ධා අහූ[4] දානපතී වදඤ්ඤූ
තං කුල්ලවත්තං[5] අනුවත්තමානො,
මාහං කුලෙ අන්තිම ගන්ධිනො අහුං
එතස්ස වාදස්ස ජිගුච්ඡමානො
අකාමකො දානමිමං දදාමි.

1421. දහරිං කුමාරිං අසමත්ථපඤ්ඤං
යං තානයිං[6] ඤාතිකුලා සුගත්තෙ
න චාපි මෙ අප්පියතං අවෙදි,
අඤ්ඤත්‍ර කාමා පරිචාරයන්තී[7]
අථ කෙන වණ්ණෙන මයා තෙ[8] හොති
සංවාසධම්මො අහු එවරූපො.

1422. ආරා දූරෙ න ඉධ[9] කදාචි අත්ථි
පරම්පරා නාම කුලෙ ඉමස්මිං
තං කුල්ලවත්තං අනුවත්තමානා,
මාහං කුලෙ අන්තිමගන්ධිනී අහුං
එතස්ස වාදස්ස ජිගුච්ඡමානා
අකාමිකා[10] බද්ධචරාස්මි තුය්හං.

1423. මණ්ඩබ්‍ය භාසිස්සං අභාසනෙය්‍යං[11]
තං ඛමයතං පුත්තහෙතු මමජ්ජ,
පුත්තපෙමා[12] න ඉධ පරත්ථි කිඤ්චි
සො නො අයං ජීවති යඤ්ඤදත්තොති.

6. කණ්හදීපායනජාතකං.

1. පුන - මජසං, සයා.
2. චපලො - මජසං. - සයා.
3. විඤ්ඤුප්පසට්ඨං - මජසං.
4. අහුං - මජසං.
5. කුලවත්තං - මජසං, සයා.
6. ආනයි - මජසං.
7. පරිචාරයන්තා - මජසං, සයා.
8. හි - මජසං, සයා.
9. හි - මජසං.
10. අකාමකා - මජසං.
11. භාසිං සමභාසමනෙයං - මජසං.
12. තං පුත්තපෙමං - මජසං

1418. කෙළතොල්ලකු වූ එකැත්තින් ම මෝඩ වූ නුවණ රහිත වූ මෙතෙම සැදැයෙන් ගිහි ගෙය හැර පියා ගොස් පෙරලා ගිහි බවට පැමිණියේ ය යන මේ වචනයට පිළිකුල් කෙරෙමින් නො කැමැත්තෙන් බඹසර හැසිරෙමි. එතෙකුදුවත්, පැවිද්ද සාධූන්ගේ වාසය යි බුදුධාදි උතුමෝ පසසති. මෙසේ හෙයින් මම පින් කරන්නෙම් වෙමි.

1419. ඔබ මහණ බමුණන් හා මගියන් හා භික්ෂූන් ආහාර පානයෙන් සන්තර්පණය කරන්නාව. කන බොන දෑ ඇති ඔබගේ නිවාසය සතරමංසන්ධියෙක (කැණූ) පොකුණක් වැන්න, කාගේ බසක් පිළිකුල් කරමින් මේ දනය නො කැමැත්තෙන් දෙයි ද?

1420. මාගේ මව් පිය මුතුන්මිත්තෝ සැදැවත් දනපතියෝ වූහ. ප්‍රතිග්‍රාහකයන්ගේ වචන වටහා ගත්තෝ ය. ඒ පරපුරෙන් ආ සිරිත අනුගමනය කරන මම 'කුලයෙහි අන්තිමයා හිස් පුහුලෙක් නො වේවා'යි (සිතන්නෙමි) මේ වචනය පිළිකුල් කරමින් නො කැමැත්තෙන් දන් දෙමි.

1421. හොබනා සිරුරු ඇත්තිය, ඉතා තරුණ වූ ගෘහසංවිධානය කිරීමට තරම් මේරූ නුවණ නැති, (ඔබ) තීගේ නෑයන්ගෙන් ගෙන ආයෙමි. මට මෙහෙවර කිරීමෙහි ඔබ නුරුස්නා බවක් නො හැඟ වීය. මා හා එක් ව වාසය කිරීම කවර කරුණෙකින් මෙසේ වී ද?

1422. ඉතා ඈත සිට අප කුලයෙහි පුරුෂ පරපුරෙක් නො වී ය. කුල සිරිත අනුව පවත්නා වූ මා නිසා කුලය හිස් නො වේවා යි සිතන්නෙමි. මේ වචනය පිළිකුල් කරමින් නො කැමැත්තෙන් ඔබට පාදපරිචාරිකා වීමි.

1423. මාණ්ඩව්‍යය, නො කියයුතු දෙයක් කීවෙමි. මාගේ ඒ කීම පුතු ගැන සිතා කමා කෙරේවා, පුත්‍ර ප්‍රේමයට වැඩි ප්‍රේමයෙක් මෙ ලොවැ නැත. ඒ අප යඤ්ඤදත්ත කුමාරයා ජීවත් වේවා.

6. කණ්හදීපායන ජාතක යි.

1424. නවාහමෙතං ජානාමි කොවායං කස්ස වාති වා[1],
යථා සාඛො වදී එවං නිග්‍රොධ කින්ති මඤ්ඤසි.

1425. තතො ගලවිනීතෙන පුරිසා නීහරිංසු මං,
දත්වා මුඛ පහාරානි සාඛස්ස වචනං කරා.

1426. එතාදිසං දුම්මතිනා අකතඤ්ඤුනා[2] දුබ්භිනා,
කතං අනරියං සාඛෙන සඛිනා තෙ ජනාධිප.

1427. නවාහ මෙතං ජානාමි නපි මෙ කොචි සංසති,
යම්මෙ ත්වං සම්ම අක්ඛාසි සාඛෙන කඩ්ඪනං කතං[3].

1428. සඛීනං සාජීවකරො මම සාඛස්ස වූභයං,
ත්වං නො ඉස්සරියං දාතා මනුස්සෙසු මහග්ගතං.
තයම්හා ලභිතා ඉද්ධි එත්ථ මෙ නත්ථි සංසයො.

1429. යථාපි බීජං අග්ගිස්මිං ඩය්හති න විරූහති,
එවං කතං අසප්පුරිසෙ නස්සති න විරූහති.

1430. කතඤ්ඤුම්හි ච පොසම්හි සීලවන්තෙ අරියවුත්තිනෙ,
සුඛෙත්තෙ විය බීජානි කතං තම්හි න නස්සති.

1431. ඉමඤ්ච ජම්මං[4] නෙකතිකං අසප්පුරිසචින්තකං[5],
හනන්තු සාඛං සත්තීහි නාස්ස ඉච්ඡාමි ජීවිතං.

1432. ඛම්‍යතස්ස[6] මහාරාජ පාණා දුප්පටිආනයා,
ඛම දෙව අසප්පුරිසස්ස නාස්ස ඉච්ඡාමහං වධං.

1433. නිග්‍රොධමෙව සෙවෙය්‍ය න සාඛමුපසංවසෙ,
නිග්‍රොධස්මිං මතං සෙය්‍යො යඤ්චෙ සාඛස්මිං ජීවිතන්ති.

7. නිග්‍රොධජාතකං.

---

1. වාති වා - මජසං.
2. අකතඤ්ඤුනා - මජසං. අකතඤ්ඤුන. - සයා.
3. කරණං. මජසං
4. ඉමං - මජසං.
5. චින්තිතං - මජසං.
6. ඛමිතස්ස - මජසං, සයා.

1424. නිග්‍රොධ රජුනි, මම මොහු නො දනිමි. මේ තෙම කාගේ කවරෙක් ද යි සාඛයා යම්සේ කී ද, කෙසේ ද ඔබ ත් එසේ සිතවු ද?

1425. සාඛයාගේ වචන කරවූ, සේවකයෝ මුඛප්‍රහාරය දී ගෙල ගැනීමෙන් මා ඉවතට දැමූහ.

1426. ජනාධිපය, ඔබ ගේ මිත්‍රයකු වූ නුවණ නැති අකෘතඥ මිත්‍රද්‍රොහි සාඛයා විසින් මෙබඳු පහත් ක්‍රියාවක් කරන ලද.

1427. මිතුර ඔබ මට යමක් කිවු ද, එය මම නො දනිමි. සාඛයා කළ තැළුම් පෙළුම් කිසිවෙක් මට නො කී යැ.

1428. ඔබ මටත් සාඛයාටත් එක සමාන ව සංග්‍රහ කළහු ය. මනුෂ්‍යයන් අතරේ ඉසුරු හා දියුණුව ඔබගෙන් අපි ලදුම්හ. මේ කරුණෙහි සැකයක් නැත.

1429. ගින්නෙහි ලූ බීජය ද දැවී යම්සේ (යළි) නො හටගන්නේ ද, එසේ අකෘතඥයාට කළ උපකාරය ද නැසේ. (නැවත) නො වැඩේ.

1430. සිල්වත් ශ්‍රෙෂ්ඨ පැවැතුම් ඇති කෘතොපකාර දත් සත්පුරුෂයාට කළ උපකාරය සරුකෙතෙකැ වපුළ බිජුවට මෙන් (වැඩේ.) නො නසී.

1431. අසත්පුරුෂ සිතිවිලි ඇති ලාමක වූ කපටි වූ මේ සාඛයා තෙබින් (ඈණ) නසත්වා. මොහුගේ ජීවිතය (මම) නො රුස්නෙමි.

1432. මහරජ, අසත්පුරුෂ මොහුට කමා කෙරේවා. මළවුන්ගේ ප්‍රාණයෝ යළි ගෙන්වා ගන්නට නො හැකි වෙති. රජතුමනි, කමා කරනු මනා ය. මම මොහුගේ වධය නො රුස්නෙමි.

1433. නිග්‍රොධයා ම ඇසුරු කරන්න. සාඛයා ගේ ඇසුරට නො යන්න. සාඛයා සමීපයේ ජීවත් වීමට වඩා නිග්‍රොධයා සමීපයේ මිය යාම උතුම් වේ.

7. නිග්‍රොධ ජාතක යි.

1434. න තක්කලා සන්ති න ආලුපානි
න බිළාලියො න කලම්බානි තාත,
එකො අරඤ්ඤම්හි සුසානමජ්ඣෙ
කිමත්ථිකො තාත ඛණාසි[1] කාසුං.

1435. පිතාමහො තාත සුදුබ්බලො තෙ
අනෙකබ්‍යාධීහි දුඛෙන[2] ඵුට්ඨො,
තමජ්ජහං නිඛණිස්සාමි සොබ්භෙ
නහිස්ස තං ජීවිතං රොචයාමි

1436. සඞ්කප්පමෙතං පටිලද්ධ පාපං
අච්චාහිතං කම්ම කරොසි ලුද්දං.
මයාපි තාත පටිලච්ඡසෙ තුවං
එතාදිසං කම්ම[3] ජරූපනීතො[4],
තං කුල්ලවත්තං අනුවත්තමානො
අහම්පි තං නිඛණිස්සාමි සොබ්භෙ.

1437. ඵරුසාහි වාචාහි පකුබ්බමානෙ
ආසජ්ජ මං ත්වං වදසෙ කුමාර,
පුත්තො මම ඔරසකො සමානො
අහිතානුකම්පි මෙ ත්වංසි පුත්ත.

1438. න තාහං[5] තාත අහිතානුකම්පී
හිතානුකම්පී තෙ අහංපි තාත,
පාපඤ්ච තං කම්ම පකුබ්බමානං
අරහාමි නො වාරයිතුං තතො හි.

1439. යො මාතරං පිතරං වා වසිට්ඨ[6]
අදූසකෙ හිංසති පාපධම්මො,
කායස්ස භෙදා අභිසම්පරායං
අසංසයං සො නිරයං පරෙති.

1440. යො මාතරං පිතරං වා වසිට්ඨ
අන්නෙන පානෙන උපට්ඨහාති,
කායස්ස භෙදා අභිසම්පරායං
අසංසයං සො සුගතිං පරෙති.

1441. න මෙ ත්වං පුත්ත අහිතානුකම්පී
හිතානුකම්පී මෙ ත්වංසි පුත්ත,
අහඤ්ච තං මාතරා වුච්චමානො
එතාදිසං කම්ම කරොමි ලුද්දං.

---

1. ඛණසි – මජසං.
2. දුක්ඛෙන – මජසං, ස්‍යා.
3. කම්මං – මජසං, ස්‍යා.
4. ජරොපනීතො – මජසං.
5. ත්‍යාහං – මජසං.
6. සවිට්ඨ – මජසං, ස්‍යා.

1434. පියාණෙනි, කුකුළල ද වැල්ලල ද සිරිඅල ද තල්අල ද මෙහි නැත. එහෙත් හුදෙකලා ව වනයේ සොහොන මැද වළක් කණනෙහි. පියාණෙනි, කුමක් කැමැත්තෙහි ද?

1435. පුත්‍රය, ඔබ මුත්තණුවෝ නොයෙක් රොගයෙන් දුකින් පීඩා ලදහු බොහෝ දුබලයහ. අද මම ඔහු වළෙහි දමමි. ඔහුගේ ජීවත් වීම නො කැමැත්තෙමී.

1436. තොප විසින් තෙල පාපසංකල්පයෙක් ලබන ලද යැ. හිතෙමී බව ඉක්මවා ගිය දරුණු පාපකර්‍මයක් කරන්නෙහි ය. පියාණෙනි, ජරාවට පත් තෙපි මෙබඳු ක්‍රියාවකින් (සංග්‍රහ) ලබන්නහු ය. පාරම්පරික චාරිත්‍රය අනුව සිරිත් පවත්වන මමත් ඔබ වළට දමමි.

1437. කුමාරය, නුඹ පරොස් බසින් මට ගටා බෙණෙහි. පුත්‍රය තෝ මාගේ ඖරස පුත්‍ර වුවද මා කෙරෙහි අනුකම්පා නැත්තෙහි.

1438. පියාණෙනි, මම තොපට අනුකම්පා නැත්තෙම් නො වෙමි. තොප කෙරෙහි හිතානුකම්පා ඇත්තෙමි. පාපකර්‍මයක් කරන තොප (ඉන්) මුදලන්නට සුදුස්සෙමි.

1439. වසිට්ඨය, පාපි පැවැතුම් ඇති යමෙක් නිරපරාධ මවු-පියනට හිංසා කෙරේ ද හේ මරණින් මතු සැක නැතිව ම නරකයට යන්නේ ය.

1440. වසිට්ඨය, යමෙක් මව්පියන් කැමෙන් බීමෙන් උවටැන් කෙරේ ද හේ මරණින් මතු සැක නැති ව ම දෙව්ලොවට යන්නේ ය.

1441. පුත්‍රය, නුඹ මට හිතානුකම්පා නැති නො වෙහි. නුඹ මට හිතානුකම්පා ඇතියව. මම වනාහි තොපගේ මව කියන හෙයින් මෙ වැනි දරුණු පාප කර්මයක් කරමි.

1442. යා තෙ සා හරියා අනරියරූපා.
මාතා මමෙසා සකියා[1] ජනෙත්ති
නිද්ධාපයෙතං සකා අගාරා
අඤ්ඤම්පි තෙ සා දුඛ[2]මාවහෙයා.

1443. යා තෙ සා හරියා අනරියරූපා
මාතා මමෙසා සකියා ජනෙත්ති,
දන්තා කරෙණූව වසූපනීතා
සා පාපධම්මා පුනරාවජාතූති.

8. තක්කලජාතකං.

1444. කිනෙන වතං කිම්පන බ්‍රහ්මචරියං
කිස්ස සුචිණ්ණස්ස අයං විපාකො,
අක්ඛාහි මෙ බ්‍රාහ්මණ එතමත්ථං
කස්මා හි තුම්හං දහරා න මීයරෙ.

1445. ධම්මං චරාම න මුසා භණාම
පාපානි කම්මානි විවජ්ජයාම,
අනරියං පරිවජ්ජෙමු සබ්බං
තස්මා හි අම්හං දහරා න මීයරෙ.

4446. සුණොම ධම්මං අසතං සතං ච
න චාපි ධම්මං අසතං රොචයාම
හිත්වා අසන්තෙ න ජහාම සන්තෙ
තස්මා හි අම්හං දහරා න මීයරෙ.

1447. පුබ්බෙව දනා සුමනා භවාම
දදම්පි වෙ අත්තමනා භවාම,
දත්වාපි වෙ නානුතපාම[3] පච්ඡා
තස්මා හි අම්හං දහරා න මීයරෙ.

1448. සමණෙ මයං බ්‍රාහ්මණෙ අද්ධිකෙ ච
වණිබ්බකෙ යාචනකෙ දළිද්දෙ,
අන්නෙන පානෙන අභිතප්පයාම[4]
තස්මා හි අම්හං දහරා න මීයරෙ.

---

1. ජාතියා – මජසං.
2. දුක්ඛ – සීමු.
3. නානු තපාම – මජසං.
4. අභිතපාම – මජසං.

1442. උතුම් පැවැතුම් නැති, තොපගේ යම් බිරිඳක් වේ ද, මැය මා ප්‍රසූත කළ මාගේ මව වෙයි. මැය ගෙන් ඉවත් කළ මැනව. ඕ තොපට වෙනත් කරදර පමුණුවන්නී ය.

1443. උතුම් පැවැතුම් නැති, තොපගේ යම් බිරිඳක් වූ ද, මෝ මා ප්‍රසූත කළ මාගේ මව වෙයි. ඇතින්නක මෙන් දමනය වූ වසඟ වූ පාප ගති ඇති ඕ නැවත පැමිණේවා!

8. තක්කල ජාතක යි.

1444. තා සමාදන් වූ ව්‍රතය කුමක් ද? උත්තම චර්‍ය්‍යාව කුමක් ද? මේ විපාකය කෙබඳු සුචරිතයක් පිරීමෙන් ලද්දේ ද? බමුණ, මේ කරුණු මට කියව. තොපගේ ගෙහි බාලයෝ කවර හෙයින් නො මියන්නෝ ද?

1445. දස පුණ්‍යක්‍රියා ධර්මයෙහි හැසිරෙම්හ. බොරු නො කියම්හ. ප්‍රාණඝාතාදි පාපකර්මයන් දුරු කරම්හ. නින්ද්‍ය කටයුතු ක්‍රියා සියල්ල දුරු කරම්හ. එ හෙයින් අප බාලයෝ (අකාලයෙහි) නො මැරෙති.

1446. සත්පුරුෂයන්ගේ ද අසත්පුරුෂයන්ගේ ද ධර්‍මය අසම්හ. අසත්පුරුෂයන්ගේ ධර්‍මය රුචි නො කරන්නමෝ වෙමු. අසත් පුරුෂයන් හැර සත්පුරුෂයන් හරින්නමෝ නො වෙමු. එ හෙයින් අප බාලයෝ (අකාලයෙහි) නො මැරෙති.

1447. දනය දෙන්නට පෙර සතුටු සිතැත්තමෝ වෙමු. දෙමිනු දු සතුටු සිතැත්තමෝ වෙමු. දනය දීමෙන් පසුව (සිතා) පසු-තැවිලි වන්නමෝ නො වෙමු. එහෙයින් අපගේ බාලයෝ නො මැරෙති.

1448. ශ්‍රමණයන් ද බමුණන් ද මඟියන් ද ගුණ කියා යදින්නන් ද යාචකයන් ද දිළින්දන් දූ යි හැම දෙන ආහාර පානයෙන් සන්තර්පනය කරමු. එ හෙයින් අපගේ බාලයෝ නො මැරෙති.

1449. මයඤ්ච භරියා නාතික්කමාම
අම්හෙ ච භරියා නාතික්කමන්ති,
අඤ්ඤත්‍ර තාහි බ්‍රහ්මචරියං චරාම
තස්මා හි අම්හං දහරා න මීයරෙ.

1450. පාණාතිපාතා විරමාම සබ්බෙ
ලොකෙ අදින්නං පරිවජ්ජයාම,
අමජ්ජපා නො ච මුසා භණාම
තස්මා හි අම්හං දහරා න මීයරෙ.

1451. එතාසු වෙ ජායරෙ සුත්තමාසු
මෙධාවිනො හොන්ති පහූතපඤ්ඤා[1]
බහුස්සුතා වෙදගුනො ච[2] හොන්ති
තස්මා හි අම්හං දහරා න මීයරෙ.

1452. මාතාපිතා ච භගිනී භාතරො ච
පුත්තා ච දාරා ච මයඤ්ච සබ්බෙ,
ධම්මං චරාම පරලොකහෙතු.
තස්මා හි අම්හං දහරා න මීයරෙ.

1453. දසා ච දස්සො[3] අනුජීවිනො ච
පරිචාරකා කම්මකරා ච සබ්බෙ,
ධම්මං චරන්ති පරලොකහෙතු
තස්මා හි අම්හං දහරා න මීයරෙ.

1454. ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං
ධම්මො සුචිණ්ණො සුඛමාවහාති
එසානිසංසො ධම්මෙ සුචිණ්ණෙ
න දුග්ගතිං ගච්ඡති ධම්මචාරී.

1455. ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං
ඡත්තං මහන්තං විය වස්සකාලෙ,
ධම්මෙන ගුත්තො මම ධම්මපාලො
අඤ්ඤස්ස අට්ඨීනි සුඛී කුමාරොති.

9. මහාධම්මපාලජාතකං.

1. පහූතත – මජසං. බහුත. – සයා.
2. වෙදගුණා – මජසං.
3. දසො – මජසං. දසී – සයා.

1449. අපි ද භාය්‍යාවන් ඉක්මවා නො යම්හ. භාය්‍යාවෝ ද අප ඉක්මවා නො යති. ඔවුන් හැර අනෙක් ස්ත්‍රීන් කෙරෙහි බඹසර හැසිරෙම්හ. එහෙයින් අපගේ බාලයෝ නො මැරෙති.

1450. අපි හැම දෙන ප්‍රාණඝාතයෙන් වළකිමු. ලොව (හිමියන්) නුදුන් දෑය දුරු කොට වාසය කරම්හ. මත්පැන් නො බොමු. බොරු ද නො කියමු. එ හෙයින් අපගේ බාලයෝ නො මැරෙති.

1451. සුසිල්වත් මේ අප උතුම් ස්ත්‍රීන් කෙරෙහි දරුවෝ උපදිත් ද, ඔවුහු ධාරණ ශක්තිය ඇති මහනුවණැත්තෝ වෙති. බහුශ්‍රුත වෙති. වෙදයෙහි පාරප්‍රාප්තයෝ වෙති. එහෙයින් අප බාලයෝ නො මැරෙති.

1452. මවුපියෝ ද සහොදරසහොදරියෝ ද දරුවෝ ද බිරියෝ ද යි අපි හැම දෙනමෝ පරලොව සලකාගෙන පුණ්‍යක්‍රියාවන්හි හැසිරෙම්හ. එහෙයින් අපගේ බාලයෝ නො මැරෙති.

1453. දසිදසයෝ ද අප නිසා දිවි රැක ගන්නෝ ද පිරිවර ජනයෝ ද කම්කරුවෝ දෑ යි හැම දෙන පරලොව සලකා පුණ්‍යක්‍රියාවන්හි හැසිරෙති. එ හෙයින් අපගේ බාලයෝ නො මැරෙති.

1454. කුශල ධර්මය, ධර්මයෙහි හැසිරෙන්නහු එකාන්තයෙන් රකී. මනා ලෙස පුරුදු කළ කුශලය සුව ගෙන දෙයි. මනා ලෙස පුරුදු කළ කුශලයෙහි තෙල ආනිශංසය වෙයි. දම්සැරි තෙමේ දුගතියට නො යයි.

1455. කුශල ධර්මය දම්සැරියා වැසි සමයෙහි මහත් කුඩයක් සේ එකාන්තයෙන් රකී. කුසල් බෙලෙන් රක්ෂිත වූ මාගේ දම්පල් කුමර සුව ඇත්තේ වෙයි, මෙය අනෙකකුගේ ඇට වේ යයි.

9. මහාධම්මපාල ජාතක යි.

1456. නාස්මසෙ කතපාපම්හි නාස්මසෙ අලිකවාදිනෙ,
නාස්මසෙ අත්තත්ථපඤ්ඤම්හි[1] අතිසන්තෙපි[2] නාස්මසෙ.

1457. භවන්ති හෙකෙ පුරිසා ගොපිපාසකජාතිකා,
ඝසන්ති මඤ්ඤෙ මිත්තානි වාචාය න ච කම්මුනා.

1458. සුක්ඛඤ්ජලි පග්ගහීතා වාචාය පලිගුණ්ඨිතා,
මනුස්සඵෙග්ගු නාසීදෙ යස්මිං නත්ථි කතඤ්ඤුතා.

1459. න හි අඤ්ඤඤ්ඤ[3] චිත්තානං ඉත්ථීනං පුරිසාන[4] වා,
නානාව කත්වා සංසග්ගං තාදිසම්පි නාස්මසෙ.

1460. අනරියකම්මං ඔක්කන්තං[5] අත්ථෙතං[6] සබ්බ ඝාතිනං,[7]
නිසිතංව පටිච්ඡන්නං තාදිසම්පි නාස්මසෙ.

1461. මිත්තරූපෙනිධෙකච්චෙ සාඛල්ලෙන[8] අචෙතසා,
විවිධෙහි උපායෙහි[9] තාදිසම්පි නාස්මසෙ.

1462. ආමිසං වා ධනං වාපි යත්ථ පස්සති තාදිසො,
දූභිං[10] කරොති දුම්මෙධො තඤ්ච හන්ත්වාන[11] ගච්ඡති.

1463. මිත්තරූපෙන බහවො ඡන්නා සෙවන්ති සත්තවො,
ජහෙ කාපුරිසෙ හෙතෙ කුක්කුටො විය සෙනකං.

1464. යො ච උප්පතිතං අත්ථං න ඛිප්පමනුබුජ්ඣති,
අමිත්තවසමන්වෙති පච්ඡා ච මනුතප්පති.

1465. යො ච උප්පතිතං අත්ථං ඛිප්පමෙව නිබොධති,
මුච්චතෙ සත්තුසම්බාධා කුක්කුටො විය සෙනකා.

1466. තං තාදිසං කූටම්වොඩ්ඩිතං[12] වනෙ
අධම්මිකං නිච්චවිධංසකාරිනං,
ආරා විවජ්ජෙය්‍ය නරො විචක්ඛණො
සෙනං යථා කුක්කුටො වංසකානනෙ'ති,

10. කුක්කුටජාතකං.

1. නාස්මසෙ අත්තත්ථපඤ්ඤම්හි – සයා
2. අත්තසන්තෙපි – මජසං.
3. අඤ්ඤොඤ්ඤ – සයා.
4. පුරිසනං – මජසං
5. මුක්කන්තං – සයා.
6. අථෙතං – මසජං.
7. ඝාටිනං – මජසං.
8. සාබ්බලෙන – මජසං. සයා.
9. උපායන්ති – මජසං. සයා.
10. දූබ්භිං – මජසං, සයා.
11. හනත්වාන – මජසං, සයා.
12. කූටා – මජසං

1456. පවු කළ පුද්ගලයා කෙරෙහි විශ්වාස නො කරන්නේ ය. බොරු කියන්නහු කෙරෙහි විශ්වාස නො කරන්නේ ය. ආත්මාර්ථයට ම නුවණ යොදා ගන්නා පුද්ගලයා කෙරෙහි විශ්වාස නො කරන්නේ ය. අති ශාන්ත පුද්ගලයා කෙරෙහි ද විශ්වාස නො කරන්නේ ය.

1457. සමහර පුරුෂයෝ පිපාසිත ගවයන් වැනියහ. ඔහු මිතුරන් වචනයෙන් කාදමති. ක්‍රියාවෙන් කිසිත් නො කරති.

1458. කළගුණ නො දත් බොරු ඇඳිලි බැඳීම් පමණක් ඇති නිසරු මිනිසා කරා නො යන්නේ ය.

1459. වහා වෙනස් වන ස්වභාව ඇති ස්ත්‍රී පුරුෂයන් විශ්වාස නො කරන්නේ ය. හිතෛෂී නො වූවෙක් නොයෙක් හෙතු දක්වමින් (මිතුරකුසේ) එක් වන්නේ ද එ වැන්නහු විශ්වාස නො කරන්නේ ය.

1460. අනාර්‍ය්‍ය ක්‍රියාවට බැසගත් සථිර වචන නැති අවකාශ ලද කල්හි හැම දෙන නසන හෙයින් කොපුවෙක ලූ තියුණු කඩුවක් වැනි පුද්ගලයා විශ්වාස නො කරන්නේ ය.

1461. මෙහි (මෙ ලොවැ) යම් කෙනෙක් මිත්‍රප්‍රතිරූපක ව තද හිතැත්තාහු නමුදු සිලිටි බසින් බෙණෙමින් නානාවිධ කෛරාටික පැවැතුම් ඇත්තෝ වෙත් ද එ වැනියන් විශ්වාස නො කරන්නේ ය.

1462. එ බඳු මෝඩයා (මිත්‍ර ප්‍රතිරූපකයා) යම් මිතුරකුගේ නිවෙසකැ ආහාරයක් හෝ ධනයක් හෝ දුටු වේ නම් මිතුරාට ද්‍රොහ කොට එය පැහැර ගන්නේ ය. ඔහු ද (මිතුරා) නසාපියා යන්නේ ය.

1463. බොහෝ සතුරෝ මිත්‍රප්‍රතිරූපකයන් මෙන් ඇසුරු කෙරෙති. මෙ වැනි නින්දනීය පුරුෂයන් උකුස්සා දුරුලූ විලිකුළුහු මෙන් දුරු කරන්නේ ය.

1464. යමෙක් (යමක් පිළිබඳ) හටගත් කරුණු වහා වටහා නො ගනී ද. හේ සතුරන්ගේ වසඟයට පැමිණ පසුව තැවේ.

1465. යමෙක් (යමක් පිළිබඳ) හටගත් කරුණු වහා වටහා ගනී ද. උකුස්සාගෙන් මිදුනු විලිකුළුහු සේ සතුරු වියවුලෙන් මිදෙන්නේ ය.

1466. වනයේ අටවා තැබූ පාසයක් (මළපුඩුවක්) වැනි නො දැහැමි විනාශකාරී වූ ඔහු, උණ වනයේ වෙසෙන පිරික්සුම් නැණින් හෙබි ඇටිකුළා උකුස්සා දුරු කළා සේ දුරු කරන්නේ යි.

10. කුක්කුට ජාතක යි.

1467. අලඞ්කතො මට්ඨකුණ්ඩලී
මාලාභාරී හරිචන්දනුස්සදො,
බාහා පග්ගය්හ කන්දසි
වනමජ්ඣෙ කිං දුක්ඛිතො තුවං.

1468. සොවණ්ණමයො පභස්සරො
උප්පන්නො රථපඤ්ජරො මම
තස්ස චක්කයුගං න වින්දාමි
තෙන දුක්ඛෙන ජහාමි ජීවිතං.

1469. සොවණ්ණමයං මණීමයං
ලොහමයං අථ රූපියාමයං,
පාවද රථං කාරයාමි තෙ
චක්කයුගං පටිපාදයාමි තං.

1470. සො මාණවො තස්ස පාවදි
චන්දසුරියා උභයෙත්ථ භාතරො,
සොවණ්ණමයො රථො මම
තෙන චක්කයුගෙන සොභති,

1471. බාලො ඛො ත්වමසි මාණව
යො ත්වං පත්ථයසෙ අපත්ථියං,[1]
මඤ්ඤාමි තුවං මරිස්සසි
න හි ත්වං[2] ලච්ඡසි චන්දසූරියෙ.

1472. ගමනාගමනම්පි දිස්සති
වණ්ණධාතු උභයෙත්ථ වීථියො.
පෙතො පන නෙව දිස්සති
කො නු ඛො කන්දතං බාල්‍යතරො.

1473. සච්චං ඛො වදෙසි මාණව
අහමෙව කන්දතං බාල්‍යතරො,
චන්දං විය දාරකො රුදං
පෙතං කාලකතාභිපත්ථයෙ.

1474. ආදිත්තං වත මං සන්තං ඝතසිත්තං ව පාවකං,
වාරිනා විය ඔසිඤ්චං සබ්බං නිබ්බාපයෙ දරං.

1475. අබ්බහී[3] වත මෙ සල්ලං යමාසි හදයනිස්සිතං,[4]
යො මෙ සොකපරෙතස්ස පුත්තසොකං අපානුදි.

1476. සොහං අබ්බූළ්හසල්ලොස්මි වීතසොකො අනාවිලො,
න සොචාමි න රොදාමි තව සුත්වාන මාණවාති.

11. මට්ඨකුණ්ඩලිජාතකං.

---

1. අපත්ථියං - මජසං - සයා
2. නත්වං - මජසං
3. අබ්බුළ්හං - මජසං.
4. යමාසි හදයස්සිතං, - මජසං - සයා.

1467. නන් අබරණින් සැරැසී මටකොඬොල් පැළැඳැ විසිතුරු මල් දරන්නෝ, රන්වන් සඳුන් ආලෙප කොට ගත් තෙපි මේ වන මැද හිසැ අත් බැඳගෙන කවර හෙයින් අඬන්නහු ද?

1468. රන්මුවා දීප්තිමත් රියමැදිරියක් මට ලැබිණ. ඊට රියසක් දෙකක් නො ලබමි. ඒ නිසා උපන් දුකෙන් දිවි හරිමි.

1469. රන්මුවා, මිණිමුවා, ලොහොමුවා වූ හෝ රිදීමුවා රියක් ඔබට සාදමි. යම් බඳු රියක් කැමැත්තහු ද ඒ සක් යුගළය ඔබට ලබා දෙමි.

1470. ඒ මාණවකයා ඔහුට කීය: මාගේ රිය රන්මුවා වෙයි. දීප්තිමත් සඳහිරු දෙදෙනා සක් යුගළය (වශයෙන්) මාගේ රියට හොබනේ වේ.

1471. මාණවකය, නො පැතියයුතු දය පතන තෙපි මෝඩ-යෙකි. තොප මියැ යෙති යි සිතමි. තෙපි සඳහිරු නො ලබන්නහු ය.

1472. ගමනා ගමන (උදවීම හා බැස යාම) ද හැඩහුරු කම හා පැහැය ද ගමන් මාර්ග දෙක ද පෙනේ. මිය ගිය තැනැත්තා දකින්නට නැත. අඬන්නවුන්ගෙන් කවරෙක් වඩා බාලයතර ද?

1473. මාණවකය, සත්‍යයක් කීයෙහි ය. අඬන්නවුන් ගෙන් ඉතා බාලයා මම වෙමි. හඳ ඉල්ලා අඬන ගම්දරුවකු සේ මියැ පරලොව ගියකු පතන්නෙමි.

1474. ගිතෙල් ඉසින ලද ගින්නක් ලෙස ශොක ගින්නෙන් ඇවිල ගෙන සිටි මා, ජලය ඉසින ලද කලෙක මෙන් සියලු දහය නිවී ගියේ ය.

1475. සොවින් පෙළුණු මාගේ, පුත්‍ර ශොකය යමෙක් නැති කෙළේ ද, හේ මාගේ හදවතේ පැවැති ශොකය නමැති හුල ද ඒකාන්තයෙන් උදුරා දැමී ය.

1476. තරුණය, ඒ මම උපුටා හළ ශොක නමැති උල ඇත්තෙමි. ශොකය නැත්තෙමි. නො කැළඹුණ සිතැත්තෙමි. තොප ගේ බස් අසා ශොක නො කරමි. නො හඬමි.

11. මට්ටකුණ්ඩලී ජාතක යි.

1477. අපචන්තාපි[1] දිච්ඡන්ති සන්තො ලද්ධාන භොජනං,
කිමෙව ත්වං පචමානො යං න දජ්ජා න තං සමං.

1478. මච්ඡෙරා ච පමාද ච එවං දනං න දීයති,
පුඤ්ඤං ආකඞ්ඛමානෙන දෙය්‍යං හොති විජානතා.

1479. යස්සෙව භීතො න දදති මච්ඡරී තදෙව අදදතො භයං,
ජිඝච්ඡා ච පිපාසා ච යස්ස භායති මච්ඡරී.
තමෙව බාලං ඵුසති[2] අස්මිං ලොකෙ පරම්හි ච.

1480. තස්මා විනෙය්‍ය මච්ඡෙරං දජ්ජා දනං මලාභිභූ,
පුඤ්ඤානි පරලොකස්මිං පතිට්ඨා හොන්ති පාණිනං.

1481. දුද්දදං දදමානානං දුක්කරං කම්ම කුබ්බතං,
අසන්තො නානුකුබ්බන්ති සතං ධම්මො දුරන්නයො.

1482. තස්මා සතඤ්ච අසතඤ්ච නානා හොති ඉතො ගති,
අසන්තො නිරයං යන්ති සන්තො සග්ගපරායනා.

1483. අප්පස්මෙකෙ පවෙච්ඡන්ති[3] බහුනෙකෙ[4] න දිච්ඡරෙ,
අප්පස්මා දක්ඛිණා දින්නා සහස්සෙන සමං මිතා.

1484. ධම්මං චරෙ යොපි සමුඤ්ජකං[5] චරෙ
දරඤ්ච[6] පොසං දදං අප්පකස්මිං,
සතං සහස්සානං සහස්සයාගිනං
කලම්පි නාග්ඝන්ති තථාවිධස්ස තෙ.

1485. කෙනෙස යඤ්ඤො විපුලො මහග්ඝතො
සමෙන දින්නස්ස න අග්ඝමෙති,
කථං සහස්සානං සහස්සයාගිනං
කලම්පි නාග්ඝන්ති තථාවිධස්ස තෙ.

1486. දදන්ති හෙකෙ විසමෙ නිවිට්ඨා
ඣත්වා[7] වධිත්වා අථ සොචයිත්වා,
සා දක්ඛිණා අස්සුමුඛා සදණ්ඩා
සමෙන දින්නස්ස න අග්ඝමෙති
එවං සහස්සානං සහස්සයාගිනං
කලම්පි නාග්ඝන්ති තථාවිධස්ස තෙ'ති.

12. බිළාරකොසියජාතකං.

1. අපචයන්තොපි-මජසං.
2. ඵුස්සති - මජසං
3. අප්පමෙකෙ පවච්ඡන්ති - මජසං
4. බහුනා එකෙ - සයා
5. සමුඤ්ජිකං - මජසං
6. පුත්තදරං - මජසං
7. ඡෙත්වා - මජසං.

1477. නො පිසන සත්පුරුෂයෝ බොජුන් ලැබැ දෙන්නට කැමැති වෙති. පිසන ඔබ යම් හෙයෙකින් දෙන්නට කැමැති නො වෙත් නම් සුදුසු නො වේ.

1478. මසුරුකම ත් නො සැලකිල්ල ත් නිසා දන් නො දෙනු ලැබේ. පින් කැමැති නුවණැත්තා දන් දියයුතු වේ.

1479. දන් දීම නිසා සාපිපාසාවෙන් පීඩා විඳින්නට සිදු වේ ය යන බිය නිසා මසුරු පුහුලා නො දේ ද එය ම ඔහුට බිය වන්නේ ය. සාපිපාසා දෙකට මසුරා බිය වේ ද එය ම (ඔහු) දෙ ලොවැ දී පෙළයි.

1480. එ හෙයින් මසුරුකම මඩින්නේ මසුරුකම දුරු කොට දන් දෙන්නේ ය. කළ පින් ප්‍රාණීන්ට පරලොව දී පිහිට වේ.

1481. මසුරු සිත් මැඩ දියයුතු බැවින් දන් දීම දුෂ්කර ය. අසත්පුරුෂයෝ (දනානිසංස නො දන්නෝ) ඔවුන් ගිය මඟෙහි නො යත්. සත්පුරුෂයන් (බෝසත්වරු) ගිය මගැ යාම සෙස්සනට පහසු නො වේ.

1482. එහෙයින් සත්පුරුෂයන්ගේ ද අසත්පුරුෂයන්ගේ ද මෙයින් මතු උපත වෙනස් වේ. අසත්පුරුෂයෝ නිරයට යති. සත්-පුරුෂයෝ දෙව්ලොව යති.

1483. ඇතැමෙක් මඳ වස්තුවකිනු දු දන් දෙත්. ඇතැමෙක් බොහෝ වස්තුව ඇතත් දන් නො දෙත්. මඳ වස්තුවෙන් දුන් දනය ද මහානිසංස ඇති හෙයින් ප්‍රමාණ කොට බැලීමේ දී දහසක් පමණ වැය කොට දුන් දන හා සම වේ.

1484. නො දැහැමි ව සපයාගත් මුදලින් ඉසුරන් ලක්‍ෂයක් දෙනා දෙන දනයෝ ත්‍රිවිධ සුචරිතය පුරමින් අඹුදරුවන් ද රැකැ ගනිමින් දිළින්දකු ස්වල්ප වශයෙන් හෝ කරන පරිත්‍යාගයක සොළොසින් භාගයක් පමණ නො අගනාහ.

1485. දෙය ධර්ම බොහෝ බැවින් විශාල වූ ලක්‍ෂයක් දෙනා එක් ව දෙන දනය, දැහැමි ව සපයා ගත් දෙයින් දුන් දනය හා සම නො වන්නේ කවර කරුණෙකින් ද? දැහැමි ව සපයා ගත් දෙයින් දන් දෙන දිළින්දගේ දනමය පින්කමේ (සොළොසින්) කොටසක් පමණවත් නො අගනේ කෙසේ ද?

1486. අනුන් තළා පෙළා අඬවා හිංසා කොට ඇතැම් කෙනෙක් දන් දෙති. එලෙස දුන් දන දැහැමි ව සපයාගත් වස්තුවෙන් දිළින්ද දුන් දනය හා සමාන නො වේ. නො දැහැමි වස්තුවෙන් යාග කළ ලක්‍ෂයක් දෙනාගේ දනය දිළින්දගේ දනයෙහි සොළොස්වෙනි කොටස තරම්වත් නො අගී.

12. බිළාර කොසිය ජාතක යි.

1487. වණ්ණවා අභිරූපොසි ඝනො සඤ්ජාතරොහිතො,
චක්කවාක සුරූපොසි විප්පසන්නමුඛින්ද්‍රියො.

1488. පාඨීනං[1] පාවුසං මච්ඡං වලජං මුඤ්ජරොහිතං,
ගඞ්ගාය තීරෙ නිසින්නො[2] එවං භුඤ්ජසි භොජනං.

1489. න වාහමෙතං භුඤ්ජාමි ජඞ්ගලානොදකානි වා,
අඤ්ඤත්‍ර සෙවාලපණකා එතං මෙ සම්ම භොජනං.

1490. න වාහමෙතං සද්දහාමි චක්කවාකස්ස භොජනං,
අහං හි[3] සම්ම භුඤ්ජාමි ගාමෙ ලොණියතෙලියං.

1491. මනුස්සෙසු කතං භත්තං සුචිමංසූපසෙචනං,
න ච මෙ තාදිසො වණ්ණො චක්කවාක යථා තවං.

1492. සම්පස්සං අත්තනි වෙරං හිංසයං[4] මානුසිං පජං,
උත්‍රස්තො ඝසසී භීතො තෙන වණ්ණො තවෙදිසො.

1493. සබ්බලොක විරද්ධොසි[5] ධඞ්ක පාපෙන කම්මුනා,
ලද්ධො පිණ්ඩො න පීණෙති තෙන වණ්ණො තවෙදිසො.

1494. අහම්පි සම්ම භුඤ්ජාමි අහිංසා[6] සබ්බපාණිනං,
අප්පොස්සුක්කො නිරාසඞ්කී අසොකො අකුතො භයො.

1495. සො කරස්සු අනුභාවං වීතිවත්තස්සු සීලියං,
අහිංසාය චරං ලොකෙ පියො හොහිසි මම්මිව.

1496. යො න හන්ති න ඝාතෙති න ජිනාති න පාපයෙ,
මෙත්තංසො සබ්බභූතෙසු වෙරං තස්ස න කෙනචීති.

13. චක්කවාකජාතකං.

1. පාතීනං – මජ්සං
2. ගඞ්ගා තීරෙ නිසින්නොසි – මජ්සං, ස්‍යා
3. අහංපි – ස්‍යා.
4. හිංසාය – මජ්සං, ස්‍යා
5. විරුද්ධොසි – මජ්සං – ස්‍යා
6. අහිංස – මජ්සං

1487. සක්වාලිහිණිය, (ඔබ) වර්ණවත් ශරීර ඇත්තහු ය. රූප සම්පන්න වූවහු ය. ඝන වූ සිරුරු ඇත්තහු ය. රන්වන් මනා රූ ඇත්තහු ය. පහන් වූ මුහුණ හා ඉඳුරන් ඇත්තහු ය.

1488. මෙසේ ගං තෙර සිටැ පෙටි මස්, ලූල් මස්, වලා මස්, මොඳුව මස් හා රේ මස් බුදින්නහු ද?

1489. මිතුර, මේ සෙවෙල් සහ දියපරඬල් මගේ ආහාරය යි. මම මෙය හැර දියෙහි හෝ වනයෙහි හටගන්නා වූ වෙනත් මාංශයක් අනුභව නො කරමි.

1490. සෙවෙල් සහ දියපරඬල් සක්වාලිහිණියාගේ ආහාර යයි මම විශ්වාස නො කරමි. මිතුර, මම ගමෙහි ලුණු හා තෙල් මුසු ආහාර අනුභව කරමි.

1491. චක්‍රවාකය, මනුෂ්‍යයන්ට පිළියෙළ කළ මස් සහිත පවිත්‍ර ආහාරය බුදිතත් ඔබට මෙන් එ බඳු පැහැයක් මට නැත.

1492. (තෙපි) ක්‍රොධ සිතින් බලමින් මිනිසුන්ට හිංසා කෙරෙමින් තැති ගත් සිතින් බුදින්නහු ය. එහෙයින් තොපගේ පැහැය මෙ බඳු වේ.

1493. කාකය, පාපකර්ම බලයෙන් සියලු ලොකයා (ඔබට) විරුද්ධ ය. ඔබ ලද ආහාරය ඔබ නො පිනව යි. එ හෙයින් ඔබේ පැහැය මෙ බඳු වේ.

1494. මිතුර, මම් වනාහි සර්වසත්නට හිංසා නො කරන්නෙමි, මඳ වෑයමකින් යුතු ව සැක රහිත ව ශොක නැති ව බියකු දු නැති ව බුදිමි.

1495. තෙපි, වෑයම් කරව, සිය දුසිල් බව ඉක්මවා පවතුව, (දුසිල් බව අත් හරුව) අහිංසක ව ලොවෙහි හැසිරෙව, මා මෙන් ලොවට ප්‍රිය වන්නහු.

1496. යමෙක් අනුන් නො නසා ද නො නස්වා ද ධන හානි නො කෙරේ ද, නො කරවා ද, සර්ව සතුන් කෙරෙහි මෙත් කෙරේ ද ඔහුට කිසිවෙක් වෛර නො කෙරේ.

10. චක්කවාක ජාතක යි.

1497. සච්චං කිර ත්වමපි භූරිපඤ්ඤ[1]
යා තාදිසී සිරි ධිතී මුතී[2] ච,
න තායතෙ භාවවසූපනීතං
යො යාවකං භුඤ්ජසි අප්පසූපං.

1498. සුඛං දුක්ඛෙන පරිපාචයන්තො
කාලාකාලං විචිනං ඡන්දඡන්නො,[3]
අත්ථස්ස ද්වාරානි අවාපුරන්තො
තෙනාහං[4] තුස්සාමි යවොදනෙන,

1499. කාලඤ්ච ඤත්වා අභිජීහනාය
මන්තෙහි අත්ථං පරිපාචයිත්වා,
විජම්භිස්සං[5] සීහවිජම්භිතානි
තායිද්ධියා දක්ඛසි මං පුනාපි.

1500. සුඛීහි එකෙ[6] න කරොන්ති පාපං
අවණ්ණසංසග්ගභයා පුනෙකෙ,
පහූ සමානො විපුලත්ථචින්තී
කිං කාරණා මෙ න කරොසි දුක්ඛං.

1501. න පණ්ඩිතා අත්තසුඛස්ස හෙතු
පාපානි කම්මානි සමාචරන්ති,
දුක්ඛෙන ඵුට්ඨා ඛලිතාපි සන්තා
ඡන්දා ච දොසා න ජහන්ති ධම්මං.

1502. යෙන කෙනචි වණ්ණෙන මුදුනා දාරුණෙන වා,
උද්ධරෙ දීනමත්තානං පච්ඡා ධම්මං සමාචරෙ.

1503. යස්ස රුක්ඛස්ස ඡායාය නිසීදෙය්‍ය සයෙය්‍ය වා,
න තස්ස සාඛං භඤ්ජෙය්‍ය මිත්තදූභො හි පාපකො.

1504. යස්සාපි ධම්මං[7] මනුජො විජඤ්ඤා
යෙ චස්ස කඞ්ඛං විනයන්ති සන්තො,
තං හිස්ස දීපඤ්ච පරායණඤ්ච
න තෙන මිත්තං ජරයෙථ[8] පඤ්ඤො.

1. භූරිපඤ්ඤ – මජ්සං.
2. මතී – මජ්සං.
3. ඡන්නඡන්නො – මජ්සං.
4. තෙනාහ – මජ්සං.
5. විජම්භිසං – මජ්සං.
6. සුඛී පි එතෙ – මජ්සං.
7. යස්ස හි ධම්ම පුරිසො විජඤ්ඤා – මජ්සං.
8. ජීයෙථ – සයා.

1497. මහානුවණැත්ත. යම්බඳු වූ ඔබ ව්‍යඤ්ජන ස්වල්පයක් සමග යවසාලේ බත් බුදින්නහු ය. ඔබගේ යම් සෞභාග්‍යයක්, ධෛර්යයක් හා සිහියක් වේ ද, එබඳු සෞභාග්‍යය විපතට පත් ඔබ නො රකියි. එ හෙයින් සෞභාග්‍යය උතුම් වෙයි, ප්‍රඥාව උතුම් නො වෙයි (යන) කීම සැබෑ වෙයි.

1498. මම දුකෙන් සැප දියුණු කරන්නෙම් සැහවී විසීමටත් නො සැහවී විසීමටත් (මෙය) යොග්‍ය සමය යයි සිතා සැහවුණෙමි. දියුණුවට දෙර අරිනුයේ යවසාලේ බතින් ප්‍රීත වෙමි.

1499. වෑයම් කරන්නට යොග්‍ය කාලය දැනැ නුවණින් දියුණුව වැඩී කර ගෙන සිංහයකු සේ විජෘම්භණය කරන්නෙමි. දියුණු වූ මා නැවත දකින්නහු ය.

1500. පණ්ඩිතය, සැප ඇත්තෝ පාපකර්ම නො කෙරෙති. තවත් කෙනෙක් අපකීර්තියට බියෙන් පාපකර්ම නො කෙරෙති. බොහෝ දේ සිතීමේ හැකියාව ඇති තෙපි කවර හෙයින් මට දුක් (කරදර) නො කරන්නහු ද?

1501. පණ්ඩිතයෝ ආත්මාර්ථය සලකා පාපකර්ම නො කරති. දුකට පත් වුවත් සම්පත් ගිලිහී ගියත් ඡන්දය නිසා හෝ ද්වෙෂය නිසා හෝ ධර්මය නො හරිත්.

1502. මොළොක් වූ හෝ දරුණු වූ හෝ කිසියම් ආකාර-යෙකින් තමාගේ දීනත්වය උපුටා හරින්නේ ය. ඉක්බිති ව සුචරිතයෙහි හැසිරෙන්නේ ය.

1503. යම් රුකකැ සෙවණෙහි හුන්නේ වේ ද හොත්තේ වේ ද ඒ රුකෙහි අතු නො කඩනේ ය. මිත්‍රද්‍රොහී කම දීන හෙයිනි.

1504. යම් පුරුෂයෙක් පුරුෂයකුගෙන් ධර්මය උගත්තේ ද, සැක දුරු කෙරේ ද එය ඔහුට පිහිටකි. පිළිසරණෙකි. එ හෙයින් ඇඳුරු ව සිටියහු සමග වූ මිතුරුබව දිරාපත් නො කරන්නේ ය.

1505. අලසො ගිහී කාමභොගී න සාධු
අසඤ්ඤතො පබ්බජිතො න සාධු,
රාජා න සාධු අනිසම්මකාරී
යො පණ්ඩිතො කොධනො තං න සාධු.

1506. නිසම්ම ඛත්තියො කයිරා නානිසම්ම දිසම්පති,
නිසම්මකාරිනො රාජ යසො කිත්ති ච වඩ්ඪතීති.

14. භූරිපඤ්ඤජාතකං.

1507. කිං සු නරො ජප්පමධිච්චකාලෙ
කං වා විජ්ජං කතමං වා සුතානං,
සො මච්චො අස්මිං ච පරම්හි ලොකෙ
කථං කරො සොත්ථානෙන ගුත්තො.

1508. යස්ස දෙවා පිතරො ච සබ්බෙ
සිරිංසපා[1] සබ්බභූතානි චාපි,
මෙත්තාය නිච්චං අපචිතානි හොන්ති
භූතෙසු වෙ සොත්ථානං තදාහු.

1509. යො සබ්බලොකස්ස නිවාතවුත්ති
ඉත්ථී පුමානං සහ දාරකානං,
ඛන්තා දුරුත්තානං අප්පටිකූලවාදී
අධිවාසනං සොත්ථානං තදාහු.

1510. යො නාවජානාති සහායමත්තෙ
සිප්පෙන කුල්‍යාහි ධනෙන ජච්චා,
රුචිපඤ්ඤො අත්ථකාලෙ මුතීමා
සහායෙසු වෙ සොත්ථානං තදාහු.

1511. මිත්තානි වෙ යස්ස භවන්ති සන්තො
සංවිස්සත්ථා[2] අවිසංවාදකස්ස,
න මිත්තදූභී[3] සංවිභාගී ධනෙන
මිත්තෙසු වෙ සොත්ථානං තදාහු

1512. යස්ස භරියා තුල්‍යවයා සමග්ගා
අනුබ්බතා ධම්මකාමා පජාතා,[4]
කොලිනියා සීලවතී පතිබ්බතා
දාරෙසු වෙ සොත්ථානං තදාහු.

---

1. සරිසපා – මජසං
2. සංවිස්සට්ඨා – මජසං
3. න මිත්ත දුබ්භී – මජසං
4. සජාතා – මජසං.

1505. කම්සැප විඳින අලස ගිහියා නො මැනැවි. හික්මීම නැති පැවිද්ද නො මැනැවී. විමසීම රහිත ව ක්‍රියා කරන රජ නො මැනැවි. යම් පණ්ඩිතයෙක් කිපෙන ගතියෙන් යුතු වේ නම් හේ ද නො මැනැවි.

1506. ක්‍ෂත්‍රිය තෙම පරීක්‍ෂාකාරී ව වැඩ කරන්නේ ය. නො විමසා නො කරන්නේ ය. රජතුමනි, පරීක්‍ෂාකාරිව වැඩ කරන්නාගේ යශස ද කීර්තිය ද වැඩේ.

14. භූරිපඤ්ඤ ජාතක යි.

1507. අභිවෘද්ධිය රුස්නා පුරුෂයා වේදය හෝ ශ්‍රුතය හදරා කවර ආකාරයෙකින් ක්‍රියා කිරීමෙන් දෙ ලොව ආරක්‍ෂා කර ගත්තේ වේ ද?

1508. සියලු දෙවියෝ ද බ්‍රහ්මයෝ ද දීර්ඝජාතීහු ද සියලු සත්ත්වයෝ ද මෙත් සිතින් පුදන ලද්දෝ ද මිනිසුන්ට එය මඟුලෙකැ යි කියත්.

1509. යමෙක් ලොකයා කෙරේ නිරහඞ්කාර පැවැතුම් ඇත්තේ ද, ස්ත්‍රීපුරුෂයන් සහ ළමයින් වරදවා කී බස් කමා කෙරේ ද, ගොරෝසු කථා නැත්තේ ද ඉවැසීම ඇත්තේ ද එය මඟුලෙකැ යි කියත්.

1510. යමෙක් යහළුවන් හා මිතුරන් කෙරේ ශිල්පය නිසා හෝ කුලය නිසා හෝ ධනය නිසා හෝ ජාතිය නිසා හෝ අවමානයට ලක් නො කෙරේ ද මනා සිහිය හා නුවණ ඇත්තේ ද එය මඟුලෙකැ යි කියත්.

1511. රැවැටිලි නැතියන් හා සත්පුරුෂයෝ එකැතින් මිතුරු වෙත් ද විශ්වාස වෙත් ද මිත්‍රද්‍රොහි නො වෙත් ද, සිය ධනය මිතුරන්ට බෙදත් ද; මිතුරන් අතරේ ඒ විශ්වාසය මඟුලෙකැ යි කියත්.

1512. යමකුගේ බිරිඳ සමාන වයස ඇත්තී ද සමගි සම්පන්න ද සැමියා අනුව වසා ද ත්‍රිවිධ සුචරිත ක්‍රියාවන් කැමැත්තී ද දරුවන් ලබන්නී ද කුලවත් වී ද පතිව්‍රතා ගුණය ඇත්තී ද එය බිරියන් කෙරේ මඟුලෙකැ යි කියත්.

1513. යස්ස රාජා භූතපති යසස්සි
ජානාති සොචෙය්‍යං[1] පරක්කමඤ්ච,
අද්වෙජ්ඣතාසු[2] හදයං මමන්ති
රාජූසු වෙ සොත්ථානං තදාහු.

1514. අන්නඤ්ච පානඤ්ච දදති සද්ධා
මාලඤ්ච ගන්ධඤ්ච විලෙපනඤ්ච[3],
පසන්නචිත්තො අනුමොදමානො
සග්ගෙසු වෙ සොත්ථානං තදාහු.

1515. යමරියධම්මෙන පුනන්ති වද්ධා[4]
ආරාධිතා සමචරියාය සන්තො,
බහුස්සුතා ඉසයො[5] සීලවන්තං
අරහන්තමජ්ඣෙ සොත්ථානං තදාහු.

1516. එතානි ඛො සොත්ථානානි ලොකෙ
විඤ්ඤුප්පසත්ථානි[6] සුඛුද්‍රයානි,
තානීධ සෙවෙථ නරො සපඤ්ඤො
න හි මඞ්ගලෙ කිඤ්චනමත්ථි[7] සච්චන්ති.

15. මහාමඞ්ගලජාතකං.

1517. උට්ඨෙහි කණ්හ කිං සෙසි කො අත්ථො සුපිනෙන තෙන
යොපි තුය්හ සකො භාතා හදයං චක්ඛුඤ්ච[8] දක්ඛිණං
තස්ස වාතා බලීයන්ති ඝටො ජප්පති කෙසව.

1518. තස්ස තං වචනං සුත්වා රොහිණෙය්‍යස්ස කෙසවො,
තරමානරූපො වුට්ඨාසි භාතුසොකෙන අට්ටිතො.

1519. කින්නු උම්මත්තරූපොව කෙවලං ද්වාරකං ඉමං,
සසො සසොති ලපසි කො නු තෙ සසමාහරි.

1520. සොවණ්ණමයං මණීමයං ලොහමයං අථ රූපියාමයං,
සඞ්ඛසිලාපවාළමයං කාරයිස්සාමි තෙ සසං.

1521. සන්ති අඤ්ඤෙපි සසකා අරඤ්ඤෙ වනගොචරා,
තෙපි තෙ ආනයිස්සාමි කීදිසං සසමිච්ඡසි.

1. සොචෙය්‍ය – මජසං
2. අම්ජ්ඣතා – මජසං.
3. විභූසනඤ්ච – මජසං
4. පුනන්ති වුද්ධා – මජසං
5. ඉස්සයො – මජසං
6. විඤ්ඤුපසට්ඨානි – මජසං
7. කිංචින – සයා
8. චක්ඛු – මජසං

1513. ජනපති වූ පරිවාර ඇත්තා වූ රජ යමකුගේ පවිත්‍රකම, එඩිතරකම, දනී ද (මෙ) මට පක්‍ෂපාතී ය නො වෙනස් වචන ඇත්තේ යයි දනී ද එය රජුන් කෙරේ මඟුලෙකැ යි කියත්.

1514. සැදැහැති ව පහන් සිතැති ව සතුටු සිතින් කැමබීම් සුවඳමල් විලෙවුන් දේ ද එය ස්වර්ගගාමී මඟුලෙකැ යි කියත්.

1515. ඤාණවෘද්ධ වූ ප්‍රතිපත්ති ගරුක වූ සත්පුරුෂ වූ බහුශ්‍රැත වූ සිල්වත් වූ ඍෂිවරු ආර්යධර්මයෙන් පවිත්‍ර වෙත් නම් එය රහතන් වහන්සේ කෙරේ ලදමනා මඟුලෙකැ යි කියත්.

1516. මේ මංගලයන් ලොකයේ නුවණැත්තන් විසින් සැපත් වැඩීමට හෙතු වේ යයි පසසන ලදූ, එ හෙයින් නැණවත් මිනිසා ඒ මංගලයන් ම සොයන්නේ ය. මේ මංගලයන්ගෙන් තොර සත්‍ය වූ වෙනත් මංගල නැත.

15. මහාමඞ්ගල ජාතක යි.

1517. කෙසවය, ඔබේ හදවත වැනි දකුණුඇස හා සම වූ සත නැමැති සිය සොහොයුරු කෙනෙක් වෙත් ද ඔහුගේ හදවත අපස්මාර වාතයෝ පෙළත්. කෘෂ්ණය නැගිටින්න. වැද හෝනේ කිම? තොපගේ නිදගැනීමෙන් කවර ප්‍රයොජනයක් ද?

1518. රොහණෙයයාගේ කීම අසා ඉක්මන් වූ කෙසව තෙම සෝවුරු සොවින් පීඩාවට පැමිණ නැගීසිටියේ ය.

1519. උමතුවූවකු සේ ද්වාරවතී පුරය පුරා යමින් සාවා සාවා ය යි කුමට කියහි? ඔබගේ සාවා ගත්තේ කවරෙක් ද?

1520. රන්මුවා, මිණිමුවා, ලොහොමුවා, රිදීමුවා, සක්මුවා සෙල්මුවා, පබළුමුවා සාවකු ඔබට සාදවමි.

1521. වනයේ හැසිරෙන වෙනත් සාවෝ ද ඇත. තොපට ඔවුන් ද ගෙනෙන්නෙමි. තෙපි කෙබඳු සාවකු කැමැත්තහු ද?

1522. නවාහමෙතං ඉච්ඡාමි යෙ සසා පථවිං සිතා,
චන්දතො සසමිච්ඡාමි තමෙම ඔහර කෙසව.

1523. සො නූන මධුරං ඤාති ජීවිතං විජහිස්සසි,
අපත්ථියං යො පත්ථයසි චන්දතො සසමිච්ඡසි.

1524. එවඤ්චෙ කණ්හ ජානාසි යදඤ්ඤමනුසාසසි
කස්මා පුරෙ මතං පුත්තං අජ්ජාපිමනුසොචසි.

1525. යං න ලබ්භා මනුස්සෙන අමනුස්සෙන වා පුන,[1]
ජාතො මෙ මාමරි පුත්තො කුතො ලබ්භා අලබ්භියං.

1526. න මන්තා මූලභෙසජ්ජා ඔසධෙහි ධනෙන වා,
සක්කා ආනයිතුං කණ්හ යමෙපතමනුසොචසි.

1527. යස්ස එතාදිසා අස්සු අමච්චා පුරිසපණ්ඩිතා,
යථා නිජ්ඣාපයෙ අජ්ජ ඝතො පුරිසපණ්ඩිතො.

1528. ආදිත්තං වත මං සන්තං ඝතසිත්තං ව පාවකං,
වාරිනා විය ඔසිඤ්චං සබ්බං නිබ්බාපයෙ දරං.

1529. අබ්බහී වත මෙ සල්ලං යමාසි හදයනිස්සිතං,
යො මෙ සොකපරෙතස්ස පුත්තසොකං අපානුදි.

1530. සොහං අබ්බූළ්හසල්ලොස්මි වීතසොකො අනාවිලො,
න සොචාමි න රොදාමි තව සුත්වාන මාණව.

1531. එවං කරොන්ති සප්පඤ්ඤා යෙ හොන්ති අනුකම්පකා,
නිවත්තයන්ති සොකම්හා ඝතො ජෙට්ඨංව භාතරන්ති:

16. ඝතපණ්ඩිතජාතකං.

දසකනිපාතං නිට්ඨිතං.

තස්සුද්දානං:

දළ්හකණ්හධනඤ්ජයසබ්බවරො
රාජා සත්තාහ සසඛ තක්කළිනා,
ධම්මං කුක්කුටකුණ්ඩලිභොජනද
චක්කවාක සුභූරිසසොත්ථී ඝතො.

---

1. පන – මජ්සං

1522. පොළොවේ වෙසෙන හාවුන් මම නො කැමැත්තෙමි. හඳේ හාවා (ලබනු) කැමැත්තෙමි. කෙසව, ඒ හාවා මට ගෙන දෙන්න.

1523. ප්‍රිය ඥාතිය, හඳෙන් හාවා පතන තෙපි ඒකාන්තයෙන් මධුර වූ ජීවිතය අත් හරින්නහු ය. යම් බඳු තෙපි නො පැතියයුත්තක් පතන්නහු ද ඒ හෙයිනි.

1524. කෘෂ්ණය, ඉදින් මෙසේ දන්නේ නම් අනෙකකුට අනුසාසනා කරනුයේ (කිම) පෙර මළා වූ පුත්‍රයාට අදත් ශොක කරන්නේ කවර හෙයින් ද?

1525. උපන් මාගේ පුතා නැවත නො මැරේව යි මනුෂ්‍යයකු විසින් හෝ අමනුෂ්‍යයකු විසින් හෝ ලද නො හැකි ය. ඒ හෙයින් ලද නො හැකි දෙය කොතැනින් ලැබේ ද?

1526. කෘෂ්ණය, මියගිය යමකු නිසා නැවැත නැවැත ශොක කෙරහි ද (මළහු) මන්ත්‍ර බලයෙන් හෝ බෙහෙත්මුල් බලයෙන් හෝ අන් ඔසු බලයෙකින් හෝ ධන බලයෙන් හෝ ගෙනෙන්නට නො හැකි ය.

1527. පුත් සොවින් පෙළුණු මට සතපණ්ඩිත තෙම අද කරුණු වටහවා ශොකය නැති කෙළේ ය. සෙස්සනටත් මෙ වැනි පණ්ඩිත ඇමැතිවරු වෙත් නම් කවර ශොකයෙක් ද?

1528. ගිතෙල් ඉසින ලද ගින්නක් ලෙස ශොක ගින්නෙන් ඇවිලගෙන සිටි මා, ජලය ඉසින ලද කලෙක මෙන් (මාගේ) සියලු දහ නිවීගියේ ය.

1529. සොවින් පෙළුණු මාගේ පුත්‍රශොකය යමෙක් නැති කෙළේ ද හේ මාගේ හදවතේ පැවැති ශොකය නමැති හුල ද ඒකාන්තයෙන් උදුරාදැමී ය.

1530. ඒ මම උපුටාලූ ශොකය නමැති හුල් ඇත්තෙමි. ශොක රහිතයෙමි. නො කැළඹුණු සිතැත්තෙමි. තොපගේ බස් අසා ශොක නො කරමි. නො හඬමි.

1531. යම් කෙනෙක් අනුකම්පා ඇති ප්‍රාඥයෝ වෙත් ද දෙටු සොහොයුරු සතයා මෙන් ජනයා සොවින් දුරු කෙරෙත්.

16. සතපණ්ඩිත ජාතක යි.

දසක නිපාතය නිමි.

එහි උද්දානය :

චතුද්වාරජාතක යැ කණ්හ ජාතක යැ චතුපොසථික ජාතක යැ සඞ්ඛජාතක යැ කණ්හදීපායන ජාතක යැ නිග්‍රොධ ජාතක යැ තක්කල ජාතක යැ මහා ධම්මපාලජාතක යැ කුක්කුටජාතක යැ මට්ටකුණ්ඩලී ජාතක යැ බිළාරකොසිය ජාතක යැ චක්කවාකජාතක යැ භූරිපඤ්ඤජාතක යැ මහාමඞ්ගල ජාතක යැ ඝතජාතක යි සොළසෙකි.

1532. තස්ස නාගස්ස විප්පවාසෙන
විරූළ්හා සල්ලකී[1] ච කුටජා ච,
කුරුවින්දකරවරා භිසසාමා[2]
නිවාතෙ පුප්ඵිතා ච කණිකාරා.[3]

1533. කොවිදෙව සුවණ්ණකායූරා
නාගරාජං භරන්ති පිණ්ඩෙන,
යත්ථ රාජා රාජකුමාරො වා
කවචමභිහෙස්සති අසම්භීතො.

1534. ගණ්හාහි නාග කබළං මා නාග කිසකො භව,
බහූනි රාජකිච්චානි යානි[4] නාග කරිස්සසි.

1535. සා නූන සා කපණිකා අන්ධා අපරිනායිකා,
ඛාණුං පාදෙන ඝට්ටෙති ගිරිං චණ්ඩොරණංපති.

1536. කා නු තෙ සා මහානාග අන්ධා අපරිනායිකා,
ඛාණුං පාදෙන ඝට්ටෙති ගිරිං චණ්ඩොරණංපති.

1537. මාතා මෙ සා මහාරාජ අන්ධා අපරිනායිකා,
ඛාණුං පාදෙන ඝට්ටෙති ගිරිං චණ්ඩොරණංපති.

1538. මුඤ්චථෙතං මහානාගං යො යං භරති මාතරං,
සමෙතු මාතරා නාගො සහ සබ්බෙහි ඤාතිභි.

1539. මුත්තොච බන්ධනා නාගො කාසිරාජෙන පෙසිතො,
මුහුත්තං විස්සමිත්වාන[5] අගමා යෙන පබ්බතො.

1540. තතො සො නලිනිං[6] ගන්ත්වා සීතං කුඤ්ජරසෙවිතං,
සොණ්ඩාය උදකමාහත්වා[7] මාතරං අභිසිඤ්චථ.

1541. කොයං අනරියො දෙවො අකාලෙන[8] පි වස්සති,
ගතො මෙ අත්‍රජො පුත්තො යො මය්හං පරිචාරකො.

1542. උට්ඨෙහි අම්ම කිං සෙසි ආගතො ත්‍යාහමත්‍රජො,
මුත්තොම්හි කාසිරාජෙන වෙදෙහෙන යසස්සිනා.

1543. චිරං ජීවතු සො රාජා කාසීනං රට්ඨවද්ධනො,[9]
යො මෙ පුත්තං අමොචෙසි සදා වුද්ධාපචායිකන්ති:[10]

1. මාතුපොසකජාතකං.

1. සල්ලකියා ච කුටජා – සයා.
2. භිසාමාච – සයා භිසස්සමා ච – මජසං.
3. කණිකාරා – මජසං, සයා.
4. තානි – මජසං.
5. අස්සයිත්වාන – මජසං.
6. නලිනං – සයා.
7. මාහිත්වා – සයා, මජසං.
8. අකාලෙන පවස්සති – මජසං.
9. රට්ඨවඩ්ඪනො – මජසං, සයා.
10. බුද්ධාපචායිකං – මජසං. වුඩ්ඪා – සයා.

1532. මාගේ පුත්‍රයා වන ඇතා වෙන් ව ගිය නිසා ඉඳුසල් ගස් කෙළිඳ ගස් හා කුරුඳු ගස් ද ඉළුක් ආදි තෘණ වර්ග ද බොඩහමු ගස් ද වැඩුණාහ. කඳු පමුලැ කිණිහිරි ගස්හි මල් පිපී ගියහ.

1533. යම් කිසි තැනෙකැ රන් අබරණ සහිත රාජ රාජමහාමාත්‍යයෝ ඇතා ආහාරයෙන් පොෂණය කරත් ද. යම් ඇතකු පිට රජෙක් හෝ රාජ කුමාරයෙක් හෝ හිඳ ගෙන බිය රහිත ව සතුරන්ගේ යුද ඇඳුම් විනාශ කෙරේ ද,

1534. නාගය, (හස්තිය) ආහාර අනුභව කරව. නාගය, කෘශ නො වව, රාජ කටයුතු බොහෝ ඇත. ඒ කටයුතු කරන්නෙහි ය.

1535. දුකට පත් වූ අන්ධ වූ අසරණ වූ ඒ මාගේ මව් ඇතිනි (හඬමින්) චණෝරණ පව්වෙහි කිලිහුරන් (දවකඳන්) පයින් පොළති සිතමි.

1536. මහානාගය, අන්ධ වූ මහ පෙන්වන්නකු නැති ද චණ්ඩෝරණ පව්වෙහි කිලිහුරන් පයින් පොළන ඕ තොපට කවරක් වේ ද?

1537. මහරජ, අන්ධ වූ මහ පෙන්වන්නකු නැති චණ්ඩෝරණ පව්වෙහි කිලිහුරන් පයින් පොළන මාගේ මෑණියෝ ය.

1538. යම් ඇතෙක් මව පොෂණය කෙරේ ද ඒ ඇතා මුදවු. සියලු නෑයන් සමග (ගොස්) ඇතා මව හා එක් වේවා!

1539. කසී රජු විසින් බැම්මෙන් මුදවා යැවූ ඇතා මොහොතක් විඩා හැර, පව්ව යම් තැනක ද (එතැනට) ගියේ ය.

1540. ඉක්බිති ඒ ඇතා සිහිල් දිය ඇති ඇතුන් ගැවසුන විලට ගොස් සොඬින් දිය ගෙන මවට ඉස්සේ ය.

1541. නො කල්හි වස්නා මේ නොහොබනා වැස්ස කුමක් ද? යමෙක් මට උපස්ථායක ව සිටියේ ද ඒ මාගේ පුත්‍රයා ගියේ ය.

1542. අම්මෙ, නැගිටින්න. වැතිර සිටිනේ කිම? ඔබේ පුතා වන මම ආවෙමි. නුවණැති පිරිවර ඇති කසී රජ විසින් මම මුදනු ලදිමි.

1543. හැම ද වැඩිහිටියන් සලකන යමෙක් මාගේ පුතා නිදහස් කෙළේ ද කසී රටියන්ගේ රට දියුණු කරන ඒ රජ සැරදේවා.

1. මාතුපොසක ජාතක යි.

1544. සුණොහි මය්හං වචනං ජනින්ද
අත්ථෙන ජුණ්හම්හි ඉධානුපත්තො,
න බ්‍රාහ්මණෙ අද්ධිකෙ තිට්ඨමානෙ
ගන්තබ්බමාහු දිපදන[1] සෙට්ඨ,

1545. සුණොමි තිට්ඨාමි වදෙහි බ්‍රහ්මෙ
යෙනාසි[2] අත්ථෙන ඉධානුපත්තො,
කං වා ත්වමත්ථං මයි පත්ථයානො
ඉධාගමා බ්‍රහ්මෙ තදිඞ්ඝ බ්‍රෑහි.

1546. දදහි මෙ ගාමවරානි පඤ්ච
දාසීසතං සත්තගවං සතානි,
පරොසහස්සඤ්ච සුවණ්ණනික්ඛෙ
හරියා ච මෙ සාදිසී දෙව දදහි.

1547. තපො නු තෙ බ්‍රාහ්මණ හිංසරූපො
මන්තා නු තෙ බ්‍රාහ්මණ චිත්තරූපා,
යක්ඛාව තෙ අස්සවා සන්ති කෙචි
අත්ථං වා මෙ අහිජානාසි කත්තං.

1548. න මෙ තපො අත්ථි න චාපි මන්තා
යක්ඛාපි[3] මෙ අස්සවා නත්ථි කෙචි
අත්ථම්පි තෙ නාහිජානාමි කත්තං
පුබ්බෙ ච ඛො සඞ්ගතිමත්තමාසි.

1549. පඨමං ඉමං දස්සනං ජානතො මෙ
න තාහිජානාමි ඉතො පුරත්ථා,
අක්ඛාහි මෙ පුච්ඡිතො එතමත්ථං
කද කුහිං වා අහු සඞ්ගමො නො.

1550. ගන්ධාරරාජස්ස පුරම්හි රම්මෙ
අවසිම්හසෙ තක්කසිලාය දෙව,
තත්ථන්ධකාරම්හි තිමිස්සිකායං[4]
අංසෙන අංසං සමඝට්ටයිම්හ.

1551. තෙ තත්ථ ඨත්වාන උභො ජනින්ද
සාරාණියං වීතිසාරිම්හ[5] තත්ථ,
සායෙව නො සඞ්ගතිමත්තමාසි
තතො න පච්ඡා න පුරෙ අහොසි.

1. ද්විපදින්ද – මජසං, සයා
2. යෙනාපි – මජසං.
3. යක්ඛාව – සයා.
4. තිමිස්සකායං – සයා
5. වීතිසාරයිම්හ – මජසං

1544. රජතුමනි, මාගේ කීම ඇසුවමනා ය. ප්‍රයොජනයක් සලකා ගෙන ජූජක (නම්) ඔබ වෙත පැමිණියෙමි. දෙපා ඇත්තන් අතර උතුම් වූ රජතුමනි, බමුණන් ද මගියන් ද පැමිණ සිටිය දී (ඔවුන්) නො බලා යායුතු යයි (පඬිවරු) නො කියති.

1545. බමුණ, (ඔබ කීම) අසමි. (මෙහි) සිටිමි, කියව. යම් ප්‍රයොජනයක් සලකා මෙහි ආයෙහි ද ? මා කෙරෙහි වූ කුමක් පතමින් මෙහි ආයෙහි ද ? බමුණ, එය වහා කියව.

1546. ගම්වර පහක් ද දාස්සන් සියයක් ද ගවයන් සත් සියක් ද දහසකට වැඩි ස්වර්ණ නිෂ්ක ද (ජාතිකුලාදීන්) මා හා සමාන බිරියන් දෙදෙනකු ද මට දුන මැනැවි.

1547. බමුණ, ඔබට උසස් වූ තාපස ගුණධර්මයෙක් ඇත් ද නැතහොත් විසිතුරු වූ මන්ත්‍ර තිබේ ද, නැතහොත් සුවච වූ කිසි යක්‍ෂ කෙනෙක් හෝ සිටිත් ද, නැතහොත් ඔබ විසින් මට කළ කිසියම් හිතකර කිසිවක් දන්නෙහි ද?

1548. මට තපසෙක් නැත, මන්ත්‍ර ද නැත, සුවච යක්‍ෂයෝ ද නැත. ඔබට කළ යහපතකු දු නො දනිමි. පෙර ඔබ හා සමාගමය පමණෙක් විය.

1549. දන්නා වූ මට මේ පළමු වර දැක්මයි. මීට පෙර ඔබ නො හඳුනමි. කවද කො තැනෙක අප හමුවීම සිදුවී ද? පුළුවුස්නා ලද මට මෙය කියව.

1550. දෙවයන් වහන්ස, ගන්ධාර රජතුමාගේ රම්‍ය තක්සලා නගරයෙහි විසූමහ. එහි ගනඳුරු (පැවැති) රැයෙක අංසයෙන් අංසය ගැටුනුමු.

1551. මහරජ, අපි එහි දී සිහි කළ මනා කතා කෙළෙමු. අප හමුවීම එ පමණෙකි. ඉන්පසු හමුවීමෙක් නො වීය. ඉන් පෙර ද නො විය.

1552. යද කදචි මනුජෙසු බ්‍රහෙම
සමාගමො සප්පුරිසෙන හොති,
න පණ්ඩිතා සඞ්ගතිසන්ථවානි
පුබ්බෙ කතං වාපි විනාසයන්ති.

1553. බාලා ච ඛො සඞ්ගතිසන්ථවානි
පුබ්බෙ කතං වාපි විනාසයන්ති,
බහුම්පි බාලෙසු කතං විනස්සති
තථා හි බාලා අකතඤ්ඤුරූපා.

1554. ධීරා ච ඛො සඞ්ගතිසන්ථවානි
පුබ්බෙ කතං වාපි න නාසයන්ති,
අප්පම්පි ධීරෙසු කතං න නස්සති
තථා හි ධීරා සුකතඤ්ඤුරූපා.

1555. දදමි තෙ ගාමවරානි පඤ්ච
දසීසතං සත්තගවං සතානි,
පරොසහස්සඤ්ච සුවණ්ණනික්ඛෙ
භරියා ච තෙ සාදිසී දෙව දදමි.

1556. එවං සතං හොති සමෙච්ච රාජ
නක්ඛත්තරාජාරිව තාරකානං,
ආපූරතී කාසිපතී යථා අහං
තයා හි මෙ සඞ්ගමො අජ්ජ ලද්ධොති.

2. ජුණ්හජාතකං.

1557. යසොකරො පුඤ්ඤකරොහමස්මි
සදත්ථුතො සමණබ්‍රාහ්මණානං
මග්ගාරහො දෙවමනුස්සපූජිතො
ධම්මො අහං දෙහි අධම්ම මග්ගං.

1558. අධම්මයානං දළ්හමාරුහිත්වා
අසන්තසන්තො බලවාහමස්මි,
ස කිස්ස හෙතුම්හි තවජ්ජ දජ්ජං
මග්ගං අහං ධම්ම අදින්නපුබ්බං.

1559. ධම්මො හවෙ පාතුරහොසි පුබ්බෙ
පච්ඡා අධම්මො උදපාදි ලොකෙ,
ජෙට්ඨො ච සෙට්ඨො ච සනන්තනො ච
උය්‍යාහි ජෙට්ඨස්ස කනිට්ඨ මග්ගා.

1552. බමුණ, යම් කලෙක සත්පුරුෂයන් හා හමුවීමෙක් වේ ද මොහොතක් පැවැති එකතුව හෝ බොහෝ කලක් පැවැති එක්වීම හෝ පෙර කළ දූය හෝ පඩිවරු විනාශ නො කරත්.

1553. අඥයෝ මොහොතක් කල් හෝ බොහෝ කලක් හෝ පැවැති එකතුව නසත්, කළ ගුණ ද නසත්. බාලයන් කෙරේ කළ හොඳ වැනැසේ. ඒ එසේ මැ යි. අඥනයෝ කළ ගුණ නො දන්නාහු ය.

1554. ප්‍රාඥයෝ හමුවීම හෝ එක්ව වාසය හෝ පෙර කළ උපකාරයන් (දන්නා ගුණය) නො නසත්. නුවණැතියන් කෙරේ කළ හොඳ නො නැසේ. ඒ එසේ මැ යි. නැණැත්තෝ කළ ගුණ දන්නාහු ය.

1555. ඔබට ගම්වර පහක් ද දූස්සන් සියයක් ද ගවයන් සත් සියයක් ද දහසකට වැඩි ස්වර්ණ නිෂ්ක ද සමාන බිරියන් දෙදෙනකු ද දෙමි.

1556. රජතුමනි, සත්පුරුෂයන් හා එකතු වීම නිසා මෙසේ එය වෙයි. කසී රටේ අධිපති රජ, තාරකා මැද සඳසේ (ක්‍රම-යෙන්) පිරෙයි. මම ද අද ඔබතුමා දුන් ගම්වරාදීන් නිසා එසේ වෙමි. දූන් මා විසින් තොප හා සඞගමය ලබන ලදි.

2. ජුණ්හ ජාතක යි.

1557. මම දෙව්මිනිසුන්ට යශස ගෙන දෙන්නෙක්මි. මම පින් කරන්නෙක්මි. මහණ බමුණන් විසින් නිතර පසස්නා ලද්දෙමි. මාර්ගය ලබන්නට සුදුස්සෙක්මි. දෙව්මිනිසුන්ගේ පිදුම් ලද්දෙම් වෙමි. අධර්ම නම් දිව්‍යපුත්‍රය, මම ධර්ම දිව්‍යපුත්‍රයා වෙමි. මට මහ දූන මැනැව්.

1558. (දූහැමි නම් දෙවපුත්‍රය,) මම නො දූහැමි දෙවියා වෙමි. මම ශක්තිමත් අධර්ම යානයට නැඟ ගතිමි. බලවතෙක් වීමි. මිතුර, කිසිවෙකුටත් නුදුන් විරූ මහ කවර හෙයින් අද මම ඔබට දෙම් ද?

1659. ලොවෙහි පළමු වැ ධර්මය පහළ විය. පසු වැ අධර්මය පහළ විය. (එ හෙයින්) ධර්මය ජ්‍යෙෂ්ඨ වෙයි. ශ්‍රේෂ්ඨ වෙයි. පැරණි ද වෙයි. අධර්ම දිව්‍ය පුත්‍රය, ඔබ කනිටු ය. වැඩි මහලු ධර්ම දිව්‍ය පුත්‍ර වූ මාගේ මගෙන් ඉවත් වෙව.

1560. න යාචනාය නපි පාටිරූපා
න අරහති[1] තෙහං දදෙය්‍යා[2] මග්ගං
යුද්ධඤ්ච නො හොතු උභින්නමජ්ජ
යුද්ධස්මිං යො ජෙස්සති තස්ස මග්ගො.

1561. සබ්බා දිසා අනුවිසටොහමස්මි[3]
මහබ්බලො අමිතයසො අතුල්‍යො,[4]
ගුණෙහි සබ්බෙහි උපෙතරූපො
ධම්මො අධම්ම ත්වං කථං විජෙස්සසි.

1562. ලොහෙන වෙ හඤ්ඤති ජාතරූපං
න ජාතරූපෙන හනන්ති ලොහං,
සචෙ අධම්මො හඤ්ඤති ධම්මමජ්ජ
අයො සුවණ්ණං විය දස්සනෙය්‍යං.

1563. සචෙ තුවං යුද්ධබලො අධම්ම
න තුය්හ වද්ධා[5] ච ගරූ ච අත්ථි,
මග්ගං ච තෙ දම්මි පියාප්පියෙන
වාචා දුරුත්තානිපි තෙ ඛමාමි.

1564. ඉදඤ්ච සුත්වා වචනං අධම්මො
අවංසිරො පතිතො උද්ධපාදො,
යුද්ධත්ථිකො චෙ න ලභාමි යුද්ධං
එත්තාවතා හොති හතො අධම්මො.

1565. ඛන්තිබලො යුද්ධබලං විජෙත්වා
හන්ත්වා අධම්මං නිහනිත්ව භුම්මා,
පායාසි විත්තො අභිරුය්හ සන්දනං
මග්ගෙනෙව අතිබලො සච්චනික්කමො.

1566. මාතාපිතා සමණබ්‍රාහ්මණා ච
අසම්මානිතා යස්ස සකෙ අගාරෙ,
ඉධෙව නික්ඛිප්ප සරීරදෙහං
කායස්ස භෙදා නිරයං වජන්ති,[6]
යථා අධම්මො පතිතො අවංසිරො.

1567. මාතාපිතා සමණබ්‍රාහ්මණා ච,
සුසම්මානිතා යස්ස සකෙ අගාරෙ,
ඉධෙව නික්ඛිප්ප සරීරදෙහං
කායස්ස භෙදා සුගතිං වජන්ති
යථාපි ධම්මො අභිරුය්හ සන්දනන්ති.

3. ධම්මජාතකං*.

---

1. අරහත්තා - ස්‍යා
2. දදෙය්‍යං - මජ්ඣං.
3. අනුවිස්සටො - මජ්ඣං ස්‍යා.
4. අතුලෙය්‍යා - මජ්ඣං, ස්‍යා
5. වුඩ්ඪා - මජ්ඣං.
6. විජනති තෙ - මජ්ඣං.

*. ධම්මදෙවපුත්තජාතකං - මජ්ඣං, ස්‍යා.

1560. යැදීම නිසා ඔබට මග දෙන්නෙම් නම් යොග්‍ය නො වේ. සුදුසු වචන කීම නිසා මග දීම යොග්‍ය නැත. අද අප දෙදෙනාගේ සටන වේවා ! සටනින් යමෙක් දිනන්නේ ද ඔහුට මග (හිමි) වේ.

1561. මම සියලු දිසාවන්හි පැතිරැ ගියෙමි, මහ බලැත්තෙමි, අප්‍රමාණ යශස් ඇත්තෙමි. මා හා සමානයෙක් නැත. හැම ගුණයන්ගෙන් සම්පූර්ණ වූ (මම) ධර්ම දිව්‍ය පුත්‍රයා වෙමි. තෙපි කෙසේ දිනන්නෙහි ද?

1562. අයොමය මිටියෙන් රන් ඒකාන්තයෙන් නැසේ. රනින් යකඩ නො නැසේ. අධර්මය අද ඔබේ ධර්මය නසයි. යමුවා මිටිය දූකුම්කලු රන් නසන්නා මෙනි.

1563. අධර්ම දෙවපුත්‍රය, ඔබ සටන බලය කොට ඇත්තාව. ඔබට වැඩිහිටියෝ ද ගරුකටයුත්තෝ ද නැත. ඔබට මග දෙනුයේ ප්‍රිය අප්‍රිය දෙදෙනාගෙන් ප්‍රියයකු ලෙසින් දෙමි. නපුරු ලෙස ඔබ කී වචන ද ඉවසමි.

1564. අධර්ම දිව්‍ය පුත්‍රයා මෙ බස් අසා, යුද්ධය රිසි වුවත් යුද්ධය (කරන්නට) නො ලබම් යි හිස යටිකුරු වැ පා උඩුකුරු වැ වැටුණි. මෙ පමණෙකින් අධර්ම දිව්‍ය පුත්‍රයා නටුයේ ය.

1565. යුද්ධය ජය ගෙන, අධර්ම දිව්‍ය පුත්‍රයා නසා බිමැ හෙළා සත්‍යය පරාක්‍රම කොට ඇති ක්‍ෂාන්ති බලය මැ ඇති දෙව් පුත් තෙම සතුටු සිතැති ව දිව්‍ය රථයට නැඟී මගින් ම ගියේ ය.

1566. යම් කෙනෙක් සිය නිවෙසෙහි මවුපියන්ට ද මහණ බමුණන්ට ද සැලැකිලි නො කෙරෙත් ද, ඔවුහු අධර්ම දිව්‍ය පුත්‍රයා නිරයට පිවිසියා සේ මරණින් මත්තේ නිරා වදිත්.

1567. යම් කෙනෙක් සිය නිවෙසෙහි මවුපියන්ට ද මහණ බමුණන්ට ද මැනැවින් සලකත් ද ඔවුහු, ධර්ම දිව්‍ය පුත්‍රයා දිව්‍ය රථයට නැඟ ගියා සේ, මරණින් මත්තේ දෙව්ලොවැ උපදිත්.

3. ධම්ම ජාතක යි.

1568. එකා නිසින්නා සුවිසඤ්ඤතුරූ
පාසාදමාරුය්හ අනින්දිතඞ්ගි,
යාචාමි තං කින්නරනෙත්තචක්ඛු
ඉමෙකරත්තිං උභයො වසෙම.

1569. උක්කිණ්ණන්තරපරිඛං දළ්හමට්ටාලකොට්ඨකං,
රක්ඛිතං ඛග්ගහත්ථෙහි දුප්පවෙසමිදං පුරං.

1570. දහරස්ස යුධිනො[1] චාපි ආගමො ච න විජ්ජති,
අථ කෙන නු වණ්ණෙන සඞ්ගමං ඉච්ඡසෙ මයා.

1571. යක්ඛොහමස්මි කල්‍යාණි ආගතොස්මි තවන්තිකං[2]
ත්වං මං නන්දය භද්දෙන්තෙ පුණ්ණකංසං දදමි තෙ.

1572. දෙවඤ්ච යක්ඛං අථ වා මනුස්සං
න පත්ථයෙ උදයමතිච්චමඤ්ඤං,
ගච්ඡෙව ත්වං යක්ඛ මහානුභාව
මාචස්සු ගන්ත්වා පුනරාවජිත්ථ.

1573. යා සා රති උත්තමා කාමභොගිනං
රතිසු සත්තා[3] විසමං චරන්ති,
මා තං රතිං ජීයි තුවං සුවිම්හිතෙ
දදමි තෙ රූපියං කංසපූරං.

1574. නාරිං නරො නිජ්ඣපයං ධනෙන
උක්කංසති යත්ථ කරොති ඡන්දං,
විපච්චනීකො තව දෙව ධම්මො
පච්චක්ඛතො ථොකතරෙන එසි,

1575. ආයුඤ්ච වණ්ණඤ්ච මනුස්සලොකෙ
නිහීයති[4] මනුජානං සුගත්තෙ,
තෙනෙව වණ්ණෙන ධනම්පි තුය්හං
නිහීයති ජිණ්ණතරාසි අජ්ජ.

1576. එවං මෙ පෙක්ඛමානස්ස රාජපුත්ති යසස්සිනි,
හායතෙ වත තෙ වණ්ණො අහොරත්තානමච්චයෙ.

1577. ඉමිනා ච ත්වං වයසා රාජපුත්ති සුමෙධසෙ,
බ්‍රහ්මචරියං චරෙය්‍යාසි භීයො වණ්ණවතී සියා.

---

1. සුවිනො-සීමු.
2. තවන්තිකෙ-මජසං සයා.
3. යංහෙතු සත්තා,-සයා,
4. නහියයති,-මජසං.

1568. පවිත්‍ර වස්ත්‍ර ඇඳ ගත්, මනා දෙවටොර ඇති, ඉතා ශොභාසම්පන්න සිරුරැති, කිඳුරු නෙත් වැනි නෙත් ඇති ඔබ පහයට නැඟී සිටියෙහි ය. සැරැසූ මේ යහන මැද මේ රැය ගත කරමුය යි ඔබෙන් ඉල්ලමි.

1569. මේ පුරය තැනින් තැනැ දිය අගල් ආදිය ඇත. ශක්තිමත් අටල්ලෙන් හා දෙරකොටුවලින් යුක්ත ය. අසිපත් ගත්තන් විසින් රැකවරණ කරනු ලබන හෙයින් පිවිසිය නො හැකි ය.

1570. ළදරුවෙකුට හෝ සෙබළෙකුට හෝ (මේ නගරයට) පැමිණිය නො හැකි ය: කවර හෙයින් මේ වේලාවෙහි මා හා සඞගමයට කැමැත්තෙහි ද?

1571. සොඳුර, මම දෙව්පුතෙක්මි. දිව්‍යානුභාවයෙන් තී වෙත ආවෙමි, ඔබට සෙත් වේවා! අද මා පිනවන්න. ඔබට රන්මසු පිරුණු රන්තළිය දෙමි.

1572. යක්‍ෂය, උදය රජතුමා හැර අන් දෙවියකු, මිනිසකු හෝ යකකු නො පතමි. ඔබ යව, යළි (මෙහි) නො එව.

1573. රතීන් අතුරෙහි කාමභොගීන්හට යම් උත්තමරතියක් වේ ද යමක් නිසා සත්ත්වයෝ විෂමාචාර කෙරෙත් ද, පියකරු සිනා ඇත්තිය තෙපි ඒ රතිය නො දිනව. තොපට රතින් පිරුවූ රිදීතළිය දෙමි.

1574. පින්වත, ඔබ මෝඩ මිනිසෙකි, කෙලෙස් රතියෙන් සන්තර්පණය වන්නෙක් බොහෝ වස්තුවෙන් ස්ත්‍රිය පොළඹවයි. ආසා කරවයි, ඔබේ ස්වභාවය ඊට වෙනස් ය. මඳ වූ ධනයක් ගෙනවුත් තිබෙන බව ප්‍රත්‍යක්‍ෂ හෙයිනි.

1575. ශොභන සිරුර ඇත්තිය, මිනිස්ලොව මිනිසුන්ගේ ආයුෂ ද, පැහැය ද පිරිහේ, එ හෙයින් තොපට දෙන ධනය ද (ක්‍රමයෙන්) පිරිහේ තෙපි අද බොහෝ දිරුවහු.

1576. යසස් ඇති රජ දියණියනි, දිවා රෑ ගෙවී යන්නා සමග බලා සිටිය දී ම ඔබ ගේ රූපය පිරිහීයයි.

1577. මනා පැහැති රජ දියණියනි, ඔබ මේ වියේ බඹසර කරව. බොහෝ වර්ණවත් වන්නී ය.

1578. දෙවා න ජීරන්ති යථා මනුස්සා
ගත්තෙසු තෙසං වලියො න හොන්ති;
පුච්ඡාමි තං යක්ඛ මහානුභාව
කථන්නු දෙවාන සරීරදෙහො.

1579. දෙවා න ජීරන්ති යථා මනුස්සා
ගත්තෙසු තෙසං වලියො න හොන්ති,
සුවෙ සුවෙ භිය්‍යතරොව තෙසං
දිබ්බො ච වණ්ණො විපුලා ච භොගා.

1580. කිංසූධ භීතා ජනතා අනෙකා
මග්ගො ච නෙකායතනං පවුත්තො,
පුච්ඡාමි තං යක්ඛ මහානුභාව
කත්ථ ඨිතො පරලොකං න භායෙ.

1581. වාචං මනඤ්ච පණිධාය සම්මා
කායෙන පාපානි අකුබ්බමානො
බව්හන්නපානං[1] ඝරමාවසන්තො,
සද්ධො මුදූ සංවිභාගී වදඤ්ඤූ
සඞ්ගාහකො සඛිලො සණ්හවාචො
එත්ථට්ඨිතො පරලොකං න භායෙ.

1582. අනුසාසසි මං යක්ඛ යථා මාතා යථා පිතා,
උළාරවණ්ණ පුච්ඡාමි කොනු ත්වමසි සුබ්‍රහා.

1583. උදයොහමස්මි කල්‍යාණි සඞ්ගරත්ථා ඉධාගතො,
ආමන්ත ඛො තංගච්ඡාමි මුත්තොස්මි තව සඞ්ගරා.

1584. සචෙ ඛො ත්වං උදයොසි සඞ්ගරත්ථා ඉධාගතො,
අනුසාස මං රාජපුත්ත යථාස්සු පුන සඞ්ගමො.

1585. අධිපතති වයො ඛණො තථෙව
ඨානං නත්ථි ධුවං[2] චවන්ති සත්තා,
පරිජීයති අද්ධුවං සරීරං
උදයෙ මා පමාදං චරස්සු ධම්මං.

1586. කසිණා පථවී ධනස්ස පූරා
එකස්සෙව සියා අනඤ්ඤධෙය්‍යා,
තඤ්චාපි ජහාති අවීතරාගො
උදයෙ මා පමාදං[3] චරස්සු ධම්මං.

1587. මාතා ච පිතා ච භාතරො ච[4]
භරියා යාපි ධනෙන හොති කීතා,
තෙචාපි ජහන්ති අඤ්ඤමඤ්ඤං
උදයෙ මා පමාදං චරස්සු ධම්මං.

---

1. බහුන්නපානං - මජසං.
2. අතිපතති - සයා.
3. පමාද, මජසං - සයා.
4. මාතා පිතා ච භාතරො ච භගිනී - සයා.

1578. මිනිසුන් ලෙස දෙවියෝ නො දිරත්, ශරීරයේ රැළි නො වැටේ. මහානුභාව ඇති යක්‍ෂය, ඊට හෙතු ඔබෙන් අසමි. දෙවියන්ගේ දෙහය කවර හෙයින් නො දිරා ද?

1579. මිනිසුන් දිරාපත් වන පරිද්දෙන් දෙවියෝ දිරාපත් නො වෙත්. ඔවුන් සිරුරු රැළි නො වැටේ. දවසක් පාසා දෙවියන්ට බොහෝ දිව්‍ය වර්ණය ද භොගයෝ ද වැඩෙත්.

1580. මෙ ලොවැ ජනයා කුමට බිය වෙත් ද? පඬිවරුන් විසින් නොයෙක් තීර්‍ථායතන විසින් සගමග කියන ලද, මහ තෙදැති දෙව් රජාණෙනි, කවර මගෙකැ සිටි කල පරලොවට බිය නො වන්නේ ද?

1581. වචනය ද සිත ද මැනැවින් සංවරයෙහි පිහිටුවා ගෙන කයින් පාපක්‍රියා නො කොට ආහාර පාන බොහෝ ඇති ව ගෙහි වසනුයේ, සැදැහැවත් වීම, මොළොක් සිතැති වීම, සංවිභාග ගුණය ඇත්තකු වීම, ප්‍රතිග්‍රාහකයන්ගේ බස් තේරුම් ගැනීම, සිව්සඟරාවත් ඇත්තකු වීම, ප්‍රිය බස් ඇත්තකු වීම, මට සිළිටි බසින් කථා කිරීම යන ගුණ ඇත්තේ පරලොවට බිය නො වේ.

1582. මහෙශාක්‍ය දිව්‍යරාජය; මවක මෙන් පියකු මෙන් මට අනුශාසනා කරන්නෙහි ය. පුණ්‍ය මහිමයෙන් ලද රුවක් ඇති ඔබ කවරෙක් ද?

1583. රූපිකාවෙනි, මම උදය රජ වෙමි. (පෙර) පොරොන්දුවෙන් මිදීමට ආවෙමි. ඔබ අමතා එම පොරොන්දුවෙන් මිදුණෙමි.

1584. ඉදින් ඔබ උදය රජ වේ නම්, ප්‍රතිඥාවෙන් මිදීමට මෙහි පැමිණියේ යළි දු එක්වීම සිදුවන පරිද්දෙන් මට අනුශාසනා කරව.

1585. වයස ඉතා ශීඝ්‍රව (ගෙවී) යයි. ක්‍ෂණය ද එසේ ගෙවී යයි. සත්ත්වයෝ ච්‍යුත වෙත්. ඔවුනට සිටීමෙක් නැත. සිරුර නො තිරය : දිරාපත් වේ. උදයභද්‍රාවෙනි, සිහි මුළාවට නො පැමිණෙව දශපුණ්‍යක්‍රියාවන්හි හැසිරෙව.

1586. ධනයෙන් පිරුණු මුළු පොළොව එක් රජක්හට අයත් වුවත්, අන් කෙනකුට අයත් නො වුවත්, පහ නො වූ ආසාව ඇති හේ එය ද හැර දමයි. උදයභද්‍රාවෙනි, සිහි මුළාවට නො යව දශපුණ්‍යක්‍රියාවන්හි හැසිරෙව.

1587. මවු ද පියා ද සහෝදරයෝ ද ධනයෙන් මිලයට ගත් යම් භාර්‍යාවකුත් වේ ද ඔහු ද ඔවුනොවුන් හැරයති. එහෙයින්, සිහි මුළාවට නො යව දශපුණ්‍යක්‍රියාවන්හි හැසිරෙව.

1588. කායො පරභොජනන්ති ඤත්වා[1]
සංසාරෙ සුගතී ච දුග්ගතී ච,
ඉත්තරවාසොති ජානියා
උදය මා පමාදං චරස්සු ධම්මං.

1589. සාධු භාසතයං[2] යක්ඛො අප්පං මච්චාන ජීවිතං,
කසිරඤ්ච පරිත්තඤ්ච තඤ්ච දුක්ඛෙන සංයුතං
සාහං එකා පබ්බජිස්සාමි හිත්වා කාසිං සුරුන්ධන'න්ති.

4. උදයජාතකං.

1590. මිත්තො මිත්තස්ස පානීයං අදින්නං පරිභුඤ්ජිසං[3],
තෙන පච්ඡා විජිගුච්ඡිං තං පාපං පකතං මයා
මා පුන අකරං පාපං තස්මා පබ්බජිතො අහං.

1591. පරදාරඤ්ච දිස්වාන ඡන්දො මෙ උදපජ්ජථ,
තෙන පච්ඡා විජිගුච්ඡිං තං පාපං පකතං මයා.
මා පුන අකරං පාපං තස්මා පබ්බජිතො අහං.

1592. පිතරමෙම මහාරාජ චොරා අගණ්හුං කානනෙ,
තෙසාහං පුච්ඡිතො ජානං අඤ්ඤථා නං වියාකරිං.

1593. තෙන පච්ඡා විජිගුච්ඡිං තං පාපං පකතං මයා,
මා පුන අකරං පාපං තස්මා පබ්බජිතො අහං.

1594. පාණාතිපාතමකරුං සොමයාගෙ උපට්ඨිතෙ,
තෙසාහං සමනුඤ්ඤාසිං, තෙන පච්ඡා විජිගුච්ඡිං
තං පාපං පකතං මයා මා පුන අකරං පාපං
තස්මා පබ්බජිතො අහං,

1595. සුරාමෙරයමධුකා යෙ ජනා පඨමාසු නො
බහුන්නතෙ අනත්ථාය මජ්ජපානමකප්පයුං.
තෙසාහං සමනුඤ්ඤාසිං තෙන පච්ඡා විජිගුච්ඡිං
තං පාපං පකතං මයා මා පුන අකරං පාපං
තස්මා පබ්බජිතො අහං.

1596. ධිරත්ථු සුබහූ කාමෙ දුග්ගන්ධෙ බහුකණ්ටකෙ,
යෙ අහං පතිසෙවන්තො න ලභිං තාදිසං සුඛං,

1597. මහස්සාද සුඛා කාමා නත්ථී කාමපරං සුඛං,
යෙ කාමෙ පතිසෙවන්ති සග්ගං තෙ උපපජ්ජරෙ,

1. විචිත්වා - මජසං-සයා.
2. භාසති - සයා.-මජසං.
3. පරිභුඤ්ජිසිං-මජසං,
4. උපපජ්ජත - සීමු.

1588. උදයභද්‍රාවෙනි, ශරීරය අන් සතුනට ආහාර වන බව දැනැ, සසරේ සුගති දුගතීන්හි කෙටි කලක් විසූමට ඇති බව දැනැ, සිහි මුළාවට නො යව, දශපුණ්‍යක්‍රියාවන්හි හැසිරෙව.

1589. සත්ත්ව ජීවිත අල්ප යයි මම යක්‍ෂයා සොඳුරු දැයක් කියයි. එද ආස්වාද රහිත යැ, ස්වල්ප කලක් පවත්නේ ය. සසරදුක හා යෙදී පවත්නේ ය. ඒ මම කසී රට ත් සුරුන්ධන පුරය ත් හැර හුදෙකලා ව පැවිදි වන්නෙමි.

4. උදය ජාතක යි.

1590. මහරජ, මම එකකු හා මිතුරු වූයෙමි, ඒ මිතුරා නුදුන් පැන් බීවෙමි. ඒ පව මා කරන ලදී. පසුව ඒ පව පිළිකුල් කෙළෙම් නැවැත පව් නො කරන්නෙමි යි (ඉටා) පැවිදි වීමි.

1591. මහරජ, අනෙකකුගේ බිරිඳක් දැක මට කාමාශා උපනි, ඒ පව මා කරන ලදී. පසුව ඒ පව පිළිකුල් කෙළෙමි. නැවැත පව් නො කරන්නෙමි යි (ඉටා) පැවිදි වීමි.

1592. මහරජ, සොරු මාගේ පියා වෙනෙහි දී අල්ලා ගත්හ. මා විචාළ ඔවුන්ට දැනැ දැනැ ම වෙනත් අයුරෙකින් කීවෙමි.

1593. ඒ පව මා කරන ලදී. පසුව ඒ පව පිළිකුල් කෙළෙමි. නැවැත පව් නො කරන්නෙමි යි (ඉටා) පැවිදි වීමි.

1594. සොම යාගය (කරන මොහොත) එළඹ සිටි කලැ ප්‍රාණඝාතය කළහ. ඔවුන්ගේ කර්මය අනුදත්තෙමි. (එකහ වීමි.) එය කරණ කොටගෙන පසුව පිළිකුල් කෙළෙමි. නැවැත පව් නො කරන්නෙමි යි (ඉටා) පැවිදි වීමි.

1595. සුරාවත් මෙරයත් මිහිරි (පානයකැ යි) පානය කරන්නෝ අපේ ගම්හි වූ ඔහු ද, බොහෝ දෙනාට අවැඩ පිණිස හෙතු වන මද්‍ය පානය කළහ. මම ඔවුන්ගේ කර්මය අනුදත්තෙමි. එයින් පසුව පිළිකුල් කෙළෙම් නැවැත පව් නො කරන්නෙම් යි (ඉටා) පැවිදි වීමි.

1596. මම කාම සම්පත් විඳින්නෙමි, නිකෙලෙස් ධ්‍යාන සුවය වැනි සැපතක් නො ලදිමි. දුගඳ වූ සතුරන් නමැති කටු ඇති බහුල වූ කාමයන්ට නින්ද වේවා !

1597. කාමයෝ මහත් වූ ආස්වාදය ත් සැපත ත් ඇත්තාහු වෙති. කාමය හැර අන් සැපතක් නැත. යම් කෙනෙක් කම් සැපත විඳිත් ද ඔවුහු දෙව්ලොව උපදිත්.

1598. අප්පස්සාද දුඛා කාමා නත්ථි කාමාපරං[1] දුඛං,
යෙ කාමෙ පතිසෙවන්ති නිරයං තෙ උපපජ්ජරෙ.

1599. අසී යථා සුනිසිතො නෙත්තිංසොව[2] සුපායිකො,[3]
සත්තීව උරසී ඛිත්තො[4] කාමා දුක්ඛතරා තතො.

1600. අඞ්ගාරානංව ජලිතං කාසුං සාධිකපොරිසං,
ඵාලංව දිවසං තත්තං කාමා දුක්ඛතරා තතො.

1601. විසං යථා හලාහලං තෙලමුක්කට්ඨිතං[5] යථා,
තම්බලොහ විලීනංව කාමා දුක්ඛතරා තතො’ති,

5. පානීයජාතකං.

1602. මිත්තාමච්චපරිබ්බූළ්හං අහං වන්දෙ රථෙසභං,[6]
පබ්බජිස්සං[7] මහාරාජ තං දෙවො අනුමඤ්ඤතු.

1603. සචෙ තෙ ඌනං කාමෙහි අහං පරිපූරයාමි තෙ,
යො තං හිංසති වාරෙමි මා පබ්බජි[8] යුධඤ්ජය.

1604. න චත්ථි ඌනං කාමෙහි හිංසිතා මෙ න විජ්ජති,
දීපඤ්ච කාතු[9]මිච්ඡාමි යං ජරා නාභිකීරති.

1605. පුත්තො වා පිතරං යාචෙ පිතා වා පුත්තමොරසං,
නෙගමො යාචතෙ තාත මා පබ්බජි යුධඤ්ජය.

1606. මා මං තාත[10] නිවාරෙසි පබ්බජන්තං රථෙසභ,
මාහං කාමෙහි සම්මත්තො ජරාය වසමන්වගූ.[11]

1607. අහං තං තාත යාචාමි අහං පුත්ත නිවාරයෙ,
චිරන්තං දට්ඨුමිච්ඡාමි මා පබ්බජි යුධඤ්ජය.

1608. උස්සාවොව තිණග්ගම්හි සූරියස්සුග්ගමනං පති,
එවමායු මනුස්සානං මා මං අම්ම නිවාරයෙ.

---

1. කාමපරං – සීමු.
2. නෙත්තියො – මජසං, සයා.
3. සුපායිනො. – මජසං, සයා.
4. ඛිත්තා – මජසං, සයා.
5. පක්කුට්ඨිත – මජසං, සයා
6. රථෙසභ – මජසං, සයා.
7. පබ්බජිස්සාමහරාජ, – මජසං, සයා.
8. පබ්බජී – මජසං, සයා.
9. කත්තු–සයා.
10. පබ්බජ – සීමු.
11. දෙවි – මජසං.

1598. කාමයෝ අල්ප ආස්වාද ඇත්තාහු දුක් බහුල වූවාහු වෙත්, කාමයට වඩා දුකෙක් නැත. යම් කෙනෙක් කම් සැපත විඳිත් ද ඔවුහු නිරයේ උපදිත්.

1599. මුවහත් කළ කඩුව ද, පණපෙවූ සිරියද තෙබ ද ලෙහි පහළේ යම්සේ දුක් උපදවා ද, කාමයන් නිසා ලැබෙන දුක එයට වඩා බොහෝ වේ.

1600. පුරුෂ ප්‍රමාණයටත් වැඩි අඟුරු වළත් දවස මුළුල්ලේ ගිනියම් කළ හීවැලත් නිසා යම් දුකක් උපදී ද, කාමයෝ එයට වඩා බොහෝ දුක් සහිත වෙති.

1601. හලාහල විෂ ද කකියවා ගත් තෙල ද උණු කොට ගත් තඹ ද නිසා යම් පමණ දුක් උපදවා ද කාමයෝ එයට වඩා බොහෝ දුක් සහිත වෙති.

5. පානීය ජාතක යි.

1602. මම, මිතුරන් හා ඇමතියන් පිරිවරා ගත් පිය මහ රජාණන් වඳිමි. මම පැවිදි වන්නෙමි. දෙවයන් වහන්සේ, එය අනුදනීත්වා.

1603. යුධංජය කුමාරය, ඔබට කාම සම්පත අඩුව ගියේ ද? එය ඔබට සපුරා දෙන්නෙමි. යමෙක් ඔබට ගැහැට කෙරේ ද ඔහු වළකාලම්. පැවිදි නො වන්න.

1604. මට කාම සම්පතෙන් අඩු නැත. හිංසා කරන්නෙක් නැත. පරලොව ගමන් සඳහා ආරක්ෂාව සලසා ගන්නට රිස්සෙමි. අමා මහනිවන සොයන්නෙමි.

1605. යුධංජය කුමාරය, පුතා පියා යදී, පියා පුතා යදී, නියම්ගම වැසියෝ ද යදිති. පුත්‍රය, පැවිදි නො වන්න.

1606. පියරජතුමනි, පැවිදිවන මා වළක්වනු නො මනා ය. මම කාමයෙන් මත් වූවෙක් නො වෙම්වා. ජරාවේ වසයට නො යන්නෙක් වෙම්වා.

1607. දරුව, මම ඔබ යදිමි, මම ඔබ වළකමි, ඔබ කලක් දකිනු කැමැත්තෙමි. පුතේ යුධංජය, පැවිදි නො වන්න.

1608. මනුෂ්‍යයන්ගේ ආයුෂ, හිර උදවන සමයේ තණ අග පිනිබිඳු වැනි ය, අම්මෙ, මා වැළක්වීම නො මැනැවි.

1609. තරමානො ඉමං යානං ආරොපෙතු රථෙසභ,
මා මෙ මාතා තරන්තස්ස අන්තරායකරා අහු.

1610. අභිධාවථ භද්දන්තෙ සුඤ්ඤං හෙස්සති රම්මකං,
යුධඤ්ජයො අනුඤ්ඤාතො සබ්බදත්තෙන රාජිනා.

1611. යොහු සෙට්ඨො සහස්සස්ස[1] යුවා කඤ්චනසන්නිභො,
සොයං කුමාරො පබ්බජිතො කාසායවසනො බලී.

1612. උභො කුමාරා පබ්බජිතා යුධඤ්ජයො යුධිට්ඨිලො,
පහාය මාතාපිතරො සඞ්ගං ඡෙත්වාන මච්චුනො'ති

6. යුධඤ්ජය ජාතකං.

1613. එථ ලක්ඛණ සීතා ච උභො ඔතරථොදකං,
එවායං භරතො ආහ රාජා දසරථො මතො.

1614. කෙන රාමප්පභාවෙන[2] සොචිතබ්බං න සොචසි,
පිතරං කාලකතං සුත්වා න තං පසහතෙ දුඛං.

1615. යං න සක්කා පාලෙතුං[3] පොසෙන ලපතා[4] බහු,
ස කිස්ස විඤ්ඤූ මෙධාවී අත්තානමුපතාපයෙ.

1616. දහරා ච හි යෙ වුද්ධා යෙ බාලා යෙ ච පණ්ඩිතා,
අඩ්ඪා චෙව දළිද්ද ච සබ්බෙ මච්චුපරායණා.

1617. ඵලානමිව පක්කානං නිච්චං පපතනා භයං,
එවං ජාතාන මච්චානං නිච්චං මරණතො භයං.

1618. සායමෙකෙ න දිස්සන්ති පාතො දිට්ඨා බහුජ්ජනා,
පාතො එකෙ න දිස්සන්ති සායං දිට්ඨා බහුජ්ජනා

1619. පරිදෙවයමානො චෙ කඤ්චි[5]දත්ථං උදබ්බහෙ,
සම්මූළ්හො හිංසමත්තානං කයිරා චෙතං විචක්ඛණො.

1620. කිසො විවණ්ණො භවති හිංසමත්තානමත්තනා,
න තෙන පෙතා පාලෙන්ති නිරත්ථා පරිදෙවනා.

---

1. සහස්සානං—මජසං.
2. රාම සභාවෙන – මජසං.
3. නිපාලෙතුං – මජසං.
4. පොසෙනාලපතං – සයා.
5. කිඤ්චි – මජසං, සයා

1609. පියරජතුමනි, මේ මව ඉක්මනින් යානාවට නඟීවා! සසර තරණය කරන මට මගේ මව බාධා කරන්නෙක් නො වේවා !

1610. සබ්බදත්ත රජ යුධංජය කුමරාගේ පැවිද්ද අනුදත්තේ ය. (තෙපි) වහා දිවයවූ, ඔබට සෙත් වේවා යි කියවූ, රම්ම නගරය හිස් වන්නේ ය.

1611. පුත්‍රයන් දහසකට ශ්‍රේෂ්ඨ ව සිටි තරුණ වූ රන් පැහැති යම් කුමරෙක් වී ද, බලැති හේ කහවත අඳින්නා වූ පැවිද්දෙකි.

1612 යුධංජය, යුධිට්ඨිල යන කුමාරවරු මවුපියන් හැරදමා මරුවාගේ බැමි කපා පැවිදි වූහ.

6. යුධංජය ජාතක යි.

1613. ලක්ඛණ සීතා (යන) දෙදෙනා එව. (මේ) වතුරට බයිවූ. (ඉක්බිති) මේ භරත කුමරා මෙසේ කීය. දසරථ රජ මළේ ය.

1614. රාම කුමාරයෙනි, කෙබඳු අනුභාවයක් නිසා දුක් විය යුත්තෙහි දී දුක් නො වන්නෙහි ද? පියා මළ බව ඇසූ ඔබ දුකෙන් නො පෙළා ද?

1615. බොහෝ වලප්නා පුරුෂයකුට ද සත්ත්වයන්ගේ පණ රකින්නට නො හැකි ය. අව ලෝදහම් දත් නැණවත් තැනැත්තා තමා කුමට තවාද?

1616. ළදරුවෝ ද, වෘද්ධයෝ ද, මෝඩයෝ ද, පණ්ඩිතයෝ ද ඉසුරෝ ද, දිළින්දෝ ද යන හැම දෙන මියයති.

1617. විලිකුත් පල (බිම) වැටෙයි යන බිය නිතර ඇත්තා සේ, උපන් මනුෂ්‍යයන්ට මරණය නිසා බිය නිතර උපදී.

1618. අලුයම දුටු බොහෝ දෙනකු සවස දකින්නට නැත. සවස දුටු බොහෝ දෙනකු අළුයම දකින්නට නැත.

1619. හඬනු ලබන්නෝ කිසි ප්‍රයොජනයක් උපදවන්නේ නම් නැණවත් පුද්ගලයා මුළාවට පත් වැ තමාට පීඩාව දෙන මේ හැඬීම කරන්නේ ය.

1520. තමා විසින් තමාට හිංසා කිරීම නිසා (සිරුර) කෘශ වේ, දුර්වර්ණ වේ, හැඬීම නිසා මිය ගියාහු නො රැකෙත්. හැඬීමෙන් පලක් නැත.

1621. යථාසරණමාදිත්තං වාරිනා පරිනිබ්බයෙ,
එවම්පි ධීරො සුතවා මෙධාවී පණ්ඩිතො නරො
ඛිප්පමුප්පතිතං සොකං වාතො තූලංව ධංසයෙ.

1622. එකොව මච්චො අච්චෙති එකොව ජායතෙ කුලෙ,
සඤ්ඤොගපරමාත්වෙව සම්භොගා සබ්බපාණිනං.

1623. තස්මා හි ධීරස්ස බහුස්සුතස්ස
සම්පස්සතො ලොකමිමං පරඤ්ච,
අඤ්ඤාය ධම්මං හදයං මනඤ්ච
සොකා මහන්තාපි න තාපයන්ති.

1624. සොහං දස්සඤ්ච භොක්ඛඤ්ච[1] භරිස්සාමි ච ඤාතකෙ,
සෙසං සම්පාලයිස්සාමි කිච්චමෙතං විජානතො.

1625. දස වස්සසහස්සානි සට්ඨිවස්සසතානි ච,
කම්බුගීවො මහාබාහු රාමො රජ්ජමකාරයීති.

7. දසරථජාතකං.

1626. ජානන්තො නො මහාරාජ තව සීලං ජනාධිපො,
ඉමෙ කුමාරෙ පූජෙන්තො න තං කෙනචි මඤ්ඤථ.

1627. තිට්ඨන්තෙ නො මහාරාජෙ[2] ආදු දෙවෙ දිවංගතෙ,
ඤාතී නං සමනුමඤ්ඤිංසු සම්පස්සං අත්ථමත්තනො.

1628. කෙන සංවරවත්තෙන සඤ්ජාතෙ අධිතිට්ඨසි[3],
කෙන තං නාතිවත්තන්ති ඤාතිසඞ්ඝා සමාගතා.

1629. න රාජපුත්ත උසූයාමි සමණානං මහෙසිනං,
සක්කච්චං තෙ නමස්සාමි පාදෙ වන්දාමි තාදිනං.

1630. තෙ මං ධම්මගුණෙ යුත්තං සුස්සූසමනුසූයකං,
සමණා සමනුසාසන්ති.[4] ඉසී ධම්මගුණෙ රතා.

1631. තෙසාහං වචනං සුත්වා සමණානං මහෙසිනං,
න කිඤ්චි අතිමඤ්ඤාමි ධම්මෙ මෙ නිරතො මනො.

1632. හත්ථාරුහා[5] අනීකට්ඨා රථිකා පත්තිකාරිකා,
තෙසං නප්පටිබන්ධාමි නිබද්ධං භත්තවෙතනං[5].

---

1. සොහං යසඤ්ච භොගඤ්ච - මජ්සං, ස්‍යා.
2. මහාරාජ - මජ්සං.
3. අභිතිට්ඨසි - මජ්සං, ස්‍යා.
4. මනුසාසන්ති. - මජ්සං
5. හත්ථාරොහා - මජ්සං, ස්‍යා.
6. කිවිට්ඨං භත්ත වෙතනං - මජ්සං, ස්‍යා.

1621. ගිනි ගත් ගෙය දියෙන් නිවන්නේ යම්සේ ද, එසේ ධෛර්‍ය්‍ය සම්පන්න, බහුශ්‍රැත නුවණැති පණ්ඩිත මනුෂ්‍යයා, සුළඟ පුළුන් පහ කරන්නා සේ හටගත් ශොකය වහා පහ කරන්නේ ය.

1622. සත්ත්‍වයා හුදෙකලා ව පරලොව යයි. හුදෙකලා ව උපදියි. මව්පිය මිතුරු ආදි වශයෙන් ඇති වන සත්ත්‍වයන්ගේ එක්වීම් කර්‍මය අනුව සිදුවන්නේ ය.

1623. එහෙයින්, ධෛර්‍ය්‍ය සම්පන්න වූ බහුශ්‍රැත වූ මෙලොවත් පරලොවත් ධර්‍මයත් දන සිටියහුගේ හදවත, මහත් ශොකයෝ ද නො තවත්.

1624. ඒ මම සුදුස්සන්ට යසස ද තනතුරු ද දෙමි. නෑයන් පොෂණය කරන්නෙමි. (වස්තු) සම්පත්තිය ද පාලනය කරන්නෙමි. මෙය නුවණැත්තහුගේ කටයුතු වේ.

1625. රන් මිහිඟු බෙරයක් වැනි ගෙළ ඇති මහබාහු ඇති රාම රජ හවුරුදු සොළොස් දහසක් රාජ්‍යය කැරැවී ය.

7. දසරථ ජාතක යි.

1626. මහරජ, පියරජ තෙම කුමාරවරුන් පුදන්නේ ඔබ කුඩා දනව්වකින් හෝ පිදියයුතු යයි නො සිතී ය. එසේ කළේ ඔබට රාජ්‍යය ලැබෙන බව දනැ ගෙන ද?

1627. මහරජ, සිය අභිවෘද්ධිය දක්නා වූ නෑසියෝ ඔබට කැමැති වූහ. එය වූයේ අපේ පියරජාණන් සිටිය දී ද නැත-හොත් දෙව්ලොව ගිය පසු ද?

1628. සංවර රජතුමනි, කෙබඳු සීලයක් නිසා (තමාට) සමාන එකුන්සියයක් සොහොයුරු කුමාරවරුන් මැඩපවත්වා ගෙන සිටිනේ ද? ඥාතිසමූහයා එකතු වී ඔබ අභිභවනය නො කරන්නේ කවර හෙයින් ද?

1629. රාජපුත්‍රය, මම ඊර්ෂ්‍යා නො කරමි. මහර්ෂි ගුණයෙන් හා, අටලෝදහම් නිසා කම්පා නො වන (තාදී) ගුණයෙන් හෙබි ශ්‍රමණයන්ගේ පා වඳිමි. සකස් කොට උන් වහන්සේ වඳිමි.

1630. ගුණදහම් ඇති කීකරුවෙකැ යි දනැගෙන, අනුසාසනා අසන මට සෘෂිගුණයන්හි ඇලුණු ශ්‍රමණයෝ අනුශාසනා කරති.

1631. මම මහර්ෂි ගුණ ඇති ශ්‍රමණයන් වහන්සේගේ අවවාද ඉක්මවා නො යමි. මගේ සිත දහම්හි ඇලුණේ ය.

1632. ඇතරුවන්, හමුදා නියුක්තයන්, රථිකයන්, පාබළ හමුදා නියුක්තයන් සඳහා ප්‍රතිපාදිත බත් වැටුප් නො නවත්වා දෙමි.

1633. මහාමත්තා ච මෙ අත්ථි මන්තිනො පරිචාරකා[1],
බාරාණසිං වොහරන්ති බහුමංස[2] සුරොදකං.

1634. අථොපි වාණිජා ඵීතා නානා රට්ඨෙහි ආගතා,
තෙසු මෙ විහිතා රක්ඛා එවං ජානාහුපොසථ.

1635. ධම්මෙන කිර ඤාතීනං රජ්ජං කාරෙහි සංවර,
මෙධාවී පණ්ඩිතො චාපි[3] අථොපි ඤාතීනං හිතො

1636. තං තං ඤාති පරිබ්බූළ්හං නානාරතනමොචිතං,
අමිත්තා නප්පසහන්ති ඉන්දංව අසුරාධිපොති.

8. සංවරජාතකං.

1637. උම්මුජ්ජන්ති නිමුජ්ජන්ති මනුස්සා ඛුරනාසිකා,
සුප්පාරකං තං පුච්ඡාම සමුද්දො කතමො අයං.

1638. භරුකච්ඡා පයාතානං වාණිජානං ධනෙසිනං,
නාවාය විප්පනට්ඨාය ඛුරමාලීති වුච්චති.

1639. යථා අග්ගිව සූරියො ච[4] සමුද්දො පති[5]දිස්සති[5],
සුප්පාරකං තං පුච්ඡාම සමුද්දො කතමො අයං.

1640. භරුකච්ඡා පයාතානං වාණිජානං ධනෙසිනං,
නාවාය විප්පනට්ඨාය අග්ගිමාලීති වුච්චති.

1641. යථා දධිංව ඛීරංව සමුද්දො පති[5]දිස්සති,
සුප්පාරකං තං පුච්ඡාම සමුද්දො කතමො අයං.

1642. භරුකච්ඡා පයාතානං වාණිජානං ධනෙසිනං,
නාවාය විප්පනට්ඨාය දධිමාලීති වුච්චති.

1643. යථාකුසොව සස්සංව[6] සමුද්දො පතිදිස්සති,
සුප්පාරකං තං පුච්ඡාම සමුද්දො කතමො අයං.

1644. භරුකච්ඡා පයාතානං වාණිජානං ධනෙසිනං,
නාවාය විප්පනට්ඨාය කුසමාලීති වුච්චති.

1. පරිචාරිකා – මජසං, සයා.
2. බහුංමංසං – සයා.
3. වාසි – මජසං, සයා.
4. යථා අග්ගිව සූරියො – මජසං. යථා අග්ගිසූරියො – සයා.
5. පටි – මජසං, සයා.
6. ච – සයා.

1633. මන්ත්‍ර ශාස්ත්‍රයේ පාරප්‍රාප්ත මහඇමැතියන් ද අනෙක් පරිවාර ඇමැතියන් ද මට ඇත. බරණැස් නගරයේ මස් ආදි අවුලු ද සුරා ආදි පානයන් ද බහුල වැ ඇතැ යි කියති.

1634. ආඪ්‍ය වූ රාෂ්ට්‍රයන්හි සිට මෙහි පැමිණි වෙළෙඳහු වෙත් ද ඔවුන්ගේ ආරක්‍ෂාව සලසන ලදී. උපොසථය, (මෙය) මෙසේ දැනැ ගන්න.

1635. සංවර රජතුමනි, නෑසියන්ට ද ධර්මානුකූල ව පාලන කටයුතු කරන්නේ මනා ය. මෙ තැන් සිට ද ඔබ ම රාජ්‍යය කරනු මැනැවි. නුවණැති පණ්ඩිත වූ ඔබ ඥාති වර්ගයාට ද හිතෛෂී ය.

1636. නෑයන් විසින් පිරිවරා ගත්තා වූ, රැස් කොට තැබූ බොහෝ රුවන් ඇත්තා වූ ඔබ මැඩලන්නට සතුරෝ සමත් නො වෙති. ශක්‍රයා මැඩ ලන්නට වේපචිත්ති අසුරයා සමත් නො වූවා මෙනි.

8. සංවර ජාතක යි.

1637. දැලිපිහියක මුවාත වැනි නාසය ඇති මනුෂ්‍යයන් වැනි මත්ස්‍යයෝ මෙ සාගරයේ මතු වෙති, ගිලෙති. මේ කිනම් සයුරෙක් දැ යි සුප්පාරක පඬිතුමන් විචාරම්හ.

1638. හරුකච්ඡ පටුන්ගමින් නික්මැගිය ධනය සොයන වෙළෙඳුන්ගේ නැවු නැසුණු මේ සයුර ඛුරමාලි නමැ යි කියනු ලැබේ.

1639. යම්සේ, ගින්න මෙන් සූර්යයා උෂ්ණවත් වූ සයුර දකින්නට ලැබේ. මේ කවර සයුරෙක් දැ යි සුප්පාරක පඬිතුමන් විචාරම්හ.

1640. හරුකච්ඡ පටුන්ගමින් නික්මැගිය ධනය සොයන වෙළෙඳුන්ගේ නැවු නැසුණු මේ සයුර අග්ගිමාලී යයි කියනු ලැබේ.

1641. මේ සයුර දී මෙන් ද කිරි මෙන් ද පෙනේ. මේ කවර සයුරෙක් දැ යි සුප්පාරක පඬිතුමන් විචාරම්හ.

1642. හරුකච්ඡ පටුන්ගමින් නික්මැගිය ධනය සොයන වෙළෙඳුන්ගේ නැවු නැසුණු මේ සයුර දධිමාලී යයි කියනු ලැබේ.

1643. මේ සයුර කුසතණ මෙන් ද ධාන්‍ය මෙන් ද පෙනේ. මේ සයුර කවරේ දැ යි සුප්පාරක පඬිතුමන් විචාරම්හ.

1644. හරුකච්ඡ පටුන්ගමින් නික්මැගිය ධනය සොයන වෙළෙඳුන්ගේ නැවු නැසුණු මේ සයුර කුසමාලී යයි කියනු ලැබේ.

1645. යථා නළොව වෙළුව සමුද්දො පතිදිස්සති,
සුප්පාරකං තං පුච්ඡාම සමුද්දො කතමො අයං.

1646. භරුකච්ඡා පයාතානං වාණිජානං ධනෙසිනං,
නාවාය විප්පනට්ඨාය නළමාලීති වුච්චති.

1647. මහාභයො[1] භිංසනකො සමුද්දො[2] සුයයතමානුසො[3],
යථා සොබ්භා පපාතොව සමුද්දො පතිදිස්සති.
සුප්පාරකං තං පුච්ඡාම සමුද්දො කතමො අයං.

1648. භරුකච්ඡා පයාතානං වාණිජානං ධනෙසිනං
නාවාය විප්පනට්ඨාය වළවාමුඛීති වුච්චති.

1649. යතො සරාමි අත්තානං යතො පත්තොස්මි විඤ්ඤුතං.
නාභිජානාමි සඤ්චිච්ච එකපාණම්පි හිංසිතං.
එතෙන සච්චවජ්ජෙන සොත්ථිං නාවා නිවත්තතූති.

9. සුප්පාරකජාතකං.

එකාදසකනිපාතං නිට්ඨිතං.

තස්සුද්දනං:

සිරි මාතුසුපොසක නාගවරො
පුන ජුණ්හ අධම්ම මුදයවරො,
අථ පාණියුධඤ්ජයකො ච දස
රථ සංවර පාරගතෙන නවාති.

1. මහබ්භයො – මජසං.
2. සද්දෙ – මජසං.
3. සුයයති – මජසං.

1645. බටගස් මෙන් ද උණගස් මෙන් ද මේ සයුර පෙනේ. මේ කවර සයුරෙක් දැ යි සුප්පාරක පඬිතුමන් විචාරම්හ.

1646. භරුකච්ඡ පටුන්ගමින් නික්මැගිය ධනය සොයන වෙළෙඳුන්ගේ නැවු නැසුණු මේ සයුර නළමාලි යයි කියනු ලැබේ.

1647. මහත් බිය ඇති බිය උපදවන අමනුෂ්‍යයන්ගේ හඬ ඇසෙයි. හෙබක් මෙන් ද ප්‍රපාතයක් මෙන් ද සයුර පෙනේ. මේ කවර සයුරෙක් දැ යි සුප්පාරක පඬිතුමන් විචාරම්හ.

1648. භරුකච්ඡ පටුන්ගමින් නික්මැගිය ධනය සොයන වෙළෙඳුන්ගේ නැවු නැසුණු මේ සයුර වළවාමුඛී යයි කියනු ලැබේ.

1649. යම් කලෙක සිට තමා සිහි කරම් ද යම් කලෙක සිට නුවණැති බවට පත්වූයෙම් ද එ තැන්හි පටන් දැනැ දැනැ එක් සතකු දු පෙළූ බවක් නො දනිමි. මේ සත්‍ය වචන බලයෙන් නැව සුවසේ ආපසු හැරේවා !

නවවැනි සුප්පාරක ජාතක යි.

එකොළොස් වැනි නිපාතය නිමි.

එහි උද්දානය:

මාතුපොසක ජාතක යැ ජුණ්හජාතක යැ ධම්මජාතක යැ උදය ජාතක යැ පානීයජාතක යැ යුධඤ්ජයජාතක යැ දසරථජාතක යැ සුප්පාරකජාතක යි ජාතක නවයෙකි.

1650. ඛුද්දානං ලහුචිත්තානං අකතඤ්ඤූන දූභිනං[1],
නාදෙවසත්තො පුරිසො ථීනං සද්ධාතුමරහති.

1651. න තා පජානන්ති කතං න කිච්චං
න මාතරං පිතරං භාතරං වා,
අනරියා සමතික්කන්තධම්මා
සස්සෙව චිත්තස්ස වසං වජන්ති.

1652. චිරානුවුත්ථම්පි[2] පියං මනාපං
අනුකම්පං පාණසමම්පි[3] සන්තං,
ආවාසු කිච්චෙසු ච නං ජහන්ති
තස්මාහමිත්ථීනං න විස්සසාමි.

1653. ථීනඤ්හි චිත්තං යථා වානරස්ස
කන්නප්පකන්නං[4] යථා රුක්ඛඡායා,
චලාචලං හදයං ඉත්ථියානං
චක්කස්ස නෙමි විය පරිවත්තති.

1654. යදා තා පස්සන්ති සමෙක්ඛමානා
ආදෙය්‍යරූපං පුරිසස්ස විත්තං,
සණ්හාහි වාචාහි නයන්ති මෙනං
කම්බොජකා ජලජෙනෙව අස්සං.

1655. යදා න පස්සන්ති සමෙක්ඛමානා
ආදෙය්‍යරූපං පුරිසස්ස විත්තං,
සමන්තතො නං පරිවජ්ජයන්ති
තිණ්ණො නදීපාරගතොව කුල්ලං.

1656. සිලෙසූපමා[5] සිඛිරිව සබ්බභක්ඛා
තික්ඛමායා[6] නදීරිව සීඝසොතා[7],
සෙවන්ති හෙතා පියමප්පියඤ්ච
නාගං යථා ඔරකුලං පරඤ්ච.

1657. න තා එකස්ස න ද්වින්නං ආපණොව පසාරිතො[7],
යො තා මය්හන්ති මඤ්ඤෙය්‍ය වාතං ජාලෙන බාධයෙ.

---

1. දූබ්භිනං – මජසං. දූනබ්භිං – ස්‍යා.
2. චිරානුවුට්ඨම්හි – මජසං. චිරානුවුට්ඨම්පි – වි.
3. පාණසමම්පි භත්තුං – වි. මජසං.
4. කණ්ණප්පකණ්ණං – වි.
5. ලෙසූපමා – මජසං.
6. තික්ඛසීනා – වි. මජසං.
7 සිඝ්‍රසොතා – මජසං.
8. ආපණො සො – මජසං, වි.

1650. (බඳනා ලද සොරු කෙරෙහි පවා ඇලෙන ස්වභාවය ඇති හෙයින්) ක්ෂුද්‍ර වූ, වහා පෙරළෙන සිත් ඇත්තා වූ, අකෘතඥ වූ, ද්‍රොහී වූ ස්ත්‍රීන්ගේ (සිල්වත්බව) භූතාවේශයෙන් තොර කවර නම් පුරුෂයෙක් අදහන්නට සුදුස්සේ ද?

1651. ඔවුහු තමහට කළ උපකාරය හෝ තමා විසින් කළ යුතු කාර්‍ය්‍යය හෝ නො දනිත්. මා පිය සොහොවුරන් (සියලු නෑයන්) හෝ නො දනිති. නිර්ලජ්ජ වූ, ඉක්මවූ සච්චරිත්‍ර ධර්ම ඇති, ඔවුහු ස්වකීය චිත්තයාගේ ම වසඟයට යෙත්.

1652. ඔවුහු බොහෝ කලක් එක්ව වාසය කළා වූ, ප්‍රිය වූ, මනාප වූ අනුකම්පක වූ, ප්‍රාණ සම වූ තැනැත්තහු පවා විපත්තීන්හි ද සෙසු කෘත්‍යයන්හි ද හැරදමත්. එහෙයින් මම ස්ත්‍රීන් විශ්වාස නො කරමි.

1653. ස්ත්‍රීන්ගේ සිත වානරයකුගේ (සිත) වැන්න. උස් පහත් තැන්වලට වැටෙන රැක්සෙවණක් වැන්න. ස්ත්‍රීන්ගේ සිත (හෘදය) එක් තැනෙකැ නො පිහිටියේ යැ. රිය සකෙහි නිම්වළල්ල මෙන් පෙරළෙයි.

1654. (පුරුෂයන්) විමසා බලන්නා වූ ඔවුහු යම් විටෙක ගතයුතු ස්වභාවය ඇති පුරුෂයකු දකිත් ද, (එකල්හි) කාම්බොජ දෙශවාසීන් දියෙහි හටගත් සෙවෙලින් අශ්වයන් (පොළඹවනු) මෙන් මිහිරි වදනින් ඔහු වසඟ කෙරෙත්.

1655. (පුරුෂයන්) විමසා බලන්නා වූ ඔවුහු යම් විටෙක ගතයුතු ස්වභාවය නැති පුරුෂයකු දකිත් ද (එකල්හි) නදිය තරණය කොට පරතෙරට ගියහු පසුර (මෙහි–තරණය සඳහා ගත් යම් කිසිවක්) මෙන් හාත්පසින් ඔවුහු හැරදමත්.

1656. (ස්ත්‍රීහු පුරුෂයන්ගේ සිත් බඳනා හෙයින්) ලහටු බඳු උපමා ඇතියහ. සියල්ල භක්ෂණය කරන ගින්නක් වැන්න. වහා ගලන දියපහර ඇති කඳුරැළි මෙන් ශීඝ්‍රමායා ඇතියහ. මෙතෙර හා එතෙර සෙවුනා නැවක් මෙන් ඔවුහු ප්‍රිය වූවහු ද අප්‍රිය වූවහු ද සෙවනය කෙරෙත්.

1657. ඔවුහු විවෘත අවන්හලක් මෙන් එකකුගේ හෝ දෙදෙනකුගේ නො වෙත්, යමෙක් 'ඔවුහු මගේ යැ'යි සිතා ද හේ දැලින් සුළඟ බඳනේ ය.

1658. යථා නදී ච පන්ථො ච පානාගාරං සභා පපා,
එවං ලොකිත්ථියො නාම වෙලා තාසං න විජ්ජති.

1659. ඝතාසනසමාහෙතා කණ්හසප්ප සිරූපමා,
ගාවො බහි තිණස්සෙව ඔමසන්ති වරං වරං.

1660. ඝතාසනං කුඤ්ජරිං කණ්හසප්පං
මුද්ධාභිසිත්තං පමදා ච සබ්බා,
එතෙ නරො නිච්චයතො[1] භජෙථ
තෙසං හවෙ දුබ්බිදූ සබ්බභාවො[2].

1661. නාච්චන්තවණ්ණා න බහූනං[3] කන්තා
න දක්ඛිණා පමදා සෙවිතබ්බා,
න පරස්ස භරියා න ධනස්ස හෙතු
එතිත්ථියො පඤ්ච න සෙවිතබ්බාති.

1. චූළකුණාලජාතකං.

1662. කා ත්වං සුද්ධෙහි වත්ථෙහි අඝෙ වෙහායසං ඨිතා,
කෙන ත්‍යාස්සූනි වත්තන්ති කුතො තං භයමාගතං.

1663. තවෙව දෙව විජිතෙ භද්දසාලොති මං විදූ,
සට්ඨිං වස්සසහස්සානි තිට්ඨතො පූජිතස්ස මෙ.

1664. කාරයන්තා නගරානි අගාරෙ ච දිසම්පති,
විවිධෙ චාපි පාසාදෙ න මනෙත අච්චමඤ්ඤිසුං.
යථෙව මං තෙ පූජෙසුං තථෙව ත්වම්පි පූජය.

1665. තව අහං න පස්සාමි ථූලං කායෙන තෙ දුමං,
ආරොහපරිණාහෙන අභිරූපොසි ජාතියා.

1666. පාසාදං කාරයිස්සාමි එකත්ථම්භං මනොරමං,
තත්ථ තං උපනෙස්සාමි චිරං තෙ යක්ඛ ජීවිතං.

1667. එවං චිත්තං[4] උදපාදි සරීරෙන විනාභාවො,
පුථුසො මං විකන්තෙත්වා ඛණ්ඩසො අවකන්තථ.

1. නිච්චයතො - මජසං, සයා.
2. සබ්බභාවොය - මජසං.
3. නච්චන්තවණ්ණනං බහූනං. - මරමෙ.
4. එවං හෙතං - වි.

1658. නදිය, මාර්ගය, පානාගාරය, සභාව හා පැන්හල යම් සේ ද, ලොකයෙහි ස්ත්‍රීහු නම් එබඳු වෙති. ඔවුනට වෙලාවක් හෝ සීමාවක් විද්‍යමාන නො වේ.

1659. මොවුහු ගින්න හා සමානයහ. කෘෂ්ණ සර්පයකුගේ හිස බඳු උපමා ඇතියහ. බැහැර ඇති තෘණ සොයන ගවයන් මෙන් වඩ වඩා උසස් පුරුෂයන් (සධන පුරුෂයන්) සොයන්නාහ.

1660. ගින්න ද ඇතා ද කෘෂ්ණ සර්පයා ද අභිෂෙක කළ රජ ද සියලු ස්ත්‍රීහු ද යන මොවුන් එළඹ සිටී සිහි ඇති මනුෂ්‍ය තෙම සෙවනය කරන්නේ ය. ඔවුන් මැනැවින් නො දන්නේ සියලු අනර්ථයනට කරුණු වූයේ වන්නේ ය.

1661. අභිරූපවත් ස්ත්‍රිය, බොහෝ දෙනාට ප්‍රිය මනාප ස්ත්‍රිය, නෘත්‍යගීතයෙහි දක්ෂ තැනැත්තිය, අනුන්ගේ භාර්‍ය්‍යාව, ධනය නිසා සෙවුනීය යන මේ ස්ත්‍රීහු පස්දෙන නො සෙවිය යුත්තාහ.

1. චූලකුණාල ජාතක යි.

1662. පවිත්‍ර වස්ත්‍රවලින් සැරසී අහසේ සිටින තෙපි කවරහු ද? කුමක් හෙයින් කඳුළු වගුරුවහු ද? කුමක් හෙයින් බියපත් වූවහු ද?

1663. දෙවයන් වහන්ස, ඔබතුමාගේ රාජ්‍යයේ වාසය කරන, පිදුම් ලද මට අවුරුදු හැටදහසක් ගෙවී ගියේ ය. මා හද්දසාලය යි දත්හ.

1664. මහරජ, පැරැණි රජවරු නගර ද නිවාස ද පහයන් ද කරවන්නෝ මා නො වෙහෙසූහ. යම්සේ ඔහු මා පිදූ ද එසේ තෙපි ද මා පුදව.

1665. පහයට ගැළැපෙන කඳ මහත් වූ අන් රුකක් මම නො දකිමි. වැඩුණු තැන් සිට මනා පෙනුමැති රුක ආරොහ පරිණාහ සම්පන්න වෙයි.

1666. සිත් ගන්නා පෙනුමැති එකස්තම්භ මාලිගාවක් කරවන්නෙමි. තොප එහි පමුණුවන්නෙමි, තෙපි (එහි) බොහෝ කල් ජීවත් වන්නහු ය.

1667. (මාගේ) ශරීරය වෙන් කරන්නා වූ මෙබඳු සිතක් (තොපට) පහළ විය. (මේ නිසා) මා කඩ කඩ කොට කපන්නාහු ය.

1668. අග්ගෙ ච ඡෙත්වා මජ්ඣෙ ච පච්ඡා[1] මූලම්හි ඡින්දථ.
එවං මෙ ඡිජ්ජමානස්ස න දුක්ඛං මරණං සියා.

1669. හත්ථපාදං[2] යථා ඡින්නෙ කණ්ණනාසඤ්ච ජීවිතෙ[3]
තතො පච්ඡා සිරො ඡින්නෙ තං දුක්ඛං මරණං සියා.

1670. සුඛන්නු ඛණ්ඩසො ඡින්නං[4] භද්දසාල වනස්පති[5]
කිං හෙතු කිං[6] උපාදය ඛණ්ඩසො ඡින්නමිච්ඡසි.

1671. යඤ්ච හෙතුං උපාදය හෙතු[7] ධම්මූපසංහිතං
ඛණ්ඩසො ඡින්නමිච්ඡාමි මහාරාජ සුණොහි මෙ.

1672. ඤාතී[8] මෙ සුඛසංවද්ධා මම පස්සෙ නිවාතජා
තෙ'පිහං උපහිංසෙය්‍යං පරෙසං අසුඛොචිතං[9],

1673. චෙතබ්බරූපං[10] චෙතෙසි[11] භද්දසාල වනස්පති,
හිතකාමොසි ඤාතීනං අභයං සම්ම දදමි තෙ'ති.

2. භද්දසාල ජාතකං.

1674. කස්සන්ති වපන්ති[12] තෙ ජනා
මනුජා කම්මඵලූපජීවිනො,
නයිමස්ස දීපකස්ස භාගිනො
ජම්බුදීපා ඉදමෙව නො වරං.

1675. තිපඤ්චරත්තූපගමම්හි චන්දෙ
වෙගො මහා හෙහිති සාගරස්ස;[13]
උපප්ලාවයං දීපමිමං උළාරං
මා වො වධි ගච්ඡථ ලෙණමඤ්ඤං.

1676. න ජායං[14] සාගරවාරිවෙගො
උප්පාටයෙ[15] දීපමිමං උළාරං;
තං මෙ නිමිත්තෙහි බහූහි දිට්ඨං
මා භෙථ කිං සොචථ මොදථව්හො[16].

---

1. පච්ඡා මූලං වි. විච්ඡින්දථ. මූලම්හි ඡින්දථ - මඡසං, සයා.
2. හත්ථපාදෙ - මඡසං.
3. ජීවතො. - මඡසං. ජීවිතො - වි.
4. ඡින්න - සයා.
5. වනප්පති - මඡසං, සයා.
6. තං - වි.
7. හෙතූ - වි. මඡසං, සයා.
8. ඤාති - වි. මඡසං, සයා.
9. අස්ස. දුඛොචිතං - වි.
10. චෙතෙය්‍ය රූපං - මඡසං.
11. චෙතයි - නා.
12. වප්පන - මඡසං.
13. රස්ස - වි.
14. න ජාතුයං - මඡසං, සයා.
15. උපලං වස්සං - මඡසං, සයා.
16. මොදථ වො - මඡසං.

1668. (රුකෙහි) අග ද මැද ද සිඳ පසුව මුල සිඳිවු, මෙලෙස සිඳිනු ලබන (කලැ) මට මරණය දුක් නො වේ.

1669. පණ ඇත්තහුගේ අත්පා කන්නාසා යම්සේ සිඳින්නේ ද ඉනික්බිති හිස සිඳින්නේ ද (එයින්) මරණය දුක් වන්නේ ය.

1670. වනස්පති වූ භද්‍රසාල රුක කඩ කඩ වසයෙන් කැපීම සැපයෙක් ද? කඩ කඩ වශයෙන් කැපීම කැමැති වන්නේ කවර කරුණක් නිසා ද?

1671. මහරජ හෙතුව කරුණු සහිත වේ. කඩ කඩ වශයෙන් කැපීම රිසි වෙමි. මා කියන හෙතුව අසනු මැනැවි.

1672. මාගේ රුක විරණය ලැබැ ගස ඇසුරේ සුවසේ වැඩුණු මගේ ඤාතිහු වෙත්. මම අනාථ වූ ඒ ඤාතීන්ගේ කඳුළු වගුරුවන ලද්දෙම් වෙමි.

1673. වනස්පතියකු වූ භද්‍රසාලය, සිතුවමනා දෙයක් සිතුවෙහි ය. නෑයන්ට යහපත කැමැත්තෙහි ය. මිතුර තොපට අභය දෙමි.

2. භද්දසාල ජාතක යි.

1674. දඹදිවැ වෙසෙන ඒ ජනයා සී සාති, වපුරති. කර්මානු-රූප ව ජීවත් වන මනුෂ්‍යයෝ මේ දූපතේ සැපනට කොටස්කරුවෝ නො වෙති. දඹදිවට වඩා අපට මේ දූපත උතුම් වන්නේ ය.

1675. (අද සිට) හඳ පසළොස් රැයක් ඉක්මැ ගිය කලැ සයුරේ (රළ) වෙගය වැඩි වෙයි. මේ මහ දූපත යට කරමින් තොප නො නසාවා! රැකවරණැති අන් තැනකට යවු.

1676. මේ සයුරේ ජල වෙගය, මේ මහ දූපත යට නො කරයි. බොහෝ නිමිතිවලින් මා එය දැකැ තිබේ. බය නො වවු. දුක් වනුයේ කුමට ද? සතුටු වවු.

1677. පහූතභක්ඛං[1] බහුඅන්නපානං
පත්තත්ථ[2] ආවාසමිමං උළාරං;
න වො භයං පටිපස්සාමි කිඤ්චි
ආපුත්ත පුත්තෙහි පමොදථව්හො[3].

1678. යො ඛ්වායං දක්ඛිණස්සං දිසායං
ඛෙමන්ති පක්කොසති තස්ස සච්චං;
න උත්තරො වෙදි භයාභයස්ස
මා හෙථ කිං සොචථ මොදථව්හො.

1679. යථා ඉමෙ විප්පවදන්ති යක්ඛා
එකො භයං සංසති ඛෙමමෙකො
තදිඞ්ඝ මය්හං වචනං සුණාථ;
ඛිප්පං ලහුං මා විනස්සිම්හ[4] සබ්බෙ

1680. සබ්බෙ සමාගම්ම කරොම නාවං
දොණිං දළ්හං සබ්බයන්තූපපන්නං;
සචෙ අයං දක්ඛිණො සච්චමාහ
මොඝං පටික්කොසති උත්තරො අයං.

1681. සචෙ වනො හොහිති[5] ආපදත්ථා
ඉමඤ්ච දීපං න පරිච්චජෙම;
සචෙ ච ඛො උත්තරො සච්චමාහ
මොඝං පටික්කොසති දක්ඛිණො අයං[6].
තමෙව නාවං අභිරුය්හ සබ්බෙ
එවං මයං සොත්ථි තාරෙමු පාරං,

1682. න වෙ සුගණ්හං පඨමෙන සෙට්ඨං
කනිට්ඨං මාපාථගතං ගහෙත්වා
යො චීධ මජ්ඣං[7] පවිචෙය්‍ය ගණ්හති;
සවෙ නරො සෙට්ඨමුපෙති ඨානං

1683. යථාපි තෙ සාගරවාරිමජ්ඣෙ
සකම්මුනා[8] සොත්ථිං වහිංසු වාණිජා;
අනාගතත්ථං පටිවිජ්ඣියාන
අප්පම්පි නාච්චෙති ස භූරිපඤ්ඤො.[9]

---

1. බහුත්ත - මජසං.
2. පත්තථ, පත්තත්ථ - මජසං.
3. පමොදථ වො - මජසං.
4. විනසිම්හ - වි මජසං, සයා.
5. හෙහිති - මජසං, සයා.
6. දක්ඛිණු - මජසං.
7. තච්ඡං - මජසං.
8. සකම්මනා - සීමු.
9. සො - මජසං.

1677. කෑ යුතු බොහෝ දේ තිබෙන ආහාරපාන බහුල මේ මහනිවෙසැ සම්පත් ඇත. ඔබට සිදු වන කිසිදු බියෙක් නො පෙනේ. පුතුන්ගේ පුතුන් දක්වා ප්‍රමුදිත වවු.

1678. දකුණු දෙසැ සිට යම් දෙවියෙක් ආරක්‍ෂා සහිතය යි කියා ද ඔහුගේ කීම සත්‍ය වේ. උතුරු දෙසෙහි සිටැ බිය උපදී යයි කී බස සත්‍ය නො වේ. බිය නො වවු, දුක් වනුයේ කුමට ද? ප්‍රමුදිත වවු.

1679. මේ යක්‍ෂයෝ ඔවුනොවුනට විරුද්ධ ව බෙණෙති. එකෙක් බිය සහිත යයි කියයි. එකෙක් බිය රහිත යයි කියයි. එ හෙයින් මගේ කීම අසවු. හැමදෙන වහා නො නැසෙම්හ.

1680. හැම දෙන එකතු වැ යන්ත්‍රොපකරණ සියල්ල සම්පූර්ණ ශක්ති සම්පන්න නැවක් සාදමු. ඉදින් දකුණු දිග දෙව පුත්‍රයා සත්‍යයක් කීයේ නම් මේ උතුරු දිග දෙව පුත්‍රයා කීයේ හිස් බසෙකි.

1681. අපට ඒ ප්‍රකාශය අවැඩ පිණිස වන්නී ය. මේ දූපත ද අත් නො හරිමු. ඉදින් උතුරුදිග් දෙවියා සත්‍යයක් කීයේ නම්, දකුණුදිග් දෙවියා කීයේ හිස් බසෙකි. හැම දෙන ඒ නැවට නැඟ අපි සුවසේ එතෙරට තරණය කරමු. (එතෙරට යමු.)

1682. ප්‍රථමයා කී දේ ශ්‍රෙෂ්ඨ යයි දැඩි ලෙස ගැනීමත්, පශ්චිමයා කී දේ ශ්‍රෙෂ්ඨ යයි දැඩි ලෙස ගැනීමත් මනා නො වේ. යමෙක් විමසා සත්‍ය වූවක් නුවණින් ගනී ද, ඒ මනුෂ්‍යයා එකාන්තයෙන් උසස් තැනට පැමිණෙයි.

1683. මුහුද මැද ඒ වෙළෙන්දෝ තම කර්මාන්තය නිසා අභයස්ථානයට සුවසේ පැමිණියෝ ද, එසේ නුවණැත්තේ අනාගත අභිවෘද්ධිය වටහා ගෙන එය ඉක්මවා නො යයි. (ඒ අනුව ක්‍රියා කරයි.)

1684. බාලා ච මොහෙන රසානුගිද්ධා
අනාගතං අප්පටිවිජ්ඣියත්ථං;
පච්චුප්පන්නෙ සීදන්ති අත්ථජාතෙ[1]
සමුද්දමජ්ඣෙ යථා තෙ මනුස්සා.

1685. අනාගතං පටිකයිරාථ කිච්චං
මාමං කිච්චං කිච්චකාලෙ ව්‍යධෙසි,
තං තාදිසං පටිගත[2] කිච්චකාරිං
න තං කිච්චං කිච්චකාලෙ ව්‍යධෙති.

3. සමුද්දවාණිජ ජාතකං.

1686. කාමං කාමයමානස්ස තස්ස චෙ තං සමිජ්ඣති,
අද්ධා පීතිමනො හොති ලද්ධා මච්චො යදිච්ඡති.

1687. කාමං කාමයමානස්ස තස්ස චෙ තං සමිජ්ඣති
තතො නං අපරං කාමෙ ඝම්මෙ තණ්හංව වින්දති.

1688. ගවංව සිඞ්ගිනො සිඞ්ගං වඩ්ඪමානස්ස වඩ්ඪති,
එවං මන්දස්ස පොසස්ස බාලස්ස අවිජානතො,
භියෙයා තණ්හා පිපාසා ච වඩ්ඪමානස්ස වඩ්ඪති.

1689. පථව්‍යා සාලියවකං ගවාස්සං[3] දාසපොරිසං,
දත්වාපි[4] නාලමෙකස්ස ඉති විද්වා සමඤ්චරෙ.

1690. රාජා පසය්හ පඨවිං[5] විජෙත්වා[6]
සසාගරන්තං මහිමාවසන්තො;
ඕරං සමුද්දස්ස අතිත්තරූපො
පාරං සමුද්දස්සපි පත්ථයෙථ.

1691. යාව අනුස්සරං[7] කාමෙ මනසා තිත්ති නාජ්ඣිගා,
තතො නිවත්තා[8] පටික්කම්ම[9] දිස්වා,
තෙ වෙ තිත්තා යෙ පඤ්ඤාය තිත්තා.

---

1. අත්ථෙ – වි.
2. පටිකතං – මජ්සං. පටිකත – සභා.
3. ගවස්ස – මජ්සං.
4. දත්වා වා – විං.
5. පඨවිං – මජ්සං.
6. විජිත්වා – මජ්සං.
7. යො ච අනුස්සරං – වි. යො ච මනුස්සරං – මජ්සං.
8. නිවත්වා – වි.
9. පටිකම්මං.

1684. සයුර මැද නැසුණ ඒ මනුෂ්‍යයන් මෙන්, මෝඩයෝ ද රසයෙහි ඇලී ගිජු වැ අනාගත අභිවෘද්ධිය නො තකා ලද් සැපතෙහි මුළාවට පත් වැ තම පිහිට නො ලබන්නෝ වෙත්.

1685. ආයත්‍යභිවෘද්ධිය ගෙන දෙන කාර්‍ය්‍ය පළමුව කටයුත්තේ ය. එ ලෙස කාර්‍ය්‍ය කරන ප්‍රාඥයා, තමාට හිතකර කාර්‍ය්‍යය කරන්නට යොග්‍ය අවසථාව පැමිණි කලැ පළමු වැ කළමනා කාර්‍ය්‍යය පළමුවැ කළ හෙයින් පීඩාවට පත් නො වේ.

3. සමුද්දවාණිජ ජාතක යි.

1686. ඉදින් වස්තුකාමය පතන ඒ පුහුලාට එය සමෘද්ධ වී නම් මනුෂ්‍ය තෙම යමක් කැමති වේ නම් එය ලැබැ එකාන්තයෙන් ප්‍රීති සිත් ඇත්තෙක් වේ.

1687. ඉදින් වස්තුකාමය පතන පුහුලාට එය සමෘද්ධ වී නම්, ඉක්බිති හේ ග්‍රීෂ්මයෙහි තැවුණහු පැන් පවස මෙන් අනෙක් කාමවස්තූන් විඳිනේ යැ.

1688. වැඩෙන අඟ ඇති ගවයාගේ සිරුර හා සමග අඟ වැඩෙන්නා සේ මන්දබුද්ධික වූ කිසිත් නො දත් වැඩෙන මෝඩ පුරුෂයාගේ ආසාව නමැති පිපාසය ද බොහෝ සෙයින් වැඩේ.

1689. පොළොවෙහි සාලියවාදි ධාන්‍ය ද ගවාදි සතුන් ද දසිදසයන් ද එක් කෙනකුට දුන්නත් ඔහු එතෙකිනු දු සෑහීමට පත් නොවන බව දැනැ නැණැත්තේ සමචර්‍ය්‍යායෙහි හැසිරෙන්නේ ය:

1690. රජ තෙම බලාත්කාරයෙන් පොළොව දිනා සාගරය සීමා කොට ඇති පොළොවට අධිපති ව වසනුයේ සයුරෙන් මෙතෙර නො සෑහී සයුරෙන් එතෙර ද පතන්නේ ය.

1691. යමෙක් වස්තුකාමයන් සිහි කරන්නේ සිතින් තෘප්තියට නො යේ ද, (සෑහීමක් නො ලබා ද,) කාමාශාවන්ගෙන් මිදෙන ප්‍රතිකර්මය දැනැ යම් කෙනෙක් නුවණින් විමසා තෘප්තිමත් වූ නම් එකාන්තයෙන් ඔහු මැනැවින් තෘප්ත වූහ.

1692. පසඤ්ඤය තිත්තිනං සෙට්ඨං න සො කාමෙහි තප්පති,
පඤ්ඤාය තිත්තං[1] පුරිසං තණ්හා න කුරුතෙ වසං.

1693. අපචිනෙථෙව කාමානි[2] අප්පිච්ඡස්ස[3] අලොලුපො,
සමුද්දමත්තො පුරිසො න සො කාමෙහි තප්පති.

1694. රථකාරොව චම්මස්ස පරිකන්තං උපාහනං,
යං යං චජති[4] කාමානං තං තං සම්පජ්ජතෙ සුඛං,
සබ්බඤ්ච සුඛමිච්ඡෙය්‍ය සබ්බෙ කාමෙ පරිච්චජෙ.

1695. අට්ඨ තෙ භාසිතා ගාථා සබ්බා හොන්ති සහස්සියො,
පතිගණ්හ මහාබ්‍රහ්ම සාධෙතං තව භාසිතං.

1696. න මෙ අත්ථො සහස්සෙහි සතෙහි නහුතෙහි වා,
පච්ඡිමං භාසතො ගාථං කාමෙ මෙ න රතො මනො.

1697. භද්‍රො[5] වතායං මාණවකො සබ්බලොකවිදූ මුනි,
යො තණ්හං[6] දුක්ඛජනනිං පරිජානාති පණ්ඩිතොති.

4. කාමජාතකං.

1698. දස ඛලු ඉමානි[7] ඨානානි යානි පුබ්බෙ අකාරිත්වා,
ස පච්ඡා මනුතප්පති ඉච්චාහ රාජා ජනසන්ධො.

1699. අලද්ධා විත්තං තප්පති[8] පුබ්බෙ අසමුදානිතං
න පුබ්බෙ ධනමෙසිස්සං ඉති පච්ඡානුතප්පති.

1700. සක්‍යරූපං පුරෙ සන්තං මයා සිප්පං න සික්ඛිතං,
කිච්ඡා වුත්ති අසිප්පස්ස ඉති පච්ඡානුතප්පති.

1701. කූටවෙදී පුරෙ ආසිං පිසුනො පිට්ඨිමංසිකො,
චණ්ඩො ච ඵරුසො චාසිං[9] ඉති පච්ඡානුතප්පති.

1702. පාණාතිපාතී පුරෙ ආසිං ලුද්දො චාසිං[10] අනාරියො,
භූතානං නාවජායිස්සං ඉති පච්ඡානුතප්පති.

1703. බහූසු වත සන්තීසු අනපාදසු ඉත්ථිසු,
පරදාරං අසෙවිස්සං ඉති පච්ඡානුතප්පති.

---

1. සුතිත්තා – මජ්සං.
2. කාමානං – මජ්සං.
3. අපිච්ඡස්ස – මජ්සං.
4. ජහති – මජ්සං, ස්‍යා,
5. භද්දකො – මජ්සං, ස්‍යා.
6. යො ඉමං තණ්හං – වි.
7. දසඛලුමානි – ස්‍යා.
8. අලද්ධාවිත්තං තප්පති – මජ්සං.
9. ච පි – මජ්සං.
10. චාසී – මජ්සං.

1692. තෘප්ති අතුරෙන් ප්‍රඥාව නිසා ලබන තෘප්තිය උසස් වේ. හේ කාමාසා නිසා නො තැවේ. තෘෂ්ණා තොමෝ ප්‍රඥාව නිසා තෘප්ත පුරුෂයා වසඟ නො කරයි.

1693. කාමයන්හි ලොල් නො වූ අල්පෙච්ඡ පුද්ගලයාගේ කාමාසා නැසෙන්නේ ම ය. (මහත් ප්‍රඥාවෙන් යුත් බැවින්) සමුද්‍රය වැනි වූ ඒ පුරුෂයා (වස්තුකාම ක්ලෙශකාම) කාමයන් නිසා නො තැවේ.

1694. හම කපමින් වහන් සකස්කරන සම්කරුවකු සේ කාමයන් අතුරෙන් යමක් යමක් හරනේ ද ඒ ඒ (කොටස) සැප එළව යි. ඉදින් පූර්ණ සැපත රුස්නේ නම් කාමයන් සියල්ල අත් හරින්නේ ය.

1695. ඔබ විසින් ගාථා අටක් කියන ලද, (ඒ ගාථා) සියල්ල දහස බැගින් වටනේ ය. පූජ්‍ය වූ බමුණ, (මේ අටදහස) පිළිගත මැනැව, ඔබගේ තෙල භාෂිතය මැනැවි.

1696. දහසෙකින් හෝ සියයෙකින් හෝ දසදහසෙකින් හෝ මට වැඩෙක් නැත. පැසුළුගය කියන මගේ සිත කාමයෙහි නො ඇලුණේ ය.

1697. මුළුලොව නුවණින් වටහා ගත් මුනි වූ යමෙක් සියලු දුක් උපදවන තෘෂ්ණාව මනාලෙස දනී ද, පණ්ඩිත වූ ඒ මේ මාණවක තෙම ඒකාන්තයෙන් යහපත් වේ.

4. කාම ජාතක යි.

1698. පළමු වැ කටයුතු මේ කරුණු දහය නො කිරීම නිසා හෙතෙම පසුතැවේ යයි ජනසන්ධ රජ තෙමේ මෙසේ කීය.

1699. තරුණ කාලයෙහි ධනය රැස් නො කොට ධන රහිත වැ මහලු වියට පත් වැ, (දුකසේ දිවි පවත්වනුයේ) තරුණ කල්හි ධනය රැස් නො කෙළෙම් යි සිතමින් පසුතැවේ.

1700. බාල වියේ ගුරුන් ඇසුරේ උගන්නට හැකියාව තිබිය දී මා ඉගෙනීම නො කරන ලදී. ශිල්ප රහිතයාට දිවි පැවැත්ම දුක් සහිතය යි සිතමින් පසුතැවේ.

1701. පෙර කූටකම් (තුලාකූට, මානකූටාදිය) දත්තෙකිම් වීමි. කේලාම් කීමි, අල්ලස් ගතිමි, චණ්ඩ පරුෂ වීමි යයි (මරණාසන්නයෙහි) සිතමින් පසුතැවේ.

1702. පෙර පරපණ නැසූයෙමි, පහත් වූ රුදුරුකම් ඇත්තෙක් වීමි, සතුන් කෙරේ කාරුණික පැවැත්ම නැත්තෙකිම් වීමි යි සිතමින් පසුතැවේ.

1703. සරණෙකු නො ගිය බොහෝ ස්ත්‍රීන් සිටිය දී පරදාරාවන් සේවනය කෙළෙම් යි සිතමින් පසුතැවේ.

1704. බහුම්පි වත සන්තම්හි අන්නපානෙ උපට්ඨිතෙ,
න පුබ්බෙ අදදිං දනං ඉති පච්ඡානුතප්පති.

1705. මාතරං පිතරං වාපි ජිණ්ණකෙ ගතයොබ්බනෙ[1],
පහූ සන්තො න පොසිස්සං ඉති පච්ඡානුතප්පති.

1706. ආචරියමනුසත්ථාරං සබ්බකාමරසාහරං,
පිතරං අතිමඤ්ඤිස්සං ඉති පච්ඡානුතප්පති.

1707. සමණෙ බ්‍රාහ්මණෙ චාපි සීලවන්තෙ බහුස්සුතෙ,
න පුබ්බෙ පයිරුපාසිස්සං ඉති පච්ඡානුතප්පති,

1708. සාධු හොති තපො චිණ්ණො සන්තො ච පයිරුපාසිතො,
න ච පුබ්බෙ තපො චිණ්ණො ඉති පච්ඡානුතප්පති.

1709. යො ච එතානි ඨානානි යොනිසො පටිපජ්ජති,
කරං පුරිසකිච්චානි ස පච්ඡා නානුතප්පතී'ති.

5. ජනසන්ධ ජාතකං.

1710. කණ්හා කණ්හා ච සොරො ච සුක්කදයො පතාපවා[2],
බද්ධො පඤ්චහි රජ්ජුහි කිං ඝිර සුනඛො තව.

1711. නායං මිගානං අත්ථාය උසීනර[3] භවිස්සති,
මනුස්සානං අනයො හුත්වා තදා කණ්හා පමොක්ඛති.

1712. පත්තහත්ථා සමණකා මුණ්ඩා සංඝාටිපාරුතා,
නඞ්ගලෙහි කසිස්සන්ති තදා කණ්හා පමොක්ඛති.

1713. තපස්සිනියො පබ්බජිතා මුණ්ඩා සංඝාටි පාරුතා,
යදා ලොකෙ ගමිස්සන්ති තදා කණ්හා පමොක්ඛති.

1714. දීඝුත්තරොට්ඨා[4] ජටිලා පඞ්කදන්තා රජස්සිරා,
ඉණං චොදය ගච්ඡන්ති තදා කණ්හා පමොක්ඛති.

1715. අධිච්ච වෙදෙ[5] සාවිත්තිං යඤ්ඤතන්ත්‍රඤ්ච[6] බ්‍රාහ්මණා,
භතිකාය යජිස්සන්ති තදා කණ්හා පමොක්ඛති.

1. ජින්නකං ගතයොබ්බනං - මජසං.
2. පභාසවා - මජසං, සයා.
3. උසීනර - සයා.
4. දීඝොත්තරොට්ඨා - මජසං.
5. වෙදං - මජසං.
6. යඤ්ඤාතන්තඤ්ච - මජසං, යඤ්ඤං තන්ත්‍රඤ්ච - සයා.

1704. පෙර බොහෝ ආහාරපාන තිබිය දී පවා දන් නො දුන්නෙමි යි සිතමින් පසුතැවේ.

1705. වත්කම තිබිය දී, මහලු වූ දිරාපත් වූ මව හෝ පියා හෝ පොෂණය නො කෙළෙම් යි සිතමින් පසුතැවේ.

1706. ආචාරධර්මයන් පුහුණු කරවන ආචාර්ය වූ, කැමැති සියලු දේ දෙමින් (තමා) පොෂණය කළ පියාණන්ගේ අවවාද නො පිළිගත්තෙමි යි සිතමින් පසුතැවේ.

1707. සිල්වත් උගත් මහණබමුණන් පෙර ආශ්‍රය නො කෙළෙම් යි සිතමින් පසුතැවේ.

1708. පෙර ත්‍රිවිධ සුචරිත සඞ්ඛ්‍යාත තපස පුරුදු කිරීම ද සිල්වතුන් ඇසුරු කිරීම ද කළේ නම් යහපත (එය) නො කෙළෙමියි සිතමින් පසුතැවේ.

1709. යමෙක් මේ කරුණු නුවණින් විමසා පිළිපදී ද (පුරුෂයන් විසින් කළයුතු ධාර්මික කෘත්‍යයන් කරන හෙයින්) අප්‍රමාද ගුණය ඇති හෙතෙම නො පසුතැවේ.

5. ජනසන්ධ ජාතක යි.

1710. ප්‍රාඥය, ඉතා කළු පැහැති බියකරු වූ සුදුදත් ඇති ප්‍රතාපවත් වූ පස් රැහැනකින් බඳනා ලද තොපගේ බල්ලා කුමක් කෙරේ ද?

1711. උසීනර රජතුමනි, මේ බල්ලා මෘගමාංස බුදින්නට ආවේ නො වේ. මනුෂ්‍යමාංස බුදින්නට ආවෙකි. මනුෂ්‍යයන්ගේ විනාශය කරන්නෙක් ව මේ කණ්හ තෙම මගේ අතින් මිදෙන්නේ ය.

1712. පාත්‍රය ගෙන හිස මුඩු කොට සඟළ සිවුර පොරොවා ගත් ශ්‍රමණ ප්‍රතිරූපකයෝ නගුලින් සී සාති. (යම් කලෙක මොවුන් මරා මස් කන ලද්දේ ද) එ කලැ මේ කණ්හ තෙම මගේ අතින් මිදෙන්නේ ය,

1713. පැවිදි වූ භික්ෂුණීහු හිස මුඩු කොට සඟළ සිවුර පොරොවා ගෙන පස්කම් සුව විඳිමින් හැසිරෙත්. (යම් කලෙකැ මොවුන් මරා මස් කන ලද්දේ ද) එකල මෙතෙම මගේ අතින් මිදෙන්නේ ය.

1714. උඩුරැවුල වැඩුනා වූ ජටා සහිත වූ මල සහිත දත් ඇති ධූලි සහිත හිස් ඇති තවුසෝ මුදල් පොලී කොට ජීවත් වෙති, (යම් කලෙක මොවුන් මරා මස් කන ලද්දේ ද) එකලැ මෙ කණ්හ තෙම මගේ අතින් මිදෙන්නේ ය.

1715. බමුණෝ වේදය ද සාවිත්‍රිය ද යාග විධි ද හදරා කුලිය සඳහා යාග කරති. (යම් කලෙක මොවුන් මරා මස් කන ලද්දේ ද) එකලැ මේ කණ්හ තෙම මගේ අතින් මිදෙන්නේ ය.

1716. මාතරං පිතරං වාපි ජිණ්ණකෙ ගතයොබ්බනෙ[1],
පහූ සන්තා න හරන්ති තද කණ්හො පමොක්ඛති.

1717. මාතරං පිතරං වාපි ජිණ්ණකෙ ගතයොබ්බනෙ,
බාලා තුම්හෙති වක්ඛන්ති තද කණ්හො පමොක්ඛති.

1718. ආචරියහරියං සඛාහරියං[2] මාතුලානිං පිතුච්ඡයං[3],
යද ලොකෙ ගමිස්සන්ති තද කණ්හො පමොක්ඛති.

1719. අසිචම්මං ගහෙත්වාන ඛග්ගං පග්ගය්හ බ්‍රාහ්මණා
පන්ථඝාතං[4] කරිස්සන්ති තද කණ්හො පමොක්ඛති.

1720. සුක්කච්ඡවී වෙධවෙරා ථුල්ලබාහූ අපාතුභා,
මිත්තුහෙදං කරිස්සන්ති තද කණ්හො පමොක්ඛති.

1721. මායාවිනො නෙකතිකා අසප්පුරිසචින්තකා,
යද ලොකෙ හවිස්සන්ති තද කණ්හො පමොක්ඛතීති.

6. මහාකණ්හ ජාතකං.

1722. නෙව කිණාමි නපි වික්කිණාමි
න චාපි මෙ සන්නිචයො ච අත්ථි,
සුකිච්ඡරූපං වතිදං පරිත්තං
පත්ථොදනො නාලමයං දුවින්නං

1723. අප්පම්හා අප්පකං දජ්ජං අනුමජ්ඣතො මජ්ඣකං,
බහුම්හා බහුකං දජ්ජා අදානං නුපපජ්ජති.

1724. තං තං වදමි කොසිය දෙහි දනානි හුඤ්ජ ච,
අරියං මග්ගං සමාරුහ නෙකාසී ලහතෙ සුඛං

1. ජිණ්ණකං ගතයොබ්බනං - මජසං.
2. සඛිං - මජසං.
3. පිතුච්ඡිං - මජසං, සහා.
4. පන්ථඝාටං - මජසං.

1716. ජරාවටපත් වූ මහලු වූ මව්පියන් වත්කම තිබිය දී (යම් කෙනෙක්) පොෂණය නො කෙරෙත් ද, (යම් කලෙක මොවුන් මරා මස් කන ලද්දේ ද) එකලැ මෙතෙම මගේ අතින් මිදෙන්නේ ය.

1717. ජරාවට පත් මහලු වූ මව්පියන්ට තෙපි බාලයෝ යැ යි කියත් ද (යම් කලෙක මොවුන් මරා මස් කන ලදුදේ ද) එකලැ මේ කණ්හ තෙම මගේ අතින් මිදෙන්නේ ය.

1718. ඇදුරු බිරිඳ, මිතුරු බිරිඳ, මයිලණුවන්ගේ බිරිඳ, සහ පියාගේ සොහොවුරිය යන මොවුන් සමග ලොකයෙහි ආචාරධර්ම විරොධී ව යම් කෙනෙක් හැසිරෙත් ද (යම් කලෙක මොවුන් මරා මස් කන ලද්දේ ද) එකල මේ කණ්හ තෙම මගේ අතින් මිදෙන්නේ ය.

1719. බමුණෝ කඩුව හා පළිහ ගෙන කඩු ඔසොවාගෙන මං පැහැරීම කෙරෙත් ද, (යම් කලෙක මොවුන් මරා මස් කන ලද්දේ ද) එකලැ කණ්හ තෙම මගේ අතින් මිදෙන්නේ ය.

1720. ආලෙපයන්ගෙන් ඡවිවර්ණය සකස් කර ගත් ධනවත් වැන්දඹුවන් හා හැසිරෙන සඵුල හස්තයන් ඇති ස්ත්‍රී ධූර්තයෝ (ඒ වැන්දඹුවන් හා) මිත්‍ර භෙදයට පැමිණෙත් ද (යම් කලෙක මොවුන් මරා මස් කන ලද්දේ ද) එකලැ මේ කණ්හ තෙම මගේ අතින් මිදෙන්නේ ය.

1721. ලොකයා රවටන වංචාකාරී දුර්ජනයෝ යම් කලෙක ලොවෙහි ඇති වන්නාහු ද, (යම් කලෙක මොවුන් මරා මස් කන ලද්දේ ද) එකලැ මෙ කණ්හ තෙම මගේ අතින් මිදෙන්නේ ය.

6. මහාකණ්හ ජාතක යි

1722. මම නො මැ මිලයට ගනිමි. නො ද විකුණමි. මා විසින් රැස් කළ ධනයෙක් ද නො ද ඇත. මේ අල්ප ආහාරය ද දුකසේ ලබන ලද මැ යැ. මේ පතක් පමණ වූ බත දෙදෙනකුන්ට පමණ නො වෙයි.

1723. අල්පමාත්‍ර දූයින් අල්පමාත්‍රයක් දෙන්නේ යැ. අණුමාත්‍ර අර්ධයෙන් අඩක් දෙන්නේ යැ. බොහෝ දූයින් බොහෝ දූයක් දෙන්නේ යැ. නො දෙනු නො වටනේ යි.

1724. කොසිය සිටාණෙනි, එකරුණෙන් තොපට කියමි; දන් දෙව, වළඳ ද කරව, ආර්‍යමාර්ගයට නැඟෙව, එකලා වැ වළඳනුයේ සුව නො ලබා.

1725. මොඝඤ්චස්ස හුතං හොති මොඝඤ්චාපි සමීහිතං,
අතිථිස්මිං යො නිසින්නස්මිං එකො භුඤ්ජති භොජනං.

1726. තං තං වදාමි කොසිය දෙහි දානානි භුඤ්ජ ච,
අරියං මග්ගං සමාරූහ නෙකාසී ලභතෙ සුඛං.

1727. සච්චං තස්ස[1] හුතං හොති සච්චං චාපි සමීහිතං,
අතිථිස්මිං යො නිසින්නස්මිං නෙකො භුඤ්ජති භොජනං.

1728. තං තං වදාමි කොසිය දෙහි දානානි භුඤ්ජ ච,
අරියං මග්ගං සමාරූහ නෙකාසී[2] ලභතෙ සුඛං

1729. සරඤ්ච ජුහති පොසො බාහුකාය ගයාය ච,
දොණෙ තිම්බරුතිත්ථස්මිං සීඝසොතෙ[3] මහාවහෙ.

1730. අත්‍ර චස්ස හුතං හොති අත්‍ර චස්ස සමීහිතං,
අතිථිස්මිං යො නිසින්නස්මිං නෙකො භුඤ්ජති භොජනං.

1731. තං තං වදාමි කොසිය දෙහි දානානි භුඤ්ජ ච,
අරියං මග්ගං සමාරූහ නෙකාසී ලභතෙ සුඛං.

1732. බළිසං හි සො නිග්ගිලති[4] දීඝසුත්තං සබන්ධනං,
අතිථිස්මිං යො නිසින්නස්මිං එකො භුඤ්ජති භොජනං.

1733. තං තං වදාමි කොසිය දෙහි දානානි භුඤ්ජ ච,
අරියං මග්ගං සමාරූහ නෙකාසී ලභතෙ සුඛං.

1734. උළාරවණ්ණා වත බ්‍රාහ්මණා ඉමෙ,
අයඤ්ච වො සුනඛො කිස්ස හෙතු,
උච්චාවචං වණ්ණනිභං විකුබ්බති
අක්ඛාථ නො බ්‍රාහ්මණා කෙ නු තුම්හෙ.

---

1. සච්චඤ්චස්ස – වි.
2. නෙකොපි – මජසං, ස්‍යා.
3. සීඝසොතෙ – මජසං.
4. නිගිලති – මජසං, ස්‍යා

1725. යමෙක් ආගන්තුකයකු හුන් කල්හි එකලා වැ බොජුන් බුදී නම් ඔහුගේ හෝම සිස් වෙයි. ධනොපායන වීයඞී ද සිස් වෙයි.

1726. කොසිය සිටාණෙනි, එයින් තොපට කියමි. දන් දෙව, වළඳ ද කරව, ආයඞීමාර්ගයට නැඟෙව, එකලා වැ වළඳනුයේ සුව නො ලබා.

1727. යමෙක් ආගන්තුකයකු හුන් කල්හි එකලා වැ බොජුන් නො බුදී නම් ඔහුගේ දනය සත්‍ය වෙයි. ධනොපායන වීයඞී ද සත්‍ය වෙයි.

1728. කොසිය සිටාණෙනි, එයින් තොපට කියමි: දන් දෙව. තෙමේ ද වළඳ කරව. ආයඞීමාර්ගයට නැඟෙව. එකලා වැ වළඳ-නුයේ සුව නො ලබා.

1729. යම් පුරුෂයෙක් (ලවණසමුද්‍ර පුෂ්කරණී ආදි) ජලාශයක් කරා එළැඹැ බලිකම් කෙරේ ද, බාහුකා නදී යැ ගයාපුෂ්කරණී යැ ද්‍රොණ තීර්‍ථ යැ තිම්බරු තීර්‍ථ යැ මහත් වූ ජලප්‍රවාහ ඇති ශීඝ්‍ර-ශ්‍රොතස් යැ යන මෙහි බලිකම් කෙරේ ද.

1730. යමෙක් අමුත්තකු හුන් කල්හි එකලා වැ බොජුන් නො බුදී නම් ඔහු විසින් තෙල තන්හි දූ බලිකර්ම කරනලද වෙයි. තෙල තන්හි දූ ධනොපායන වීයඞී කරනලද වෙයි.

1731. කොසිය සිටාණෙනි, එයින් තොපට කියමි: දන් දෙව, තෙමේත් වළඳ කරව, ආයඞීමාර්ගයට නැඟෙව, එකලා වැ වළඳ-නුයේ සුව නො ලබා.

1732. යමෙක් අමුත්තකු හුන් කල්හි එකලා වැ අහර වළඳ කෙරේ ද, හේ දීඝසූත්‍රයක් ඇති බන්ධන සහිත වූ බිලියක් ගිලියි.

1733. කොසිය සිටාණෙනි, එයින් තොපට කියමි: දන් දෙව, තෙමේ ද වළඳ කරව, ආයඞීමාර්ගයට නැඟෙව, එකලා වැ වළඳ-නුයේ සුව නො ලබා.

1734. මේ බ්‍රාහ්මණයෝ උදරවර්ණ ඇතියාහු මැ යැ. තොපගේ මේ සුනඛ තෙම කවර හෙයින් හීන ප්‍රණීත පැහැසටහන් විකුර්වණ (නිර්මාණ) කෙරේ ද? බ්‍රාහ්මණයෙනි, අපට කියව, තෙපි කවරහු ද?

1735. චන්‍දො ච සූරියො ච උභො ඉධාගතා
අයං පන මාතලි දෙව සාරථී,
සක්කොහමස්මි තිදසානමින්‍දො
එසො ච ඛො පඤ්චසිඛොති වුච්චති.

1736. පාණිස්සරා මුදිඞ්ගා ච මුරජාළම්බරානි ච,
සුත්තමෙනං පබොධෙන්ති පටිබුද්ධො ච නන්‍දති.

1737. යෙ කෙචිමෙ මච්ඡරිනො කදරියා
පරිභාසකා සමණබ්‍රාහ්මණානං,
ඉධෙව නික්ඛිප්ප සරීරදෙහං
කායස්ස භෙද නිරයං වජන්ති.

1738. යෙ කෙචිමෙ සුග්ගතිමාසසානා[1]
ධම්මෙ ඨිතා සංයමෙ සංවිභාගෙ,
ඉධෙව නික්ඛිප්ප සරීරදෙහං
කායස්ස භෙද සුගතිං වජන්ති.

1739. ත්වං නොසි ඤාති පුරිමාසු ජාතිසු
සො මච්ඡරී රොසකො පාපධම්මො,
තවෙව අත්ථාය ඉධාගතම්හා
මා පාපධම්මො නිරයං අපත්ථ.

1740. අද්ධා හි මං වො හිතකාමා යං මං සමනුසාසථ,
සොහං තථා කරිස්සාමි සබ්බං වුත්තං හිතෙසිහි.

1741. එසාහමජ්ජෙව උපාරමාමි
නචාපහං කිඤ්චි කරෙය්‍ය පාපං,
නචාපි මෙ කිඤ්චිමදෙය්‍යමත්ථි
නචාපදත්වා උදකම්පහං පිබෙ[2].

1742. එවඤ්ච මෙ දදතො සබ්බකාලං
භොගා ඉමෙ වාසව ඛීයිස්සන්ති,
තතො අහං පබ්බජිස්සාමි සක්ක
හිත්වාන කාමානි යථොධිකානීති.

7. කොසියජාතකං.

1. මාසමානා – වි. මජසං.
2. නචාපි දත්වා උදකං පිවාමි – මජසං, වි.

1735. සඳ හිරු දෙදෙන මෙහි ආහ. මේ වූකලි දෙවසාරථී වූ මාතලී වෙයි. මම තිදස්වැසි දෙවියනට අධිපති සක්දෙව්රජ වෙමි. තෙල තැනැත්තේ 'පඤ්චසිඛ' යැ යි කියනු ලැබේ.

1736. අත්තල නාදයෝ ද මිහිඟුබෙර හඬ ද මුරජ බෙර හඬ ද පණාබෙර හඬ ද නිදිගත් මොහු පුබුදු කෙරෙති. පිබිදියේ තුටු වේ.

1737. යම්කිසි කෙනෙක් මසුරු වූවාහු තදමසුරු වූවාහු මහණ බමුණන්ට පිරිහෙළා කථා කරන්නාහු වෙත් ද, ඔහු ශරීර සංඛ්‍යාත දෙහය මෙලොව්හි මැ බහාතබා කාබුන් මරණින් මතු නිරයට යති යි.

1738. යම්කිසි කෙනෙක් සුගතිය පතන්නාහු සංයම සංඛ්‍යාත දශශීලධර්‍මයෙහි ද සංවිභාග සංඛ්‍යාත දනධර්‍මයෙහි ද සිටියාහු වෙත් ද, ඔහු ශරීර සංඛ්‍යාත දෙහය මෙලොව්හි මැ බහාතබා කායභෙදයෙන් මතු සුගතියට යති යි.

1739. තෙපි පූර්වජාතියෙහි අපගේ ඥාති වූවාහු යැ. ඒ තෙපි මසුරු වවු. රොස්පරොස් බස් ඇතියහු. පාපධර්‍ම ඇතියහු යැ. තොපට වැඩ සඳහා මැ මෙහි ආම්හ. පාපධර්‍ම ඇතියහු නිරයට නො යව.

1740. යම්හෙයෙකින් තෙපි මට මැනැවින් අනුශාසනා කරවු ද, එහෙයින් එකාන්තයෙන් මැ තෙපි මට හිත කැමැත්තවු යැ. හිත කැමැතියන් විසින් කියනලද සියල්ල ඒ මම එසේ මැ කරන්නෙමි.

1741. තෙල මම අද මැ මසුරු බැවින් වෙන් වෙමි. මම කිසි පවකුදු නො කරමි. (මෙතැන් පටන්) නො දියැයුතු කිසිවක් මට නැත. කිසිවක්හට නො දී මම දියපතකුදු නො බොමි.

1742. සක්දෙව්රජුනි, හැම කල්හි දෙන්නා වූ මාගේ මේ භොගයෝ ක්‍ෂය වන්නාහ. සක්දෙව්රජුනි, එකල්හි මම (වස්තුකාම ක්ලෙශකාම විසින්) ශෙෂ වැ සිටි කාමයන් හැරපියා පැවිදි වන්නෙමි යි.

7. කොසිය ජාතක යි.

1743. යෙසං න කදචි භූතපුබ්බං[1]
සක්ඛිං සත්තපදම්පි ඉමස්මිං ලොකෙ,
ජාතා අමිත්තා[2] දුවෙ සහායා
පටිසන්ධාය චරන්ති කිස්ස හෙතු.

1744. යදි මෙ අජ්ජ පාතරාසකාලෙ
පඤ්හං න සක්කුණෙය්‍යාථ වත්තුමෙතං,
රට්ඨා පබ්බාජයිස්සාමි වො සබ්බෙ
නහි මත්ථො දුප්පඤ්ඤජාතිකෙහි.

1745. මහාජනසමාගමම්හි ඝොරෙ
ජනකොලාහලසඞ්ගමම්හි ජාතෙ,
වික්ඛිත්තමනා අනෙකචිත්තා
පඤ්හං න සක්කුණොම වත්තුමෙතං.

1746. එකග්ගචිත්තා ච එකමෙකා
රහසිගතා අත්ථං නිචින්තයිත්වා,
පවිවෙකෙ සම්මසිත්වාන ධීරා
අථ වක්ඛන්ති ජනින්ද අත්ථමෙතං.

1747. උග්ගපුත්තරාජපුත්තියානං
උරබ්භමංසං පියං මනාපං,
න තෙ සුනඛස්ස අදෙන්ති මංසං
අථ මෙණ්ඩස්ස සුණෙන සඛ්‍යමස්ස.

1748. චම්මං විහනන්ති එළකස්ස
අස්සපිට්ඨත්ථරණසුඛස්ස හෙතු,
නච තෙ සුනඛස්ස අත්ථරන්ති
අථ මෙණ්ඩස්ස සුණෙන සඛ්‍යමස්ස.

1749. ආවෙල්ලිතසිඞ්ගිකො හි මෙණ්ඩො
න ච සුනඛස්ස විසාණානි[3] අත්ථි,
තිණභක්ඛො මංසභොජනො ච
අථ මෙණ්ඩස්ස සුණෙන සඛ්‍යමස්ස.

1750. තිණමාසි පලාසමාසි මෙණ්ඩො
න ච සුනඛො තිණමාසි නො පලාසං,
ගණ්හෙය්‍ය සුණො සසං බිළාරං
අථ මෙණ්ඩස්ස සුණෙන සඛ්‍යමස්ස.

1. සුතපුබ්බං - මජසං, සයා.
2. ජාතාමිත්තා - මජසං.
3. විසානකානි - මජසං, සයා.

1743. මෙලොවැ යම් කෙනකුන්ගේ සත්පියවරක් පමණ මිත්‍රසන්ථවයකුදු කිසිකලෙකත් ඇස්හමු නො වූ විරී ද, එබඳු සතුරෝ දෙදෙනෙක් මිත්‍ර වූවාහු කවර හෙයින් සටිත වැ හැසිරෙත් ද?

1744. ඉදින් අද පෙරබත් වේලෙහි තෙල ප්‍රශ්නය මට කියන්නට නොහැකි වන්නවු නම් තොප හැමදෙනා නෙරනෙමි. නුනුවණ සැහැවි ඇතියන්ගෙන් මට අර්ථයෙක් නැත් මැ යි.

1745. මහාජනසමාජයෙහි මහත් වූ ජනකලහසමාගම හටගත් කල්හි විසුළ සිත් ඇතියමෝ නොයෙක් සිතිවිලි ඇතියමෝ තෙල ප්‍රශ්නය කියන්නට නො හැකියම්හ.

1746. රජතුමනි, මේ ප්‍රාඥයෝ එකහසිත් ඇතියාහු එකිනෙකා රහසිගත වැ කායචිත්තවිවෙකයෙහි සිටියාහු සම්මර්ශන කොට අර්ථ නිශ්චය කොට ඉක්බිති තෙල අර්ථය කියන්නාහ යි.

1747. එළුමස් අමාත්‍යපුත්‍රයනට ද රාජපුත්‍රයනට ද ප්‍රිය මනාප වෙයි. ඔහු ශුනකමාංස භක්ෂණ නො කෙරෙති. එතෙකුදු වත් ශුනකයකු හා සමග එළුවාගේ යහළුබවෙක් වන්නේ යැ යි.

1748. අසුපිට අතුරුණු සුව හෙයින් එළුවාගේ සම වෙන් කොට ගනිත්. ඔහු ශුනකයාගේ සම නො අතුරති. එතෙකුදු වත් ශුනකයකු හා සමග එළුවාගේ යහළුබවෙක් වන්නේ යැ.

1749. එළුවා ඇඹරුණු අං ඇත්තේ යැ. ශුනකයාට අං නැත. එළුවා තණ කන්නේ යැ. ශුනකයා මාංසභක්ෂණ කරන්නේ යැ. එතෙකුදු වත් සුනඛයකු හා සමග එළුවාගේ යහළු බවෙක් වන්නේ යැ යි.

1750. එළුවා තණ කන්නේ යැ. කොළ කන්නේ යැ. ශුනකයා තණ නො කයි. කොළ නො කයි. ශුනකයා සාවා, බළලා අල්වා ගන්නේ යැ. එකෙකුදු වත් ශුනකයකු හා සමග එළුවාගේ යහළු බවෙක් වන්නේ යැ යි.

1751. අඩ්ඪට්ඨපාදෙ චතුප්පදස්ස
මෙණ්ඩො අට්ඨනඛො අදිස්සමානො,
ඡාදියමාහරති අයං ඉමස්ස
මංසං ආහරති අයං අමුස්ස.

1752. පාසාදගතො විදෙහසෙට්ඨො
වීතිහාරං අඤ්ඤමඤ්ඤභොජනානං,
අද්දක්ඛි කිර සක්ඛි තං ජනින්දො
බොභුක්ඛස්ස ච පුණ්ණමුඛස්ස චෙතං.

1753. ලාභා වත මෙ අනප්පරූපා
යස්ස මෙදිසා පණ්ඩිතා කුලම්හි,
පඤ්හස්ස ගම්භිරගතං නිපුණමත්ථං
පටිවිජ්ඣන්ති සුභාසිතෙන ධීරා.

1754. අස්සතරීරථඤ්ච එකමෙකං
ඵීතං ගාමවරඤ්ච එකමෙකං,
සබ්බෙසං වො දම්මි පණ්ඩිතානං
පරමපතීතමනො සුභාසිතෙනා'ති.

8. මෙණ්ඩකපඤ්හා.

1755. නාදිට්ඨා[1] පරතො දෙසං අණුංථූලානි සබ්බසො,
ඉස්සරො පණයෙ දණ්ඩං සාමං අප්පටිවෙක්ඛිය.

1756. යො ච අප්පටිවෙක්ඛිත්වා දණ්ඩං කුබ්බති ඛත්තියො,
සකණ්ටකං සො ගිලති ජච්චන්ධොව සමක්ඛිකං.

1757. අදණ්ඩියං දණ්ඩයති දණ්ඩියඤ්ච අදණ්ඩියං
අන්ධොව විසමං මග්ගං න ජානාති සමාසමං.

1758. යො ච එතානි ඨානානි අණුංථූලානි සබ්බසො,
සුදිට්ඨං චානුසාසෙය්‍ය ස වෙ වොහරිතුමරහති.[2]

1759. නෙකන්තමුදුනා සක්කා එකන්තතික්ඛිණෙන වා,
අත්තං මහන්තෙ ඨපෙතුං[3] තස්මා උභයමාචරෙ.

---

1. නා දට්ඨා – වි.
2. සවෙ වොහාතු – වි.
3. ඨපෙතුං – මජ්සං.

1751. පා සතරක් ඇති නිය අටක් ඇති මෙ එළුවා අප්‍රකට වැ තෙල ශුනකයාට මස් ගෙන එයි. මේ ශුනක තෙම මේ එළුවාට තණ ගෙන එයි.

1752. ප්‍රාසාදතලයට ගිය වෛදෙහ රජ අන්‍යොන්‍ය ආහාර ව්‍යතීහාරය (හුවමාරුව) දුටුයේ වන. නරෙන්ද්‍ර තෙම ශුනකයාගේ ද එළුවාගේ ද තෙල මිත්‍රධර්මය ආත්මප්‍රත්‍යක්‍ෂ කොට දුටුයේ යැ යි.

1753. යම්බඳු මාගේ කුලයෙහි මෙවන් පණ්ඩිතයෝ ඇද්ද? ඒ මට එකාන්තයෙන් අනල්ප ලාභයෙකි. ප්‍රාඥයෝ ගැඹුරු වූ නිපුණාර්‍ථය සුභාෂිතයෙන් දැන කියති.

1754. පණ්ඩිත වූ තොපට එකෙකි අශ්වතරී රථයක් ද එකෙකි සමෘද්ධ වූ ගම්වරයක් ද යන සියල්ල දෙමි. සුභාෂිතයෙන් අතිශයින් සතුටු වූ සිත් ඇතියෙමි'යි.

8. මෙණ්ඩකප්‍රශ්න යි.

1755. අන් කෙනෙකුගේ ලොකු කුඩා වැරැදි සියලු ආකාරයෙන් නො දැක, නො විමසා රජ තෙම දඬුවම් නියම නො කරන්නේ ය.

1756. කිසියම් ක්‍ෂත්‍රියයෙක් (රජෙක්) නුවණින් නො සිතා (කෙනකුට) දඬුවම් නියම කෙරේ ද හේ කටු සහිත ආහාරය ගිලී. මැස්සන් සහිත බොජුන් බුදිනා ජාත්‍යන්‍ධයකු මෙන් වෙයි.

1757. යමෙක් දඬුවම් නොදිය යුත්තාට දඬුවම් කෙරේ ද දඬුවම් දිය යුත්තාට දඬුවම් නො කෙරේ ද හේ විෂම මඟට පැමිණියා වූ අන්‍ධයකු පරිද්දෙන් පාෂාණාදියෙහි පැකිළෙන්නේ සම අසම දෙක නො දනී. (මහත් වූ අපාය දුකට පැමිණෙයි.)

1758. යමෙක් මේ ලොකු කුඩා කරුණු සර්වප්‍රකාරයෙන් මනාකොට දැන (දැකැ) අනුශාසනා කෙරේ ද හේ එකාන්තයෙන් රාජ්‍යානුශාසනයට සුදුසු වෙයි.

1759. එකාන්ත මොළොක් පැවැත්මෙන් ද, එකාන්ත තියුණු (රළු) පැවැත්මෙන් ද තමා ආධිපත්‍යයෙහි තබවන්නට නො හැකි වෙයි. එහෙයින් (මොළොක් වූ ද, රළු වූ ද) දෙයාකාරයෙන් හැසිරෙන්නේ ය.

1760. පරිභූතො මුදු හොති අතිතික්ඛො ච වෙරවා,
එතඤ්ච උභයං ඤත්වා අනුමජ්ඣං සමාචරෙ.

1761. බහුම්පි රත්තො භාසෙය්‍ය දුට්ඨොපි බහුභාසති,
න ඉත්ථිකාරණා රාජ පුත්තං ඝාතෙතුමරහසි.

1762. සබ්බො ච ලොකො එකන්තො[1] ඉත්ථී ච අයමෙකිකා,
තෙනාහං පටිපජ්ජිස්සං ගච්ඡ පක්ඛිපථෙව නං.

1763. අනෙකතාලෙ නරකෙ ගම්භීරෙ ච සුදුත්තරෙ,
පාතිතො ගිරිදුග්ගස්මිං කෙන ත්වං තත්ථ නාමරි.

1764. නාගො නාගබලො[2] තත්ථ ථාමවා ගිරිසානුජො,
පච්චග්ගහී මං භොගෙහි තෙනාහං තත්ථ නාමරිං.

1765. එහි තං පටිනෙස්සාමි රාජපුත්ත සකං ඝරං,
රජ්ජං කාරෙසි භද්දන්තෙ කිං අරඤ්ඤෙ කරිස්සසි.

1766. යථා ගිලිත්වා බළිසං උද්ධරෙය්‍ය සලොහිතං,
උද්ධරිත්වා සුඛී අස්සං[3] එවං පස්සාමි අත්තනං.

1767. කින්නු ත්වං බළිසං බ්‍රූසි කිං ත්වං බ්‍රූසි සලොහිතං,
කින්නු ත්වං උබ්භතං බ්‍රූසි තමෙම අක්ඛාහි පුච්ඡිතො.

1768. කාමාහං බළිසං බ්‍රූමි හත්ථිඅස්සං සලොහිතං,
චත්තාහං උබ්භතං බ්‍රූමි එවං ජානාහි ඛත්තිය.

1769. චිඤ්චාමාණවිකා මාතා දෙවදත්තො ච මෙ පිතා,
ආනන්දො පණ්ඩිතො නාගො සාරිපුත්තො ච දෙවතා.
අහං තදා රාජපුත්තො[4] එවං ධාරෙථ ජාතකන්ති.

9. මහාපදුමජාතකං.

1. එකත්තො – මජසං, ස්‍යා.
2. නාගො ජාතපණ්ණො තත්ථ නා එණො – මජසං.
3. සුඛං පස්සාමි අත්තනි – මජසං.
4. රාජපුත්තො අහං ආසිං – වි, මජසං.

1760. මොළොක් වූවහුට මහජනයා අවමන් කරයි, රළු වූවහුට මහජනයා සතුරු වෙයි. මේ දෙයාකාරය දැනැ මධ්‍යස්ථ ව හැසිරෙන්නේ ය.

1761. රාගයෙන් රත් වූයේ බොහෝ දේ කියන්නේ ය. ද්වෙෂයෙන් දූෂිත වූයේ ද බොහෝ දේ කියන්නේ ය. මහරජ තුමනි, ස්ත්‍රිය නිසා පුත්‍රයා නසන්නට නො වටී.

1762. ලෝ වැස්සා එක් පක්‍ෂයක් විය. මේ ස්ත්‍රී හුදෙකලා වූවා ය. එහෙයින්, මම ස්ත්‍රියගේ කීම පිළිපදින්නෙමි. යවූ, ඔහු ප්‍රපාතයේ දමවූ.

1763. තල්ගස් ගණනක් බහා ලන්නට තරම් ගැඹුරුඹුනි, එතර වන්නට අපහසු නරකයක් වැනි ගිරි දුර්ගයේ දමා ලූ ඔබ වහන්සේ නො මළේ කිම?

1764. ඒ පර්වත ප්‍රපාතයේ උපන් ශක්ති සම්පන්න වූ නාගයෙක් මා දරණ-වැළින් පිළිගත්තේ ය. එහෙයින් එහි දී මම නො මළෙමි.

1765. රාජ පුත්‍රය, එව, තොප සිය නිවසට ගෙන යන්නෙමි. පින්වත, රාජ්‍යය කරන්න. වනයෙහි කරන්නේ කුමක් ද?

1766. ගිල්ලා වූ බිළිය ලේ සහිතව උදුරා දමන්නේ යම් සේ ද, උදුරාලූ පසු සුවපත් වනුයේ යම්සේ ද එපරිද්දෙන් මා ද සුවපත් වූවකු ලෙස දකිමි.

1767. තෙපි කුමකට බිළිය යි කියවූ ද? කුමකට ලේ සහිතය යි කියවූ ද? කුමක් උදුරාලූය යි කීවහු ද? විතාළ මට එය කියව.

1768. මම කාමයන් බිළිය යි කියමි, ඇතුන් අසුන් (ඇති බව) ලේ සහිත යයි කියමි, හළවා වූ දෙය උදුරා ලූ දෙය යයි කියමි, ක්‍ෂත්‍රියය, එය මෙසේ දැන ගනුව.

1769. එ සමයෙහි මව චිංචාමාණවිකා ය. පිය රජ දෙව්දත් තෙර ය. නැණවත් නාගයා ආනන්ද තෙර ය. දිව්‍යපුත්‍රයා සැරියුත් රහතන් වහන්සේ ය. රාජපුත්‍රයා මම වෙමි. මේ ජාතකය මෙසේ දරා ගනිවු. (සිතැ තබා ගනිවු)

9. මහාපදුම ජාතක යි.

1770. කානි කම්මානි කුබ්බානං කථං විඤ්ඤූ පරක්කමෙ
අමිත්තං ජානෙය්‍ය මෙධාවී දිස්වා සුත්වා ච පණ්ඩිතො.

1771. න නං උම්හයතෙ දිස්වා න ච නං පටිනන්දති,
චක්ඛූනි චස්ස[1] න දදති පටිලොමං ච වත්තති.

1772. අමිත්තෙ තස්ස භජති මිත්තෙ තස්ස න සෙවති,
වණ්ණකාමෙ නිවාරෙති අක්කොසන්තෙ පසංසති.

1773. ගුය්හඤ්ච තස්ස නක්ඛාති තස්ස ගුය්හං න ගූහති,
කම්මං තස්ස න වණ්ණෙති පඤ්ඤස්ස නප්පසංසති.

1774. අභවෙ නන්දති තස්ස භවෙ තස්ස න නන්දති,
අච්ඡරියං භොජනං ලද්ධා තස්ස නුප්පජ්ජතෙ සති,
තතො නං නානුකම්පති අහො සොපි ලභෙය්‍යිතො[2].

1775. ඉච්චෙතෙ සොළසාකාරා අමිත්තස්මිං පතිට්ඨිතා,
යෙහි අමිත්තං ජානෙය්‍ය දිස්වා සුත්වා ච පණ්ඩිතො.

1776. කානි කම්මානි කුබ්බානං කථං විඤ්ඤූ පරක්කමෙ,
මිත්තං ජානෙය්‍ය මෙධාවී දිස්වා සුත්වා ච පණ්ඩිතො

1777. පවුත්තං[3] චස්ස සරති ආගතං අභිනන්දති,
තතො කෙලායිතො හොති වාචාය පටිනන්දති.

1778. මිත්තෙ තස්සෙව භජති අමිත්තෙ තස්ස න සෙවති,
අක්කොසන්තෙ නිවාරෙති වණ්ණකාමෙ පසංසති.

1779. ගුය්හඤ්ච තස්ස අක්ඛාති තස්ස ගුය්හඤ්ච ගූහති,
කම්මඤ්ච තස්ස වණ්ණෙති පඤ්ඤං තස්ස[4] පසංසති.

1. චක්ඛූනි තස්ස. වි. තිස්ස. - මජ්සං.
2. ලභෙය්‍යතො - වි.
3. පවුට්ඨං තස්ස - මජ්සං. පවුත්ථං තං - වි.
4. පඤ්ඤමස්ස - මජ්සං.

1770. නැණවත් පුරුෂයා ඇසින් දැක, කනින් අසා කවර කර්මයන් කරන්නහු මා සතුරෙකැ යි දැනගන්නේ ද, එය දැන ගැනීමට නැණවතා කෙසේ වෑයම් කටයුතු ද?

1771. මිත්‍ර ප්‍රතිරූපකයා, මිතුරා දැකැ ද සිනා නො වෙයි, සතුටු නො වෙයි. ඇස් ඇර බැලීම ද නො කෙරෙයි. මිතුරා කරන කතාවට ද විරුද්ධ වේ.

1772. ඔහුගේ සතුරන් භජනය කෙරෙයි. ඔහුගේ මිතුරන් භජනය නො කෙරෙයි. ගුණ කියන්නවුන් වළකයි. නුගුණ කියන්නවුන් පසසයි.

1773. සැඟවියයුතු දෙය ඔහුට නො කියයි. ඔහුගේ සැඟවිය යුතු දෙය නො සඟවයි. ඔහුගේ වැඩ නො පසසයි. ඔහුගේ නුවණ නො පසසයි.

1774. ඔහුගේ පරිහානියේ දී සතුටු වෙයි. ඔහුගේ දියුණුවේ දී සතුටු නො වෙයි. රසවත් බොජුනක් ලද විටෙක ඔහු සිහිපත් නො කරයි. එයින් ඔහුට සංග්‍රහ කරන්නට තරම් සානුකම්පික නො වෙයි. මෙයින් නො සතුට ලබන්නේ ය.

1775. මෙසේ, සතුරා කෙරේ පිහිටි මේ සොළසාකාර ලකුණෙන් පණ්ඩිත පුරුෂයා සතුරා දැක ද අසා ද දැනැ ගන්නේ ය.

1776. කෙබඳු දේ කරන්නකු ඇසින් දැකැ කනින් අසා මේ මගේ මිතුරෙකැ යි නැණවත් පුරුෂයා දැනැ ගන්නේ ද එය දැනැ ගැනීමට නැණවත් පුරුෂයා කෙසේ වෑයම් කටයුතු ද?

1777. විදෙශයට ගිය ඔහුගේ මිතුරා සිහිකරයි. ආපසු පැමිණි මිතුරා දැක ඉතා සතුටු වෙයි. ඉක්බිති මමායනය කරන්නේ වෙයි. ප්‍රිය බසින් සල්ලාපයේ යෙදෙමින් ප්‍රීත වෙයි.

1778. ඔහුගේ ම මිතුරන් භජනය කරයි. ඔහුගේ සතුරන් භජනය නො කරයි. නින්ද කරන්නන් වළක්වයි. ගුණ කියන්නන් පසසයි.

1779. සැඟවියයුතු දෙය ඔහුට කියයි. ඔහුගේ සැඟවිය යුතු දෙය සඟවයි. ඔහුගේ වැඩට පැසසුම් කරයි. ඔහුගේ නුවණට පැසසුම් කරයි.

1780. භවෙ ච නන්දති තස්ස අභවෙ තස්ස න නන්දති,
අච්ඡරියං භොජනං ලද්ධා තස්ස උප්පජ්ජතෙ සති,
තතො තං අනුකම්පති අහො සොපි[1] ලභෙය්‍යිතො.

1781. ඉච්චෙතෙ සොළසාකාරා මිත්තස්මිං සුප්පතිට්ඨිතා,
යෙහි මිත්තං ච ජානෙය්‍ය දිස්වා සුත්වා ච පණ්ඩිතොති.

10. මිත්තාමිත්තජාතකං.

ද්වාදසකනිපාතො නිට්ඨිතො.

තස්සුද්දානං:

ලහුචිත්ත සාසාල කසානති පුන
අථ කාම දසබ්‍රාහ්මණ භූරිදත්තවරො,
අථ කණ්හ සුකොසිය මෙණ්ඩවරො
පදුමො පුන මිත්තවරෙ දස.

1. පහාසොපි – මජ්ඣං. සයා.

1780. ඔහුගේ දියුණුවෙහි සතුටු වෙයි. ඔහුගේ පරිහානියෙහි නො සතුටු වෙයි. රසවත් බොජුනක් ලද විටෙක ඔහු සිහිපත් කරයි. එයින් ඔහුට සංග්‍රහ කරන්නට තරම් සානුකම්පක වෙයි. මෙයින් සතුටක් ලබන්නේ ය.

1781. මෙසේ මිතුරා කෙරේ පිහිටි මේ සොළසාකාර ලකුණෙන් පණ්ඩිත පුරුෂයා මිතුරා දැක ද අසා ද දැන ගන්නේ ය.

10. මිත්තාමිත්ත ජාතක යි.

දොළොස්වැනි නිපාතය නිමි.

එහි උද්දානය:

ලහුචිත්ත (චුල්ලකුණාල) ය, භද්දසාල ය, කසනාති (සමුද්දවාණිජ) ය, කාම ය, දස බලු (ජනසන්ධ) ය, කණ්හ (මහාකණ්හ) ය, කොසිය ය, මෙණ්ඩක ය, මහාපදුම ය, මිත්තාමිත්ත ය යි දශ ජාතකයෝ වෙත්.

තෙරසක නිපාතො

1782. අහාසි මෙ අම්බඵලානි පුබ්බෙ
අණූනි ථූලානි ච බ්‍රහ්මචාරි,
තෙහෙව මන්තෙහි න දානි තුය්හං
දුමප්ඵලා පාතුභවන්ති බ්‍රහ්මෙ.

1783. නක්ඛත්තයොගං පටිමානයාමි[1]
ඛණං මුහුත්තං න මං තොසයන්ති,[2]
නක්ඛත්තයොගඤ්ච ඛණඤ්ච ලද්ධා
අථා[3] හරිස්සම්බඵලං පහූතං[4].

1784. නක්ඛත්තයොගං න පුරෙ අභාණි
ඛණං මුහුත්තං න පුරෙ අසංසි,
අථාහරී[5] අම්බඵලං පහූතං
වණ්ණෙන ගන්ධෙන රසෙනුපෙතං.

1785. මන්තාභිජප්පෙන පුරස්ස[6] තුය්හං
දුමප්ඵලා පාතුභවන්ති බ්‍රහ්මෙ,
ස්වාජ්ජ න පාරෙසි ජපම්පි මන්ත[7]
අයං සො කො නාම තවජ්ජ ධම්මො.

1786. චණ්ඩාලපුත්තො මම සම්පදසි
ධම්මෙන මන්තෙ පකතිඤ්ච සංසි,
මා චස්සු මෙ පුච්ඡිතො නාමගොත්තං
ගුය්හිත්ථො මා තං විජහෙය්‍ය[8] මන්තො.

1787. සොහං ජනින්දෙන ජනම්හි පුට්ඨො
මක්ඛාභිභූතො අලිකං අභාසිං,
මන්තා ඉමෙ බ්‍රාහ්මණස්සාති මිච්ඡා
පහීනමන්තො කපණො රුදාමි.

1788. එරණ්ඩා පුචිමන්ද වා අථවා පාළිභද්දකා,
මධුං මධුත්ථිකො වින්දෙ සො හි තස්ස දුමුත්තමො.

---

1. පතිමානයාමි – වි. මජසං.
2. ඛණං මුහුත්තං මන්තෙන පස්සං – මජසං.
3. අද්ධා – මජසං, ස්‍යා.
4. බහුතං – මජසං, ස්‍යා.
5. සයං හරි – මජසං.
6. පුරෙහි – මජසං, ස්‍යා.
7. ස්වජ්ජ න පාදෙසි ජපම්පි මන්තං – මජසං.
8. විජහෙය්‍යු – ස්‍යා.

තෙරසක නිපාතය

1782. බඹසැරිය, ලොකු කුඩා අඹ පෙර (තෙපි) මට ගෙනාවහු ය. තොපගේ ඒ මන්ත්‍ර බලයෙන් දැන් අඹ පහළ නො වෙ යි. (අඹ නො සැදේ.)

1783. නැකැත් යොගය ගරු කරමි. හෙවත් පරීක්‍ෂාවෙන් සිටිමි. ක්‍ෂණය (නැකැත) සුභ මොහොත මා තුටු නො කෙරේ. නැකැත් යොගයත් සුභ මොහොතත් ලැබ නැවත බොහෝ අඹ ගෙනෙන්නෙමි.

1784. නැකැත් යොගයක් (එහි අවශ්‍යතාව) පෙර නො කීය. සුභ මොහොත තිබියුතු යයි නො කීය. එහෙත්, පැහැයෙන් සුවඳින් හා රසයෙන් යුතු අඹරසක් ගෙනාවේ ය.

1785. බමුණ, මන්ත්‍ර ජල්පනයෙන් පෙර තොපට අඹ ගසේ එලයෝ පහළ වූහ. ඒ තෙපි අද මතුරු දපන්නේ නමුදු ගස පල ගන්වන්නට අපොහොසත් වූහු. අද තොපට මේ වූයේ කුමක් ද?

1786. සැඩොල් පුතෙක් දැහැමින් හෙවත් පාරිතොෂිකයක් හෝ නො ගෙන මට මන්ත්‍රය දිනි. (ඉදින්) මතුර දුන්නහු (කවුරුන් හෝ) පිළිවිසියේ නො සඟවා කියව. (එය) මතුරු තා නො හරින්නට හෙතු ය.

1787. රජතුමා විසින් ජනයා මැද මා විතාළේ ගුණමකු වැ මම බොරු කීවෙමි. මේ මතුර බමුණකුගෙන් ඉගෙන ගත්තේ යයි කීම බොරු ය. මන්ත්‍ර නැති ව ගියෙන් අසරණ ව අඬමි.

1788. මී සොයන්නෙක්, එරඬු ගසෙහි හෝ කොහොඹ ගසෙහි හෝ එරබදු ගසෙහි හෝ බඳනා ලද මීයක් ලබා ද ඒ ගස ඔහුට උතුම් වේ.

1789. ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා චණ්ඩාලපුක්කුසා,
යස්මා[1] ධම්මං විජානෙය්‍ය සො හි තස්ස නරුත්තමො.

1790. ඉමස්ස දණ්ඩඤ්ච වධඤ්ච දත්වා
ගලෙ ගහෙත්වා ඛලයාථ ජම්මං,
යො උත්තමත්ථං කසිරෙන ලද්ධං
මානාතිමානෙන විනාසයිත්ථ.

1791. යථා සමං මඤ්ඤමානො පතෙය්‍ය
සොබ්භං ගුහං නරකං පූතිපාදං,
රජ්ජූති වා අක්කමෙ කණ්හසප්පං
අන්ධො යථා ජොතිමධිට්ඨහෙය්‍ය[2]
එවම්පි මං ත්වං ඛලිතං සපඤ්ඤ[3]
පහීනමන්තස්ස පුනප්පසීද[4],

1792. ධම්මෙන මන්තෙ[5] තව සම්පදාසිං
තුවම්පි ධම්මෙන පටිග්ගහෙසි
පකතිම්පි තෙ අත්තමනො අසංසිං[6]
ධම්මෙ ඨිතං තං න ජහෙය්‍ය මන්තො.

1793. සො බාල මන්තං කසිරෙන ලද්ධං
යං දුල්ලභං අජ්ජ මනුස්සලොකෙ,
කිච්ඡා ලද්ධා ජීවිකං අප්පපඤ්ඤො[7]
විනාසයි අලිකං භාසමානො.

1794. බාලස්ස මූළ්හස්ස අකතඤ්ඤුනො ච
මුසා භණන්තස්ස අසඤ්ඤතස්ස,
මන්තෙ මයං තාදිසකෙ න දෙම
කුතො මන්තා ගච්ඡ න මය්හ රුච්චසී'ති.

1. අම්බජාතකං.

1. යම්හා - මජසං, සයා.
2. අන්ධො යථා ජොතිං පවිට්ඨහෙය්‍ය - මජසං.
3. සපඤ්ඤං - වි.
4. පුනප්පසාදහි - මජසං. සම්පාදහි - සයා.
5. මන්තං - මජසං.
6. අසංසි - වි. මජසං, සයා.
7. කිඤ්චාපි ලද්ධා ජීවිතුං අප්පපඤ්ඤො - මජසං. වි. කිච්ඡාපි ලද්ධා ජීවිතං අප්පපඤ්ඤො - සයා.

1789. ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශූද්‍ර, චණ්ඩාල, හෝ පුක්කුස යන මොවුනතර කාගෙන් හෝ දහමක් දත්තේ නම් හේ ඔහුට උත්තමයෙක් වේ.

1790. යමෙක් දුකසේ ලද උතුම් වස්තුව (මතුරු) අධික මානය නිසා නසාපි ද, ඔහුට දඬුවම් හා හිංසා කොට බොටු-වෙන් ගෙන ඇද දමවු.

1791. වළ, ගුහාව, ප්‍රපාතය, නරාවළ යන තැන් සම වූ තැන් යයි සිතන්නේ වැටේ ද රැහැන යන හැඟීමෙන් සර්පයකු මඩී ද අන්ධයෙක් ගින්න මඩී ද එ පරිදි (සිතා) සප්‍රාඥ වූ ඔබ වහන්සේ, නටුවහුට නැවත මතුර දෙන්නේ මැනැවි.

1792. දැහැමි පරිදි තොපට මතුර දුනිමි. තෙපි ද එසේ එය ගත්තහු ය. සතුටු සිතැතියාගේ ප්‍රකෘතිය තොපට කීමි. ධර්මයේ පිහිටියේ නම්, මන්ත්‍රය තොප අත් නො හරින්නේ ය.

1793. මෙ කලැ මිනිස් ලොව දුර්ලභ වූ දුකසේ ලද මතුරත් මහන්සි ව ගෙන ගිය දිවිපැවැත්මත් දුෂ්ප්‍රාඥ තෙමේ බොරු බස් කියමින් වැනැසී ය.

1794. නුවණ රහිත වූ කළගුණ නො දත්තා වූ බොරු කියන සංයමයක් නැත්තා වූ එ බඳු නුගුණයකුට මතුර නො දෙමු. තොප මට නුරුස්නේ ය. මොන මතුරක් ද? (මෙතැනින්) යව.

1. අම්බ ජාතක යි.

1795. කුඨාරිහත්ථො පුරිසො වනමොගය්හ තිට්ඨසි[1],
පුට්ඨො මෙ සම්ම අක්ඛාහි කිං දරුං ඡෙතුමිච්ඡසි.

1796. ඉස්සො[2] වනානි චරසි සමානි විසමානි ච,
පුට්ඨො මෙ සම්ම අක්ඛාහි කිං දරුං නෙමියා දළ්හං.

1997. නෙව සාලො න ඛදිරො නාස්සකණ්ණො කුතො ධවො[3],
රුක්ඛොව ඵන්දනො නාම තං දරුං නෙමියා දළ්හන්ති.

1798. කීදිසානිස්ස පත්තානි ඛන්ධො වා පන කීදිසො,
පුට්ඨො මෙ සම්ම අක්ඛාහි යථා ජානෙමු ඵන්දනං

1799. යස්ස සාඛා පලම්බන්ති නමන්ති න ච භඤ්ජරෙ,
සො රුක්ඛො ඵන්දනො නාම යස්ස මූලෙ අහං[4] ඨිතො.

1800. අරානං චක්කනාභීනං ඊසානෙමි රථස්ස ච,
සබ්බස්ස තෙ කම්මනියො අයං හෙස්සති ඵන්දනො.

1801. ඉති ඵන්දනරුක්ඛොපි තාවදෙ අජ්ඣභාසථ,
මය්හම්පි වචනං අත්ථි භාරද්වාජ සුණොහි මෙ.

1802. ඉස්සස්ස[5] උපක්ඛන්ධම්හා[6] ඔක්කච්ච චතුරඞ්ගුලං,
තෙන නෙමිං පරිහරෙසි[7] එවං දළ්හතරං සියා

1803. ඉති ඵන්දනරුක්ඛොපි වෙරං අප්පෙසි[8] තාවදෙ,
ජාතානඤ්ච අජාතානං ඉස්සානං දුක්ඛමාවහි[9].

1804. ඉච්චෙව[10] ඵන්දනො ඉස්සං ඉස්සො[11] ච පන ඵන්දනං
අඤ්ඤමඤ්ඤං විවාදෙන අඤ්ඤමඤ්ඤමඝාතයුං.

1805. එවමෙව මනුස්සෙසු විවාදෙ යත්ථ ජායති,
මයූරනච්චං නච්චන්ති යථා තෙ ඉස්සඵන්දනා[12].

---

1. තිට්ඨති – වි.
2. ඊසො – ස්‍යා. ඉසො – සීමු
3. නාස්ස කණ්ණො කකුයොවා – මජසං.
4. සවාහං – මජසං.
5. ඉමස්ස – මජසං, ස්‍යා.
6. උපක්ඛන්ධම්හා – මජසං.
7. පහාරෙසි – මජසං.
8. අප්පෙති – මජසං, කප්පෙසි – ස්‍යා.
9. දෙවතා – ස්‍යා.
10. ඉච්චෙවං – වි., මජසං, ස්‍යා.
11. ඊසානං රුක්ඛමාවහති – මජසං.
12. ඊස – ස්‍යා.

1795. පොරොවක් අතින් ගත් පුරුෂයෙක් වන වැද සිටී. මිතුර, විතාළ මට කියව, කෙබඳු දැවයක් (ගසක්) කපන රිස්සේ ද?

1796. වලස් වූ තෝ සම විසම වනයන්හි හැසිරෙන්නෙහි. මිතුර, විතාළ මට කියව. නිම්වළල්ලක් තැනීමට ශක්තිමත් දැව (වර්ගය) කුමක් ද?

1797. නිම්වළල්ල තැනීමට සල්, කිහිරි අස්කන් (අශ්වකර්ණ) ගස් සුදුසු නො වේ. කිහිරි ගස කෙසේ යොග්‍ය වේ ද? නිම්වළල්ල තැනීමට කොළොම්දැව ශක්ති සම්පන්න වේ.

1798. මිතුර, ඒ (කොළොම්) ගසේ කොළ කෙබඳු ද? කඳ කෙබඳු ද? කොළොම්ගස (අපි) යම්සේ හඳුනා ගනිමු ද, එසේ විතාළ මට කියව.

1799. යම් ගසක ශාඛාවෝ එල්බැ සිටිත් ද නැමෙත් ද (එහෙත්) නො කැඩෙත් ද ඒ ගස එන්දන නම් වේ. ඒ ගසැ මුල මම සිටිනෝ වෙමි.

1800. රියෙහි අර, සක්නැව, රියහිස්, නම්වළ යන මේවා තැනීමට මේ කොළොම්ගස කර්මණ්‍ය හෙවත් යොග්‍ය වේ.

1801. මෙසේ කී මොහොතේ ම කොළොම්ගස අරක් ගත් දෙවියා ද මෙලෙස කිය. භාරද්වාජය, මගේ කීමෙක් ද ඇත. එය ද අසව.

1802. වලසාගේ ගෙලෙන් සතරඟුලක් (හම) ගෙන නිම් වළල්ලේ යොදා ගනුව හෙවත් සවි කරව. එයින් ඉතා ශක්තිමත් වන්නේ ය.

1803. එකෙණෙහි කොළොම් ගස ද වෛර ඉපැද වීය. උපන්නා වූ ද නූපන්නා වූ ද වලසුන්ට දුක් ගෙන දුන්නේ ය.

1804. මෙසේ කොළොම් ගස වලසාට ද වලසා කොළොම් ගසට ද ඔවුනොවුන් කළ වාදයෙන් ඔවුනොවුන් නස්වාලූහ.

1805. එසේ මනුෂ්‍යයන් අතරේ විවාදයක් හටගනී ද, එය, වලසා හා කොළොම්ගස පරිදි මොනරනැටූම් නටත්. (හෙවත් විවාදපන්නයෝ උනුන් කුලමල කියා බැණ ගැනීම නිසා තමන්ගේ ඌනතා හෙළිකර ගනිත්.)

1806. තං වො වදමි භද්දං[1] වො යාවන්තෙත්ථ සමාගතා,
සම්මොදථ මාවිවදිත්ථ මා හොථ ඉස්සඵන්දනා.

1807. සාමග්ගිමෙව සික්ඛෙථ බුද්ධෙහෙතං පසංසිතං,
සාමග්ගිරතො[2] ධම්මට්ඨො යොගක්ඛෙමා න ධංසතීති.

2. ඵන්දනජාතකං.

1808. ඉධෙව හංස නිපත පියං මෙ තව දස්සනං,
ඉස්සරොසි අනුප්පත්තො යං ඉධත්ථි පවෙදය.

1809. සවණෙන චෙකස්ස[3] පියා භවන්ති
දිස්වා පනෙකස්ස වියෙති[4] ඡන්දො,
දිස්වා ච සුත්වා ච පියා භවන්ති.
කච්චින්නු[5] මෙ පීයයසි දස්සනෙන.

1810. සවණෙන පියො මෙසි භීය්‍යො වාගම්ම දස්සනං,
එවං පියදස්සනො සමානො වස හංස මම සන්තිකෙ.

1811. වසෙය්‍යාම තවාගාරෙ නිච්චං සක්කතපූජිතා,
මත්තො ච එකදා වජ්ජා[6] හංසරාජං පචන්තු මෙ.

1812. ධිරත්ථු තං අන්නපානං යමහං පියතරං තයා,
න චාපි මජ්ජං පායාමි යාව මෙ වච්ඡසී ඝරෙ.

1813. සුවිජානං සිගාලානං සකුන්තානඤ්ච වස්සිතං,
මනුස්සවස්සිතං රාජ දුබ්බිජානතරං තතො.

1814. අපි චෙ මඤ්ඤති පොසො ඤාති මිත්තො සඛාති වා,
යො[7] පුබ්බෙ සුමනො හුත්වා පච්ඡා සම්පජ්ජතෙ දිසො.

1815. යස්මිං මනො නිවිසති අවිදූරෙ සහාපි සො[8],
සන්තිකෙපි හි සො දූරෙ යස්මා විවසතෙ මනො.

---

1. භද්දන්තෙ – මජ්සං.
2. සාමග්ග්‍ය – මජ්සං.
3. එකස්ස – ස්‍යා, නෙකස්ස – මජ්සං.
4. විහෙති – වි., විනෙති – මජ්සං, ස්‍යා.
5. කච්චි නු මෙ පියසි – ස්‍යා.
6. වජ්ජෙ – මජ්සං, වජ්ජං – ස්‍යා.
7. සො – මජ්සං.
8. යො – වි.

1806. තොපට කියමි, යම්තාක් දෙන මෙහි රැස් වූ ද ඒ හැමට සෙත් වේවා. තෙපි වලසා සහ කොළොම් ගස් සේ නො වවූ, ප්‍රීත වවූ. වාද නො කරවූ.

1807. සමගියෙහි ම හික්මෙවු. මෙය බුදුවරයන් විසින් පසස්නා ලද. සමගියෙහි ඇලී සුචරිත ධර්මයෙහි පිහිටි තැනැත්තේ නිර්වාණ සම්පතින් නො පිරිහේ.

2. එන්දන ජාතක යි.

1808. හංසය, මෙහි (මේ රන්පුවුවෙහි ම) හිඳුව. තොපගේ දැකීම මට ප්‍රිය වේ. තෙපි මෙහි ඉසුරු බවට පත් වූහු. යමක් කැමැති ද එය කියන්න.

1809. ගුණ ඇසීම නිසා කෙනෙක් කෙනකුට ප්‍රිය වෙති. සමහරුන් දැකීම නිසා සමහරකුගේ ආසා පහව යයි. දැකීමත් ඇසීමත් නිසා සමහරු ප්‍රිය වෙති. කිමෙක් ද, දැකීම නිසා ප්‍රිය බව උපදී ද?

1810. හංසය, තොපි මට ඇසීමෙන් ප්‍රිය වූහු දර්ශනයට පැමිණ වඩා ප්‍රිය වූහු ප්‍රිය දැකුම් ඇතියේම මා සමීපයේ වෙසෙව.

1811. නිතර සැලැකිලි හා පිදුම් ලබමින් තොපගේ නිවෙසේ (අපි) වසමු. දවසෙකැ සුරාමදයෙන් මත් වැ මට හංසරාජයා (මස් පිණිස) පිසත්වා (යී කියන්නහු ය.)

1812. තොපටත් වඩා මට යම් ආහාරපානයක් ඉතා ප්‍රිය ද ඊට නින්දා වේවා. යම්තාක් තෙපි මාගේ නිවෙසේ වෙසෙන්නහු ද ඒ තාක් මත්පැන් නො බොමි.

1813. රජතුමනි, සිවලුන්ගේ ද පක්ෂීන්ගේ ද හඬ සුවසේ දත හැකි ය. මිනිසුන්ගේ හඬ දැන ගැනීම ඊට වඩා බෙහෙවින් දුෂ්කර ය.

1814. යම් පුරුෂයෙක් පළමු සතුටු සිතැති වැ (මේ) නෑයෙක, මිතුරෙක යහළුවෙකැ යි සිතා ද හේ පසුව සතුරු වෙයි.

1815. යමකු කෙරේ සිත බැසැගනී ද හේ දුරවුව ද සමීපයේ එක්වැ වාසය කරන්නේ වේ. බැඳුණු යමකු කෙරෙන් සිත පහව යේ ද හේ සමීපයේ වෙසෙතත් ඈත වාසය කරන්නේ වේ.

1816. අන්තොපි සො[1] හොති පසන්න චිත්තො
පාරං සමුද්දස්ස පසන්නචිත්තො,
අන්තොපි යො හොති පදුට්ඨචිත්තො
පාරං සමුද්දස්ස පදුට්ඨචිත්තො.

1817. සංවසන්තාපි විවසන්ති යෙ දිසා[2] තෙ රථෙසභ,
ආරා සන්තො සංවසන්ති[3] මනසා රට්ඨවඩ්ඪන.

1818. අතිචිරං නිවාසෙන පියො භවති අප්පියො,
ආමන්ත ඛො තං ගච්ඡාම[4] පුරා තෙ හොම[5] අප්පියා[6].

1819. එවං චෙ යාචමානානං අඤ්ජලිං නාවබුජ්ඣසි,
පරිචාරකානං සත්තානං වචනං න කරොසි නො,
එවං තං අභියාචාම පුන කයිරාසි පරියායං.

1820. එවං චෙ නො විහරතං අන්තරායො න හෙස්සති,
තුය්හං වාපි මහාරාජ මය්හං වා රට්ඨවඩ්ඪන[7],
අප්පෙවනාම පස්සෙම[8] අහොරත්තානමච්චයෙති.

3. ජවනහංසජාතකං.

1821. න තෙ කට්ඨානි භින්නානි න තෙ උදකමාහතං,
අග්ගිපි තෙ න හාසිතො[9] කින්නු මන්දෙව ඣායසි.

1822. න උස්සහෙ වනෙ වත්ථුං කස්සපාමන්තයාමි තං,
දුක්ඛො වාසො අරඤ්ඤස්මිං රට්ඨං ඉච්ඡාමි ගන්තවෙ.

1823. යථා අහං ඉතො ගන්ත්වා යස්මිං ජනපදෙ වසං,
ආචාරං බ්‍රහ්මෙ[10] සික්ඛෙය්‍යං තං ධම්මං අනුසාස මං.

1824. සචෙ අරඤ්ඤං හිත්වාන වනමූලඵලානි ච,
රට්ඨෙ රොචයසෙ වාසං තං ධම්මං නිසාමෙහි මෙ.

1. චෙ – ස්‍යා.
2. තාදිසා – මජසං.
3. ආරාධිතා සංවසන්ති – මජසං.
4. ගච්ඡාමි – ස්‍යා.
5. හොථ – මජසං, ස්‍යා.
6. අප්පියා – ස්‍යා.
7. රට්ඨවද්ධන.
8. පමුස්සෙය – මජසං.
9. භාසිතො – මජසං
10. ආචාරං බ්‍රහමං – මජසං.

1816. පහන් සිතැත්තෙක් මුහුදෙන් එතෙර වෙසෙතත් හේ ඇතුළත (සිතැ) වෙසෙන්නේ වේ. නො පහන් සිතැත්තෙක් ඇතුළතැ වෙසෙතත් හේ මුහුදෙන් එතෙර වෙසෙන්නේ වේ.

1817. මහරජ, යම් කෙනෙක් සතුරු ද ඔහු එක්වැ වසන්නාහු නමුදු වෙන් වැ වෙසෙන්නෝ වෙති. සත්පුරුෂයෝ දුර වෙසෙතත් මෙත් සිත් නිසා ළං වැ වෙසෙන්නෝ වෙති.

1818. දිගු කල් එක් වැ විසීම නිසා ප්‍රියයා ද අප්‍රිය වේ. අප්‍රිය වන්නට පෙරාතු ව තොපට කියා අවසර ගෙන යමු.

1819. මෙසේ දෙහොත් මුදුන් දී කරන ඉල්ලීම නොපිළිගන්නේ නම්, ආශ්‍රිතයන් කියන පරිදි නො කරන්නේ නම් නැවත තොප යදිමු. මෙලෙස නැවත ද ගමනාගමනය කරව.

1820. රට වඩන රජතුමනි, මෙසේ වෙසෙන තොපගේ ද මාගේ ද ජීවිතාන්තරායෙක් නො වන්නේ නම් අහොරාත්‍රයන් දිවිහිමියෙන් ඔවුනොවුන් දකින්නෙමු නම් ඉතා මැනැවි.

3. ජවනහංස ජාතක යි.

1821 තා විසින් දර නො පලන ලද ය. තා විසින් දිය නො ගෙනෙන ලද ය. තා විසින් ගිනි නො දල්වන ලද අඬ බාලයකු ලෙස සිත සිතා ඉන්නේ කිම?

1822. කාශ්‍යපයන් වහන්ස, ඔබ වහන්සේ අමතමි. වනයෙහි වාසය කරන්නට උත්සාහයක් නැත. වන වාසය දුක් සහිත ය රටට යන්නට කැමැත්තෙමි.

1823. පියාණෙනි, මම මෙ තැනින් ගොස් යම් දනව්වෙක වසම් ද ඒ දනව් සිරිත් පුහුණුවනු සඳහා මට ධර්මයෙන් අනුශාසනා කරනු මැනැවි.

1824. ඉදින් වනයත් වනමුලුත් පලාපලත් හැර පියා රටේ විසුම රුස්නේ නම් ඒ දහම් සිරිත් අසව.

1825. විසං මා පතිසෙවිත්ථො පපාතං පරිවජ්ජය,
පඞ්කෙ[1] ච මා විසීදිත්ථො[2] යත්තො ආසීවිසෙ[3] චරෙ

1826. කින්නු විසං පපාතො වා පඞ්කො වා බ්‍රහ්මචාරිනං,
කං ත්වං ආසීවිසං බ්‍රෑහි තමෙම අක්ඛාහි පුච්ඡිතො.

1827. ආසවො තාත ලොකස්මිං සුරා නාම පවුච්චති,
මනුඤ්ඤා[4] සුරභි වග්ගු මධුඛුද්දරසූපමා[5]
විසං තදාහු අරියා බ්‍රහ්මචරියස්ස නාරද.

1828. ඉත්ථියො තාත ලොකස්මිං පමත්තං පමථෙන්ති තා,
හරන්ති යුවිනො[6] චිත්තං තූලභට්ඨංව[7] මාලුතො
පපාතො එසො අක්ඛාතො බ්‍රහ්මචරියස්ස නාරද.

1829. ලාභො සිලොකො සක්කාරො පූජා පරකුලෙසු ච,
පඞ්කො එසො[8] අක්ඛාතො බ්‍රහ්මචරියස්ස නාරද.

1830. ස සත්ථා[9] තාත රාජානො ආවසන්ති මහිං ඉමං,
තෙ තාදිසෙ මනුස්සින්දෙ මහන්තෙ තාත නාරද.

1831. ඉස්සරානං අධිපතීනං න තෙසං පාදතො චරෙ,
ආසීවිසො සො අක්ඛාතො බ්‍රහ්මචරියස්ස නාරද.

1832. භත්තත්ථො[10] භත්තකාලෙ යං යං ගෙහං උපසඞ්කමෙ,
යදෙත්ථ කුසලං ජඤ්ඤා තත්ථ ඝාසෙසනං චරෙ.

1833. පවිසිත්වා පරකුලං පානත්ථං[11] භොජනාය වා,
මිතං ඛාදෙ මිතං භුඤ්ජෙ න ච රූපෙ මනං කරෙ.

1834. ගොට්ඨං[12] මජ්ජං කිරාසඤ්ච[13] සභානි කිරණානි ච,
ආරකා පරිවජ්ජෙහි යානීව[14] විසමං පථන්ති.

4. චූලනාරදජාතකං.

1835. දූතෙ තෙ බ්‍රහ්මෙ[15] පාහෙසිං ගඞ්ගාතීරස්මිං ඣායතො,
තෙසං පුට්ඨො න ව්‍යාකාසි[16] දුක්ඛං ගුය්හං මතන්නු තෙ.

---

1. පඞ්කො – වි. මජ්ඣං.
2. විසියිත්ථො – මජ්ඣං.
3. වාසිවිසෙ – වි., මජ්ඣං.
4. මනුඤ්ඤො – මජ්ඣං.
5. සාදුඛුද්දරසූපමො – මජ්ඣං.
6. යතිනො – මජ්ඣං, මුනිනො – ස්‍යා.
7. තූලං – මජ්ඣං, තුලං – ස්‍යා.
8. එසො ච – මජ්ඣං.
9. මහන්තා – මජ්ඣං, ස්‍යා.
10. භත්තට්ඨො – මජ්ඣං
11. පානට්ඨො – වි.
12. ගුට්ඨං – ස්‍යා.
13. කිරාටඤ්ච – මජ්ඣං.
14. යානිංව – මජ්ඣං, යානි ච – වි.
15. බ්‍රාහ්මණ – මජ්ඣං.
16. බ්‍යාකාසි – මජ්ඣං

1825. විෂය සෙවීම නො කරව. ප්‍රපාතය දුරුකරව. මඩෙහි නො ගිලෙව. සර්පයා දුරු කරව.

1826. බඹසැරියන්හට විෂය කුමක් ද? ප්‍රපාතය කුමක් ද? මඩ නම් කුමක් ද? සර්පයා යයි කියන්නේ කුමකට ද? විතාළ මට එය කියනු මැනව.

1827. පුතණුවෙනි, ලොකයේ සිත් ගන්නා වූ සුවඳැති හිතට ප්‍රිය වූ අඩුවැල් බෑ මීරස වැනි රස ඇති ආසව සුරා නම් වේ. එය බ්‍රහ්මචර්යාවට විෂ (වේ) යයි ආර්යයෝ කියති.

1828. පුතණුවනි, ලොවෙහි ස්ත්‍රීහු සිහි මුළාවූවන් මඩිති. සුළඟ රුකින් ගිළිහුණු පුළුන් රොදක් සේ ස්ත්‍රීහු, තරුණයාගේ සිත පැහැරැ ගනිති. නාරදය තෙල බ්‍රහ්මචර්‍ය්‍යයට ප්‍රපාතය යි කියන ලදී.

1829. නාරද, ලාභය, කීර්තිය. සැලැකිල්ල හා අන්‍ය කුලයන්හි පිදුම් ද යන මේ බ්‍රහ්මචර්යයට පඞ්ක (මඩ) යයි කියන ලදී.

1830. දරුව නාරද, මහ තෙදැති රජවරු පොළොවට අධිපති ව වෙසෙති. ඉසුරෙන් මහත් වූ ඒ රජවරුන් ද සෙවනය නො කරව.

1831. ආඪ්‍ය වූ අධිපති වූ ඒ රජුන් සමීප වැ ඇසුරු කොට නො හැසිරෙව. මෙය බ්‍රහ්මචර්යාවට ආශීර්විෂ යයි කියන ලදී.

1832. ආහාර කැමැත්තේ, ආහාර වේලායෙහි යම් මැ නිවෙසකට එළැඹේ ද එහි යම් තැනක් නිරවද්‍ය යැ යි දන්නේ නම් ආහාර සෙවීම කරන්නේ ය.

1833. ආහාරපාන සඳහා අන් නිවෙසකට ගොස් පමණ දැන කන්නේ ය. පමණ දැනැ අනුභව කරන්නේ ය. ස්ත්‍රී රූපයෙහි හිත නො යොදන්නේ ය.

1834. ගව ගාල ද මත්පැන් හල ද ධූර්තයන් හා කපටියන් වෙසෙන තැන් ද ජනයා රැස්වන තැන් ද රන්රුවන් විකුණන තැන් ද, ගිතෙල් තලතෙල් බඳුන් පුරවා ගත් වාහන විෂම මඟ හැර යන්නා සේ දුරින් ම දුරු කරව.

4. චුල්ලනාරදජාතක යි.

1835. බමුණ, ගං ඉවුරට වී සිතමින් හිඳින තොප වෙත දූතයන් එවීමි. ඔවුන් විතාරන ලද්දේ නමුදු සැහවී ඇති දුක් සහිත ගුප්ත සිතුවිලි හෙළි නො කෙළේ ය.

1836. සචෙ තෙ දුක්ඛං උප්පජ්ජෙ කාසීනං රට්ඨවඩ්ඪන,
මා ඛො නො[1] තස්ස අක්ඛාහි යො තං දුක්ඛා න මොචයෙ.

1837. යො තස්ස දුක්ඛජාතස්ස එකන්තං අපි භාසතො,
විප්පමොචෙය්‍ය ධම්මෙන කාමං තස්ස පවෙදයෙ.

1838. සුවිජානං සිගාලානං සකුන්තානඤ්ච[2] වස්සිතං
මනුස්සවස්සිතං රාජ දුබ්බිජානතරං තතො.

1839. අපි චෙ මඤ්ඤතී පොසො ඤාති මිත්තො සඛාති වා,
යො පුබ්බෙ සුමනො හුත්වා පච්ඡා සම්පජ්ජතෙ දිසො.

1840. යො අත්තනො දුක්ඛමනානුපුට්ඨො
පවෙදයෙ ජන්තු අකාලරූපෙ,
ආනන්දිනො[3] තස්ස භවන්තාමිත්තා[4]
හිතෙසිනො තස්ස දුඛී[5] භවන්ති.

1841. කාලඤ්ච ඤත්වාන තථාවිධස්ස
මෙධාවිනං එකමනං විදිත්වා,
අක්ඛෙය්‍ය තිප්පානි පරස්ස ධීරො
සණ්හං ගිරං අත්ථවතිං පමුඤ්චෙ.

1842. සචෙ ච ජඤ්ඤා අවිසය්හමත්තනො
නායං නීති[6] මය්හසුඛාගමාය,
එකොපි තිප්පානි[7] සහෙය්‍ය ධීරො
සච්චං හිරොත්තප්පමපෙක්ඛමානො.

1843. අහං රට්ඨානි විචරන්තො නිගමෙ රාජධානියො[8],
භික්ඛමානො මහාරාජ ආචරියස්ස[9] ධනත්ථිකො.

1844. ගහපතී රාජපුරිසෙ මහාසාලෙ ච බ්‍රාහ්මණෙ,
අලත්ථං[10] සත්ත නික්ඛානි සුවණ්ණස්ස ජනාධිප
තෙ මෙ නට්ඨා මහාරාජ තස්මා සොචාමහං භුසං.

1845. පුරිසා තෙ මහාරාජ මනසා අනුවිචින්තිතා
නාලං දුක්ඛා පමොචෙතුං තස්මා තෙසං න ව්‍යාහරිං.

1846. ත්වං ච ඛො මෙ මහාරාජ මනසා අනුවිචින්තිතො,
අලං දුක්ඛා පමොචෙතුං තස්මා තුය්හං පවෙදයිං.

1847. තස්සාදසි පසන්නත්තො[11] කාසීනං රට්ඨවඩ්ඪනො.
ජාතරූපමයෙ නික්ඛෙ සුවණ්ණස්ස චතුද්දසාති

5. දූතජාතකං.

1. නං – මජසං.
2. සකුණඤ්ච – මජසං.
3. අනන්දිනො – මජසං, ස්‍යා.
4. භවන්ති මිත්තා – මජසං, ස්‍යා.
5. දුක්ඛී – මජසං, ස්‍යා.
6. කාලං සෙහි මය්හං – මජසං, නතෙහි මය්හං – ස්‍යා.
7. එකොව තිබ්බානි – මජසං, එකොව – වි.
8. රාජට්ඨානියො – මජසං.
9. ආචරිය – මජසං.
10. අලද්ධං – මජසං.
11. පසන්නචිත්තො – මජසං, ස්‍යා.

1836. කසී රටවාසීන්ගේ රට වඩන රජතුමනි, ඉදින් ඔබතුමාට උපන් දුක යමෙක් දුරු නො කෙරේ ද ඔහුට ඒ දුක නො කියනු මනා ය.

1837. හටගත් දුක් ඇති (එය) කියන්නා වූ ඔහුගේ දුක යමෙක් එකාන්තයෙන් දැහැමින් මුදු නම් ඔහට එකාන්තයෙන් (එය) කියන්නේ ය.

1838. සිවලුන්ගේ ද පක්ෂීන්ගේ ද හඬ මැනැවින් දත හැකි වේ. මහරජ (එහෙත්) මිනිසුන්ගේ හඬ දැනැගැනීම ඊට වඩා බොහෝ දුෂ්කර වේ.

1839. යම් පුරුෂයෙක් පළමු සතුටු සිතැති වැ නෑයෙක, මිතුරෙක, යහළුවෙකැ යි සිතා ද හේ පසුව සතුරු වෙයි.

1840. යමෙක් තම දුක නැවත නැවත විචාරන ලද්දේ අයොග්‍ය අවස්ථාවක කියන්නේ ද ඔහුගේ සතුරෝ (එය අසා) සතුටු වෙත්. ඔහුගේ හිතකැමති මිතුරෝ දුක් වෙත්.

1841. (රහස් කීමට) සුදුසු කාලය දැනැ තමා හා සමාන අදහස් ඇති නුවණැත්තකුට දුක් වීමට හෙතු වූ කරුණු කියන්නේ ය. නුවණැත්තේ අර්ථවත් දෙය මොළොක් බසින් කියන්නේ ය.

1842. ඉදින් තම දුක ඉවසා ගන්නට අපහසු බව දන්නේ ද (එකලැ) ලොක ධර්මයෝ (අටලෝදහම්) මට සැප ලබා දෙන්නට තිබෙන්නාහු නො වෙති යි සිතන නැණවතා හිරි ඔතප් උපදවා ගැනීමෙන් තියුණු දුක් ඉවසන්නේ ය.

1843. රජතුමනි, ගුරුතුමාට දුනමනා ධනය දෙනු කැමැති වැ රටෙහි ද දනවුවල ද රාජධානිවල ද සිඟමින් ඇවිදින්නෙමි.

1844. ජනපතිතුමනි, ගැහැවියන්, රාජපුරුෂයන් මහාසාර බමුණන් යැද රන් නිෂ්ක සතක් ලදිමි. මගේ ඒ ස්වර්ණ නිෂ්කයෝ නටහ. එහෙයින් මම බොහෝ දුක් වෙමි.

1845. මහරජතුමනි, ඔබගේ දූත පුරුෂයෝ සිතින් සිතුවාහු නමුදු මා දුකින් මුදන්නට සමත් නො වෙති. එහෙයින් ඔවුනට නො කීමි.

1846. මහරජතුමනි, තෙපි මාගේ දුක සිතින් සිතුවහු මා දුකින් මුදන්නට සමත් වහු. එහෙයින් තොපට කීවෙමි.

1847. කසීරට වාසීන්ගේ රට වඩන රජ තෙම පහන් සිතින් ස්වර්ණ නිෂ්ක තුදුසක් ඔහුට දුන්නේ ය.

5. දූතජාතක යි.

1848. රාජා කාලිඞ්ගො[1] චක්කවත්තී
ධම්මෙන පථවිමනුසාසං,
අගමා[2] බොධිසමීපං
නාගෙන මහානුභාවෙන.

1849. කාලිඞ්ගො භාරද්වාජො
රාජානං කාලිඞ්ගං සමණකොලඤ්ඤං,
චක්කං වත්තයතො පරිග්ගහෙත්වා
පඤ්ජලී ඉදමවොච[3].

1850. පච්චොරොහ මහාරාජ
භූමිභාගො යථා සමනුගීතො[4],
ඉධ අනධිවරා බුද්ධා
අභිසම්බුද්ධා විරොචන්ති.

1851. පදක්ඛිණතො ආවට්ටා[5]
තිණලතා අස්මිං භූමිභාගස්මිං,
පුථුවියා අයං[6] මණ්ඩො
ඉති නො සුතං මහාරාජ[7].

1852. සාගරපරියන්තාය
මෙදිනියා සබ්බභූතධරණියා,
පුථුවියා අයං මණ්ඩො
ඔරොහිත්වා නමො කරොහි.

1853. යෙ තෙ භවන්ති නාගා
අභිජාතා[8] මාතිතො ච පිතිතො ච,
එත්තාවතා පදෙසං
තෙ නාගා නෙවමුපයන්ති.

1854. අභිජාතො තෙ නාගො
කාමං පෙසෙහි කුඤ්ජරං දන්තිං,
එත්තාවතා පදෙසො
සක්කා නාගෙන මුපගන්තුං.[9]

1. රාජා කාලිඞ්ගා – මජසං., වි.
2. අගමාසි – මජසං, සයා.
3. මනුසාසි – සයා.
4. සමනුග්ගහො – මජසං.
5. ආවත්තා – වි.
6. පථවියා අයං – සයා, පථවියං නාභියං අප්වි යාය – මජසං.
7. ඉති නොසුතං මනෙත මහාරජ – මජසං.
8. අභිජාතා ච කුඤ්ජරා – මජසං.
9. එත්තාවතා පදෙසොච න සක්කා නාගෙන මුපගන්තං – මජසං

1848. කාලිංග නමැති සක්විති රජ තෙම ධර්මානුකූල වැ රාජ්‍යානු-ශාසනා කරන්නේ මහානුභාව සම්පන්න ඇතා පිටින් ශ්‍රී මහා බෝධිය වෙත ගියේ ය.

1849. කාලිංග භාරද්වාජ නමැති පුරෝහිත බමුණා බිම විමසා බලා සක්විති වූ තාපස පුතකු වූ කලිඟු රජුට දෙහොත් මුදුන් දී ගෙන මෙය කීය.

1850. රජතුමනි, මේ බිම බුදුවරයන් වහන්සේ වර්ණනා කළහ. ඇතාගේ පිටෙන් බසින්නේ මැනැවි. මෙහි අප්‍රමාණ බුදුවරු බුදුබව ලබා බබළති.

1851. මේ බිමෙහි තණ හා වැල් දකුණු දෙසට නැමී කැරකී සිටිති. මේ බිම පොළොවට අලංකාර (දෙන) තැනකි. මහරජ, අප විසින් මෙසේ අසන ලද ය.

1852. සයුර අවසන් කොට පවතින සව් සතුන් දරා සිටින මේ පොළොවට මෙ තැන අලංකාරයකි. මහරජ, ඇතු පිටින් බැසැ නමදිනු මැනැවි.

1853. මව්පිය දෙ පසින් අභිජාත වූ (උපොසථ කුලයේ ඉපැදුනු සක්විති රජහට පහළ වන) යම් ඇත්තු වෙත් ද ඒ ඇත්තු මේ පෙදෙසට මේ දක්වා නො පැමිණියාහු ය.

1854. තොපගේ ඇත් තෙම (උපොසථ කුලයෙහි) අභිජාතය. දළැති ඒ උතුම් ඇතා (තමා) රුස්නා පරිද්දෙකින් මෙහෙයව. මෙතෙක් පෙදෙස ඇත්වාහනයෙන් එළැඹෙන්නට හැක්ක.

1855. තං සුත්වා රාජා කාලිඞ්ගො
වෙය්‍යඤ්ජනිකවචො[1] නිසාමෙත්වා
සංපෙසෙසි නාගං
ඤස්සාම[2] මයං යථා ඉදං වචනං.

1856. සංපෙසිතො ච රඤ්ඤා
නාගො කොඤ්චො ච අභිනදිත්වාන,
පටිසක්කිත්වා නිසීදි
ගරුභාරං අසහමානො.

1857. කාලිඞ්ගභාරද්වාජො
නාගං ඛීණායුකං විදිත්වාන,
රාජානං කාලිඞ්ගං
තරමානො අජ්ඣභාසිථ.
අඤ්ඤං සඞ්කම නාගං
නාගො ඛීණායුකො මහාරාජ.

1858. තං සුත්වා කාලිඞ්ගො තරමානො
සඞ්කාමි නාගං සඞ්කන්තෙ ච රඤ්ඤෙ,
නාගො තත්ථෙව පති භුම්‍යා
වෙය්‍යඤ්ජනිකවචො යථා තථා අහු නාගො.

1859. කාලිඞ්ගභාරද්වාජං
කාලිඞ්ගො බ්‍රාහ්මණං ඉදමවොච[4]
ත්වමෙවාසි සම්බුද්ධො
සබ්බඤ්ඤූ සබ්බදස්සාවී.

1860. තං වචනං අනධිවාසෙන්තො
කාලිඞ්ගො බ්‍රාහ්මණො ඉදමවොච,
වෙය්‍යඤ්ජනිකා හි මයං
බුද්ධා සබ්බඤ්ඤුනොව මහාරාජ.

1861. සබ්බඤ්ඤූ සබ්බවිදූ ච
බුද්ධා න ලක්ඛණෙන ජානන්ති*,
ආගමබලසා හි මයං
බුද්ධා සබ්බං පජානන්ති.

---

1. වෙය්‍යඤ්ජනිය – වි.
2. උස්සාම – මජ්සං, උය්‍යාම – ස්‍යා.
3. පතිතො – වි., මජ්සං.
4. එතද වොච – මජ්සං.
* න අනධිවාසෙන්තො කාලිඞ්ගො බ්‍රාහ්මණො – ස්‍යා
ඉදමවොච –මජ්සං, තං අනධිවාසො කලිඞ්ගං බ්‍රාහ්මණෙ.

1855. කලිඟු රජ එය අසා, ලක්‍ෂණ ශාස්ත්‍ර දත් බමුණාගේ කීම පරිදි එය එසේ වන්නේ ද යි අපි දැන ගනිමු යි (කියා) ඇතා මෙහෙයැවී.

1856. රජතුමා විසින් මෙහෙයැවුණු ඇතා කොස්වා ලිහිණියකු සේ නාද කොට මහ බරක් දරන්නකු ලෙස පසුබැස සිටියේ යැ.

1857. කාලිංග භාරද්වාජ බමුණා ඇතා මළ බව දැනැ කලිඟු රජුට වහා කීය. මහරජ, ඇතා මළේ ය. අන් ඇතකු පිට නැගෙනු මැනැව.

1858. කලිඟු රජ එය අසා වහා අන් ඇතකු පිට නැගුනේ ය. රජ මාරු වූ කලැ මළ ඇත් තෙම ඒ තැනැ ම බිමට වැටිණි. ලක්ෂණශාස්ත්‍රය දත් බමුණාගේ කීම යම්සේ ද එසේ ඇතා මළේ ය.

1859. කලිඟු රජ කාලිංග භාරද්වාජ බමුණාට මෙය කීය. තෙපි ම සියල්ල දන්නා වූ සියල්ල දක්නා වූ සම්බුදු වෙවයි.

1860. ඒ කීම නො ඉවසන කලිඟු බමුණා මෙසේ කීය. මහරජ, අපි ලකුණු සතර දන්නෝ වෙමු. බුදුවරයෝ ම සියල්ල දත්තෝ ය.

1861. බුදුවරු ලකුණු සතරින් නොව සර්වඥතාඥානයෙන් හැම දේ දනිත්, ශිල්ප බලයෙන් අපි එකදෙශයක් දනිමු. බුදුවරයෝ සියල්ල මැනැවින් දත්තෝ ය:

1862. මහායිත්වාන[1] සම්බාධිං
නානා තුරියෙහි වජ්ජමානෙහි,
මාලාගන්ධවිලෙපනං[2]
ආහරිත්වා පාකාරපරික්ඛෙපං කාරෙසි.

1863. සට්ඨිවාහසහස්සානං පුප්ඵානං සන්නිපාතයි,
පූජෙසි රාජා කාලිඞ්ගො බොධිමණ්ඩවරුත්තමෙ'ති.

6. කාලිඞ්ගබොධිජාතකං.

1864. අකිත්තිං දිස්වාන සම්මන්තං සක්කො භූතපති බ්‍රවි,
කිමත්ථියං මහාබ්‍රහ්මෙ එකො සම්මසි සම්මනි.

1865. දුක්ඛො පුනබ්භවො සක්ක සරීරස්ස ච භෙදනං,
සම්මොහමරණං දුක්ඛං තස්මා සම්මාමි වාසව.

1866. එතස්මිං තෙ සුලපිතෙ පතිරූපෙ සුභාසිතෙ,
වරං කස්සප තෙ දම්මි යං කිඤ්චි මනසිච්ඡසි.

1867. වරං චෙ මෙ අදො සක්ක සබ්බභූතානමිස්සර,
යෙන පුත්තෙ ච දරෙ ච ධනධඤ්ඤං පියානි ච
ලද්ධා නරා න තප්පන්ති සො ලොභො න මයි වසෙ.

1868. එතස්මිං තෙ සුලපිතෙ පතිරූපෙ සුභාසිතෙ,
වරං කස්සප තෙ දම්මි යඤ්කිඤ්චි මනසිච්ඡසි.

1869. වරං චෙ මෙ අදො සක්ක සබ්බභූතානමිස්සර
ඛෙත්තං වත්ථුං හිරඤ්ඤඤ්ච ගවාස්සං[3] දාසපොරිසං.
යෙන ජාතෙන ජීයන්ති සො දොසො න මයි වසෙ.

1870. එතස්මිං තෙ සුලපිතෙ පතිරූපෙ සුභාසිතෙ,
වරං කස්සප තෙ දම්මි යං කිඤ්චි මනසිච්ඡසි.

1871. වරං චෙ මෙ අදො සක්ක සබ්බභූතානමිස්සර,
බාලං න පස්සෙ න සුණෙ න ච බාලෙන සංවසෙ
බාලෙන අල්ලාපසල්ලාපං න කරෙ න ච රොචයෙ.

---

1. පසංසිත්වාන - සයා.
2. මාලාවිලෙපනං අභිහරිත්වා - මජ්සං, සයා.
3. ගවස්සං - මජ්සං.

1862. නානාවිධ තූර්යයන් වාදනය කරනු ලබද්දී සුවඳැති මල් ද විලෙවුන් ද ගෙන්වා බෝධිය පුද පවුරෙකින් පිරිකෙව් කැරැවී ය.

1863. කලිඟු රජ තෙම ගැල් සැටදහසක් මල් රැස් කැරැවී ය. උතුම් බෝමැඩ මලින් පිදී.

6. කාලිංගබොධි ජාතක යි.

1864. භූතාධිපති ශක්‍ර තෙම, අකිත්ති තවුසා දැක තවුසාණෙනි, ග්‍රීෂ්ම කාලයෙහි හුදෙකලා ව කවර සම්පතක් පතා තපස් රක්නෙහි දැ යි ඇසී ය.

1865. ශක්‍රය, පුනර්භවය දුකෙකි, ශරීර භෙදනය (මරණය) දුකෙකි, සම්මොහ මරණය දුකෙකි, එහෙයින් තපස් රකිමි යි කීය.

1866. කාශ්‍යපය, තොප කී මනා සුභාෂිතය නිසා තොපට වරයක් දෙමි. (ඔබ) යම් වරයක් කැමැත්තෙහි ද (එය ගන්නේ මැනැවි).

1867. භූතාධිපති ශක්‍රය, ඉදින් මට වරයක් දෙවු නම්, 'පුතුන්, බිරියන්, ධන ධාන්‍ය හා අනෙක් ප්‍රිය වස්තූන් ලැබැ ද සෑහීමකට පත් නො වන ලොභය මට නූපදීවා' යන මේ වරය කැමැත්තෙමි (යි කීය.)

1868. කාශ්‍යපය, තොප කී මේ මනා සුභාෂිතය නිසා තොපට වරයක් දෙමි. තෙපි යම් වරයක් කැමැත්තහු ද (එය ගන්නේ මැනැවි.)

1869. භූතාධිපති ශක්‍රය, ඉදින් මට වරයක් දෙවු නම්, 'කෙත්, වතු, රන්. ගවයන්, දසයන්, කම්කරු පුරුෂයන් යන මොවුන් නිසා හටගත් කොපයෙන් සිය පිරිහීම වේ ද ඒ ක්‍රොධය මට නූපදීවා' යන මේ වරය කැමැත්තෙමි (යි කීය.)

1870. කාශ්‍යපය, තොප කී මේ මනා සුභාෂිතය නිසා තොපට වරයක් දෙමි. (ඔබ) යම් වරයක් කැමැත්තවු ද (එය ගන්නේ මැනැවි.)

1871. භූතාධිපති ශක්‍රය, ඉදින් මට වරයක් දෙවු නම්, 'බාලයකු නො දකීවා, ඔහු ගැන අසන්නට නො ලැබේවා, බාලයකු සමග එක් ව වාසයක් නො ලැබේවා, බාලයන් හා ප්‍රිය බස් (හෝ) බණන්නට නො ලැබේවා, එය රිසි නො වේවා, (යි කීය.)

1872. කිංනු තෙ අකරං බාලො වද කස්සප කාරණං,
කෙන කස්සප බාලස්ස දස්සනං නාභිකඞ්ඛසි.

1873. අනයං නයති දුම්මෙධො අධුරායං නියුඤ්ජති,
දුන්නයො සෙය්‍යසො හොති සම්මාවුත්තො පකුප්පති
විනයං සො න ජානාති සාධු තස්ස අදස්සනං.

1874. එතස්මිං තෙ සුලපිතෙ පතිරූපෙ සුභාසිතෙ,
වරං කස්සප තෙ දම්මි යං කිඤ්චි මනසිච්ඡසි.

1875. වරං චෙ මෙ අදෝ සක්ක සබ්බභූතානමිස්සර,
ධීරං පස්සෙ සුණෙ ධීරං ධීරෙන සහ සංවසෙ.
ධීරෙන අල්ලාපසල්ලාපං තං කරෙ තං ච රොචයෙ.

1876. කිංනු තෙ අකරං ධීරො වද කස්සප කාරණං,
කෙන කස්සප ධීරස්ස දස්සනං අභිකඞ්ඛසි.

1877. නයං නයති මෙධාවී අධුරායං න යුඤ්ජති,
සුනයො සෙය්‍යසො හොති සම්මා වුත්තො න කුප්පති
විනයං සො පජානාති සාධු තෙන සමාගමො.

1878. එතස්මිං තෙ සුලපිතෙ පතිරූපෙ සුභාසිතෙ,
වරං කස්සප තෙ දම්මි යං කිඤ්චි මනසිච්ඡසි.

1879. වරං චෙ මෙ අදෝ සක්ක සබ්බභූතානමිස්සර,
තතො රත්‍යා විවසනෙ[1] සුරියස්සුග්ගමනං පති
දිබ්බා භක්ඛා පාතුභවෙය්‍යුං සීලවන්තො ච යාචකා.

1880. දදතො ච මෙ න ඛීයෙථ දත්වා නානුතපෙය්‍යහං,
දදං චිත්තං පසාදෙය්‍යං එතං සක්ක වරං වරෙ.

1881. එතස්මිං තෙ සුලපිතෙ පතිරූපෙ සුභාසිතෙ,
වරං කස්සප තෙ දම්මි යං කිඤ්චි මනසිච්ඡසි.

1882. වරං චෙ මෙ අදෝ සක්ක සබ්බභූතානමිස්සර,
න මං පුන උපෙය්‍යාසි එතං සක්ක වරං වරෙ.

1. විවසානෙ – මජ්සං.

1872. කාශ්‍යපය, බාලයා තොපට කුමක් කෙළේ ද කාශ්‍යපය, බාලයා දැකීම නො රුස්නේ කවර කරුණක් නිසා ද? ඒ හෙතුව මට කියව.

1873. බාලයා (ආශ්‍රිතයන්) අනභිවෘද්ධියට පමුණුවයි. අකට යුතු දෙයෙහි යොදයි. උපිළිවෙළ උසස් සේ ගනී. ළෙන්ගතුව කී දෙයිනු දු තදින් කිපෙයි. ආචාර විනය නො දනි යි. එ හෙයින් ඔහුගේ දසුන නො මැනැවි.

1874. කාශ්‍යපය, තොප කී මේ මනා සුභාෂිතය නිසා තොපට වරයක් දෙමි. (තෙපි) යම් වරයක් කැමැත්තවු ද (එය ගන්නේ මැනැවි.)

1875. භූතාධිපති ශක්‍රය, ඉදින් මට වරයක් දෙවු නම් නැණවතා දකිම්වා, නැණවතා ගැන අසම්වා, නැණවතා හා එක් වැ වෙසෙම්වා, නැණවතා හා ප්‍රිය බස් බෙණෙම්වා, එය රිසි වෙම්වා, (යි කීය.)

1876. කාශ්‍යපය, නැණවතා තොපට කුමක් කෙළේ ද? කාශ්‍යපය, නැණවතා දැකීම රුස්නේ කවර කරුණක් නිසා ද? ඒ හෙතුව මට කියව.

1877. නැණවතා (ආශ්‍රිතයන්) අභිවෘද්ධියට පමුණුවයි. කටයුතු දෙයෙහි යොදවයි. මනා පිළිවෙළ උසස් සේ ගනී. ළෙන්ගතුව කී දෙයින් නො කිපෙයි. ආචාර විනය දනි යි. එ හෙයින් ඔහුගේ එක්වීම මනා ය.

1878. කාශ්‍යපය, තොප කී මේ මනා සුභාෂිතය නිසා තොපට වරයක් දෙමි. (ඔබ) යම් වරයක් කැමැත්තෝ ද (එය ගන්නේ මැනැවි.)

1879. භූතාධිපති ශක්‍රය, ඉදින් මට වරයක් දෙවු නම්, රාත්‍රිය ගෙවී ගොස් සූර්යොදය වේලෙහි දිව බොජුන් පහළ වේවා, එය පිළිගන්නට සිල්වත් පිළිගාවෝ පැමිණෙත්වා.

1880. මා දෙන්නා වූ දන වස්තුව අඩු නො වේවා. දනය දී පසුව නො තැවෙම්වා. දෙමිනු දු සිත පහදවම්වා. සක් දෙවිඳුනි මේ වරය ඉල්ලමි.

1881. කාශ්‍යපය, තොප කී මේ මනා සුභාෂිතය නිසා තොපට වරයක් දෙමි. (ඔබ) යම් වරයක් කැමැත්තෝ ද (එය ගන්නේ මැනැවි.)

1882. භූතාධිපති ශක්‍රය, ඉදින් මට වරයක් දෙවු නම්, තෙපි යළිත් මා වෙතැ නො පැමිණෙවු. ශක්‍රය මේ වරය ඉල්ලමි.

1883. බහූහි වත්තචරියාහි නරා ච අථ නාරියො,
දස්සනං අභිකඞ්ඛන්ති කින්නු මෙ දස්සනෙ භයං.

1884. තං තාදිසං දෙවවණ්ණං සබ්බකාමසමිද්ධිනං,
දිස්වා තපො පමජ්ජෙය්‍යං[1] එතං තෙ දස්සනෙ භයන්ති.

7. අකිත්තිජාතකං[2].

1885. අහමෙව දුබ්භාසිතං භාසි බාලො
භෙකො ච අරඤ්ඤෙ අභිමව්හයානො[3],
තක්කාරියෙ සොබ්භමිමං[4] පතාමි
න කිරෙව සාධු අතිවෙලභාණී.

1886. පප්පොති මච්චො අතිවෙලභාණී
බන්ධං වධං සොකපරිද්දවඤ්ච,
අත්තානං යෙව[5] ගරහාසි එත්තො[6]
ආචෙර යං තං නිඛණන්ති[7] සොබ්භෙ.

1887. කිමෙවාහං තුණ්ඩිල මනුපුච්ඡිං[8]
කරෙය්‍ය[9] සං භාතරං කාළිකායං[10],
නග්ගොවහං වත්ථයුගඤ්ච ජීනො
අයම්පි අත්ථො බහුතාදිසොව.

1888. යො යුජ්ඣමානානං අයුජ්ඣමානො
මෙණ්ඩන්තරං අච්චුපතී කුලිඞ්ගො,
සො පිංසිතො මෙණ්ඩසිරෙහි තත්ථ
අයම්පි අත්ථො බහුතාදිසොව.

1889. චතුරො ජනා පොත්ථකං අග්ගහෙසුං
එකඤ්ච පොසං අනුරක්ඛමානා
සබ්බෙව තෙ භින්නසිරා සයිංසු
අයම්පි අත්ථො බහුතාදිසොව.

1890. අජා යථා වෙළුගුම්බස්මිං බද්ධා
අවෙක්ඛිපන්තී අසිමජ්ඣගඤ්ජි[11],
තෙනෙව තස්සා ගලකාවකන්තං[12]
අයම්පි අත්ථො බහුතාදිසොව.

---

1. පමජ්ජෙය්‍ය – මජසං.
2. අකත්ති ජාතකං – මජසං.
3. සයවහායමානො – මජසං.
4. සොබ්භම්හි අහං – මජසං.
5. අත්තානමෙව – මජසං.
6. එත්ථ – මජසං.
7. ආචරියන්තං නිඛනන්ති – මජසං., ස්‍යා.
8. මානුපුච්ඡෙය්‍යං – වි., මජසං.
9. කරෙය්‍යාසං – ස්‍යා, කාමෙ – මජසං.
10. කලිකාය – මජසං, කාලිකාය – ස්‍යා.
11. ආසිකජ්ඣගඤ්ජං – වි., මජසං, ස්‍යා.
12. ගලකං විකන්තා – ස්‍යා, විකන්තුං – මජසං, (ශීලයා කන්තුං – මජසං.)

1883. බොහෝ ව්‍රතයන් පුරා පුරුෂයෝ ද ස්ත්‍රීහු ද මගේ දසුන කැමැති වෙති. මගේ දැකීම නිසා ඔබට කවර බයක් ඇති වේ ද?

1884. එබඳු දිව්‍යවර්ණ සහිත සියලු සැපතින් පිරුණු තොප දැක තවුස්දම් රක්මෙහි පමා වෙමි. එහෙයින් තොප දකින්නට බය වෙමි.

7. අකිත්ති ජාතකය.

1885. තක්කාරිය, වනයෙහි සපුන් කැඳවන මැඩියකු සේ නාද කරන අඥානයකු වූ මම වැරැදි ලෙස බිණීමි. (එහෙයින්) මේ වළෙහි වැටෙමි, පමණ ඉක්මවා බෙණෙන පුද්ගලයා නුසුදුසු ය.

1886. ඇදුරුතුමනි, පමණ ඉක්මවා බෙණෙන පුද්ගලයා සිරගෙයි වැටීමට, හිංසා පීඩා ලැබීමට, දුක්වීමට හා වැළැපීමට පැමිණේ. යම් හෙයකින් (ඔබ) මේ වළෙහි තමා හෙළත් ද, ඔබ තමාට ම අපහාස කරගත්තෝ ය.

1887. සිය සොහොයුරු තුණ්ඩිලට පිළී නො දෙනුයේ කිම්ද යි මම කාළිය විතාළෙමි. එ හෙයින් පිළී යුග්මය ද නැති වැ මම නග්න වීමි. මේ කරුණ ද බොහෝ සෙයින් ඊට සමාන යැ.

1888. සටන් වැදුණු බැටළුවන් සටනින් මුදන්නට උන් අතරට ගිය ගේ කුරුල්ලා බැටළුඔළු පහර ලැබ තැළී ගියේ ය. මේ කරුණ ද බොහෝ සෙයින් ඊට සමාන යැ.

1889. සතර දෙනෙක් සන රෙද්දක කොන් සතර අල්ලා මිනිසකු රකිනුවෝ හිස් පැළී ඔවුහු හැම හොත්තාහ. මේ කරුණ ද බොහෝ සෙයින් ඊට සමාන ය.

1890. හුණ ලැහැබෙක බඳින ලද එළදෙන කෙළි දෙළෙන් පා ගසන්නී සහවා තැබූ අවියක් පෙරළී ය. එම අවියෙන් ම ඇගේ ගෙල කපාලූ ය. මේ කරුණ ද බොහෝ සෙයින් ඊට සමාන ය.

1891\. නයිමෙ[1] දෙවා නපි[2] ගන්ධබ්බපුත්තා,
මිගා ඉමෙ අත්ථවසාගතා ඉමෙ[3]
එකඤ්ච නං සායමාසෙ පචන්තු.
එකඤ්ච පුන පාතරාසෙ[4] පචන්තු.

1892\. සතං සහස්සානං දුබ්භාසිතානං[5]
කලම්පි නාග්ඝන්ති සුභාසිතස්ස,
දුබ්භාසිතං සඞ්කමානො කිලෙසො
තස්මා තුණ්හී කිම්පුරිසො න බාල්‍යා.

1893\. යා මෙසා ව්‍යාකාසි පමුඤ්චථෙතං
ගිරිඤ්ච[6] නං හිමවන්තං නයන්තු,
ඉමඤ්ච ඛො දෙන්තු මහානසාය
පාතොව නං පාතරාසෙ පචන්තු.

1894\. පජ්ජුන්නනාථා පසවො පසූනාථා අයං පජා,
ත්වං නාථොසි මහාරාජ අම්හනාථා මම හරියා[7],
ද්වින්නමඤ්ඤතරං ඤත්වා මුත්තො ගච්ඡෙය්‍ය පබ්බතං.

1895\. න වෙ නින්දා සුපරිවජ්ජයෙථ
නානා ජනා සෙවිතබ්බා ජනින්ද,
යෙනෙව එකො ලභතෙ පසංසං
තෙනෙව අඤ්ඤො ලභතෙ නින්දිතාරං.

1896\. සබ්බො ලොකො පරචිත්තෙන අචිත්තො[8]
සබ්බො ලොකො චිත්තවාසම්හි චිත්තෙ,
පච්චෙකචිත්තා පුථුසබ්බසත්තා
කස්සීධ චිත්තස්ස වසෙන වත්තති.

1897\. තුණ්හී අහූ කිම්පුරිසො සභරියො
යොදානි ව්‍යාකාසි භයස්ස භීතො,
සොදානි මුත්තො සුඛිතො අරොගො
වාචා කිරෙවත්ථවතී නරානන්ති.

8. තක්කාරියජාතකං.

---

1. ඉමෙන – මජසං.
2. නාපි – සයා, මජසං.
3. අත්ථවසංගතා මෙ – මජසං.
4. පුනප්පාතරාසෙ – මජසං., සයා.
5. සතසහස්සානි දුබ්භාසිතානි – මජසං.
6. ගිරිවරං – මජසං.
7. නාථොහං හරියාය මෙ – මජසං.
8. අතිචිත්තො – මජසං.

1891. මොවුහු දෙවියෝ නො වෙති. ගන්ධර්ව පුත්‍රයෝ නො වෙති. මොවුහු මෘගයෝ වෙති. වස්තු ලෝභයෙන් මොවුහු මා වෙත ගෙනෙන ලද හ. එකකු සවසට පිසත්වා. එකකු උදේට පිසත්වා.

1892. දුබැසි බස් ලක්‍ෂයක්, සුබැසි බසක (සොළොස් වැනි) කලාව තරමවත් නො අගනේ ය. දුබස් බිණුමෙන් කිලිටි වේ යන සැකයෙන් කිඳුරා නිහඬ විය. මෝඩ නිසා නො වේ.

1893. මා හා කතා කළා වූ මැය මුදවූ. ඇය හිමවත් පව්වට පමුණුවත්වා. මොහු මුළුතැන් ගෙට දෙත්වා. ඔහු උදසන්හි උදේ ආහාරයට පිසත්වා.

1894. රජතුමනි, තෘණභක්‍ෂක චතුස්පදිකයන්ට වර්ෂාව පිහිට වෙයි. මනුෂ්‍ය ප්‍රජාවට සිව්පාවෝ පිහිට වෙති. මම තොප පිහිට කොට ඇත්තෙමි. මගේ බිරිඳ මා පිහිට කොට ඇත්තිය. අපගෙන් එකකු මළ පසු මරණයෙන් මිදුණු අනිකා පර්වතයට යන්නේ ය.

1895. රජතුමනි, නින්දුව පහසුවෙන් ඉවත් කළ නො හැකිය. නොයෙක් දේ රුස්නා ජනයා ඇසුරු කළ යුතු වේ. යමක් නිසා එකෙක් ප්‍රශංසා ලබා ද එයින් ම අනෙකා නින්ද ලබයි.

1896. රජතුමනි, හැම ලෝ වැසියා මෙරමා සිත් ඉක්ම සිටි සිත් ඇත්තේ ය. හැම ලෝ වැසියා හීනොත්කෘෂ්ට විසින් සිය සිත්හි සිත් ඇතියේ නම. හැම සත්ත්වයෝ වෙනස් වෙනස් සිත් ඇතියෝ ය. ඔවුනතුරෙහි කවර එකක්හුගේ සිත් වශයෙන් පවතී ද?

1897. බිරිඳ සහිත කිඳුරා තුෂ්ණීම්භූත වැ මරණ බය නිසා දූන් බිණීය. දූන් හේ මරණින් මිදුණේ ය. සුවපත් ය. නීරෝග ය. සත්ත්වයන්ට වචනය ම හිත සැප ගෙන දේ.

8. තක්කාරිය ජාතක යි.

1898. කස්ස ගාමවරං දම්මි නාරියො ච අලඞ්කතා,
කො මෙ තං මිගමක්ඛාති මිගානං මිගමුත්තමං.

1899. මය්හං ගාමවරං දෙහි නාරියො ච අලඞ්කතා,
අහං තෙ මිගමක්ඛිස්සං මිගානං මිගමුත්තමං.

1900. එතස්මිං වනසණ්ඩස්මිං අම්බා සාලා ච පුප්ඵිතා.
ඉන්දගොපකසංඡන්නා එත්ථෙසො තිට්ඨති මිගො.

1901. ධනුං අද්දෙජ්ඣං[1] කත්වාන උසුං සන්ධායුපාගමි[2],
මිගො ච දිස්වා රාජානං දූරතො අජ්ඣභාසථ.

1902. ආගමෙහි මහාරාජ මා මං විජ්ඣි රථෙසභ.
කො නු තෙ ඉදමක්ඛාසි[3] එත්ථෙසො තිට්ඨති මිගො.

1903. එස පාපචරො පොසො සම්ම තිට්ඨති ආරකා,
සො හි මෙ ඉදමක්ඛාසි එත්ථෙසො තිට්ඨති මිගො.

1904. සච්චං කිරෙව මාහංසු නරා එකච්චියා ඉධ,
කට්ඨං විපලාවිතං[4] සෙය්‍යො න ත්වෙවෙකච්චියො නරො.

1905. කින්නු රුරූ ගරහසි මිගානං
කිං පක්ඛීනං කිං පන මානුසානං,
භයං හි මං වින්දති නප්පරූපං
සුත්වාන තං මානුසිං භාසමානං.

1906. යමුද්ධරිං වහනෙ[5] වුය්හමානං
මහොදකෙ සලිලෙ සීඝසොතෙ,
තතො නිදානං භයමාගතං මම
දුක්ඛා හවෙ රාජ අසබ්භිසඞ්ගමො.

1907. සොහං චතුප්පත්තමිදං විහඞ්ගමං
තනුච්ඡිදං හදයෙ ඔස්සජාමි,
හනාමි මිත්තද්දුමකිච්චකාරිං
යො තාදිසං කම්මකතං න ජානෙ.

1. ධනුං සරජ්ජුං – මජසං.
2. සන්නය්හුපාගමිං – මජසං.
3. ඉධං – මජසං.
4. කට්ඨං නිපාවතං – සයා, කට්ඨ නිපලවිතං – මජසං.
5. වාහනෙ – මජසං, සයා.

1898. ගම්වර හා සැරසුණ ස්ත්‍රීන් කාහට දෙම් ද? කවරෙක් මුවන්ගෙන් උතුම් වූ රන්වන් මුවා (ගැන) කියන්නේ ද?

1899. ගම්වර ද සැරසුණු ස්ත්‍රීන් ද මට දෙව. මම තොපට මුවන්ගෙන් උතුම් වූ රන්වන් මුවා (ගැන) කියමි.

1900. මේ වන ලැහැබෙහි පිපුණ අඹගස් ද සල් ගස් ද ඇත. රතිඳුගොව් පැහැය ඇති තෘණ ගැවසුණ මේ බිමෙහි ඒ රන්වන් මුවා සිටී.

1901. රජතෙම දුනුදිය නගා දුන්න සරහා ගෙන පැමිණියේය. මුවා ද එලෙස එන රජු දැක දුර සිට මෙලෙස කීය.

1902. රජතුමනි, බලාපොරොත්තු වනු මැනැවි. මා නො විදින්නේ මැනැවි. ඒ රන්වන් මුවා මෙහි සිටීය යි තොපට කවරෙක් කීයේ ද?

1903. මිත්‍රය, ලාමක ගති ඇති ඒ පුරුෂයා ඈත සිටියි. ඒ රන්වන් මුවා මෙහි සිටී යන පුවත හේ මට කීය.

1904. මේ ලෝකයේ ඇතැම් මනුෂ්‍යයෝ "දියෙහි පා වී යන වියළි දඬුකඩ ගොඩ ලීම මැනැවි. (එහෙත්) ඇතමකු ගොඩ ගැනීම නො මනාය යි සත්‍යයක් ම බිණූහු.''

1905. රුරු මෘගය, කිමෙක් ද, තෙපි මෘගයන්ට නින්ද කරන්නහු ද, පක්ෂීන්ට නින්ද කරන්නහු ද, මනුෂ්‍යයනට නින්ද කරන්නහු ද? මිනිස් බසින් බෙණෙන ඒ බස් අසා මට මහත් බියක් උපදී,

1906. වේගයෙන් ගලන මහ දිය කඳෙහි පා වී යන යමකු ගොඩට නගාලීම් ද ඒ හේතුවෙන් මට බිය පැමිණියේ ය. රජතුමනි, අසත්පුරුෂයන් හා එක්වීම ඒකාන්තයෙන් දුකෙකි.

1907. ඒ මම පියාපත් සතරක් තිබෙන, අහසින් යා හැකි, සිරුර සිඳ ලන, මේ හීය ඔහුගේ හදවතට යවන්නෙමි. යමෙක් කළ උපකාර නො දනී ද එ බඳු මිත්‍රද්‍රෝහියා නසමි.

1908. ධීරස්ස බාලස්ස හවෙ ජනින්ද
සන්තො වධං නප්පසංසන්ති ජාතු,
කාමං සරං ගච්ඡතු පාපධම්මො
යක්ඛස්ස හත්ථං තදෙතස්ස දෙහි
අහඤ්ච තෙ කාමකරො භවාමි.

1909. අද්ධා රුරු අඤ්ඤතරො සතං සො[1]
යො දුබ්භතො මානුසස්ස න දුබ්භි,[2]
කාමං සරං ගච්ඡතු පාපධම්මො
යක්ඛස්ස හත්ථං තදෙතස්ස දම්මි
අහඤ්ච තෙ කාමචාරං[3] දදමි.

1910. සුවිජානං සිගාලානං සකුන්තානඤ්ච වස්සිතං,
මනුස්සවස්සිතං රාජ දුබ්බිජානතරං තතො.

1911. අපි චෙ මඤ්ඤති පොසො ඤාති මිත්තො සඛාති වා,
යො පුබ්බෙ සුමනො හුත්වා පච්ඡා සම්පජ්ජතෙ දිසො.

1912. සමාගතා ජානපදා[4] නෙගමා ච සමාගතා,
මිගා[5] ධඤ්ඤානි ඛාදන්ති තං දෙවො පටිසෙධතු[6].

1913. කාමං ජනපදෙ[7] මාසි රට්ඨංචාපි විනස්සතු,
නත්වෙවාහං රුරුං දුබ්භෙ දත්වා අභයදක්ඛිණං.

1914. මා මෙ ජනපදෙ ආසි රට්ඨඤ්චාපි විනස්සතු,
නත්වෙව[8] මිග රාජස්ස වරං දත්වා මුසා භණෙති.

9. රුරුමිගජාතකං.

1915. ආසිංසෙථෙව[9] පුරිසො න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො,
පස්සාමි වොහං අත්තානං යථා ඉච්ඡිං තථා අහු.

1916. ආසිංසෙථෙව පුරිසො න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො,
පස්සාමි වොහං අත්තානං උදකා ථලමුබ්භතං.

1917. වායමෙථෙව[10] පුරිසො න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො,
පස්සාමි වොහං අත්තානං යථා ඉච්ඡිං තථා අහු.

---

1. සතං සො – මජසං.
2. දූභතො – වි., දුබ්භිතො – සයා.
3. ගාමවරං – මජසං, සයා.
4. ජනපපද – මජසං.
5. මිගාසස්සානි – මජසං.
6. පටිසෙධෙතු – මජසං.
7. ජනපපදෙ – මජසං.
8. නත්වෙවාහං – වි.
9. ආසිසෙථෙව – මජසං.
10. වායාමෙථෙව – මජසං.

1908. ජනපතිතුමනි, පණ්ඩිතයාගේ ද මෝඩයාගේ ද විනාශය සත්පුරුෂයෝ ඒකාන්තයෙන් ප්‍රශංසා නො කෙරෙති. පාප පැවැතුම් ඇති (හේ) කැමැති පරිදි ගෙදර යේවා. යමක් මොහුට දෙමි යි කීයේ ද එයත් ඔහුට දෙන්නේ මැනැවි. මම ද තොප කැමැති පරිදි කරන්නෙක් වෙමි.

1909. ද්‍රෝහි මිනිසාට යමෙක් ද්‍රෝහ නො කෙළේ ද මේ රුරු මෘගයා ඒකාන්තයෙන් සත්පුරුෂයන්ගෙන් කෙනෙකි. පාප පැවැතුම් ඇති (හේ) කැමැති පරිදි ගෙදර යේවා. 'යමක් මොහුට දෙමි' යි කීයෙමි ද එයත් මොහුට දෙමි. මම ද තොපට කැමැති පරිදි වාසය කරන්නට වර දෙමි.

1910. රජතුමනි, සිවුපුන්ගේත් පක්ෂීන්ගේත් නාදය පහසුවෙන් තේරුම් ගත හැකිය. මනුෂ්‍යයන්ගේ නාදය තේරුම් ගැනීම ඊට වඩා අපහසු ය.

1911. ඉදින් පුරුෂයෙක් (මේ) නෑයෙක, මිතුරෙක, යහළුවෙක කියා දනී ද, හේ පළමු සතුටු සිතැති වැ පසු වැ සතුරු වන්නේ ය.

1912. රැස් වූ දනවු වැසියෝ ද නියම්ගම් වැසියෝ ද "රජතුමනි, මුවෝ ධාන්‍ය කන්නාහ. රජතුමා, එය වළකනු සේක්වා" යි කීහ.

1913. ජනපදය ඒකාන්තයෙන් වැනැසේවා. රට ද වැනැසේවා. රුරු මුවාට අභය දානය දී (යළිත්) මම ද්‍රොහ නො කරන්නෙමි.

1914. මගේ ජනපදය වැනැසේවා. රට ද වැනැසේවා. මම මුවරජහට වර දී බොරු නො කියමි.

9. රුරු මෘග ජාතක යි.

1915. නැණවත් පුරුෂයා බලාපොරොත්තු (ඇත්තෙක්) වන්නේ ම ය. නො කලකිරෙන්නේය. මම යම් සේ කැමැති වීම් ද එසේ සිදු විය. මම තමා දකිමි.

1916. නැණවත් පුරුෂයා බලාපොරොත්තු (ඇත්තෙක්) වන්නේ ම ය. නො කලකිරෙන්නේ ය. දියෙන් ගොඩට පැමිණි මම තමා දකිමි.

1917. නැණවත් පුරුෂයා වෑයම් කරන්නේ ම ය. නො කල කිරෙන්නේ ය. මම යම් සේ කැමැති වීම් ද එසේ සිදු විය. මම තමා දකිමි.

1918. වායමෙථෙව පුරිසො න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො,
පස්සාමි වොහං අත්තානං උදකා ථලමුබ්භතං.

1919. දුක්ඛූපනීතොපි නරො සපඤ්ඤො
ආසං න ඡින්දෙය්‍ය සුඛාගමාය,
බහූහි ඵස්සා අහිතා හිතා ච
අවිතක්කිතා මච්චුමුපබ්බජන්ති.

1920. අචින්තිතම්පි භවති චින්තිතම්පි විනස්සති,
න හි චින්තාමයා භොගා ඉත්ථියා පුරිසස්ස වා.

1921. සරභං ගිරිදුග්ගස්මිං යං ත්වං අනුසරී පුරෙ,
අලීනචිත්තස්ස තුවං වික්කන්තමනුජීවසි.

1922. යො තං විදුග්ගා නරකා සමුද්ධරි
සිලාය යොග්ගං සරභො කරිත්වා,
දුක්ඛූපනීතං මච්චුමුඛා පමොචයි
අලීනචිත්තං තමිගං වදෙසි.

1923. තුවං නු තත්ථෙව තද අහොසි
උදහු තෙ කොචි නං එතදක්ඛා,
විවත්තච්ඡද්දො[1] නුසි සබ්බදස්සී
ඤාණන්නු තෙ බ්‍රාහ්මණ භිංසරූපං.

1924. න චෙවහං තත්ථ තද අහොසිං
න චාපි මෙ කොචි නං එතදක්ඛා,
ගාථාපදානඤ්ච සුභාසිතානං
අත්ථං තද නෙන්ති ජනින්ද ධීරා.

1925. ආදය පත්තිං පරවිරියඝාතිං
චාපෙ සරං කිං විචිකිච්ඡසෙ තුවං,
නුණ්ණො[2] සරො සරභං හන්තු ඛිප්පං
අන්නං හි එතං වරපඤ්ඤ රඤ්ඤො.

1926. අද්ධා පජානාමි අහම්පි එතං
අන්නං මිගො බ්‍රාහ්මණ ඛත්තියස්ස,
පුබ්බෙ කතඤ්ච අපචායමානො
තස්මා මිගං සරභං නො හනාමි.

---

1. විවටාච්ඡෙදෙ – මජ්ඣ, විවට්ටච්ඡදෙ – සයා.
2. නුන්නො – වි.

1918. නැණවත් පුරුෂයා වෑයම් කරන්නේ ම ය. නො කල කිරෙන්නේ ය. දියෙන් ගොඩට පැමිණි මම තමා දකිමි.

1919. දුකට පැමිණියේ නමුදු නැණවත් පුරුෂයා සැපතට පැමිණීමේ රිස්ස නො සිඳින්නේ ය. නො සිතූ හිතාහිත ස්පර්ශයෝ සත්ත්වයා වෙත පැමිණෙති.

1920. නො සිතූ දෑය සිද්ධ වෙයි. සිතූ දෑය නො සිද්ධ වෙයි. ස්ත්‍රියකට හෝ පුරුෂයකුට සිතූ ලෙස වස්තුව නො ලැබේ.

1921. පෙර ඔබ යම් ගිරි දුර්ගයෙක සරභ මුවකු ලුහුබැඳ ගියෝ ද, කරුණා සිතැති උගේ වෑයම නිසා තෙපි ජීවත් වව.

1922. යම් සරභ මුවෙක් ගලෙන් උපක්‍රම යොදා, ගොඩ පැමිණිය නො හැකි නරාවළින් තොප ගොඩ ගත්තේ ද දුකට පත් වැ සිටී තොප මරු මුවෙන් මිදී ද, ධෛර්ය සම්පන්න සිතැති ඒ මුවාගේ ගුණ කීහු ය.

1923. බමුණ, තෙපි එද එහි සිටියහු ද? නැතහොත් කිසිවෙක් එය තොපට කීවේ ද? (නැතහොත්) දුරු කළ කෙලෙස් ඇති සර්වඥ වූහු ද? තොපගේ නුවණ බලවත් පැවැතුම් ඇත්තේ ය.

1924. ජනපති තුමනි, මම එද එහි නො වීමි. කිසිවෙකුත් මට එය නො කීය. (එහෙත්) මනා කොට කී ගාථා පදයන්ගේ අර්ථය නුවණැත්තෝ සොයති.

1925. අන්‍යයන්ගේ වෑයම නසන ඊතලය දුන්නෙහි බහාගෙන ඔබ සැක කරන්නේ කිම? ඊය විද වහා සරභයා නසත්වා. එය උතුම් පැණැති රජුගේ ආහාර යි.

1926. බමුණ, මුවා ක්ෂත්‍රියයාගේ ආහාර යි. එය මම ද ඒකාන්තයෙන් දනිමි. පෙර කළගුණය පුදන්නෙමි, මම සරභමුවා නො මරමි.

1927. නෙසො මිගො මහාරාජ අසුරෙසො[1] දිසම්පති,
එතං හන්ත්වා මනුස්සින්ද භවස්සු අමරාධිපො.

1928. සචෙච රාජ[2] විචිකිච්ඡසෙ තුවං
හන්තුං මිගං සරභං සහායකං මෙ
සපුත්තදාරො නරවීරියසෙට්ඨ[3]
ගන්තා තුවං වෙතරණිං[4] යමස්ස.

1929. කාමං අහං ජානපදා ච සබ්බෙ
පුත්තා ච දාරා ච සහායසඞ්ඝා,
ගච්ඡෙමු තං වෙතරණිං යමස්ස
නත්වෙව හඤ්ඤෙ[5] යො මමපාණදස්ස[6].

1930. අයං මිගො කිච්ඡගතස්ස මය්හං
එකස්ස කත්තා විවනස්මිං ඝොරෙ
තං තාදිසං පුබ්බකිච්චං සරන්තො
ජානං මහාබ්‍රහ්මෙ කථං හනෙය්‍යං.

1931. මිත්තාභිරාධී[7] චිරමෙව ජීව
රජ්ජං ඉමං ධම්මගුණෙ පසාස,[8]
නාරීගණෙහි පරිවාරයන්තො
මොදස්සු රට්ඨෙ තිදිවෙව වාසවො.

1932. අක්කොධනො නිච්චපසන්නචිත්තො
සබ්බාතිථීයාචයොගො භවිත්වා[9]
දත්වා ච භුත්වා ච යථානුභාවං
අනින්දිතො සග්ගමුපෙහි ඨානන්ති.

10. සරභමිගජාතකං.

තෙරසකනිපාතං නිට්ඨිතං.

තස්සුද්දානං:

වරකම්බ[10]කුට්ඨාරිසහංවරො
අථරක්ඛසම්හි දූතකපඤ්චකො
අථබොධි අකිත්තිසුතසාරිනා
අථරුරුමිගෙන පරොසරභොති.

---

1. අසුරො සො – වි.
2. රාජා – වි. මි.
3. නරවීරසෙට්ඨං – මජසං, සයා.
4. වෙතරණි – මජසං.
5. හඤ්ඤෙ – මජසං, සයා.
6. මම පාණ – මජසං.
7. මිත්තාභිධීරා – මජසං.
8. රජ්ජම්පිවස්ස පණපසංස – මජසං.
9. සබ්බාතිථී පාහුනකෙ කරිත්වා – සයා, සබ්බතිථී යාචයොගෙ විදිත්වා – මජසං.
10. වරමම්බ – සයා.

1927. දිශාධිපති රජතුමනි, මෙතෙම මුවෙක් නො වේ. මෙතෙම අසුරයා ය. නරදෙවුව, මොහු මරා ඔබ ශක්‍ර වන්නේ මනාය.

1928. රජතුමනි, මේ සරභයා මාගේ මිතුරා යයි (යන හැඟීම නිසා) නසන්නට සැක උපදවා ද (එහෙයින්) නරදෙවුව, අඹු දරුවන් සහිත තෙපි යමයාගේ වෙතරණී නම් නිරයට යන්නාහුය.

1929. බමුණ, මම ද දනවු වැසියෝ ද පුත්‍රයෝ ද භාර්යාවෝ ද මිතුරෝ ද යන හැමදෙන යමයාගේ වේතරණී නිරයට ඒකාන්තයෙන් යම්හ. (එහෙත්) යමෙක් මට පණ දුන්නේ ද හේ නො මැරිය යුතු ය.

1930. බමුණ, මේ මුවා මහවනයෙහි හුදෙකලා ව සිටි මට නරාවළෙන් ගොඩ එන්නට උපකාර කෙළේ ය. පෙර කළ ඒ උපකාර සිහි කරන්නෙම් දැන දැන ම් ඔහු කෙසේ නසම් ද?

1931. මිතුරන් සතුටු කරන ඔබ බොහෝ කල් වෙසෙත්වා. (දශ)රාජ ධර්මයෙහි පිහිටා රාජ්‍යානුශාසනා කෙරෙත්වා. ස්ත්‍රී සමූහයා පිරිවරා ගෙන වෙසෙන ශක්‍රයා මෙන් රටෙහි ප්‍රීතියෙන් වෙසෙත්වා.

1932. නො කිපෙන සතුටු සිතැති (ඔබ) අමුත්තන්ගේ යාච-නයට සුදුසු වෙත්වා. හැකි පමණින් දීමත් බිදීමත් කොට නින්ද රහිත වැ සැපතින් අග්‍රස්ථානය වන දෙව්ලොවට පැමි-ණෙත්වා.

10. සරභමිග ජාතක යි.

තෙරසක නිපාතය නිමියේ යි.

එහි උද්දනය:

අම්බජාතකය, කුඨාරි (වඩුදන) ජාතකය, ජවන හංස ජාතකය, චුල්ලනාරද ජාතකය, පස්වැනි දූත ජාතකය ද, යළි කාලිඞ්ග බොධි ජාතකය, අකිත්ති ජාතකය, තක්කාරිය ජාතකය, රුරුමිග ජාතකය හා සරභමිග ජාතකය දැයි (ජාතක දශය වේ.)

1933. සම්පන්නං සාලිකෙදරං සුවා භුඤ්ජන්ති කොසිය,
පටිවෙදෙමි තෙ බ්‍රහ්මෙ න නං[1] වාරෙතු මුස්සහෙ

1934. එකො ච තත්ථ සකුණො සො තෙසං[2] සබ්බසුන්දරො,
භුත්වා සාලිං යථාකාමං තුණ්ඩෙනාදාය ගච්ඡති.

1935. ඔඩ්ඩෙන්තු[3] වාළපාසානි යථා බජ්ඣෙථ සො දිජො,
ජීවඤ්ච නං ගහෙත්වාන ආනයෙථ මමන්තිකෙ.

1936. එතෙ භුත්වා පිවිත්වා ච පක්කමන්ති විහංගමා,
එකො බද්ධාසි පාසෙන කිං පාපං පකතම්මයා.

1937. 'උදරං නූන අඤ්ඤෙසං සුව අච්චොදරං තව,
භුත්වා සාලිං යථාකාමං තුණ්ඩෙනාදාය ගච්ඡසි.

1938. කොට්ඨන්නු තත්ථ පූරෙසි සුව වෙරන්නු තෙ මයා
පුට්ඨො මෙ සම්ම අක්ඛාහි කුහිං සාලිං නිධීයසි.

1939. න මෙ වෙරං තයා සද්ධිං කොට්ඨො මය්හං න විජ්ජති,
ඉණං මුඤ්චාමිණං දම්මි සම්පත්තො කොටිසිම්බලිං[4]
නිධිම්පි තත්ථ නිදහාමි එවං ජානාහි කොසිය.

1940. කීදිසං තෙ ඉණදානං ඉණමොක්ඛො ච කීදිසො,
නිධිං[5] නිධානං අක්ඛාහි අථ පාසා පමොක්ඛසි.

1941. අජාතපක්ඛා තරුණා පුත්තකා මය්හ[6] කොසිය,
තෙ මං භතා භරිස්සන්ති තස්මා තෙසං ඉණං දදෙ.

1942. මාතා පිතා ච මෙ වුද්ධා ජිණ්ණකා ගතයොබ්බනා,
තෙසං තුණ්ඩෙන හාතූන මුඤ්චෙ පුබ්බෙ කතං[7] ඉණං.

1943. අඤ්ඤෙපි තත්ථ සකුණා ඛීණපක්ඛා සුදුබ්බලා,
තෙසං පුඤ්ඤත්ථිකො දම්මි තං නිධිං ආහු පණ්ඩිතා.

---

1. නතෙ – මජසං., නතෙ – සයා.
2. යො තෙසං – මජසං, සයා,
3. උජ්ඣන්තු – මජසං, සයා.
4. කොටසිම්බලි – මජසං.
5. නිධිනිධාන මක්ඛාහි – මජසං.
6. මය්හං – මජසං.
7. පුබ්බකතං – වි., මජසං.

1933. කොසිය ගොත්හි උපන් බමුණ, ඇල් කෙත සම්පූර්ණයෙන් පැසී තිබේ. කෙත ගිරවු කති. එය වළකන්නට නො හැක්කෙමි. එය ඔබට දන්වමි.

1934. එහි ගිරවුන් අතර අංගොපාංග සම්පූර්ණ බැවින් සර්ව සුන්දර වූ ගිරවෙක් වෙයි. හේ රිසි සේ ඇල් වී රස විඳැ වී කරල් රැගෙන යයි.

1935. ඒ පක්ෂියා බැඳෙන පරිදි පුඩු අටවා තබත්වා. ජීව-ග්‍රහයෙන් ම ඔහු අල්ලා මා සමීපයට ගෙනෙව.

1936. මේ පක්ෂීහු වී බිඳැ පැන් බී ඉවත් වැ යති. හුදෙ-කලාව මම පුඩුවෙන් බැඳුනෙමි. මා කෙබඳු පාපයක් කරන ලද ද?

1937. ගිරා පොතකය, සෙසු ගිරවුන්ගේ බඩට වඩා තොපගේ බඩ ඉතා මහත් යයි සිතමි. රිසි සේ ඇල් වී කා තුඩෙනු දු ගෙන යන්නෙහිය.

1938. ගිරවාණෙනි, එහි කොටුගුලක් පුරවන්නෙහි ද? නැත-හොත් මා හා වෛරයක් පවති ද? මිතුර, විතාරන මට කිය. ඇල් වී කොහි තැන්පත් කරන්නෙහි ද?

1939. කොසිය බමුණ, තොප හා මාගේ වෛරයෙක් නැත. මට කොටුගුලෙකුත් නැත. ඉඹුල් රැකට පැමිණ ණයක් මුදමි. ණය ද දෙමි. එහි නිධානයක් ද නිදන් කරමි. (මෙය) මෙසේ දනුව.

1940. ගිරවාණෙනි, තොපගේ ණය දීම කෙබඳු ද? ණයෙන් මිදීම කෙබඳු ද? නිදන් කිරීම කෙබඳු ද? එකලැ තෙපි පුඩුවෙන් මිදෙන්නහුය.

1941. කොසිය බමුණ, පියාපත් නො සැදුණු මාගේ පුත්‍ර පැටවු සිටිති. මා විසින් පොෂණය කරනු ලැබූ ඔවුහු යළිත් මා පුස්නාහ. එ හෙයින් ඔවුනට ණය දෙමි.

1942. මගේ මවුපියෝ වෘද්ධයහ. ජරාවෙන් යුක්තහ. යොවුන් බව පහව ගොස් ඇත. තුඩින් ගෙන ගොස් (ඇල් වී කරල්) ඔවුනට දී මම පෙර ගත් ණය මුදමි.

1943. එහි ඉතා දුබල නැසුණ පියාපත් ඇති තවත් පක්ෂීහු වෙසෙති. පින් සඳහා ඔවුනටත් දෙමි. එය අනුගාමික නිධානය යි නුවණැත්තෝ කියති.

1944. එදිසං[1] මෙ ඉණදනං ඉණමොක්ඛො මෙ එදිසො,
නිධිං නිධානං අක්ඛාතං[2] එවං ජානාහි කොසිය.

1945. භද්දකො වතයං[3] පක්ඛී ද්විජො පරමධම්මිකො,
එකච්චෙසු මනුස්සෙසු අයං ධම්මො න විජ්ජති.

1946. භුඤ්ජ සාලිං යථාකාමං සහ සබ්බෙහි ඤාතිහි,
පුනාපි සුව පස්සෙමු පියං මෙ තව දස්සනං.

1947. භුත්තඤ්ච පීතඤ්ච තවස්සමම්හි
රතීච නො කොසිය තෙ සකාසෙ,
නික්ඛිත්තදණ්ඩෙසු දදහි දනං,
ජිණ්ණෙච මාතාපිතරො භරස්සු.

1948. ලක්ඛී වත මෙ උදපාදි අජ්ජ
යො අද්දසාසිං[4] පවරං දිජානං,
සුවස්ස සුත්වාන සුභාසිතානි
කාහාමි පුඤ්ඤානි අනප්පකානි.

1949. සො කොසියො අත්තමනො උදග්ගො
අන්නඤ්ච පානඤ්චභිසඞ්ඛරිත්වා[5],
අන්නෙන පානෙන පසන්නචිත්තො
සන්තප්පයී සමණෙ බ්‍රාහ්මණෙචාති.

1. සාලිකෙදරජාතකං[6].

1950. උපනීයතිදං මඤ්ඤෙ
චන්දෙ ලොහිතමදෙන මජ්ජාමි,
විජහාමි ජීවිතං පාණා
මෙ චන්දෙ නිරුජ්ඣන්ති[7].

1951. ඔසධි මෙ දුක්ඛං මෙ
හදයං මෙ ඩය්හතෙ නිතම්මාමි,
තව චන්දියා සොචන්තියා
න නං අඤ්ඤෙහි සොකෙහි.

1. ඊදිසං – මජසං.
2. නිධිනිධානමක්ඛාමි – මජසං.
3. වතායං – සයා, වි.
4. යොහං අද්දසං – මජසං, සයා.
5. හරිත්වා – වි, කරි – මජසං.
6. කෙරජාතකං – මජසං,
7. උපනියාතිදං මඤ්ඤෙ–චන්දෙ ලොහිත මද්දනෙ.
අජ්ජ ජහාමි ජීවිත–පාණා මෙ චන්දෙ නිරාජ්ඣන්ති – මජසං.
අජ්ජාසි විජහාමි ජීවිතං. සයා.

1944. කොසිය බමුණ, මාගේ ණය දීම මෙබඳු වේයි. මාගේ ණය මිදීම ද මෙබඳු වේ. කියන ලද නිදන් කිරීමත් මෙලෙස දැන ගනුව.

1945. පියාපත් ඇති මේ පක්ෂියා යහපත් ය. ඉතා දැහැමිය. ඇතැම් මිනිසුන් අතර ද මේ ගුණ දහම විද්‍යමාන නො වේ.

1946. සියලු නෑයන් සමග කැමැති පරිදි ඇල් වී අනුභව කරව. යළිදු (තොප) දකිමු. තොපගේ දැක්ම මට ප්‍රිය ය.

1947. කොසිය බමුණ, තොපගේ නිවෙසෙහි කෑවෙමි. බීවෙමි. තොප කෙරෙහි ඇල්ම ද ඇති විය. බහා ලූ දඬු ඇත්තන්ට දන් දෙව. ජරපත් මවුපියන් පොෂණය කරව.

1948. පක්ෂීන්ගෙන් උතුම් ගිරවා මම දුටුයෙම් ද ඒ මට ශ්‍රී කාන්තාව එකාන්තයෙන් පහළ වූවා ය. ගිරවාගේ සුභාෂිත අසා බොහෝ පින් කරමි.

1949. ඒ කොසිය බමුණා මුදිත වූයේ ප්‍රමුදිත වූයේ, කෑම බීම පිළියෙළ කොට පහන් සිතින් ආහාරපානයෙන් ශ්‍රමණ-බ්‍රාහ්මණයන් සතුටු කරවී ය.

1. සාලිකෙදර ජාතක යි.

1950. චන්ද්‍රාවෙනි, මේ ජීවිතය විනාශය කරා පැමිණියේය යි හඟිමි. (වැගිරෙන) ලෙයෙහි ගිලෙමි. ජීවිතය අත් හරිමි. ප්‍රාණයෝ නිරුද්ධ වෙති.

1951. මාගේ පණ නවතී. මට දුකෙකි. මාගේ හදවත දැවේ. ඉතා ක්ලාන්ත ඇත්තේ වෙමි. මේ මාගේ දුක ශොක කරන චන්ද්‍රාව නිසා උපනී. අන් කරුණු නිසා නො වේ.

1952. තිණමිව වනමිව මියායාමි[1]
නදී අපරිපුණ්ණියාව සුස්සාමි,
තව චන්දියා සොචන්තියා
න නං අඤ්ඤෙහි සොකෙහි.

1953. වස්සංව සරෙ පාදෙ
ඉමානි මස්සූනි වත්තරෙ මය්හං,
තව චන්දියා සොචන්තියා
න නං අඤ්ඤෙහි සොකෙහි.

1954. පාපොසි ඛො රාජපුත්ත
යො මෙ ඉච්ඡිතපතිං වරාකියා,
විජ්ඣසි වනමූලස්මිං
සො යං විද්ධො ඡමා සෙති.

1955. ඉමං මය්හං හදයසොකං
පටිමුඤ්චතු රාජපුත්ත තව මාතා,
යො මය්හං හදයසොකො
කිම්පුරිසං අවෙක්ඛමානාය.

1956. ඉමං මය්හං හදයසොකං
පටිමුඤ්චතු රාජපුත්ත තව ජායා,
යො මය්හං හදයසොකො
කිම්පුරිසං අවෙක්ඛමානාය.

1957. මා ච පුත්තෙ[2] මා ච පතිං
අද්දක්ඛි රාජපුත්ත තව මාතා,
යො කිම්පුරිසං අවධි
අදූසකං[3] මය්හකාමාහි.

1958. මා ච පුත්තෙ මා ච පතිං[5]
අද්දක්ඛි රාජපුත්ත තව ජායා,
යො කිම්පුරිසං අවධි
අදූසකං මය්හකාමාහි.[4]

1959. මා තුවං චන්දෙ රුජ්ජි[5]
මා සොචි වනතිමිරමත්තක්ඛි,
මම ත්වං හොහිසි භරියා
රාජකුලෙ පූජිතා නාරී[6].

---

1. මිලායාමි – මජසං,
2. මාව පුත්තං – මජසං, සයා
3. අවිදූසකං – වි.
4. මයාං කාමා වි. මයාංකාමාහි–මජසං.
5. රොදි–මජසං.
6. නාරිහි – මජසං.

1952. රත් වූ ගලෙහි ලූ තණ මෙන් ද මුලසුන් කැලෑ ගසක් මෙන් ද මලානික වෙමි. දිය නො පිරුණු නදියක් මෙන් වියළෙමි. එය ශොක කරන චන්ද්‍රා නිසා උපනි. අන් කරුණු නිසා නො වෙයි.

1953. පර්වත පාදයෙහි වැසි දිය මෙන් මගේ කඳුළු ධාරා නො සිඳී ගලයි. එය ශොක කරන චන්ද්‍රා නිසා උපනි. අන් කරුණු නිසා නො වේ.

1954. රාජපුත්‍රය, යමෙක් දුක්පත් මං කැමැති මාගේ සැමියා වනයෙහි විද්දේ ද (ඒ නුඹ) පාපියෙක් වෙහි. විදුම් ලද හෙතෙම බිමැ හෝනේ ය.

1955. රාජපුත්‍රය, කිඳුරා බලන මාගේ සිත්හි යම් දුකෙක් වේ ද, මාගේ සිත්හි හටගත් දුක තොපගේ මව ද ලබාවා.

1956. රාජපුත්‍රය, කිඳුරා බලන මාගේ හිතෙහි යම් දුකෙක් වේ ද, මාගේ හිතෙහි හටගත් දුක තොපගේ බිරිඳ ද ලබාවා.

1957. රාජපුත්‍රය, යමෙක් අහිංසක වූ මට ප්‍රිය වූ කිඳුරා මැරී ද (ඒ) තොපගේ මව ද දූදරුවන් නො දකීවා. සැමියා ද නො දකීවා.

1958. රාජපුත්‍රය, යමෙක්, අහිංසක වූ මට ප්‍රිය වූ කිඳුරා මැරී ද (ඒ) තොපගේ බිරිඳ දරුවන් නො දකීවා. සැමියා ද නො දකීවා යි සාප කළා ය.

1559. චන්ද්‍රාවෙනි, නො හඬන්න. දුක් නො වන්න. නී මානෙල් මල් බඳු ඇස් ඇත්තිය. තෙපි රජකුලයේ ස්ත්‍රීන්ගෙන් පිදුම් ලබන්නී මාගේ භාර්යාව හෙවත් අගමෙහෙසිය වන්නහු ය.

1960. අපිනූනහං[1] මරිස්සං
නවපනාහං[2] රාජපුත්ත තව හෙස්සං
යො කිම්පුරිසං අවධි
අදූසකං මය්හකාමාහි.

1961. අපි භීරුකෙ අපිජීවිතුකාමිකෙ
කිම්පුරිසි ගච්ඡ හිමවන්තං,
තාලිස්සතගරභොජනෙ[3]
අරඤ්ඤෙ තං මිගා රමිස්සන්ති.

1962. තෙ පබ්බතා තාව කන්දරා
තා ච ගිරිගුහායො,
තත්ථ[4] තං අපස්සන්ති
කිංපුරිස කථං අහං කාසං[5].

1663. තෙ පණ්ණසන්ථතා රමණීයා
වාළමිගෙහි අනුචිණ්ණා,
තත්ථ තං අපස්සන්ති
කිංපුරිස කථං අහං කාසං.

1964. තෙ පුප්ඵසන්ථාරමණීයා
වාළමිගෙහි අනුචිණ්ණා,
තත්ථ තං අපස්සන්ති
කිංපුරිස කථං අහං කාසං.

1965. අච්ඡා සවන්ති ගිරිවරනදියො[6]
කුසුමාභිකිණ්ණසොතායො,
තත්ථ තං අපස්සන්ති
කිංපුරිස කථං අහං කාසං.

1966. නීලානි හිමවතො
පබ්බතස්ස කූටානි දස්සනෙය්‍යානි,
තත්ථ තං අපස්සන්ති
කිම්පුරිස කථං අහං කාසං.

1967. පීතානි හිමවතො
පබ්බතස්ස කූටානි දස්සනෙය්‍යානි,
තත්ථ තං අපස්සන්ති
කිම්පුරිස කථං අහං කාසං.

1. සයා. වි. නූනාහං–මජසං.
2. කාහං–මජසං.
3. තාලීස තගරභොජනා–මජසං, සයා.
4. තථෙව – වි., මජසං.
5. කසසං – වි. මජසං.
6. ගිරිවන නදියො – මජසං, වි.

1960. රාජපුත්‍රය, අහිංසක වූ මට ප්‍රිය වූ කිඳුරා යමෙක් මැරී ද, මම මිය යතත් (ඒ) තොපගේ භාර්යා නො වෙමි.

1961. තලිස් පතුරු හා තුවරලා ආහාර කොට ගන්නා බියසුලු කිඳුරිය, ජීවත් වන්නට කැමැති නම් හිමවතට යව. වනයෙහි මෘගයෝ තී රමණය කරන්නාහ.

1962. කිඳුරාණෙනි, ඒ පර්වත ද ඒ කඳුරැළි ද ඒ පර්වත ගුහා ද ඇත. එහි තොප නො දක්නා මම කුමක් කෙරෙම් ද?

1963. කිඳුරාණෙනි, ව්‍යාල මෘගයන් හැසිරැ පුරුදු කොළ ඇතිරි ඇත. එහි තොප නො දක්නා මම කුමක් කෙරෙම් ද?

1964. කිඳුරාණෙනි, ව්‍යාල මෘගයන් හැසිරැ පුරුදු රමණීය වූ මල්ඇතිරි ඇත. එහි තොප නො දක්නා මම කුමක් කෙරෙම් ද?

1965. කිඳුරාණෙනි, පිරිසුදු දිය ඇති කුසුම් විසුරුණු දියදහර ඇති ගිරිනදීහු මෙහි ගලා බසිති. එහි තොප නො දක්නා මම කුමක් කෙරෙම් ද?

1966. කිඳුරාණෙනි, හිමවතෙහි දර්ශනීය වූ නිල්පැහැති පර්වතකූටයෝ වෙති. එහි තොප නො දක්නා මම කුමක් කරම් ද?

1967. කිඳුරාණෙනි, හිමවතෙහි දැකුමකලු රන්වන් පර්වතකූටයෝ වෙති. එහි තොප නො දක්නා මම කුමක් කරම් ද?

1968. තම්බානි හිමවතො
පබ්බතස්ස කූටානි දස්සනෙය්‍යානි,
තත්ථ තං අපස්සන්ති
කිම්පුරිස කථං අහං කාසං.

1969. තුඞ්ගානි හිමවතො
පබ්බතස්ස කූටානි දස්සනෙය්‍යානි,
තත්ථ තං අපස්සන්ති
කිම්පුරිස කථං අහං කාසං.

1970. සෙතානි හිමවතො
පබ්බතස්ස කූටානි දස්සනෙය්‍යානි,
තත්ථ තං අපස්සන්ති
කිම්පුරිස කථං අහං කාසං.

1971. චිත්‍රානි හිමවතො
පබ්බතස්ස කූටානි දස්සනෙය්‍යානි,
තත්ථ තං අපස්සන්ති
කිම්පුරිස කථං අහං කාසං.

1972. යක්ඛගණසෙවිතෙ
ගන්ධමාදනෙ ඔසධෙහි සඤ්ඡන්නෙ,
තත්ථ තං අපස්සන්ති
කිම්පුරිස කථං අහං කාසං.

1973. කිම්පුරිසසෙවිතෙ
ගන්ධමාදනෙ ඔසධෙහි සඤ්ඡන්නෙ,
තත්ථ තං අපස්සන්ති
කිම්පුරිස කථං අහං කාසං.

1974. වන්දෙ තෙ පාදෙ අයිර බ්‍රහෙම[1]
යො මෙ ඉච්ඡිතපතිං වරාකියා,
අමතෙන අභිසිඤ්චි
සමාගතස්මිං පියතමෙන.

1975. විචරාම දනි ගිරිවරනදියො
කුසුමාභිකිණ්ණසොතායො,
නානාදුමවසනායො
පියංවද අඤ්ඤමඤ්ඤස්සාති.

2. චන්දකින්නරජාතකං.

1. වන්දෙ පො අයිරෙ බ්‍රහෙම - මජසං.

1968. කිඳුරාණෙනි, හිමවතෙහි දර්ශනීය වූ තඹපැහැති පර්වත කූටයෝ වෙති. එහි ඔබ නො දක්නා මම කුමක් කෙරෙම් ද?

1969. කිඳුරාණෙනි, හිමවතෙහි දර්ශනීය වූ උස් වූ පර්වත-කූටයෝ වෙති. එහි ඔබ නො දක්නා මම කුමක් කෙරෙම් ද?

1970. කිඳුරාණෙනි, හිමවතෙහි දර්ශනීය වූ සුදුපැහැති පර්වත-කූටයෝ වෙති. එහි ඔබ නො දක්නා මම කුමක් කෙරෙම් ද?

1971. කිඳුරාණෙනි, හිමවතෙහි දර්ශනීය වූ විසිතුරු පර්වත-කූටයෝ වෙති. එහි ඔබ නො දක්නා මම කුමක් කෙරෙම් ද?

1972. කිඳුරාණෙනි, ඔසුයෙන් ගැවැසුණු බූමාටුදෙවියන් සෙවුනා ගඳමහන් පව්වෙහි ඔබ නො දක්නා මම කුමක් කෙරෙම් ද?

1973. කිඳුරාණෙනි, ඔසුයෙන් ගැවැසුණු කිඳුරන් සෙවුනා ගඳමහන් පව්වෙහි ඔබ නො දක්නා මම කුමක් කෙරෙම් ද?

1974. උතුම් බමුණාණෙනි, යමෙක් දුක්පත් මාගේ සැමියා අමාදියෙන් ඉස්සේ ද, (එ හෙයින්) ප්‍රියතම සැමියා හා එක්වීම් ලදිමි. ඒ ඔබ වඳිමි.

1975. අපි දැන් මලින් ගැවැසුණු දියදහර ඇති නන්වැදෑරුම් තුරුසෙවණ නැමැති වස්ත්‍ර ඇති ගිරිමතින් ඇද හැලෙන නදීන්හි ඔවුනොවුනට ප්‍රිය බස් බෙණෙමින් හැසිරෙම්හ.

2. චන්දකින්නර ජාතක යි.

1976. උක්කා[1] මිලාචා බන්ධන්ති දීපෙ
පජා මමං[2] ඛාදිතුං පත්ථයන්ති,
මිත්තං සහායඤ්ච වදෙහි[3] සෙනක
ආචික්ඛ ඤාතිබ්‍යසනං දිජානං

1977. දිජො දිජානං පවරොසි පක්ඛි
උක්කුසරාජ[4] සරණං තං උපෙමි,
පජා මම ඛාදිතුං පත්ථයන්ති
ලුද්දා මිලාචා භව මෙ සුඛාය.

1978. මිත්තං සහායඤ්ච කරොන්ති පණ්ඩිතා
කාලෙ අකාලෙ සුඛමෙසමානා[5],
කරොමි තෙ සෙනක එතමත්ථං
අරියො හි අරියස්ස කරොති කිච්චං.

1979. යං හොති කිච්චං අනුකම්පකෙන
අරියස්ස අරියෙන කතං තවයිදං[6],
අත්තානුරක්ඛී භව මා අඩය්හ
ලච්ඡාම පුත්තෙ තයි ජීවමානෙ.

1980. තවෙව[7] රක්ඛාවරණං කරොන්තො
සරීරභෙදාපි න සන්තසාමි;
කරොන්ති හෙකෙ[8] සඛීනං සඛාරො
පාණං චජන්ති[9] සත[10] මෙසධම්මො.

1981. සුදුක්කරං කම්මමකා[11] අණ්ඩජායං විහඞ්ගමො
අත්ථාය කුරරො[12] පුත්තෙ අඩ්ඪරත්තෙ අනාගතෙ.

1982. චුතාපි එකෙ ඛලිතා සකම්මුනා,
මිත්තානුකම්පාය පතිට්ඨහන්ති,
පුත්තා මමට්ටා ගතිමාගතොස්මි
අත්ථං චරෙථ මම වාරිජස්ස.

1983. ධනෙන ධඤ්ඤෙන ච අත්තනා ච
මිත්තං සහායඤ්ච කරොන්ති පණ්ඩිතා,
කරොමි තෙ සෙනක එතමත්ථං
අරියො හි අරියස්ස කරොති කිච්චං.

---

1. ලුද්දා – මජසං, වි.
2. මම – සයා.
3. පරෙහි – වී.
4. උක්කුස – වි.
5. මායයානා – වි.
6. තයිදං – මජසං, සයා.
7. තමෙව – මජසං, සයා.
8. හෙතෙ – මජසං.
9. චජන්තා – මජසං, සයා.
10. සතං තෙස මජසං. ආකාතෙස – වි.
11. කම්ම මකාසි – මජසං, සයා.
12. කුරුරො – මජසං, සයා.

1976. උකුස්සාණෙනි, මාගේ දරුවන් කන්නට රිසිඇති දනවු වැස්සෝ අප වසන ද්වීපතෙහි එහු බඳිති. එක් වැ හැසිරෙන මිතුරකුට කියව. පක්ෂි වූ අපගේ ඥාති ව්‍යසනය උකුසුරජුට කියනු මැනැවි.

1977. උකුසුරජාණෙනි, ඔබ පක්ෂීන් අතුරෙන් ශ්‍රෙෂ්ඨ පක්ෂි වෙති. මම ඔබ සරණ යමි. රුදුරු ජනපද වාසිහු මාගේ දරුවන් කන්නට රිසි වන්නාහ. ඔබ මට සැප පිණිස වෙත්වා.

1978. උකුස්සාණෙනි, ප්‍රාඥයෝ කල්හි දු නො කල්හි දු සැපය සොයන්නාහු උපකාර කරන මිතුරන් සහායයන් ඇති කර ගනිති. එහෙයින් මම ඔබට මේ උපකාරය කරමි. ආචාරසම්පන්න පුද්ගල ආචාරසම්පන්න පුද්ගලහට කටයුතු දැ කෙරෙයි.

1979. අනුකම්පා ඇති ආචාරසම්පන්න ඔබ විසින් කටයුතු යමක් ඇත් ද, ආචාරගුණ ඇති මට මේ උපකාරය කරන ලදී. තමා රකෙන්නේ මැනැවි. නො දුවෙන්නේ මැනැවි. ඔබ ජීවත් වන කලැ (අපි) දරුවන් ලබන්නමු.

1980. (මිතුර,) ඔබගේ ම රකවරණ සඳහා ක්‍රියා කරන මම මැරෙතු දු සන්ත්‍රාසයට පත් නො වෙමි. ඇතැම් මිතුරෝ මිතුරන් නිසා සිය පණ ද අත් හරිති. මෙය සත්පුරුෂ ධර්ම යි.

1981. ආකාශචාරී මේ උකුසු පක්ෂි තෙමේ අඩරැයක් ගෙවෙන තාක් මිතුරාගේ පුතුන් සඳහා ඉතා දුෂ්කර කාර්යයක් කෙළේ ය.

1982. දියෙහි වසන මාගේ මිත්‍රය, ඇතැම් කෙනෙක් යසසින් හා ධනයෙන් පිරිහෙත් නමුදු මිතුරනට අනුකම්පාවෙන් පිහිට වෙති. මාගේ පුත්හු කරදරයට පත් වැ සිටිති. පිළිසරණ සොයා පැමිණියෙමි. හිතචර්යායෙහි යෙදෙනු මැනැවි.

1983. නුවණැත්තෝ ධනධාන්‍යයට ද ජීවිතයට ද වඩා මිතුරාට සහායයාට උදව් කෙරෙති. උකුස්සාණෙනි, ඔබගේ මේ කාර්යය කරමි. ආචාරසම්පන්නයා ආචාරසම්පන්නයාගේ කාර්යය ඉටු කෙරෙයි.

1984. අප්පොස්සුක්කො තාත තුවං නිසීද[1]
පුත්තො පිතු චරති අත්ථචරියං,
අහං චරිස්සාමි තවෙතමත්ථං[2]
සෙනස්ස පුත්තෙ පරිතායමානො.

1985. අද්ධා හි තාත සතමෙස ධම්මො
පුත්තො පිතු යං චරෙථ[3] අත්ථචරියං,
අප්පෙව මං දිස්වා පවඩ්ඪකායං[4]
සෙනස්ස පුත්තෙ න විහෙඨයෙය්‍යුං[5].

1986. පසූ මනුස්සා මිගවිරියසෙට්ඨ[6]
භයද්දිතා[7] සෙට්ඨමුපබ්බජන්ති[8],
පුත්තා මමට්ටා ගතිමාගතොස්මි
ත්වං නොසි රාජා භව මෙ සුඛාය.

1987. කරොමි තෙ සෙනක එතමත්ථං
ආයාම[9] තෙ තං දිසතං වධාය,
කථං හි විඤ්ඤූ පහු[10] සම්පජානො
න වායමෙ අත්තජනස්ස ගුත්තියා.

1988. මිත්තඤ්ච[11] කයිරාථ සුහදයඤ්ච[12]
අයිරඤ්ච කයිරාථ සුඛෙහි අයිරො[13],
නිවත්ථකොජො ව සරෙභිහන්ත්වා
මොදාම පුත්තෙහි සමඞ්ගිභූතා.

1989. සකමිත්තස්ස[14] කම්මෙන සහායස්සාපලායිනො,
කූජන්තමුපකූජන්ති[15] ලොමසා හදයඞ්ගමං.

1990. මිත්තං සහායං අධිගම්ම පණ්ඩිතො
සො භුඤ්ජති පුත්තපසුං[16] ධනං වා,
අහඤ්ච පුත්තා ච පතී ච මය්හං
මිත්තානුකම්පාය සමඞ්ගිභූතා.

1991. රාජවතා සූරවතා ච අත්ථො
සම්පන්න සඛිස්ස[17] භවන්ති හෙතෙ,
සො මිත්තවා යසවා උග්ගතත්තො
අසමිඤ්ච[18] ලොකෙ මොදති කාමකාමී.

---

1. නිසීදි – මජසං.
2. තවෙව – මජසං, සයා, වි.
3. පිතූනං චරෙ – මජසං.
4. පවද්ධකායං පවඩ්ඪකායං – මජසං, සයා, වි.
5. න හෙඨයෙය්‍යුං – වි. න. හෙඨපෙය්‍යුං – මජසං.
6. වීරසෙට්ඨ – මජසං, සයා.
7. භයට්ටිතා – මජසං, සයා.
8. ජජන්ති – මජසං.
9. ආයාමි – මජසං,
10. බහූ – මජසං, වි.
11. මිත්තං – මජසං.
12. සකාසරඤ්ච – වි.
13. සුඛාගමය – මජසං, සයා.
14. සතං වි. සකං – මජසං.
15. කුජන්තං – මජසං, වි.
16. මිත්ත මජසං, පුත්ත වි.
17. සබ්‍යස්ස – මජසං.
18. අසම්ධ – මජසං,

1984. පියාණෙනි, ඔබ වෙහෙස නො වනු මැනවි. පුත්‍රයා පියාගේ කාර්යයෙහි නියුක්ත ව හැසිරෙයි. උකුස්සාගේ දරුවන් රකිමින් මම ඔබගේ මේ කාර්යයෙහි හැසිරෙන්නෙමි.

1985. දරුව, පියාගේ කාර්යයෙහි පුත්‍රයා නියුක්ත වීම එකාන්තයෙන් සත්පුරුෂ ගුණයෙකි. බොහෝ වැඩී ගිය මා දැකැ දනවී වැසියෝ උකුස්සාගේ පුතුන් වෙහෙස නො කරන්නාහු නම් මැනැවි.

1986. මෘගයන් අතරේ වීර්යය ඇති ශ්‍රෙෂ්ඨ රජතුමනි, තිරිසන්නු ද මනුෂ්‍යයෝ ද බියට පත් වූවෝ ශ්‍රෙෂ්ඨයකු කරා එති. මාගේ දරුවෝ පීඩිතයහ. පිළිසරණ සොයා ආයේ වෙමි. ඔබ අප රජ වෙති. මාගේ සැපත පිණිස උපකාර වුව මැනැවි.

1987. උකුස්සාණෙනි, ඔබගේ මේ කාර්යය කරමි. ඔබගේ ඒ සතුරන් නසන්නට යමු. නුවණැත්තේ සතුරු බිය දැකැ මිතු-රන්ගේ ආරක්ෂාව සඳහා කෙසේ නම් වෑයම් නො කෙරේ ද?

1988. යමෙක් සැපත සඳහා මිතුරකු හෝ හිතෛෂියකු හෝ ස්වාමියකු හෝ ඇති කරන්නේ ද හේ සන්නාහය පැළැඳ ගත්-තෙක් ඊපහර වළකන්නා සේ සතුරු කරදර වළකා ගනියි. (රැකුණා වූ) අපි දරුවන් හා එක්ව ප්‍රීත වෙමු.

1989. ස්වකීය මිත්‍රයා වූ, බියෙන් පැන නොයන්නා වූ සිංහ-යාගේ වික්‍රමය නිසා, අපේ කුරුලු පැටවී අපේ සිත් තුටු කරමින් නාදයට අනුව නාද කරති.

1990. ප්‍රාඥයා හිතෛෂී මිත්‍රයකු ලබා ද හේ පුත්‍රයන් ද සිවුපාවන් ද ධනය ද ලැබැ පරිහරණය කරයි. මම ද මගේ පුත්‍රයෝ ද සැමියා ද යන අපි මිතුරන්ගේ අනුකම්පාව නිසා එක් වැ වසමු.

1991. රාජබලය ද සූරබලය ද ඇති මිතුරන්ගෙන් ප්‍රයොජන ඇත. මිත්‍රධර්ම ඇත්තාට මෙබඳු මිතුරෝ වෙත්. මිතුරන් සහ යසස් ඇති උසස් ගතිපැවැතුම්වලින් යුතු හේ මෙලොව දී ද ප්‍රීත වේ.

1992. කරණීයානි[1] මිත්තානි දළිද්දේනාපි සෙනක,
පස්ස මිත්තානුකම්පාය සමග්ගම්හා සඤ්ඤාතකෙ.

1993. සූරෙන බලවන්තෙන යො මෙත්තිං[2] කුරුතෙ දිජො,
එවං සො සුඛිතො හොති යථාහං ත්වඤ්ච සෙනකාති.

3. මහාඋක්කුසජාතකං.

1994. ඛරාජිනා ජටිලා පඞ්කදන්තා
දුම්මුඛරූපා[3] යෙ මෙ ජපන්ති[4];
කච්චිනු[5] තෙ මානුසකෙ පයොගෙ
ඉදං විදූ පරිමුත්තා අපායා.

1995. පාපානි කම්මානි කරෙථ[6] රාජ
බහුස්සුතො චෙ න චරෙය්‍ය ධම්මං,
සහස්සවෙදොපි න තං පටිච්ච
දුක්ඛා පමුඤ්චෙ චරණං අපත්වා.

1996. සහස්සවෙදොපි න තං පටිච්ච
දුක්ඛා පමුඤ්චෙ චරණං අපත්වා
මඤ්ඤාමි වෙදා අඵලා භවන්ති
සසංයමං චරණඤ්ඤෙව සච්චං.

1997. නහෙව වෙදා අඵලා භවන්ති
සසංයමං චරණඤ්ඤෙව සච්චං,
කිත්තිං[7] හි පප්පොති අධිච්ච වෙදෙ
සන්තිං පුණෙති[8] චරණෙන දන්තො.

1998. භච්චා මාතා පිතා බන්ධූ යෙන ජාතො[9] සයෙව[10] සො,
උද්දාලකො අහං හොතො[11] සොත්තියා[12]කුලවංසකො.

1999. කථං භො බ්‍රාහ්මණො හොති කථං භවති කෙවලී,
කථඤ්ච පරිනිබ්බානං ධම්මට්ඨො කින්ති වුච්චති.

2000. නිරං කත්වා අග්ගිමාදාය බ්‍රාහ්මණො
ආපොසිඤ්චං[13] යජමුස්සෙති යූපං,
එවං කරො බ්‍රාහ්මණො හොති ඛෙමී
ධම්මෙ ඨිතං තෙන අමාපයිංසු.

---

1. කරණීයානි – වි.
2. යොමිත්තං – මජ්සං.
3. දුම්මුක්ඛරූපා ස්‍යා. දුම්මක්ඛරූපාමි. රුම්මක්ඛරූපා ස්‍යා. අපොසිඤ්චුං – මජ්සං
4. මන්තං ජප්පන්ති – මජ්සං.
5. කච්චින්නු – මජ්සං, ස්‍යා. වි.
6. කරෙය්‍යාථ ස්‍යා. කරෙය්‍ය – මජ්සං.
7. කිත්තිංච – ස්‍යා.
8. සන්තිම්පුණාති – මජ්සං.
9. ජාතෙ – මජ්සං.
10. සච – ස්‍යා.
11. හොති – මජ්සං.
12. සොත්ථිය – මජ්සං.
13. ආපොසිඤ්චු – මජ්සං.

1992. උකුස්සාණෙනි, දිළින්ද විසිතුදු මිතුරෝ කටයුත්තාහ. (හෙවත් මිතුරෝ සෙවිය යුතුවෙති.) මිතුරන්ගේ අනුකම්පාව නිසා සිය දරුවන් හා එක්වීමු. එය බලනු මැනැවි.

1993. උකුස්සාණෙනි, යම් පක්ෂියෙක් සූරයකු සමග ද බලවතකු සමග ද මිතුරුකම් කෙරේ ද, හේ මාත් ඔබත් සුවපත් වූ සේ සුවපත් වෙයි.

3. මහා උක්කුස ජාතක යි.

1994. රළු අඳුන්දිවිසම් පොරොවාගත් මැලියම් සහිත දත් ඇති අපවිත්‍ර මුහුණත් පෙනුමත් ඇති යම් දූළල්ලෝ මන්ත්‍ර පිරුවහත් ද, මිනිසුන් කටයුතු දෙයෙහි ව්‍යාවෘත වූ, ඔවුහු කිම අවාදුකින් මිදුණෝ ද?

1995. මහරජතුමනි, බහුශ්‍රැත වුවත් කුසල් දහම්හි නො හැසිරේ නම් පව්කම් කරන්නේ නම් දහසක් වේද දතුවත් අෂ්ට සමාපත්ති නො ලබා අපාදුකින් නො මිදෙන්නේ ය.

1996. දහසක් වේද හදළේ නමුදු චරණ ධර්මයට නො පැමිණ ඒ වේද නිසා දුකින් නො මිදෙන්නේ යි. හදළ වේද (නිවන් මග නොවන හෙයින්) නිෂ්ඵල යයි හඟිමි. සංයම සහිත චරණ ධර්ම ම සත්‍ය වෙයි.

1997. වේද හැදෑරීම නිෂ්ඵල යයි නො කියමි. සංයමය සහිත චරණධර්ම ම සත්‍ය වේ. වේදය හදුරා කීර්තියට පැමිණෙයි. චරණ ධර්මයෙන් දන්ත වූයේ නිවනට පැමිණේ.

1998. මව ද පියා ද නෑයෝ ද පොෂණය කටයුතු වෙත්. යමකු නිසා උපන්නේ ද හේ ද හේ මැ යැ. උද්දලක නමැති මම ඔබගේ කුලවංශය ඇත්තෙම් වෙමි.

1999. පින්වත, බ්‍රාහ්මණ වන්නේ කෙසේ ද? කෙවලී (සියල්ල සම්පූරණ වූවෙක්) වන්නේ කෙසේ ද? පරිනිර්වාණය කෙසේ වේ ද? කුමකින් ධම්මට්ඨ (ධර්මයේ පිහිටියේ) යි කියනු ලැබේ ද?

2000. බමුණ, නිතර ගිනි පුද ද ස්නාන කෙරේ ද යාගස්තම්භය ඔසොවා ද මෙසේ කරන්නේ බ්‍රාහ්මණ වෙයි. ඛෙමි (ක්‍ෂෙම ඇති) වෙයි. එහෙයින් ඔහු ධර්මයෙහි සිටියහූ කොට කීහු.

2001. න සුද්ධි සෙවනෙනත්‍ථි නපි[1] කෙවලී බ්‍රාහ්මණො,
න ඛන්ති නපි සොරච්චං[2] නපි සො පරිනිබ්බුතො.

2002. කථං සො බ්‍රාහ්මණො හොති කථං භවති කෙවලී,
කථඤ්ච පරිනිබ්බානං ධම්මට්ඨො කින්ති වුච්චති.

2003. අඛෙත්තබන්ධු[3] අමමො නිරාසො
නිල්ලොභපාපො භවලොභඛීණො,
එවං කරො බ්‍රාහ්මණො හොති ඛෙමී
ධම්මෙ ඨිතං තෙන අමාපයිංසු.

2004. ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා චණ්ඩාල පුක්කුසා,
සබ්බෙව සොරතා දන්තා සබ්බෙව පරිනිබ්බුතා.
සබ්බෙසං සීතිභූතානං අත්ථි සෙය්‍යොව පාපියො.

2005. ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා චණ්ඩාල පුක්කුසා
සබ්බෙව සොරතා දන්තා සබ්බෙව පරිනිබ්බුතා,
සබ්බෙසං සීතිභූතානං නත්ථි සෙය්‍යොව පාපියො.

2006. ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා චණ්ඩාල පුක්කුසා,
සබ්බෙව සොරතා දන්තා සබ්බෙව පරිනිබ්බුතා.

2007. සබ්බෙසං සීතිභූතානං නත්ථි සෙය්‍යොව පාපියො,
පනට්ඨං චරසි බ්‍රහ්මඤ්ඤං සොත්ථියා කුලවංසතං

2008. නානාරත්තෙහි වත්ථෙහි විමානං භවති ඡාදිතං,
න තෙසං ඡායාවත්ථානං සො රාගො අපනුජ්ජථ.

2009. එවමෙව මනුස්සෙසු යද[4] සුජ්ඣන්ති මානවා,
න තෙසං ජාතිං පුච්ඡන්ති ධම්මමඤ්ඤාය සුබ්බතා'ති.

4. උද්දාලකජාතකං.

1. නාපි -වි.
2. නමෙව ඛන්තිසොරච්චං - මජ්සං.
3. අඛෙත්ත - මජ්සං, සයා. වි,
4. සද - වි.

2001. ස්නානයෙන් පිරිසුදුබවෙක් නැත. ගිනි පිදීම් ආදියෙන් කෙවලී නො වෙයි, බ්‍රාහ්මණ නො වෙයි, ඉවසීම නො වෙයි, සුරත බව ද නො වෙයි, පිරිනිවියේ ද නො වේ.

2002. හේ කෙසේ බ්‍රාහමණ වන්නේ ද? කෙසේ කෙවලී (සියල්ලෙන් පිරිපුන්) වන්නේ ද? පරිනිර්වාණය වන්නේ කෙසේ ද? කුමකින් ධම්මට්ඨ (ධර්මයෙහි පිහිටියේ) යි කියනු ලැබේ ද?

2003. යමෙක් කෙත් හා නෑයන් නැත්තෙක් වේ ද මමායනය හා ලාභයෙහි නිරපෙක්‍ෂකයෙක් වේ ද, භවරාගය ක්‍ෂය කළ කෙනෙක් වේ ද මෙසේ කළා වූ බමුණු ආරක්‍ෂා සහිතයෙක් වේ. එහෙයින් ඔහු ධර්මයේ පිහිටියේ යයි කීහ.

2004. ක්‍ෂත්‍රිය, බ්‍රාහමණය, වෛශ්‍ය, ශුද්‍ර, චණ්ඩාල සහ පුක්කුස යන සියල්ලෝ සුරත වැ දමිත වැ පිරිනිවියාහු වෙත් නම්, මේ සියල්ලන්ගෙන් මෙ ශ්‍රෙෂ්ඨ ය මෙ හීන යයි වෙනසෙක් වේ ද?

2005. ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර, චණ්ඩාල සහ පුක්කුස යන සියල්ලෝ සුරත වැ දමිත වැ පිරිනිවියාහු වෙත් නම් මේ සියල්ලන්ගෙන් මෙ ශ්‍රෙෂ්ඨ ය මෙ හීන යයි වෙනසෙක් නැත.

2006. ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර, චණ්ඩාල සහ පුක්කුස යන සියල්ලෝ සුරත වැ දමිත වැ සියල්ලෝ ම පිරිනිවියෝ ය.

2007. සැනැසුණ සියල්ලන්ගෙන් මෙ ශ්‍රෙෂ්ඨය මෙ හීනය යි වෙනසෙක් නැත්තේ නම් බමුණන්ගේ කුලපරපුරෙන් පැවැත ආ බමුණු බව නැති කොට සැඬොලුන් සමාන ව හැසිරෙන්නේ ය.

2008. නොයෙක් පාට ඇති වස්ත්‍රයෙන් ගෙයක් වසන ලද්දේ වේ ද, වැසූ වස්ත්‍රයෙහි පැහැය සෙවනැල්ලට යම්සේ නො ඒ ද.

2009. මෙසේ මනුෂ්‍යයන් අතරේ මනුෂ්‍යයෝ යම් කලෙකැ පිරිසුදු වෙත් ද (එකලැ) සිල්වත්හු දහම් දනැ ඔවුන්ගේ ජාතිය නො විචාරති.

4. උද්දල ජාතක යි.

2010. අස්සං ගවං රජතං ජාතරූපං
භරියඤ්ච සො ඉධ ලභතං මනාපං,
පුත්තෙහි දාරෙහි සමඞ්ගි හොතු
භිසානි තෙ බ්‍රාහ්මණ යො අහාසි.

2011. මාලඤ්ච සො කාසිකචන්දනඤ්ච
ධාරෙතු පුත්තස්ස බහූ භවන්තු,
කාමෙසු තිබ්බං කුරුතං අපෙක්ඛං
භිසානි තෙ බ්‍රාහ්මණ යො අහාසි.

2012. පහූතධඤ්ඤො කසිමා යසස්සී
පුත්තෙ ගිහී ධනිමා සබ්බකාමෙ,
වයං අපස්සං ඝරමාවසාතු
භිසානි තෙ බ්‍රාහ්මණ යො අහාසි.

2013. සො ඛත්තියො හොතු[1] පසය්හකාරී
රාජාභිරාජා බලවා යසස්සී,
සචාතුරන්තං මහිමාවසාතු
භිසානි තෙ බ්‍රාහ්මණ යො අහාසි.

2014. සො බ්‍රාහ්මණො හොතු අවීතරාගො
මුහුත්තනක්ඛත්තපථෙසු යුත්තො,
පූජෙතු නං රට්ඨපතී යසස්සී
භිසානි තෙ බ්‍රාහ්මණ යො අහාසි.

2015. අජ්ඣායකං සබ්බසමත්තවෙදං[2]
තපස්සිනං මඤ්ඤතු සබ්බලොකො,
පූජෙන්තු[3] තං ජානපදා සමෙච්ච
භිසානි තෙ බ්‍රාහ්මණ යො අහාසි.

2016. චතුස්සදං ගාමවරං සමිද්ධං
දින්නං හි භුඤ්ජතු වාසවෙන,
අවීතරාගො මරණං උපෙතු
භිසානි තෙ බ්‍රාහ්මණ යො අහාසි.

2017. සො ගාමණී හොතු සහායමජ්ඣෙ
නච්චෙහි ගීතෙහි පමොදමානො,
මා රාජතො ව්‍යසනමලත්ථ කිඤ්චි
භිසානි තෙ බ්‍රාහ්මණ යො අහාසි.

1. හොති - වි.
2. සමත්තවෙදං - මජසං, සයා.
3. පූජෙතු - වි.

2010. බමුණාණෙනි, යමෙක් තොපගේ නෙළුම් අල සොරකම් කෙළේ ද හෙතෙම අශ්වයකු ගවයකු සහ රන්රිදී ද මනවඩන බිරිඳක ද ලබාවා. පුත්‍රයන් සමගත් බිරියන් සමගත් එක්වේවා.

2011. බමුණාණෙනි, යමෙක් තොපගේ නෙළුම් අල සොරකම් කෙළේ ද හෙතෙම මල්දම් ද කසීසඳුන් ද දරාවා. ඔහුට දරුවෝ ද බොහෝ වෙත්වා. හෙතෙම කාමයන්හි තීව්‍ර වූ අපෙක්‍ෂා කෙරේවා.

2012. බමුණාණෙනි, යමෙක් තොපගේ නෙළුම් අල සොරකම් කෙළේ ද හෙතෙම බොහෝ ධාන්‍ය ඇති, සී සාන, පිරිවර ඇති පුතුන් ද, හැම කම්සුවයක් ම ලබන ධනවත්, වයස නො පෙනෙන ගිහියෙක් ව වාසය කෙරේවා.

2013. බමුණාණෙනි, යමෙක් තොපගේ නෙළුම් අල සොරකම් කෙළේ ද හෙතෙම රජුන්ටත් රජ වූ පිරිවර ඇති බලාත්කාරකම් කරන ක්‍ෂත්‍රියයෙක් වේවා. සිවු මුහුදු හිම් කොට තිබෙන පෘථිවියට අධිපති ව වෙසේවා.

2014. බමුණාණෙනි, යමෙක් තොපගේ නෙළුම් අල සොරකම් කෙළේ ද හෙතෙම (ශුභ) මුහූර්තයන්හි හා නක්‍ෂත්‍රයෙහි පහ නො වූ ආශා ඇති බමුණෙක් වේවා. පිරිවර ඇති රජතෙම ඔහු පුදවා.

2015. බමුණාණෙනි, යමෙක් තොපගේ නෙළුම් අල සොරකම් කෙළේ ද, හෙ මන්ත්‍ර හදරන වේදය සම්පූර්ණයෙන් හදළ තවුසෙකැ යි ලෝවැසියා සිතාවා. දනවුවැසියෝ එක් වැ ඔහු පුදත්වා.

2016. බමුණාණෙනි, යමෙක් තොපගේ නෙළුම් අල සොරකම් කෙළේ ද හෙතෙම කරුණු සතරෙකින් උත්සන්න වූ ශක්‍රයා දුන්නා වැනි සමෘද්ධ වූ ගම්වරය අනුභව කෙරේවා. පහ නො කළ ආශා ඇත්තෙක් ව මරණයට පැමිණේවා.

2017. බමුණාණෙනි, යමෙක් තොපගේ නෙළුම් අල සොරකම් කෙළේ ද හෙතෙම මිතුරන් මැද නැටුම් ගැයුම් වලින් ප්‍රීතවන ගම්දෙටුවෙක් වේවා. රජුගෙන් විපත් කිසිත් නො ලබාවා.

2018. යං එකරාජා පඨවිං විජෙත්වා[1]
ඉත්ථී සහස්සස්ස[2] ඨපෙතු අග්ගං
සීමන්තිනීනං පවරා භවාතු[3]
භිසානි තෙ බ්‍රාහ්මණ යා අහාසි.

2019. ඉසීනං[4] හි සා සබ්බසමාගතානං
භුඤ්ජෙය්‍ය සාදුං අවිකම්පමානා,
චරාතු ලාභෙන විකත්ථමානා
භිසානි තෙ බ්‍රාහ්මණ යා අහාසි.

2020. ආවාසිකො හොතු මහාවිහාරෙ
නවකම්මිකො හොතු කජඞ්ගලායං,
ආලොකසන්ධිං[5] දිවසා කරොතු
භිසානි තෙ බ්‍රාහ්මණ යො අහාසි.

2021. සො බජ්ඣතං[6] පාසසතෙහි ඡම්හි*
රම්මා වනා නීයතු රාජධානිං,
තුත්තෙහි සො හඤ්ඤතු පාචනෙහි
භිසානි තෙ බ්‍රාහ්මණ යො අහාසි.

2022. අලක්කමාලී තිපුකණ්ණවිද්ධො[7]
ලට්ඨීහතො සප්පමුඛං උපෙතු,
සකච්ඡබන්ධො[8] විසිඛං[9] චරාතු
භිසානි තෙ බ්‍රාහ්මණ යො අහාසි.

2023. යො වෙ[10] අනට්ඨං නට්ඨන්ති චාහ[11]
කාමෙව සො ලභතං භුඤ්ජතඤ්ච[12],
අගාරමජ්ඣෙ මරණං උපෙතු
යො වා භොන්තො සඞ්කති කඤ්චිදෙව.

2024. යදෙසමානා විචරන්ති ලොකෙ
ඉට්ඨඤ්ච කන්තඤ්ච බහූනමෙතං,[13]
පියං මනුඤ්ඤං ඉධ ජීවලොකෙ
කස්මා ඉසයො නප්පසංසන්ති කාමෙ

---

1. ජිත්වා – මජසං, සයා.
2. සහස්සානං – මජසං, වි.
3. භවතු – මජසං.
4. දසීන – මජසං.
5. ආලොකසන්ධි – මජසං.
6. බජ්ඣතු – මජසං.
*. ඡම්හීති සබ්බත්ථ
7. තිපුකරණා පිට්ඨෙ – වි.
8. සකච්ඡබන්ධො – මජසං.
9. විසිකං – නා.
10. යෙ වෙ – මජසං.
11. ආහ – සයා.
12. ලභතු භුඤ්ජතු – මජසං, සයා.
13. බහූන – මජසං, සයා.

2018. බමුණාණෙනි, යම් ස්ත්‍රියක් තොපගේ නෙළුම් අල සොරකම් කළා ද ඇය ප්‍රධාන රජෙක් පොළොව දිනා ස්ත්‍රීන් දහසකට ප්‍රධාන තනතුරෙහි තබාවා. ඕ ස්ත්‍රීන්ගෙන් උතුම් තැනැත්තියක් වේවා.

2019. බමුණාණෙනි, යම් ස්ත්‍රියක් තොපගේ නෙළුම් අල සොරකම් කොට කෑවා නම් ඕ තොමෝ රැස් වූ අධිපතීන් (ස්වාමිවරුන්) මැද හිඳ පැකිලීම් රහිතව රසය බුදීවා. ලාභය සඳහා කුහකකම් කෙරේවා.

2020. බමුණාණෙනි, යමෙක් තොපගේ නෙළුම් අල සොරකම් කෙළේ ද හෙතෙම කජංගල නගරයේ මහ වෙහෙරෙක නවාම් කරන තෙර කෙනෙක් වේවා. දවසකින් එක් කවුළුවක් කෙරේවා.

2021. බමුණාණෙනි, යමෙක් තොපගේ නෙළුම් අල සොරකම් කෙළේ ද හෙ ස තැනෙකැ සිය ගණන් බැම් වලින් බැඳේවා. රම්‍ය වූ වනයෙන් රාජධානියට ගෙන යේවා. හෙතෙම කටුසැමිටියෙන් හා කෙවිටින් පෙළනු ලබාවා.

2022. බමුණාණෙනි, යමෙක් තොපගේ නෙළුම් අල සොරකම් කෙළේ ද හෙතෙම වරාමල් මාලාවක් ගෙල පැළැඳැ ඊයම් කන් පළඳනා පැළැඳැ යටියෙන් පහර දෙමින් සපුන් ඉදිරියට පමුණුවාවා. මනා කොට බඳින ලද්දේ මාර්ගයේ හසුරුවාවා.

2023. යමෙක් නැති නො වූ දෙය නැති වී යයි කී ද, යමෙක් තොපගෙන් කෙනකු සැක කෙළේ ද හේ පංචකාමය ලබාවා. එය අනුභව කෙරේවා. ගිහිගෙහි දී මරණයට පැමිණේවා.

2024. ලොකයෙහි සත්‍වයන් යමක් සොයමින් හැසිරෙද්දී මේ සම්පත බොහෝදෙනාට ඉෂ්ට ද කාන්ත ද ප්‍රිය ද කැමැති ද වෙයිද, කවර හෙයින් ඉසිවරයෝ (ඒ) කම්සුව නො පසසත් ද?

2025. කාමෙසු වෙ හඤ්ඤරෙ බජ්ඣරෙ ච
කාමෙසු දුක්ඛඤ්ච භයඤ්ච ජාතං,
කාමෙසු භූතාධිපතී පමත්තා
පාපානි කම්මානි කරොන්ති මොහා.

2026. තෙ පාපධම්මා පසවෙත්වා[1] පාපං
කායස්සභෙදා නිරයං වජන්ති,
ආදීනවං කාමගුණෙසු දිස්වා
තස්මා ඉසයො නප්පසංසන්ති කාමෙ.

2027. වීමංසමානො ඉසිනො භිසානි
තීරෙ ගහෙත්වාන ථලෙ නිධෙසිං,
සුද්ධා අපාපා ඉසයො වසන්ති
එතානි තෙ බ්‍රහ්මචාරී භිසානි.

2028. න තෙ නටා නො පන කීළනෙය්‍යා
න බන්ධවා නො පන තෙ සහායා,
කිස්මිං පරත්ථම්භ[2] සහස්සනෙත්ත
ඉසීහි ත්වං කීළසි දෙවරාජ.

2029. ආචරියො මෙසි පිතා ච මය්හං
එසා පතිට්ඨා ඛලිතස්ස බ්‍රහ්මෙ,
එකාපරාධං ඛම භූරිපඤ්ඤ
න පණ්ඩිතා කොධබලා භවන්ති

2030. සුවොසිතං ඉසිනං[3] එකරත්තං
යං වාසවං භූතපතිං අද්දසාම,
සබ්බෙව භොන්තො සුමනා භවන්තු
යං බ්‍රාහ්මණො පච්චපාදී භිසානි.

2031. අහඤ්ච සාරිපුත්තො ච මොග්ගල්ලානො ච කස්සපො,
අනුරුද්ධො පුණ්ණො ආනන්දො තදාසුං සත්ත භාතරො.

2032. භගිනී උප්පලවණ්ණා දාසී ඛුජ්ජුත්තරා තදා,
චිත්තො ගහපති දාසො යක්ඛො සාතාගිරො තදා.

2033. පාරිලෙය්‍යො[4] තදා නාගො මධුදො සෙට්ඨවානරො,
කාළුදායී තදා සක්කො එවං ධාරෙථ ජාතකන්ති.

5. භිසජාතකං.

1. පසවෙත්ව – වි.
2. වූපත්ථම්භ – මජසං.
3. පවාසිතං එසිනං – මජසං.
4. පාලිලෙය්‍යො – මජසං, සහං.

2025. ශක්‍රය, කාම සම්පත් නිසා සත්ත්වයෝ නසනු ලබත්. බඳිනු ලබත්. කාමයන් නිසා දුක හා බිය හට ගනී. කාම සම්පත නිසා පමාවූවෝ මොහය නිසා පව් කරති.

2026. ඒ පාපස්වභාවය ඇත්තෝ පව් කොට මරණයෙන් පසු නිරා වදිති. මෙසේ කම්සැපයේ දෙස් දැක ඉසිවරයෝ කාමයන් නො පසසති.

2027. බඹසැරියාණෙනි, ඉසිවරයන් විමසන්නා වූ මම ඉවු-රෙහි වූ නෙළුම් අල ගොඩ සැඟවීමි. ඉසිවරු පවිත්‍ර වැ පව් රහිත වැ වෙසෙත්. මෙය තොපගේ නෙළුම් අල වේ.

2028. සහසුනෙත්‍රයාණෙනි, අපි තොපගේ නළුවෝ නො වෙමු, ක්‍රීඩකයෝ නො වෙමු, නෑයෝ ද නො වෙමු, මිතුරෝ ද නො වෙමු, දෙව් රජුනි, තෙපි තවුසන් සමග කුමක් නිසා ක්‍රීඩා කරවු ද?

2029. මහාප්‍රාඥය, තෙපි මාගේ ගුරුතුමා වවු. මාගේ පියා ද වවු. මා කළ වරදට ඔබ වහන්සේගේ පා සෙවණ පිහිට වේවා. මා කළ වරදට කමා කරන්නේ මැනැවි. නුවණැත්තෝ ක්‍රොධය බලය කොට ඇත්තෝ නො වෙති.

2030. තවුසන්ගේ මේ වනයෙහි එකරැයක් විසීම නිසා භූතාධිපති ශක්‍රයා දුටුමු. එහෙයින් යහපත් විසීමකි. ඔබගේ ඇදුරු බමුණා නෙළුම් අල පසුව ලදුයෙන් පින්වත් ඔබ හැම සතුටු සිත් ඇත්තෝ වෙත්වා.

2031. මම ද සැරියුත් මුගලන් කසුප් අනුරුදු පුණු සහ අනඳ යන මොහු ද එකලැ සත් සොහොයුරෝ වූම්හ.

2032. එකලැ නැගැණියෝ උප්පුල්වන් වූහ. දසිය ඛුජ්ජුත්තරා වූවා ය. එකලැ දසයා චිත්ත ගහපතියා විය. එකලැ යක්‍ෂ ව සිටියේ සාතාගිර ය.

2033. එකලැ ඇත් තෙම පාරිලෙය ඇතා ය. වඳුරා නම් මී දුන් වඳුරා ය. එකලැ ශක්‍රයා කාළුදායි තෙරණුවෝ ය. ජාතකය මෙලෙස දරා ගනිවු.

5. භිස ජාතක යි.

2034. මහෙසී රුචිනො භරියා ආනීතා පඨමං අහං,
දසවස්සසහස්සානි යං මං සුරුචිමානයි.

2035. සාහං බ්‍රාහ්මණ රාජානං වෙදෙහං මිථිලග්ගහං
නාභිජානාමි කායෙන වාචාය උදචෙතසා
සුරුචිං අතිමඤ්ඤිත්ථො ආවිවා[1] යදිවා රහො.

2036. එතෙන සච්චවජ්ජෙන පුත්තො උප්පජ්ජතං ඉසෙ,
මුසා මෙ භණමානාය මුද්ධා ඵලතු සත්තධා.

2037. භත්තුමනාපස්ස පිතා මාතා චාපි සුවාමිනො[2],
තෙ මං බ්‍රහ්මෙ විනෙතාරො යාව අට්ඨංසු ජීවිතෙ.

2038. සාහං අහිංසාරතිනී කාමසො ධම්මචාරිණී,
සක්කච්චං තෙ උපට්ඨාසිං රත්තින්දිවමතන්දිතා.

2039. එතෙන සච්චවජ්ජෙන පුත්තො උප්පජ්ජතං ඉසෙ,
මුසා මෙ භණමානාය මුද්ධා ඵලතු සත්තධා.

2040. සොළසිත්ථිසහස්සානි සහභරියානි බ්‍රාහ්මණ,
තාසු ඉස්සා වා කොධො වා නාහු මය්හං කුදාචනං.

2041. හිතෙන තාසං නන්දාමි න ච මෙ කාචි අප්පියා
අත්තානං වානුකම්පාමි සදා සබ්බා සපත්තියො.

2042. එතෙන සච්චවජ්ජෙන පුත්තො උප්පජ්ජතං ඉසෙ,
මුසා මෙ භණමානාය මුද්ධා ඵලතු සත්තධා.

2043. දසෙ කම්මකරෙ පෙස්සෙ[4] යෙ චඤ්ඤෙ අනුජීවිනො,
පොසෙමි සහධම්මෙන සදා පමුදිතින්ද්‍රියා.

2044. එතෙන සච්චවජ්ජෙන පුත්තො උප්පජ්ජතං ඉසෙ,
මුසා මෙ භණමානාය මුද්ධා ඵලතු සත්තධා.

2045. සමණෙ බ්‍රාහ්මණෙ චාපි අඤ්ඤෙ චාපි වණිබ්බකෙ,
තප්පෙමි අන්නපානෙන සදා පයතපාණිනී.

---

1. අවිවා – මජසං.
2. භත්තු මම සස්සු මාතා පිතා චාපිචස්සුරො ස්‍යා. භත්තු මනාපා සස්සු පියා මාතා පිතාච සස්සුරො – මජසං.
3. යාව අට්ඨංසු ජීවිතං – මජසං.
4. දසකම්ම කරා පෙසසා – වි.

2034. ඍෂිතුමනි, සියලු දෙනාට පළමු වැ ගෙනෙන ලද මම සුරුචි රජුගේ බිරිඳ වන අගමෙහෙසිය වෙමි. යම් කලෙක මා සුරුචි රජ ගෙනායේ ද එ තැන් සිට දසදහසක් අවුරුදු තනි ව මෙහි විසීමි.

2035. ඍෂිතුමනි, ඒ මම විදෙහ රට මියුලු නුවර සුරුචි රජතුමා කයින්, වචනයෙන් හෝ සිතින් ඉදිරියේ හෝ රහසිගත ව ඉක්මවා සිතූබව නො දනිමි.

2036. ඍෂිතුමනි, මේ සත්‍ය වචනයේ බලයෙන් මට පුතෙක් උපදීවා. බොරු කියන්නී නම් මාගේ හිස සතට පැළේවා.

2037. ඍෂිතුමනි, මන වඩන මාගේ සැමියාගේ මවපියන් මා හික්මවමින් යම්තාක් කල් ජීවත් ව සිටියාහු ද, (ඒ තාක්)

2038. ඒ මම අහිංසාවෙහි ඇලුණි කුශල ධර්මයන්හි හැසිරෙන්නී දිවා රයේ ලැසි නො වී සකසා ඔවුන්ට උවටැන් කෙළෙමි.

2039. ඍෂිතුමනි, මේ සත්‍ය වචනයේ බලයෙන් මට පුතෙක් උපදීවා. බොරු කියන්නී නම් මගේ හිස සතට පැළේවා.

2040. ඍෂිතුමනි, සමාන බිරියෝ සොළොස් දහසක් වෙත්. කිසිකලෙක ඔවුන් කෙරේ ඊර්ෂ්‍යාවක් හෝ ක්‍රොධයක් මට නො වීය.

2041. ඔවුන්ට හිත සිතින් සතුටු වෙමි. මට කිසිවකුත් අප්‍රිය නො වීය. හැම ද සියලු සපත්නීන්හට මට මෙන් අනුකම්පා කරමි.

2042. ඍෂිතුමනි, මේ සත්‍ය වචනයේ බලයෙන් මට පුතෙක් උපදීවා. බොරු කියන්නී නම් මාගේ හිස සතට පැළේවා.

2043. දසයන් කම්කරුවන් පණිවිඩ කරුවන් සහ නමා නිසා ජීවත්වන සෙස්සන් ද හැම කල්හි සතුටු ඉඳුරන් (ප්‍රිය බැල් ම හා කතා) ඇති වැ (ඔවුන්ගේ) සත්‍යභාවය දැනැ පොෂණය කරමි.

2044. ඍෂිතුමනි, මේ සත්‍ය වචනයේ බලයෙන් මට පුත්‍රයෙක් උපදීවා. බොරු කියන්නී නම් මාගේ හිස සතට පැළේවා.

2045. ශ්‍රමණයන් ද බමුණන් ද සෙසු යාචකයන් ද පිරිසුදු සිතැති ව හැම කල්හි ආහාර පානයෙන් සංග්‍රහ කරමි.

2046. එතෙන සච්චවජ්ජෙන පුත්තො උප්පජ්ජතං ඉසෙ,
මුසා මෙ භණමානාය මුද්ධා ඵලතු සත්තධා.

2047. චාතුද්දසිං පඤ්චදසිං යාව පක්ඛස්ස අට්ඨමිං,
පාටිහාරියපක්ඛඤ්ච අට්ඨඞ්ගසුසමාහිතං.
උපොසථං උපවසාමි සදා සීලෙසු සංවුතා.

2048. එතෙන සච්චවජ්ජෙන පුත්තො උප්පජ්ජතං ඉසෙ,
මුසා මෙ භණමානාය මුද්ධා ඵලතු සත්තධා.

2049. සබ්බෙව තෙ ධම්මගුණා රාජපුත්ති යසස්සිනි,
සංවිජ්ජන්ති තයි භද්දෙ යෙ ත්වං කිත්තෙසි අත්තනි.

2050. ඛත්තියො ජාතිසම්පන්නො අභිජාතො යසස්සිමා,
ධම්මරාජා විදෙහානං පුත්තො උප්පජ්ජතෙ[1] තවං[2],

2051. දුම්මි[3] රජොජල්ලධරො අසෙ වෙහාසයං ඨිතො,
මනුඤ්ඤං භාසසි[4] වාචං යං මය්හං හදයඞ්ගමං.

2052. දෙවතානුසි සග්ගම්හා ඉසිවාසි[5] මහිද්ධිකො,
කොවාසි ත්වං අනුප්පත්තො අත්තානං මෙ පවෙදය.

2053. යං දෙවසඞ්ඝා වන්දන්ති සුධම්මායං[6] සමාගතා,
සොහං සක්කො සහස්සක්ඛො ආගතොස්මි තවන්තිකෙ.

2054. ඉත්ථියො ජීවලොකස්මිං යා හොන්ති සමචාරිනී,
මෙධාවිනී සීලවතී සස්සුදෙවා පතිබ්බතා.

2055. තාදිසාය සුමෙධාය සුචිකම්මාය නාරියා,
දෙවා දස්සනමායන්ති මානුසියා අමානුසා.

2056. ත්වඤ්ච භද්දෙ සුචිණ්ණෙන පුබ්බෙ සුචරිතෙන ච,
ඉධ රාජකුලෙ ජාතා සබ්බකාමසමිද්ධිනී.

2057. අයඤ්ච තෙ රාජපුත්ති උභයත්ථ කටග්ගහො,
දෙවලොකූපපත්ති ච කිත්ති ච ඉධ ජීවිතෙ.

2058. චිරං සුමෙධෙ සුඛිනී ධම්මං පාලයමත්තනි[7],
එසාහං තිදිවං යාමි පියමෙම තව දස්සනන්ති.

6. සුරුචිජාතකං.

1. උපජ්ජතෙ – සයා.
2. තව – වි.
3. දුම්මී – මජසං, සයා.
4. භාසසෙ – මජසං, සයා.
5. ඉසිවාපි ඉසිවාපි – මජසං, සයා.
6. සුධම්මාය – මජසං, සයා.
7. ධම්මෙ මත්තනි. පාලය – වි,

2046. ඍෂිතුමනි, මේ සත්‍ය වචනයේ බලයෙන් මට පුතෙක් උපදීවා. බොරු කියන්නී නම් මගේ හිස සතට පැළේවා.

2047. දිනපතා පන්සිල්හි පිහිටි මම, තුදුස්වක, පසළොස්වක, අටවක සහ ප්‍රාතිහාර්ය පක්‍ෂය යන දවස්හි අංග අටකින් යුතු පෙහෙවස් සමාදන් වෙමි.

2048. ඍෂිතුමනි, මේ සත්‍ය වචනයේ බලයෙන් මට පුතෙක් උපදීවා. බොරු කියන්නී නම් මගේ හිස සතට පැළේවා.

2049. යසස් ඇති රාජපුත්‍රිය, (රාජදේවිය) ඔබ යම් ගුණ රැසක් ප්‍රකාශ කළෝ ද ඒ සියලු ගුණයෝ ඔබ කෙරේ විද්‍යමාන වෙති.

2050. ක්‍ෂත්‍රිය වූ කුලීන වූ අතිජාත වූ පිරිවර සහිත වූ විදෙහ රටවාසීන්ට ධර්මරාජ වූ (දැහැමිව රාජ්‍යය කරන) පුත්‍රයෙක් ඔබට උපදින්නේ ය.

2051. තවුස් වෙස් ගත් රජස්දූලි සහිත වූ සිරුර ඇති ව හිස් වූ අහසේ සිටැ යමෙක් මගේ සිත් ගන්නා මනහර බස් බෙණේ ද.

2052. ඔබ දෙව්ලොවින් පැමිණි දෙවියෙක් ද? මහත් සෘද්ධි ඇති ඍෂිවරයෙක් ද, මෙහි පැමිණි ඔබ කවර කෙනෙක් දැ යි තමා මට කියව.

2053. සුධර්මා දිව්‍ය සභාවට රැස් වූ දෙව සමූහයා යමකු වඳිත් ද දහසක් ඇස් ඇති ශක්‍ර නම් වූ ඒ මම තොප වෙත ආවෙමි.

2054. මේ ලොකයෙහි දැහැමි පැවතුම් ඇති ව නුවණින් හා සීලයෙන් යුතුව නැදිමයිලන් දෙවියන් ලෙස සිතා බුහුමන් දක්වන පතිව්‍රතා ගුණයෙන් යුක්ත ඒ ස්ත්‍රීහු වෙත් ද.

2055. එ බඳු ගුණ ඇති නැණවත් පවිත්‍ර ක්‍රියා ඇති මනුෂ්‍ය ස්ත්‍රිය දැකීමට අමනුෂ්‍ය වූ දෙවියෝ පැමිණෙත්.

2056. සොඳුර ඔබ ද පෙර පුරුදු කළ සුචරිත ධර්ම නිසා මෙ ලොවැ රජ කුලයේ ඉපිදැ සියලු සම්පතින් දියුණු වූවාහු ය.

2057. රාජපුත්‍රිය, ඔබ දෙව්ලොවෙහි ඉපදීම ද මෙලොවැ මනුෂ්‍ය වැ කීර්තිධර වීම ද යන මෙය දෙ ලොවැ ජයග්‍රහණය වේ.

2058. නැණවතිය, ඔබ සැපවත් ව තම ගුණදම් බොහෝ කල් රකුව. ඒ මම දෙව්ලොව යමි. ඔබේ දැක්ම මට ප්‍රිය ය.

6. සුරුචි ජාතක යි.

2059. අප්පොස්සුක්කොදානි තුවං කපොත
විහඞ්ගම න තව භොජනත්ථො,
ඛුද්දං පිපාසං අධිවාසයන්තො
කස්මා භවං පොසථිකො කපොතො[1].

2060. අහං පුරෙ ගිද්ධිගතො කපොතියා
අස්මිං පදෙසස්මිං උභො රමාම,
අථග්ගහී සාකුණිකො කපොතිං
අකාමකො තාය විනා අහොසිං.

2061. නානාභවා[2] විප්පයොගෙන තස්සා
මනොමයං වෙදනං වෙදියාමි[3],
තස්මා අහං පොසථං[4] පාලයාමි
රාගො මමං මා පුනරාගමාසි.

2062. අනුජ්ජුගාමී උරග[5] විජිව්හ
දාඨාවුධො ඝොරවිසොසි සප්ප,
ඛුද්දං පිපාසං අධිවාසයන්තො
කස්මා භවං පොසථිකො නු දීඝො.

2063. උසභො අහූ බලවා ගාමිකස්ස
චලක්කකු වණ්ණබලූපපන්නො
මං අක්කමි තං කුපිතො අඩංසිං[6].
දුක්ඛාභිතුන්නො මරණං උපාගමි[7].

2064. තතො ජනා නික්ඛමිත්වාන ගාමා
කන්දිත්වා රොදිත්වා අපක්කමිංසු,
තස්මා අහං පොසථං පාලයාමි
කොධො මමං මා පුනරාගමාසි.

2065. මතාන[8] මංසානි බහූ සුසානෙ
මනුස්සරූපං තව භොජනෙතං,
ඛුද්දං පිපාසං අධිවාසයන්තො
කස්මා භවං පොසථිකො සිගාලො[9].

---

1. කපොට - වි.
2. නානාභාව - ස්‍යා.
3. වෙදයාමි - මජසං, ස්‍යා.
4. පොසථ - මජසං, ස්‍යා.
5. උරග දුජිව්හ මජසං, උරගා දූජිම්හා - ස්‍යා.
6. අණ්ඩජිං - වි.
7. උපාගා - මජසං, ස්‍යා.
8. මතානං - මජසං, වි.
9. සිඞ්ගාලො - වි,

2059. පරෙවිය, දූන් ඔබ ආහාරයට ආසා නැත්තෝ ය. ඔබට ආහාරයෙන් ප්‍රයොජනයක් නැත්තේ ද? පින්වත් පරෙවියා සා පිපාසා ඉවසමින් පෙහෙවස් රක්නේ කිම?

2060. තවුසාණෙනි, මම පෙර පරෙවි දෙනක හා බැඳී ගියෙමි. මේ පෙදෙසේ අපි දෙදෙනා ප්‍රෙමයෙන් වුසූමු. එකලැ කුරුල්ලෙක් (උකුස්සෙක්) පරෙවි දෙන අල්ලා ගති. නො කැමැත්-තෙන් මම ඇගෙන් වෙන් වීමි.

2061. ඇගේ නැතිවීම නිසා උපන් විරහ දුකින් සිත් වේදනා විඳිමි. එහෙයින් මම පෙහෙවස් රකිමි. රාගය මට නැවත නො පැමිණේවා.

2062. සෘජුව ගමන් නො කරන උරගයකු වූ දෙ දිව් ඇති සර්පය, ඔබ දළ අවි කොට ඇති දරුණු විෂ ඇත්තෙහි ය. පින්වත් සර්පයා සා පවස් ඉවසමින් පෙහෙවස් රක්නේ කවර හෙයින් ද?

2063. චලනය වන මොල්ලියක් ඇති වර්ණයෙන් හා බලයෙන් යුක්ත වූ වෘෂභයෙක් ග්‍රාමභොජකයාට විය. ඌ මා මැඩ පී හෙයින් කිපුණු මම ඌ ඩැසීමි. දුකට පැමිණි ගවයා මරණයට පත් විය.

2064. ඉක්බිති ගම්වැසියෝ නික්ම අවුත් හඬා වැලැපැ ගියාහු ය. එහෙයින් මම පෙහෙවස් රකිමි. මට නැවත ක්‍රොධය නො පැමිණේවා.

2065. සොහොනෙහි මළවුන්ගේ මස් බොහෝ ඇත. මේ ආහාරය තොපගේ සිත් ගන්නේ ය. පින්වත් ශෘගාලය, සා පවස් ඉවසමින් පෙහෙවස් රක්නේ කිම?

2066. පවිස්ස[1] කුච්ඡිං මහතො ගජස්ස
කුණපෙ රතො හත්ථීමංසෙ පගිද්ධො,
උණ්හො ච වාතො තිඛිණා ච රස්මියො
තෙ සොසයුං තස්ස කරීසමග්ගං.

2067. කිසො ච පණ්ඩු ච අහං හදන්ත[2]
න මෙ අහු නික්ඛමනාය මග්ගො,
මහා ච මෙඝො සහසා පවස්සි
සො තෙමයී තස්ස කරීසමග්ගං.

2068. තතො අහං නික්ඛමිස්සං හදන්ත
චන්දො යථා රාහුමුඛා පමුත්තො,
තස්මා අහං පොසථං පාලයාමි
ලොභො මමං මා පුනරාගමාසි.

2069. වම්මිකථූපස්මිං කිපිල්ලිකානි
නිපොථයන්තො තුවං පුරෙ චරාසි,
ඛුදං පිපාසං අධිවාසයන්තො
කස්මා භවං පොසථිකො නු අජ්ජ.

2070. සකං නිකෙතං අතිහීලයානො[4]
අත්‍රිච්ඡතාය මලතං[5] අගඤ්ඡිං,
තතො ජනා නික්ඛමිත්වාන ගාමා
කොදණ්ඩකෙන පරිපොථයිංසු මං

2071. සො භින්නසීසො රුහිරමක්ඛිතඞ්ගො
පච්චාගමාසිං සකං[6] නිකෙතං,
තස්මා අහං පොසථං පාලයාමි
අත්‍රිච්ඡතා මා පුනරාගමාසි.

2072. යං නො අපුච්ඡිත්ථ තුවං හදන්ත
සබ්බෙව ව්‍යාකරිම්හ යථාපජානං,[7]
මයම්පි පුච්ඡාම තවං හදන්ත[8]
කස්මා භවං පොසථිකො නු බ්‍රහ්මෙ.

2073. අනූපලිත්තො මම අස්සමම්හි
පච්චෙකබුද්ධො මුහුත්තං නිසීදි,
සො මං අවෙදි ගතිමාගතිඤ්ච
නාමඤ්ච ගොත්තං චරණඤ්ච සබ්බං.

---

1. පවිස-මජසං.
2. හද්දන්ත – මජසං.
3. මංසෙසු – මජසං, සයා.
4. අතිහෙළයානො – මජසං, සයා.
5. මලලයතං – මජසං.
6. සසකං – මජසං, සයා.
7. ජානනං – වී.
8. තුවං ම. හද්දන්ත – මජසං, වී.

2066. ඇත්කුණට තදින් ඇලුණේ ඇත් මසට ඉතා ගිජු වැ මහත් ඇත්කුසට වැදුණෙමි. උණුසුම් වාතයත් දැඩි රශ්මියත් ඇතාගේ ඒ මල මහ වියළූ.

2067. ස්වාමීනි, මම කෘශ වීමි. පඬු පැහැ වීමි. නික්මෙන්නට එහි මට මගෙක් නො වී ය. මහ වැස්සක් හදිසියේ වැස්සේ ය. එය උගේ මලමඟ තෙමී ය.

2068. ස්වාමීනි, ඉක්බිති මම රාහු මුවෙන් මුත් සඳ සේ එයින් පිටවීමි. එ හෙයින් මම පෙහෙවස් රකිමි. ලොභය නැවැත මට නො පැමිණේවා.

2069. පෙර තෙපි හුඹස් වේයන් බුදිමින් හැසිරුණවු ය. පින්වත් වලසාණෙනි, දැන් සා පවස් ඉවසමින් පෙහෙවස් රක්නේ කිම?

2070. සිය නිවෙස වූ වන ලැහැබට නිගා කරමින් ආශා අධික හෙයින් මලය පෙදෙසට ගියෙමි. ගම්වැසියෝ එයින් නික්මැ අවුත් දුනු දඬුවලින් හා මුගුරුවලින් මට තැළූහ.

2071. බිඳුණු හිසත් ලේ තැවැරුණ සිරුරත් ඇති මම සිය නිවෙසට ආපසු ආවෙමි. එහෙයින් මම පෙහෙවස් රකිමි. අධික ආශාව මට නැවැත නො පැමිණේවා.

2072. ස්වාමීනි, ඔබ වහන්සේ අපෙන් යමක් විතාළෝ ද අපි හැම දන්නා පරිද්දෙන් හෙළි කෙළෙමු. ස්වාමීනි, අපි දූ ඔබ වහන්සේ විතාරමු. පින්වත් ඔබ වහන්සේ පෙහෙවස් රක්නේ කිම?

2073. කෙලෙස් නො වැකුණ පසේ බුදුන් වහන්සෙ නමක් මගේ අසපුවෙහි මොහොතක් වැඩහුන් සේක. උන් වහන්සේ මට යායුතු තැන ද පැමිණි තැන ද නම් ගොත් ද චරණ දහම් ද යන සියල්ල දෙසූ සේක.

2074. එවම්පහං නගගහෙ තස්ස පාදෙ
න චාපි නං මානගතෙන පුච්ඡිං,
තස්මා අහං පොසථං පාලයාමි
මානො මමං මා පුනරාගමාසීති.

7. පඤ්චුපොසථජාතකං.

2075. සචෙ හි ත්‍යාහං ධනහෙතු ගහිතො
මා මං වධි ජීවගාහං ගහෙත්වා,
රඤ්ඤො ච මං සම්ම උපෙනති නෙහි
මඤ්ඤෙ ධනං ලච්ඡසි නප්පරූපං.

2076. න මෙ අයං තුම්හෙ[1] වධාය අජ්ජ
සමාහිතො චාපවරෙ ඛුරප්පො,
පාසඤ්ච ත්‍යාහං අධිපාතයිස්සං
යථා සුඛං ගච්ඡතු මොරරාජා.

2077. යං සත්ත වස්සානි මමානුබන්ධි
රත්තින්දිවං ඛුප්පිපාසං සහන්තො,
අථ කිස්ස මං පාසවසූපනීතං
පමුත්තවෙ ඉච්ඡසි බන්ධනස්මා.

2078. පාණාතිපාතා විරතොනුසජ්ජ
අභයං නු තෙ සබ්බභූතෙසු දින්නං,
යං මං තුවං පාසවසූපනීතං,
පමුත්තවෙ ඉච්ඡසි බන්ධනස්මා.

2079. පාණාතිපාතා විරතස්ස බ්‍රෑහි
අභයඤ්ච යො සබ්බභූතෙසු දෙති,
පුච්ඡාමි තං මොරරාජෙතමත්ථං
ඉතො චුතො කිං ලභතෙ සුඛං සො.

2080. පාණාතිපාතා විරතස්ස බ්‍රෑමි
අභයඤ්ච යො සබ්බභූතෙසු දෙති,
දිට්ඨෙව ධම්මෙ ලභතෙ පසංසං
සග්ගඤ්ච සො යාති සරීරභෙදා.

2081. න සන්ති දෙවා ඉච්චාහු එකෙ
ඉධෙව ජීවො විභවං උපෙති,
තථා ඵලං සුකතදුක්කතානං
දත්තුපඤ්ඤත්තඤ්ච[2] වදන්ති දානං.
තෙසං වචො අරහතං සද්දහානො
තස්මා අහං සකුණෙ බාධයාමි.

---

1. තුය්හ - මජසං, වි.
2. දත්තූ - මජසං.

2074. මෙසේ වුවත් මම උන්වහන්සේගේ පා නො වැන්දෙමි. උඩඟු සිතින් උන්වහන්සේ නො විතාළෙමි. එහෙයින් මම පෙහෙවස් රකිමි. මානය මට යළිත් නො පැමිණේවා.

7. පංචුපොසථ ජාතක යි.

2075. මිතුර, මා වස්තුව ලබාගනු සඳහා අල්ලා ගත්තේ නම්, මා නො මරා ජීවග්‍රාහයෙන් රජු සමීපයට ගෙන යව. එ කලැ බොහෝ වස්තුව ලබන්නෙහිය යි හඟිමි.

2076. මොනර රජුනි, මේ ඊය ඔබ නසන්නට දුන්නෙහි තැබුයෙම් නො වෙමි. ඔබ අසු වැ සිටින මලපුඩුව සිඳින්නට තැබුවේ වෙමි. මොනර රජ සුවසේ යේවා.

2077. සත් වසක් මුළුල්ලේ දිවාරැහි සා පවස් ඉවසමින් යම් හේතුවක් නිසා මා ලුහුබැන්දෙහි. පුඩුවේ බැඳුණ මා ඉන් මුදන් නට කුමට කැමැති වෙහි ද?

2078. තෙපි ප්‍රාණඝාතයෙන් වැළකුණවු ද? සර්වසත්නට අභය දෙන ලද්දවු ද? පුඩුවට අසු වී සිටින මා බැම්මෙන් මුදන්නට කැමැති වන්නවූ ද?

2079. මොනර රජුනි, යමෙක් ප්‍රාණඝාතයෙන් වැළැකුණේ ද, සියලු සතුන්හට අභය දනය දේ ද, හේ මෙ ලොවින් ච්‍යුත වූ පසු කෙ බඳු සැපතක් ලබා ද? මේ කරුණ විචාරමි.

2080. යමෙක් ප්‍රාණඝාතයෙන් වැළකුණේ ද සර්වසත්නට අභය දනය කෙරේ ද හෙතෙම මේ ජීවිතයේදී ම පැසසුම් ලබයි. මරණින් මත්තේ දෙව්ලොවට යයි.

2081. ඇතැම් කෙනෙක් දෙවියෝ නැතැ යි කියති. ප්‍රාණය මෙ ලොව ම නැසේය යි ද පින් පව්හි විපාක නැතැ යි ද දනය මෝඩයන් පනවා ගත්තකැ යි ද කියති. රහතුන්ගේ ඒ කීම අදහන මම පක්ෂීන් මරමි.

2082. චන්දො ච සුරියො ච උභො සුදස්සනා
ගච්ඡන්ති ඔභාසයමන්තලික්ඛෙ,
ඉමස්ස ලොකස්ස පරස්ස වා තෙ
කථන්නු තෙ ආහු මනුස්සලොකෙ.

2083. චන්දො ච සුරියො ච උභො සුදස්සනා
ගච්ඡන්ති ඔභාසයමන්තලික්ඛෙ,
පරස්ස ලොකස්ස න තෙ ඉමස්ස
දෙවාති තෙ ආහු මනුස්සලොකෙ.

2084. එත්ථෙව තෙ නිහතා හීනවාද
අහෙතුකා යෙ න වදන්ති කම්මං,
තථා ඵලං සුකතදුක්කතානං
දත්තූ[1] පඤ්ඤත්තං යෙ ච වදන්ති දානං.

2085. අද්ධා හි සච්චං වචනං තවෙතං
කථං හි දානං අඵලං වදෙය්‍ය,
තථා ඵලං සුකතදුක්කතානං
දත්තූපඤ්ඤත්තස්ස කථං භවෙය්‍යා

2086. කථංකරො කින්තිකරො කිමාචරං
කිං සෙවමානො කෙන තපොගුණෙන,
අක්ඛාහි[2] මෙ මොරරාජෙතමත්ථං[3]
යථා අහං නො නිරයං පතෙය්‍යං.

2087. යෙ කෙචි අත්ථි සමණා පථව්‍යා[4]
කාසාවවත්ථා අනගාරියා[5] තෙ,
පාතොව පිණ්ඩාය චරන්ති කාලෙ
විකාලචරියා විරතා හි සන්තො.

2088. තෙ තත්ථ කාලෙනුපසඞ්කමිත්වා
පුච්ඡෙසි[6] යං තෙ මනසො පියං සියා,
තෙ තෙ[7] පවක්ඛන්ති යථා පජානං
ඉමස්ස ලොකස්ස පරස්ස චත්ථං.

2089. තචංව ජිණ්ණං උරගො පුරාණං
පණ්ඩුපලාසං හරිතො දුමොව,
එසප්පහීනො මම ලුද්දභාවො
පජහා[8]මහං ලුද්දකභාවමජ්ජ.

---

1. දත්තු - මජසං.
2. අක්ඛාහි තං දිජ - මජසං.
3. රාජ-තමත්ථං - මජසං.
4. පථබ්‍යා - මජසං.
5. කාසාය වත්ථා අනගාරියං චරන්ති - මජසං, සයා.
6. පුච්ඡ හි - මජසං.
7. තං - මජසං, සයා.
8. ජහා - මජසං, සයා.

2082 දකුම් කලු වූ සඳ හිරු දෙදෙන බබළමින් අහසේ ගමන් කරති. ඔව්හු මෙ ලොවට අයිති වෙත් ද නැතහොත් පරලොවට අයිති ද? ඒ විමන්හි දිව්‍ය පුත්‍රයෝ කෙසේ වෙත්දැයි මිනිස්ලොවැ කියත් ද?

2083. දකුම් කලු වූ සඳ හිරු දෙදෙන බබළමින් අහසේ ගමන් කරති. ඔව්හු පරලොවට අයත් වෙති. මෙ ලොවට අයත් නො වෙති. මිනිස්ලොවැ ඔව්හු දෙවියෝ යයි කියති.

2084. යම් කෙනෙක් අහෙතුකවාදී වෙත් ද පුණ්‍ය පාප කර්මයන්ගේ විපාකය හෙවත් පිරිසුදු අපිරිසුදු බවට හෙතු වන කර්‍ම නැතැ යි කියත් ද, දන් දීම මෝඩයන් විසින් පැනැවූවකැ යි කියත් ද ඒ මහණ බමුණෝ මේ කරුණෙහි නැසුණෝ වෙත්.

2085. තොපගේ මේ කීම එකාන්තයෙන් සත්‍යයෙකි. දනය විපාක නැතැ යි කියන්නේ කෙසේ ද? එසේ සුකෘත දුෂ්කෘත-යන්ගේ පල විපාක මෝඩයන් පැනැවූවක් වන්නේ කෙසේ ද?

2086. මොනර රජුනි, කුමක් කරන්නේ කෙසේ කරන්නේ කුමක හැසිරෙන්නේ කුමක් සේවනය කරන්නේ කෙබඳු තවුස් ගුණයක් නිසා නිරයේ නො වැටෙම් ද එයට උපදෙස් කියව.

2087. මෙ ලොවැ යම් ශ්‍රමණ කෙනෙක් වෙත් ද කසාවත දරන අනගාරික වූ නො කල්හි හැසිරීමෙන් වැළැකී ඒ සත්පුරුෂයෝ (පසේ බුදුවරු) උදසන්හි සුදුසු කාලයෙහි පිඬුසිඟා වඩිති.

2088. සුදුසු කලැ උන්වහන්සේ වෙතැ එළඹැ තොප කැමැති යමක් වේ නම් එය අසව. උන් වහන්සේ මෙලොව පරලොව දියුණුව දන්නා ආකාරයෙන් ප්‍රකාශ කරත්.

2089. සර්පයකු දිරාපත් වූ පැරැණි හැවය හරනා සේ, රුක තැනින් තැන ඇති පඬුවන් පැහැති පත් ඉවත් කරන්නා සේ මම ද අද මගේ රුදුරු ගතිය හරිමි. මේ මගේ රුදුරු ගතිය ප්‍රහීණ ය.

2090. යෙ චාපි මෙ සකුණා අඤ්ඤේ බද්ධා[1]
සතානි නෙකානි නිවෙසනස්මිං,
තෙසං පහං[2] ජීවිතං අජ්ජ දම්මි
මොක්ඛඤ්ච තෙ පත්තො[3] සකං නිකෙතං.

2091. ලුද්දො චරී පාසහත්ථො අරඤ්ඤෙ
බාධෙතුං[4] මොරාධිපතිං යසස්සිං
බන්ධිත්වා[5] මොරාධිපතිං යසස්සිං
දුක්ඛා පමුච්චි[6] යථාහං පමුත්තොති.

8. මහාමොරජාතකං.

2092. යදෙසමානා විචරිම්හ පබ්බතානි වනානි ච,
අන්වෙසං විචරිං[7] ඤාතී[8] තෙමෙ අධිගතා මයා.

2093. බහුං ඉදං[9] මූලඵලං භක්ඛො චායං අනප්පකො,
රම්මා චිමා ගිරී නදියො ඵාසු වාසො භවිස්සති.

2094. ඉධෙවාහං වසිස්සාමි සහ සබ්බෙහි ඤාතිහි,
අප්පොස්සුක්කො නිරාසඞ්කී අසොකො අකුතොභයො.

2095. අඤ්ඤං හි ලෙනං[10] පරියෙස සත්තු නො ඉධ විජ්ජති,
සො තච්ඡ සූකරෙ හන්ති ඉධාගන්ත්වා වරං වරං.

2096. කොනම්හාකං ඉධ සත්තු කො ඤාතී සුසමාගතෙ,
අප්පධංසෙ පධංසෙති තම්මෙ අක්ඛාථ පුච්ඡිතා.

2097. උද්ධග්ගරාජී මිගරාජා බලී දාඨාවුධො මිගො,
සො තච්ඡ සූකරෙ[11] හන්ති ඉධාගන්ත්වා වරං වරං.

2098. න නො දාඨා න විජ්ජන්ති බලං කායෙ සමූහතං[12],
සබ්බෙ සමග්ගා හුත්වාන වසං කාහාම එකකං.

2199. හදයඞ්ගමං කණ්ණසුඛං වාචං භාසසි තච්ඡක,
යොපි යුද්ධෙ පලායෙථ[13] තම්පි පච්ඡා හනාමසෙ.

---

1. බන්ධා - මජසං, සයා.
2. තෙසං අහං - මජසං, සයා.
3. පත්තා - මජසං.
4. බාධෙතු - මජසං, සයා.
5. බන්ධිත්වා - මජසං, සයා.
6. දුක්ඛා පමුඤ්ච මජසං. සපමොචි - සයා, වි.
7. විපුලෙ - මජසං, සයා.
8. ඤාතිං - මජසං, වි.
9. බහුඤ්චිදං - මජසං, වි.
10. නජ්ජො - මජසං, සයා.
11. සූකරං- වි
12. සමොහතං - මජසං, සයා.
13. පලායෙය්‍යු. සයා. පාලයෙථ- මජසං.

2090. මා විසින් බඳින ලද සිය ගණන් පක්ෂීන් නිවෙසේ ඇද්ද ඔවුනටත් මම අද ජීවිත දානය දෙමි. මම නිවනට පැමිණියෙමි. ඒ සත්‍ය බලයෙන් සියලු සත්ත්වයෝ තමන් වසන තැන්වලට යෙත්වා.

2091. යසස් ඇති මොනර රජ බැඳ ගන්නට, පුඩු අතැ'ති වැද්දෙක් වනයෙහි හැසුරුණේ ය. යසස් ඇති මොනර රජ බැඳ යම්සේ දුකින් මිදුණේ ද, එසේ මම ද දුකින් මිදුණෙමි.

8. මහාමොර ජාතක යි.

2092. යම් ඥාති සමූහයක් සොයමින් අපි පර්වතයන්හි ද වනාන්තරයන්හි ද හැසුරුණෙමු ද (යම්) කෙනකු ඥාතීන් සොයමින් හැසුරුණෙම්ද? මා විසින් ඔවුහු ලබන ලදහ.

2093. මේ අල වර්ග ද ගෙඩි වර්ග ද බොහෝ ය. කෑ යුතු දෙය ද බොහෝ ය. මේ පර්වත නදීහු මනරම් වෙති. වාසයට පහසු තැනක් වන්නේ ය.

2094. වෑයම් රහිත වැ නිසැක වැ ශොක රහිත වැ බියක් නැති වැ සියලු ඥාතීන් සමග මම මෙහි ම වසන්නෙමි.

2095. තච්ඡ සූකරය, වෙන ලෙනක් සොයව. මෙහි අපට සතුරෙක් සිටී. හේ මෙහි අවුත් වැඩුණු මසැති හොඳ හොඳ ඌරන් මරයි.

2096. මෙහි අපගේ සතුරා කවරෙක් ද? නැසිය නොහැකි ලෙස එක්වූ ඥාතීන් කවරෙක් නසා ද? විචාරන ලද මට එය කියව.

2097. තච්ඡය, උඩට ගිය ඉරි සහිත මෘගරාජයකු වූ බල ඇත්තා වූ දළ මැ අවි කොට ගත් ව්‍යාඝ්‍රයෙක් වේ. හේ මෙහි අවුත් වැඩුණු මසැති හොඳ හොඳ ඌරන් මරයි.

2098. අපි දළ නැත්තෝ නො වෙමු. බලය සිරුරේ ඇත. හැම දෙන එකතු වැ තනි වූ ඔහු යටත් කරමු.

2099. තච්ඡකය, හිතට වදින කනට මිහිරි වචනයක් කියහි. සටනෙහි අපෙන් යමෙක් පලා ගියොත් පසුව ඔහුත් නසන්නෙමු.

2100. පාණාතිපාතා විරතො නු අජ්ජ
අභයං නු තෙ සබ්බභූතෙසු දින්නං,
දයා නු තෙ මිග විරියං න සන්ති
යො සඞ්ඝපත්තො කපණොව ඣායසි.

2101. න මෙ දයා න විජ්ජන්ති
බලං කායෙ සමූහතං,
ඤාතී ච දිස්වාන සමග්ගි[1]එකතො
තස්මා ඣායාමි වනම්හි එකතො

2102. ඉමස්සුදං යන්ති දිසොදිසං පුරෙ
භයද්දිතා[2] ලෙනගවෙසිනො පුථූ,
තෙදානි සඞ්ගම්ම වසන්ති[3] එකතො
යත්ථට්ඨිතා දුප්පසහජ්ජ තෙ මයා.

2103. පරිණායකසම්පන්නා සහිතා එකවාදිනො[4]
තෙ මං සමග්ගා හිංසෙය්‍යුං තස්මා තෙසං න පත්ථයෙ[5].

2104. එකොව ඉන්දො අසුරෙ ජිනාති
එකොව සෙනො හන්ති දිජෙ පසය්හ,
එකොව ව්‍යග්ඝො[6] මිගසඞ්ඝපත්තො
වරං වරං හන්ති බලං හි තාදිසං.

2105. නහෙව ඉන්දො න සෙනො නපි ව්‍යග්ඝො මිගාධිපො,
සමග්ගෙ සහිතෙ ඤාතී ව්‍යග්ඝෙස[7] ච කුරුතෙ වසෙ.

2106. කුම්භිලකා සකුණිකා[8] සඞ්ඝිනො ගණචාරිනො,
සම්මොදමානා එකජ්ඣං උප්පතන්ති ඩයන්ති ච[9]

2107. තෙසඤ්ච ඩයමානානං එකෙත්ථ අපවත්තති[10],
තඤ්ච[11] සෙනො නිතාළෙති වෙය්‍යග්ගියෙව සා ගති.

2108. උස්සාහිතො ජටිලෙන[12] ලුද්දෙනාමිසචක්ඛුනා,
දයී දයිස්සු පක්ඛන්දි මඤ්ඤමානො යථාපුරෙ.

2109. සාධු සම්බහුලා ඤාතී අපි රුක්ඛා අරඤ්ඤජා,
සූකරෙහි සමග්ගෙහි ව්‍යග්ඝො එකායනෙ[13] හතො

---

1. සමග්ගි - මජ්ඣං, වි.
2. භයට්ටිතා - මජ්ඣං, ස්‍යා.
3. සරන්ති - වි.
4. වාරිකො - අ.
5. තෙසං අපත්ථයෙ - වි.
6. බ්‍යග්ඝො - මජ්ඣං, ස්‍යා.
7. නව්‍යග්ඝො ස්‍යා. ව්‍යග්ඝෙනාන - මජ්ඣං.
8. සකුණිකා - මජ්ඣං, ස්‍යා.
9. දමන්තිච - වි.
10. අපසක්කති - මජ්ඣං.
11. තං - වි.
12. ජටිලකෙන - වි.
13. එකායතනෙ - මජ්ඣං.

2100. අද ප්‍රාණඝාතයෙන් වැළකුණෙහි ද? සර්වසත්නට අභය දෙන ලද ද? නුඹේ දළ නැද්ද? මෘග බල නැද්ද? සූකර සමූහයා මැදට පැමිණ කුමක් සිතන්නේ ද?

2101. මගේ දළ නැත්තේ නො වෙයි. සිරුරේ ශක්තිය ඇත. සමගි සම්පන්නව එක් වූ නෑයන් දුටු හෙයින් තනි ව වනයෙහි කල්පනා කරමි.

2102. පෙර මොහු බියපත් වැ වෙන් වෙන් වැ ලෙන් සොයා දිසාවෙන් දිසාවට යති. දැන් ඔහු එක්තැන් ව වෙසෙති. මා විසින් අද ඔවුන් මැඩලන්නට හැකි නො වේ.

2103. නායකයකු ඇති ව එක්සත් වූ සමගි කතා ඇති ඒ සියල්ලෝ මට හිංසා කරන්නාහ. එහෙයින් අද මම ඔවුන් නො පතමි.

2104. හුදෙකලා ව ශක්‍රයා අසුරයන් දිනයි. හුදෙකලාව උකුස්සා පක්ෂීන් නස යි. හුදෙකලා ව ව්‍යාඝ්‍රයා මෘග සමූහයා වෙත පැමිණ වැඩුණු මසැති හොඳ හොඳ ඌරා මර යි. බලය නම් එබඳු ය.

2105. සමගි වූ නෑයන් ඇති ව ව්‍යාඝ්‍රයන් බඳු වූවන් ශක්‍රයා ද වසඟ නො කරන්නේ ය. උකුස්සා ද වසඟ නො කරන්නේ ය. මෘගාධිපති ව්‍යාඝ්‍රයා ද වසඟයෙහි පවත්වා ගන්නට නො හැක්කේ ය.

2106. පිරිවරා ගත් සමූහය සමග හැසිරෙන කුම්භිලක පක්ෂීහු ප්‍රීත වෙමින් එක් වැ ගොදුරු සොයමින් අහසින් යති.

2107. අහසින් යන ඔවුන්ගෙන් (යම්) කුරුල්ලෙක් ඉවත්ව යේ ද උකුස්සා ඌ පැහැර ගනී. ව්‍යාඝ්‍රයන්ගේ ස්වභාවයත් මෙය යි.

2108. ආමිෂ ලොලයකු වූ රෞද්‍ර ඇස් ඇති ජටිලයා විසින් උනන්දු කරන ලද දළ සහිත ව්‍යාඝ්‍රයා පෙර සේ සිතමින් දළ ඇති ඌරන් වෙත පැන්නේ ය.

2109. නෑයන් බොහෝ වීම යහපත් වේ. වනයෙහි රුක් බොහෝ වීම යහපත් වේ. සමගි වූ ඌරන් විසින් එක් වරකින් ම ව්‍යාඝ්‍රයා නසනු ලැබී ය.

2110. බ්‍රාහ්මණඤ්චෙව ව්‍යග්ඝඤ්ච උභො හන්ත්වාන සූකරා,
ආනන්දිනො පමුදිතා[1] මහානාදඤ්ච නාදිසුං.

2111. තෙ[2]සු උදුම්බරමූලස්මිං සූකරා සුසමාගතා,
තච්ඡකං අභිසිඤ්චිංසු ත්වං නො රාජාසි ඉස්සරොති.

9. තච්ඡසූකරජාතකං.

2112. වාණිජා සමිතිං කත්වා නානාරට්ඨතො ආගතා,
ධනාහාරා පක්කමිංසු එකං කත්වාන ගාමණිං.

2113. තෙ තං කන්තාරමාගම්ම අප්පභක්ඛං අනොදකං,
මහානිග්‍රොධමද්දක්ඛුං සීතච්ඡායං මනොරමං.

2114. තෙ ච තත්ථ නිසීදිත්වා තස්ස රුක්ඛස්ස ඡාදියා[3],
වාණිජා සමචින්තෙසු බාලා මොහෙන පාරුතා.

2115. අද්දායතෙ[4] අයං රුක්ඛො අපි වාරි ච[5] සන්දති,
ඉඞ්ඝස්ස පුරිමං සාඛං මයං ඡින්දාම වාණිජා.

2116. සා ච ඡින්නාව පග්ඝරි අච්ඡං වාරිං[6] අනාවිලං,
තෙ තත්ථ නහාත්වා ච පිවිත්වා ච යාවතිච්ඡිංසු වාණිජා.

2117. දුතියං සමචින්තෙසුං බාලා මොහෙන පාරුතා,
ඉඞ්ඝස්ස දක්ඛිණං සාඛං මයං ඡින්දාම වාණිජා.

2118. සා ච ඡින්නාව පග්ඝරි සාලිමංසොදනං බහුං,
අප්පොදවණ්ණෙ කුම්මාසෙ[7] සිඞ්ගිං[8] බිදල සූපියො.

2119. තෙ තත්ථ භුත්වා ඛාදිත්වා[9] යාවතිච්ඡිංසු වාණිජා,
තතියං සමචින්තෙසුං බාලා මොහෙන පාරුතා.

2120. ඉඞ්ඝස්ස පච්ඡිමං සාඛං මයං ඡින්දාම වාණිජා,
සා ච ඡින්නාව පග්ඝරි නාරියො සමලඞ්කතා.

2121. විචිත්‍රවත්ථාභරණා[10] ආමුත්තමණිකුණ්ඩලා,
අපිසු වාණිජා එකා නාරියො පණ්ණවීසති.

2122. සමන්තා පරිකරිංසු[11] තස්ස රුක්ඛස්ස ඡාදියා,
තෙ තාහි පරිචාරෙසුං[12] යාවතිච්ඡිංසු වාණිජා.

1. පමොදිතා – මජසං, සයා.
2. තෙ – මජසං, සයා.
3. ඡායාය – මජසං.
4. අලලායතෙ – මජසං, සයා.
5. වාරිව – මජසං, සයා.
6. වාරී – මජසං, සයා.
7. කුම්මාසෙ – මජසං.
8. සිඞ්ගිවෙරං ලසුපියො මජසං. – සිඞ්ගිවිල්ලඳ සූපියො – සයා.
9. පිවිත්වා – වි.
10. විචිත්ත මජසං, විචිත්‍රා – සයා.
11. පරිවාරිංසු – මජසං.
12. පරිවාරෙත්වා – සයා. පරිචාරෙත්වා - අට්ඨකථා

2110. බ්‍රාහ්මණයා ද ව්‍යාඝ්‍රයා ද යන දෙදෙන නසා ඌරෝ සතුටු වැ ඉතා සතුටු වැ මහානාද පැවැත්වූහ.

2111. දිඹුල්ගස මුලැ ඌරෝ රැස් වැ තෙපි අපගේ අධිපති රජ වව යි තච්ඡක ඌරා අභිෂෙක කළහ.

9. තච්ඡසූකර ජාතක යි.

2112. නොයෙක් රටවලින් පැමිණි වෙළෙන්දෝ රැස් වැ එකකු ප්‍රධානයා ලෙස පත් කොට ධනය ගෙන වෙළඳාමට ගියහ.

2113. ඒ වෙළෙන්දෝ ආහාරයත් ජලයත් නැති කාන්තාර-යකට අවුත් මනරම් සිහිල් සෙවණ සහිත මහනුගරුකක් දුටහ.

2114. අවිද්‍යාවෙන් වැසුණ (මනසැති) මෝඩ ඒ වෙළෙන්දෝ නුගරුක් සෙවණෙහි හිඳ මෙසේ සිතූහ.

2115. වෙළෙඳුනි, මේ ගස තෙත් සහිත සේ ය. ජලය ද වැගිරේ. එහෙයින් ගසේ පළමුවන අත්ත අපි කපමු යි.

2116. ඒ අත්ත කැපීමත් සමග පවිත්‍ර වූ බොර නො වූ ජලය වැගිරුණේ ය. ඒ වෙළෙන්දෝ කැමැති තාක් ජලය නහා බී සතුටු වූහ.

2117. මොහයෙන් වැසුණ (මනසැති) මෝඩ ඒ වෙළෙන්දෝ දෙවන වර මෙසේ සිතූහ. අපි ගසේ දකුණු අත්ත කපමුයි.

2118. ඒ අත්ත කැපීමත් සමග මස් සහිත ඇල්හාලේ බත් ද දිය නුමුසු කිරිබත් වැනි කොමුපිඩු ද අවුළපත් ද මුං ආදි සූප ද වැගිරුණේ ය.

2119. මොහයෙන් වැසුණ මෝඩ ඒ වෙළෙන්දෝ කැමැති පමණ අනුභව කොට තෙවනු ව මෙසේ සිතූහ.

2120. වෙළෙඳුනි, අපි මේ ගසේ බටහිර දෑසට ගිය අත්ත ද කපමු යි. ඒ අත්ත කැපීමත් සමග සැරසුණ ස්ත්‍රීහු වැගිරුණාහ.

2121. එක් එක් වෙළඳකුට විසිතුරු වත් පැළැඳි, මිණි කොඩොල් ආදි අබරණින් සැරසුණ එක් එක් ස්ත්‍රියක් ද ගැල් නායකයාට පස්විසි ස්ත්‍රී කෙනෙක් ද ලැබිණි.

2122. ඒ රැක් සෙවණ වටා රැස් වූ ඒ වෙළෙන්දෝ ස්ත්‍රීන් සමග රිසි සේ සතුටු වූහ.

2123. චතුත්ථං සමචින්තෙසුං බාලා මොහෙන පාරුතා
ඉඩඝාසස උත්තරං සාඛං මයං ඡින්දාම වාණිජා.

2124. සා ච ඡින්නාව පග්ඝරි මුත්තා වෙළුරියෙ බහූ,
රජතං ජාතරූපඤ්ච කුත්තියො පාටියානි ච.

2125. කාසිකානි ච වත්ථානි උද්දියානෙ ච කම්බලෙ[1],
තෙ තත්ථ භාරෙ බන්ධිත්වා යාවතිච්ඡිංසු වාණිජා.

2126. පඤ්චමං සමචින්තෙසුං බාලා මොහෙන පාරුතා,
ඉඩඝසස මූලං ඡින්දාම අපි භීයො ලභාමසෙ.

2127. අථුට්ඨහී සත්ථවාහො යාචමානො කතඤ්ජලී,
නිග්‍රොධෙ කිං අපරජ්ඣති[2] වාණිජා භද්දමත්ථු තෙ.

2128. වාරිද පුරිමා සාඛා අන්නපානං ච දක්ඛිණා,
නාරිද පච්ඡිමා සාඛා සබ්බකාමෙ ච උත්තරා.
නිග්‍රොධෙ[3] කිං අපරජ්ඣති වාණිජා භද්දමත්ථු තෙ.

2129. යස්ස රුක්ඛස්ස ඡායාය නිසීදෙය්‍ය සයෙය්‍ය වා,
න තස්ස සාඛං භඤ්ජෙය්‍ය මිත්තදූභො හි[4] පාපකො.

2130. තෙ ච තස්ස අනාදිත්වා එකස්ස වචනං බහූ,
නිසිතාහි කුඨාරීහි මූලතො තං උපක්කමුං.

2131. තතො නාගා නික්ඛමිංසු සන්නද්ධා පණ්ණවීසති,
ධනුග්ගහානං තිසතා ඡසහස්සා ච වම්මිනො.

2132. එතෙ හනථ බන්ධථ මා වො මුඤ්චිත්ථ ජීවිතං,
ඨපෙත්වා සත්ථවාහං සබ්බෙ භස්මීකරොථ තෙ.

2133. තස්මා හි පණ්ඩිතො පොසො සම්පස්සං අත්ථමත්තනො.
ලොභස්ස න වසං ගච්ඡෙ හනෙය්‍ය[5] දිසතං මනං.

2134. එතමාදීනවං ඤත්වා තණ්හා දුක්ඛස්ස සම්භවං,
වීතතණ්හො අනාදානො සතො භික්ඛු පරිබ්බජෙති.

10. මහාවාණිජජාතකං.

1. කම්බලා – මජසං, සයා.
2. නිග්‍රොධො කිං අපරජ්ඣති – මජසං, සයා. වි.
3. නිග්‍රොධො – මජස.
4. මිත්තදූභො – මජස.
5. හනෙයාරිසකං – මජස.

2123. මොහයෙන් වැසුණ මෝඩ වෙළෙන්දෝ සතරවෙනු ව මෙසේ සිතූහ. මේ ගසේ උතුරු දෙසට ගිය අත්ත ද අපි කපමු යි.

2124. ඒ අත්ත කැපීමත් සමග මුතු වෙරළුමිණි රන්, රිදී, ඇතුන් පිට අතුරන පලස් හා ලොම්මුවා පසතුරුණු ද වැගිරුණේ ය.

2125. තවද කසි සළු උද්දියාන නමැති කම්බිලි (පොරෝනා) ද වැගිරුණේය. ඒ වෙළෙන්දෝ කැමැති පමණ එහි බැඳ (තබා) සතුටු වූහ.

2126. මොහයෙන් මුළා වැ නුවණ රහිත වූවෝ අපි මේ ගසේ මුල කපමු. වැඩියක් වස්තුව ලබන්නෙමු යි සිතූහ.

2127. වෙළෙඳුනි, ඔබට යහපතක් වේවා යි ඇඳිලි බැඳැ යදිමින්, කවර හෙයින් නුගරුකට අපරාධ කරන්නහු ද යි (අසමින්) සාර්ථවාහක තෙම (ඊට විරුද්ධ ව) නැගී සිටියේ ය.

2128. වෙළෙඳුනි, ඔබට යහපතක් වේවා. මේ ගසේ පෙර දිග අත්ත ජලය ද දකුණු දිග අත්ත කෑම බීම ද පැසුළු දිග අත්ත ස්ත්‍රීන් ද උතුරු දිග අත්ත කැමැති හැම දේ ද දුන්නා ය. මේ නුගරුකට කවර හෙයින් අපරාධ කරවු ද?

2129. යම් රුකක්හුගේ සෙවණෙහි හිඳුනේ ද හෝනේ ද (සත්පුරුෂයා) ඒ ගසේ අතු නො කඩන්නේ ය. මිත්‍රද්‍රෝහීකම ලාමක ය.

2130. බොහෝ වෙළෙන්දෝ ඔහුගේ කීම නො පිළිගෙන මුවහත් පොරෝවලින් ඒ ගස මුලින් ම කපන්නට පටන්ගත්හ.

2131. ඉක්බිති සටන් සඳහා සැරැසී ගත් නාගයෝ විසිපස් දෙනෙක් ද දුනු ඊ ගත්තෝ තුන්සිය දෙනෙක් ද යුද්ධසැට්ට ඇඳ ගත්තෝ සය දහසක් ද නික්මුණහ.

2132. මොවුන් නසවු, බඳිවු, මොවුන්ගේ ජීවිත නො හරිවු, ගැල් නායකයා හැර ඔවුන් හැම අළු කරවු.

2133. එ හෙයින් නුවණැති පුරුෂයා තමාගේ අභිවෘද්ධිය දක්නේ ලොභයේ වසඟයට නො යන්නේ ය. ලොභ සහිත සතුරු සිත නසන්නේ ය.

2134. තණ්හාව නිසා දුක් හටගන්නේය යි මේ දොෂය දැනැ, පහ කළ තණ්හාව ඇත්තේ, තණ්හාවෙන් කිසිවක් නො ගන්නෙක් ව සිහි ඇති භික්ෂු තෙම වසන්නේ ය.

10. මහාවාණිජ ජාතක යි.

2135. අබ්භුතො වත ලොකස්මිං උප්පජ්ජි ලොමහංසනො,
දිබ්බො රථො පාතුරහු වෙදෙහස්ස යසස්සිනො.

2136. දෙවපුත්තො මහිද්ධිකො මාතලි දෙවසාරථී,
නිමන්තයිත්ථ රාජානං වෙදෙහං මිථිලග්ගහං.

2137. එහිමං රථමාරුය්හ රාජසෙට්ඨ දිසම්පති,
දෙවා දස්සනකාමා තෙ තාවතිංසා සඉන්දකා.
සරමානා හි තෙ දෙවා සුධම්මායං සමච්ඡරෙ.

2138. තතො ච රාජා සාධීනො පමුඛො රථමාරුහි,
සහස්සයුත්තං අභිරුය්හ අගා දෙවාන සන්තිකෙ
තං දෙවා පටිනන්දිංසු දිස්වා රාජානමාගතං.

2139. ස්වාගතං තෙ මහාරාජ අථො තෙ අදූරාගතං,
නිසීදදනි රාජීසි දෙවරාජස්ස සන්තිකෙ.

2140. සක්කොපි පටිනන්දිත්ථ වෙදෙහං මිථිලග්ගහං,
නිමන්තයී ච කාමෙහි ආසනෙන ච වාසවො.

2141. සාධු ඛොසි අනුප්පත්තො ආවාසං වසවත්තිනං,
වස දෙවෙසු රාජීසි සබ්බකාමසමිද්ධිසු
තාවතිංසෙසු දෙවෙසු භුඤ්ජ කාමෙ අමානුසෙ.

2142. අහං පුරෙ සග්ගගතො රමාමි
නච්චෙහි ගීතෙහි ච වාදිතෙහි,
සොදනි අජ්ජ න රමාමි සග්ගෙ
ආයුං නු ඛීණො මරණං නු සන්තිකෙ
උදහු මූළ්හොස්මි ජනින්දසෙට්ඨ.

2143. නචායු ඛීණං මරණං තෙ දූරෙ
නචාපි මූළ්හො නරවීරිය[1] සෙට්ඨ,
තවඤ්ච[2] පුඤ්ඤානි පරිත්තකානි
යෙසං විපාකං ඉධ වෙදයිත්ථො.

2144. වස දෙවානුභාවෙන රාජසෙට්ඨ දිසම්පති,
තාවතිංසෙසු දෙවෙසු භුඤ්ජ කාමෙ අමානුසෙ.

---

1. නරවීර – මජ්ඣසං.
2. තව – මජ්ඣසං,

2135. ලොකයෙහි ඒකාන්තයෙන් ම ලොමුදහ ගන්වන්නා වූ පුදුම උපදවන්නා වූ දෙයක් උපන්නේ ය. (පහළවිය) යසස් ඇත්තා වූ වෙදෙහ රජුට දිව්‍ය රථයක් පහළ විය.

2136. දිව්‍ය රථාචාය්‍ය වූ මහත් සෘද්ධි ඇත්තා වූ මාතලි දිව්‍ය පුත්‍රයා මියුලු නුවර අධිපති වූ සාධීන රජුට ආරාධනා කෙළේ ය.

2137. දිසාධිපති වූ ශ්‍රෙෂ්ඨ රජතුමනි, එනු මැනැවි. මේ රියට නගින්නේ මැනැවි. ශක්‍රයා සහිත තව්තිසා දෙව් ලොවැ දෙවියෝ ඔබ දකින්නට කැමැත්තෝ ය. ඒ දෙවියෝ (ඔබ) සිහි කරමින් ම සුදම් දෙව් සබේ සිටිති.

2138. ඉක්බිති සාධීන රජ තෙමේ උතුම් රියට නැංගේ ය. දහසක් අසුන් යෙදූ රියට නැග දෙවියන් වෙත ගියේ ය. දෙවියෝ පැමිණි රජු දැක සතුටු වූහ.

2139. මහරජ ඔබේ යහපත් පැමිණීමකි. තවද අපේ සමීපයට පැමිණීමකි. ශ්‍රෙෂ්ඨ රජතුමනි, දෙවරාජයා සමීපයේ හුන මැනවි.

2140. මියුලු නගරයට අධිපති වෙදෙහ රජ (සමග) ශක්‍රයා ද සතුටු විය. ශක්‍රයා කාමසම්පත්තියෙන් ද ආසනයෙන් ද (රජු) පැවැරී ය.

2141. රජතුමනි, කාම සම්පත් සිය වසඟයෙහි පවත්වන දෙවියන් වසන තැනට පැමිණීම යහපත් වෙයි. කාමසම්පත් සියල්ල දියුණුව පවතින දෙවියන් අතර වාසය කරව. තව්තිසා දෙවියන්ට ඇති මිනිසුන්ට නො ලැබෙන කාමයන් අනුභව කරන්න.

2142. සක්දෙවිඳුනි, පෙර මම දෙව්ලොවට පැමිණ නෘත්‍ය ගීතයෙන් හා වාද්‍යයෙන් සිත රමණය කෙළෙමි. ඒ මම අද දෙව්ලොව නො ඇලෙමි. (මගේ) ආයුෂ ගෙවුණේ ද මරණය ළංවූයේ ද නැතහොත් මුළා වූයෙම් ද?

2143. උතුම් නරවිරුවාණෙනි, ඔබගේ ආයුෂ ගෙවුණේ නො වෙයි. ඔබේ මරණය දුර ය. ඔබ මුළා වූයෙහි ද නො වේ. යම් පුණ්‍ය කර්‍මයක් නිසා මෙහි සැප වින්දයුතු ද ඔබගේ ඒ පින් මඳ වූහ.

2144. දිසාධිපති රජතුමනි, දෙවානුභාවයෙන් මෙහි වාසය කරව. තව්තිසා වැසි දෙවියන්ට අයිති වූ මිනිසුන්ට නො ලැබෙන කාමයන් අනුභව කරන්න.

2145. යථා යාචිතකං යානං යථා යාචිතකං ධනං,
එවං සම්පදමෙවෙතං යං පරතො දානපච්චයා.

2146. නචාහමෙතං ඉච්ඡාමි යං පරතො දානපච්චයා,
සයං කතානි පුඤ්ඤානි තම්මෙ ආවෙණිකං ධනං.

2147. සොහං ගන්ත්වා මනුස්සෙසු කාහාමි කුසලං බහුං,
දානෙන සමචරියාය සංයමෙන දමෙන ච.
යං කත්වා සුඛිතො හොති න ච පච්ඡානුතප්පති.

2148. ඉමානි තානි ඛෙත්තානි ඉමං නික්ඛං සුකුණ්ඩලං[1],
ඉමා තා හරිතා නූපා[2] ඉමා නජ්ජො සවන්තියො.

2149. ඉමා තා පොක්ඛරණියො රම්මා චක්කවාකූපකූජිතා,
මන්දාලකෙහි[3] සඤ්ඡන්නා පදුමුප්පලකෙහි ච
යස්සිමානි මමායිංසු කින්නු තෙ දිසතං ගතා.

2150. තානීධ[4] ඛෙත්තානි සො භූමිභාගො
තෙ ආරාමා තෙ වන මෙ පවාරා[5],
තමෙව මය්හං ජනතං අපස්සතො
සුඤ්ඤාව මෙ නාරද ඛායතෙ දිසා.

2151. දිට්ඨා මයා විමානානි ඔභාසෙන්තා[6] චතුද්දිසා,
සම්මුඛා දෙවරාජස්ස තිදසානඤ්ච සම්මුඛා.

2152. වුත්ථං මෙ හවනං දිබ්බං[7] යුත්තා කාමා අමානුසා,
තාවතිංසෙසු දෙවෙසු තිබ්බකාමසමිද්ධිසු.

2153. සොහං එතාදිසිං දිස්වා[8] පුඤ්ඤාය'මහි ඉධාගතො,
ධම්මමෙව චරිස්සාමි නාහං රජ්ජෙන අත්ථිකො.

2154. අදණ්ඩාවචරං මග්ගං සම්මාසම්බුද්ධදෙසිතං,
තං මග්ගං පටිපජ්ජිස්සං යෙන ගච්ඡන්ති සුබ්බතා'ති.

11. සාධීනජාතකං[9].

1. සකුණ්ඩලං - මජසං, සයා.
2. තොපා - වි.
3. මණ්ඩාල - සයා.
4. තානීව - මජසං.
5. තෙ යෙව ආරාම වනානි සඤ්චරා - මජසං. තෙයෙව ආරාම වසූපචාරා - සයා.
6. ඔභාසන්තං - මජසං, සයා.
7. දිබ්යං - මජසං, සයා.
8. හිත්වා - මජසං.
9. සාධීන රාජ - සයා.

2145. ඉල්ලා ගත් යානය යම්සේ ද ඉල්ලා ගත් ධනය යම්සේ ද, අනුන් දුන් පිනෙන් යමක් ලබා නම් එද මෙසේ දතයුතු ය.

2146. අනුන් දුන් නිසා යමක් ලැබේ ද එය මම නො කැමැත්තෙමි. තමා කළ පින් වේ ද එය මට උරුම ධනය යි.

